පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි



# දූවිලි මත රැඳි පියසටහන්

ඉතාමත් පැරණි මූලාශ්‍රවලින් බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ තොරතුරු

# දූවිලි මත රැඳි පිය සටහන්

ඉතාමත් පැරණි මූලාශ්‍රවලින්
බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ තොරතුරු


සම්පාදක:

පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

පරිවර්තක:

මන්ජරී පීරිස්

# දූවිලි මත රැඳි පිය සටහන්

සම්පාදක: පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමි

පරිවර්තක: මන්ජරී පීරිස්

# දූවිලි මත රැඳි පිය සටහන්

## ඉතාමත් පැරණි මූලාශ්‍රවලින්
## බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ තොරතුරු

ඇසෙන් බලන ආකාරයෙන් මම බුදුපියාණන් වහන්සේ මනසින් දකිමි
උන්වහන්සේ අගයමින් රාත්‍රිය ගත කරමි
ඒ නිසාවෙන්, මම කිසි දිනක උන්වහන්සේගෙන් බැහැර නොවෙමි.
සුත්ත නිපාත 1142

පටුන

පෙරවදන
භාවිතය පිළිබඳ සටහනක්
ප්‍රස්තාවනාව
1. හැඳින්වීම
2. වෙනස්වීමේ යුගයක්
3. දෙවියන් වහන්සේ, බ්‍රාහ්මණයන් සහ තවුසන්
4. ශාක්‍යයන්
5. ආලෝකය වෙත
6. දෙවියන්ගේ සහ මිනිසුන්ගේ ආචාර්යවරයා
7. බුදුපියාණන් වහන්සේගේ දවස
8. මාවත දිගේ
9. ප්‍රශංසා සහ චෝදනා
10.පැවිදි සහ ගිහි ශ්‍රාවකයන්
11.වෙනත් කරුණුවලදී බුදුපියාණන් වහන්සේ
12.දුෂ්කර කාලයක්
13.අවසාන දින
14.ආනිසංසය
උපග්‍රන්ථය I. බුදුපියාණන් වහන්සේ සංචාරය කළ නගර සහ පුරවර
උපග්‍රන්ථය II. බුදුපියාණන් වහන්සේ සහ උපනිෂද්
ආශ්‍රිත ග්‍රන්ථ පිළිබඳ නාමලේඛනය

## පෙරවදන

බුදුපියාණනන් වහන්සේ මනුෂ්‍යයෙකු ලෙස කෙබඳු ද? උන්වහන්සේ අන් අය සමග සම්බන්ධ වූයේ කෙසේ ද? ඉතා සැලකිල්ලෙන් සහ සවිස්තරාත්මක ඇසකින් පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමියන් අපට ඉතා පැරණි ග්‍රන්ථවලින් උපුටා දක්වමින් බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ සිදුවූ සිද්ධීන් පිළිබඳ කොටස් අපට 'කියවිය හැකි' අයුරින් එකතු කර ඇත. එහි ප්‍රතිඵලය සැබැවින්ම විශ්වාසය තැබිය හැකි චරිතාපදානයකි. මිනිසෙකු මෙන්ම, ගුරුවරයෙකු වශයෙන් ද, ඓතිහාසික බුදුපියාණන් වහන්සේ සැබැවින්ම විශිෂ්ට වූ බව එයින් පෙන්වා දෙයි. පරිච්ඡේද ශිර්ෂයන් ප්‍රබෝධ කරනසුළු ආකාරයෙන් නැවුම්යඃ උන්වහන්සේගේ ජීවිතයේ එක් දිනක්, උන්වහන්සේගේ හාස්‍යය, උන්වහන්සේගේ විවාද විලාසය, උන්වහන්සේගේ පසුබිම යනාදි වශයෙන්. ගෞතම බුදුපියාණන් වහන්සේ පිළිබඳව, සරලව පුද්ගලයෙකු ලෙසත් - එසේම ධම්මික ස්වාමීන් වහන්සේ අපට පෙන්වා දෙන ආකාරයට පැහැදිලිවම අසාමාන්‍ය පුද්ගලයෙකු ලෙසත්, සිතීමට මම ප්‍රිය කළෙමි. ලෝකයේ වැඩ සිටි, ශ්‍රේෂ්ඨතම ආගම් නිර්මාතෘවරයා පිළිබඳව නූතන ඇසින් දකිමින්, ප්‍රායෝගික, නිවැරදි සහ කියවීමෙන් සතුට උපදවන ඇගයීමක් ඇතුළත් මෙම ග්‍රන්ථය කියවීම සුදුසු යැයි ඕනෑම පුද්ගලයෙකුට මම යෝජනා කරමි.

සාරා ෂෝ
ඔක්ස්ෆර්ඩ්
මාර්තු 2021

## භාවිතය පිළිබඳ සටහනක්

බෞද්ධ ග්‍රන්ථවල බහුල වශයෙන් නැවත නැවත සඳහන් කිරීම් ඇතුළත්ව තිබෙන නිසා, වෙහෙසකර ලෙස කියවීම අවශ්‍ය වේ. මෙම පුන පුනා සඳහන් කිරීම් බොහොමයක් මම සංක්ෂිප්ත කර ඇත්තෙමි. මෙසේ සිදු කර ඇති ස්ථාන, උපුටා දැක්වීම්වල හෝ සටහන්වල දක්වා ඇත. බෞද්ධ සාහිත්‍යයෙහි විශාල සංඛ්‍යාවක් සඳහන් කරන සම්ප්‍රදාය වන්නේ එහි පන්සියයක් තිබූ බවයි. මෙය 'බොහෝ', 'විශාල සංඛ්‍යාවක්' හෝ 'සිය ගණනක්' වශයෙන් ආදේශ කර ඇත. සැමතැනම, 'පෙළ' හෝ 'පැරණිතම ග්‍රන්ථය' යනාදිය මාරුවෙන් මාරුවට 'ත්‍රිපිටක' යනුවෙන් භාවිත කර ඇත. මේ ආකාරයට, මාරුවෙන් මාරුවට, සමණ, භික්ෂුව සහ ශ්‍රමණ යනුවෙන් භාවිත කර ඇත. සංස්කෘතයේ මෙන් පාළි භාෂාවේ ද, 'සමණයන් සහ බ්‍රාහ්මණයන්' යන පදය සංයෝගයකි. එය සාමාන්‍යයෙන් පුද්ගලයන් වර්ග දෙකම අදහස් නොකෙරේ. නමුත්, 'ආගමික ගුරුවරුන්' යන සාමාන්‍ය යෙදුමකි. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමට පෙර, උන්වහන්සේ අමතනු ලැබුවේ උන්වහන්සේගේ ගෝත්‍ර නාමයවූ ගෝතම බෝධිසත්ත්වයන් වහන්සේ යනුවෙනි. බුද්ධත්වයට පත් වූ පසු බුදුපියාණන් වහන්සේ යනුවෙන් අමතනු ලබයි.

# ප්‍රස්තාවනාව

එක් අතකින් මම අවුරුදු තිස් පහක් මුළුල්ලේ මෙම ග්‍රන්ථය ලියමින් සිටියෙමි. බුදුපියාණන් වහන්සේ කවුද සහ උන්වහන්සේ කෙබඳු පුද්ගලයෙක්ද යන්න, අධ්‍යයනය කිරීම, නව යොවුන් වියේ අග භාගයේදී බෞද්ධයෙකු බවට පත් වූ දිනයේ සිට මා කුතුහලයට සහ වශීකරණයට පත් කරන කරුණක් විය. 'බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන්' යන තේමාවෙන් මා විසින් 1989දී රචනය කරන ලද ග්‍රන්ථයේ, මම උන්වහන්සේගේ පෞරුෂයේ සමහර කරුණු පිළිබඳව, ඉගැන්වීමේ ශෛලියත් සෝදිසි කර බැලුවෙමි. ඊළඟ දශක කිහිපය තුළ උන්වහන්සේගේ ජීවිතයේ වෙනත් අංශ, පුරුදු, චාරිකා, උන්වහන්සේගේ ආහාර පිළිබඳව පවා බොහෝ ලිපි ලීවෙමි. එවකට මා විසින් ලියන ලද සමහර දේ වර්තමානයේ රචනය කළ මෙම ග්‍රන්ථයට ඇතුළත් කර ඇත. බුදුපියාණන් වහන්සේ ජීවත්වූ ලෝකය පිළිබඳව අවම වශයෙන් හෝ යම් හැඟීමක් ලබා ගැනීම පිණිස උන්වහන්සේගේ පාද සලකුණු ඔස්සේ මම ඉන්දියාවේ තුන්වරක් පා ගමනින් චාරිකා කළෙමි. ඒ බුද්ධ ගයාවේ සිට වරනාසි, බුද්ධ ගයාවේ සිට රජගහ සහ ආපසු, සහ සියල්ලම අතරින් දීර්ඝතම චාරිකාව වූ, බුදුපියාණන් වහන්සේගේ අවසාන චාරිකාව වූ රජගහ සිට කුසිනාරාවට ආපසු පිය නැගීමයි. බුදුපියාණන් වහන්සේගේ ආගමික සහ සමාජීය පසුතලය හොඳින් අවබෝධ කරගැනීම සඳහා පසුගිය වසර කිහිපය තුළ මම වෛදික සාහිත්‍යයෙහි මුල් කාලය සහ පසු කාලයේ අධ්‍යයනයෙහි නිමග්න වී සිටියෙමි.

මෙම ග්‍රන්ථය ලිවීමේදී මට නොමසුරු උපකාර සහ දිරිමත් කිරීම් ආනන්දජෝති හිමියන්, සුහේන්ද්‍ර සුලිත්තයො සහ මගේ සහෝදරයා වන චාල්ස්ගෙන් ලැබී ඇත.

එසේම මෙම ග්‍රන්ථය සිංහල බසට පරිවර්තනය කිරීම පිළිබඳව මම මන්ජරී පීරිස් මෙනවියට ස්තූතිවන්ත වෙමි. ඇයට විවිධ ආකාරයෙන් උපකාර කළ සුජීව දිලංගන මහතාට ද ස්තූතිවන්ත වෙමි.

## පරිවර්තකගේ සටහන

මෙම ග්‍රන්ථයේ කතුවරයා වන පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික ස්වාමීන් වහන්සේ ග්‍රන්ථය රචනයට ප්‍රවේශ වන්නේ, පුද්ගලයෙකුට පහසුවෙන් ප්‍රවේශ විය

නොහැකි දේ සොයා ගනිමින් බුදුපියාණන් වහන්සේ අන් අය සමග කටයුතු කිරීමේදී හැසිරීමට නැඹුරු වූවේ කෙසේ ද යන්න, උන්වහන්සේගේ අනුකම්පාව සහ මහා කරුණාව අනපේක්ෂිත ආකාරයෙන් දක්වමින්ය. එම තොරතුරු කතුවරයා ලබා ගෙන ඇත්තේ මුල්කාලීන මූලාශ්‍රවලින්ය.

එම නිසා මෙම ග්‍රන්ථය පරිවර්තනය කරන්නට මට ලැබීම භාග්‍යයක් කොට මම සලකමි.

පළමුව, ඒ සඳහා මට අවසර දුන් පූජ්‍ය ශ්‍රාවස්ති ධම්මික හිමියන්ට මම මගේ ප්‍රණාමය පුද කරමි.

දෙවනුව, විවිධ සහාය ලබා දුන්, මහරගම වජිරඥාණ ධර්මායතනවාසී, පූජ්‍ය ගබ්බෙල වජිරඥාණ ස්වාමීන් වහන්සේට සහ පූජ්‍ය වෙරදූවේ මහින්ද ස්වාමීන් වහන්සේටත් ප්‍රණාමය පුද කරමි.

තෙවනුව, මෙම ග්‍රන්ථයේ අවසාන සෝදුපත් සම්පූර්ණයෙන්ම කර දුන් සරත් සෝමරත්න මහතාට බෙහෙවින්ම ස්තූතිවන්ත වෙමි.

අවසානයේ, මෙම ග්‍රන්ථය නිම කිරීමට විවිධ සහාය දුන් සුජීව දිලංගන සහ ජීවක මෛත්‍රී යන මහත්වරුන්ට ස්තූතිවන්ත වෙමි.

බුදුදහම සිංහල බසින් පරිහරණය කරන පින්වතුන්ට ඔවුන්ගේ දහම් දැනුම පෝෂණය කර ගැනීමට මෙම ග්‍රන්ථය ප්‍රයෝජනවත් වේ යැයි මම සිතමි.

මගේ දෙමව්පියන්ට සහ පවුලේ සියලු දෙනාගේ සංසාර විමුක්තිය සඳහා මෙම ක්‍රියාව හේතුවක් වේවා!

මන්ජරී පීරිස්
86, දහම් මාවත,
මහරගම

# 1. හැඳින්වීම

බුදුදහම උගන්වන්නේ සෑම පුද්ගලයෙකුම ඔවුන්ගේ වර්තමාන ජීවිතයට පැමිණෙන්නේ පෙර ජීවිතයකින් බවයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට වර්තමාන ජීවිතය අවසන් වන විට තවත් ජීවිතයක් ලැබෙන බවත්ය. මෙම ඉපදීම, මිය යෑම සහ නැවත ඉපදීමේ ක්‍රියාවලිය නතර වන්නේ පුද්ගලයෙකු නිර්වාණය (බෝධි) යනුවෙන් හඳුන්වන තත්ත්වයට පත්වූ පසුව පමණය. තමන්ගේ පෙර භවය හෝ සමහර විට බොහෝ භවයන් පිළිබඳව තමන්ට මතකයන් ඇති බවට සඳහන් කරන පුද්ගලයෝ වෙති. එනමුත්, එවැනි කියමන් සත්‍ය, වංචනික හෝ මිථ්‍යාවන් ද යන්න දැන ගැනීම දුෂ්කර වේ. අනෙක් අයගේ මෙන්ම, බුදුපියාණන් වහන්සේටද ගෝතම බෝධිසත්ත්වයන් නමැති උන්වහන්සේගේ අවසාන උත්පත්තියට පෙර බොහෝ උත්පත්ති තිබුණි. සම්ප්‍රදාය විසින් පන්සියයකට වඩා වූ මෙම පෙර ආත්මවල ප්‍රබන්ධමය ජීවන චරිතාපදාන නිර්මාණය කර ඇත. පසුකාලීනව ජාතක නමින් හැඳින්වෙන ග්‍රන්ථයක විස්තර කරමින් බෞද්ධ ධර්ම ග්‍රන්ථවලට ඇතුළත් කර ඇත. බුදුපියාණන් වහන්සේගේ සුවිශේෂත්වය නම්, ප්‍රබන්ධමය හෝ වෙනත් ආකාරයකින් පුනරුත්පත්ති තිබීම නොව, නමුත්, උන්වහන්සේ නිර්වාණයට පත් වී ශතවර්ෂ ගණනාවකට පසුවත්, වෙනත් අය උන්වහන්සේ වෙනුවෙන් නව ජීවිත නිර්මාණය කරන අදහසින් 'පුනර්භව ඇති කිරීමේ' යෙදීමයි. ඒවායෙන් සමහරක් උන්වහන්සේගේ ප්‍රබන්ධිත පෙර ආත්මවලට වඩා වැඩියෙන් විශ්වාස කළ නොහැකිය.

බුදුපියාණන් වහන්සේ කායික වශයෙන් සහ තවත් බොහෝ ආකාරයෙන් සාමාන්‍ය මනුෂ්‍යයෙකු වුවද, ක්‍රි. පූ. දෙවන ශතවර්ෂයේ මැද භාගයේදී පමණ පවත්වන ලද තුන්වන බෞද්ධ කවුන්සලයට සහභාගී වූ සමහර පුද්ගලයන් අවධාරණය කළේ උන්වහන්සේගේ පාරිශුද්ධත්වය කෙතරම් ද කිවහොත් උන්වහන්සේගේ  මලපහ පවා සුගන්ධවත් බවයි. කෙසේ නමුත් බුදුපියාණන් වහන්සේ පිළිබඳව වඩාත් යථාර්ථවාදී දෘෂ්ටියක් පවත්වමින් සිටි අය ද සිටිති. ඔවුහු මෙම කියමන නිෂ්ප්‍රභ කර නිරවුල් ප්‍රායෝගික අවබෝධයක් දුන්හ. ඔවුන් තර්ක කළේ, පෙර කී දෙය  සත්‍ය නම්, බුදුපියාණන් වහන්සේ ආහාරයට ගත්තේ සුවඳ විලවුන් විය යුතු බවයි. නමුත්, උන්වහන්සේ ආහාරයට ගත්තේ බත් සහ වෙනත් සාමාන්‍ය ආහාර බව හොඳින් දන්නා කාරණයක් බවත්ය. ඊට අමතරව, උන්වහන්සේගේ මලපහ සැබැවින්ම සුවඳවත් නම්, මිනිසුන් ඒවා එකතු කරන්නට සහ ගබඩා කරන්නටත්, සහ ඒවා විලවුන් ලෙස භාවිත කරන්නටත් ඉඩ තිබුණි. නමුත් මෙසේ කළ බවට කිසිම වාර්තාවක් නැත.[1]

[1] Kv. XVIII,4

මීට ශතවර්ෂ බොහෝ ගණනකට පසු, ලලිතවස්තර නමැති බුදුපියාණන් වහන්සේගේ ජීවන චරිතාපදානයක් උන්වහන්සේ පිළිබඳව විස්තර කළේ වර්ෂාවකට පසු හතු පිපෙන්නාක් මෙන්, විස්මකුරු සහ පුදුම දේ තමන් ඉදිරියේ විද්‍යමාන වන පුද්ගලයෙකු ලෙසයි. මේවා බොහොමයක් අතරින්, එක් උදාහරණයක් නම්, බුදුපියාණන් වහන්සේ දරුවෙකු ලෙස පන්සලකට ආශීර්වාද කිරීමට ගෙන ගිය විට දෙවිවරුන්ගේ පිළිම තමන්ගේ ගෞරවය ප්‍රකාශ කිරීම වස් නැගී සිටි බවයි. මීට ශතවර්ෂයක් හෝ දෙකකට පසු, ඊටත් ඔබ්බට යමින් සද්ධර්මපුණ්ඩරීක සූත්‍රයේ සඳහන් වූයේ බුදුපියාණන් වහන්සේ සැබැවින්ම සදාකාලික විශ්වීය ජීවියෙකු බවත්, ඊනියා බුදුපියාණන් වහන්සේ නම් මිනිස්කම ඉගැන්වීම සඳහා විශ්වීය බුදුවරයා වෙනුවෙන් සිටින අද්භූත දර්ශනයක් බවත්ය. නමුත්, දිව්‍යමය හෝ අර්ධ-දිව්‍යමය-ආශ්චර්යයමත් ලෙස ක්‍රියා කරන බුදුන්වහන්සේ සමහර අංශවලින් ප්‍රාමාණිකවනසුලු මාර්ගයේ සිටියහ. වඩාත් සන්සුන් සිහිබුද්ධියෙන් යුක්ත ඒ හඬ තවමත් ඇසේ.

එයින් එකක් නම්, දෙවන ශතවර්ෂයේ මුලදී අශ්වඝෝෂ ලියූ බුද්ධචරිතය නම් බුදුපියාණන් වහන්සේගේ පළමු දින සිට අවසාන දින තෙක් බුද්ධ චරිතය පිළිබඳ කාව්‍යමය විස්තරයයි. මෙම වීර කාව්‍යයේ බුදුපියාණන් වහන්සේ පිළිබඳව විස්තර කර ඇත්තේ අසාමාන්‍ය, නමුත්, තවදුරටත් මනුෂ්‍යයෙක් ලෙසයි. හයවන ශතවර්ෂයේදී පමණ නිර්මාණය වූ හින්දු මත්ස්‍ය පුරාණය අනාවරණය කළේ බුදුපියාණන් වහන්සේ සැබැවින්ම විෂ්ණු දෙවියන්ගේ අවතාරයක් (අවතාර) බවයි. මෙම කියමන පසුකාලීනව වෙනත් 'පුරාණ' විසින් නැවත පවසන ලදී. බෞද්ධයන් සුළු පිරිසක් පමණක් මෙම කියමන සැබැවින්ම සැලකිල්ලට ගත්හ.

දහවන ශතවර්ෂය වන විට, බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ ව්‍යාකූල සහ අසම්පූර්ණ විස්තරයක් යුරෝපයට ලැබුණි. එයට හේතුව එයින් උන්වහන්සේ නිරූපණය කර තිබූයේ කැපී පෙනෙන බැතිමතෙකු ලෙස නිසා, උපකල්පනය කර තිබුණේ උන්වහන්සේ ක්‍රිස්තු භක්තිකයෙකු බවයි. ඒ නිසාවෙන්, උන්වහන්සේට කතෝලික පල්ලියේ ශාන්ත ජෝසප් යන නමින් ශාන්ත ජෝසප්ගේ උත්සව දිනය වන නොවැම්බර් 27 වන දින පදවි පැවරීමක් කර ඇත.

යුරෝපීය බලය ආසියාවට විනිවිද යාම තුළින් අවසානයේ ඓතිහාසික සැබෑ පුද්ගලයෙකු වශයෙන් පහළවෙමින් 'අවතාරවල' නව රැල්ලකට යටත් වන්නට සිදු වී ඇත. නමුත්, උන්වහන්සේ දෙවියකු, දෙවියෙකුගේ අනාගතය හෙළි කරන්නෙකු, හින්දු හෝ චීන පුද්ගලයෙකු නොව, සැබැවින්ම ඉන්දියානුවෙකු බව තහවුරු කරන්නට කාලය ගතවිය.

වික්ටෝරියානු යුගයේ මැද භාගයේදී වඩා නිදහස් මතධාරීහු උන්වහන්සේ හින්දු ආගම ප්‍රතිසංස්කරණවාදියෙකු, හේතුධර්මවාදියෙකු හෝ ජේසුස් වහන්සේට වඩා පියවරක් පහළ, ශ්‍රේෂ්ඨ සදාචාරය ප්‍රගුණ කළ ගුරුවරයෙකු

ලෙසින් දකින්නට පටන් ගන්නා ලදී. ඍජු පුද්ගලයෝ ස්වල්පයක් බුදුපියාණන් වහන්සේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේට සමාන යැයි කියන්නට තරම් නිර්භය වූහ.[2] තවත් සමහරු බුදුපියාණන් වහන්සේ අදේවවාදියෙකු හෝ භෞතික සංසිද්ධිවලින් බැහැරව කිසිවක් නැතැයි අදහන්නෙකු යැයි ප්‍රකාශයට පත් කළහ. මේ අතර තවත් සමහරු උන්වහන්සේ දෙවියන් වහන්සේ විශ්වාස කළ බවට එක සමාන ලෙසම නිසැක වූහ. නමුත් උන්වහන්සේ එම විෂය පිළිබඳව පැවසුවේ ස්වල්පවූ දෙයක් පමණක් බවත්, එයට හේතුව දිව්‍යමය වචනයෙන් ඔබ්බට ගිය නිසා බව ඔවුහු පැවසූහ.

1880 මුල් භාගයේදී ඉන්දියානු ආගම පිළිබඳ විශිෂ්ට ඕලන්ද විශාරද හෙන්ඩ්‍රික් කර්න්, වෙළුම් දෙකකින් යුක්ත විශාල ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කළ අතර, බුදුදහම සූර්යා වන්දනාව තුළින් ගොඩනැගුනු බවත්, බුදුපියාණන් වහන්සේ මුලින් සූර්ය දේවතාවෙකු බවත්, ඔහු එයින් ඔප්පු කළේය. බුදුදහමේ නිදාන දොළොස නම්, වසරේ මාසයි, හය ආකාරයේ වැරදි අදහස් නම් ග්‍රහලෝක හයයි. බුදුපියාණන් වහන්සේගේ මැද මාවත නම් වෙස්වලාගත් ගිම්හාන සූර්ය නිවෘත්තිය යනාදියයි. කර්න්ගේ සෙසු විද්වතුන් ඔහුට දැක්වූ ගෞරවය නොසලකමින්, බුදුපියාණන් වහන්සේ පිළිබඳව ඔහු තුළ තිබූ තාරකා විද්‍යාත්මක න්‍යායයේ හිරුගෙන් න්‍යායට ප්‍රචණ්ඩ ලෙස පහර දෙනු ලැබුණි. 1960 ගණන්වල තිබූ සංස්කෘතියට විරුද්ධ ව්‍යාපාරයෙන් පසුව සහ නව යුගයේ ආධ්‍යාත්මිකතාවය මතුවීමෙන් පසු, බුදුපියාණන් වහන්සේ නිර්මාශවීම පිළිබඳ නායකයා වූහ. උන්වහන්සේගේ චක්‍ර විවෘත කළ අතර, පළිඟු දෙස බැලීමෙන් මනස සන්සුන් කළ හැකි බව ඉගැන්වීය. ඒ අතරම, ලිබරල් ක්‍රිස්තියානි කවයන් තුළ ජේසුස් වහන්සේ සහ බුදුපියාණන් වහන්සේ කවදා හෝ හමු වූවා නම්, ඔවුන් හොඳම මිතුරන් වනු ඇතැයි තරයේ කියා සිටි අතර, එකිනෙකා තම ඉගැන්වීම් එකිනෙකාට පැහැදිලි කරන විට සිනාමුසු මුහුණින් එකඟ වන්නට ද ඇත.[3]

මේ සියලු කුතුහලයන් බැහැරව, සාමාන්‍යයෙන් ධනාත්මක අවතාර වුවද, බුදුපියාණන් වහන්සේ ඇත්ත වශයෙන්ම යුද්ධයේදී මිනිසුන්ට අණ දීමේ පුළුල් අත්දැකීම් ඇති දක්ෂ ක්ෂේත්‍රයේ සෙන්පතියෙකු බව ප්‍රථම වරට හෙළි කරන මෑත ප්‍රකාශනයකි. පෙනෙන ආකාරයට උන්වහන්සේ ''මොනතරම් යුධ පිටියේ සංහාරයක් දුටුවාද යත්, උන්වහන්සේ මානසික බිඳවැටීමකට ලක් විය.'' උන්වහන්සේ ඝාතනය කර ඇති බවට ''සාධාරණ සැකයක්'' ඇති බව ද පොත පාඨකයාට දන්වයි.[4]

බොහෝ 'බුදුවරයන්' සමග මෙම ඉන්දියානු ප්‍රාඥයාණන්වහන්සේ බොහෝ

---

[2] Philip C. Almond, *The British Discovery of Buddhism*, 1988

[3] A good example of this claim is *Jesus and Buddha, Friends in Conversation* by Paul Kitter and Roger Haight. The former, representing Buddhism, is professor emeritus of Union Theological Seminary in New York and the latter, representing Christianity, is a Jesuit priest and theologian at the same instution. Apparently it was not thought necessary to invite a Buddhist scholar for his or her opinion.

[4] Richard A. Gabriel's *God's Generals, the Military Lives of Moses, the Buddha and Muhammad*, 2020

මිනිසුන්ගේ සිත්වල මිථ්‍යාව සහ යථාර්ථය, අහිංසකත්වය සහ උද්‍යෝගය උපද්දවීම අතර චරිතයක් වීම පුදුමයක් නොවේ. නමුත් සම්පූර්ණ සත්‍යයක් නොවේ. බුදුපියාණන් වහන්සේ කෙබඳු පුද්ගලයෙක්ද සහ උන්වහන්සේ උගැන්වූ දේ කුමක් වුවත්, වඩාත් යථාර්ථවාදී හෝ සමහර විට වඩා හොඳ, වඩා සාම්ප්‍රදායික වාර්තා ඉදිරිපත් කරන අධ්‍යයනයන් අවම වශයෙන් සියවස් එකහමාරක්වත් ඇත. කෙසේ වෙතත්, මෙම සියලු උත්සාහයන් සහ සමකාලිනයන් පවා, බුදුපියාණන් වහන්සේගේ චරිතාපදානය විස්තර කරන්නේ, උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් සියවස් ගණනාවකට පසු විකාශනය වූ ජනප්‍රවාද සමග මුල්ම මූලාශ්‍රවල ඇති ස්වල්ප වූ කරුණු එකතු කරමිනි. එයට හේතුව, මෙම වඩාත් විශ්වාසදායක මුල් මූලාශ්‍රවල තොරතුරු සෑහෙන ප්‍රමාණයේ ග්‍රන්ථයක් සඳහා ප්‍රමාණවත් නොවන නිසා, අවම වශයෙන් එවැනි චරිතාපදානවලින් අඩක් හෝ වැඩි ගණනක් සාමාන්‍යයෙන් ප්‍රධාන වශයෙන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව නොව, බුද්ධ දර්ශනය ගැන විස්තර කරයි.

තර්කානුකූලව, බුදුපියාණන් වහන්සේ කව්ද සහ උන්වහන්සේ කෙබඳු පුද්ගලයෙක්ද යන්න දැනගැනීමට හොඳම ක්‍රමය වන්නේ උන්වහන්සේ පිළිබඳව ඇති පැරණිතම සටහන් පරීක්ෂා කිරීමයි. එයට හේතුව ඒවා පසුකාලීන ඒවාට වඩා උන්වහන්සේට වඩා සමීප වන නිසාය. කෙසේ නමුත් එවැනි ප්‍රයත්නයක් දැරීම කියන තරමට පහසු නොවේ. ඉන්දියානු සාහිත්‍යයේ දින වකවානු දැක්වීම විශේෂයෙන්ම දුෂ්කර සහ අසාර්ථක කාරියකි. සාමාන්‍යයෙන් යම් විශේෂ ග්‍රන්ථයක් රචනා කළ විට, විද්වතුන් අතර විවිධාකාර මත ඇති වේ. පැරණි ග්‍රන්ථ සුළුතරයක් එක් කාලයකදී රචනා කිරීමෙන් පසුව, පසුකාලීන ශතවර්ෂවලදී කොටස් එකතු කිරීම හෝ සංශෝධනය කිරීම නිසා සමජාතිවීමෙන්, කාර්ය තවදුරටත් අවුල් වේ. කෙසේ නමුත්, පාළි ධර්ම ග්‍රන්ථ නාමාවලිය යනුවෙන් ද හැඳින්වෙන, පාළි ත්‍රිපිටකයේ ඇති මූලික කරුණු බුදුපියාණන් වහන්සේගේ මුල්ම වාර්තා සහ උන්වහන්සේ සහ උන්වහන්සේගේ ඉගැන්වීම් පිළිබඳ තොරතුරු බව විද්වතුන් අතර පොදු එකඟතාවක් තිබේ.

ත්‍රිපිටක යන නම සෑදී ඇත්තේ ත්‍රි, 'තුන' යන වචනය, එනම් ධර්ම ග්‍රන්ථවල කාණ්ඩ තුන සහ පිටක 'කූඩයක්' යන වචනයත් එකතු වෙමින්ය. එම කාණ්ඩ තුන නම් වශයෙන්, සූත්‍ර පිටක, විනය පිටක සහ අභිධම්ම පිටක වේ. මේවායෙන් පළමුවැන්න සහ ඉතා වැදගත් කාණ්ඩයේ ඇතුළත් වන්නේ බුදුපියාණන් වහන්සේගේ සහ උන්වහන්සේගේ පැවිදි සහ ගිහි ශ්‍රාවකයන් සුළු පිරිසකගේ ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා වේ. මෙම එක් එක් විශේෂ ධර්ම දේශනා සහ ධර්ම සාකච්ඡා සූත්‍රයක් වශයෙන් හැඳින් වේ. සූත්‍ර යනු තන්තුවක් හෝ ලණුවක් යන්නයි. එයට හේතුව තන්තුවක් එකට ඇතිල්ලීමෙන් ඇතිවන ශබ්දයෙන් වචන ලැබෙන අතර, වචන එකට එක්වීමෙන් අර්ථය ඇති වේ. මෙම සූත්‍ර ගොඩවල් හෝ නිකායන් පහකට සකස් කර ඇත. පස් වැන්න වෙන්වූ ග්‍රන්ථ දහතුනකින් සමන්විත වේ. මෙම ග්‍රන්ථ සමහරක භාෂාව, අන්තර්ගතය සහ ශෛලිය

අනුව, ඒවා පළමු එකතු හතරේ මූලික කරුණුවලට වඩා පසුකාලීනව රචනා වූ ඒවා බව නිගමනය කළ හැකිය. සැබැවින්ම ඒවා බොහොමයක් බුදුපියාණන් වහන්සේ දේශනා කළ ඒවා යැයි කිව නොහැකිය. ගොඩවල් හතර පුරා විසිරී ඇත්තේ සමහර විට, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂයක් හෝ දෙකකට පසු කාලවල තිබූ සමහර සූත්‍රයි. නමුත් පළමුව සඳහන් කළ ආකාරයට, බොහෝදුරට ඒවා සාමාන්‍යයෙන් පහසුවෙන් හඳුනාගත හැකිය.

ත්‍රිපිටකයේ දෙවන කාණ්ඩය වන විනය පිටකයේ අන්තර්ගත වන්නේ භික්ෂූන් සහ භික්ෂුණීන් සඳහා නීති රීති සහ පැවිදි ප්‍රජාව පාලනය කිරීම සඳහා වන අණපණත් සහ පැවිදි ප්‍රජාව පිළිබඳ මුල්කාලීන ඉතිහාසය සම්බන්ධ කෙටි තොරතුරුයි. විනයේ පැරණිතම කොටස හඳුන්වන්නේ පාතිමොක්ඛ යනුවෙනි. එය සියලු නීති පිළිබඳ ලැයිස්තුවකි. නමුත් මෙය අටුවාවක නීති, එකින් එක වශයෙන් පැහැදිලි කරමින් අන්තර්ගත වේ. මෙම අටුවාවේ කොටස් මුල් කාලයේ ඒවා වන අතර, අනෙක් කොටස් සමහර විට, ශතවර්ෂයක් හෝ ඊට පසු රචනා කරන ලද ඒවායි.

අභිධම්ම පිටකය බුදුපියාණන් වහන්සේගේ අත්‍යවශ්‍ය අංගවලට සංක්ෂේප වේ. ඒවා බොහෝ සෙයින් ලැයිස්තු ස්වභාවයෙන් යුක්ත වේ. එසේ කර ඇත්තේ ධර්මය වඩා පහසුවෙන් මතක තබා ගැනීම පිණිස සහ සමහර විට වඩා පහසුවෙන් ඉගැන්වීම පිණිසය. අභිධම්ම පිටකය සමහර විට බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වසර දෙසියකට පමණ පසු ආරම්භ වූ එකකි. නමුත්, සූත්‍ර පිටකයේ සඳහන් ආකාරයට පරස්පර වූ කිසිවක් ඇතුළත් නොවේ. ධර්ම කූඩා යනුවෙන් හැඳින්වීමට හේතුව ඒවා ශතවර්ශ ගණනාවක් සම්ප්‍රේෂණය වූයේ වාචිකව නිසාය. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී ලිඛිතව කටයුතු සිදු වූයේ නැත. පැරණි ඉන්දියාවේ කම්කරුවන් පස්, වැලි හෝ ගොඩනැගිලි ඉදිකිරීමේ භාණ්ඩ ගෙන ගියේ, විශාල, රවුම්, නොගැඹුරු කූඩා මාරුවෙන් මාරුවට යවමින්ය. කම්කරුවෙකු පුරවන ලද කූඩය තම හිස මත තබාගෙන ඊළඟ කම්කරුවා වෙතට ගොස් ඔහු අත තබයි. එම පුද්ගලයා මෙම ක්‍රියාවලිය නැවත කරයි. එබැවින් මුල්කාලීන බෞද්ධයන්ගේ මනසේ රැඳි එක් පුද්ගලයෙකුගේ හිස මතින් ද්‍රව්‍ය කූඩා තවත් කෙනෙකු මතට යැවීම, ධර්ම ග්‍රන්ථ එක් පුද්ගලයෙකුගේ මතකයෙන් තවත් කෙනෙකුට යැවීම හා සමාන වේ.

ත්‍රිපිටකය ලියැවී ඇත්තේ පාළි භාෂාවෙනි. එය ඉන්දියානු ආර්ය ප්‍රක්රිට් හෝ විශේෂඥයන් සඳහා නොවන, පැරණි භාෂාවකි. එහි ආරම්භය සිදුවී ඇත්තේ අනුමාන වශයෙන් බුදුපියාණන් වහන්සේගේ කාලයේ උතුරු ඉන්දියාවේදීය. පාළි භාෂාවේ ආරම්භය සහ එහි ස්වභාවය පිළිබඳ විද්වතුන්ගේ පොදු මතය වන්නේ ''එය බුදුපියාණන් වහන්සේ කථා කළ භාෂාවට සර්ව සම නොවන බවයි. එය අයත් වන්නේ උන්වහන්සේ භාවිත කරන්නට ඇති සහ එකම සංකල්පීය පරිසරයක ආරම්භ වූ, එකම පුළුල් භාෂා කුටුම්බයකය. එම නිසා, මෙම භාෂාව බුදුපියාණන් වහන්සේ ඉපදුණු

පුළුල් ඉන්දියානු සංස්කෘතියෙන් උරුම කර ගන්නා ලද සිතුවිලි-ලෝකය පිළිබිඹු කරයි. එමනිසා ඒවායේ වචන එම සිතුවිලි-ලෝකයේ වටහා ගැනීමට දුෂ්කර සියුම් වෙනස නිරූපණය කරයි.''[5] මුල්කාලීන බුදුදහම පිළිබඳ කීර්තිමත් විද්වතෙකු වූ මහාචාර්ය රිචඩ් ගොම්බ්‍රිච් මෑතකදී මෙම තත්ත්වය පිළිබඳව තර්ක කර ඇත්තේ බුදුපියාණන් වහන්සේ පාළි භාෂාවෙන් කථා කළ බව සිතීමට තරම් ප්‍රබල හේතු ඇති බව කියමින්ය.[6] බුදුපියාණන් වහන්සේ පාළි හෝ එයට සම්පූර්ණයෙන්ම සමාන භාෂාවකින් කථා කළ බවට අපට සමහර විට කිව හැකිය.

ත්‍රිපිටකය එහි වර්තමාන ස්වරූපයට එක්තැන් කර ඇත්තේ සමහර විට ශතවර්ෂ ගණනාවක් තිස්සේ සහ එය මුල්කාලීන සහ පසුකාලීන ද්‍රව්‍යයන්ගේ සංයෝගයක් බවත් පිළිගෙන තිබීම නිසා විය හැකිය. නමුත්, මෙම ද්‍රව්‍ය හොඳින් පරීක්ෂා කිරීම සමඟ බුද්ධිමත් අනුමාන කිරීමෙනුත්, ත්‍රිපිටකය තුළ පැරණිතම ස්තරය හඳුනා ගැනීම කළ හැකිය. එවැනි ප්‍රවේශයකින් හෙළි වන්නේ සුත්ත නිපාතයේ ප්‍රධාන ද්‍රව්‍ය සහ විනය පිටකයේ කොටස් බුදුපියාණන් වහන්සේගේ කාලයේ සිට, සමහර විට උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පරම්පරාවක් හෝ දෙකක් තෙක් දිවෙන බවයි.

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ශතවර්ෂ ගණනාවක් වාචිකව සම්ප්‍රේෂණය වූ නිසා, උන්වහන්සේ පිළිබඳව අර්ථවත් කිසිවක් දැන ගැනීම ඉතා අපහසු බවට උපකල්පනය කර ඇත. සමහර අය පවසන්නේ එය කළ නොහැකි දෙයක් බවත්ය. නමුත් අවශ්‍ය කාරණාව මෙය නොවේ. ලිඛිත තොරතුරු, මතකයට වඩා නිවැරදිව සම්ප්‍රේෂණය වන බව පොදුවේ සිතනු ලැබේ. නමුත්, සාක්ෂිවලින් පෙන්වා දෙන්නේ වෙනත් දෙයකි. ග්‍රන්ථ මුද්‍රණය ආරම්භ කිරීමට පෙර, ඒවා අතින් පිටපත් කිරීම සහ ලිවීම සිදු කළ අතර, එයින් බොහෝ විට ඔවුන්ගෙන් ප්‍රමාද දෝෂ සිදුවිය. කාලයත් සමග එක් ග්‍රන්ථයක් තවත් එකකින් පිටපත් කරන විට ප්‍රමාද දෝෂ කෙතරම් වැඩි වූයේද යත්, සමහර විට මුල් කෘතියේ කුමන කොටස්ද යන්නවත් අදහස් කර ගැනීම දුෂ්කර විය. වඩාත් බැරෑරුම් ලෙස, එක් තනි ලියන්නෙකුට ඊළඟ පිටපතේ ඇතුළත් කරන දෙයක්, ඔහු විසින් පිටපත් කරන උද්ධෘතයන් මකන්නට හෝ එකතු කරන්නට ඉඩ ඇත. එයින් වෙනස්කම් නොකළ අත්පිටපත් සමග සසඳන විට ව්‍යාකූලතා පැන නැගිය හැකිය.

අනෙක් අතට මිනිස් මතකය කුඩා කල සිටම පුහුණු කර ඇත්නම්, සහ සියලු අවධානය වෙනතකට යොමු කරන ලෝකයක අප විසින් දැඩි ලෙස උත්සාහ උත්සාහ ගන්නේ නම්, ඉතා නිවැරදි විය හැකිය. ඉන්දියාවේ පැරණි වෛදික ආගමේ බ්‍රාහ්මණ පූජකයන් කළේ මෙයයි. බ්‍රාහ්මණ පිරිමි දරුවන් කුඩා අවධියේ සිටම වෛදික ගීතිකා ඔවුන්ගේ මතකයේ ධාරණය

[5] Bodhi, 2005, p.10
[6] Gombrich, 2018.

වන තුරුම නැවත නැවත පුනරුච්චාරණය කිරීමට පුහුණු කරන ලදී.[7] බ්‍රාහ්මණයන්ගේ විවිධ උත්සවවලදී, ආගමික සභාවලදී ගීතිකා සජ්ඣායනය කළ අතර, එක් පුද්ගලයෙකුට පදයක් මගහැරුනත්, හෝ වැරදියට උච්චාරණය කළත්, අනෙක් අයගේ සජ්ඣායනය තුළින් ඔහුගේ මතකය ඉදිරියට එනු ඇත. නැතහොත් නිවැරදි වනු ඇත. එසේම, පුද්ගලයෙකුට ග්‍රන්ථය සමථයකට පත් වූ විට හෝ 'වසා දැමූ පසු' එයට යමක් එකතු කිරීම හෝ මකා දැමීමට නොහැකි වනු ඇත. එසේ කිරීමට පුළුල් කුමන්ත්‍රණකාරී වැඩපිළිවෙළක් අවශ්‍ය වනු ඇත. ඒ ග්‍රන්ථ පූජනීය යැයි සලකන නිසා කිසිවෙකු එවැනි දෙයක් කිරීමට එඩිතර නොවනු ඇත.

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෝ සැලකිය යුතු ප්‍රමාණයක් බ්‍රාහ්මණ කුලයේ අය වූහ.[8] ඔවුහු මෙම කුසලතාවන් ඔවුන්ගේ නව ආගමට ගෙන ආහ. කෙනෙකු භික්ෂුවක් බවට පත්වූ විට, ඔහු සජ්ඣායනය කරන ලද ධර්මදේශනාවලට සවන් දී ඒවා ක්‍රමයෙන් මතකයට නගා ගනු ඇත. එසේම ත්‍රිපිටකය බවට පත් වූ විවිධ ධර්ම කොටස් ඉගෙන ගැනීමේ විශේෂ කුසලතා සමහර පැවිදි පිරිසට තිබූ බව දැනගන්නට ලැබුණි. බුදුපියාණන් වහන්සේගේ ධර්මදේශනා ආරක්ෂා කර ගැනීමට උපකාර වීම සඳහා, ඒවා මතකයට වඩාත් නතුවනසුලු ආකාරවලින් සංස්කරණය කරන ලදී. ඒවා අංක යොදන ලද, ආකෘතික උද්ධෘතයන්, සම්මතයකට අනුව නිශ්චය කරන ලද නාමාවලි, රිද්මයානුකූල පැදි, සහ සියල්ලටම වඩා, පුන පුනා කීම් වැනි මතකයට නගා ගත හැකි උපාංගවලින් පිරී ඇත. වර්තමානයේ බෞද්ධයන්ට වඩාත් වෙහෙසකර කියැවීම් ලෙස දැනෙන්නට මෙය එක් හේතුවකි.[9] මෙම සංස්කරණය කිරීම් බුදුපියාණන් වහන්සේගේ ධර්මදේශනා තරමක් කෘත්‍රිම සහ අස්වාභාවික ස්වරූපයක් ගන්නට හේතු වූ නමුත්, උන්වහන්සේ ඉගැන්වූ දේවල අරුත ආරක්ෂා කරන අතරම, සමහර විට සම්පූර්ණයෙන්ම උන්වහන්සේ කථා කළ වචනම විය යුතුය. කාලය සහ නැවතත් ත්‍රිපිටකයේ වැකිකඩ සහ කෙටි උද්ධෘතයන් කියවන විට ප්‍රකට වන්නේ සැබෑ පුද්ගලයෙකු පවසන ස්වභාවික, වෙනසක් නොවූ සහ ස්වකීය දෙයක් ලෙසය. එමනිසා, ත්‍රිපිටකයේ අඩංගු ප්‍රධාන ද්‍රව්‍ය බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ සහ උන්වහන්සේගේ ඍජු ශ්‍රාවකයන් විසින් මතකයට නගා ගත් සහ ආසන්න පරම්පරාව උරුමකර ගත්, නිවැරදි වාර්තාව නොවේ යැයි සැක කිරීමට හේතුවක් නැත. පාදක වූ කරුණු හා සම්බන්ධ විස්තරාත්මක පොදු සමාලෝචනයක් සහ පාළි ත්‍රිපිටකය පිළිබඳ විශ්වාසය සඳහා සාක්ෂි විමසීමට පාඨකයාට *The Authenticity of the Early Buddhist Texts* by Bhikkhu Sujato and Bhikkhu Brahmali කියවීම සුදුසු වේ.

පාළි ත්‍රිපිටකයේ විශ්වාසවන්ත භාවය පිළිබඳ කරුණු සම්බන්ධයෙන් සවිස්තරාත්මක සමීක්ෂණයක් සඳහා පාඨකයාට උපදෙස් ලබා ගැනීමට

---

[7] On the accuracy attainable through this training see Bronkhorst 2002 pp. 797-801, and Analāyo 2011, pp.867 ff.
[8] Rhys Davids, Vol. I, 1913, p. xxviii
[9] On editing the suttas in order to aid memory see Anālayo 2011, pp.14 ff.

විමසන්න. *The Authenticity of the Early Buddhist Texts* by Bhikkhu Sujato and Bhikkhu Brahmali කියවීම සුදුසු වේ.

බුදුපියාණන් වහන්සේ පිළිබඳ භෞතික සාක්ෂි අල්පය. ක්‍රි. පූ. 249දී ඉන්දියානු අගරජ අශෝක උන්වහන්සේගේ උත්පත්තිය සිදුවූ ලුම්බිනියට වන්දනා කළේය. ඔහු එහි ශිලාලේඛනයක් සමග විශාල ගල් කුළුණක් ඉදි කළේය. ශිලාලේඛනයේ මෙසේ සඳහන් වේ

> ''මෞලි මංගල්‍යයෙන් වසර විස්සකට පසු, දෙවිවරුන්ට සෙනෙහැති, පියදස්සි රජතුමා, (එනම් අසෝක) මෙම ස්ථානයට පැමිණ වන්දනා කළේය. එයට හේතුව ශාක්‍යයන්ගේ ප්‍රාඥ බුදුපියාණන් වහන්සේගේ උපත සිදුවූයේ මෙතැනයි. ඔහු මෙතැන ගල්වලින් රූපයක් සහ කණුවක් ඉදි කරන ලදී. ඒ බුදුපියාණන් වහන්සේගේ උපත සිදුවූයේ මෙතැන නිසාය. ඔහු ලුම්බිනී ගම්මානය බදු ගෙවීමෙන් නිදහස් කරන ලදී. ගෙවීමට අවශ්‍ය වූයේ නිෂ්පාදනයක මිලෙන් අටෙන් එකක් පමණි.''

ත්‍රිපිටකයෙන් පිටත බුදුපියාණන් වහන්සේ පිළිබඳව සඳහන් වූ මුල්ම පිළිගත් සඳහන එයයි. තවත් සාක්ෂියක් නම් බුදුපියාණන් වහන්සේගේ උපන්බිම වූ කපිලවත්ථුවේ පිප්රාව යන ස්ථානයේ තිබූ ස්තූපයකින් හමුවූ උපහාර සටහනක් සහිත පූජනීය කරඬුවයි. එම සටහනේ මෙසේ සඳහන් වේ: ''ශාක්‍යය වංශික බුදුපියාණන් වහන්සේගේ පූජනීය කරඬුව (පූජා කරන ලද්දේ) සුකිර්ති සහෝදරයන් සමග සහෝදරියන්, පුත්‍රයන් සහ බිරින්දෑවරුන් එක්වයි.'' අවාසනාවට, පොදුවේ පැරණි ඉන්දියානු වාර්තා සමග කලකිරීමට පත්වන පරිදි, මෙම සෙල්ලිපියේ යුගය පිළිබඳව විද්වතුන් අතර මතභේද පවතී. එහි අක්ෂර වින්‍යාස අධ්‍යයනයට අනුව, සමහර අය විශ්වාස කරන්නේ එය අශෝකගේ ශිලාලේඛනවලට වඩා මුල් කාලයේදී සිදු වූ එකක් බවයි. නමුත්, තවත් අය සලකන්නේ සමකාලීන හෝ ඊට පසුව සිදුවන්නට ඉඩ ඇති බවයි. ජූරිය තවමත් රහසකි.[10]

තවත් සාක්ෂියක් නම්, මෙය මෛත්‍රාය උපනිෂදය හෙළා දකින උද්ධෘතයෙන් සාක්ෂියක් විය හැකිය. ''... තාර්කික තර්කවලින්, උදාහරණ සහ ආත්මයක් නැතැයි කියන වංචාකාරී ධර්මයක රැවටිලි, සහ වේදයට විනාශකාරී ධර්මයක් උගන්වමින් අනෙක් අය හරවා ගන්නා, සහ දුඹුරු පැහැ චීවර හැඳගත් ...''[11] මෙම උපනිෂද් බුදුපියාණන් වහන්සේට පසුව ආරම්භ වුවත්, එම කාලය බොහෝ කාලයකට පසුව නොවේ. එයින් විස්තර

---

[10] A great deal has been written about the Lumbini and Piprawa inscriptions and the identification of Kapilavatthu in the last hundred years. Good representatives of the research are Fleet 1906; Allen 2008; Falk 2017; Milligan 2019; and The Piprawa Project at http://www.piprahwa.com/home

[11] 7.8-9 condenced. See also Jayatilleke p.66-68.

කරන්නේ බුදුදහම සහ බෞද්ධ භික්ෂූන් පිළිබඳව බව පෙනේ. මේ දෙකින්ම බුදුපියාණන් වහන්සේගේ මෑත කාලීන පැවැත්ම ගම්‍ය වේ.

බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ කාලානුක්‍රම වශයෙන් සැලසුම් කළ විස්තරයක් ඇත. උදාහරණයක් වශයෙන්, මැතිව්ගේ ශුභාරංචිය හෝ *De Vita Caesarum*යේ ඔගස්ටස් අධිරාජයා, ත්‍රිපිටකයේ නැත. කෙසේ නමුත්, මෙවැනි ආකාරයට යමක් රචනා කිරීමට උත්සාහයක් ගෙන ඇති නමුත්, යම් හේතුවක් නිසා එය කිසිදා සම්පූර්ණ කර නැත. විනය පිටකයේ පළමුවැන්න පිළිබඳව විස්තරයක් ඇතුළත් කර ඇත. ඒ උරුවෙලාවේදී සිදුවූ බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය සමග උන්වහන්සේගේ ප්‍රගමනය ආරම්භයේ සිට සාරිපුත්ත සහ මොග්ගල්ලාන හිමිවරුන් උන්වහන්සේගේ අග්‍ර ශ්‍රාවකයන් බවට පත්වීමේ සංවාදය සහ පැවිදි කිරීම තෙක්ය.[12] එසේම, දීර්ඝතම ධර්ම දේශනාව සූත්‍ර පිටකයේ සටහන් වන්නේ බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ සිදු වූ සිද්ධීන් පිළිබඳවයි. ඒ උන්වහන්සේ මාස දොළසකට පසු කුසිනාරාවේදී පරිනිර්වාණයට පත් වන්නට රජගහ නුවරින් බැහැරවූ කාලයේ සිටයි. මෙම තොරතුරු දෙකෙන් දක්වන්නේ මේ කාරණය පිළිබඳව විද්වතුන්ගේ මතයක් තිබියදීත්, පැරණි බෞද්ධයන්ට ඉතිහාසය පිළිබඳව අවබෝධයක් තිබූ බවත්, බුදුපියාණන් වහන්සේ පිළිබඳව එක් විශේෂිත කාලයක විචිත්‍රව විස්තර කරන්නට සහ ඒ ආකාරයෙන් හඳුනා ගැනීමට බලාපොරොත්තු වූ බවත්ය. සැබැවින්ම, ඓතිහාසික සිද්ධින් විස්තර කිරීමට සහ එක් අඛණ්ඩ තර්කාන්විත කතන්දරයක් රචනා කිරීමට ඉන්දියාව ගත් උත්සාහයන් ත්‍රිපිටකයේ සඳහන් මුල්ම උදාහරණ දෙකයි.[13]

කෙසේ නමුත්, දශක හතරකට වඩා වැඩි කාලයකදී බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනය තුළ සිදුවීම් සිදු වූ විට ඒවා මෙම විස්තර දෙක අතරේ ඇතුළත් කිරීම මුළුමනින්ම වාගේ දුෂ්කරය. මෙයට අමතරව, බුදුපියාණන් වහන්සේ වයස තිහේදී ඔබ මොබ යන තවුසෙකු බවට පත්වන්නට පෙර, ජීවිතය පිළිබඳ කිසිවක් ත්‍රිපිටකයේ සඳහන් නොවේ. ඒ නිසාවෙන්, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දේ පිළිබඳව, උන්වහන්සේ ඉගැන්වූයේ කොහේද, ඉගැන්වූයේ කාටද, සමහර විට ඒවා ඉගැන්වීමට පොළඹවූ හේතූන් සහ සිදුවීම් ආදිය අප හොඳින් දන්නා නමුත්, උන්වහන්සේගේ ජීවිතයේ නිශ්චිතවම ඒවා සිදුවූයේ කවදාද යනාදිය පිළිබඳව අප දන්නේ ඉතා ස්වල්පයකි. එම නිසා උන්වහන්සේගේ උපතේ සිට පරිනිර්වාණය දක්වා ජීවන චරිතාපදානයක් ලබා ගැනීම කළ නොහැකිය.[14]

[12] Vin.I,1-44

[13] Hinüber, 2006, p.197

[14] Bv-a. 4 includes a list of all the places where the Buddha stayed during the yearly rainy season retreat during the first twenty years of his career. Although this text dates from the fifth century CE some of the material in it may be much earlier, and I suspect this list is mostly authentic.

නමුත් ජීවිත චරිතාපදානයන් යනු හුදෙක් කාලානුක්‍රමයට සූදානම් කළ සිද්ධීන්වල විස්තරයකට වඩා වැඩි දෙයකි. ඒවායේ ඔවුන්ගේ විෂය ට අනුබද්ධ පුද්ගලයාගේ චරිතය, පුරුදු, ආකල්ප, ජයග්‍රහණයන් සහ අනෙක් අය සමග ඇති සම්බන්ධතා ද ඇතුළත් කරයි. එවැනි දේවල් පිළිබඳ බොහෝ තොරතුරු ත්‍රිපිටකයේ ඇතුළත් වේ. සමහර විට පැරණි කාලයේ සිටි තවත් ඕනෑම පුද්ගලයෙකු පිළිබඳව තොරතුරු එහි ඇතුළත් වේ.

මෙම තොරතුරු බොහොමයක් අදහස් දැක්වීමේ කෙටි විසිතුරු රචනයන්, කෙටි අවස්ථාවෝචිත විග්‍රහයන් සහ අනියම් ප්‍රකාශවල ස්වරූපයෙන් තිබුණි. ඒවා වඩාත් අවධානය ගත්තේ ඒවායෙන් බොහොමයකට ධර්මය හෝ මතවාද පිළිබඳව වටිනාකමක් නොතිබූ නිසාය. එම නිසා, බුදුපියාණන් වහන්සේ පිළිබඳව දැන සිටි සහ උන්වහන්සේ සමග අන්‍යෝන්‍යව ක්‍රියා කළ මිනිසුන්ගේ අවංක මතකයන් විය හැකිය. මෙම කරුණු සියල්ල එකට ගත් කල බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දේවල්වලින් උන්වහන්සේ පිළිබඳව නිගමනය කළ හැක්කේ, උන්වහන්සේ සම්බන්ධයෙන් පුදුමාකාර තාත්වික සහ සම්පූර්ණ පිළිරුවක් ලබාදෙන බවයි.

සැබෑ පුද්ගලයෙකු වූ බුදුපියාණන් වහන්සේට අධි ප්‍රමාණ හැකියාවන් ආරෝපණය කරමින් සමහර ඡේදවල තොරතුරු සැපයීම ත්‍රිපිටකයේ වටිනාකම සම්බන්ධයෙන් සැක මතු කරන එක් කරුණක් වේ. මෙයට උදාහරණ නම්, ධ්‍යාන බලයෙන් ඉහළ පාවීම, දුරබැහැරින් සංවාද ඇසීමේ හැකියාව, මිනිසුන්ගේ මනස කියවීම, සහ දිව්‍ය ලෝකවලට සංචාරය කිරීම සහ දෙවිවරුන් සමග සංවාදයේ යෙදීම ආදියයි. මෙම සිදුවීම්වලින් සමහරක් පසුකාලීනව අලංකාර කර ඇති බව නිශ්චිතයි. නමුත් බුදුපියාණන් වහන්සේ සමග අන්‍යෝන්‍යව කටයුතු කළ මිනිසුන් බොහොමයක් අවංකව විශ්වාස කළේ උන්වහන්සේගෙන් එවැනි බලයන් විද්‍යමානවනු දුටු බව විය හැකිය. ප්‍රභාසම්පන්න පුද්ගලයන්ට මනුෂත්වය ඉක්මවූ හෝ අඩු තරමින් සුවිශේෂී හැකියාවන් ඇති බවට හොඳින් දන්නා කරුණකි. බුදුපියාණන් වහන්සේට පෞද්ගලිකව බොහෝ අනුගාමිකයන් ආකර්ෂණය කරගැනීමේ ජන්ම කුසලතාවක් තිබූ බවට සැකයක් නැත. [15] පසුකාලීන විසිතුරු කිරීම් සම්බන්ධයෙන් ගත් කල, අධිසාමාන්‍ය සංසිද්ධි කොටසක්වූ ලෝක දැක්මක් ඔවුහු ප්‍රකාශ කරති. සැබැවින්ම, ත්‍රිපිටකයට එවැනි තොරතුරු ඇතුළත් කිරීමට හේතු වශයෙන් මෙම ලෝකය පිළිබඳ සංකල්පනයන් අර්ධ වශයෙන් වගකිව යුතු විය හැකිය. මෙයින් ලැබිය හැකි කීර්තිය පෙරකී ලෙස ධර්මදේශනා තුළින් අදාළ ප්‍රේක්ෂකයන් හමුවේ තැබීම ඔවුන් ඒ තැන සිටින්නේ ඇයිද යන්න පැහැදිලි කිරීමට ප්‍රමාණවත් වේ. මෙම මූලද්‍රව්‍යවල

[15] Max Weber, *The Theory of Social and Economic Organization*,1947, pp.328, 358ff

පැවැත්ම ත්‍රිපිටකයේ ඇති මූලික ද්‍රව්‍ය සම්ප්‍රේෂණය විශ්වාස කළ නොහැකි යැයි සිතීමට හොඳ හේතුවක් නොවේ.[16]

[16] (A paraphraseof Sujato and Brahmali, 2014, p.112)

# 2. නව අත්දැකීමකින් යුක්ත යුගයක්

මායිම් නගරයක් වන කජඞගල සහ ඒ අසළ නැගෙනහිර දෙසින් පිහිටි මහාසාල සහ ගිනිකොණ දෙසින් පිහිටි සල්ලවතී ගඟ දක්වා මජ්ඣිම දේශය විහිදී ඇත. දකුණේ සෙතකණ්ණික නගරයට, බටහිරෙන් ථූන බ්‍රාහ්මණ ගම්මානය සහ උතුරේ උසීරද්ධජ කඳුකරය මජ්ඣිම දේශය විහිදේ. විනය 1, 197

බුදුපියාණන් වහන්සේ උපත ලැබීමෙන් පසු මුළු ජීවිතයම ගත කළේ එවකට එම ප්‍රදේශයේ ජීවත් වූ මිනිසුන් හැඳින් වූ මජ්ඣිම දේශයේය (මජ්ඣිම දේස). මෙම ප්‍රදේශය දළ වශයෙන් නූතන උතුරු ඉන්දියානු ප්‍රාන්ත වන බිහාර් සහ උත්තර් ප්‍රදේශයට සමාන ප්‍රදේශයකි. ක්‍රි. පූ. හත්වන ශතවර්ෂයේදී පමණ මෙම කලාපයේ ජීවිතයේ සෑම අංශයකටම තියුණු ලෙස බලපාන අයුරෙන් සොයා ගැනීමක් සිදුවුණි. වර්තමානයේ උතුරු ජාර්ඛන්ඩ් සහ අග්‍රා සහ ග්වොලියර් කඳුකරය අතර යකඩ සොයාගනු ලැබුණි. මෙම ලෝහය වසර සිය ගණනකට පෙර ඉන්දියාවේ දැන සිටිය නමුත්, දැන් සොයාගත් ලෝහය මතුපිටට වඩා සමීප වන අතර, එය ගුණයෙන් වඩා ඉහළ වේ. ඒ නිසා පතල් කැණීමට සහ ලෝපස් උණු කිරීමටද වඩා පහසු වේ. දැන් සෑම ගොවියෙකුටම ඔහුගේ නගුල භාවිත කළ නොහැකි අවස්ථාවල, පොළොව පෙරළීම සඳහා යකඩ උදැල්ලක් හෝ ඉස්කෝප්පයක් ඔහුගේ උදැල්ල මත යකඩ තොංගලක් තබා ගත හැකිය. යකඩ දෑකැති අස්වැන්න නෙළා ගැනීමේදී භාවිත කිරීමෙන් ශ්‍රමය වැය කළ යුත්තේ අඩුවෙනි. යකඩ ඇණ ලීවලින් නිම කරන නිර්මාණ වඩා හොඳට වාත්තු කරයි. වඩාත් වැදගත් දෙය නම්, මජ්ඣිම දේශයේ වැඩි ප්‍රමාණයක් ආවරණය වන වනාන්තර වඩා කාර්යක්ෂමව ඉවත් කිරීමෙන් කෘෂිකර්මාන්තය සඳහා වැඩි ප්‍රමාණයක් විවෘත වීමයි. මේ කාලය වන තෙක් මජ්ඣිම දේශයේ ජනාවාස බොහොමයක් කුඩා හෝ ගංගා ආසන්නයේ තිබුණි. දැන් ඒවා ක්‍රමයෙන් විශාල වී ආසන්න ප්‍රදේශය මතුවන්නට පටන් ගත්තේය. කලක් ගෝත්‍රිකයන් සහ දඩයම්කරුවන් පමණක් සැරිසැරූ ප්‍රදේශයේ දැන් කෘෂිකාර්මිකයෝ පදිංචිවී කෙත්වතු දැමූහ. මෙම ජනාවාස බොහොමයක් ස්වභාවිකව වර්ධනය වූ නමුත්, රජවරුන් ඔවුන්ගේ රාජධානි දියුණු කිරීම සඳහා ගම්මාන පිහිටු වූ බවට සාක්ෂි ඇත. එක් ග්‍රන්ථයක සටහන් වී ඇත්තේ එක් රජ කෙනෙකු ජලාශයක් කැණීම් කරවා, කුටි ඉදිකර, ගොවීන් එතැනට වෙනත් තැනකින් පදිංචි කළ බවයි. අලුත් පදිංචිකරුවන්ට වන්දනා කිරීම සඳහා බෝ වෘක්ෂයක් අසල භූමිය වටා පොළොව වෘක්ෂයේ අතු විහිදෙන තාක් දුරට මට්ටම් කර, ඊට පසු එතැන ආරුක්කු දොරටු සහිත වැටකින් වට කර ඇත.[1] මෙම වෙනස්කම්වල ශුද්ධ ප්‍රතිඵලය වූයේ විශාල ආහාර අතිරික්තයක් සහ එහි ප්‍රතිඵලයක් ලෙස ජනගහනයේ වර්ධනයක් ඇති වීමයි. ඒ අනුව කුඩා ජනාවාස ගම්මාන, ගම්මාන, නගර සහ නගර පුරවර බවටත් වර්ධනය විය.[2]

[1] Ja. V,511. *Arthaśāstra* II,1,1-4 details how the setting up of new villages was to be done.
[2] Dyson, 2018 p.37 gives an approximation of the population of some of these cities in about 100 CE.

මීට වසර දහසකට පෙර, මොහෙන් ජෝ - ඩාරෝ, හරප්පා සහ රාඛිගර්හි සිට පළමු වරට විශාල ජනගහන මධ්‍යස්ථාන උතුරු ඉන්දියාවේ ස්වභාවික දසුන් පිළිබඳ අංගයක් බවට පත් විය.

බුදුපියාණන් වහන්සේ කුසවතී නම් වූ මිථ්‍යා පරමාදර්ශී නගරයක් විස්තර කළේ ''නැගෙනහිර සිට බටහිරට යොදුන් දොළසක් දිග සහ උතුරේ සිට දකුණට යොදුන් හතක් පළළ'' යනුවෙනි. එය පොහොසත්, සහ සමෘද්ධිමත් ජනාකීර්ණ, මිනිසුන්ගෙන් පිරුණු සහ ආහාරවලින් බහුල විය... ඇතුන්, අශ්වයන්, අශ්ව රථ සහ බෙර, තබ්ලා සහ වීනා, ගායනා, සිම්බල සහ සීනු, සහ 'කන්න, බොන්න සහ ප්‍රීති වන්න' යන හඬින්'' දිවා රාත්‍රියේ ශබ්ද දහයකින් දෝංකාර විය.[3] මෙම විස්තරය මනඃකල්පිත වුවත්, පැහැදිලිවම පදනම් වී ඇත්තේ, බුදුපියාණන් වහන්සේ දන්නා හඳුනන ප්‍රධාන නගරයක් විය හැක්කේ කුමක්ද යන්න මතය. සමහර විට අතිශයෝක්තියට නැංවූවත්, ධනවතුන් එවැනි ස්ථාන පිහිටුවා ඇති බවට සැකයක් නැත.

ග්‍රන්ථවල නගර ආරක්ෂක පවුරු හෝ බිත්ති සමග කුලුනු සමගින්, සහ ගේට්ටු සහ සමහර විට ඒ වටා දිග අගල් ඇති බවට විස්තර කර ඇත.[4] ගේට්ටු මුරකරුවන්, නගරයට ඇතුළුවන සෑම දෙනාම සියුම් පිරික්සුමට ලක් කරනු ලැබේ. එසේම ඔවුහු මුරසංචාරයේද යෙදෙති. ඒ කිසිම කෙනෙකුට රාත්‍රියේදී රිංගා යාමට හෝ නොහැකි වන බවට සහතික කර ගැනීමටයි.[5] නැගෙනහිර ගේට්ටුව සාමාන්‍යයෙන් වඩාත් වාසනාවන්ත එක සේ සලකනු ලැබූ නිසා එය නගරයට ඇති ප්‍රධාන ප්‍රවේශය විය. වඩාත් අවාසනාවන්ත දකුණ වීමෙන් එයින් ඔබ්බෙහි කුණු දැමීම, මළමිනී ගොඩ ගැසීම හෝ ආදාහන භූමිය සහ මරණ දඬුවම් පැමිණවීම් සිදු කරන ලදී. ගේට්ටු සාමාන්‍යයෙන් නම් කරනු ලැබුවේ ඒවා විවෘත කරන ගමනාන්තය අනුවය.[6] නගරයක තිබෙන සමහර ප්‍රසිද්ධ ගොඩනැගිලි අතරට රජමාලිගාව, භාණ්ඩාගාරය, බදු කාර්යාලය සහ වෙළඳපොළ ද ඇතුළත්ය. ඕනෑම නගරයක හෝ පුරවරයක ඉතාම වැදගත් පොදු ගොඩනැගිලි වූයේ මහ නගර සභාවට අයත් ශාලාවන්ය. ඒවා සාමාන්‍යයෙන් වේදිකාවක් මත විවෘත කුලුනු ව්‍යූහයකින් සමන්විත විය. සංකේතමය වශයෙන්, සෑම නගර දොරටුවක් අසල, නගරය මධ්‍යයේ සහ රජමාලිගයට ප්‍රවේශවන ස්ථානයේ ද දාන ශාලා තිබුණි. ඉතාම අවම ශාලාවකද  බංකු සහ ජල බඳුන් තිබුණි.[7] මංගල්‍යමය උත්සවවලදී හෝ ආගමික උත්සවවලදී මෙම ශාලාවලින් දුප්පතුන්ට, අගහිඟකම් ඇති අයට සහ ඔබ මොබ යන පූජ්‍ය පක්ෂයට දාන

---

[3] D.II,170. A yojana is about 12 km, see Srinivasan, p. 25 ff.
[4] S.IV,194
[5] . IV,194; V,160; D.II,83.
[6] Agrawala, p.141.
[7] Ja.I,199.

බෙදා දෙන ලදී. එසේම ඔවුහු නවාතැන් පහසුකම් නැති සංචාරකයන්ට සහ එතැන පසුකර යන පූජ්‍ය පක්ෂයට නවාතැන් පහසුකම් ලබා දුන්හ. සමහර ශාලා ආගමික සංවාද පැවැත්වීමේ හමුවීම් පොළක් වශයෙන්ද පවත්වා ගෙන යාමට අවස්ථාව ලබා දෙන ලදී. කෝසලයේ මල්ලිකා දේවිය එවැනි ශාලාවක් මෙවැනි උත්සව සඳහා සහභාගි වීම පිණිස කරවන ලදී. විවිධ නිකායන්වල භික්ෂූන් තුන්සියයකට එවැනි අවස්ථාවක එහි රැස්වීමක් පැවැත්වීම පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ.[8]

බොහෝ සාමාන්‍ය නිවෙස් නිමවන ලද්දේ ලී, වරිච්චි සහ මැටි බදාම හෝ නොපුළුස්සනලද ගඩොල් සමගින් වූ අතර, සෙවිලි කරන ලද වහල හෝ වියදම් දැරිය හැකි අය, උළුවලින් ද වශයෙනි. බුදුපියාණන් වහන්සේ සමෘද්ධිමත් පුරවැසියෙකුගේ නිවස විස්තර කළේ ''උස් මුදුන් වහල සහිත නිවෙස, ඇතුළත සහ පිටත කපරාරු කළ සහ හොඳින් සවිකළ දොරවල් සහ පියන් පිටතට සිටින සේ නිමවා ඇත. ඇතුළත වූල් බිලැංකට් සහ කවර අතුරන ලද සහ ශෝභන මුව හමකින් වැසූ කවිච්චියක් තිබිය හැකිය. ඊට උඩින් උඩුවියනක් සහ දෙඅද්දරින් තද රතු පැහැ කොට්ට, තෙල් පහනක් සහ ස්වාමියා රැක බලා ගැනීමට බිරින්දෑවරුන් හතර දෙනෙක් ද සිටිය හැකිය.''[9] රාජගහ, වේසාලි, කෝසම්බි සහ භිත වැනි පැරණි නගර පිළිබඳව කරන ලද පුරා විද්‍යාත්මක විමර්ශනවලින් පෙන්වා දෙන්නේ නිවෙස් සංකේතවත් ලෙස එකිනෙක අතර සුළු පරතරයක් තබමින් සැමවිටම තිබූ අතර, යම් විටක ගින්නක් ඇති වුවහොත්, අල්ලපු නිවෙස විනාශ නොවෙමින් අනෙක නිදහස් කර ගත හැකි බවත්ය.[10]

ගින්දර නගර හෝ පුරවර හරහා ඇවිළීම් පිළිබඳව සඳහනක් නොමැති වුවත්, එවැනි ව්‍යසන සිදුවූ කාලවකවානු තිබෙන්නට ඇත. පෙර කී ලෙස බොහෝ ගොඩනැගිලි නිමවා ඇත්තේ ලීවලින්ය. සියලු කෑම පිසීමේ කටයුතු දර ගින්දර භාවිත කරමින් සිදු කළ අතර, රාත්‍රියේ සියලු ආලෝකය ලබා ගත්තේ ලාම්පු දැල්වීමෙන්ය. ගින්නක් ඇති වුවහොත් ඊට එරෙහිවීම සඳහා සැම නිවසකම ජල භාජන පහක් තිබිය යුතු බවට චාරිත්‍රයක්, හෝ සමහර නගර හෝ පුරවරවල නීතියක් තිබුණි.[11] වරක් කොසැම්බියේ රජමාලිගයේ කාන්තාවකගේ නිල නිවාසයට ගින්නක් ඇතිවී එයින් බොහෝ මරණ සිදු වී ඇති බව බුදුපියාණන් වහන්සේට වාර්තා විය.[12] එකල සියලු නගර පිහිටා තිබුණේ විශාල ගං ඉවුරු මත නිසා ඔවුන්

---

[8] D.I,178; M.I,2; S.V,398.
[9] A.I,137.
[10] *Arthaśāstra* III 8,13recommends a gap between houses probably for this reason.
[11] Mil. 43. This is also mentioned at *Arthaśāstra* II 36,18.
[12] Ud.79.

මුහුණ දුන් තවත් විපත්තියක් වූයේ ගංවතුරයි. පැට්නා සහ හස්තිනපුර බොහෝ වාරයක් ගංවතුර ඇති වී තිබෙන බවට සාක්ෂි පුරාවිද්‍යාව විසින් අනාවරණය කරගෙන ඇත. ඒ නිසා අවසානයේ ඒ ප්‍රදේශ ශතවර්ෂ ගණනාවකට අතහැර දමා ඇත. ගින්දර සහ ගංවතුර පවුලක වෙහෙස මහන්සිවී උපයා ගත් වස්තුවට ඇති විය හැකි උවදුරු බව බුදුපියාණන් වහන්සේ බොහෝ විට සඳහන් කිරීම පුදුමයක් නොවේ.[13]

නගරවල ඇති තවත් අංගයක් වූයේ උද්‍යාන වතුය. ඒවායින් සමහරක් පෞද්ගලික ඒවාය. අනෙක් ඒවා මහජනතාවට විවෘත විය. ස්වල්පයක් නගර අතර තිබුණි. නමුත් බොහෝ ඒවා ඔවුන්ගේ පරිසරය තුළ තිබුණි. මෙම උද්‍යානවලින් සමහරක් මල්, පඳුරු සහ ගස් අලංකාරය පිණිස රෝපණය කරන ලද ඒවාය. පොකුණු ලිලී මල් සහ නෙළුම් මල්, මල් හට ගන්නා වැල් සහිත ලියගොමු සහ බංකුවලින් අලංකාර කර තිබුණි. රාජගහ උතුරු දොරටුවට යම්තම් ඔබ්බෙන් වෙළුවනය තිබුණි. එතැනට මිනිස්සු ලේනුන් සහ මොනරුන්ට ආහාර දීම සඳහා පැමිණියහ.[14] කෙසේ නමුත්, මෙම උද්‍යාන සහ වතු බොහොමයක්, අඩු ගණනේ මිනිසුන්ට විවෘත වූ ඒවා විය. හුදෙක් කුඩා හුදෙකලා වනාන්තර විය. ඒවා උපනගර බවට ව්‍යාප්ත වීම නිසා ආරක්ෂා කරගෙන තිබුණි. එකල සිටි බොහෝ භික්ෂූන් වහන්සේලාට නවාතැන් ගැනීමට හෝ අනෙක් භික්ෂූන් හමුවී සාකච්ඡා කිරීමට පොදුවේ පිළිගත් ස්ථානයක් විය. බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ භික්ෂු - භික්ෂුණීන් වහන්සේලා එවැනි උද්‍යානයක දවස ගත කිරීම සහ මහජනයා උන්වහන්සේලා සමග සාකච්ඡා කිරීම පිළිබඳව බොහෝ සඳහන් තිබේ. කුණ්ඩලිය භික්ෂුවට අහම්බෙන් බුදුපියාණන් වහන්සේ සාකෙත අඤ්ජන උද්‍යානයේදී හමුවූ විට උන්වහන්සේ කාලය ගත කළ ආකාරය විස්තර කළහ.

> ''මා උදය ආහාර ගත් පසු මගේ පුරුද්ද වූයේ එක් උද්‍යානයකින් හෝ වත්තකින් තවත් එකකට හෙමින් ගමන් කිරීමයි. එසේ සිටින විට විවිධ ස්වාමීන් වහන්සේලා සහ බ්‍රාහ්මණයන් ඔවුන් වාද විවාදයකදී තමන්ගේ තත්ත්වය ආරක්ෂා කරමින් අනෙක් අයගේ තත්ත්වය විවේචනය කරන්නේ කෙසේ දැයි සාකච්ඡා කරනු මම නිරීක්ෂණය කරමි.''[15]

එවැනි එක් ස්ථානයක් වන රාජගහ වේළුවනාව, බුදුපියාණන් වහන්සේ අගය කළහ. ඒ එම ස්ථානය ''නගරයට වැඩියෙන් ළඟ නොවීම සහ,

[13] A.II, 68; IV,281-82
[14] M.I,145; II,1.
[15] S.V,73.

වැඩියෙන් දුර නොවීම, ඒමට සහ යෑමට පහසු, නිශ්ශබ්ද, මිනිසුන්ගෙන් හුදෙකලාවූ, බාධාවක් නැතිව ඉඳගෙන සිටීමට සහ ආධ්‍යාත්මික පුහුණුවට යෝග්‍ය වන'' නිසාය.[16] බෞද්ධ භික්ෂූන් ඇතුළුව සියලු නිකායන්වල ඔබ මොබ යන භික්ෂූන් ආශ්‍රය කළ උයන් හඳුන්වන වචනය 'ආරාම' වූ අතර, එහි ද්විත්ව අර්ථය වන්නේ අසපුව හෝ ආරාමයයි.

මෙම කාලයේදී විහාරස්ථාන නොතිබුණි. නමුත් ආගමික සිද්ධස්ථාන (චෛත්‍ය), ගස් හෝ පර්වතවල ආකෘති තිබුණු අතර, ඒවායේ දෙවිවරු හෝ භූතයන් ජීවත්වන්නේ යැයි විශ්වාස කරනු ලැබුණි. එසේම දිගු කාලයකට පෙර මියගිය ශාන්තුවරයන්ගේ හෝ වීරයන්ගේ අළු මත මැටියෙන් කළ ගොඩැලි (ථූප, සංස්කෘතයෙන් ස්තූප) ඔසවා ඇත. ජෛනයන්ගේ නායක මහාවීරගේ අළු ස්තූපයක තැන්පත් කර ඇත. [17] මුණ්ඩ රජු ඔහුගේ රැජිනගේ අළු මත ස්තූපයක් කරවූයේය. සමහර විට ඔහුට ඇය කෙරෙහි මහත් ආදරයක් සහ සැලකිල්ලක් තිබෙන්නට ඇත. වේසාලියේ නගරය වටා හතර දිසාවේම සහ නගරය තුළ තවත් එවැනි බොහෝ සිද්ධස්ථාන තිබුණි. බුදුපියාණන් වහන්සේ වරක් රාජගහ මණිමාලක චෛත්‍ය වෙත වැඩියහ. එහි මණිභද්ද භූතයා ජීවත් වන්නේ යැයි විශ්වාසයක් ඇත.[18] මෙම සිද්ධස්ථානය ශතවර්ෂ ගණනාවක් තුළදී බොහෝ සෙයින් නැවත ඉදිකර සහ අලුත්වැඩියා කර ඇත. තවමත් තිබෙන අතර වර්තමානයේ එහි නම මනියර් මැත් වේ.

බෞද්ධ ධර්ම ග්‍රන්ථවලින් සහ වෙනත් නූතන මූලාශ්‍රවලින් ලැබෙන සාක්ෂිවලින් පෙනී යන්නේ මජ්ඣිම දේශයේ නගර සහ පුරවරවලින් උද්‍යෝගීමත් නාගරික සහ සංස්කෘතිමය ජීවිතයක් සඳහා සහායක් ලබා දී ඇති බවයි. පරිත්‍යාගශීලී පුද්ගලයන් විශාල ජලාශයක් කැණවීමෙන්, එහි වාසය කළ මිනිසුන්ට ස්නානය කිරීම, සේදීම, රෙදි සේදීම සහ පානය කිරීමට ජලයත් ගෙන යාමට හැකි විය. මෙම ජලාශ ගල්වලින් අසුරා ඒ වෙත යාමට හැකි වන සේ තරප්පු ඉදිකර නෙළුම්මල් වවමින් අලංකාර කර තිබුණි. වේසාලියේ එවැනි ජලාශ බොහෝ ඉදිකර තිබුණි. ගග්ගාර රැජිනගේ චම්පාහි පිහිටි පොක්ඛරනිය මෙන්ම රාජගහ නුවර සුමාගංධත් නගරයේ දර්ශනයක් විය. එක් ජාතක කථාවක නාගරික ආකාරයට සිතන පුද්ගලයෙකු ඔහුගේ නගරය පරිත්‍යාග කළ ආකාරය විස්තර කර ඇති අතර දැන් එය නාගරික මධ්‍යස්ථානය යනුවෙන් හඳුන්වනු ලැබේ. ගෘහනිර්මාණ ශිල්පීන් සහ නිර්මාණ සැලසුම්කරුවන් සමග උපදේශ ලැබීමෙන් පසු ඔහු ගොඩනැගිලි සංකීර්ණයක් සාදවා සංචාරකයන්ට, නිවෙස් නැති අයට සහ රෝගීන්ට, පිරිමින්ට සහ ගැහැණුන්ට වෙන වෙනම නවාතැන් පහසුකම්

[16] Vin.I,39.

[17] M.II,244; A. II,62.
[18] S.I,208

සැලැස්වූයේය. ක්‍රීඩා, ආගමික කටයුතු සහ උසාවි කටයුතු සඳහා ස්ථාන තිබුණි. සංකීර්ණයෙන් පිටත ස්නානය කිරීම සඳහා ජලාශ සහ ඒ වටා ගෙඋයන් ද තිබුණි. මුළු සංකීර්ණයම සාදා අවසාන වූ පසු එම පරිත්‍යාගය කළ පුද්ගලයා සියලුම බිත්ති චිත්‍රවලින් ආලේප කිරීමට චිත්‍රකරුවන් යෙදවූයේය. [19] සමහර විට අතිශයෝක්තියක් විය හැකි නමුත්, ධනවතුන් සමහර විට එවැනි ස්ථාන පිහිටුවූවාය යන්න පිළිබඳව ඇත්තේ සුළු සැකයකි.

කවි කලාව මේ වන විටත්, ඉතා දියුණු කලාවක් වූ අතර, ගායනය කුඩා කණ්ඩායම් වශයෙන් සහ විවිධ මහජන රැස්වීම්වලදී පැවැත්වුණි. බුදුපියාණන් වහන්සේට කවි පිළිබඳව යම් උනන්දුවක් සහ දැනුමක් තිබුණි. උන්වහන්සේ කවි නිර්මාණය කිරීමේදී තාලය සහ හඬ භාවිත කරන රටාව සමග සුපුරුදු වීම නිසා, විවිධ ප්‍රභේද හතරකින් රචනා කරන කවියන් සමග කුළුපග වූහ. උන්වහන්සේගේ වඩාත් කැමැති ගායනය සාවිත්තී බව සඳහන් කළහ. කවි පිළිබඳව බුදුපියාණන් වහන්සේ ඇගයීම, සමහර විට උන්වහන්සේගේ සමහර ශ්‍රාවකයන් නිපුණ කවියන් වීම හේතුව විය හැකිය. උදාහරණ වශයෙන්, බුදුපියාණන් වහන්සේ වර්ණනා කරමින් අලංකාර පැදි පෙළක් රචනා කළ වඞ්ගීස, සහ ඉන්දියාවේ පළමු කිවිඳිය වූ අම්බපාලී හැඳින්විය හැකිය. රිටි බැඳගත් පිනුම් ගසන්නන්, නයි නටවන්නන්, විජ්ජාකාරයන් සහ කවි ගායකයන් වැනි නගරයේ මාර්ගවල තැනින් තැන යන විනෝද සපයන්නන් දකින්නට ලැබීම සුලබ දෙයක් විය. නළුවන්, නර්තන ශිල්පීන්, ඉඟි නළුවන් සහ විරිදුකරුවන් පිළිබඳ කෙටි සඳහනක් නම් එවැනි පුද්ගලයන්ටත් කළමනාකරුවන් සිටීමෙන් ඇඟවෙන්නේ එවැනි විනෝද කර්මාන්තත් නවීන මට්ටමකට එළඹ ඇති බවයි.[20] සෑම වසරකම රාජගහ හිල්ටොප් උත්සවය (ගිරග්ගසමජ්ජ) නමැති උත්සවයක් පැවතුන අතර එහි වැඩිපුර තිබුණේ කෑම බීම සහ නාට්‍යම රඟ දැක්වීම්ය.[21] ඉඳහිට අවිධිමත් රූප සුන්දරී තරඟ පැවැත්වුණි. එයින් ජයග්‍රහණය කළ අය භූමියේ ලස්සනම කාන්තාව ලෙස හඳුන්වනු ලැබේ. එවැනි ජයග්‍රාහිකාවක් දැකීම සඳහා සෙනග එකිනෙකා තල්ලු කරමින් සහ ඇයට ඔවුන් වෙනුවෙන් ගායනා කිරීමට සහ නැටුම් ඉදිරිපත් කිරීමට බල කරන බව බුදුපියාණන් වහන්සේ විස්තර කළහ. [22] නගරවල වීදිවල සැරිසැරූ ගවයින් සමහර විට මිනිසුන්ට තුවාල කිරීමට හෝ මරා දැමීමට පවා ඉඩ ඇත. භාහිය බුදුපියාණන් වහන්සේ සමග සාකච්ඡා කිරීමෙන් පසු ඔහුට එසේ සිදු විය. මෙම අනතුරු අවම කිරීම සඳහා සමහර විට ගවයින්ගේ අං ඉවත් කරනු ලැබේ.[23] අඳුරේ නගරයක හෝ පුරවරයක ඇවිදීමෙන් කෙනෙකු කාණුවකට හෝ අපද්‍රව්‍ය වලකට වැටෙන්න පුළුවනි, නිදාසිටින ගවයෙකු උඩින් පැටලී වැටෙන්න පුළුවනි. මාර්ග විදුලි බුබුළු නැතිව රාත්‍රියේ ගමන් කිරීම, විශේෂයෙන් පමාවී, ගැටලු සහගත විය හැකිය. එසේ කිරීමෙන්

[19] Ja.VI,333
[20] Ja. II,430 S.IV, 306; Vin.IV,285.
[21] Vin.II,107.
[22] S.V,170.
[23] Ud.8; A.IV,276.

වළකින ලෙස බුදුපියාණන් වහන්සේ ශ්‍රාවකයන්ට උපදෙස් දුන්හ.[24] යම් අපරාධයක් කළ හෝ කරන්නට යන කෙනෙකු හමුවන්නට පුළුවනි, හෝ සමහර විට වෙසඟනක් යම් සුළු මුදලකට ඇයගේ කාමස්වාදය ලබා දීමට කැමැත්ත පළ කරන්නට පුළුවනි. [25] ඉඳහිට අපරාධමය කලබල ඇති වූ බවටද දැනගන්නට නැත. වෙසඟනක් සම්බන්ධයෙන් තරුණ කණ්ඩායමක් විසින් ඇති කර ගත් සුළු කලකෝලාහලයක් පිළිබඳව සඳහන් වේ. එසේම සමහර උත්සවවලදී පුළුල්ව ව්‍යාප්තවූ ප්‍රජාවගේ බේබදුකම පිළිබඳවත් සඳහන් වේ.[26] ඉඳහිට එකල සිටි සමහර ඔබ මොබ යන භික්ෂූහු නගරවලට සහ පුරවලට පැමිණ ඔවුන්ගේ මූලික අවශ්‍යතාවන් - විසි කළ ඇඳුම්, ලුණු, බෙහෙත් හෝ හුදෙක් ආහාර යනාදිය ලබා ගනිති. ඔවුන් ඔවුන්ගේ පාත්‍ර රැගෙන නිවෙස් ඉදිරිපිට සිටගෙන හෝ අපේක්ෂිත ස්ථානවල අත් දිගු කරමින් සහ දානය ඉල්ලමින් සිටිනු දක්නට ලැබේ.

මජ්ඣිම දේශයේ අලුත් සහ දියුණු වෙමින් පවතින නගර සහ පුරවරවල විශාල ජනගහනයන්ට ජීවත් වෙන්නට හැකි වුවද, බහුතරයක් මිනිසුන් තවමත් ජීවත් වන්නේ ගම්වලය. ගම්වලින් බහුතරයක ජීවත් වන්නේ ගොවීන්ය. නමුත්, ග්‍රන්ථවල නිරන්තරව සඳහන් වන්නේ කුඹල්කරුවන්, ධීවරයන්, බටකපන්නන්, කම්මල්කරුවන්, ලුණු සාදන්නන් සහ වඩුවන් එකල සිදුවෙමින් පැවති ශ්‍රම විභජනයේ ස්වභාවයෙන් පිළිබිඹු කරන බවයි.[27] සාමාන්‍යයෙන් ගමක් වැටකින් වටවී ඇත. සමහර විට වනසතුන්ගෙන් සහ සොරුන්ගෙන් ආරක්ෂාවීමට මැටි, ගඩොල්, හෝ කටු ගස්වල අතුවලින් වටවූ ගේට්ටුවක් ඇත. අසල්වැසි ගම්මාන සමග ගැටුම් වළක්වා ගැනීමට සහ බදු අරමුණු සඳහා එහි කෙත්වතු සහ පොදු ඉඩම් ඇතුළත් ගම් මායිම්ද පැහැදිලිව වෙන් කිරීම සඳහාද මෙසේ කරනු ලැබේ.[28] ගොවියාගේ ජීවිතයේ ඇති නැවත නැවත සිදුවීම සහ වෙහෙසකර වැඩෙහි යෙදීම බුදුපියාණන් වහන්සේගේ ඥාතී සහෝදර අනුරුද්ධ මෙසේ විස්තර කළේය. ''අස්වැන්න නෙළා ඊට පසුව එම දෙයම ඊළඟ වසරේ සහ ඊට පසුවත් කරන්නට සිදුවේ, ඒ වැඩ කිසි දිනක අවසාන වන්නේ නැත. එසේ වනු දැකීමක අවසානයක්ද නැත.''[29]

කරදරකාරී බදු අයකිරීම්, මංපහරන්නන් සහ කාලගුණය සම්බන්ධයෙන් හිටි ගමන් සිදුවන ඉතාමත් නරක දේවලින් ග්‍රාමීය ජනතාවට ජීවිතය දුෂ්කර විය. පැරණි නීති පොත්වලින් නියම කර ඇති පරිදි, අස්වැන්න සඳහා සාධාරණ බදු පෙළ ගැසිය යුත්තේ හයේ සිට දොළහක් දක්වා නමුත්, ඇත්ත වශයෙන්ම, පාලකයන්, රජවරු හෝ කවුන්සලවල වැඩිහිටියන් හෝ වේවා, ඔවුන්ට හැකි තරම් ආදායම් ඉහළ දැමිය හැකි විය. එයට හේතුව ඔවුන්ට උවමනා වූයේ අයබදු පැනවීමේ ඉහළම මට්ටමේ සිටීමට සහ

[24] D.III,183
[25] M.I,448; Vin.I,112
[26] Ud.71.
[27] Vin.III,52.
[28] Vin.I,110; III,52
[29] Vin.II,181.

වෙනත් බොහෝ දේ සඳහා ද බදු අය කිරීමයි.[30] නමුත්, දේශගුණයේ ඇති කලින් කිව නොහැකි ස්වභාවය නිසා උපරිම තර්ජන එල්ල වුණි. සාගතයකින් නගරයේ ජීවත් වන්නන්ට ආහාර හිඟයක් ඇති කළ හැකිය. නමුත් එයින් ගම්බද පිරිසට මරණය සිදු කළ හැකිය. මෝසම් කාලයේ එක පේළියට වසර තුනක් ඇති වූ බිඳ වැටීම් නිසා කාසි නගරයේ සාගතයක් ඇතිවීම පිළිබඳව ග්‍රන්ථවල සඳහන් වේ. ඒ නිසා භූමිය ''ගින්දරෙන් කර්කශ''[31] වූ ආකාරයකින් පෙනුණි. එක් ප්‍රදේශයක නියඟයක් ඇති වීමෙන් කුසගින්නෙන් සිටින මිනිසුන් තවත් ප්‍රදේශයකට පලා යෑමට සිදුවීමෙන්, ඔවුන්ට තදබදයෙන් යුක්තව ජීවත්වීමට සිදු වන බවත් ඒවා සරණාගත කඳවුරු බවත් බුදුපියාණන් වහන්සේ පැවසූහ.[32] වැස්ස පවා සතියකින් හෝ දෙකකින් වුවත් ප්‍රමාද වුවහොත් මිනිසුන්ගේ සිත් ඇවිස්සීමට පත්විය හැකිය. මෙම තත්ත්වය තුන් බිය (තීණි භයානි) නම් වේ, නියඟයට ඇති බිය, සාගතයට ඇති බිය සහ රෝග බියයි.[33] කෲරතර ව්‍යංගයෙන්, සමහර විට ප්‍රශ්න ඇති කරන්නේ වැස්ස නොමැති කම නිසා නොවේ. නමුත්, අවශ්‍යතාවයට වඩා වැඩිවීම නිසාය. එයින් පසුව ඇතිවන ගංවතුරෙන් අස්වැන්න විනාශවීමෙන් සාගතය ඇති වේ.[34] ''ගම්මාන, නගර සහ රාජකීය ප්‍රධාන නගර කුරුල්ලෙකුට එකින් එකට ඉතා සමීපව පියාඹන්න හැකි තරමට පමණක් '' අතීතයේදී ජනගහනය විශාල වුවත්, දැන් ස්වල්ප ප්‍රමාණයක මිනිසුන් ඇත්තේ ඇයි දැයි වරක් එක් පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේගෙන් ඇසුවේය. උන්වහන්සේගේ පිළිතුර වූයේ මිනිසුන්ගේ අධික ලෝභය හේතුකොටගෙන සමාජීය අරගල, නියඟ සහ අනර්ථකාමී ජීවීන් ජනගහනයේ දුර්වල කිරීමක් සිදුකර ඇති බවයි.[35]

මිනිසෙකු ඔහු ජීවත්වූ ගමෙන් දීර්ඝ කාලයකට බැහැරව සිට පසුව අහම්බෙන් ඔහුගේ ගමේ තවත් පුද්ගලයෙකු හමු වූවොත් ඔහු තද කැමැත්තකින් ගමේ තත්ත්වය ආරක්ෂිතද, වසංගත කිසිවක් තිබුණේද, ආහාර හිඟයක් තිබුණේද, මංකොල්ලකරුවන්ගේ පහර දීම් තිබුණේද යනාදිය අසන බවත්, ග්‍රාමීය ජීවිතය එතරම් අවදානම් බවත්, බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ.[36] උන්වහන්සේගේ ශ්‍රාවකයන් ඒ පිළිබඳව තැකීමක් නැති නිසා, අස්වැන්න යහපත් සහ ආහාර බහුල ලෙස ඇති මේ අවස්ථාව පහසුවෙන්ම වෙනස් විය හැකි බවත්, ඒ නිසා උන්වහන්සේ ඔවුන්ට ඉඳහිට හොඳ කාලයේ උපරිම ප්‍රයෝජනය ගනිමින් ධර්මය පුහුණු කිරීමට ප්‍රත්‍යවේක්ෂණය කරන ලෙස අවවාද දුන්හ.[37]

---

[30] E.g. *Manuśastra* 7,130; *Gautama Dharmasūtra*10,24.
[31] Ja. V,193.
[32] A.III,104.
[33] Ja. II,367. The Buddha referred to the four fears as fires, floods, kings and bandits, A.II,121
[34] Ja. II,135.
[35] A.I,159-160. Concerning droughts, the Buddha accepted the common belief that widespread immorality or an unjust ruler could adversely affect the weather.
[36] M.II,253.
[37] A.III,104

සැබැවින්ම, ජීවිතයම වැඩ කිරීමට පමණක් විය නොහැකිය, අවම වශයෙන් සියලුදෙනාටම, සෑම තැනම සහ හැම වේලේම විය නොහැක. ඉඳහිට විවේකය සඳහා අවස්ථාවන්ද, සහ ආගමික උත්සවවලදීත් විනෝදය සඳහා විය හැකිය. දකුණු දිස්ත්‍රික්කයේ තිබූ එවැනි ආගමික එක්වීමකදී ආහාර සහ බීම, ගායනා, නැටුම් සහ සංගීතය ඇතුළත්ව තිබූ බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ.[38] එසේම යහපත් රජයක් සමග රටක් සාමයෙන් තිබෙන්නට හැකි බවත්, මංකොල්ලකෑම් පාලනය කරන්නට හැකි බවත්, එවිට මිනිසුන්ට සතුටෙන් සිටින්නට සහ තමන්ගේ දරුවන් සමග රඟමින් සහ ඔවුන්ගේ නිවෙස් විවෘතව තබා ගත හැකි බවත් බුදුපියාණන් වහන්සේ පැවසූහ.[39]

නගරවැසියන්, ගම්වැසියන් චාම් අවිනීත පුද්ගලයන් ලෙස සලකන්නට නැඹුරු වූ අතර, ඔවුන් දෙස බලන්නට පුරුදු වූයේ යම් මට්ටමක පිළිකුලෙනි. සාමාන්‍ය කතා ව්‍යවහාරයේදී ''ගම්ම'' යන පදයෙන් අදහස් වූයේ 'ගමේ', හෙවත් පහත් සහ අසැබි දෙයක් ලෙසයි. මෙම පොදු භාවිතයට අනුකූලව, බුදුපියාණන් වහන්සේ ලිංගික සංසර්ගය විස්තර කළේ, විවිධ ආකාර්ෂණාත්මක දේ සහ නිෂ්ඵල කථාබහ දකින්නට යෑම ''ගම්ම''ය බවයි. බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම්වල ඇති වඩා ගැඹුරු සහ බොහෝ දාර්ශනික කරුණු සම්බන්ධයෙන් සාමාන්‍ය ගම්වැසියෙකුට තිබුණේ ස්වල්ප වූ උනන්දුවක් වුවත්, උන්වහන්සේගේ සදාචාරාත්මක සහ සමාජීය ඉගැන්වීම් සඳහා නිසැකවම ඔවුන්ගේ උනන්දුව තිබුණි. සමහර විට උන්වහන්සේ ගම්වල සංචාරය කරමින් ඒවායේ ජීවත්වන විට බොහෝ විට ඔවුන්ට ඉගැන්වූයේ එම කරුණු විය හැකිය.

වැඩිවන ආහාර අතිරික්තය, ජනගහන වර්ධනය සහ නගර වැඩිවීම, මජ්ඣිම දේශයේ තවත් වෙනස් උත්තේජකයක් ඇති කළේය. ඒ වාණිජමය ව්‍යාප්තියක් සහ දීර්ඝ දුරස්තර සහ මහාද්වීපය හරහා විහිදුණු වෙළඳාමක ආරම්භයයි. මීට පෙර, ගමේ ප්‍රජාව ඔවුන්ගේම ආහාර වගා කරමින් සහ ඔවුන්ට අවශ්‍ය බොහෝ දේ දේශීය ශිල්පීන් විසින් නිපදවමින් සම්පූර්ණයෙන්ම ස්වයංපෝෂිත වූහ. ස්වල්ප වූ අනෙක් අත්‍යවශ්‍යවූ දේ ඔවුහු අසල්වැසි ගම්මානවලින්, ලඟපාත වනාන්තරවලින් හෝ ඉඳහිට ගෙන් ගෙට ගොස් බඩු විකුණන්නන්ගෙන් හෝ සහ බූරුවා මත හෝ ගොන් කරත්තයෙන් පැමිණෙන කෙටි කාලීන වෙළෙඳුන්ගෙන් ලබා ගත්හ. හුවමාරු වෙළඳම ප්‍රධාන වශයෙන් භාවිත විය. එක් නගරයකින් හෝ ප්‍රදේශයකින් භාණ්ඩ රැගත් ගැල් සහිත තවලම් පිළිබඳව ත්‍රිපිටකයේ බොහෝ සඳහන් කිරීම් ඇතුළත්ය. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමත් සමග උරුවෙලාවේ වැඩ සිටින විට, උක්කලා, සමහර විට ඔරිස්සේ සිට පැමිණි තපස්සු සහ භල්ලුක යන වෙළඳුන් දෙදෙනා

38 A.V,216.
39 D.I,136.

හමුවූහ.[40] මෙම මිනිසුන් දෙදෙනා තවලමකට සම්බන්ධ බවට ධර්ම ග්‍රන්ථවල සඳහන් නොවේ. එහි සඳහන් වන්නේ ඔවුන් දුර බැහැර සිට පැමිණෙන්නට ඇති බවයි. එම ධනවත් ව්‍යාපාරිකයන් සහ බුදුපියාණන් වහන්සේගේ නිත්‍ය අනුග්‍රාහකයෙකු වූ අනාථපිණ්ඩික, ඔහුගේ නිවස පිහිටි රාජගහ සාවත්ථියේ සිට පැමිණ ආපසු වෙළඳාමේ ගිය අතර, කාසි නුවර ව්‍යාපාරමය දේපොළක් තිබුණි.[41] සීනි බරණි සිය ගණනක් රැගත් ගැල් රාජගහ සහ අංධවින්ද [42] අතර ප්‍රධාන මාර්ගයේ ගිය බවත්, බුදුපියාණන් වහන්සේ කුසිනාරාවට වඩින විට මාර්ගයේ ගසක් යට ගිමන් හරින විට, කරත්ත තවලමක් ඒ අසල ගඟකින් දිය බැස එගොඩ වූ බවත් සඳහන් වේ. සමහර අවස්ථාවල, තවලම්වලට එක් ස්ථානයක ළඟපාත දිස්ත්‍රික්කවල වෙළඳ මුරපොළක් වශයෙන් කටයුතු කරමින් මාස ගණන් නැවතී සිටින්නට සිදුවිය. එක් තරුණ වෙළෙන්දෙකුගේ තවලම් ''දැන් නැගෙනහිර සිට බටහිරට, සහ දැන් උතුරේ සිට දකුණට'' සංචාරය කළ බව එක් ජාතක කථාවක සඳහන් වේ.[43] ඔහුගේ තවලමේ එක් ගැලක් මැටිවලින් නිමවූ විශාල ජල බඳුන් ජලය නොමැති ප්‍රදේශ පසු කර යන විට රැගෙන ගිය අතර, එම ගැල් ආරක්ෂාව සඳහා රවුමට සකසන ලදී. එවැනිම කථාවක සඳහන් වන්නේ කාන්තාරයක්, සමහර විට රාජස්ථානයේ ථාර් කාන්තාරය, පසු කර යන විට, එක් තවලමකට සංචාරය කළ හැකි වූයේ රාත්‍රියේදී පමණක් බවයි. ඒ තරුවලින් ගමන් මග හසුරුවණු ලැබූයේ නාවික නියමුවෙකු විසින් නිසය.[44]

රජවරු සහ පරිපාලනමය ප්‍රධානී ගංගා මාරුවන ස්ථාන, කඳු දුර්ග සහ නගර දොරටු අසල තවලම්වලින් බදු අය කිරීම සඳහා රේගු මුරපොළ පිහිටුවා තිබුණි. රජයේ විශේෂ නිලධාරීන් රේගු මුරපොළවල සේවයේ යොදවා තිබුණ අතර ඔවුහු සමහර විට විශාල තවලම්වලට නියම කරන ලද ස්ථානවල අනිවාර්යයෙන් බදු අය කර ගැනීම සඳහා රහසේ රැඳී සිටියහ.[45] වරක් බුදුපියාණන් වහන්සේ එක් භික්ෂුවකට එක් වංචාවක ප්‍රතිලාභියා වීම පිළිබඳව චෝදනා කළහ. ඒ ඔහු එක් වෙළෙන්දෙකුගේ තවලම බදු ගෙවීම මග හරිමින් බදු මුරපොළ නගරයක් මඟ හැර යා හැකි විකල්ප මඟක යන්නට අදහස් කරන බව දැන දැනත් එම තවලමේ ගමන් කිරීම පිළිබඳවයි. [46]

රටවල් ගණනාවක වෙළෙඳුන් එක්ව හමුවී බොහෝ විට ජාත්‍යන්තර වෙළඳ ගොඩනැගිල්ලක් ගොඩනගා ගැනීම සඳහා සභාපති කෙනෙකු පත්කර ගෙන පිටරට වෙළෙඳුන්ගේ භාණ්ඩ ගබඩා කිරීමට සුදුසු නගරයක් සහ

---

[40] Vin.IV,4. Buddhist remains and early Brahmi inscriptions mentioning the names Tapussa and Bhallika have been found in Tarapur, Jaipur District in Orissa, see Mohanty.
[41] Vin.II,154ff; IV,162.
[42] Vin. I,224; D.II,128. When Tavernier was in India in the 17th century he witnessed caravans of up to 12,000 bullock carts. Sometimes oncoming traffic was obliged to wait two or three days for them to pass; *Travels in India by Jean Baptist Tavernier*, 1886, Vol.1 pp.39-40.
[43] Ja.I,98.
[44] Ja.I,107.
[45] Vin.IV,131.
[46] Vin.III,131.

ස්ථානයක් තීරණය කිරීමට කටයුතු කළ බව අසා ඇත්තෙමු.[47] එවැනි වෙළෙඳුන් සැමවිටම මෙසේ සිතනු ඇතැයි බුදුපියාණන් වහන්සේ විස්තර කළහ, ''මට මෙය මෙතැනින් සහ එය එතැනින් ලැබෙනු ඇත.'' [48] වශයෙනි.

වෙළෙන්දෝ සහ අත්කම් ශිල්පීහු ඔවුන්ගේ දේපළ අධීක්ෂණයට සහ ආරක්ෂා කිරීමට 'සමාජයක්' (සෙණිර් පූග) සාදා ගත්හ. පාරම්පරිකව එවැනි 'සමාජ' දහඅටක් සහ ඔවුන්ගේ සභාපතිවරු හෝ නගර සභාවේ සාමාජිකවරු සිටි බව කියන අතර, ඔවුන්ට රජුට හෝ පාලක කවුන්සලයට ඍජු ප්‍රවේශ ක්‍රම තිබුණු අතර සහ සමහර විට මුදල් ඇමති ධූරයද හොබවා ඇති බවට සඳහන් වේ. 'සමාජ' ඔවුන්ගේ සාමාජිකයන් අතර ඇතිවන අරෝවන් විසඳීම සඳහා මැදිහත්වීමට උසාවි මෙහෙයවන බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ.[49]

වෙළඳාමේ වැඩිදියුණුවත් සමග සමගාමීව පළමු වලංගු මුදල් වශයෙන් ඉන්දියාවේ පහළ වූයේ සමහර විට ක්‍රි. පූ. 600 දීය. වඩා නිවැරදිව කියනවා නම්, ඒවා සටහන් නොව, ගණන් කළ හැකි ඒකක ලෙස මුද්‍රා සටහන් සහිත තඹ, රිදී සහ රත්‍රරන් කාසි වේ. සම්මත නාමිකය වූයේ කහාපණ යන්නය. ඒවා නිකුත් කරණු ලැබුවේ මූල්‍ය ආයතන, 'සමාජ' සහ රජය විසිනි.[50] මුදල් භාවිතය සමගින් විගණනය, ගණකාධිකරණය, ගණනය කිරීම, වැනි වෘත්තීන් සඳහා මාර්ග විවෘත විය (මුද්ද, ගණනා, සංඛා). [51]

ඒ සමග බුදුපියාණන් වහන්සේ සාධාරණ දිවි පෙවෙත් වශයෙන් සලකනු ලැබූ වෙළඳාම සහ ගොවිතැන ද ආරම්භ විය. [52] ගම් පදනම් වූ වඩුවන් සහ කම්මල්කරුවන්, කුඹල්කරුවන්, සෙවිලිකරන්නන් සහ කුඩා වියන්නන් වැනි නිෂ්පාදකයන්ගෙන් ඔබ්බෙන් ඉවත දමන දෙයින් ලැබිය හැකි ආදායම්වල පැවැත්ම සහ සුඛෝපභෝගී අත්‍යවශ්‍ය නොවන දේ සඳහා ඇති ඉල්ලුම පෙන්වා දෙන අනෙක් වැඩකරන්නන් සහ ශිල්පයන්වල නියැලෙන්නන් ගැන ත්‍රිපිටකයේ සඳහන් වේ. ඒ අය නම් රන්කරුවන්, මැණික් සාදන්නන්, ඇත් දළින් භාණ්ඩ සාදන්නන්, මල්මාලා සාදන්නන් සහ මල්කරුවන්, පට රෙදි වියන්නන්, ක්‍රීඩා පුහුණුකරන්නන්, රසකැවිලි සාදන්නන් සහ සුවඳ විලවුන් නිපදවන්නන් ය. රාජ සභාවලට සහ ධනවතුන්ට සහ ගොඩනැගිලිවල බිත්ති මත, රෙදිවල සහ ඔප දමන ලද ලී පනේල මත චිත්‍ර කරන කලාකරුවන්ට ඇතුන්, අශ්වයන්, මැණික්, රත්රන් සහ වෙනත් ඉහළ මිලැති භාණ්ඩ සැපයීම සඳහා තක්සේරුකරුවෝ (අග්ගකාරික) සිටියහ.[53]

[47] Ja.VI,333.
[48] M.II,232.
[49] M.I,288.
[50] On the various coins and their values see Agrawal, pp.259-274.
[51] M.I,85; D.I,51; S.IV,376; Ja. IV,422; M.I,85.
[52] A.I,248-249; 145.
[53] Ja. I,124; S.II,101-02.

මජ්ඣිම දේශයට භාණ්ඩ ආනයනය කරනු ලැබුවේ එතැනින් ඉතා දුර සිටය - අශ්වයන් සින්ධ්, සුදුහඳුන් දකුණු ඉන්දියාවෙන්, තද රතු පැහැ බ්ලැන්කට් සහ වයින් ඝාන්ධාරයෙන් සහ හක්ගෙඩි ඈත දකුණෙන්, ඒවා නම් කිරීමට තරම් සුළුතරයකි. එසේම මුතු, වෛඩූර්යය, නිල් ලෝහ, තිරුවාණ, රතුවන් පබළු කොරල්, පද්මරාග සහ වෛරෝඩි වැනි මිල ඉතා අධික - ප්‍රමාණයෙන් අඩු වර්ග පිළිබඳව ද ත්‍රිපිටකයේ සඳහන් වේ. ඒවා බොහොමයක් මජ්ඣිම දේශයට වෙළඳාම සඳහා ගෙන එන ලදී.[54] වෙළඳාම ගොවිතැන් වැනි පාරම්පරික දිවි පෙවෙත්වලට වඩා වැඩි යම් ප්‍රයෝජන ඇති එකක් යන්න බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළහ. එනම් :

> ''කෘෂිකර්මාන්තය යනු කිරීමට බොහෝ දේ ඇති, බොහෝ කාර්යයන්, බොහෝ කල්පනාකාරී විය යුතු, විශාල ගැටලු තිබෙන, සාර්ථක වුවහොත් විශාල ලාභ ලබා දෙන රැකියාවකි... වෙළඳාම යනු ස්වල්ප වශයෙන් වැඩ ඇති, අඩු රාජකාරී, සැලසුම් සහ ගැටලු ඇති, සාර්ථක වුවහොත් වැඩි ලාභයක් ලැබෙන රැකියාවකි.''[55]

වෙනත් බොහෝ දේ මෙන්, ශතවර්ෂ හයේ සිට හත අතර, මජ්ඣිම දේශයේ දේශපාලනයේ ඉතා වැදගත් වෙනස්කම් සිදුවිය. ත්‍රිපිටකයේ සඳහන් විස්තරාත්මක තොරතුරු ස්වල්පයෙන් අපට කිව හැක්කේ පැරණි ජනරජ හෝ ප්‍රධාන රාජ්‍යයන් (සඞ්ඝ හෝ ගණ) ක්‍රමයෙන් රාජාණ්ඩුවලට (රාජක) මග පෑදූ බවයි. ප්‍රධාන රාජධානි වූයේ, මගධ, කෝසල, වම්සා සහ පඤ්චාලය. ජනරජයන් වූයේ වජ්ජියානුවන්, මල්ලයන්, සෙඩිස්, විදෙහස්, කෝලියානුවන්, සහ බුදුපියාණන් වහන්සේගේ වංශය වූ ශාක්‍යයන්ය. මේ සියල්ලන්ම කුඩාය.

රජවරුන්ට තමන් කැමති ආකාරයට පාලනය කළ හැකි වූ අතර, සමහර විට යම්තාක් දුරට පූර්වාදර්ශයෙන් සහ සම්ප්‍රදායෙන් සීමා කළද, ප්‍රධාන රාජ්‍යයන්ට සහභාගිත්ව රජයන් තිබුණි. නමුත් මෙය විවෘතව පැවතියේ ඉහළ තත්ත්වයේ පවුල්වල පිරිමින්ටය. ඔවුන්ගේ නගර, පුරවර සහ ගම්වලට පවා සභාශාලා (සන්ථාගාර) තිබුණි. ඒවායේ රජයේ හෝ ප්‍රජාවේ ව්‍යාපාර කටයුතු සිදු විය. රාත්‍රිය ගත කරමින් ඔවුන්ගේ නව සභාශාලාව විවෘත කිරීමට ශාක්‍යයන් බුදුපියාණන් වහන්සේට ඇරයුම් කළ විට, ''බුමුතුරුණු අතුරන ලදී, අසුන් පණවන ලදී, විශාල ජල බඳුනක් පිටත තබා, තෙල් පහනක් එල්ලන ලදී.''[56] දෙවිවරුන් ඔවුන්ගේ දිව්‍යමය සභා ශාලාවේ ව්‍යාපාර කළ ආකාරය එක් ධර්ම ග්‍රන්ථයක විස්තර වේ. මිනිසුන් අතර එවැනි රැස්වීම් තිබෙන ආකාරයට සමානව ඒවා සිදුවන බවට ඉඟියක් එයින් ලබා දී ඇත. සහභාගිවන්නන් එක් විශේෂ පිළිවෙලකට අසුන් ගෙන සිටි අතර, සභාපති රැස්වීමට ව්‍යාපාර තොරතුරු ඉදිරිපත් කළ

---

[54] Ud. 54.
[55] M.II,197-99.
[56] M.I,354.

පසු, අදාළ කරුණු පිළිබඳව අනෙක් අය කථා කළහ.[57] බහුතර හෝ ඒකමතික තීරණවලට එළඹෙන තුරු, ඡන්දය ප්‍රකාශ කිරීම සහ සාකච්ඡා කිරීම් බහුල වශයෙන් තිබුණි. ක්‍රියා (ඤත්ති), මැදිහත්වීම (උබ්බාහිකා), ප්‍රදේශය (සීමා), ජනමත විචාරණය (යේභුය්‍යසිකා), වැනි සභාවේ (සභාධම්ම) සීමාවන්, සහ නීතිවලින් අඟවන්නේ එවැනි රැස්වීම් පැවැත්වීමේ පිළිගත් පරිපාටි තිබූ බවයි. සමහර සභාවල අඩු ගණනේ ඡන්දය ප්‍රකාශ කිරීමේ තුණ්ඩු, ප්‍රායෝගික 'පත්‍රිකා' (සලාක), ඡන්දය ප්‍රකාශ කිරීමට භාවිත කරන ලදී. එසේම විවෘතව ඡන්දය (විවටක) ප්‍රකාශ කිරීමට හෝ රහසේ ඡන්ද (ගූළ්හක) ප්‍රකාශ කිරීමටද හැකිය. රාජ්‍ය ප්‍රධානීන් අනුගමනය කළ බොහෝ පිළිවෙත් සහ නීති බුදුපියාණන් වහන්සේ පැවිදි සඞ්ඝයා පාලනය කිරීමේදී භාවිත කළහ.

සමහර රාජධානි එකිනෙකා සමග යුද්ධවලට ගිය බවට විස්තර ඇත. නමුත් ජනරජ කිසිවක් එසේ කර නැත. බුදුපියාණන් වහන්සේගේ උපතට පෙර හෝ සමහර විට උන්වහන්සේගේ ළමා කාලයේදී, කෝසලයේ වංක රජු කාසි දේශය ආක්‍රමණය කර අල්ලා ගන්නා ලදී. සමහර විට බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් වර්ෂ ස්වල්පයක් ඇතුළත, වේගවත් සහ කුරිරු යුද මෙහෙයුමකින් ශාක්‍යයන්ගේ දේශය කෝසලයට ඒකාබද්ධ කරන ලද බව පසුකාලීන සටහන්වලින් දැක්වේ. එකල තිබූ ඉතාමත් ආක්‍රමණශීලී රාජධානිය වන්නේ මගධයයි. එකල එය අංගවලට ඒකාබද්ධ කර තිබුණි. නැවතත්, සමහර විට එය සිදුව ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ තරුණ අවධියේදීය. පසුව, අජාසත්තු මගධයේ රජව සිටි අවධියේදී, ඔහු පළමුව කෝසලයේ හමුදාව පරදවමින් කාසි දේශය ආක්‍රමණය කළේය. නමුත්, කෝසලවාසීන් ප්‍රතිප්‍රහාර දෙමින් ඔවුන් එළවා දමන ලදී.[58] අවන්තියේ පජ්ජෝත රජු ආක්‍රමණය කරන්නේ යැයි බියෙන් අජාසත්තු රාජගහ බලකොටු ශක්තිමත් කිරීම පිළිබඳව ත්‍රිපිටකයේ කෙටි විස්තරයක් ඇත. එසේම බුදුපියාණන් වහන්සේගේ අවසාන මාස කිහිපයේදී අජාසත්තු වජ්ජීන් සමග ගැටුමකට සැලසුම් කිරීමේ සූදානමකට පාඨලිගාමයේ බලකොටු ඉදි කිරීම පිළිබඳවද සඳහන් වේ.[59] බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂයක් තුළදී මගධය, පළමුව උතුරු ඉන්දියාවේ සහ ඊට පසු උපමහාද්වීප බොහොමයක ප්‍රමුඛ බලවතා ලෙස මතුවිය.

මේවා සහ තවත් අන්තර්-ප්‍රාන්ත රාජ්‍යයන්වල ගැටුම් කෙතරම් විශාලද හෝ විනාශකාරී වූයේද යන්න දැන ගැනීමට අපහසුය. නමුත්, කෙටි, පෙර සූදානමක් රහිත හමුදා ගැටුම් ලේ ගැලීම් සහිත වන්නට ඇත. යුද්ධ පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ ප්‍රකාශ සාක්ෂි දරයි. ''මිනිස්සු කඩු සහ පළිහ රැගෙන, දුනු සහ හී කොපුවල දෙපැත්ත ගාංචු දමාගෙන යුද්ධයට වේගයෙන් පිටව යති. දුනු වනමින්, පිහි වනමින් සහ කඩු දිලිසෙමින්, ඔවුහු ඊතලවලින් සිදුරු කරති, පිහිවලින් තුවාල කරති, කඩුවලින් හිස්ගසා දමති.

[57] D.II,208-209.
[58] S.I,182-85.
[59] M.III,7; D.II,86.

එසේ කරමින් ඔවුහු යුද්ධයෙන් දුක් විඳිති හෝ මරණය වැනි වේදනාවෙන් දුක් විඳිති.''[60] උන්වහන්සේ විස්තර කළහ. එසේම, විරුද්ධ හමුදාවේ ප්‍රවේශයෙන් විසිවන දූවිලි පවා දැකීමෙන් සහ යුද බල කොටුව හෝ නගරය වටලන ආකාරය දැකීමෙන් ''සෙබලෙකු හදවත නැති කර ගනී, ධෛර්යය හීන කර ගනී හෝ තමන් තමන්ට දරා ගැනීම නොහැකි වේ.'' ''උතුරන තෙල් විසිවන ආකාරය හෝ ඔවුන් මත විසිවන බර ද්‍රව්‍යවලින් පොඩි පට්ටම් කළ හැක්කේ කෙසේද'' යන්නත් බුදුපියාණන් වහන්සේ විස්තර කළහ.[61]

ප්‍රධානියෙකු පළමුව ඒකාධිපතියෙකු, අවසානයේ අධිරාජයෙක් බවට පත්වීමේ ක්‍රියාවලිය අපැහැදිලිය. නමුත් සමහර විට අක්‍රමවත් හෝ අභියෝගාත්මක ආකාරවලින් සිදුවන්නට ඇත. බොහෝ ප්‍රධාන රාජ්‍යයන්හි දේශපාලන ක්‍රමය ඇතිනියානු ප්‍රජාතන්ත්‍රවාදය මෙන් නොවීය. නමුත්, ඊට වඩා, සුළු පිරිසකගේ පාලනයක් ඇති රජයක් විය. එම පසුබිමේ යම් ඉහළ පැළැන්තියේ අය හෝ පවුල් දේශපාලන බලය ආධිපත්‍යය පවත්වා ගත්හ. කෙසේ නමුත්, ජනප්‍රිය නොවන ප්‍රධානියෙකු නිසියාකාරව තේරී පත්වුවත්, ජනප්‍රිය මතයට හිස නමන්නට සිදු විය හැකිය. එසේ නැත්නම් බලයෙන් නෙරපා දැමීමේ අවදානමටත් මුහුණ දෙන්නට සිදු විය හැකිය.

බුදුපියාණන් වහන්සේ ඉපදුණු ලෝකය මෙයයි. නමුත්, උන්වහන්සේ ඔබ මොබ යන භික්ෂුවක වන තුරු ඒ පිළිබඳ හොඳින් දැන සිටියේ යැයි සිතිය නොහැක. උන්වහන්සේගේ නිජබිම පිටත කෙළවරේ පිහිටා තිබූ අතර, උතුරු ඉන්දියාවේ සෙසු ප්‍රදේශවල සිදුවෙමින් තිබූ බොහෝ දේවලින් සාපේක්ෂව අවධානයට ලක් නොවන්නට ඇත.

---

[60] M.I,86-7.
[61] A.III,89.

# 3. දෙවිවරු, බ්‍රහ්මයන් සහ තවුසන්

බුදුපියාණන් වහන්සේගේ කාලයේ මජ්ඣිම දේශයේ සිටි මිනිසුන් බහුතරයක් පොදුවේ හැඟෙන ආකාරයට හින්දු නොව, වඩා නිවරදව කියනවා නම්, හැම දෙයක්ම ආත්මයක් ඇතැයි යනුවෙන් අදහන්නන්ය. මෙම සතුරුවාදය, අවිධිමත්, පිළිවෙලක් නැති ආගමක් විය. එය එහි පැවැත්මේ සළකුණු ස්වල්පයක් හැර දමා ඇත. නමුත් එහි යම් දෙයක් බ්‍රාහ්මණ, ජෛන සහ බෞද්ධ මූලාශ්‍රවලින් සහ නූතන ඉන්දියානු ජන විශ්වාසවලින් ලබාගත් ධර්මයෙන්ද යම් මට්ටමකින් තෝරා ගත හැකිය. මෙකල පන්සල් නොතිබුණි. නමුත්, විවිධ දෙවිවරුන් සහ භූතයන් හෝ සමහර විට ගෞරවයට පාත්‍රවූ රජවරුන්, වීරයන් හෝ ශාන්තුවරයන් ලෙස සලකනු ලැබූ මිනිසුන් වෙනුවෙන් සිද්ධස්ථාන තිබුණි. ''බොහෝ මිනිසුන් පූජනීය කඳු, කුඩා වන වදුලු, වෘක්ෂ සහ සිද්ධස්ථානවලට උපකාර පතා යන බව''[1] බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළහ. එවැනි ස්ථානවල වාසය කළ ආත්මයන්ට හෝ ඔවුන්ගෙන් පිටවන ශක්තියෙන් ආරක්ෂිත බලයක් හෝ ඔවුන්ට යාච්ඤා කිරීමෙන් හෝ පූජා පැවැත්වීමෙන් ලැබූ ප්‍රතිචාර යැයි මිනිස්සු විශ්වාස කළහ. පූජනීය වෘක්ෂවල මුල්වලට කිරි සහ ජලය වත් කරන ලදී. ඒවායේ අතුවල මල්මාලා එල්ලා සුවඳවත් තෙල් භාවිත කරමින් පහන් වෘක්ෂ වටා දල්වන ලදී. වෘක්ෂයේ කඳ වටා රෙදි එල්ලන ලදී.[2] රතු හෝ කහ-වර්ණ තලප වර්ගයක් සිද්ධස්ථාන මත ආලේප කර ඒ ඉදිරිපිට මල් තබනු ලැබේ.[3] පූජනීය වෘක්ෂයන්ට සත්ත්වයෙකු හෝ ඉඳහිට මනුෂ්‍යයන් බිලිපූජා වශයෙන් පුදන බව සඳහන් වේ. බිලිපූජාවට බඳුන්වන පුද්ගලයාගේ රුධිරය ගසේ මුලට වත් කරනු ලබයි. බඩවැල් අතුවල එල්ලනු ලබයි.[4] අද වන විට, දෙවියන් විසින් බොහෝ සෙයින් වාසය කරන බවට කියනු ලබන වෘක්ෂ වන්නේ බෝගස හෝ නුග ගස්ය. විශේෂයෙන්ම පැරණි සහ විශාල ගස්ය.

යක්ෂයන් සහ ඔවුන්ගේ ස්ත්‍රී පක්ෂය වන යක්ෂණියන්, භූතයන්, නාගයන්, රාක්ෂයන් සහ පිසාචයන් වැනි විවිධ භූතයන් කෙරෙහි විශ්වාසය තැබීම සහ වන්දනා කිරීම ද නිතර සිදුවිය. මෙම ජීවීන් සුසානභූමිවල, වනාන්තරවල හුදෙකලාවූ ලෙඩුන් ගෙන යන වනාන්තරවල සහ පාළු

[1] Dhp.188.
[2] Ja. II,104
[3] D.II,142.
[4] Ja. I,260; III,160.

මාර්ගවල, හොරෙන් රැඳී සිට, රාත්‍රියේදී එළියට පැමිණුනහ.[5] සමහර අය හිතකාමී වන අතර, සාමාන්‍යයෙන් බොහෝ අය කරදරකාරී අය වූහ. එවිට මල් සහ සුවඳ කුඩු පූජා කරමින් අනුග්‍රහ දැක්විය යුතු විය. වඩාත් අනර්ථකාමී ජීවීන්ට මස් සහ මත්පැන් දෙන්නට සිදු වේ.[6] යවක්කබ නමැති වර්ගයේ මිනීකන රකුසන් මිනිසුන්ට අරක්ගෙන සිටින්නට හැකිය, ''බිහිසුණු, භයානක සහ තැතිගන්වන'' අත්දැකීම්, අන්තරායට පත් පුද්ගලයා බියෙන් මොර දෙන්නට හේතු වෙයි, ''මෙම යකා මා අරක් ගෙන සිටියි, මට පීඩා කරයි, සහ මට යන්නට ඉඩ නොදෙයි!''[7] ඊට පසු ග්‍රන්ථයකින් කියැවෙන්නේ කාල සහ උපකාලක නමැති යක්ෂයන් බුදුපියාණන් වහන්සේගේ උපන් ගමවූ කපිලවත්ථුවේදී වන්දනා කරනු ලැබූ බවයි.[8] නාගයන් අඩ-ජලජ සත්ත්වයන් කොට්ඨාශයක් වේ. ජීවත් වන්නේ ගැඹුරු වැව් හෝ පාළු කැළෑවල තටාකවලය. ඔවුන්ට විනාඩියක් මිනිස් ස්වරූපයක් ගත හැකිය. ඊළඟට සර්පයෙක් වැනිය. සාමාන්‍යයෙන් ගෞරවයෙන් සැලකූ විට, කරුණාවන්තය. නාගයන් කෝපයට පත් කළහොත්, ඉතා ඉක්මනින් වෙනස් වී උන්ගේ විෂ සහිත හුස්මෙන් මරා දැමිය හැකිය. එසේ නැත්නම් ලේසරයක් වැනි තදින් බලා සිටීමෙන් දවා අළු කළ හැකිය.

දෙවිවරු (දේව) අනෙක් ජීවීන් අතරින් යම් අර්ථයකින් වෙනස් සහ විවිධ ආත්මයන්ට වඩා ඉහළ තත්ත්වයකින් දකින්නට ලැබුණි. වේදයන්ගේ 'නිල' (වෛඩික) දෙවිවරු සහ ලෞකික (ලෞකික) පොදු ජනයා විශ්වාස කරන දෙවිවරු අතර ඇති වෙනස පාණිනි වෙන්කොට හඳුනා ගත්තේය.[9] නමුත්, ක්‍රි.පූ. පස්වන ශතවර්ෂය වන විට මේ දෙක වෙන් කිරීම ඉතා දුෂ්කර විය. එයට හේතුව බ්‍රාහ්මණ ආගම ක්‍රමයෙන් බොහෝ ස්ථානීය දෙවිවරුන් එහි සියලු දෙවියන්ට කැප කළ දේවාරාමයට ඇතුල් කර ගැනීමයි. සාමාන්‍යයෙන් ඔවුන් කියා සිටියේ තමන් වෛදික දෙවියෙකුගේ වෙනස් 'අංගයක්' හෝ ඔවුන්ගෙන් එක් අයෙකු බවත්, නමුත්, වෙනස් නමක් යටතේ බවත්ය. බොහෝ ස්ථානීය හෝ ප්‍රාදේශීය දෙවිවරුන් සහ දිව්‍යාංගනාවන් බොහෝ දෙනෙකුට ඵලදායිත්වය, වැස්ස සහ බෝග ආරක්ෂා කිරීම පිළිබඳව සබඳතාවක් තිබුණි. මේ අතරින් වඩාත් ජනප්‍රිය වන්නේ වාසනා සම්පත්තිය සම්බන්ධයෙන් ශ්‍රී දෙවඟන සහ දිශානුගත

[5] D.II,346; Ja. I,99.
[6] Ja. I,425; 489
[7] D.III,203-4. Jesus sometimes did exorcisims but there is no mention of the Buddha having done so.
[8] *Mahāmāyurī* translated by D. C. Sircar 1971, pp. 265-8.
[9] *Aṣṭādhyāyī* VI.3,26.

දෙවිවරුන්ගේ රජු වෙස්සවණයි. ඔවුහු පසුකාලීනව හින්දු සමස්ත දේව සභාවේ දෙවිවරුන්ට ලක්ෂ්මී සහ කුබෙර යනුවෙන් ඒකාබද්ධ කරන ලදී.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ විධිමත් ආගම වූයේ බ්‍රාහ්මණ ආගමයි. එය බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ශතවර්ෂ ගණනාවකට පසු ක්‍රමයෙන් හින්දු ආගමට සම්පූර්ණයෙන්ම වෙනස් විය. බ්‍රාහ්මණ ආගමට පූජකවරු, ධර්ම ග්‍රන්ථ අටුවාවක්, යාච්ඤා ක්‍රමයට අයත් භාෂාවක්, සහ විවිධ, පැහැදිලිව නිර්වචනය කරන ලද ධර්මයක් සහ පිළිවෙත් ක්‍රම තිබුණි. එහි පූජනීය ග්‍රන්ථ වන්නේ තුන් ආකාර වේදය, ඍග්වේදය, යගුවේදය සහ සාමවේදයයි. මෙයින් පළමුවැන්න වඩාත්ම පැරණි සහ වැදගත් එක වේ. මන්ත්‍ර, ජප කිරීම් සහ මායාකාර මැතුරුම්වල එකතුවක් ආථබ්බන වශයෙන් හැඳින්වෙන අතර, ක්‍රි. පූ. පස්වන ශතවර්ෂයේදී ඒ පිළිබඳව බුදුපියාණන් වහන්සේට දැනගන්නට ලැබී ඇත. උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් යම් ශතවර්ෂ ගණනකට පසු, අර්ථවේද හතරවන වේදය වශයෙන් පිළිගැනීමට ලක් විය.[10] වේදයට විවිධ දෙවිවරුන් ආමන්ත්‍රණය කරන, අගයන සහ ඔවුන්ගෙන් උපකාර ඉල්ලන දේවගීතිකා ඇතුළත් වේ. වඩාත් ජනප්‍රිය වෛදික දෙවිවරුන් වන්නේ පජාපති, සෝම, ඉන්ද්‍ර, යම සහ අග්නි ය. නමුත් තවත් බොහෝ දෙවිවරු සිටියහ. දේවගීතිකා ගායනා කරන විට සිදු කරන යාග (යගු) බ්‍රාහ්මණ ආගමේ ප්‍රධාන විශේෂ ආගමික චාරිත්‍රයයි. ඒවා බ්‍රාහ්මණ පූජකවරුන් ගණනාවක් විසින් පවත්වන සූක්ෂමව පැහැදිලි කරන පිළිවෙත් ක්‍රමයකි. ඒවා සූදානම් කරන්නේ යම් අනුග්‍රාහකයෙකු විසින් වස්තුව, දරුවන්, කාන්තාවකගේ ආදරය, විරුද්ධකාරයන් පරදවා ජය ලැබීමට සහ වෙනත් ලෞකික ලැබීම් යම් දෙවිකෙනෙකුගෙන් හෝ තවත් දෙවිකෙනෙකුගෙන් ලැබීමේ අපේක්ෂාවෙනි. යාග පැවැත්වීමේ අරමුණ වූ පූජනීය ගිනි දල්වා ඊට පසු එළගිතෙල්, කිරි, ධාන්‍ය, කේක් යනාදිය ගිනිදැල් මතට විසිකර දුම් අතර වැඩ සිටින දෙවියන් වෙත ඉහළින් රැගෙන යති. ඍතු පසු කිරීම් හඳුනා ගැනීමට, පාලකයන් පදවිවලට පත් කළ විට, ව්‍යසන වැළැක්වීමට, වැසි ලැබීමට, යුද්ධවලින් ජය ලබා ගැනීමට සහ වෙනත් සියයක් කරුණු සම්බන්ධයෙන් යාග සිදු කරනු ලැබ ඇත. වඩා වැදගත් යාග සඳහා සතුන් මරා ගින්දරට පූජා කර ඇත. සිය ගණනක් ගොනුන්, ගවයන්, වැස්සියන්, එළුවන් සහ බැටළුවන් මරමින් සිදු කළ යාගයක් පිළිබඳව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ.[11] වෙනත් යාගවලදී 'සෝමා' යන නම් ඇති 'සිහින් මවා ගැනීමක් ඇති කරවන' බීම වර්ගයක් බ්‍රාහ්මණයන් භාවිත කර ඒවා දෙවිවරු සමග බෙදා ගන්නා බවක් කියැවේ. නමුත්, ක්‍රි. පූ. පස්වන ශතවර්ෂයේදී මෙම බීම වර්ගය නිපදවන පැළෑටි අතුරුදහන් වී ඇති බව පෙනී යයි. එසේම ඊට වඩා කුඩා සහ නොදියුණු ගෘහස්ථ යාග පවත්වන ලද අතර, ඒවා දෛනිකව ගෙවල්වල සහ පවුල් විසින් මෙහෙයවන ලදී.

[10] Sn. 927.
[11] A.IV,41.

වෛදික බ්‍රාහ්මණ ආගමේ මූලාරම්භය සමහර විට බුදුපියාණන් වහන්සේ පහළ වීමට වසර 1000කට ප්‍රථමව මජ්ඣිම දේශයේ බටහිර මායිමට ඔබ්බෙන් වූ, දැන් උතුරු-බටහිර පකිස්ථානයේ සහ ඇෆ්ගනිස්ථානයේ යාබද ප්‍රදේශවල සිදුව ඇත. මෙම ප්‍රදේශය හැඳින්වූයේ ආර්යවර්ත යන නමිනි. එහි පදිංචිකරුවන් අර්ධ-එඬේර මිනිසුන් වන අතර, ඔවුහු තමන් ආර්යයන් (ආර්යය), හෙවත් උතුම් පුද්ගලයන් වශයෙන් හැඳින්වූහ. ආර්යයන්ගේ ආගමේ වඩාත් සැලකිය යුතු ලක්ෂණය වන්නේ මිනිසුන් විවිධ වර්ග හතරකට අයත් යැයි විශ්වාස කිරීමයි. එනම් බ්‍රාහ්මණ හෝ පූජකයන්, රණශූරයන් (ඛත්තියා), වෙළෙඳුන්, ගොවීන් (වෙස්සා), සහ දාස (සුද්දා, සංස්කෘතයෙන් සූද්‍රා) යනුවෙනි. මෙම කණ්ඩායම්වලට පහළින් වූයේ වනාන්තරවල ජීවත්වන මිනිසුන් වන අතර, ඔවුන් ආර්ය සමාජයේ සම්මත හැසිරීම් සීමාවන්ගෙන් පිට සිටි නිසා, හරිජන කුලයට අයත් වූ අය ලෙස සලකන ලදී. පළමු කුල තුනට අයත් අය දෙවරක් උපන් (සංස්කෘතයෙන් ද්විජ හෝ ද්විජාති) යනුවෙන් හැඳින්වුණි. එයට හේතුව එක්තරා වයස් මට්ටමකදී පිරිමින් ආරම්භන චාරිත්‍රයකට භාජනය වූ අතර, එයින් ඔහුගේ කුලයට සහ එහි පිළිවෙත් සහ බැඳීම් සමග ශක්තිමත් වේ. හතරවන දාස කුලයේ, අයට වෛදික චාරිත්‍ර කිසිවකට සහභාගි විය නොහැකි වූ අතර, හරිජනයන්ට සහ විදේශිකයන්ට බ්‍රාහ්මණ ආගමේ කිසිම තැනක් නොතිබුණි. ඍග්වේදයට අනුව, එක් එක් කුල නිර්මාණය වී ඇත්තේ පජාපතිගේ ශරීරයේ විවිධ කොටස්වලින්ය - එනම්, බ්‍රාහ්මණයන් ඔහුගේ හිසෙන්, රණශූරයන් ඔහුගේ බාහුවලින්, වෙළෙඳුන් /ගොවියන් ඔහුගේ උදරයෙන් සහ දාසයන් ඔහුගේ පාදවලින් වශයෙනි.[12]

ආර්යයන්ට, ඔවුන්ගේ නැගෙනහිර දිසාවේ ජීවත් වූ මජ්ඣිම දේශයේ මිනිසුන්, දුෂ්ටයන් ලෙස පෙනුණි. එසේම ''එළදෙනුන් මෙන් මෝඩයන්''ය.[13] එයට හේතුව, ඔවුන් ආර්යයන්ගේ චාරිත්‍ර අනුගමනය නොකිරීම, වෛදික දෙවියන් නොවැඳීම හෝ බ්‍රාහ්මණයන්ට ගෞරව නොකිරීමයි. නැගෙනහිර දිශාවේ, එනම්, මජ්ඣිම දේශයේ, යාග පැවැත්වීම නුසුදුසු යැයි සලකන ලදී. ඊටත් වඩා නරක දෙය නම්, වෛදික සමාජ ක්‍රමයේ ඉවත නොදැමිය හැකි කොටස වූ කුල ක්‍රමය නැගෙනහිර වැසියන් නොසලකා හැරීමයි. එබැවින්, ඔවුන් චාරිත්‍රානුකූලව අපිරිසිදු යැයි සලකන ලදී. කෙසේ නමුත්, ශතවර්ෂ ගණනාවක් ආර්යයන් ක්‍රමයෙන් නැගෙනහිර දෙසට ගමන් කරමින්, ඔවුන් සමග ඔවුන්ගේ සංස්කෘතිය සහ ආගම ගෙන යන ලදී. එවිට බුදුපියාණන් වහන්සේගේ කාලය වන විට, මජ්ඣිම දේශයේ සංස්කෘතියට ඒකාබද්ධ වී, එය පරිවර්තනය කරමින් සහ යම්තාක් දුරට එයට පරිවර්තනය වෙමින් පැවතුණි.

---

[12] This belief became central to Hindu social life and is mentioned at *Ṛgveda* X, 90; *Atharvaveda* XX.6, 6; *Taittīyriya Saṃhita* 7,1, 1, 4-6; *Manusmṛti* I, 31; *Bhagavad Gīta* IV,13; *Mahābhārata* 12. 73, 4-5 and in several *Purāṇas*.

[13] *Śatapatha Brāhamaṇa* 13.8.1.5; *Mahābhārata* III p.368.I,20.

බ්‍රාහ්මණයෝ, රජවරුන්ට සහ දේශීය පාලකයන්ට නීත්‍යානුකූල බව, යුද්ධවලින් ජය ගැනීම සහතිකවීමට, අඛණ්ඩ වැසි ඇති වීමට, පිරිමි දරුවන් ලැබීමට සහ චාරිත්‍ර ඉටුකිරීම සඳහා පූජා පැවැත්වීම සම්බන්ධයෙන් ඔවුන්ව පරිපාලකයන් සහ උපදේශකයන් වශයෙන් කටයුතු කිරීමට නිර්දේශ කරවා ගත්හ. ඒ සම්බන්ධයෙන් ඔවුන්ට වතුපිටි සහ ඇතැම් වරප්‍රසාද ලැබුණි. ඔවුන්ගේ සමාජ න්‍යායයන්, විශේෂයෙන් සමාජය සතර ආකාරයෙන් විභජනය කිරීමේදී න්‍යායාත්මක සාධාරණීකරණයන් ලැබුණි. ඒ අනුව, එය සම්මතයක් ලෙස පිළිගැනීමට ලක් විය. තමන්ගේම ගම්වල වෙසෙන බ්‍රාහ්මණයන් සහ ''උතුරෙන් පැමිණෙන'' බ්‍රාහ්මණයන්ගෙන් ගම්‍ය වන්නේ ආර්යවතයෙන් පැමිණි අය මජ්ඣිම දේශයේ දැන් උපත ලබා සිටින අයට වඩා, පිරිසිදු සහ වඩා චාරිත්‍රමය වශයෙන් බලවත් බව බෞද්ධ ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. (ත්‍රිපිටකයේ බ්‍රාහ්මණ ගම් සඳහන් වේ. ඒවායෙන් බොහොමයක් කෝසලයයි.)

ශතවර්ෂ ගණනාවක් පුරා සහ නිසැකවම බුදුපියාණන් වහන්සේගේ කාලය වන විට, වෛදික යාග පිළිබඳව සහ ඒ සමගම ඒවා සිදු කළ ආකාරය පිළිබඳ අර්ථය වෙනස් වී ඇත. දේව ගීතිකා බොහෝ සෙයින් මායාකාර වශී ලෙස පෙනෙන්නට තිබුණි. ඒවා සම්පූර්ණයෙන්ම නිවැරදිව උච්චාරණය කළහොත්, ඉල්ලීම් ප්‍රදානය කිරීමට දෙවිවරුන්ට බල කෙරෙනු ඇත. සාපේක්ෂව සරලව තිබූ චාරිත්‍ර වඩ වඩාත් සංකීර්ණ සහ මිල අධිකවී ඇත. නොපැහැර හැරිය හැකි ලෙස තේරුමක් නැති තරම් ප්‍රමාණයක පූජා පූජනීය ගින්දරට හෙළනු ලැබුණි. මේවා සහ අනෙක් චාරිත්‍ර පැවැත්වීම සඳහා බ්‍රාහ්මණ ගාස්තු ද අධිකවී ඇත. මෙම වෙනස්කම් හා සම්බන්ධ වැඩි වෙමින් පවතින අතෘප්තිය හේතුකොට ගෙන සමහර මිනිසුන් අඩු ගණනේ, ඇතැම් බ්‍රාහ්මණ ධර්මයන් නැවත අර්ථනිරූපණය කිරීම ආරම්භ කර ඇත. එම නැඹුරුව මුල්කාලීන උපනිෂද් සහ මජ්ඣිම දේශයේ ආගමික සංස්කෘතියට ඇති විවෘත භාවයෙන් පිළිබිඹු වී ඇත. බ්‍රාහ්මණ ආගම බොහෝදුරට ප්‍රජාව කේන්ද්‍ර කරගත්, පවුලක් මත පදනම් වූ ආගමකි. දෙවරක් උපත ලැබූ අයගේ ජීවිතයකට කදිම පසුබිම වූයේ ගමක ඔහුගේ ඥාතීන් අතර ජීවත් වීමයි. ඔහුගේ ඉලක්කය වූයේ ඔහුට පුතුන් ලබාදිය හැකි වීම සහ පොහොසත් වීමට භූමි සහ ගවයන් සිටීමයි. අලුතෙන් ඇතිවූ නගර බ්‍රාහ්මණයන්ට පිළිකුලක් විය. ''ඔවුන් කියන්නේ යහපත් -විනය ගරුක ලෙස හැසිරෙන මිනිසෙකු නිර්වාණයට පත් වෙන බවයි. නමුත්, ඔහු ජීවත් වන්නේ ඔහුගේ ශරීරය, අත් සහ මුහුණ දූවිලිවලින් වැසී ගිය නගරයකයි. එය සිදුවිය නොහැකියි.!'' [14] ''ඔහු නිරයේ කල්දේරම මෙන් ... ප්‍රධාන නගරයක් මගහැරිය යුතුයි.''[15] සමහර යාගයක් නගරයක සිදු කළහොත්, එය සාර්ථක නොවන බව පවා තරයේ දරා සිටියහ. බ්‍රාහ්මණ ආගම ගම්බද ආගමක් විය. අප දකින විට බුදුදහම වඩාත් නගර සහ පුරවරවල ආගමක් විය.

---

[14] *Baudhāyana Dharmasūtra* 2.6,33.

[15] *NāradaparivrājakaUpaniṣad* 7, 95. *Āpastamba* 1. 32, 21 and *GautamaDharmasūtras* 16. 45 make this same point.

එවැනි ආගමක් නොව, මජ්ඣිම දේශය පුරා පැවති සහ ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ එසේ කර ඇති ආගමික ව්‍යාපාරයක් වූයේ, පොදුවේ සාමණ යැයි හැඳින්වෙන පැවිදි පන්තියකි.[16] මෙම තවුසන් විවිධ ආකාරයෙන් හැඳින්වේ - නිවසක් නොමැති බව නිසා ඔබ මොබ යන තවුසන් (පරිබ්බාජකයන්), කොන්දේසි සහිත පැවැත්මේ ප්‍රකෝප වූ ගඟ තරණය කිරීමට මාර්ගයක් සොයා ගැනීමට උත්සාහ කිරීම හෝ මාර්ගයක් සොයා ගත් බව නිසා, දිය බැස එගොඩ වන්නන් (තිත්ථංකර) ඔවුන් නිශ්ශබ්දව සහ හුදෙකලාව සිටීමට ඔවුන්ගේ ඇති කැමැත්ත නිසා දානය අයදින, හෝ නිශ්ශබ්ද පුද්ගලයන් (මුනි) භික්ෂූන්ය. (භික්ඛු හෝ පිණ්ඩෝල) තැනින් තැන යන සහ දානයෙන් පමණක් යැපෙන බොහෝ සාමණවරු බ්‍රහ්මචාරී වේ. ''ප්‍රමාණවත් දානය පිළිගෙන ඔහු ඔහුගේ ගමන යන්නේ කුරුල්ලෙකු මෙන්ය, කුරුල්ලෙකු මෙතැන හෝ එතැන පියඹා යන්නේ කිසිවක් රැගෙන නොවේ, නමුත් අත්තටු පමණක් රැගෙනයි.''[17] බුදුපියාණන් වහන්සේ සමණයන් වහන්සේලා පිළිබඳව පැවසුවේ එසේය. උන්වහන්සේ උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශ්‍රාවක සාරිපුත්තයන් වහන්සේ පිළිබඳව විස්තර කළේ පරමාදර්ශී සාමණ වශයෙනි. එයට හේතුව සාරිපුත්තයන් වහන්සේ ''බලාපොරොත්තු ස්වල්පයක්, තෘප්තිමත් වූ, හුදෙකලාවූ, ධෛර්ය සම්පන්න සහ උසස් මනසක් ඇතිකර ගැනීමට කැප වූ'' පුද්ගලයෙකු නිසාය.[18] සාමණ සම්ප්‍රදාය මේ කාලයේ සිදුවූ නව නාගරීකකරණය නිසා ඇති වූ අතෘප්තියට සහ විරසකයට ප්‍රතිචාරයක් වූ බවත්, ඒ අනුව එය මෑතකාලීන සංසිද්ධියක් බවත්, නමුත් එය මජ්ඣිම දේශයට ආවේණික වූ පැරණි සම්ප්‍රදායක් වීමට ඉඩ තිබූ බවටත් තර්ක කර තිබේ.

සාමණයෝ, බ්‍රාහ්මණයන්ට ප්‍රතිවිරුද්ධ ලෙස, සාමාන්‍යයෙන් වේදයන් සහ බොහෝ බ්‍රාහ්මණ ආගමේ ඇදහිලි සහ පිළිවෙත් ප්‍රතික්ෂේප කළහ. ධර්ම ග්‍රන්ථවල අධිකාරියෙන් ලැබූ අත්දැකීම්වලට, ලබ්ධියට වඩා මුල්තැනක් දුන්හ. ඔවුහු භාවනාව, ස්වයං අත්තකිලමථය, යෝගී ආශ්වාස කිරීම, නිරාහාරව සිටීම සහ දීර්ඝකාලීනව හුදෙකලාවේ සිටීම යනාදියේ අත්හදාබැලීම් සිදු කළහ. එසේම ඔවුහු විවිධ අරමුණු අපේක්ෂා කළහ. බ්‍රාහ්මණ ආගමට අනුව, මෙලොව සහ ඊළඟ භවයේ දිව්‍යලෝකය ගැන සැලකිලිමත් වූ අතර, සාමණයෝ සියලු ලෞකික අවශ්‍යතා අත්හැර දැමූහ. යම් ආකාරයක ප්‍රමුදිත අත්භූත අත්දැකීම් මේ භවයේ සහ පසුව අත්කර ගත හැකි යැයි විශ්වාස කළහ. කෙසේ නමුත්, සාමණයෝ කිහිප දෙනෙක් සියලු භෞතිකවාදී දර්ශනයන් ඉගැන්වූහ. එනම්, සියලු දාර්ශනික දෘෂ්ටිකෝණයන් ගැන සැක පහළ කළහ. එසේම එකල සිටි ප්‍රමුඛතම

---

[16] On the origin and meaning of the word see Olivelle 1993, pp.11-16.
[17] D.I,71.
[18] Ud.43.

ගුරුවරුන් හත් දෙනාගෙන් කිසිවෙකු දේවවාදී ආකාරයක් ඉගැන්වූයේ නැත.

තමා යම් ආකාරයක ආධ්‍යාත්මික අවබෝධයක් ලබා ඇතැයි විශ්වාස කරන යම් සමණයෙකුට ශ්‍රාවකයන් ආකර්ෂණය කළ හැකිය. ඒ අනුව එක් නිකායක් හෝ ගුරුකුලයක් බිහිවනු ඇත. අනෙක් අය කුඩා අවිධිමත් කණ්ඩායම්වලත් සුළු පිරිසක් වනාන්තරවලත් තනිව ජීවත් වූහ. ඔවුන් දායකවූ කුමන පුහුණුව හෝ මතවාදයට අනුව, සමණයන් නිරුවත්, සියලු සමාජ සම්මතයන් සහ සාරධර්ම ප්‍රතික්ෂේප කිරීම සංකේතවත් කළ අතර, අනෙක් අය සත්ත්ව හම් හෝ රෙදි කඩමාලුවලින් මැසූ සිවුරු පෙරවූහ. සාමාන්‍යයෙන් තැඹිලි පැහැයෙන් වර්ණවත් විය. සමහරු හිස මුඩු කළහ. තවත් අයගේ කෙස් අවුල්ව තිබුණි. ඒ අතර තවත් අය අවුල් කෙස් වැවෙන්නට ඉඩ හැරියහ. එවිට එය පීරා නැති පටලැවුණු ස්වරූපයක තිබුණි.

ක්‍රි. පූ. පස්වන ශතවර්ෂය වන විට, ප්‍රධාන සාමණ සංගම් හෝ නිකායන් අඩුම ගණනේ දුසිමක්වත් මජ්ඣිම දේශයේ සිටියහ. ඒ මුණ්ඩක සාවකයන්, ජටිලයන්, මාගණ්දික, තෙදණ්ඩිකයන්, අවිරුද්ධකයන් සහ දේවධම්මිකයන්ය. අවධානය ආකර්ශණය කළ සමණ ගුරුවරුන් වූයේ පුරාණ කස්සප, අජිත කේසකම්බලී, පකුඩා කච්චායන, සඤ්ජය බෙලත්ථපුත්ත, මහාවීර සහ සැබැවින්ම බුදුපියාණන් වහන්සේගේ මුල්ම ගවේෂණ සඳහා මාර්ගෝපදේශ ලබා දුන් ආලාර කාලාම සහ උදක රාමපුත්තයි.**19** ඔවුන් සහාය දුන් මෙම නිකායන් බොහොමයක් සහ ධර්ම ඉක්මනින්ම අප්‍රකට බවට මැකී ගියේය, අමතක විය. බෞද්ධයන් හැර ශතවර්ෂ සුළු ප්‍රමාණයකට පැවතුණේ ආජීවකයන් සහ ජෛනයන් පමණි. එකල හඳුන්වනු ලැබුවේ නිගණ්ඨයන්, හෙවත් බැඳීම් නැති පුද්ගලයන් ලෙසිනි. 20

ආජීවකයන් ආරම්භ කර ඇත්තේ මක්ඛලි ගොසාල විසිනි. ඔහු ජෛන නායක මහාවීර සමග අමනාප වී තමාගේම ව්‍යාපාරයක් ඇරඹීමට පෙර, ආරම්භයේදී මහාවීරගේ මිත්‍රයෙකි. ගොසාලගේ ඉගැන්වීම් පිළිබඳ විසිරී ඇති සහ අර්ධ වශයෙන් පරස්පර විරෝධී සඳහන් කිරීම් කිහිපයක් පමණක් ඉතිරිව ඇති නමුත්, එය එක්තරා ආකාරයකින් දැඩි නියතිවාදයක් සහ එහි බොහෝ මායාකාර පුරුදු ඇතුළත් කර ඇත. එවැනි පුරුදු පිළිගැනීම බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. විශේෂයෙන්ම, ආජීවකගේ ඉගැන්වීම්වල සමහර විට වක්‍ර විවේචනයට භාජනය වී ඇත. ආජීවකයන් ශතවර්ෂ ගණනාවක් සැලකිය යුතු ප්‍රමාණයක සහයෝගය රැස්කර ගත්හ. ඊට පසු දීර්ඝ කාලයක් පිරිහීමට ලක්විය. අවසානයේ දහතුන්වන ශතවර්ෂයේදී පමණ අතුරුදහන් විය.[21]

ක්‍රි. පූ. හත්වන ශතවර්ෂයේදී පමණ පාර්ශ්ව මුනිවරයා විසින් ජෛන ආගම ආරම්භ කර, ඊට පසු බුදුපියාණන් වහන්සේගේ පැරණි

සමකාලීනයෙකුවූ මහාවීර විසින් ප්‍රතිසංස්කරණය කර, යළි සූත්‍රගත කරන ලදී. බෞද්ධ ධර්ම ග්‍රන්ථවල ඔහු හඳුන්වනු ලැබුවේ නාතපුත්ත වශයෙනි. පාර්ශ්ව මුනිවරයාගේ මුල් ඉගැන්වීම් සහ පුහුණු කිරීම් පිළිපදින ලද අය බුදුපියාණන් වහන්සේගේ කාලයේදීත් සිටියහ. ඔවුහු මහාවීරගේ ශ්‍රාවකයන්ට වඩා අඩු ගණනේ පිටතින්වත් වෙනස් විය. මහාවීරගේ ශ්‍රාවකයන් ඔවුන්ගේ ලිංගේන්ද්‍රිය වටා කුඩා රෙදි කැබැල්ලක් පමණක් අඳිමින් නිරුවතින් සිටි නිසා, ඔවුන්ගේ නම 'එක් රෙද්දක්' (ඒකසාටක) විය.[22] බොහෝ ආකාරයෙන් ජෛන ආගම බුදුදහමට සමාන බවක් තිබුණි. එක් ප්‍රධාන වෙනසක් නම්, එයින් තවත් බොහෝ දේ පැනනගින දෙයක් වූයේ, හිතාමතා හෝ නොහිතා කරන සෑම දෙයකින්ම කර්මයක් ඇතිවේ යැයි කියන අදහසයි. [23] එසේම ඔවුහු බුදුදහම ප්‍රතික්ෂේප කරන ලද ආත්මයක යථාර්ථයද පිළිගත්හ. අදවනතුරු ජෛන ආගම නොනැසී පවතී. නමුත් එහි අනුගාමිකයන් ගණන සෑමවිටම ස්වල්පයකි. නමුත්, ඔවුන්ට ඉන්දියානු සිතුවිලි සහ සංස්කෘතියේ ගැඹුරු සහ ධනාත්මක බලපෑමක් ඇත.

බුදුපියාණන් වහන්සේගේ කාලය වන විට, කුඩා නමුත් වැදගත් බ්‍රාහ්මණ සංඛ්‍යාවක් සාමණ පුරුදු, විශේෂයෙන්ම වනගතව ජීවත්වීම සහ භාවනාවට අනුගතවී ඇත. ඔවුන් සාමාන්‍යයෙන් හඳුනාගනු ලැබුවේ අවුල් වූ කෙස් (ජටිල) සහ ඔවුන් ඇඳපැළඳි මුව සම්වලින්ය. (අජින) [24] කෙසේ නමුත්, පාරම්පරික සාමණවරු කළ ආකාරයට ලෞකික ජීවිතය බැලූ බැල්මට සම්පූර්ණයෙන්ම අත්හැර දමා යා නොහැකිය. සමහරු ඔවුන්ගේ ගම්මානයේ අද්දර හෝ අසල වනාන්තරයේ පූජනීය ගිනි රැකගෙන දවස ගත කර, හවස ඔවුන්ගේ නිවෙස වෙත පැමිණියහ. තවත් සමහරු ස්ථිරව වනයේ ගත කළහ. නමුත් ඔවුන්ගේ බිරින්දෑවරුන් සහ දරුවන් ඔවුන් සමග තබා ගත්හ. උපාසක පොටලිය ඔහු පිළිබඳව සිතා සිටියේ සැබෑ ලෙස සියල්ල අත්හළ පුද්ගලයෙකු ලෙසයි. එයට හේතුව ඔහු නිවසේ ජීවත් වූවත්, ඔහුගේ සියලු දේපළ සහ වගකීම් තමන්ගේ පුත්‍රයන්ට භාර දී තිබූ නිසාත්, ඔවුන්ගෙන් ආහාර සහ වස්ත්‍ර ලබමින් සතුටට පත් වූ නිසාත්ය. කෙසේ නමුත්, ඔහු බුදුපියාණන් වහන්සේ සමග සාකච්ඡාවක යෙදෙමින් සිටි අවස්ථාවක, උන්වහන්සේ ඔහුට ''ගෘහපති'' යනුවෙන් ඇමතූ විට, ඔහු නොරිස්සුමට පත් විය. ඔහු තමන් තවදුරටත් උපාසක කෙනෙකු නොව, සියල්ල අත්හළ කෙනෙකු බව පවසමින් තම විරුද්ධත්වය ප්‍රකාශ කළේය.

[22] Ud.65.

[23] M.II,214.

[24] The hide of the blackbuck, *Antilope cervicapra*. This beautiful animal had a particular significance in Vedic thought. The open grasslands of Punjab, Haryana and semi-deserts of Rajasthan where it roamed was part of the sacred land of Brahmanism, *Manusmṛti* 2, 22-3. On the mythology surrounding the blackbuck see Stella Kramrisch's *The Presence of Siva*, 1981 p.40-50.

බුදුපියාණන් වහන්සේ ඔහුට පැවසුවේ, අවංක ලෙස සියල්ල අත්හළ කෙනෙකු බවට පත්වීමට ඊට වඩා බොහෝ දේ අවශ්‍ය බවයි. [25]

බොහෝ සාමණවරුන්ගේ මිත්‍රසංගම් හෝ නිකායන් ඇත අතීතයේදී ජීවත් වූයේ යැයි ඔවුන් විශ්වාස කරන ප්‍රාරම්භකයන් දෙස විමසා බැලීමක් කරනු ලැබේ. ඔවුන්ගෙන් සමහර අය ප්‍රසිද්ධ අය වන අතර අනෙක් අය සමහර විට අව්‍යාජ අය විය හැකිය. ඉහත සඳහන් ආකාරයට, ජෛනයන් පාර්ශ්ව මුනිවරයා ගැන විමසීමක් කර ඇත. වරක් බුදුපියාණන් වහන්සේ ''දිය බැස එගොඩවන්නන්'' හයදෙනෙකු සඳහන් කළ අතර, ඔවුන්ගේ නම් තවමත් ගෞරවයෙන් යළි යළිත් සිහිපත් කරනු ලැබේ.[26] මීට ශතවර්ෂ ගණනාවකට පෙර ජීවත්වූ බුදුන්වහන්සේලා පස්නමකගේ පෙළපතක ඉගැන්වීම්වල හරය නැවත අනාවරණය කරගෙන සහ අලුතින් සූත්‍රගත කළ, වඩා මෑත බුදුවරයා තමන්වහන්සේ බව බුදුපියාණන් වහන්සේ දුටුවහ. උන්වහන්සේ එය මෙසේ පැහැදිලි කළ සේක,

> ''වනාන්තරය පුරා සැරිසරන මිනිසෙකු පෙර කාලයේ මිනිසුන් සැරිසරන ලද පැරණි මාර්ගයක් හෝ අඩිපාරක් දුටුවේ යැයි සිතමු. ඒ ඔස්සේ ගමන් කිරීමේදී ඔහු ගමන් කරන විට, අවසානයේ ඔහු වරක් මිනිසුන් ජීවත් වූ එක් පැරණි නගරයකට පැමිණේ. එය උද්‍යාන සහ කුඩා වන වදුලු, ජලාශ සහ බිත්ති සහිත එක් සැබෑ ශෝභන ස්ථානයකට පැමිණ ඇත. එවිට එම මිනිසා එරට රජුට හෝ ඔහුගේ ඇමතිවරුන්ට ඒ පිළිබඳව පවසනු ඇත, 'දේවයන් වහන්ස, එම නගරය ප්‍රතිසංස්කරණය කරන්න'. ඔවුන් එසේ කරනු ඇත. කාලයත් සමග එය වැඩිදියුණු වී ධනවත් සහ සශ්‍රීක, මිනිසුන්ගෙන් ජනාකීර්ණ වනු ඇත. එවිට එය දියුණු වේ. නැවතත් සශ්‍රීක වනු ඇත. එම ආකාරයටම, අතීතයේ වැඩසිටි බුදුන්වහන්සේලා සැරිසැරූ පැරණි මාර්ගයක් හෝ ගමන් මාර්ගයක් දුටුවෙමි. එම පැරණි මාර්ගය හෝ ගමන් මාර්ගය කුමක්ද? එය ආර්ය අෂ්ටාංගික මාර්ගයයි.''[27]

බුදුපියාණන් වහන්සේගේ ආසන්නතම පූර්වගාමික බුදුවරයා වූයේ කාශ්‍යප බුදුන්වහන්සේය. නැවතත්, අව්‍යාජ පුද්ගලයෙකු වුවද, උන්වහන්සේගේ ජීවිතය වටා පුරාවෘත්තයන් ගොඩනගා තිබිය හැකිය. එසේම උන්වහන්සේට ආරෝපණය කරන ලද ධර්ම කරුණු ප්‍රචාරණය කළ හෝ නොකළ ඒවා විය හැකිය. එසේම කාශ්‍යප බුදුන් වදාළ බවට කියැවෙන පද කිහිපයක් ත්‍රිපිටකයේ සඳහන් වේ. [28]

---

[25] M.I,360.
[26] S.II,5ff.
[27] S.II,105-6.
[28] M. M. Marasinghe, *Gods in Buddhism*, 2009, pp. 24-5.

බොහෝ මිනිසුන් සාමණවරුන්ට ගෞරවයෙන් සැලකුවද, සමහර විට ගෞරව සම්ප්‍රයුක්ත බියක් තිබුණද, සැමදෙනාම එසේ වූයේ නැත. සුළු පිරිසකගේ ආකල්පය වූයේ, ''මම කෑම පිසිමි, නමුත් ඒ අය එසේ කරන්නේ නැත. උයන මා උයන්නේ නැති ඔවුන්ට ආහාර දීම හරි නැත.'' [29] සාමණයෙකු දානය අපේක්ෂාවෙන් යම් කෙනෙකුගේ නිවෙස ඉදිරිපිට සිටගෙන සිටින විට, නිවසේ කාන්තාව යමක් දෙන්නට සිදුවීමෙන් වැළකීම සඳහා ඔහු නොදැක්ක ආකාරයට සිටිය හැකිය. එසේ නැත්නම්, ඉතිරිවූ දෙයක් දෙමින් හෝ අඛණ්ඩ බැණුම් වරුසාවකින් සංග්‍රහ කරමින් සුහද බවක් නැතිව ඉවත් විය හැකිය. බුදුපියාණන් වහන්සේට අනුව, ''දානය එකතු කරන්නෙකු වීම පහත්ම කාර්යයකි. ඔබ 'පාත්‍රයක් අතැතිව ඔබ මොබ යමින් දානය එකතු කරන්නෙකු' යැයි කීම, වර්තමාන ලෝකයේ නිග්‍රහයකි.'' [30]

සියලු සාමණයන් ගෞරවයට පාත්‍රවීමට තරම් සුදුසු නොවේ. ''ශ්‍රද්ධාවන්ත මිනිසුන් විසින් සපයන ලද ආහාරවලින් යැපෙමින් ජීවත්වූ'', අනාගතය පිළිබඳ අනාවැකි පළ කරන්නෙකු, සිහින අර්ථකරණය කරන්නට, ඇති හැකියාව පෙන්වන්නෙකු, සහ ජ්‍යොතිෂය පුහුණු කරමින් අනාවැකි පළකරන්නෙකු, මළගියවුන් ගෙන්වා පේන කියන්නෙකු හෝ පුහුණුවක් නැති වෛද්‍ය වෘත්තියේ යෙදෙන්නෙකු ලෙස පෙනී සිටිමින් මිනිසුන්ගේ භක්තිය හෝ රැවටෙනසුලු බව අපේක්ෂා කළ සාමණවරුන්ට බුදුපියාණන් වහන්සේ පරිභව කළ අවස්ථා පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. [31] බුදුපියාණන් වහන්සේ සාකච්ඡාවක් පවත්වමින් සිටි එක් පුද්ගලයෙක් විස්තර කළේ සාමාන්‍ය භික්ෂූන්ගේ ධර්ම දේශනාවල ගතයුත්තක් නොමැති, හුදෙක් නොවැදගත් (විලාපං විලපිතං) [32] ඒවා බවයි. සාමණවරු සුළු පිරිසක් අනුග්‍රහය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් බලවතුන් වෙත සැරිසැරීමට සූදානම් වූහ. නමුත්, බලවතුන් ඔවුන්ගේ පැත්තෙන් තම අභිමතාර්ථයන් සඳහා සාමණවරුන් භාවිත කිරීමට නොකැමති වූහ. සාමණවරුන් පුළුල් ලෙස සංචාරය කළ නිසාත්, සාමාන්‍යයෙන් විශ්වාස කරන ලද හෝ අඩු තරමින් පීඩාකාරී නොවේ යැයි සිතන නිසා, ඔවුහු ප්‍රයෝජනවත් තොරතුරු සපයන්නන් සහ ඔත්තු සපයන්නන් බවට පත්වූහ. පසේනදී රජු ඔහුට බුද්ධි තොරතුරු ලබා ගැනීමට යම් සාමණවරුන් හෝ ඔවුන් මෙන් වෙස්වලාගත් මිනිසුන් යෙදවූ බව බුදුපියාණන් වහන්සේට පවසමින් ඔහු එය පිළිගත්තේය. [33] සමස්තයක් වශයෙන් ගත් කල බොහෝ සාමණවරු අත්‍යන්ත නිර්වාණයට එළඹීමට කැපවීමෙන් සරල ජීවිත ගත කළ නමුත්, ඔවුහු කිසි විටක එය මුදුන්පත් කර ගත්තේ නැත.

සාමණවරුන් වේදයන් සහ ඔවුන්ට ලැබුණු ගෞරවය ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ගත් කල, පුදුමයට හේතුවක් නොවේ. සාමණයන් විසින් බ්‍රාහ්මණ

[29] A.IV,62.
[30] It.89.
[31] D.I,8-11.
[32] M.I,234.
[33] Ud.65-66. *Arthasāstra* I,11, ff recommends using ascetics as spies.

ආගමේ ඉතා නම්‍ය නොවූ අනුගාමිකයන්, විශේෂයෙන්ම, බ්‍රාහ්මණ පූජකයන්, වේදයන් කෙරෙහි තිබූ ආකල්පය නම්, ඔවුන් සතුරන්, මිථ්‍යා ලබ්ධිකයන් බවයි. ඔවුන් කෙරෙහි හරිජනයන්ට වඩා ස්වල්පයක් වූ වැඩි පිළිගැනීමක් තිබුණි. බ්‍රාහ්මණයන් සාමණවරුන්ට මදිපුංචිකම් කිරීම පිළිබඳව බොහෝ සිද්ධීන් ත්‍රිපිටකයේ සටහන්ව ඇත. බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූන් ඇතුළත් කර ඇත. මෙම දෙපාර්ශ්වය අතර තිබූ වෛරය පතඤ්ජලියේ (circa. 150 BCE) මතුකර දක්වයි. එහි සඳහන්ව ඇත්තේ සාමණවරුන් සහ බ්‍රාහ්මණයන් ''බළලා සහ මීයා, බල්ලා සහ නරියා, නයා සහ මුගටියා'' බවයි. එහි අදහස ඔවුන් ඔවුන්ගේ ජීවන රටාවෙන් සහ ආධ්‍යාත්මිකතා ප්‍රවේශවීමෙන් යන දෙකෙන්ම ස්වභාවයෙන් ප්‍රතිවිරුද්ධ බවයි. ඔහු තවදුරටත් සඳහන් කර ඇත්තේ, ''මේ දෙඅංශය අතර ඇති විරුද්ධතාව සදාකාලික'' [34] බවයි. මෙය සැම විටම සිදු නොවූවත්, ත්‍රිපිටකය ඇතුළු එකල ලේඛනවල පිළිබිඹුව ඇති ආකාරයට, දෙඅංශය අතර ඇති ආතතිය සහ තරගකාරීත්වය හඟවයි. ආරම්භයේ සිට, බුදුපියාණන් වහන්සේ සාමණවරුන්ගේ සම්ප්‍රදාය තුළ ස්ථිරව දුටුවහ. බුදුපියාණන් වහන්සේ සත්‍යය සොයමින් යන ගමන ඇරඹීමේදී වේදය ඉගෙනීම සඳහා උන්වහන්සේ බ්‍රාහ්මණ ගුරුවරයෙකු සෙව්වේ නැත. ඒ වෙනුවට, උන්වහන්සේ එය සාමණවරුන්ගේ මාර්ගය උන්වහන්සේ අපේක්ෂා කළ ඉලක්කය කරා ගෙන යනු ඇතැයි සිතූ බව පෙනේ. ත්‍රිපිටකය පුරා බුදුන්වහන්සේ ආමන්ත්‍රණය කර හෝ විස්තර කර ඇත්තේ ''සාමණ ගෞතමයන් වහන්සේ'' යනුවෙනි. එසේම උන්වහන්සේ තමන්වහන්සේගේ භික්ෂූන්ටද ඔවුන් ද සාමණ වශයෙන් හඳුන්වන ලෙස උපදෙස් දුන්හ. ''සාමණ, සාමණ, මිනිසුන් ඔබලා දකින්නේ එලෙසයි. එමනිසා, ''ඔබ කවුරුන් ද?'' කියා ඇසූ විට, ඔබ පිළිතුරු දිය යුත්තේ ඔබ සාමණයෙකු බවයි.'' [35]

---

[34] *Mahābhāṣya* II,4,9.
[35] M.I,281.

# 4. ශාක්‍යයන්

මගේ පෙළපත ආදිච්ච වන අතර, මම උපතින් ශාක්‍ය වංශියෙක්මි. මෙම පවුලෙන් මම ඉදිරියට ගොස් ඇත්තෙමි.Sn.423

නූතන ඉන්දියා - නේපාල දේශ සීමාව නිර්වචනය කරන හිමාලයානු කඳුපාමුලට සමාන්තරව ටෙරායි නමින් හඳුන්වන පටු භූමි භාගයකි. මුළු ප්‍රදේශයම පැතලි වන අතර, පස සාරවත් දියළු පසකි. කඳුකරයේ සිට උතුරට ගලා බසින ගංගා සහ ඇළ දොළ බොරලු තුළට ගිලා බැස ටෙරායි මතුපිටට විහිදේ. එයින් තටාක, වගුරුබිම් නිර්මාණය වේ. ශතවර්ෂ ගණනාවක් තිස්සේ ටෙරායිවලින් වැඩි ප්‍රමාණයක් සෑදී ඇත්තේ සණ මැලේරියානු වනාන්තරවලින්ය. නමුත්, දහනවවන ශතවර්ෂයේ අග භාගයේ සිට කැලෑ කපා විනාශකර සහල් වගාව සඳහා භාර දී ඇත. කැලෑ කපා විනාශ කරන්න පෙර එය කෙබඳු ද යන්න පිළිබඳව අදහසක් ඇති කර ගැනීමට, කෙනෙකු කතරනිසට් සහ සුහෙල්ව අභයභූමිවලට යා යුතුය. දූඨිව ජාතික පාර්කොර් වාල්මිකි ජාතික උද්‍යානය, ඇතුන්, එක් අඟක් ඇති රයිනසොරස්, සුන්දර තිත් මුවා, ව්‍යාඝ්‍රයන්, දිවියන්, වඳුරන්, වල් මීහරක් සහ හයනා සල් සහ වෙනත් ගස් පිහිටි ස්ථාන සහ උසට තණකොළ පිහිටි ප්‍රදේශ හරහා සැරි සරන අයුරු දැක ගත යුතුයි. මෝසම් වැසි ඇති කාලයේදී වැස්ස පරිසරයේ දූවිලි සෝදා ඇති විට, හිමාලයේ හිම සහිත මුදුන උතුරු දෙස ක්ෂිතිජය මත පැහැදිලිව දැක ගත හැකිය.

ක්‍රි. පූ. පස්වන ශතවර්ෂයේදී ටෙරායිහි කොටස්වල පදිංචිවූ එක් ජනවාර්ගික කණ්ඩායමක් වූයේ ශාක්‍යයන්ය. ඓතිහාසික බුදුපියාණන් වහන්සේ වීමට නියමිත ඒ උත්තරීතර මනුෂ්‍යයා උපත ලැබුවේද මෙම කණ්ඩායමේය. ශාක්‍යයන්ගේ උපන්බිම කුඩා සහ නොවැදගත් ප්‍රධාන රාජ්‍යයක් හැර, වෙනත් දෙයක් නොමැති බව හැර වෙනත් දෙයක් පැරණි ධර්ම ග්‍රන්ථවලින් හඟවන්නේ නැත. බුදුපියාණන් වහන්සේ එහි උත්පත්තිය නොලැබුවේ නම්, එය කිසිවිටකත් ප්‍රසිද්ධ වන්නට හෝ සිහිපත් කිරීමක් පවා සිදුනොවන්නට ඉඩ තිබුණි.[1] මජ්ඣිම දේශයේ ප්‍රධාන ප්‍රාන්ත රාජ්‍යයන් දහසයක් ත්‍රිපිටකයේ බොහෝ ස්ථානවල ලැයිස්තු ගතකර ඇත. නමුත් ශාක්‍ය රාජ්‍යය ඒ අතර නැත. එසේම ත්‍රිපිටකයේ ශාක්‍ය රාජ්‍යයේ නිකම්ම ගම් දහයක නම් සඳහන්ව ඇත. නැවතත්, සඳහන්ව ඇත්තේ එයින් මධ්‍යස්ථ ප්‍රදේශ, බොහෝ විට ජනගහණය අඩු ප්‍රදේශ, ආවරණය කළ බවයි.

ශාක්‍යයන් කියා සිටියේ ඔවුන් අර්ධ-ගුප්ත රජ කෙනෙකුවූ ඔක්කාරගේ පුත්‍රයන්ගෙන් පැවත එන්නන් බවයි. එම රජුගේ දෙවන බිරිඳගේ

[1] The *Mahāvaṃsa* and the *Mahāvastu* give genealogical data about the Sakyans, and the *Viṣṇu Purāṇa* mentions Suddhodana, the Buddha's father, but not the Buddha himself. However, these texts were composed centuries after the Buddha and there is no way of knowing if their information is reliable.

කූටෝපායන් නිසා ඔවුන් පිටුවහල් කරනු ලැබ ඇත.[2] වනාන්තරයේ අයාලයේ යමින් සිටියදී, ඔවුහු කපිල නමැති තවුසන්ගේ අසපුවට පැමිණ ඇත. ඒ අසලින් පදිංචි වන ලෙස එම තවුසන් ඔවුන්ට ආරාධනය කර ඇත. ඔහුට කළගුණ සැලකීමක් ලෙස ඔවුහු ඔවුන් පිහිටවූ ජනාවාසය කපිලවත්පු ලෙස නම් කර ඇත. එය ශාක්‍යයන්ගේ ප්‍රධාන නගරය විය. මෙම ජනාවාසය, ඉන්දියානු තේක්ක වන, සාක නමැති වෘක්ෂ කුඩා වන වදුලක පිහිටා තිබූ නිසා, පිටුවහල් කළ පුද්ගලයන් ශාක්‍යයන් වශයෙන් හැඳින්වුණි. අඩුම තරමින් ශාක්‍ය කුලයේ ඉතිහාසය පිළිබඳව ඇති සඳහන එයයි. සක්‍ය යන නම, සමහර විට සාක්‍ය, වන්නට හැකි හෝ දක්ෂ යන අර්ථය ඇති ශක් යන්නෙන් පැවත එන්නක් වීමට බොහෝ ඉඩකඩ ඇත. ශාක්‍යයන් කියා සිටියේ වෛදික සූර්ය දෙවියන් වෙත ආපසු ගියේ යැයි කියනු ලබන ආදිච්ච පරම්පරාවෙන් සහ රණශූර කුලයට තමන් අයත් බවයි.

නාමිකව ස්වාධීන වුවත්, ශාක්‍යයන්, දකුණු සහ බටහිර දෙසට ඔවුන්ගේ විශාල සහ බලවත් අසල්වැසියාවූ කෝසල රාජධානියේ බලපෑමට යටත් විය. ත්‍රිපිටකයේ මෙසේ සඳහන් වේ, ''ශාක්‍යයන් කෝසලයේ රජුගේ බැළයන්ය. ඔවුහු රජුට නිහතමානී සේවාවක් සහ ආචාර පිරිනමති. එසේ කරන්නේ ඔහුට ආචාර කිරීමට සහ ප්‍රණාමය පුද කිරීමටයි.''[3] මෙයින් පැහැදිලි කරන්නේ ශාක්‍ය භූමිය, ''බුදුපියාණන් වහන්සේගේ උත්පත්තිය සිදුවූ භූමිය'' (ජාතිභූමක)[4] අයිති වූයේ කෝසලයේ රජුට බවත්, සහ රජු වරක් බුදුපියාණන් වහන්සේට උන්වහන්සේ සහ තමන්, යන දෙදෙනාම කෝසලයන් බව පැවසීමට හේතුවත් ලෙස සඳහන් වේ. එක් ධර්ම ග්‍රන්ථයක සඳහන් වන්නේ රජතුමා රාජ්‍ය රථයකින් මැදළුම්පා නගරය හරහා ශාක්‍ය රාජ්‍යයට ගිය බවත්, එසේ සිදුවිය හැක්කේ ඔහුට ශාක්‍යයන් කෙරෙහි ආධිපත්‍යයක් තිබුණේ නම් පමණක් බවත්ය.[5] සම්ප්‍රදායට අනුව, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයට ආසන්නව හෝ බොහෝ විට ඊට පසු, ශාක්‍යයන්ගේ ඉඩම් විධිමත් ලෙස කෝසලයට අවශෝෂණය කරගත් පසු, ඒ සඳහා ඔවුන්ගේ නීත්‍යානුකූල නිදහස අවසානයට පැමිණි බවත්ය.

ශාක්‍යයන්ගේ නැගෙනහිර දිසාවට අසල්වැසියන් වූයේ කෝලියානුවරුන්ය. ඔවුන්ට අයත් රාජ්‍ය ප්‍රදේශයේ මායිම වූයේ රෝහිණී ගඟයි. එහි මූලාශ්‍රය හිමාලයේ කඳු පාමුල වන අතර, ගඟ රප්ති ගඟට ගලා බසී. එය පිහිටා ඇත්තේ නූතන ගොරඛපුර් නගරයෙන් බටහිර දෙසට ආසන්නයේය. පසුකාලීනව, සාධාරණ ලෙස ඒත්තු ගත හැකි සේ පෙනෙන පුරාවෘත්තයකට අනුව, ගිම්හාන නියඟය තුළ ශාක්‍යවරුන් සහ කෝලියන්වරුන් මෙම ගඟෙන් ජලය භාවිත කිරීම සම්බන්ධයෙන් සම්පූර්ණයෙන්ම ආවේග ඇති වූ බවත්, පසුව බුදුපියාණන් වහන්සේ ඒවා

[2] D.I,92.
[3] D.III, 83; Sn.422.
[4] M.I,145; II,124.
[5] M.II,118.

සමතයකට පත් කළ බවත්ය.[6] ත්‍රිපිටකයේ කෝලියවරුන් පිළිබඳ තොරතුරු ස්වල්පයක් පමණක් ආරක්ෂා කර ඇත. බුදුපියාණන් වහන්සේ අවස්ථා කිහිපයකදී එරට ප්‍රධානියා හමුව ඇත. ඔවුන්ට ශාක්‍යයානු රජයට සමාන ආණ්ඩුවක් තිබුණි. ඔවුන්ට සුවිශේෂී නිල ඇඳුමක් සහ බලහත්කාරකම් කිරීම සහ අනුන් ගැන නොතැකීම පිළිබඳ ප්‍රසිද්ධියක් තිබුණි.[7] පසුව, ධර්ම ග්‍රන්ථවල සඳහන්ව තිබුණේ ශාක්‍යයන් කෝලියන්ට ඥාතීත්ව සහ සමහර විට, ඔවුන් සමග විවාහ සම්බන්ධකම්ද තිබූ බවයි. එය සම්පූර්ණයෙන්ම සිදුවිය හැකි සහ විශ්වාස කළ හැකි දෙයකි.

ශාක්‍යයන්ට අහංකාරකම සහ ආවේගශීලීභාවය පිළිබඳව ප්‍රසිද්ධියක් තිබුණි. ඔවුන්ගේ අසල්වැසියන් ඔවුන් හැඳින්වූයේ ගොරහැඩි පුද්ගලයන් වශයෙනි. ''ශාක්‍යයන් වන අපි ආඩම්බර වෙමු.'' යනුවෙන් ශාක්‍ය තරුණයන් පිරිසක් තමන් පිළිබඳව හැඳින්වීමක් කළ බව සඳහනක් ඇත. ශාක්‍ය ජාතික උපාලි ශාක්‍යයන් විස්තර කළේ ''දරුණු මිනිසුන්'' වශයෙනි. වඩාත් ධනාත්මක ස්ථාවරයක් ගෙනෙමින්, බුදුපියාණන් වහන්සේ කියා සිටියේ උන්වහන්සේගේ ඥාතීන් ධනය සහ ශක්තිය උරුම කර ගෙන සිටින'' බවයි.[8] එක් උඩඟු තරුණ බ්‍රාහ්මණයෙකු තමන් කපිලවත්ථුවට ගිය විට ශාක්‍ය තරුණයන් තමන්ට නිසි ගෞරවය නොදුන් බවට බුදුපියාණන් වහන්සේ සමග පැමිණිලි කළ විට, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ඥාතීන් ආරක්ෂා කරමින් මෙසේ පැවසූහ ''නමුත්, වටු කුරුල්ලෙකු පවා, එවැනි කුඩා කුරුල්ලෙකු වුවද තමන්ගේම කූඩුවේ සිටින විට ඇයට උවමනා ආකාරයට කතා කළ හැකිය.''[9] බුදුපියාණන් වහන්සේ ශාක්‍යයන් කුඩා කුරුල්ලෙකු සමග සංසන්දනය කිරීම, ඔවුන්ගේ ඉතා කුඩා බව සහ නොවැදගත්කම පිළිබඳ තවත් සාක්ෂියකි.

ප්‍රධාන ශාක්‍ය නගරය වූ කපිලවත්ථුව කෙබඳුද යන්න පිළිබඳ විසිරුණු තොරතුරු ඇත්තේ ඉතා ස්වල්පයක් පමණි. යම් ආකාරයක ගුරුකුලයක් සහ සභා ශාලාවක් (සන්ථාගාර) ගෝත්‍රයේ වැඩිහිටියන් හමුවී ප්‍රධානියාගේ මෙහෙයවීම සම්බන්ධ කරුණු සාකච්ඡා කිරීම සඳහා ඇත. නව සභා ශාලාව ඉදිකිරීමෙන් පසු රාත්‍රියක් එහි ගත කරමින් එය ආරම්භ කරන ලෙස බුදුපියාණන් වහන්සේට ආරාධනා කළ බව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ.[10] කපිලවත්ථුවෙන් පාගමනින් යාහැකි දුරක බුදුපියාණන් වහන්සේ එහි ඉඳහිට වඩින විට නතරවන උද්‍යානය වන නිග්‍රෝධරාමය පිහිටා ඇත. එතැන සිට විශාල වනාන්තරය වූ මහාවනයට පාගමනින් වඩින්නට හැකි විය. මෙම පුළුල් වනාන්තරයෙන් නගරයේ සමහර පැති වටවී ඇති බවට පෙන්නුම් කරයි. එය හිමාලයානු කඳු පාමුලට ළඟාවී වේසාලිය දක්වා, සමහර විට, ඉන් ඔබ්බට ද විහිද ගියේය.[11] උන්වහන්සේ සමහර අවස්ථාවල

[6] Dhp-a 254.
[7] S.IV,341.
[8] Sn.422.
[9] D.I,91.
[10] S.IV,182; M.I,353.
[11] S.III,91.

නතරවූ තවත් ස්ථානයක් නම්, අඹ පලතුරු උයනයි. එය හිමිවූයේ වෙධඤ්ඤ පවුලටයි. ඔවුන් පිළිබඳ වෙනත් තොරතුරු සඳහන් නොවේ.[12] නමුත් කපිලවත්ථුව සම්පූර්ණයෙන්ම, නිශ්චිතවම කුඩා නගරයක් වුවත්, ඒ පිළිබඳ ඇති විස්තර ස්වල්පයෙන් දැක්වෙන්නේ ''පොහොසත් සහ සශ්‍රීක, තදබද සහ මිනිසුන්ගෙන් පිරුණු, එහි අතුරු මාර්ග කාර්ය බහුල'' බවයි. එයින් හැඟෙන්නේ එය කුඩා ස්ථානයකට වඩා තරමක් විශාල බවයි.[13] මෙම විස්තර දෙක අතර ඇති බවට පෙනෙන පරස්පර බව විසඳීමට පුරාවිද්‍යාවට උපකාර කළ හැකිය.

1980 ගණන්වලදී පුරාවිද්‍යාඥයන් විසින් උත්තර් ප්‍රදේශයේ කන්පූර් දිස්ත්‍රික්කයේ පැරණි ජනාවාස ස්ථාන පිළිබඳ සමීක්ෂණයක් සිදු කරන ලද්දේ ක්‍රි. පූ. හත්වන සිට තුන්වන ශතවර්ෂය දක්වා කාලය තුළදීය. හෙක්ටයාර් දෙකකට අඩු ජනාවාස අසූ එකක් සොයා ගත් ඔවුන් ගණනය කළේ එහි 500කට නොඅඩු ජනගහනයක් සිටින්නට ඇති බවයි. හෙක්ටයාර් දෙකත් හතරත් අතර, ප්‍රදේශයක් ආවරණය වන පරිදි ජනාවාස දාහතරක් තිබූ අතර, මේවායේ ජනගහනය 500ත් 1000ත් අතර විය හැකිය. ජනාවාස හතරක් හෙක්ටයාර් හතරකට වඩා වැඩිවූ අතර, එහි වැසියන් 1,200ත් 1,300ත් අතර ප්‍රමාණයක් වාසය කරන්නට ඉඩ ඇත.[14] මෙම සියලු ජනගහන මධ්‍යස්ථාන එකල තිබූ ප්‍රධාන නගරවලට වඩා බෙහෙවින් කුඩා වූ අතර, ඒවා අද ගම්මාන ලෙස සැලකීමට තරම් සුදුසුකම් ඇත. කපිලවත්ථුවේ ජනගහනය 1,300ක් සිටියේ නම්, විශේෂයෙන්ම එය වාණිජ මධ්‍යස්ථානයක් සහ රජයේ අසුනක් නම්, එය කාර්ය බහුල සහ ජනාකීර්ණ යැයි හැඳින්වීමට තරම් විශාල වන්නට ඇත. 1970 දශකයේ මුල් භාගයේ කපිලවත්ථු භූමියේ සිදු කරන ලද කැණීම්වලින් තහවුරු වන්නේ එය මධ්‍යස්ථ ස්ථානයක් බවයි. මුළු භූමියම ගවේෂණය කළ නොහැකි වූයේ එහි සමහරක් ප්‍රදේශ කෘෂිකර්මාන්තයේ යොදවා තිබුණ නිසා බවත්, ගවේෂණය කළ හැකි වූයේ කුඩා ප්‍රදේශයක් පමණක් බව ඔවුහු අනාවරණය කළහ.

බුදුපියාණන් වහන්සේගේ කාලයට අයත් සියලු ව්‍යුහයන්ට තිබුණේ මඩ බිත්තිය. ඒවා නිමවා තිබුණේ පසුකාලයක සිට බොහෝ සෙයින් පැවත එන පුළුස්සන ලද ගඩොල්වලින්ය. පසුකාලීන බෞද්ධ පුරාවෘත්තයේ විස්තර කර ඇති පරිදි කපිලවත්ථු යනු මහා රාජකීය අගනුවරට සමාන දෙයක් බොහොමයක් පුනරාවර්තනය වන්නේ කපිලවත්ථුව තිබූයේ හිමාල කඳුවැටියේ පාමුල යැයි කියමිනි. ඇත්ත වශයෙන්ම, එය වටා ඇති භූමි ප්‍රදේශය ගංගා සහ යමුනා තැනිතලාවේ සෙසු ප්‍රදේශ මෙන් සමතලා වේ - කඳුකරය ආරම්භ වන්නේ උතුරට තවත් කිලෝමීටර් තිහක් ඇතින් පමණය.[16]

---

[12] D.III,117.
[13] S.V,369.
[14] See Lal, 1984, a and b.
[16] Sn. 422 says the Sakyan country was flanked by, or beside, *passa*, the Himalayas.

බුදුපියාණන් වහන්සේ උත්පත්තිය ලැබූයේ, හැදී වැඩුණේ සහ පරිනිර්වාණයට පත් වූයේ හින්දු පුද්ගලයෙකු ලෙස'' බව කියා ඇත. මෙම කියමන පෙනෙන ආකාරයට පදනම් වී ඇත්තේ අද කාලයේ බොහෝ ඉන්දියානුවන් හින්දු වන නිසා, පැරණි කාලයේදීද එසේ වන්නට ඇතැයි යන්න මතය විය හැකිය.[17] යථාර්ථය නම්, ශාක්‍යයන් අතර තිබූ ආගම කුමක්ද යන්න පිළිබඳව අපට අවබෝධයක් නැත යන්නයි. ඒ නිසා තරුණ ගෝතම බෝධිසත්වයන් හට බලපෑම් තිබිය හැකිව තිබුණි. නිසැකවම, ශාක්‍ය දේශය තුළ බ්‍රාහ්මණයෙකු සිටි බවට ඇත්තේ සාක්ෂි ස්වල්පයකි. ප්‍රධානියාගේ එක් ගම්මානයක් වන බොමදුස්සහි බ්‍රාහ්මණයන් ජීවත් වූ අතර, බුදුපියාණන් වහන්සේ එහි වැඩම කළ විට, ඔවුහු උන්වහන්සේට සුහද බවින් තොර පිළිගැනීමක් කළහ. [18]

හින්දු ආගමේ පුරෝගාමියා වූ බ්‍රාහ්මණ ආගම සිය සාම්ප්‍රදායික පූජනීය භූමියේ සිට ගංගා නිම්නය දක්වා අවම වශයෙන් අවුරුදු සියයක් තිස්සේ ගමන් කරමින් සිටි අතර, කලාපය තුළ ස්ථාපිත වෙමින් පවතී. මගධයේ බිම්බිසාර වැනි රජවරු අධිකරණයේ උපදේශකවරුන් සහ නිලධරයන් ලෙස බ්‍රාහ්මණවරුන් කිහිප දෙනෙකු බඳවා ගෙන ඇත. නමුත් අනෙක් අතට, ඔහුගේ ඥාති සහෝදරයෙකු ආජීවකයන් අනුගමනය කරන්නෙකු වේ. එයින් අදහස් වන්නේ සමහර ප්‍රභූ පැලැන්තිය වෛදික සමණ නොවන සම්ප්‍රදායට පක්ෂපාත බව දරා සිටි බවයි.[19]

ප්‍රධාන රාජ්‍යවල මායිම්වල සිටි ශාක්‍යයන් වැනි මිනිසුන් සමහර විට තවමත් බ්‍රාහ්මණ ආගමෙන් සාපේක්ෂව නොසලකා ඇති බව පෙනේ. සමහර විට ත්‍රිපිටකයේ කුල හතර පිළිබඳව සඳහන් කරන විට, රණශූර කුලය සැමවිටම බ්‍රාහ්මණ කුලයට පෙර සඳහන් වන්නේ එනිසා විය හැකිය. එහෙම වුනත්, කුලය පදනම්වූ ප්‍රධානීන් කුල ධුරාවලිය හා සම්බන්ධ බ්‍රාහ්මණ මතයට විරෝධය පෑම හෝ නොසලකා හැරීමක් තිබූ බව පෙනේ. ශාක්‍යයන්ගේ ආගමික ජීවිතය පිළිබඳව අපට ඇති එකම ඉඟිය නම්, බුදුපියාණන් වහන්සේගේ මාමා කෙනෙකු වූ වප්පගේ කෙටි සඳහනයි. ඔහු වෛදික ජෛන නොවන අනුගාමිකයෙකු වේ.[20] මජ්ක්ධිම දේශයේ මිනිසුන් මෙන් බොහෝ ශාක්‍යයන් ද දැනට හඳුන්වන ජීවවාදීන් වූහ. ඔවුහු ඔවුන්ගේම දේශීය භූතයන් සහ දෙවිවරුන් වන්දනා කළහ.

ශාක්‍යයන්ගේ දේශපාලන ජීවිත පිළිබඳ තොරතුරු සමහරක් අප සතුව ඇත. පුරාවෘත්තයට අනුව, බුදුපියාණන් වහන්සේගේ පියා රජ කෙනෙකි. නමුත්, මෙම ප්‍රකාශය අනුමත කිරීම සඳහා ත්‍රිපිටකයේ ඇති සාක්ෂි නොසැහේ. කිසිම තැනක බුදුපියාණන් වහන්සේ රාජකුමාරයෙකු (රාජකුමාර) ලෙස හඳුන්වා නැත. කිසිම තැනක උන්වහන්සේ හෝ පවුලේ

---

[17] *2500 Years of Buddhism*, edited by P. V. Bapat, 1956, p.ix.
[18] S.I,184.
[19] Vin.IV,74.
[20] A.II,196.

අය රජ මාළිගාවක ජීවත්වූ බව සඳහන් වී නැත. උන්වහන්සේගේ පියා 'රාජ' රජ කෙනෙකු වශයෙන් හඳුන්වා ඇත්තේ එක් අවස්ථාවකදී පමණි.[21] පස්වන ශතවර්ෂය වන විට එම වචනය රජුන් හැඳින්වීමට භාවිත වුවත්, එය තවමත් රාජකීය ඇඟවීම් නොමැතිව තෝරා පත් කර ගත් ප්‍රධානියෙකු හෝ කොන්සල්වරයෙකුගේ පෙර අර්ථය රඳවාගෙන ඇත. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පියා රජෙකු හෝ උන්වහන්සේ කුමාරයෙකු ලෙස හඳුන්වනු ඇතැයි යමෙකු අපේක්ෂා කරන්නට ඉඩ තිබූ අවස්ථාවල පවා එසේ නොකළහ. නිදසුනක් වශයෙන්, බිම්බිසාර රජු උන්වහන්සේගේ උපත, සහ ඥාතීන් පිළිබඳව විමසූ විට, සරල පිළිතුර වූයේ තමන්වහන්සේ ශාක්‍ය පවුලකින් පැවත එන බවයි.[22] ශාක්‍යයන්ට 'ප්‍රධාන තනන්නන්' (රාජකට්ටාරො) නමැති මිනිස් කණ්ඩායමක් සිටි බව ත්‍රිපිටකයේ සඳහන් වේ. එවැනි කණ්ඩායම් පිළිබඳව වෙනත් පැරණි ඉන්දියානු ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. ඔවුන් තමන් පාලනය කිරීම සඳහා ප්‍රධානියෙකු තෝරා පත් කර ගත් බව පැහැදිලි වේ. ඒ නියම කර ගත් කාලයකට හෝ ඔහු පිළිබඳව ඔවුන්ගේ විශ්වාසය තිබෙන තුරුය.[23] කපිලවත්ථුවේ බුදුපියාණන් වහන්සේ විවෘත කරන ලද සභා ශාලාව ප්‍රධාන තනන්නන් සහ ගෝත්‍රයේ වැඩිහිටියන්, ව්‍යාපාර සහ කණ්ඩායමේ ජ්‍යෙෂ්ඨයා වශයෙන් ප්‍රධානියා හරියටම මුලසුන් ගත් රැස්වීම් පැවැත්වූ ස්ථානයයි.[24] එම නිසා බුදුපියාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම නිශ්චිත වශයෙන් පැවත ආයේ පාලන තන්ත්‍ර පවුලකින් වන අතර, උන්වහන්සේ පසුකාලීන ශතවර්ෂවලදී හෝ වර්තමානයේ තේරුම්ගත් අර්ථයෙන් රාජකීය නොවූහ.

සුද්ධෝදන පිළිබඳව ත්‍රිපිටකයේ ඇත්තේ කෙටි සඳහන් හතරක් පමණක් වන බවත් දැනගැනීම වැදගත් වේ.[25] ඔහු හැර, ශාක්‍ය නායකයෙකු වශයෙන් සඳහන් වන එකම පුද්ගලයා භද්දිය පමණකි.[26] ඔහු භික්ෂුවක වූ පසු, පැවසුවේ නායකයෙකුව සිටි අවධියේදී ජීවත් වූයේ නිරන්තර බියෙන් බවය.[27] ඔහුගේ නිවස පිටත සහ ඇතුළත මුරකාවල් යොදන්නට සිදුව ඇත. ශාක්‍ය දේශපාලනය සමහර විට භයානක විය හැකි බව පෙනේ.

බුදුපියාණන් වහන්සේගේ මව වූ මහා මායා දරු ප්‍රසූතියෙන් දින හතකට පසු මිය ගියාය. ඒ නිසා ඒ හැර ත්‍රිපිටකයේ වෙනත් කිසි තැනක ඇය පිළිබඳව තොරතුරු සඳහන් වී නොමැත. උන්වහන්සේගේ සුළු මව වූ මහාප්‍රජාපති ගෝතමී පිළිබඳව කෙසේ නමුත් ඊට වඩා තොරතුරු සඳහන් වේ. ''උන්වහන්සේගේ මවගේ සහෝදරිය වශයෙන්, ඇය උන්වහන්සේගේ සාත්තු සේවිකාව වූවාය. සුළු මව වශයෙන් ඇය උන්වහන්සේට කිරි පෙව්වාය. උන්වහන්සේගේ මව මිය ගිය විට, තන කිරි පෙව්වාය.''

[21] D.II,7. At Vin.I, 82 he is referred to as just Suddhodana the Sakyan.
[22] Sn.322-4.
[23] D.II,233. See Majumdar, pp.97 ff; 223 ff.
[24] S.IV,182.
[25] D.II, 52; Sn.685; Th. 534, Vin.I,82-83, and at M.I,246 where he is not named.I do not include references to him in the *Buddhavaṃsa* or *Apadāna*, late additions ot the Tipitaka.
[26] Vin.II,180-182; Ud.18-19.
[27] M.III,253.

සුද්ධෝදන මිය ගිය පසු, බුදුපියාණන් වහන්සේ කපිලවත්ථුවට වැඩිය අතර, මහාප්‍රජාපතිය ඇයට භික්ෂුණියක වීමට අවසර ඉල්ලුවාය. නමුත් උන්වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. ඊට ටික කාලයකට පසු, උන්වහන්සේ වේසාලියට වැඩිය විට, මහාප්‍රජාපතිය සහ පැවිදිවීමට අපේක්ෂා කළ තවත් බොහෝ කාන්තාවන් උන්වහන්සේට පසුගාමීව යන්නට තීරණය කරන ලදී. ඔවුන් එහි ගිය පසු, ආනන්ද හිමියෝ මහාප්‍රජාපතිය දුටුවහ, ''ඇයගේ දෙපා ඉදිමී ඇත, ශරීරය දූවිල්ලෙන් වැසී ඇත, මුහුණේ කඳුළු වැගිරී ඇත.'' උන්වහන්සේ ඇය සහ අනෙක් කාන්තාවන් වෙනුවෙන් බුදුපියාණන් වහන්සේට කතා කරන්නට තීරණය කළහ. නැවතත් බුදුපියාණන් වහන්සේ කාන්තාවන් පැවිදි කිරීම ප්‍රතික්ෂේප කළහ. අවසානයේ, ආනන්ද හිමියන්, බුදුපියාණන් වහන්සේගෙන් විමසුවේ, පුරුෂයන් මෙන් කාන්තාවන්ට අරහත් ඵලයට පත්වන්නට පුළුවන්ද නැද්ද යන්නයි. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ, ''කාන්තාවන්ටත් ඔවුන්ගේ ගිහි ජීවිතය අතහැර සුපේෂල පුද්ගලයන් විය හැකිය.'' අවසානයේ, අනුකම්පාව දක්වමින්, බුදුපියාණන් වහන්සේ භික්ෂුණී ශාසනය පිහිටුවීම සඳහා අවසර දුන්හ.[28] උන්වහන්සේ මෙසේ තීරණයක් ගත්තේ තරමක අකමැත්තෙන් යැයි කෙනෙකුට හැඟීමක් ඇති වන්නට පුළුවනි. නමුත්, මහාප්‍රජාපති ගෝතමී තමන්ට අවශ්‍ය විදියට යෑමට තරම් අධිෂ්ඨානයකින් යුක්ත ශක්තිමත් කාන්තාවක යන හැඟීමද ඇතිවය.

ගෝතම බෝධිසත්ත්වයන් වහන්සේට සහෝදර සහෝදරියන් සිටි බවට ත්‍රිපිටකයේ හෝ මුල්කාලීන සම්ප්‍රදායේ සඳහනක් නැත. නමුත්, උන්වහන්සේගේ සුළු සහෝදරයන් සහ ඥාති සහෝදරයන් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. ආනන්ද, අනුරුද්ධ සහ මහානාම උන්වහන්සේගේ පියාගේ සහෝදරයාගේ පුත්‍රයන් වන අතර, දේවදත්ත උන්වහන්සේගේ මවගේ සහෝදරයාගේ පුත්‍රයාය. තිස්ස, උන්වහන්සේගේ පියාගේ සහෝදරියගේ (පිතුච්ඡාපුත්ත) පුත්‍රයාය. නන්ද, උන්වහන්සේගේ පියාගේ දෙවන බිරිඳ වූ මහාප්‍රජාපති ගෝතමීගේ (මාතුච්ඡාපුත්ත) පුත්‍රයාය. මහානාම හැර, මේ සියලු පුද්ගලයෝ අවසානයේ භික්ෂූන් බවට පත්වූහ. බුදුපියාණන් වහන්සේ ගිහියන් අමතන විට, ඔවුන් උන්වහන්සේගේ ශ්‍රාවකයන් වුවද, නොවූවද, සැමවිටම ආමන්ත්‍රණය කළේ 'ගෘහපති' (ගහපති) වීම චමත්කාරජනක දෙයක් විය. උන්වහන්සේ වෙනත් පූජ්‍ය පක්ෂය සමග කතා කරන විට, සාමාන්‍යයෙන් භාවිත කළේ ඔවුන්ගේ ගෝත්‍ර නාමයෙනි. රජවරුන් සමග කතා කරන විට, සාමාන්‍යයෙන් ඔවුන්ගේ රාජ්‍ය නිල නාමය භාවිත කළහ, උදාහරණ වශයෙන්, රජතුමා, කුමාරයා වශයෙනි.[29] සමකාලීන ශාක්‍යයන් අමතන විට, කෙසේ නමුත්, සැම විටම භාවිත කළේ ඔවුන්ගේ පෞද්ගලික නාමයන්ය. එයින් ඇඟවුනේ උන්වහන්සේ තමන්වහන්සේගේ ඥාතීන් සමග තිබූ සමීප බව සහ හුරුපුරුදු බවයි.

---

[29] When talking with King Pasenadi he always addressed him as *mahārāja* but when talking with Queen Mallikā he addressed her by her name.

බුදුපියාණන් වහන්සේ ඔබ මොබ වඩින භික්ෂුවක වීමට අභිනිෂ්ක්‍රමණය කරන තුරු ජීවිතය පිළිබඳව කිසිම තොරතුරක් පාලි ත්‍රිපිටකයේ සඳහන් නොවේ. මෙයින් පසුකාලීන පරම්පරාවල් බෞද්ධයන්ගෙන් හිස්තැන් පිරවීම නතර වීමක් සිදුනොවිණි. ඔවුහු එය සිදු කළේ උද්‍යෝගයෙන් සහ සැහෙන සෞන්දර්යය පිළිබඳ වූ කුසලතාවයකින්ය. ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේගේ උපත පිළිබඳව ඔවුන් නිර්මාණය කළ කතන්දර, ඔවුන් විසින් ජේසුස්වහන්සේගේ උපත වටා ගොඩගැසූ කතා තරම්ම සිත්ගන්නා ඒවා විය.

බුදුපියාණන් වහන්සේගේ ජීවිතය පිළිබඳ සෑම විස්තරයක්ම උන්වහන්සේගේ උත්පත්තියේ දී සිදුවූයේ යැයි කියනු ලබන සිද්ධීන් වශයෙන් හැඳින් වේ. එනම්, උන්වහන්සේගේ මව පිළිසිඳ ගන්නා විට සුදු ඇතෙකු සිහිනෙන් දැකීම, ගසක අත්තක් අල්ලාගෙන දරු ප්‍රසූතිය සිදු කිරීම, සහ ඇයගේ දකුණු ඇලයෙන් උන්වහන්සේගේ උපත සිදුවීම යනාදියයි. පසුකාලීන සමහර විස්තරවලින් දක්වන්නේ මහා මායා දරුඋපත සිදුවන විටත් කන්‍යාවකව සිටි බවයි. මෙම ජනප්‍රවාද කිසිවක් ත්‍රිපිටකයේ සඳහන්ව නැත. බුදුපියාණන් වහන්සේගේ උපත සම්බන්ධයෙන් තිබෙන එකම දේශනය ආචාරියබ්භූත සූත්‍රයයි. එය නිසැකවම ප්‍රමාදයි. උත්පත්තිය සිදුවීමට පෙර, සිදුවන විට, සහ සිදුවූ වහාම බොහෝ අපූරු සිදුවීම්, සිදුවූ බවට කරන ලද උපකල්පන පිළිබඳ තොරතුරු එහි ඇතුළත් වේ.[30] කෙසේ වෙතත් සඳහන් සියලු විස්තර අතිශයෝක්තියෙන් බැහැර කළ යුතු නොවේ. සමහර ඒවා සත්‍යය මත පදනම් වූවා විය හැකි වන අතර, තවත් සමහරක් උපදේශාත්මක අරමුණක් ඇති ඒවා විය හැකිය. නිදසුනක් වශයෙන් මහාමායා දේවිය දරු ප්‍රසූතිය සිදුකර ඇත්තේ සිටගෙන සිටිමින් සිටියදී බව පැවසීම කිසිසේත් සිදුවිය නොහැක්කකි. පැරණි ඉන්දියානු උපත් පිළිවෙත් ගැන එතරම් දැනුමක් නැත. නමුත් කාන්තාවන් සාමාන්‍යයෙන් ප්‍රසූතිය සිදු කරනු ලබන්නේ ඉඳගෙන, ආංශිකව හෝ සිරස් (ඍජු) අතට සිටිමින්ය. බ්‍රිතාන්‍ය වින්නඹු මාතාවන්ගේ රාජකීය විද්‍යාලය නිර්දේශ කරන්නේ ඍජුව සිට සිදු කරන දරු ප්‍රසූතියයි. වින්නඹුවන් සහ අනෙක් සේවිකාවන් නිසියාකාරව පුහුණු කර එයට සූදානම්ව සිටී නම්, එය සම්පූර්ණයෙන්ම ආරක්ෂිත වේ.[31]

දේශනයේ මෙසේ සඳහන් වේ:

> "බුදුපියාණන් වහන්සේ මව් කුසට පහළ වන විට, දෙවියන්ගේ ආලෝකයටත් වඩා විශාල වූ අපමණ ආලෝකයක් ලොව පහළ විය. අපගේ චන්ද්‍රයාගේ සහ සූර්යයාගේ ආලෝකය බලවත් වුවත්, තේජාන්විත වුවත්, ඒවාට ළඟාවිය නොහැකි අඳුර, අඳුරු අවකාශයන්හි

[30] M.III,119 ff.
[31] In the West, lying down while giving birth is a relatively recent practice. See Lauren Dundes' 'The Evolution of Maternal Birthing Position', in *American Journal of Public Health*, Vol.77, No. 5,1987.

> පවා එම ආලෝකය බැබළුණේය. ඒ අඳුරෙහි ජීවත්වන සත්ත්වයෝ, ඒ ආලෝකය නිසා ඔවුනොවුන් හඳුනාගෙන 'සැබැවින්ම මෙහි තවත් සත්ත්වයෝ සිටිති' යැයි සිතූහ.''

බුදුපියාණන් වහන්සේගේ උත්පත්තිය පිළිබඳව සාකච්ඡා කරන දේශනා දෙකෙන් පවා, එකක් පැහැදිලිව පසුකාලීන එකක් වන අතර, ස්වභාවයෙන් ජනප්‍රවාදයකි. මේ කිසිවක් සඳහන් නොකෙරේ.

බුදුපියාණන් වහන්සේගේ උපත පිළිබඳව නිශ්චිතව කිව හැකි එකම දෙය නම් උත්පත්තිය සිදුවූයේ ශාක්‍ය භූමි පිහිටි දිස්ත්‍රික්කය වූ ලුම්බිනියේ ප්‍රධාන කෝලියානු නගරයේ කපිලවත්ථු සහ දේවදහය අතර බවයි. [32] උපත සැමවිටම නිරූපණය වී ඇත්තේ එළිමහනේ මහා මායා සිටගෙන, ගසක අත්තක් අල්ලාගෙන සිටින ආකාරයෙනි. නමුත්, ලුම්බිනිය ගමකි (ගාම). උත්පත්තිය නිවසක නැතහොත් අවම වශයෙන් යම් ආකාරයක සෙවණක සිදුවන්නට බොහෝදුරට ඉඩ කඩ ඇත.[33] ලුම්බිනිය පිහිටි ස්ථානය නිශ්චිතවම හඳුනාගත්තේ 1896 වසරේදීය. ඒ ක්‍රි. පූ 249දී අශෝක අධිරාජයා එහි වන්දනාවේ යාමෙන් පසු ඔහු විසින් එහි තනි ගල් ටැඹක් මත ඉදිකරවන ලද කුළුණක් හඳුනා ගැනීමෙන් පසුය.

ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේගේ උපත ආශ්‍රිත අනෙක් එකම තොරතුර නම් අසිත තවුසන්ය. මෙම තවුසා වනයේ ජීවත්වූ අතර ඔහුට අවුල්වූ කෙස් තිබුණි. බොහෝ විට මෙවැනි දේ තිබුණත්, වෛදික නොවන තවුසන්ට සුවිශේෂ නොවුණි. ඔහු කණ්හසිරි යනුවෙන්ද හැඳින්වුණි. අඳුරු ශ්‍රේෂ්ඨත්වය[34] යන්නෙන් අදහස් වූයේ ඔහු පහත් කුලයකින් හෝ අවම වශයෙන් බ්‍රාහ්මණයෙකු ද නොවූ බවයි. එක් දිනක අසිතට අවධාරණය වූයේ දෙවිවරු විශේෂයෙන්ම ප්‍රීතිමත්ව සිටි බවයි. ඔහු ඒ පිළිබඳව විමසූ විට දැනගන්නට ලැබුණේ ඉතාමත් විශේෂ දරුවෙකු ශාක්‍යයන් අතර උත්පත්තිය ලබා ඇති බවයි. ඒ අනුව අසිත තවුසා සුද්ධෝදනගේ නිවස වෙත ගියේය. දරුවා ඔහුට පෙන්වා ඔසවා ගන්නට ඔහුට දෙන ලදී. පෙරනිමිති දැක්වීමට සහ මන්ත්‍ර (ලක්ඛණ මන්ත) සම්බන්ධයෙන් දක්ෂයෙකුවූ අසිත දරුවා ශ්‍රේෂ්ඨ ආධ්‍යාත්මික හැකියාවෙන් යුක්ත පුද්ගලයෙකු වන බව දුටුවේය. නමුත් ඔහුගේ ඇසට කඳුළු උනන්නට විය. එය දැක දරුවාගේ අනාගතයට අයහපතක් සිදු වේ යැයි බියට පත් සුද්ධෝදන අසිත අපහසුතාවට පත්වීමට හේතුව විමසුවේය. අසිත පිළිතුරු දුන්නේය, ''මෙම දරුවා ඉහළම පාරිශුද්ධ දැක්ම වූ බුද්ධත්වයට පත්වන්නේය. එසේම බොහෝ දෙනා කෙරෙහි අනුකම්පාවෙන් උන්වහන්සේ සත්‍යය නමැති චක්‍රය ක්‍රියාකරවනු ඇත. උන්වහන්සේගේ

---

[32] M.II,214 says that Devadaha was in the Sakyan country which may be a mistake. Some forty-five km. north-east of Lumbini is a small town of Devadaha which Nepal claims is the site of the ancient town. In fact, this town only came into existence as the forest was cleared in the 1960s and settlers moved into the area. Archaeological evidence of an ancient settlement is yet to be found in or around the town.

[33] Sn.638.

ඉගැන්වීම් දසත පැතිරෙනු ඇත.''[35] පසුව, අසිත තවුසා දරුවා ශ්‍රේෂ්ඨ ආධ්‍යාත්මික ගුරුවරයෙකු හෝ ශ්‍රේෂ්ඨ දේශපාලන නායකයෙකු විය හැකි යැයි අනාවැකි කී බව පුරාවෘත්ත සඳහන් කරයි. මෙම තොරතුර හෝ අනාවැකිය ත්‍රිපිටකයේ නැත.

[35] Sn.679-694.

# 5. ආලෝකය වෙත

අමරණීයයන්ගේ දොරවල් විවෘතව ඇත.
ඇසිය හැකි පුද්ගලයන්ට විශ්වාසයෙන් ප්‍රතිචාර දැක්වීමට ඉඩ දෙන්න.
මජ්ඣිම නිකාය 1ල 169

නූතන චරිතාපදානයන් සාමාන්‍යයෙන් වැඩි අවධානයක් දෙන්නේ ඔවුන්ගේ විෂයයේ හැදී වැඩීම කෙරෙහි විශාල අවධානයක් යොමු කිරීමටයි. පුද්ගලයෙකුගේ සම්භවන වසර පසුකාලීන ජීවිතයේ ඔවුන්ගේ ගතිලක්ෂණ, හැසිරීම්, ජයග්‍රහණයන් හෝ විශ්වාසයන් පිළිබඳව හෝඩුවාවල් රඳවා තබා ගනිමින් පැහැදිලි කරනු ඇත. පැරණි ඉන්දියානුවන් එසේ සිතුවේ නැත. ඒ අනුව, ගෞතම බෝධිසත්ත්වයන්ගේ ජීවිතය පිළිබඳව උන්වහන්සේ ඔබ මොබ යන තවුසෙකු වනතුරු ඔවුන්ට තිබුණේ ස්වල්පවූ උනන්දුවකි. නැතිනම් කිසිම උනන්දුවක් තිබුණේ නැත. ඒ අනුව, ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේගේ තාරුණ්‍යය පිළිබඳ හොඳින් දන්නා කතන්දරවලින්, ඉතා වර්ණවත් සහ ආකර්ෂණීය වුවත්, ඒවායෙන් ඉතා පැරණි ග්‍රන්ථවල සඳහන් වී ඇත්තේ ඉතා ස්වල්පයක් පමණක් බව අපට පෙනී යයි. සිදුහත් කුමරුගේ නම් දීමේ උත්සවය, උන්වහන්සේගේ ඥාති සොහොයුරු දේවදත්තගෙන් කැලෑ පාත්තයෙකු බේරා ගැනීම, මලල ක්‍රීඩා සහ සටන් තරග ජයගැනීම, යශෝදරා සමග විවාහ වීම, සුඛෝපභෝගී ජීවන රටාව යනාදිය සහ පසුකාලීන සියලු නිර්මාණ යනාදියයි. ඇත්තවශයෙන්ම, අසිත තවුසාගේ කතාව හැරුණු විට, ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේගේ ළමා කාලය, තාරුණ්‍යය සහ වැඩිහිටි වියේ මුල් අවධිය පිළිබඳව ඇත්තේ ඉතා කෙටි තොරතුරු හතරක් පමණි.

පසුකාලීන ජීවිතයේදී මෙම කාල පරිච්ඡේදය පිළිබඳව සිහිපත් කරන විටදී බුදුපියාණන් වහන්සේ ''සියුම් ලෙස හැදී වැඩුණු, වඩාත් සියුම් ලෙස හැදී වැඩුණු, සුවිශේෂී ලෙස හැදී වැඩුණු'' බව පැවසේ. උන්වහන්සේ ඉස්තරම් සිල්ක් සහ සුවඳ විලවුන්වලින් යුක්තව සිටියහ. විනෝදවීමට කාන්තා සංගීත කණ්ඩායමක් සිටියේය. පිටතට යනවිට උන්වහන්සේ සමග යාමට කුඩයක් රැගෙන පසු පස කෙනෙක් සිටියේය. රසවත් ආහාර ලැබුණි. ගිම්හානය, ශීත ඍතුව සහ මෝසම් කාලය වශයෙන් ජීවත්වීමට මන්දිර තුනක් තිබූ බව උන්වහන්සේ පැවසූහ.[1] තමන්වහන්සේ ධනවත් සහ වරප්‍රසාදවලින් යුක්ත පසුබිමකින් පැවත ආ බව යළිත් සනාථ කළහ. උන්වහන්සේ විසින්ම නැවත සනාථ කරන ලද තවත් තොරතුරක් වඩාත් වැදගත් වේ. එක් දිනක් උන්වහන්සේ තම පියා වැඩ කරන ආකාරය ජම්බු ගසක් යට ඉඳගෙන බලා සිටියදී, දැන් අද්භූත අත්දැකීමක් ලෙස හැඳින්විය හැකි දෙයක් සිදුවී ඇත. පෙනෙන ආකාරයට, නිරායාසව උන්වහන්සේ භාවනාමය තත්ත්වයකට පත්වී ඇත. පසුව එම තත්ත්වය ධ්‍යාන ලෙස

[1] A.I,145.

හැඳින්වූහ.[2] මෙම අත්දැකීම වසර ගණනාවකට පසු උන්වහන්සේගේ බුද්ධත්වය අවබෝධ කර ගැනීම කෙරෙහි ගැඹුරු බලපෑමක් ඇති කළ අතර, එය විස්තරාත්මකව පහත පැහැදිලි කෙරේ.

ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ විවාහයට පත්වන්නට ඇත්තේ යෞවන වියේ මුල්කාලයේදී විය යුතුය. එය එකල චාරිත්‍රයක්ව පැවතුණි. නමුත්, මෙම විවාහය හෝ බිරිඳගේ නම ත්‍රිපිටකයේ සඳහන්ව නැත. සම්ප්‍රදායට අනුව, ඇයගේ නම යසෝධරාය. නමුත්, විශේෂණයක් වශයෙන් ඇය හඳුන්වා ඇත්තේ භද්දකච්චා හෝ රාහුලමාතා වශයෙනි. එනම් රාහුලගේ මව වශයෙනි. ඇයගේ නම කුමක් වුවත්, ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේට රාහුල නමැති පුත්‍රයෙකු සිටි බව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. නමුත්, ඔහු භික්ෂුවක වනතුරු ඔහු පිළිබඳ කිසිම තොරතුරක් ඒවායේ ඇතුළත් කර නොතිබුණි. ගෞතමයන් වහන්සේට එකම දරුවෙකු පමණක් සිටීම පිළිබඳව සිත්ගන්නාසුලු ප්‍රශ්ණයක් මතු කරයි - ගෞතමයන් වහන්සේ යෞවනයේදී විවාහවී අභිනිෂ්ක්‍රමණය කළේ වයස තිහේදී නම්, දෙදෙනාට එක් දරුවෙකු පමණක් සිටියේ කෙසේද යන්නයි. මෙම ප්‍රශ්නයට බොහෝ පිළිතුරු තිබිය හැකිය. ගැබ්ගැනීමකින් තොරව යුවළක් වසර ගණනාවක් ලිංගික පැවැත්වීම ඉඳහිට සිදුවේ. අවසානයේදී ඔවුන් බලාපොරොත්තු නොවූ ලෙස එය සිදු වේ. මෙසේ සිදුවීමට සංසිද්ධීන් සඳහා විවිධ හේතු තිබිය හැකිය. නමුත්, ගෞතමයන් වහන්සේගේ සිද්ධියේදී එවැනි තත්ත්වයක් ඇති විය නොහැකිය. විවාහයෙන් වසර ගණනාවකට පසු ඇය පිළිසිඳ ගැනීමට අපොහොසත් වූවා නම්, ඇයට දික්කසාද වන්නට සිදුවනු ඇත. තවත් සිදුවීමක් නම්, තවත් දරුවන් සිටියා නම්, රාහුල පිළිබඳව පමණක් සඳහන්ව ඇත්තේ, ඔහු භික්ෂුවක් වූ නිසා වන්නට ඉඩ තිබුණි. කෙසේ නමුත්, මෙම පැහැදිලි කිරීමේදී ද ගැටලු මතු වේ. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පවුලේ සාමාජිකයන් සමග සාකච්ඡා කිරීම් පිළිබඳව ත්‍රිපිටකයේ සටහන්වී ඇත. උදාහරණ වශයෙන් උන්වහන්සේගේ පියා, මාමාවරුන්, සුළුමව් සහ ඥාතී පුත්‍රයන් යනාදී වශයෙනි. එම නිසා උන්වහන්සේට රාහුල හැර වෙනත් දරුවන් සිටියේ නම්, උන්වහන්සේ ඔවුන් හමුවීම් සහ ඔවුන්ට කථා කිරීම් යනාදී තොරතුරු සඳහන් වන්නට ඉඩ තිබුණි. තවත් සිතන්නට ඉඩ ඇති සිද්ධියක් නම්, ඔවුන්ට තවත් දරුවන් ලැබ, ඒ සියල්ල උත්පත්තියේදී මිය ගිය බව හෝ ළදරු අවස්ථාවේ හෝ පසුව මිය ගිය බවයි. කිසිම කාලයක එවැනි ළදරු මරණ සංඛ්‍යාවක් සිදු වූ බවට දහනමවන ශතවර්ෂය එළඹෙන තුරු ඉන්දියානු ඉතිහාසයේ තොරතුරක් නැත. නමුත්, එය සමහර විට ඉතා ඉහළ මට්ටමක තිබෙන්නට හැකිය. [3]

---

[2] M.I,246. Most modern accounts of this incident follow the commentary in saying that Gotama was watching his father ploughing at the time, while the text simply says he was 'working', *kammante*. In later centuries and certainly by the time of the commentary, it was believed that Suddhodana was a king and amongst the few manual tasks kings did was the annual ceremonial first ploughing. Thus working, which could have been a range of activities, became ceremonial ploughing.

[3] Dyson, pp. 16 ff.

සම්ප්‍රදායට අනුව, ගෞතමයන් වහන්සේගේ ජීවිතයේ හැරවුම් ලක්ෂ්‍යය වූයේ උන්වහන්සේට සතර පෙර නිමිති (චතුනිමිත්ත) හමුවීමයි. තරුණ ගෞතමයන් වහන්සේට ජීවිතයේ ඇති අවලස්සන යථාර්ථයන් කිසිවක් දැනගැනීම වැළැක්වීම සහ අසිත තවුසා සිදු කළ අනාවැකියට අනුව ආගම කෙරෙහි යොමු වී තවුසෙකු වීම වැළැක්වීමට, උන්වහන්සේගේ පියා ලස්සන මාළිගයක ඉඳුරන් පිනවීමේ සෑම දෙයක්ම සහිතව රැඳවීම පිළිබඳ කතාවක් ගොඩ නැගී තිබුණි. කෙසේ වෙතත් එක් දිනක, උන්වහන්සේගේ සේවක ඡන්නගේ උපකාරය සහිතව උන්වහන්සේට මාළිගයෙන් පිටතට ගොස් කපිලවත්පු වීදිවල සැරිසරන්නට හැකි විය. එහිදී උන්වහන්සේට වියපත් බව නිසා නැමුණු මිනිසෙකු, දරුණු රෝගයකින් පෙළෙන තවත් මිනිසෙකු සහ මළ සිරුරක් ආදාහනය සඳහා ගෙන යනු දුටුවහ. කිසි දිනක එවැනි දේ නොදුටු උන්වහන්සේ දැඩි කම්පනයට පත් විය. ඊටත් වඩා, ඡන්න පැවසුවේ එවැනි දේ ජීවිතයේ අනිවාර්ය අංගයක් බවයි. දෙදෙනා නැවත මාළිගාවට යද්දි කහ පැහැති වස්ත්‍රයක් ඇඳි තවුසෙකු දුටු විට, ගෞතමයන් වහන්සේ ඒ කවුරුන්ද යන්න විමසූ විට ඡන්න පැවසුවේ මහලු විය, රෝග සහ මරණ යනාදියෙන් ඔබ්බට යාම සඳහා තත්ත්වයක් සොයනා පුද්ගලයන් අතරින් එක් පුද්ගලයෙකු බවයි. පුරාවෘත්තයට අනුව, ගෞතමයන් වහන්සේ ගනු ලැබූ වැදගත් පියවරට මුල්වූ තීරණයට හේතු වූයේ මෙම සතරපෙර නිමිති වේ. ජෝසප් කැම්බෙල් මෙම සිදුවීම නිවැරදිව අවදි කළේය - ''ලෝකයේ සාහිත්‍යය තුළ වඩාත් උපහාර දක්වන ලද වික්‍රමය ලෙසට හැඳින්වූ උදාහරණයයි'' එසේම එය සැබැවින්ම රූපකයකි. නමුත්, කණගාටුවට කරුණ නම් එය ත්‍රිපිටකයේ නොමැති වීමයි.[4]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ භාවනා සහ අභිනිෂ්ක්‍රමණය කිරීමට ගත් තීරණය ඉතාමත් කෙටියෙන් සහ අඩු ප්‍රබෝධයෙන් යුතු භාෂිතයෙන් පැහැදිලි කළහ.

> ''මා බුද්ධත්වයට පැමිණීමට පෙර, මම මෙසේ සිතුවෙමි, 'මා ඉපදීමට, වියපත්වීමට, රෝගීවීමට, මරණයට, ශෝකවීමට, සහ කෙලෙසීමට යටත් වූවෙකු සහ ඒවායේ භයානකත්වය අවබෝධ කරගත්තෙකු ලෙස, වියපත් නොවන, රෝගී නොවන, මිය නොයන, ශෝක නොවන නොකෙලසන යන බන්ධනයෙන් ආරක්ෂාව හෙවත් නිර්වාණය සොයා යායුතුය.' ඉතින්, පසුව, තරුණ වියේදීම, කළු කෙස් සහිතව තරුණ වියේ ආශීර්වාදය සහ ජීවිතයේ මුල් අවදියේදී, කඳුළු තැවරුණු මුහුණු සහිතව මගේ මව සහ පියා විරුද්ධ වෙද්දී මම මගේ හිසකෙස් සහ රැවුල කපා කහ සිවුර හැඳ නිවසේ සිට නිවසින් තොර ජීවිතයකට අවතීර්ණ වුනෙමි.''[5]

[4] Joseph Campbell, *The Hero with a Thousand Faces*, 2008 p.46
[5] M.I,163, condensed.

මෙම කථාවේ සාම්ප්‍රදායික අනුවාදයේදී ගෞතමයන් වහන්සේ නිවසින් බැහැරවී ඇත්තේ රහසිනි. අනවසරයෙන් මාළිගයේ සිටි අය නිදන විට රාත්‍රියේ අනවසරයෙන් බැහැරවී ඇත. නමුත්, මේ දැන් උපුටා ගත් උද්ධෘතයට අනුව, උන්වහන්සේගේ දෙමාපියන් උන්වහන්සේගේ තීරණය දැන සිටියහ. ඔවුහු ප්‍රතිචාර දැක්වූයේ අයහපත් ලෙසය. කඳුළුවලින් ඇඟවීම්, උස් හඬ, ඇයදීම් සහ එකිනෙකාට දොස් පවරා ගැනීම් තිබෙන්නට ඉඩ ඇති බවයි.

බුදුපියාණන් වහන්සේගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳව උන්වහන්සේගේ විස්තරයට තවත් දෙයක් පුරාවෘත්තයට වඩා පටහැනි වනවාට වඩා වැඩි යමක් කරයි. එය උන්වහන්සේගේ දෙමාපියන් සම්බන්ධයෙන් ප්‍රශ්න මතු කරයි. උන්වහන්සේ තමන්වහන්සේගේ මව සහ පියා ගෘහ ජීවිතයෙන් බැහැරවීමට ගත් උන්වහන්සේගේ තීරණයට විරුද්ධ (ආකාමකානං මාතාපිතූන්නං) වූ බව පැවසූ බව සඳහන් වුනත්, පියා එසේ කරන්නට ඇති නමුත්, මව එසේ නොකළ බවට නිශ්චිතවම කිව හැකිය. ඒ ත්‍රිපිටකයට අනුව, උන්වහන්සේගේ උත්පත්තියෙන් පසු මව මිය ගිය නිසාය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සුළු මව වූ මහාප්‍රජාපතිය අද කාලයේ එවැනි තත්ත්වයක සිටින දරුවකු මෙන්ම උන්වහන්සේගේ මව මෙන් සඳහන් කළේද? මෙය එසේ විය නොහැකිය. සියලු ඉන්දියානු සාහිත්‍යය කරන්නාක් මෙන්ම, පාළි ග්‍රන්ථද ඥාති සබඳතා සඳහා කොන්දේසි ඉතා ප්‍රවේසමින් සහ හරියටම භාවිත කරයි. ඒ අනුව, කෙනෙකු උන්වහන්සේ මහාප්‍රජාපතිය උන්වහන්සේගේ මවගේ සොයුරිය හෝ නැන්දනිය (මාතුච්ඡා) වශයෙන් හැඳින්වීම බලාපොරොත්තු වේ. ඊට පසු, ගෞතමයන් වහන්සේට උත්පත්තිය ලබා දී දින හතකට පසු මහාමායා මිය යාම පිළිබඳ කථාව පුරාවෘත්තයක් ද? මෙයත් සිදුවිය නොහැක්කක් ලෙස පෙනේ. එයට හේතුව මෙය සත්‍යයක් නොවේ නම්, මෙම ප්‍රකාශය කිරීම හොඳ අරමුණක් නොවන නිසා මෙය සැක කළ නොහැක්කකි. [6]

ඊළඟට අපිට අසන්නට ලැබෙන්නේ රජගහ අද්දර පණ්ඩව කන්දට නැගෙනහිර දිසාවේ ජීවත්වන දුඹුරු කහ පැහැ සිවුරක් හැඳි තරුණ ගෝතම සාමණයන් වහන්සේ පිළිබඳවයි. එහි උන්වහන්සේ දානය සඳහා නගරය දෙසට සක්මන් කරනු පෙනේ. බිම්බිසාර රජු උන්වහන්සේ මාර්ගයේ වඩිනු දැක තරුණ භික්ෂුවගේ හැසිරීම, විශේෂයෙන්ම පහතට දෙඇස් හෙළමින් සක්මන් කරනු, උන්වහන්සේගේ බැල්ම නගුලක මිටක දුරට යොමු කරමින් සිටිනු දැක්මෙන් රජුගේ සිත් මහත් කාවැදීමට සහ ප්‍රසාදයට පත්විය. රජු දාසයෙකු කැඳවා ගෞතමයන් වහන්සේ පසුපස ගොස් උන්වහන්සේ වැඩ සිටින්නේ කොහේද කියා සොයා ඔහුට වාර්තා කරන ලෙස අණ දුන්නේය. එසේ කළ පසු රජු වාහනයක එහි ගොස් බුදුපියාණන් වහන්සේ සමග කෙටි සාකච්ඡාවක යෙදුණි. [7]

---

[6] I thank Anandajoti Bhikkhu for drawing my attention to this point.
[7] Sn.408-421.

මෙතැන් සිට එක්තරා අවස්ථාවකදී, නිවසින් බැහැරව සහ සාමණයන්ගේ ආචාර සමාචාර විධි අධ්‍යයනය තුළින් අනුගත වී ඊට පසු, ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ ගුරුවරයෙකු සෙවීම ඇරඹූහ. එවකට සිටි, සුප්‍රසිද්ධ ගුරුවරුන්ගේ ලැයිස්තුවල සඳහන් නොවූවත්, කීර්තියක් ඇති අයකු යැයි සිතමින් උන්වහන්සේ ආලාර කාලාම තවුසන් හමුවී ශිෂ්‍යයෙකු වීමට අවසර පැතූහ. තවද, ඔහු ඉගැන්වූ භාවනාවේ අරමුණෙන් නිගමනය කළ හැකි දේ හැරෙන්නට, ඔහු ඉගැන්වූයේ කුමක්ද හෝ දායකවූයේ කුමන දර්ශන විද්‍යාවද කියා අපි නොදනිමු. කාලාම දරා සිටියේ පැවිදි ජීවිතයේ අරමුණ ලෙස ඔහු හැඳින්වූ සිහි ඇති බව (විඥානය) යන තත්ත්වයට එළඹීමයි.[8] එනම් 'හිස් බව ඇති තත්ත්වයට' (ආකිඤ්චඤ්ඤායතන) යි. ඔහු එම තත්ත්වය අවබෝධ කර ඇති බවත්, තමා යටතේ අධ්‍යයනය කරන ශිෂ්‍යයන්ට ඔහුගේ මගපෙන්වීමෙන් ඔවුන්ටත් එම තත්ත්වයට පත්විය හැකි බවත් සඳහන් කෙරේ.[9] ගෞතම බෝධිසත්ත්වයන් වහන්සේ ශිෂ්‍යයෙකු වීමට අවසර ඉල්ලා සිටි අවස්ථාවේදී කාලාම මෙසේ පැවසුවේය ''මෙම ඉගැන්වීම කෙබඳුද යත්, බුද්ධිමත් මිනිසෙකුට ගුරුවරයා පත්වී සිටිනා තත්ත්වයට ඉතා ඉක්මණින් අත්විඳිය හැකිය, එය අවබෝධ කර ගත හැකිය, සහ තමන්ගේම සෘජු දැනුමෙන් එය ඉෂ්ට කර ගත හැකිය''. පළමුවෙන්ම උන්වහන්සේට පුහුණුවේ න්‍යාය, අත්තිවාරම අධ්‍යයනය කරන්නට සිදු විය.

> ''ඉතා ඉක්මණින් මා මෙම ඉගැන්වීම ප්‍රගුණ කළේ හැකි තරම් වචනයෙන් පමණක් සහාය පාමින්, නැවත නැවත මතකයෙන් කියමින් සහ වැඩිහිටියන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින්ය. විශ්වාසයෙන් සහ නිශ්චිතව මා දන්නා බව සහ දකින බව මට කියන්නට හැකි විය. ඒ මා පමණක් නොවේ.'' මෙසේ කිරීමෙන් පසු කාලාම දැන් 'කිසිවක් නැත යන තත්ත්වයට' මාර්ගය වෙත අවතීර්ණවීමට සැබෑ පුහුණුව ආරම්භ කිරීමට බුදුපියාණන් වහන්සේ යොමු කළේය. නැවතත්, කෙටි කාලයක් තුළදී ගෞතමයන් වහන්සේ මෙම තත්ත්වයට පත්වූහ. උන්වහන්සේ කාලාම වෙත ගොස් මෙය වාර්ථා කළ විට, ඔහු එය නිරීක්ෂණය කර උන්වහන්සේ සැබැවින්ම එම තත්ත්වයට පත්වී ඇති බවට සෑහීමකට පත් විය.''මා දන්නා ඉගැන්වීම ඔබ දනී, ඔබ දන්නා ඉගැන්වීම මම දනිමි. මම මෙන්ම ඔබත් සහ ඔබ මෙන්ම මමත්.''

එවැනි දක්ෂ සිසුවෙකු පිළිබඳව සතුටට පත්වූ කාලාම ගෞතමයන් වහන්සේට ඔහුගේ සම ගුරුවරයාවීමට ආරාධනය කළේය. නමුත් තරුණ භික්ෂුව එම ආරාධනාව ප්‍රතික්ෂේප කළ අතර, උන්වහන්සේට කිසිවක් නැත යන තත්ත්වය ඉහළම තත්ත්වය යන්න බවට ඒත්තු ගියේ නැත. උන්වහන්සේ සම්පූර්ණ අවබෝධයෙන් අඩු කිසිවකින් සෑහීමට පත් නොවූහ. එම නිසා උන්වහන්සේ තවත් ගුරුවරයෙකු සොයා පිටත් වූහ.[10]

[9] Wynne 2007 pp.108 ff, has attempted to reconstruct Kālāma's philosophy.
[10] M.I,163-66.

මෙවර හමුවූයේ උදක රාමපුත්‍රයි. උදක යනු රාම නමැති සාමණ ගුරුවරයාය. පෙනෙන ආකාරයට ඔහුගේ පියාගේ ප්‍රජාව ඔහුගේ පියාගේ මරණයෙන් පසු පවරාගෙන ඇත. රාම භාවනා පුහුණුවීම් උගන්වා ඇති අතර, එමගින් ඔහු සංජානනය හෝ සංජානනය නොවන ලෙසින් හැඳින්වූ තත්ත්වයට (නෙවසඤ්ඤානාසඤ්ඤා) යොමු කරන ලදී. තමන්ගේ පියා විසින් තමාට දායාද කළ දේ උදක ඉගැන්වූවත්, පුහුණු කළත්, ඔහු සැබැවින්ම එම තත්ත්වයට පත්වී තිබුණේ නැත. පෙරදී මෙන්ම, ගෞතමයන් වහන්සේ න්‍යාය සහ පුහුණුව කෙටි කාලයක් තුළ ප්‍රගුණ කළහ. එහි සැබෑ අරමුණටද පත්වූහ. මෙයින් උදක විමතියට පත්වන්නට ඇත, එසේම එයින් ඔහු අපහසුවට ද පත්වන්නට ඇත. ඇත්ත වශයෙන්ම උදක පසෙකට වී ගෞතමයන් වහන්සේට ඔහුගේ සහ අනෙක් ශ්‍රාවකයන්ගේ ගුරුවරයා වන්නට ආරාධනය කළ නමුත්, උන්වහන්සේ පෙරදී මෙන්ම එම හේතුවටම, ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ.

ත්‍රිපිටකයේ බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ ගුරුවරුන් දෙදෙනාගේ ශ්‍රාවකයන් පිළිබඳ කුතුහලය ඇති කරන තොරතුරු ආරංචි මාත්‍ර දෙකක් ඇතුළත්ව ඇත. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ පසුකාලයේ නිශ්චිතවම, කාලය තීරණය කළ නොහැකි එක් අවස්ථාවක, කපිලවත්ථුවේ වැඩ සිට ඇත. එහිදී වෙනත් සුදුසු ස්ථානයක් සොයා ගැනීමට නොහැකිව, උන්වහන්සේ භාරණ්ඩු කාලාම භික්ෂුවගේ අසපුවේ වැඩ සිට ඇත. මෙම භික්ෂුව බුදුපියාණන් වහන්සේ ආළාර කාලාම තවුසන්ගෙන් ඉගෙන ගන්නා කාලයේ සම ශිෂ්‍යයෙකුව සිට ඇත.[11] පිරිණිවන් පෑමට දින කිහිපයකට පෙර කුසිනාරාවට වඩින විට උන්වහන්සේට මල්ලන් පුක්කුස නමැති ආළාර කාලාමගේ තවත් ශ්‍රාවකයෙකු හමුවී ඇත. නමුත්, ඔහු භික්ෂුවක්ද නැතහොත් උපාසකයෙකුද යන්න පැහැදිලි නැත.[12] මෙම පුද්ගලයන් දෙදෙනා පිළිබඳව සඳහන් කිරීමෙන් ඔවුන් පෙනී සිටින සන්දර්භයට කිසිවක් එකතු නොවේ. බුදුපියාණන් වහන්සේ ඔවුන් සමග කෙටියෙන් සම්බන්ධවීම සටහන් කර ඇත්තේ හුදෙක් ඔවුන් උන්වහන්සේගේ ජීවිතයේ සුළු සිදුවීමක් වුවද, ඒවා සිත්ගන්නාසුළු යැයි සැලකූ බැවිනි.

දැන් සම්පූර්ණයෙන්ම සාමණ සම්ප්‍රදායන්ට ඒකාබද්ධවී භාවනා විෂයයන් පිළිබඳව මනා පදනමින් යුක්තව, ගෞතමයන් වහන්සේ ඔබමොබ යෑම ඇරඹූහ. සමහර විට ඊළඟට කළ යුත්තේ කුමක්ද යන්න පිළිබඳව ඉච්ඡා භංගයක් හෝ අවිනිශ්චිත බවක් නොමැතිව, එකළ ජනප්‍රියව තිබූ - ස්වයං-අත්තකිලමථය (අත්තකිලමත) වෙත. සමීපව එය අත්හදා බලන්නට තීරණය කළහ. එවැනි විෂයයන් පිටුපස බොහෝ න්‍යායයන් ඇත. බ්‍රාහ්මණ පූජකයන් අතර, විශ්වාසය වූයේ, ස්වයං-අත්තකිලමථය, ස්වයං වන්දියක් බවයි. එය පුද්ගලයෙකු පිරිසිදු කිරීමක් හෝ යම් තහංචි හෝ පිළිවෙත් ක්‍රම

[11] A.I,276; D.II,130.
[12] A. I,276; D.II,130. The texts say Bharaṇḍu had been a *brahmacāriya* and Pukkusa had been a *sāvaka*.

සඳහාවූ උපදෙස් නොසලකා හැරීම් නිවැරදි කිරීමට මාර්ගයක් ලෙසිනි.[13] වෛදික නොවන සාමණ නිකායන් අතර පුළුල් ලෙස පිළිගත් විශ්වාසයක් වූයේ, ශරීරය තදබල මානසික ආතතියකට සහ වේදනාවකට පත් කිරීමෙන් යම් ආකාරයක ආධ්‍යාත්මික තාපයක් (තාප) ඇති කළ හැකි බවයි. ඒ අනුව ඔවුන් විශ්වාස කළේ එයින් ශක්තියේ බැමි කඩාබිමදමා පුද්ගලයෙකුට තමන්ට සහ සමහර විට බාහිර ලෝකය කෙරෙහිද බලයක් ඇති කරන බවයි. ජෛන ආගමේ ස්වයං-අත්තකිලමථය පිළිබඳව සාධාරණීකරණය සම්බන්ධ වූයේ කර්මය පිළිබඳ අවබෝධය පිළිබඳ විශේෂවූ අවබෝධයයි. ඔවුන් විශ්වාස කළේ කෙනෙකු අත්විඳින සෑම දෙයක්ම අතීතයේ කරන ලද කර්මවල විපාක ලෙසයි. ඒ අනුව, කෙනෙකු දැන් විඳින ඕනෑම වේදනාවක් ස්වයං ලෙස පමුණුවන ඒවා පවා, පෙර ජීවිතයේ කරන ලද අයහපත් කර්මවල විපාක බවයි. ඒ අනුව, කෙනෙකු තමන්ට වධ හිංසා පමුණුවා ගන්නේ නම්, වඩාත් ඍණාත්මක කර්ම ඉවත් කෙරේ.[14] බුදුපියාණන් වහන්සේ ස්වයං අත්තකිලමථයට උන්වහන්සේ බඳුන් කිරීමට තීරණය කිරීමේ හේතු කිසි විටක නොදැක්වීය. නමුත්, සමහර විට උන්වහන්සේ මෙම න්‍යායන්ගෙන් එකක් පිළිගත් නිසා, හෝ අවම වශයෙන් ඒවායින් සමහරක් උත්සාහ කර බැලීමට කැමති වූ නිසා විය හැකිය. හේතුව කුමක් වුවත්, ඊළඟ වසර කිහිපය තුළ උන්වහන්සේ දරුණු වධහිංසා පැමිණවීමේ වැඩපිළිවෙළක් දියත් කළහ. එය ඊටත් වඩා දරුණු විය.

පසුකාලයේදී බුදුපියාණන් වහන්සේ සිදු කළ බොහෝ සාකච්ඡාවලින් උන්වහන්සේ මේ කාලය තුළදී සිදු කරන ලද වේදනාකාරී අත්තකිලමථයන් පිළිබඳව විස්තර කළහ.

> ''මගේ තපස කෙසේද යත්, මම නිර්වස්ත්‍රව, චාරිත්‍ර ප්‍රතික්ෂේප කරමින්, මගේ දෑත් ලෙවකමින් ගත කළෙමි.''[15] දානය සඳහා ආරාධනා මගහැරීම, මා වෙත විශේෂයෙන් සකස් කළ හෝ ආහාරයකට ආරාධනා කිරීමක් ප්‍රතික්ෂේප කිරීම ... මා ආහාර ගත්තේ දිනකට එක් වරකි, හෝ දින දෙකකට වරකි, හෝ දින තුනකට, පහකට, හයකට හෝ හතකට වරකි. මම තේක්ක කොළ, විවිධ ධාන්‍ය වර්ග, ඉබේ වැවෙන සහල් විශේෂයක්, සපත්තු සෑදීමෙන් ඉවත විසි කරන සම් කැබලි, සහල් නිවුඩ්ඩ සහ සහල් තම්බා ලැබෙන පෙණ, තල රොඩු, තණකොළ සහ ගොම පවා ආහාරයට ගතිමි...මම වනාන්තරයේ මුල්, පලතුරු හෝ ගසෙන් වැටී ඇති පළතුරු ආදී ආහාර සොයා බැලුවෙමි... මම (මුඩු කිරීම වෙනුවට) මගේ හිසකෙස් සහ රැවුළ ඇද ඉවත් කළෙමි. මම දීර්ඝ කාලවේලාවක් සිටගෙන හෝ ඇණතියාගෙන සිටියෙමි. මම කටුසහිත ඇඳක සැතපුනෙමි. මම දිනකට තුන්වරක්, සමහර විට රාත්‍රියටත් ගඟේ ගිල්වුනෙමි. ගසක කඳක් මත ඇති දැලි කුණු සහ දූවිලි වෙන්ව යනවා සහ ඉවත් වෙනවා සේම, වසර

---

[13] See e.g. *Gautama Dharmasūtra* XXIV, 1-11; *VāsiṣṭhaDharmasūtra* XXII, 1-16, etc.

[14] M.I,92-93.

[15] This refers to the practice of refusing to use a bowl to receive alms food, requiring it to be put in one's cupped hands from which it would be licked up.

> ගණනාවක් මගේ ශරීරයේ ඇලී තිබූ දැලි කුණු වෙන්ව සහ ඉවත්ව ගියේය. එහෙත්, ඒවා කිසිවිටක මා විසින් පිසදමන්නට අවශ්‍ය නොවීය...මම හතර දිසාවේම ගව ගාල්වලට එළදෙනුන් සහ එළදෙනුන්ගේ රංචු පිටවූ පසු ගොස් කිරි බොන පැටවුන්ගේ ගොම අනුභව කළෙමි. මගේම අසූචි සහ මූත්‍ර තිබෙන තාක් කල් මම මගේම අසූචි සහ මූත්‍ර අනුභව කළෙමි. පුද්ගලයෙකු රාගයෙන් නිදහස් නොවන්නේ නම්, ඔහුගේ කෙස් කෙළවරට ගෙන ඒමට තරම් භයංකාර වූ වනාන්තරයට මම කඩා වදිමි. ශීත ඍතුවේදී මම රාත්‍රිය එළිමහනේ ගත කරන අතරතුර, ගිම්හානයේදී ඒ ආකාරයෙන්ම දවස ගත කරමි...'[16]

මාස ගණනාවක් පුරා අත්තකිලමථය සහ ස්වයං ප්‍රතික්ෂේපණය සිදු කිරීමෙන් උන්වහන්සේගේ කායික තත්ත්වය දරුණු ලෙස පිරිහී ගියේය.

> ''එයට හේතුව මා ආහාරයට ගත්තේ ඉතා ස්වල්පයක් වන අතර, මගේ කොඳු නාරටිය පෙනුණේ පබළු වැලක් ලෙසය. මගේ ඉළ ඇට පැරණි මඩුවක පරාල මෙන් විය. මගේ ඇස් කෙවෙනි තෙක් ගිලී ගියේය. මගේ ඇස්වල කාන්තිය ගැඹුරු ළිඳක පතුලේ ඇති ජලයේ කාන්තිය මෙන් පෙනුණි. මා ආහාරයට ගත්තේ ඉතා ස්වල්පයක් නිසා, මගේ හිස් කබල වෙලී ඇකිළී ගියේය. වියළී ගියේ හිරු රශ්මියෙන් වියළී ගිය ලබු කැටයක් මෙන්ය. මම මගේ උදරයේ සම ස්පර්ශ කරන්නට උත්සාහ කළෙමි, මා ස්පර්ශ කළේ මගේ කොඳු නාරටියයි. මා මගේ කොඳු නාරටිය ස්පර්ශ කරන්නට උත්සාහ කළා නම්, ස්පර්ශ කරන්නේ මගේ උදරයේ සමයි. මා මූත්‍ර හෝ මලපහ කිරීමට නැගිට සිටි විට ඇද වැටුනේ මගේ මුහුණ මතයි. මා මගේ ගාත්‍ර පිරිමැද්දොත්, කෙස් ඒවායේ මුල්වලින්ම දිරා වැටුණි.''

මේ සියලු කාලය තුළදී එක් අවස්ථාවක දෙවිවරු පවා උන්වහන්සේ මිය යනු ඇතැයි සිතූ බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. දෙවිවරු උන්වහන්සේට පෝෂණය උන්වහන්සේගේ කූපයන් තුළින් ලබා දෙන්නට උත්සාහ කළහ. එවිට ප්‍රායෝගිකව උන්වහන්සේගේ නිරාහාරව සිටීමට බාධාවක් නොවීමටයි. නමුත් බුදුපියාණන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ.

එවැනි දඬුවම් නියමයකට තමන්වහන්සේ යටත් කරමින් ගෞතමයන් වහන්සේ සිතීමේ ක්‍රියාවලියන් පාලනය කිරීමට උත්සාහ කළහ.

> ''මගේ දත් දැඩි සේ ග්‍රහණය කරමින්, මගේ දිව තල්ලට තද කරමින්, මම මගේ මනස භාවිත කරමින් මනස මැඩ පැවත් වූයෙමි, මෙල්ල කළෙමි, යටපත් කළෙමි.'' උන්වහන්සේගේ ඩහදිය කිහිල්ලෙන් ගලා ගියේය. උන්වහන්සේ වෙහෙසීමට පත්විය, සහ වියැකී ගියේය.

[16] M.I,77 ff, condensed. On these and other extreme ascetic practices see Olivelle, 1992

උන්වහන්සේ උත්සාහ කළ තවත් ක්‍රමයක් වූයේ, හුස්ම රඳවා ගැනීමේ භාවනාවයි. (අප්පාණකං ඣානං), එනම් හැකි තරම් කාලයක් හුස්ම රඳවා ගනිමින්, පැය ගණනක් දිගටම එසේ කරමින් සිටීමයි. මෙසේ කරන විට කන්වලට වේගවත් ලෙස වාතයේ හඬ ඇසුණු බව සහ මහත් වේදනාකාරී හිසරදයකින් පෙළුණු බවත් උන්වහන්සේ පැවසූහ. [17]

සෑම මිනිස් සබඳතාවක්ම වැළකීමට උන්වහන්සේ හැකිතාක් දුරට උත්සාහ කර ඇත. ඒ ආහාර ලැබීම සඳහා ගමකට වැඩම කිරීම වෙනුවට වනාන්තරයේ ඇති මුල්, පලතුරු සහ කොළ ලබා ගැනීමෙනි.

''මම වනාන්තරයකට පිවිස එහි රැඳීමෙන් මගේ හුදෙකලාව ලබා ගත්තෙමි. මා ගවරැළක් හෝ එඬේරෙකු, තණකොළ කපන්නෙකු, අතු එකතු කරන්නෙකු හෝ වනලන්දේ වාසය කරන්නෙකු දුටුවහොත්, ඔවුන් හෝ මා නොදකින ලෙස එක් උයන් වත්තකින් හෝ සන ලැහැබකින් තවත් එකකට, එක් ගලියකින් හෝ කඳුකරයකින් තවත් එකකට පළා යන්නෙමි.''[18]

මාස ගණනක් තිස්සේ කිසිදු මිනිස් ආශ්‍රයක් නොමැතිව සිටීමේ පීඩනයේ අවසානය සැලකිය යුතු මට්ටමක තිබෙන්නට ඇත. නමුත්, උන්වහන්සේට මුහුණ පෑමට සහ ජය ගැනීමට තිබූයේ එය පමණක් නොවේ. උන්වහන්සේට වන සතෙකුගෙන් සැබැවින්ම පහර කෑමට තිබූ සම්භාව්‍යතාව වැඩිය.

''මම වනයේ ජීවත්වන විට වන සතෙකු කොහේ හෝ සිට මා සමීපයට එන්නට හැකිය, මොනරෙකු කුඩා රිකිල්ලක් හඬ නගනු ඇත. නැතහොත්, සුළඟින් කොළ අතු සෙලවෙනු ඇත. මම මෙසේ සිතමි, ''මෙන්න බිය සහ බියජනක බව එයි. මා කිසිවක් නොලැබ, බිය සහ බියජනක බව සමගින් මෙහි රැඳී සිටින්නේ ඇයි? මම එය ප්‍රගුණ කර එම තත්ත්වයේම සිටිමි.''[19]

උතුරු ඉන්දියාවේ වනාන්තරවල රැකවරණ ලැබූ සිංහයන්, ව්‍යාඝ්‍රයන් සහ දිවියන්, වෘකයන්, හයනාස් සහ අලස වලසුන් වැනි සතුන් ගෞතමයන් වහන්සේට මහත්වූ හානි සිදු කරන්නට ඉඩ තිබූ බැවින්, උන්වහන්සේගේ බිය බොහෝදුරට යුක්ති සහගත විය.[20] වෙනත් අවස්ථාවලදී, ගවරැළ් බලාගන්නා එඬේරන් උන්වහන්සේ දැක උන්වහන්සේ පළි නොගන්නා බව දැන, උන්වහන්සේ මත මූත්‍ර කරමින්, දේවල් විසි කරමින් හෝ කොළ අතු

[17] M.I,242-247, condensed.
[18] M.I,79.

[19] M.I,20.
[20] Vin.I,220 mentions monks sometimes being attacked by such animals.

කණට දමමින් කුපිත කිරීමට උත්සාහ දරනු ඇත. [21]

බුදුපියාණන් වහන්සේ පුරා වසර හයක් මෙවැනි දැඩි හික්මීමකට ලක් වූ බව සාමාන්‍යයෙන් කියැවේ. නමුත් මෙයින් අදහස් වන්නේ උන්වහන්සේ ආළාර කාලාම සහ උද්දක රාමපුත්ත සමග සිටියේ උපරිමව මාස කිහිපයක් පමණක් බවයි. ඔවුන්ගේ මගපෙන්වීම යටතේ උන්වහන්සේ සිදු කළ පුහුණුවෙන් උන්වහන්සේට ශ්‍රේෂ්ඨතම තත්ත්වයන්ට ඉතා ඉක්මනින් පත්වන්නට ඉඩ තිබෙන්නට ඇතැයි සිතිය නොහැකිය. උන්වහන්සේ මෙම ගුරුවරුන් දෙදෙනා සමග අවම වශයෙන් වසරක් හෝ දෙකක්වත් සිටින්නට ඇත. එයින් අදහස් වන්නේ උන්වහන්සේ දැඩි සේ හික්මීම වසර හයකට අඩු කාලයක් පුහුණු වන්නට ඉඩ ඇති බවයි. නමුත්, කොපමණ කාලයක් ද යන්න නිශ්චිතව තීරණය කළ නොහැකිය. මේ කාරණය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ පැවසූ එකම දෙය නම්, උන්වහන්සේ අත්තකිලමථය වසර ගණනාවක් (නේකවස්සගණික) පුහුණු කළ බවයි. කොපමණ සංඛ්‍යාවක්ද යන්න සඳහන් නොකළහ.[22] ධර්ම ග්‍රන්ථවලින් නිගමනය කළ හැකි උපරිමය නම්, ගෞතමයන් වහන්සේ නිවස අතහැර දමන ලද කාලයේ සිට බුද්ධත්වය අවබෝධවන තුරු වසර හයක් ගතවීමයි.

මෙම ඉතා නරක කාලයේ ගෞතමයන් වහන්සේට අස්සජි, භද්දිය, කොණ්ඩඤ්ඤ, මහානාම සහ වප්ප නමැති සාමණේරවරු පස්දෙනෙකු, එක් වූහ. උන්වහන්සේගේ දැඩි හික්මීම අත්හිටුනොවන උග්‍රභාවය දැකීමෙන් මහත්වූ හැඟීමක් ඇති වූ ඔවුහු, උන්වහන්සේ ඉක්මනින් හෝ පසුවී යම් ශ්‍රේෂ්ඨ තත්ත්වයකට පත්වනු ඇති බව අවබෝධ කර ගත්හ. එසේ වූ විට උන්වහන්සේ පිළිගන්නා පළමු පුද්ගලයන් තමන් බවද ඔවුන්ට විශ්වාසයක් ඇති විය. නැවතත්, සාමාන්‍යයෙන් දෙන හැඟීම නම්, මෙම කාලය තුළ උන්වහන්සේගේ සහකාරයන් පස්දෙනා උන්වහන්සේ නැවත එනතුරු බලා සිටියද, එය ද නිවැරදි නොවිය හැකි දෙයක් බවයි. උන්වහන්සේගේම වචනවලට අනුව, ගෞතමයන් වහන්සේ වනාන්තරයේ හුදෙකලාව දීර්ඝ කාලයක් ගත කර ඇත. සිදුවෙතැයි හැඟෙන සිදුවීම් පෙළ නම්, උන්වහන්සේගේ සහායකයන් දින කිහිපයකට වරක් උන්වහන්සේ සොයා යන අතර, ඒ උන්වහන්සේට ආහාර සහ ජලය ලබා දීමටයි. ඊට පසු නැවත වනාන්තර අද්දර ඔවුන් ජීවත් වූ ස්ථානයට උන්වහන්සේ ඒ අඳුරු හුදෙකලාවේ ඉන්නට ඉඩ හරිමින් නැවත පැමිණීමයි.

වසර ගණනාවකට පසු ගෞතමයන් වහන්සේ වඩාත් දරුණු අතිශය වෙහෙසකර ස්වයං-දඬුවමක් වෙත උන්වහන්සේගේ විඳ දරාගැනීමේ සීමාවට ළඟා වූහ. එක් දිනක උන්වහන්සේ ඇද වැටුණි. ඒ වනවිට උන්වහන්සේ එකල තිබූ සියලු පිළිගත් විඳදරා ගැනීම් සහ මනස පාලනය කිරීමේ බොහෝ ක්‍රමවේදයන් සිදුකර තිබුණි. නමුත්, උන්වහන්සේට ඉතා

[21] M.I,79.
[22] M.I,78.

තියුණු අධිෂ්ඨානයක් තිබියදීත්, ඒ කිසිවක් ක්‍රියාත්මක වී නොතිබුණි. වේදනාව, විමුක්තිය ලැබීම සඳහා මාර්ගය යැයි යන මතය නැවත තක්සේරු කිරීමට, නැවත සලකා බැලීමට, කාලය එළඹ තිබේ.

> ''මම සිතුවෙමි. 'ඉඳුරන් පිනවීමේ සැප සහ මෝහයෙන් පිරුණු මනස සමග කිසිදු සම්බන්ධයක් නැති එම සතුටට මා බිය ඇයි ?' මම සිතුවෙමි. 'මම ඒ සතුටට බිය නොවෙමි.' ඊට පසු මම තවදුරටත් සලකා බැලුවෙමි. 'එම සතුටට පත්වීම එවැනි දැඩි ලෙස ජරාවට පත් වූ ශරීරයකින් යුක්තව ලබා ගැනීම පහසු නොවේ. මා යම් ඝන ආහාර ගත යුතුයි, තම්බාගත් බත් සහ බාර්ලි කැඳ ටිකක් අනුභව කළ යුතුයි.' මම එසේ කළෙමි...''

උන්වහන්සේගේ සහායකයන් පස්දෙනා උන්වහන්සේගේ මාර්ගය වෙනස් කිරීම පිළිබඳව කම්පනයට පත් වූහ. එය පාවාදීමක් ලෙස ඔවුහු දුටුවහ. උන්වහන්සේ කෙරෙහි තිබූ විශ්වාසය නැති විය. ''මා ඝන ආහාර ගත් විට එම භික්ෂූන් පස්දෙනා පිළිකුලට පත්ව 'සාමණ ගෞතමයන් වහන්සේ සමෘද්ධව සිටිති. උන්වහන්සේ උත්සාහය අත හැර සමෘද්ධිමත් ජීවිතයකට නැවත පැමිණ ඇත' යනුවෙන් පවසමින් මා හැර ගියහ.''[23]

පෙනෙන ආකාරයට උන්වහන්සේ නිවස අතහැර ගිය කාලයේ සිට අරමුණ ඉෂ්ට කර ගැනීමට වඩා සමීපවූ කාලයක් නොතිබිය හැකිවන අතර, මේ කාලය බලාපොරොත්තු සුන්වන සහ උන්වහන්සේට කනස්සල්ල ඇති කරවන කාලයක්ද වන්නට ඇත. උන්වහන්සේ සුවය ලබමින්, නිසියාකාරව ආහාර ගනිමින්, විවේක ගනිමින් සහ උන්වහන්සේගේ ශක්තිය නැවත ලබා ගනිමින් කාලය ගත කර, ඊට පසු උරුවෙලා ගම්මානයේ කුඩා ගංගාවේ අද්දරට පැමිණෙන තෙක් මගධයේ ගම්බද ප්‍රදේශය හරහා ගමන් කළහ. ප්‍රබෝධයට පත් උන්වහන්සේගේ මනසින් උන්වහන්සේට දකින්නට ලැබුණු සුන්දර ග්‍රාමීය දර්ශනය අගය කිරීමට හැකිවිය. මෙය මෑතක් වනතුරු උන්වහන්සේගේ නිවහන වූ අඳුරු සහ බියකරු වනාන්තර නොව, ගව හඬ නගන සහ මනුෂ්‍ය කටහඬවලින් යුක්ත හුරුපුරුදු ගෘහස්ථ ශබ්ද ඇති වගා කරන ලද ගම්බද ප්‍රදේශයකි. එයින් උන්වහන්සේගේ ආත්මය ඔසවා තැබුණි.

> ''ඊට පසු යහපත සොයන්නෙකු, සැසඳිය නොහැකි අසමසම මාවත සොයමින්, මගධය හරහා සංචාරය කරමින්, මම උරුවෙලා හමුදා ගම්මානයට පැමිණියෙමි. එහිදී මම සුන්දර බිම් කැබැල්ලක්, ශෝභන වන ලන්දක පිහිටි උයන්වත්තක්, අතිශය ප්‍රසන්න තොටක් සහිත පැහැදිලි ජලය ගලා බසින ගඟක් සහ උපකාර සඳහා අසල පිහිටි ගම්මානයක් නිරීක්ෂණය කළෙමි. මම මෙසේ සිතුවෙමි, 'මෙතැන

[23] M.I,247.

> තරුණයෙකුට උත්සාහයක් දැරීමට හොඳ තැනක්.' එම නිසා මම එතැන ඉඳ ගත්තෙමි.''[24]

ගෞතමයන් වහන්සේ භාවනාව සිදු කළේ පිප්පිල් ගසකින් පැතිරෙන දුනු යට බව සඳහන් කිරීමට පැරණි සම්ප්‍රදායන් සහ නූතන චරිතාපදානයන් යන දෙකම කිසි විටක පැකිළී නැති වීම දැනගැනීම වටී. වර්තමානයේ එය හැඳින්වෙන්නේ බෝධි වෘක්ෂය යනුවෙනි. මෙම විස්තරයට කිසිම අවධානයක් ත්‍රිපිටකයේ ලබා දී නැත. බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයට පත්වීම පිළිබඳ තොරතුරු පහෙන් මෙම වෘක්ෂය පිළිබඳව සඳහන් වන්නේ එක් වරක් පමණි.[25] මෙම තනි සඳහන පසුකාලීනව එකතු කිරීමක් යැයි විශ්වාස කිරීමට හේතු තිබුණ ද, ගෞතමයන් වහන්සේ එවැනි වෘක්ෂයක් යට හෝ ඒ අසල වාඩි වී සිටින්නට ඇත. අද දක්වාම සෑම ඉන්දියානු ගම්මානයකම වෘක්ෂ සිද්ධස්ථාන ඇත. ආදර්ශයක් සේ, පිප්පිල් වෘක්ෂයක්, ෆිකස් රෙලිජියෝසා, හෝ නුග ගසක්, ෆිකස් බෙන්ඝලෙනසිස්, අසල පිහිටා තිබේ. එවැනි ගසක පාමුල හෝ ඒ අසලම ස්ථානගත වීම බොහෝදුරටම සිදු කරන්නට ඇත්තේ ගෞතමයන් වහන්සේ වැනි තවුසෙකු විසින්ම විය යුතුයි. ඉක්මනින් හෝ පසුව යම් කෙනෙකු වෘක්ෂ දේවතාවට යාච්ඤා කිරීම සඳහා පැමිණෙනු ඇති බවත්, උන්වහන්සේ දකිනු ඇති බවත්, ඔවුන්ගේ පූජාව උන්වහන්සේට පූජා කරනු ඇති බවත් දැන සිටින්නට ඇත. එය ආහාරයක් වූයේ නම් හෝ වෙනත් දෙයක් නම්, ආහාර රැගෙන නැවත පැමිණෙන බවත් උන්වහන්සේ දැන සිටින්නට ඇත. එවැනි තවුසෙකු සැබැවින්ම ආත්මයක් හෝ වෘක්ෂ දේවතාවෙකු යැයි, නිවට, ඉක්මනින් පැහැදෙන ගම්වැසියෙකු සිතන්නට ඉඩ ඇත. සැබැවින්ම මෙවැනි සිදුවීමක් බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනය තුළදී සිදු විය. බුදුපියාණන් වහන්සේ උක්කත්ථ සහ සෙතව්‍ය අතර ප්‍රධාන මාර්ගයෙන් මදක් ඔබ්බෙන් වූ වෘක්ෂයක් පාමුල ඉඳගෙන සිටින විට එක් බ්‍රාහ්මණයෙකු උන්වහන්සේ දැක ඒ යම් දිව්‍යමය ජීවියෙකු යැයි සිතුවේය. එක් මුල්කාලීන ධර්මසංග්‍රයකට අයත් නොවන පුරාවෘත්තයක සඳහන් වන්නේ එක් සේවිකාවක් සුජාතා නමැති ස්වාමිදුවගේ ඉල්ලීම මත උරුවෙලාවේ දේශීය පූජනීය වෘක්ෂයක් වෙත පූජාවන් සූදානම් කිරීම සඳහා ගිය විට, ඇය ගෞතමයන් වහන්සේ දුටු බවත්, උන්වහන්සේ එම වෘක්ෂයේ දෙවියන් යැයි සිතූ බවත්ය.[26]

පසුගිය හය වසර තුළදී වර්ධනය කර ගත් සියලු ඉවසීම් සහ විඳදරා ගැනීම්, ශක්තිය සහ ස්වයං විනය යන කරුණු පාලනය කරමින් අවසන් සොයා ගැනීම අත්පත් කර ගැනීමට උත්සාහ කිරීම සඳහා අදිටන් කර ගනිමින් ගෞතමයන් වහන්සේ අසුන් ගත්හ. උන්වහන්සේ මෙම අධිෂ්ඨානය කළහ :

---

[24] M.I,166–67. *Senānagāma* probably means that this was one of the villages whose revenue was used by the state to finance the army. See *Arthaśāstra* II,35,1.

[25] Sn.425-449; M. I,17-22; 166-167; 246-249; Ud.1-2 repeated at Vin.I,1. It is also mentioned in the Mahāsudassana Sutta, a late addition to the Tipitaka, where it is simply called *assattha*, the then common name for this species of tree, D.II,52.

[26] Ja. I, 69.

''මිනිස් ශක්තිය, මිනිස් වෙහෙස, මිනිස් උත්සාහයෙන් ලබා ගත හැකි එය ලැබෙන තෙක් මට නොපසුබටව එසේ කරගෙන යා හැකි නම්, මගේ සම, පටක සහ අස්ථි වියළී යාම සහ මගේ ශරීරයේ මාංස සහ රුධිරය වියළී යාම මම සතුටින් පිළිගනිමි.''[27]

උන්වහන්සේගේ ජීවිතය සමාලෝචනය කරමින්, යෞවනයෙකු ලෙස ලද අත්දැකීමක් වන ස්වයංසිද්ධිව ගැඹුරු නිසල මානසික තත්ත්වයකට නොදැනුවත්ව පිවිසීම සිහිපත් කළහ. උන්වහන්සේ එය මෙසේ පැහැදිලි කළහ.

''මගේ ශාක්‍ය පියා වැඩ කරමින් සිටියදී මම ජම්බු ගසක සෙවණෙහි වාඩිවී සිටියදී මගේ මනස සම්පූර්ණයෙන්ම ඉඳුරන් සම්බන්ධ තෘප්තියෙන් සහ අකුසල් ස්වභාවයේ මනසකින් තොරවූ බව මට සිහිපත් වේ. මම පළමුවෙනි ධ්‍යානයට පිවිස එහි රැඳී සිටියෙමි. එහිදී තර්කානුකූල සහ ඔබ මොබ යන සිතුවිලි සහ ප්‍රීතිප්‍රමෝදය සහ ඒවායෙන් වෙන්වීමෙන් සතුට ද අත්වින්දෙමි. මම මෙසේ සිතුවෙමි, 'මෙය නිර්වාණයට මාර්ගය වන්නේ ද ?'... ඊට පසු ඔව්, මාර්ගය මෙයයි යනුවෙන් මම තීරණය කළෙමි.''

උන්වහන්සේ මේ පිළිබඳව තොරතුරු පැවසුවේ ආපසු හැරී බැලීමෙන් පසුවය. පසුව උන්වහන්සේ සඳහන් කළේ ධ්‍යාන අත්වින්ද බවත් ඒවා වෙනස්වූ හා වෙනම තත්ත්වයන් හතරකට බෙදා වෙන් කළ බවත්ය. එක් තත්ත්වයක් ගමන් කර ඊළඟ තත්ත්වයට පරිවර්තනය වේ. එයට හේතුව, විවිධ මානසික සංඝටක දියුණු වීම සහ මැකී යාමයි. සෑම එකක්ම පෙර තත්ත්වයට වඩා සියුම් සහ පිරිසිදු වේ.

උන්වහන්සේ මෙම තත්ත්වය උන්වහන්සේ තුළ නැවත ප්‍රතිනිර්මාණය කිරීමට උත්සාහ කළහ. එසේ කිරීමට සමත් වූහ.

''විඩාවෙන් තොර ශක්තියක් සහ අඛණ්ඩ සිහි කල්පනාව මා තුළ අවදි විය. මගේ ශරීරය නිසල සහ ශාන්ත විය. මගේ මනස එකඟ විය, සහ එක්සත් විය... ඊට පසු ඉඳුරන් පිනවීමේ කැමැත්ත සහ මනසේ කෙලෙස් ඇති ස්වභාවයෙන් සම්පූර්ණයෙන්ම වෙන් විය. මම පළමු ධ්‍යානයට ඇතුළු වී එහි රැඳී සිටියෙමි. එහි තර්කානුකූල සහ ඔබ මොබ යන සිතුවිලි සහ ප්‍රීතිප්‍රමෝදය සහ සතුට ඉපදීමෙන් වෙන් කෙරේ. එවිට තර්කානුකූල සහ ඔබ මොබ යන සිතුවිලි නැවතීමෙන්, මම දෙවන ධ්‍යානයට ඇතුළු වී එහි ඉපදුනු ඒකාග්‍රතාව තුළින් ගැඹුරු සන්සුන් බව, මනසේ එකඟත්වය සහ ප්‍රීතිප්‍රමෝදය සහ සතුට සමග එහි රැඳී සිටියෙමි. එම ප්‍රීතිප්‍රමෝදය, උපේක්ෂාව, සිහිකල්පනාව සහ කයේ සතුට අඩු වී යන විට, මම තුන්වන ධ්‍යානයට ඇතුළු වී

[27] M.I,50.

> දෙව්වරුන් පවසන 'උපේක්ෂාව සහ සිහිකල්පනාව ඇති පුද්ගලයා සතුටින් ජීවත් වෙයි' යන සතුට අත්වින්දෙමි. ඊළඟට, සතුට සහ දුක, ප්‍රීතිය සහ වේදනාව අත්හැරීමෙන්, මම හතරවන ධ්‍යානයට ඇතුළු වී ප්‍රීතිය සහ වේදනාවෙන් ඔබ්බට ගොස් උපේක්ෂාවෙන් පිරිසිදු කළ සිහිකල්පනාවෙන් රැඳී සිටියෙමි.''[28]

එය අත්විඳ නැති කෙනෙකුට මෙම තත්ත්වයන් කෙබඳු දැයි සිතා ගැනීම දුෂ්කර නමුත්, ඒවායේ කූටප්‍රාප්තියේ ගුණාංග විනිවිදයනසුළු විය. අවලෝකනය විය. නමුත් එය සම්පූර්ණයෙන් වෙන්වූ සිහි කල්පනාවක්ය.

බුදුපියාණන් වහන්සේ තවමත් බුද්ධත්වයට පැමිණ නොතිබුණි. එම තත්ත්වයට පැමිණීමට හැකි වූයේ ගැඹුරු අවබෝධයන් බොහෝ වාරයක් උන්වහන්සේට පැහැදිලි වූ පසුය. ඊළඟට පවසන දෙයින් උන්වහන්සේ පත් වූ ධ්‍යානමය තත්ත්වය අක්‍රීය එකක් නොවන බවට කෙනෙකුට පැහැදිලි වනු ඇත. දැන් ''එක්තැන්වූ සහ පිරිසිදුවූ, සුසැදි සහ දැඩි නොවන සහ කෙලෙස්වලින් නිදහස්, නම්‍ය, නොසෙල්වන, අචල සහ නොකැළඹෙන''[29] මනසකින් බුදුපියාණන් වහන්සේ එය නිශ්චිත විෂයයන් වෙත හැරවූහ, හෝ යොමු කළහ (චිත්තං අභිනින්නාමේති). ඇතැමුන් කියා ඇති පරිදි මේවායෙන් පළමු වැන්න සැලකිල්ලක් දැක්වූයේ නැවත ඉපදීම යථාර්ථයක් ද නැද්ද යන්නටයි. අතීත ජීවිත පිළිබඳව ඇති දැණුම (පුබ්බේ නිවාසානුස්සති ඤාණය) ලෙස බුදුපියාණන් වහන්සේ හැඳින්වූ දේ උන්වහන්සේ අත්වින්දහ. එහිදී උන්වහන්සේ උන්වහන්සේගේ පෙර ජීවිතවල දීර්ඝ පෙරට්ටුවක් ඉතා පැහැදිලිව සහ ප්‍රබෝධවත් අයුරින් විස්තර දුටුවහ.[30] මෙම අත්දැකීම උන්වහන්සේට නැවත ඉපදීමේ යථාර්ථය ඍජුව සහ පෞද්ගලිකව පිරික්සා බැලීමට ඉඩ ලබා දුන්නේය. කර්මයේ සංකීර්ණ සහ සියුම් ක්‍රියාකාරකම් අනුව නැවත ඉපදීම සිදුවන්නේ කෙසේ දැයි අවබෝධ කර ගැනීමට සත්ත්වයන්ගේ හට ගැනීම සහ මිය යෑම (සතානං චුතූපපාතඤාණය) පිළිබඳ දැනුම යනුවෙන් උන්වහන්සේ හැඳින්වූ දෙවන අවබෝධය සඳහා මෙය හේතු විය. පසුව, උන්වහන්සේ කියා සිටියේ සාමාන්‍ය පුද්ගලයෙකුට කර්මයේ යථාර්ථය විශ්වාස කර පිළිගත හැකි වූවත්, රහත්ඵල ලාභියෙකුට පමණක් එහි ක්‍රියාකාරීත්වය පිළිබඳ පුද්ගලික සහ ඍජු දැනුමක් ඇති බවයි.[31] මෙම සැඟවුණු ඇත්ත දැකීමේ නුවණේ තුන්වන සහ ඉතාම වැදගත් එක මානසික කෙළෙස් විනාශ කරන දැනුම (ආසවානංඛය ඤාණාය) ලෙස උන්වහන්සේ හැඳින්වූහ.[32] ගැඹුරුම මට්ටමින්, එය සම්ප්‍රජානනයේ ගැඹුරුතම පෙදෙසෙන් කිව හැකිය.

---

[28] M.I,246-48.

[29] M.I,248.

[30] This seems to have been an extension of, and in some way related to, what is called in psychology a life review experience (LRE), where a person who has a close brush with death sees their whole life instantly flashing before them. For a scientific evaluation of this phenomena see Judith Katz and Noam Saadon-Grosman's 'The life review experience: Qualitative and Quantitative Characteristics', *Consciousness and Cognition* Vol. 48, February 2017. So far, the most credible studies of rebirth are those of Ian Stevenson, late Professor of Psychiatry and Director of the Division of Personality Studies at the University of Virginia. His decades of research are summarised in his two volume *Reincarnation and Biology*,1997.

[31] A.III, 348 ff

[32] D.I,81-3.

උන්වහන්සේ ආශාව සහ වෛරය, ඇලීම සහ තණ්හාවට අවසාන හේතුව සහ ඒ සියල්ලේ විවිධාකාර සහ සියුම් විද්‍යමානවීම් දුටුවහ. ඒවා දැකීමෙන් ඒවා අහෝසි විය.''ආලෝකය උදා විය, බුද්ධිය ඇති විය, වටහා ගැනීම මතුවිය'' තරුණ ගෞතමයන් වහන්සේ බුද්ධත්වයට පත්විය.[33] මෙම ඉතා ප්‍රබල සහ විමුක්තිය ලැබීමේ ක්‍රියාවලියට කොපමණ කාලයක් ගතවූයේ දැයි උන්වහන්සේ කිසි විටක පවසා නැත. නමුත්, සම්පූර්ණයෙන්ම නිශ්චලව, දෑස් වසාගෙන, එම ක්‍රියාවලියේ පූර්ණව, මුළුමනින්ම පැය ගණනාවක් අරමුණ ඉෂ්ඨ වනතුරු ඉඳගෙන සිටින්නට ඇත.

මෙම සමස්ත ක්‍රියාවලියේදී එක් අවස්ථාවකදී, බොහෝ විට එහි ආරම්භයේදී, තමන්වහන්සේ 'මාර' වශයෙන් හඳුන්වන යම් ආකාරයක අද්භූත දර්ශනයක් උන්වහන්සේ ඉදිරියේ පෙනී සිටි බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. මුලදී මාර උත්සාහ කළේ, උන්වහන්සේ සොයා ගිය අරමුණ අත්හරවා, සාමාන්‍ය ජීවිතයට ආපසු යෑමට සහ කුසල් වඩමින් හුදෙක් යහපත් පුද්ගලයෙකු කරවීමටයි. මෙය ක්‍රියාත්මක නොවූ විට, මාරයා උන්වහන්සේ වටා 'හමුදාවක්' එක්රැස් කොට, උන්වහන්සේට පහර දුන්නේය. මෙම පහරදීම් ඇතුළු නුවණ යොදමින්, එනම්, ඒවා ඒවායේ සැබෑ ස්වරූපය දකිමින්, සහ ස්ථිර අධිෂ්ඨානය තුළින් මැඩපවත්වා ගත් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ.[34] ගෞතමයන් වහන්සේ මෙම ස්වරූපය කුමක් වුවත්, දුටුවේ උන්වහන්සේගේ සැබෑ ඇස්වලින් ද, නැතහොත් උන්වහන්සේගේ අභ්‍යන්තර ඇස්වලින් ද, උන්වහන්සේගේ සිතුවිලි මාත්‍රයෙන් ද හෝ උන්වහන්සේ අනෙක් අයට තේරුම් ගත හැකි භාෂාවෙන් ලෞකික ආශාවන් සමග උන්වහන්සේගේ අවසන් අරගලය හුදෙක් නිරූපණය කළේ ද? මෙම අරගලය පිළිබඳව ත්‍රිපිටකයේ විස්තරයට අනුව, මාර, රහත්ඵල ලැබීමට ඇති කායික සහ මානසික බාධකවල පුද්ගලාරෝපණයක් ලෙස පෙනී යයි. නිසි තත්ත්වයට ගෙනෙන ලද මනසෙහි ආලෝකය වෙත ප්‍රවේශවීමට ගන්නා අවසාන උත්සාහයට විරෝධය පෑමකි.[35] මෙම නමම, ලැබී ඇත්තේ ''මරණය'' *mṛt* යන අර්ථය ඇති සංස්කෘත මූලයෙනි. ''මරණය සිදු කරන්නා'' යන අර්ථය ඇති 'මාර්යති' යන හේතුකාරක ආකෘතියට සම්බන්ධ වේ. මෙයින් සහ මාරගේ 'හමුදාවේ' කොටස්වලින් පැහැදිලි වන්නේ මෙම පැහැදිලි කිරීම වඩාත්ම සාධාරණ ලෙස පිළිගත හැකි බවයි. 'හමුදාව' සමන්විත වූයේ ඉඳුරන් සම්බන්ධ තෘප්තිය, අසහනය, කුසගින්න සහ පිපාසය, දැඩිආශාව, නිදිමතකම සහ අලස බව, බිය, සැකය, කුහකකම සහ මුරණ්ඩුබව, ලාභ, කීර්තිය සහ ප්‍රසිද්ධිය, කීර්තිය සඳහා ඇති ආශාව සහ තමන් උසස්කොට සලකමින් අනුන් හෙළා දැකීම යනුවෙනි.[36] වෙනත් බොහෝ දේශනාවලින් මාරගේ දූවරුන් පිළිබඳව විස්තර කර ඇත. නැවතත්, ඔවුන්ගේ නම්වලින් පෙනී යන්නේ, ඔවුන් සැබෑ ජීවීන්ට වඩා ක්‍ෂණාත්මක මානසික

[33] On the different accounts of the Buddha's awakening experience see Norman 1990, 25 ff.
[34] Sn.442-3.
[35] Sn.425 ff.
[36] Sn.436-8.

තත්ත්වයන්ගෙන් හෙබි පුද්ගලාරෝපණයන් බවයි. දූවරුන් නම්කර ඇත්තේ දැඩි ආශා කිරීම් (තන්හා), රාගය (අරති) සහ ආශාව (රාගා) යනුවෙනි.[37] බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබීම සම්බන්ධ සියලු විස්තරවලින් උන්වහන්සේට මාර හමුවීම පිළිබඳව සඳහන් වන්නේ එක් ස්ථානයක පමණක් බව සඳහන් කිරීම වටී.

බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබීම අද්භූත අත්දැකීමක් බව පවසා තිබෙන නමුත්, ගුප්ත වාදයේ නිශ්චිතව අඩංගු වන්නේ කුමක්ද යන්න නිර්වචනය කිරීම අසීරු ය. නූතන මනෝවිද්‍යාවේ දෘෂ්ටි කෝණයෙන් බැලූ විට, සියල්ලම නොවුවත්, බොහෝ විට, ගුප්ත අත්දැකීම් සාමාන්‍යයෙන් ලක්ෂණ හතරකට වර්ගීකරණය කර ඇත. ඔවුන් තුළ දැඩි චිත්තවේගීය සංඝටයක් ඇත, ඔවුන් ශාරීරික හෝ මානසික ආතතියකින් ක්‍රියාත්මක වේ - බලාපොරොත්තු සුන්වීම; ආශාව; නිරාහාරව සිටීම; යටපත් කළ ලිංගිකත්වය; දීර්ඝ නිදි වැරීම් ආදිය; ඔවුන් කිසිවිටකත් ගුප්ත දේවධර්මවාදී විශ්වාසයන්ට පටහැනි නොවේ - කිතුනුවන්ට ක්‍රිෂ්නා පිළිබඳව සිහින නැත, මුස්ලිම්වරුන්ට ට්‍රිනිටි, ආදීන් පිළිබඳව කිසිවිටක දැකීම් මාත්‍රයක් නැත. ඒවාට දෙවියන්, දේවදූතයන්, පරමාත්මය, යනාදී බාහිර නියෝජිතයෙකු විසින් හෝ යම් ආකාරයකින් සම්බන්ධ වී ඇති බවට ඔවුන් අර්ථකථනය කර ඇත. බුදුපියාණන් වහන්සේ විසින් උන්වහන්සේගේ බුද්ධත්වයට පැමිණීම පිළිබඳව කරන ලද විස්තරය මෙම නිර්වචනයට හෝ ගුප්ත තත්ත්වය පිළිබඳ වැදගත් අධ්‍යයනවලට නොගැලපේ.[38] (උදාහරණ වශයෙන්, බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වන්නට පෙර පැය කිහිපය තුළ භාවනාව ආරම්භ කළ විට පවා අසාමාන්‍ය ලෙස සන්සුන්ව සහ තැන්පත්ව, සසල නොවෙමින් වැඩ සිටි බව පෙනෙන්නට තිබුණි. උන්වහන්සේට දැනුණු දැඩි ප්‍රීතිය (විමුත්තිසුඛ) ඇති වූයේ පසුවය.[39] උන්වහන්සේ බුද්ධත්වයට පත් වන විට, උන්වහන්සේගේ සියලු දැඩි හික්මීම්වලින් සම්පූර්ණයෙන්ම යළි ප්‍රකෘති තත්ත්වයට පත් වී තිබුණි. එයින් අදහස් පළවන්නේ උන්වහන්සේ හොඳින් ආහාර අනුභව කළ බව, විවේක ගත් බව, සහ ශක්තිය (බලං ගහෙත්වා) නැවත ලබා ගත් බවයි. පසුකාලීනව උන්වහන්සේගේ දර්ශනයේ කේන්ද්‍රස්ථානය ලෙස උන්වහන්සේ විසින් විධිමත්ව සකස් කරන ලද ධර්මය පිළිබඳව කිසිදු අදහසක් බුදුපියාණන් වහන්සේට බුද්ධත්වය ලැබීමට පෙර තිබූ බවට කිසිදු සාක්ෂියක් නැත - එනම් චතුරාර්ය සත්‍යය; ආර්ය අෂ්ටාංගික මාර්ගය; පටිච්ඡසමුප්පාදය; ආදිය. සැබැවින්ම, බුදුපියාණන් වහන්සේ කියා සිටියේ, උන්වහන්සේ අවබෝධ කරගත් සත්‍යයන් ''මීට පෙර උන්වහන්සේ අසා නොතිබූ'' (පුබ්බේ අනනුස්සුතේසු ධම්මේසු) බවයි.[40] උන්වහන්සේ කිසි විටකත් උන්වහන්සේ ලැබූ බුද්ධත්වය දිව්‍යමය අනුග්‍රහයක ප්‍රතිඵලයක්,

---

[37] S.I,124.

[38] E.g. William James' *Varieties of Religious Experience* 1902; Rudolf Otto's *Mysticism East and West* 1932; and Evelyn Underhill's *Mysticism* 1911.

[39] M.I,247.

[40] S.V,422.

'සැම දෙයක් සමග එකක්', වචනයෙන් විස්තර කළ නොහැකි, පරමාත්මය සමග සම්බන්ධ කිරීමක් හෝ ගුප්ත අත්දැකීම් සමග සංකේතමය සම්බන්ධ වූ වෙනත් යම් පදයක් ලෙස විස්තර කර නැත. බුදුපියාණන් වහන්සේ සැම විටම අවධාරණය කළේ පුද්ගලයෙකුට''ඔහුගේ/ඇයගේ අවබෝධයෙන් සහ විචාර බුද්ධියෙන්'' (සයං අභිඤ්ඤා) රහත්ඵල ලාභියෙකු විය හැකි බවයි. [41]

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වූ වහාම ඇති වූ ආනිසංසය වශයෙන් උන්වහන්සේ සිදු කළ දේ පිළිබඳ විස්තර තුනක් ඇත. එක් අයෙකු පවසන්නේ උන්වහන්සේ සති හතරක් උරුවෙලාවේ රැඳී සිටිය බවත්, ඒ කාලය තුළදී බ්‍රාහ්මණයෙකු, නාගයෙකු, වෙළෙඳුන් දෙදෙනෙකු සහ ඉහළම දිව්‍ය ලෝකය වන බ්‍රහ්ම ලෝකයෙන් දෙවිකෙනෙකු හමුවූ බවත්ය. [42] දෙවැන්නා පැවසුවේ උන්වහන්සේ සති තුනක් රැඳී සිටිය බවත්, පළමු තොරතුරේ සඳහන් බ්‍රාහ්මණයා හමුවූ බවත්ය. [43] මෙම විස්තර දෙකම අරියපරියේසනා සූත්‍රයේ කර ඇති විස්තරයේ වැඩිදියුණුවක් සේ පෙනේ. අරියපරියේසනා සූත්‍රයේ විස්තරයේ උන්වහන්සේ වැඩ සිටි කාල පරාසය නොදක්වයි. බ්‍රහ්ම ලෝකයෙන් පැමිණි දෙවියන් හමුවීම පිළිබඳව විස්තර සපයයි. බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වය ලැබීමෙන් පසු උරුවෙලාවේ තාවකාලික නතරවීම පිළිබඳව සමහර විට කරන ලද පැරණිතම අනුවාදය විය හැකිය.

වසරකට පසු මෙම අත්දැකීම සිහිපත් කරමින්, බුදුපියාණන් වහන්සේ මෙසේ සිතූහ:

> ''මා අවබෝධ කරගත් සත්‍යය ගැඹුරුයි, දැකීමට සහ අවබෝධකර ගැනීමට අපහසුයි, ශාන්තයි සහ උත්කෘෂ්ටයි, හුදු තර්කනයෙන් විනිවිද දැකිය නොහැකිය, සියුම් සහ ප්‍රවේශ විය හැක්කේ ප්‍රඥාවන්තයන්ට පමණයි. නමුත්, වර්තමානයේ මිනිසුන් ලෝකයේ ඇති දේවලින් සතුටු වේ, ප්‍රීතිප්‍රමෝදයට පත් වේ. මෙම සත්‍යය දකින්නට ඔවුන්ට අපහසු වේ. තත්ත්වයන්ට අනුව පැවැත්ම, ඇතිවීම, ඇතිවන අයුරු දැකීම, ඔවුන්ට අපහසු වේ. මෙම සත්‍යය දැකීම ඔවුන්ට අපහසු වනු ඇත, එනම්, සියලු මානසික උත්පාදකයන්ගේ නිශ්චලතාවය, සියලු බැඳීම් අත්හැරීම, විරාගය දක්වා තෘෂ්ණාව විනාශ කිරීම, නැවැත්වීම, නිර්වාණයයි. මා ඔවුන්ට මෙම සත්‍යය ඉගැන්වුවහොත්, ඔවුන් මා තේරුම් නොගනු ඇත. එය මට වෙහෙසකර සහ කරදරකාරී වනු ඇත.''

එම නිසා, වහන්සේ තීරණය කළේ අන් අයට උගන්වන්නේ නැති බවත්, උන්වහන්සේගේ ජීවිතයේ ඉතිරි කාලය නිසලව සහ අප්‍රකටව,

[41] D.III,55.
[42] Vin.I,1-8.
[43] Ud.1-3.

උන්වහන්සේම හැඳින්වූ බුද්ධත්වය ලැබීමේ ප්‍රීතිප්‍රමෝදය භුක්ති විඳින බවයි. බුදුපියාණන් වහන්සේ එසේ සිතන විට, ඉහළම දිව්‍යලෝකයේ ජීවින්වන බ්‍රහ්මලෝකයේ මෙම සිතුවිලි පිළිබඳව දැනගත්හ. එයින් එක් දෙවියෙකු වන සහම්පති බ්‍රහ්මයන් එයින් කලකිරීමට පත් වී උන්වහන්සේ ඉදිරියේ දිස්විය. බුදුපියාණන් වහන්සේට ආචාර කර, මෙසේ පැවසුවේය:

> ''බුදුපියාණන් වහන්ස, ධර්මය උගන්වනු මැනවි. ඇස්වල දූවිලි ස්වල්පයක් පමණක් ඇති මිනිසුන් ධර්මය අසන්නට නැති නිසා ඔවුන්ගේ ජීවිත විනාශ පවතී. ධර්මය අවබෝධ කරගත හැකි පිරිසක් ද සිටී.''

මෙම ආයාචනයට ප්‍රතිචාර දක්වමින්, බුදුපියාණන් වහන්සේ 'බුදු ඇසින්' ලෝකය සමීක්ෂණය කළහ. එයින් නැවත සලකා බැලීමට උන්වහන්සේට පෙළඹවීමක් ඇතිවුණි.

> ''නිල්, රෝස හෝ සුදු නෙළුම් මල් පිරි පොකුණක සමහර ගස් ජලයේ පැළවේ. නමුත්, කිසි විටක මතුපිටට නොපැමිණෙයි. අනෙක් ඒවා වැඩෙන අතර, පොළො මතුපිට රැඳී සිටියි. ස්වල්පයක් පමණක් පොළොව මතුපිටන් ඔබ්බට වැඩේ, ජලයේ ස්පර්ශ නොවී තිබේ. ඒ ආකාරයටම, මම ඇස්වල දූවිලි ස්වල්පයක් ඇති සහ බොහෝ දූවිලි ඇති, වහා අවබෝධ කරගන්නා සහ මන්දගාමීව අවබෝධ කරගන්නා, යහපත් ස්වභාවයේ සහ අයහපත් ස්වභාවයේ පුද්ගලයන්, වඩා යහපත් බවට හැරවිය හැකි සහ එසේ කළ නොහැකි පුද්ගලයන්, දැක ඇත්තෙමි. ඒ අය අතරින්, සුළු පිරිසක්, වැරදි කිරීමේ ඇති භයානකත්වය සහ අනාගතයේ එයින් ඇති වන ප්‍රතිඵල දකින අය වෙති.''

අවසාන කණ්ඩායමේ යහපත වෙනුවෙන් ලෝකයට ධර්මය අනාවරණය කිරීමට බුදුපියාණන් වහන්සේ අධිෂ්ඨාන කළහ. [44]

බුදුපියාණන් වහන්සේගේ ඊළඟ සිතුවිල්ල වූයේ පළමුව උගන්නන්නේ කාටද යන්නයි. හොඳට පෙනෙන්නට ඇති අපේක්ෂකයන් වූයේ උන්වහන්සේගේ ගුරුවරුන් වූ ආළාර කාලාම සහ උද්දක රාමපුත්තයි. දෙදෙනාම බුදුපියාණන් වහන්සේ සැලකුවේ ''බුද්ධිමත්, විචක්ෂණශීලී සහ ඇස්වල ස්වල්පයක් පමණක් වූ දූවිලි ඇති පුද්ගලයන් ලෙසය.'' ඒ දෙදෙනාම මෑතකදී මිය ගිය බව දැනගන්නට ලැබී උන්වහන්සේගේ පෙර සහායකයන් පස්දෙනා පිළිබඳව සිතුවිල්ලක් ඇති විය. ඔවුන් සිටින්නේ බාරාණසීයේ බව දැනගන්නට ලැබී, එහි යන්නට පිටත් වූහ. උරුවෙලා සහ බාරාණසී අතර ඇති මාර්ගයේ වඩින විට උන්වහන්සේට උපක

---

[44] M.I,168-69.

නමැති ආජීවක තවුසෙකු අනෙක් දිසාවෙන් පැමිණෙනු දකින්නට ලැබුණි. දුර සිටම බුදුපියාණන් වහන්සේගේ කල්පනාකාරී ලීලාව, ශාන්ත ඉඳුරන්ගේ සංජානනය සහ රැස් විහිදෙන සමේ ස්වභාවය දුටු උපක ආජීවකයා ගැඹුරු ලෙස පැහැදුණි. දෙදෙනා හමුවූ විට, උපක මෙසේ ඇසුවේය : ''ඔබවහන්සේගේ ගුරුවරයා කව්ද? ඔබවහන්සේ අනුගමනය කරන්නේ කාගේ ධර්මයද?'' ඔබ මොබ යන තවුසන් හමුවූ විට සාම්ප්‍රදායික සුබ පැතුම් තිබුන ද, මේ අවස්ථාවේ උපකගේ වචනවල ද යම් ප්‍රසාදයක් සහ කුතුහලයක් ද පැවතුනි. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: ''මට ගුරුවරයෙකු නැත. සියලු ලෝකයේ දෙවිවරුන්ද ඇතුළුව, මම සහකරුවෙකු නොමැතිව අද්විතීය වෙමි.'' මෙම කියමනෙන් උපක පුදුමයට පත්විය. සැබැවින්ම ඔහු ඒ පිළිබඳව සැක සහිත විය. ඔහු පිළිතුරු දුන්නේය: ඔබවහන්සේ පවසන දෙයට අනුව, ඔබවහන්සේ විශ්වීය දැනසිටින්නා!'' ඔහු ඊට පසු ඔහුගේ හිස වනමින් ''ඔහු කියන ආකාරයට, එසේ විය හැකිය මිතුරා''[45] යැයි කියමින් ගියේය.

බුදුපියාණන් වහන්සේ බාරාණාසීයට පැමිණ ඊට පසු මුවන් සඳහා වූ රක්ෂිතයක් වන ඉසිපතනය වෙත වැඩියහ. එහි උන්වහන්සේගේ සහායකයන් නැවතී සිටින බව දැනගන්නට ලැබුණි.[46] බුදුපියාණන් වහන්සේ ඈතින් වඩිනු දුටු පස්වග මහණුන් උන්වහන්සේට නොමිතුරු බව පෙන්වීමට, උන්වහන්සේ වෙනුවෙන් නොනැගීමට හෝ ආසනයක් නොපැනවීමට ඔවුන් අතර එකඟතාවක් ඇති කර ගත්හ. නමුත් උන්වහන්සේ ඔවුන් සමග එක්වුවහොත් විරුද්ධ නොවීමටද කතාකර ගත්හ. නමුත්, උන්වහන්සේට ගෞරව නොකිරීමට එකඟ වුවද, උන්වහන්සේ ඔවුන්ගේ බලාපොරොත්තු සිඳිනු ලැබූහ. ඔවුන් ලංවන විට, කෙසේ නමුත් ඔවුන් දැන සිටි වැහැරුණු පෙනුමැති ජරාපත් තවුසා, දැන් සම්පූර්ණයෙන්ම වෙනස් ලෙසින් පෙනුණි. උන්වහන්සේගේ සමෙන් රැස් විහිදුණි. උන්වහන්සේ තැන්පත් බවෙන් සහ දැඩි විශ්වාසයෙන් හෙබුණි. උන්වහන්සේ කෙතරම් ආකර්ෂණීය වූයේද කිවහොත්, උන්වහන්සේට ගෞරව නොකරන්නට ඔවුන් ගත් තීරණය අමතක විය. එක් එක්කෙනා බැගින් අසුන්වලින් නැගිට සිටියහ. බුදුපියාණන් වහන්සේ ඔවුන් වෙත පැමිණි විට, උන්වහන්සේගේ පාත්‍රය රැගෙන අසුනක් පිළිගැන්වූහ. නමුත්, තවමත් එයින් ඔබ්බට උන්වහන්සේට ගෞරව දැක්වීමට මුනිවත රැක්කහ.[47] තමන්වහන්සේ බුද්ධත්වයට පත් වී ඇති බවත්, උන්වහන්සේගේ උපදෙස් අනුගමනය කරන්නේ නම්, ඔවුන්ටද රහත්ඵලයට පත්වන්නට හැකි බවත් පැවසූහ. මෙම කියමන් දෙකම ඔවුන්ගේ සැකයට ලක්විය. ''ගෞතමයන් වහන්ස, දැඩි හික්මීම පුරුදු පුහුණු කිරීමේදීද ඔබවහන්සේ කිසියම් ඉහළ

[45] M.I,170-172.
[46] Both the *Mahāvastu* and the *Lalitavistara* give the Buddha's itinerary from Uruvelā to Isipatana, although it is not possible to identify any of the locations they mention. The Buddha would have gone from Gayā west, crossing the Son by the ancient ford at Daudnagar, and then headed north-west to Bārāṇasī, the modern Varanasi.
[47] M.I,171-173.

තත්ත්වයකට පත්වීමට හෝ ශාන්තුවරයෙකු වීමට සුදුසු කිසියම් ඉහළ දැණුමක් හෝ දැක්මක් ලැබීමේ අසාර්ථක විය. එසේ නම් දැන් ඔබවහන්සේ එවැනි තත්ත්වයන් අත්කරගත්තේ කෙසේද?'' බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: ''මීට පෙර ඔබලාට මෙවැනි දෙයක් කීමට ඔබලා මා කවදා හෝ දැන සිටියේද?''

ඔවුන්ගේ වසර ගණනාවක එක්ව සිටීමට අවධානය යොමු කරමින් මෙම අනපේක්ෂිත පෞද්ගලික ඉල්ලීම, පස්වග මහණුන්ට නැවත සිතන්නට හේතුවක් විය. ඔවුහු ඔවුන් උන්වහන්සේ දැන සිටි මුළු කාලයේදීම සැබැවින්ම එවැනි ප්‍රකාශයක් නොකළ බවට පිළිගත්හ. අප්‍රසාදය පසෙකින් තබා ඔවුහු උන්වහන්සේට කියන්නට තිබූ දේවලට සවන් දෙන්නට එකඟවිය. ඊළඟ දින කිහිපය තුළ බුදුපියාණන් වහන්සේ සහ පස්වග මහණුන් වර්තමානයේ හඳුන්වන වැඩමුළුවක් පැවැත්වූහ. බුදුපියාණන් වහන්සේ ඔවුන්ට ලබාදුන් දැණුම, පසුව ලේඛන දෙකකට සාරාංශ කරන ලදී. ඒවා හැඳින්වූයේ 'අනුශාසනාව ධර්ම චක්‍රයට සකස් කිරීම සහ අනත්ත සංඥාව පිළිබඳ අනුශාසනාව, කරුණු සහ සාක්ෂි අනුව, බුදුදහමේ ප්‍රධාන අංග වන චතුරාර්ය සත්‍යය, ආර්ය අෂ්ටාංගික මාර්ගය සහ ආත්මයක් නැතැයි යන මතය පහසුවෙන් අවබෝධ කර ගත හැකි අයුරෙන් විස්තර කර ඇත.[48]

අස්සජි, භද්දිය, කොණ්ඩඤ්ඤ, මහානාම සහ වප්ප යන පස්වග මහණුන් ඉසිපතනයේදී ඉසිපතනයේදී බුදුපියාණන් වහන්සේ සමග ඉසිපතනයට වැඩම කිරීමෙන් පසු සිදුවන්නේ කුමක්ද යන්න අභිරහසකි. උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ දේ අන් අයට උගන්වමින් ගම්දනව්වල සැරිසැරීමට බුදුපියාණන් වහන්සේ ඔවුන්ගෙන් ඉල්ලා සිටි නමුත්, අස්සජී හිමියන් හැර තවදුරටත් ඔවුන් පිළිබඳව සඳහනක් ත්‍රිපිටකයේ නැත. ඉසිපතනයෙන් නික්ම මාස කිහිපයකට පසු, අස්සජී හිමියන් රජගහනුවර සිටි අතර, එහිදී ඔහුට ඒ වනවිටත්, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු නොවූ සාරිපුත්ත හිමියන් හමුවිය. ඔහු අස්සජී හිමියන්ගේ ගුරුවරයා කව්ද සහ ඉගැන්වූයේ කුමක් ද කියා විමසුවේය. අස්සජී හිමියන් ඔහුට ඒ වන විට ලැබී ඇති ධර්මය පිළිබඳ කෙටි විස්තරයක් පමණක් ලබා දෙමින් පැවසුවේ තවමත් ඔහු එය හොඳින් නොදන්නා බවත්ය.[49] බුදුපියාණන් වහන්සේ විසින් පැවිදි කරන ලද පළමු භික්ෂූන් වහන්සේලා සහ ඉදිරියට එක්වන්නට සිටි සියලු බොහෝ භික්ෂූන් වහන්සේලා වශයෙන් ද, ඔවුහු ඉදිරියට එක්වන්නට සිටි සියලු බොහෝ භික්ෂූන් වහන්සේලාට වඩා ජ්‍යෙෂ්ඨ විය. ඒ නිසා ඔවුන් විශේෂයෙන්ම වැඩි සැලකිල්ලට ලක්වීම අපේක්ෂා කරන නිසා, ඔවුන් හා ඔවුන්ගේ ප්‍රගමනය පිළිබඳව සම්පූර්ණයෙන්ම ලේඛනගත විය යුතුව තිබුණි. නමුත් එය එසේ වී නැත. ඔවුන් ඔවුන්ගේ ජීවිතයේ ඉදිරි කාලය හුදෙකලා

[48] Vin.I, 13-14; S.V,420-424.
[49] Vin.I,39 ff.

භාවනාවේ යෙදුනේද, පැවිදි වීමෙන් නොබෝ කාලයකින් මිය ගියේද, නැතහොත්, පසුව බුදුපියාණන් වහන්සේගෙන්, සහ සඞ්ඝයාගෙන් යම් හේතුවකට ඈත් වූයේද? අපට අස්සජී හිමියන් ගැන අසන්නට ලැබෙන්නේ තවත් එක් වරක් පමණි. ඒ වේසාලියේදී භික්ෂුවක් බුදුපියාණන් වහන්සේ ඉගැන්වූයේ කුමක්දැයි ඔහුගෙන් විමසූ විට ඔහු පිළිතුරු දුන්නේ ධර්මය පිළිබඳ කෙටි විස්තරයකින් බවයි.[50]

[50] M.I,228.

# 6. දෙවිවරුන්ට සහ මිනිසුන්ට ගුරුවරයෙක්

උන්වහන්සේ බුද්ධත්වයට පත්වූහ; රහත්ඵල ලැබීමට උන්වහන්සේ ධර්මය උගන්වන සේක.
උන්වහන්සේ ශික්ෂණකාමීය; උන්වහන්සේ ශික්ෂණකාමීවීමට ධර්මය උගන්වන සේක.
බුදුපියාණන් වහන්සේ සන්සුන්ය; උන්වහන්සේ සන්සුන්වීමට ධර්මය උගන්වති. මජ්ඣිම නිකාය M.I,235

බුදුපියාණන් වහන්සේගේ පෞරුෂය පිළිබඳව වැඩිදුර අවබෝධයක් ලබා දෙන දෙයක් නම්, උන්වහන්සේගේ ආධාරකරුවන් සහ විවේචකයන්, ශ්‍රාවකයන් සහ ප්‍රතිවාදයන් විසින් ත්‍රිපිටකයට ඇතුළත් කර ඇති විශාල සංඛ්‍යාවක අදහස්ය. සමහර විට උන්වහන්සේගේ ආධාරකරුවන් සහ ශ්‍රාවකයන් උන්වහන්සේ වර්ණනා කරන අදහස් සමබර වන්නේ උන්වහන්සේට අකැමැති හෝ අවම වශයෙන් උන්වහන්සේ ඉගැන්වූ අදහස් සමග එකඟ නොවූ අයගෙන් විය හැකි අගතියෙනි. නමුත්, බුදුපියාණන් වහන්සේ ගැන අන් අය සිතන්නේ කුමක් දැයි බැලීමට පෙර උන්වහන්සේ තමන් ගැන සිතන්නේ කුමක් දැයි විමසා බැලීම වටී.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය (බෝධි) ලැබීමේ අත්දැකීම සහ පසුකාලීනව උන්වහන්සේ තුළ ඇතිවූ පරිවර්තනය තවමත් මනුෂ්‍යයෙකු වුවද, චෛතසිකව සහ සදාචාරාත්මකව අන් අයට වඩා සම්පූර්ණයෙන්ම වෙනස් ආකාරයේ මනුෂ්‍යයෙකු බව විශ්වාස කිරීමට හේතු විය.[1] උන්වහන්සේ තමන්වහන්සේ බුදුවරයෙකු බව විශ්වාස කළ අතර, බොහෝ විට උන්වහන්සේ හඳුන්වා දෙන ලද්දේ අර්හත් හෝ තථාගත ලෙසිනි. බුද්ධ යන අභිධානය පැමිණෙන්නේ බුජ්ඣති යන නාම පදයේ අතීත කෘදන්තයෙන් වන අතර, එහි අර්ථය නම්, 'අවදි කිරීම' හෝ 'අවදි වීම' යන අරුත් ඇතිවය. පුද්ගලයෙකු සම්බන්ධයෙන් භාවිත කරන විට අදහස් වන්නේ යමක් පිළිබඳව පිබිදීමක් හෝ අවබෝධයක් ඇතිකර ගත් තැනැත්තා යන්නයි. රහතන් වහන්සේ යනු බලය හෝ අධිකාරි තත්ත්වයක් දරන අය සඳහා පූර්ව බෞද්ධ යෙදුමක් වූ අතර, එහි තේරුම 'වටිනා පුද්ගලයෙකු' වැනි අර්ථයකි. එය ඕනෑම ගෞරවනීය භික්ෂුවක් ආමන්ත්‍රණය කිරීමට යොදා ගත් අතර, බෞද්ධයෝ රහත්ඵල ලැබූ භික්ෂු භික්ෂුණියන් ඇමතීමට යොදා ගත්හ.[2] තථාගත යනු අසාමාන්‍ය වචනයකි. තථ යන වචනය සත්‍ය හෝ සැබෑ යන අර්ථය ඇති විශේෂණ පදයක් ලෙසද, තථා යන්න ඒ අනුව හෝ එනිසා යන අර්ථය ඇති ක්‍රියා විශේෂණ පදයක් ලෙස ද භාවිත වේ. මෙයින් පළමු වැන්න බොහෝ විට අදහස් කෙරේ. තවදුරටත් තථා + ආගත යන වචනය සකසන්නේ නම්, එහි තේරුම 'සත්‍යයට පැමිණි තැනැත්තා' හෝ තථා+ ගත එසේ ගිය තැනැත්තා' යන්නයි. එහි නියම

[1] Numerous commentators have maintained that when the Buddha was once asked if he was a human being he denied it. This claim is based on an early translation of the discourse in which the incident occurs where the word *bhavissati* was wrongly taken to be "Are you…" whereas it is actually the future tense "Will you become…" A.II,38. The Buddha was being asked if he would become, i.e. be reborn as, a human being to which he answered 'no', affirming that he had freed himself from the process of birth, death and rebirth. The passage was rendered correctly by F. L. Woodward in his 1933 translation of the Aṅguttara Nikāya and appears correct in all subsequent translations. Despite this, both academic and popular writers continue to use the mistranslation to prove or disprove various claims about the Buddha.

[2] See Rhys Davids' *Dialogues of the Buddha*, 1921, Vol. III pp.3-4.

අර්ථය හෝ වැදගත්කම කුමක් වුවත්, තථාගත යනු එසේ වූ බවට පෙනෙන්නට තිබෙන බෞද්ධ නිර්මාණයකි. බොහෝ විට, බුදුපියාණන් වහන්සේ විසින් අලුතින් එක් කළ වැකි කඩකි.

බුදුපියාණන් වහන්සේගේ අවබෝධයට අනුව, ඕනෑම කෙනෙකුට උන්වහන්සේ අවබෝධ කරගත් ධර්මය තමන්ගේම උත්සාහයෙන් සහ අධිෂ්ඨානයෙන් අවබෝධ කර ගත හැකිය. උන්වහන්සේගේ කාර්යභාරය වූයේ පුද්ගලයන්ගේ අවධානය සත්‍යය වෙත යොමු කිරීමයි. එහි අදහස, දැනටමත් ඕනෑම කෙනෙකු සතුව ඇති සංජානනය සත්‍යය දැකීම සඳහා පැහැදිලි කර දීමයි. බුදුපියාණන් වහන්සේ එය මෙසේ දැක්වූහ:

> ''තථාගතයන් වහන්සේලා ලෝකයේ පහළ වුවත්, නැතත්, මෙම පිළිවෙළ පවතී - සංසිද්ධිවල ස්ථාවර ස්වභාවය, ඒවායේ අඛණ්ඩ රටාව සහ ඒවායේ සාමාන්‍ය කොන්දේසිය, තථාගතයන් වහන්සේ මෙය සොයාගෙන, එය පෙන්වා දී, එය උගන්වා, පැහැදිලි කර, ස්ථාපිත කර, හෙළිදරව් කර, විශ්ලේෂණය කර, පිරිසිදු කර 'බලන්න' කියා පවසති.''[3]

මේ අනුව, බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගෙන් දුටුවේ මූලික වශයෙන් ගුරුවරයෙකු ලෙසයි. නමුත්, ඈතින් හෝ දුරස්ථව සිටිමින් නොවේ. ඒ වෙනුවට මනුෂ්‍යත්වය කෙරෙහි ඇති අනුකම්පාවෙන් පමණක් පෙළඹීමෙනි. උන්වහන්සේ තමන්වහන්සේ පිළිබඳව පැවසුවේ මෙසේය:

> ''බොහෝ දෙනාගේ සුභසිද්ධිය පිණිස, බොහෝ දෙනාගේ සතුට පිණිස, ලෝකයා කෙරෙහි අනුකම්පාවෙන්, දෙවියන් සහ මිනිසුන්ගේ සුභසිද්ධිය පිණිස ලොව පහළ වන එක් පුද්ගලයෙකු ඇත. ඒ පුද්ගලයා කව්ද? ඒ තථාගතයන් වහන්සේය, ගරු කටයුතු පුද්ගලයාය. සම්පූර්ණයෙන්ම අවබෝධ කරගත්, බුදුපියාණන් වහන්සේය.''[4]

උන්වහන්සේ තමන්වහන්සේගේ ශ්‍රාවකයන්ට සිහිපත් කළේ, උන්වහන්සේ ඔවුන්ට තරවටු කළත්, හෝ බැණ වදින විටත්, සැමවිටම උන්වහන්සේගේ චේතනාව වූයේ ඔවුන් කෙරෙහි අනුකම්පාව බවයි. ''ගුරුවරයෙකු විසින් ඔහුගේ ශ්‍රාවකයන් කෙරෙහි ඇති අනුකම්පාවෙන් සහ ඔවුන්ගේ සුභසිද්ධිය සඳහා කළ යුතු ඕනෑම දෙයක් මම ඔබලා වෙනුවෙන් කළෙමි.''[5] බුදුපියාණන් වහන්සේගේ චරිතයේ වඩාත් කැපී පෙනෙන ලක්ෂණය වන්නේ උන්වහන්සේ තුළ තිබූ මෛත්‍රිය සහ ආදරය හඳුනා ගැනීමට උන්වහන්සේ සමග කල් පවතින සම්බන්ධයක් නොතිබූ අය පවා අවබෝධ කර ගැනීමයි. වරක් ජීවක වෛද්‍යවරයා බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: ''ස්වාමීනී, බ්‍රහ්මයා ආදරයෙන් මෛත්‍රියෙන් වාසය කරන බව

[3] S.II, 25.
[4] A.I,20.
[5] M.I,46.

මම අසා ඇත්තෙමි. ඔබවහන්සේ මෛත්‍රියෙන් වාසය කරන බව මම මගේ ඇසින් දුටුවෙමි.''[6] ඒ අනුව, පළමුව සහ ප්‍රධාන වශයෙන්, බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ සැලකුවේ තමන් 'සම්පූර්ණයෙන්ම අවබෝධයට පත් මනුෂ්‍යයා' වශයෙන් ඒ අවබෝධ කර ගත් සත්‍යය අනෙක් අය කෙරෙහි ඇති ගැඹුරු සහ ස්ථිර වූ කරුණාවෙන් ඉගැන්වූ පුද්ගලයා බවත්ය.

බුදුපියාණන් වහන්සේ පිළිබඳ ජනප්‍රිය මතය, බෞද්ධයන්ගේ පවා මතය වූයේ උන්වහන්සේ අර්ධ-හුදෙකලා පුද්ගලයෙකු බවයි. උන්වහන්සේ උන්වහන්සේගේ ජීවිතයේ වැඩි කාලයක් ග්ලේඩ්ස් වනාන්තරයේ සහ කඳුකර ලෙන්වල හුදෙකලාවේ ගත කර ඇත. මෙම හැඟීන ගැනීම ත්‍රිපිටකය තහවුරු නොකරයි. ත්‍රිපිටකයෙන් එය විස්තර කරන්නේ උන්වහන්සේ එකල වැඩි වශයෙන් ජීවත් වූයේ විශාල නගර සහ පුරවර අතර බවත්, නිතර ඇවිදිමින් මිනිසුන් සමග දොඩමලු වූ බවත්ය. උන්වහන්සේ ගම්බද ප්‍රදේශවල සංචාරය කළත්, නැතහොත් වනාන්තරවල හුදෙකලාවට වැඩියත්, උන්වහන්සේ සැමවිටම ගමක් හෝ කුඩා ගමක් අසල වැඩම කර ඇත. ඒ උන්වහන්සේගේ ආහාර ලබා ගැනීම පිණිසය. උන්වහන්සේගේ ශ්‍රාවකයන් සියලු පසුතලවලට අයත් වූහ. නමුත්, විශේෂයෙන්ම ඔවුන් නගරවැසියන් හෝ පුරවරවල ජීවත්වන්නන්, බොහෝ විට ආර්ථිකමය, ආගමික සහ දේශපාලනමය පංතිවලට අයත් අය විය. එසේම, වෙළෙඳුන්, විවිධ නිකායන්වලට අයත් පූජක පක්ෂය, හමුදා නිලධාරීන්, ඉඳහිට රාජකීය භවතුන් ද සිට ඇත. එසේම, සුනිධ, වස්සකාර සහ උග්ග යන අය රජයේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරුන් ද සිටියහ. ජීවක වෛද්‍යවරයෙකි. සීහ ජනරාල්වරයෙකි. අභය රාජ කුමාරයෙකි. චුන්දි සහ සුමනා යන දෙදෙනාම කුමාරිකාවන්ය. ගණක මොග්ගල්ලාන ගණකාධිවරයෙකි. අම්බපාලී ගණිකාවකි. උන්වහන්සේ සමග සාකච්ඡාවල යෙදුණු බොහෝ බ්‍රාහ්මණයන් ඔවුන්ගේ ගෝත්‍රිකයන් සහ ප්‍රජාවන්ගේ නායකයන් හෝ සුප්‍රකට විද්වතුන් වූ අතර, ස්වල්ප වූ, නමුත්, ඔවුන්ගෙන් වැදගත් සංඛ්‍යාවක් උන්වහන්සේගේ ශ්‍රාවකයන් සහ භික්ෂූන් බවට පවා පත්වූහ. අනෙක් අය, අනාථපිණ්ඩක, ඝෝසිත, කුක්කුඨ, කාලක සහ පාවාරික වැනි ධනවත් ව්‍යාපාරිකයෝ වූහ.

එවැනි පුද්ගලයන්, විශේෂයෙන්ම, එවකට ප්‍රකාශ වූ විවිධ ආගමික සහ දාර්ශනික න්‍යායන් පිළිබඳව සහ සමහර අවස්ථාවල මෙම විවිධ ඉගැන්වීම්වල සියුම් කරුණු සාකච්ඡා කිරීමට තරම් හොඳින් දන්නා සහ උනන්දුවක් තිබූ අයයි. බුදුපියාණන් වහන්සේට සාමාන්‍ය ජනතාවට කීමට කිසිවක් නොතිබූ බවක්, හෝ උන්වහන්සේගේ ධර්මය ඔවුන්ට එතරම් අදාළ නොවන බවක්, හෝ එයට ඔවුන් එතරම් උනන්දුවක් නොදක්වන බවක්, මෙයින් අදහස් නොකළ යුතුයි. වඩු කාර්මික පඤ්චකංග, බුදුපියාණන් වහන්සේ සමග දීර්ඝ සාකච්ඡාවක් කර තිබුණි. තවත් පුද්ගලයෙකු අනුරුද්ධ

[6] M.I,369.

භික්ෂුව සමග සාකච්ඡාවක් තිබී, අනතුරුව තවත් භික්ෂුවකගේ වැරදි වැටහීම නිවැරදි කිරීමට තරම් පළමු භික්ෂුවගේ ධර්මය ග්‍රහණය කර ගැනීම ගැන සෑහීමකට පත් වන්නට හැකි විය.[7] භික්ෂූන් වීමට පෙර, සුනීත සහ අරිට්ඨ යන දෙදෙනාම සමාජ පද්ධතියේ පහළම සිටි අය වූහ, පළමුවැන්නා කැළි කසළ ඉවත් කරන්නෙකු සහ දෙවැන්නා ගිජු ලිහිණියන් අල්ලන්නෙකු වේ.[8] බුදුපියාණන් වහන්සේ සතුන් පුහුණු කරන්නන් වූ පෙස්ස සහ කෙසි සහ ගම්මුලෑදෑනියා වූ අසිබන්ධකපුත්ත සමග කථාබස් කර ඇත. උදේන රජුගේ අන්තඃපුරයේ කාන්තා සේවිකාවක් වූ ඛුජ්ජුත්තරා, කිසිවිටක බුදුපියාණන් වහන්සේ සමග කතා කර නැත. නමුත්, කෝසම්බිවල පැවති උන්වහන්සේගේ බොහෝ සාකච්ඡාවලට සවන්දී ඇයට ඇසුණු බොහෝ දේ අවබෝධ කරගෙන ඇත. ඇයගේ ගැඹුරු ඉගෙනීම බුදුපියාණන් වහන්සේ ඇගයීමට ලක් කර ඇති අතර, ශ්‍රාවකයෙකු වශයෙන්, අනෙක් අය සෝදිසි කර බැලිය යුතු සහ ඕනෑකමින් ඇය අනුකරණය කළ යුතු බවත් උන්වහන්සේ පවසා ඇත.[9] බුදුපියාණන් වහන්සේ පැවසුවේ තමන්වහන්සේ ඉගැන්වූ ඕනෑම පුද්ගලයෙකු, එම පුද්ගලයා නිහතමානී යාචකයෙකු හෝ දඩයක්කාරයෙකු වුවත්, උන්වහන්සේ ඒ සියල්ලන්ට උපකාර කරන්නේ ප්‍රවේසමින් සහ ගෞරවයෙන් බවයි.[10]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේට සවන් දෙන්නට හෝ ප්‍රශ්න ඇසීමට එන්නාවූ පුද්ගලයෙකු හෝ බොහෝ මිනිසුන් සමගින් බොහෝ විට සාකච්ඡාවල යෙදුණහ. සමහර විට, සංවාදයක යෙදෙන්නා සමග පැමිණෙන මිනිසුන්ද ඒවාට සවන් දුන්හ. මෙම හමුවීම් සාමාන්‍යයෙන් ආරම්භ වූයේ ආචාර සම්පන්න සහ මිත්‍රශීලී සාකච්ඡා සමගින්ය. මිනිසුන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව අදහස් දැක්වූයේ මෙසේය: ''උන්වහන්සේ කථා කරන්නේ ප්‍රසන්නවය, ඍජුවය, උන්වහන්සේ අදහස් දක්වන්නේ පැහැදිලිවය.''[11] සියලු සමාජවල පවතින අන්‍යෝන්‍ය සන්නිවේදන මෙන්ම, බුදුපියාණන් වහන්සේ මූලික, කෙටි අදහස් හුවමාරුව භාවිත කළේ මිත්‍රත්වයේ සහ අන්‍යෝන්‍ය ගෞරවයේ පදනම මත උන්වහන්සේ හමුවූ බව මිනිසුන්ට දැන ගැනීමටය. එවැනි ආරම්භයන් ආචාරශීලී ශාරීරික අංග චලනවලින් යුක්ත විය - අත්ල අංජලි අභිනයේ එක්කර, සුදුසු දුර ප්‍රමාණයක් ලෙස සැලකෙන ස්ථානයකින් අසුන් ගැනීම සිදුවිය. බ්‍රාහ්මණයන් සම්බන්ධයෙන් ගත් කල, සමහරු බුදුපියාණන් වහන්සේ අගය කළහ. සමහරු ඔවුන්ගේ ආගමේ කරුණු පිළිබඳව උන්වහන්සේගේ ආකල්පය ගැන අසා තිබෙන නිසා පරීක්ෂාකාරී වූහ. තවත් සමහරු ඔවුන් පහත් යැයි සලකනු ලැබූ පුද්ගලයෙකු සමග සමාන භාෂිතයෙන් කතා

[7] M.I,396 ff; III,145.

[8] M.I,130 ff; Tha.620-631. Exactly what Ariṭṭha's occupation involved is uncertain but vultures' large flight feathers were used to make fans and flights for arrows and their hollow ends were used as needle cases and containers for various purposes. Perhaps Ariṭṭha trapped the birds and after extracting particular feathers released them.

[9] A. I,26; II,164; S.II,236. The tradition credits Khujjutarā with being responsible for preserving the discourses later compiled in the Itivuttaka. Unfortunately, the monks who recited, edited and transmitted the Tipitaka did not consider it worthwhile to record any other details about this interesting woman.

[10] A.III,122.

[11] D.I,116.

කරනු අන් අය දැකීමට මැලි වූහ. ඔවුන් සමග පැවැත්වූ රැස්වීම් මෙසේ විය හැකියඃ

> ''සමහර අය බුදුපියාණන් වහන්සේට ආචාර කර එක් පැත්තක වාඩිවූහ. තවත් සමහරු උන්වහන්සේට ආචාර කර ආචාරශීලී සහ මිත්‍රශීලී ආකාරයෙන් කෙටි පිළිසඳරකින් පසු ඉඳ ගත්හ. සමහරු අංජලී ඉරියව්වෙන් අත් එක් කර වැඳ ඉඳ ගත්හ. සමහරු ඔවුන්ගේ නම් සහ ගෝත්‍රය ප්‍රකාශ කර ඉඳ ගත්හ. තවත් සමහරු කිසිම දෙයක් නොකියා පැත්තකින් ඉඳ ගත්හ.''[12]

දුර්ලභ අවස්ථාවන්හි දී බුදුපියාණන් වහන්සේට අකැමැති හෝ උන්වහන්සේ අනුමත නොකළ අය සිටියහ. එසේම සමහර අය පිළිගත් ප්‍රියමනාප දේ අත්හරින්නටද ඉඩ තිබුණි. අවම වශයෙන් එක් අවස්ථාවකදී බුදුපියාණන් වහන්සේ මේ පිළිබඳව අවධානය යොමු කළහ. වෛදික අධ්‍යයනයේ විශිෂ්ටවූ අම්බත්ථ නමැත්තෙකු ඇතුළුව, තරුණ බ්‍රාහ්මණ කණ්ඩායමක් බුදුපියාණන් වහන්සේ හමුවීමට ගියහ. උන්වහන්සේ බැහැ දැකීමෙන් පසු, අම්බත්ථ හැර සියලු දෙනා ආචාර කළහ. බුදුපියාණන් වහන්සේ වාඩි වී සිටින විට, සුදානම් නැති ලීලාවෙන් යමක් පහත් හඬින් දොඩවමින් අම්බත්ථ ඉහළට පහළට ගමන් කළේය. මෙය සිතාමතාම කළ ආචාර සමාචාර විධි කඩ කිරීමකි. මෙම නොහික්මුණු බව අත්හැර නොදැමීමට තීරණය කරමින් බුදුපියාණන් වහන්සේ ඔහුගෙන් මෙසේ ඇසූහඃ

> ''හොඳයි අම්බත්ථ, ඔබ උගත් බ්‍රාහ්මණ වැඩිහිටියන්, ගුරුවරුන්ගේ ගුරුවරු සමග කතා කරන විට, ඔබ මා සමග හැසිරෙන මේ ආකාරයට හැසිරෙන්නේද?''
>
> ''නැත, යහපත් ගෞතමයන් වහන්ස. බ්‍රාහ්මණයෙකු ඇවිදිය යුත්තේ බ්‍රාහ්මණයෙකු සමගය, ඔහු සිටගෙන ඉන්නා විට, සිට ගෙන සිටිය යුතුයි, ඔහු සැතපෙන විට සැතපිය යුතුයි. නමුත්, හිස මුඬු කළ නොවැදගත් දාසයන්, බ්‍රාහ්මණයන්ගේ කකුල් හොරිකඩ සූරා කන ඔබ වැනි අය සමගින්, මා ක්‍රියා කරන සහ කතා කරන ආකාරය ගැලපේ.''
>
> මෙය අයහපත් හැසිරීම්වලට අපහාසයක් එකතු වූ අතර, බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හඃ
>
> ''හොඳයි අම්බත්ථ, ඔබ මෙහි පැමිණියේ යම් හේතුවක් නිසාය. එය කුමක් වුවත්, ඔබ ඒ කෙරෙහි අවධානය යොමු කළ යුතුයි. අම්බත්ථ සිතන්නේ ඔහු හොඳින් පුහුණු වූ අයෙකු ලෙසයි. නමුත්, සැබැවින්ම

[12] M.I,401.

ඔහුගෙන් පිළිබිඹු වන්නේ පුහුණුවේ අඩු බවක්ය. එයට එකම හේතුව තාරුණ්‍යයේ අත්දැකීම් නැති බවයි.''[13]

මේ අවස්ථාවේදී තරුණයා කෝපයට පත් වූ අතර, ඊට පසුව, බුදුපියාණන් වහන්සේගේ ගෝත්‍රය සහ ශාක්‍යයන් හෙළා දැක්කේය. මෙම ආතතිය ඇති කරන හුවමාරුව, බුදුපියාණන් වහන්සේ අම්බත්ථගේ පවුල මිශ්‍ර කුලයක් බව පෙන්වා දෙනතුරු දිගටම පැවතුණි. එය ඔහු නොදත්, සංවේදී නොවූ හෝ සමහර විට ඒ වනතෙක් දැන නොසිටි දෙයක් විය. ඔහු නිහතමානී වූ පසු, ඔවුන් අතර, දීර්ඝ සහ ඵලදායී සාකච්ඡාවක් පැවතුණි. [14]

හැඳින්වීම් සහ කෙටි සාකච්ඡා අවසන් වූ පසු, බුදුපියාණන් වහන්සේ සමග කතා කරන්නේ කවුරුන්ද යන්න මත පදනම්ව, ආගන්තුකයාගෙන් බුදුපියාණන් වහන්සේ ප්‍රශ්න අසන ලදී. නැතහොත් ඔවුන් බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න අසන ලද අතර, උන්වහන්සේ ඒවාට පිළිතුරු දුන්හ. සාමාන්‍යයෙන් උන්වහන්සේගේ ධර්මයේ යම් කරුණක් පිළිබඳව විස්තරාත්මකව විස්තර කිරීමට අවස්ථාව ලබා ගනිමින් උන්වහන්සේ එසේ කළහ. කිසියම් විෂයයක් පිළිබඳව වඩා විස්තරාත්මක පැහැදිළි කිරීමක් කිරීමට පෙර, උන්වහන්සේ බොහෝ විට, එය ආරම්භ කරන්නේ, සංවාදයේ යෙදෙන්නාගේ පූර්ණ අවධානය ඉල්ලා සිටිමිනි. ඒ ''සවන් දෙන්න, අවධානය යොමු කරන්න, මම කතා කරන්නෙමි,'' පවසමිනි. [15] අනෙක් අවස්ථාවල, ඔවුන් ධර්මයට කුළුපග යැයි උන්වහන්සේ තීරණය කළහොත්, උන්වහන්සේ මූලික දේ (අනුපුබ්බිකථා) පිළිබඳව සාකච්ඡාවක් කරනු ඇත. එනම්, උන්වහන්සේගේ ධර්මයේ ගැඹුරු කරුණු ඉදිරිපත් කිරීමට පෙර, පරිත්‍යාගශීලීත්වය, සදාචාරය, දිව්‍යලෝකය සහ ඉඳුරන් පිනවීමෙන් ඇතිවෙන අවාසි සහ ඒවා මැඩපවත්වා ගන්නේ කෙසේද යනාදිය පැහැදිලි කිරීමෙනි.

සංවාදයේ යෙදෙන්නාගේ පැත්තෙන් අදහස් පළ කිරීමේදී යම් ලැජ්ජාශීලී බවක් හෝ පැකිළීමක් තිබේ නම් ඒවා මැඩපවත්වා ගැනීම පිණිස, බුදුපියාණන් වහන්සේ ඉඳ හිට ඔවුන් දිරිමත් කිරීම සඳහා ඔවුන් අසන්නට ඉඩ තිබෙන ප්‍රශ්ණයක් පිළිබඳව වර්ණනා කිරීමක් සිදු කළහ. ''හොඳයි, හොඳයි! ඔබේ බුද්ධිය අති විශිෂ්ටයි, ඔබේ ප්‍රශ්න කිරීමත් එසේමයි. ඔබේ ප්‍රශ්නය හොඳ එකක්.''[16] එවැනි ධෛර්යවත් කිරීමකින් අදහස් වන්නේ ප්‍රශ්න සහ මත ප්‍රකාශ කිරීම් එන්නට පටන් ගැනීම, සංවාදයේ යෙදෙන්නන්ට ඔවුන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබීම සහ බුදුපියාණන් වහන්සේට උන්වහන්සේගේ පිළිතුරු ඔවුන්ගේ අදහස් සැළකිල්ලට ගනිමින් විධිමත්ව සකස් කිරීමට අවස්ථාව ලැබීමයි. නොවැළැක්විය හැකි ලෙස, එවැනි පෙරට පස්සට සම්බන්ධ වැඩසටහනක

[13] D.I,90.
[14] On the mixed caste Ambasṭhas in Brahmanical/Hindu law see *Manusmṛti* X, 8-13; 13-15.

[15] A.IV,429.
[16] A.II,177.

අවසානයේ බුදුපියාණන් වහන්සේ සාකච්ඡා කරනු ලබන ඕනෑම විෂයයක් පිළිබඳව උන්වහන්සේගේ යථා දර්ශය සම්පූර්ණයෙන්ම පැහැදිලි කරනු ඇත. උන්වහන්සේගේ සමහර තනි කතා මුළුමනින්ම දීර්ඝ විය. ඒවා සාමාන්‍යයෙන් ආචාරශීලී ආකාරයෙන් පවත්වන ලදී. කලාතුරකින් පමණක් උණුසුම් විය, උදාහරණ වශයෙන්, අම්බත්ථ, අස්සලයන සහ චන්කී සමග ඇති වූ සාකච්ඡා වශයෙනි. [17]

බුදුපියාණන් වහන්සේ බොහෝ විට උපමා කතා (උපමාකථා) හෝ උපමා (උපමා) උන්වහන්සේගේ කතාවලදී භාවිත කළහ.[18] උන්වහන්සේගේ ධර්මයේ සමහර කරුණු ඉදිරිපත් කිරීමේදී උන්වහන්සේ සමහර විට එකතු කර ඇත : ''මම ඔබට උපමාවක් දෙන්නෙමි. එයට හේතුව බුද්ධිමත් මිනිස්සු උපමාවකින් වඩා හොඳට අවබෝධ කර ගනිති.'' එසේ කියමින් උන්වහන්සේ එසේ කරති. බුදුපියාණන් වහන්සේගේ උපමා සහ උපමා කතා සියල්ල කිසිවකුත් ගණන් කර නැත. නමුත්, අවම වශයෙන් සිය ගණනක් ඇත. ස්වභාවික සංසිද්ධිවල සිට සංචාරය, ගම්බද ජීවිතය, භූදර්ශන, ව්‍යාපාර, සත්ත්ව හීලෑව, රාජකීයත්වය, ලෝහ විද්‍යාව, ගෘහ භාණ්ඩ සහ රාජකාරී වැනි විවිධ අංගයන් ඒවායින් කිහිපයක් දක්වා විවිධාකාර වූ අංගයන් මත පදනම් වේ. නමුත් ඒ ස්වල්පයකි. ඒවායේ අනගි බව, විවිධත්වය සහ තාත්විකත්වයෙන් නිර්මාණශීලී සන්නිවේදකයෙකු සහ පුළුල් අත්දැකීම් ඇති සුපරික්ෂාකාරී නිරීක්ෂකයෙකු හඟවයි. මෙය පැහැදිලි කිරීමට ගංගාවක ප්‍රතිමූර්තිය භාවිත කරමින් ඇති උදාහරණ තුන ප්‍රමාණවත් වේ.

මේවායෙන් වඩාත්ම ජනප්‍රිය එකක් වන්නේ පාරුව පිළිබඳ උපමා කතාවයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය ප්‍රධාන වශයෙන් අතිශය ප්‍රායෝගික අර්ථයෙන් දුටුවේ, නිශ්චිත ඉලක්කයක් සපුරා ගැනීම සඳහා භාවිත කළ දෙයක් ලෙසය. එනම්, රහත්ඵලයට පැමිණීමෙන් පසු, අනවශ්‍ය දෙයක් වේ. උන්වහන්සේ අදහස් කළ දේ පැහැදිලි කිරීමට මිනිසෙකු ගමනක් යන විට පුළුල් ගඟකට පැමිණීම සහ ඔහුගේ පැත්තේ ගම භයානක බවත්, අනෙක් පැත්ත ආරක්ෂිත බවත් දැනගනිමින්, අනෙක් පැත්තට එගොඩ වීමට තීරණය කළේය. තොටුපළක් හෝ පාලමක් නොමැති නිසා, ඔහු තණකොළ, ශාක පත්‍ර සහ අතු රාශියක් එකැණින් සකසා ඔහුගේ අත් සහ පාද භාවිත කරමින් ගඟේ ඉවුර තෙක් හබල් ගෑවේය. මෙසේ සිදු කර පාරුව කෙතරම් ප්‍රයෝජනවත් වී ඇත් දැයි සිතමින්, එය තම හිස මත ඔසවා තබා, ගමනේ ඉතිරි කාලය සඳහා එය රැගෙන යාමට තීරණය කළේය. ඊට පසු එම මිනිසා කළ දේ බුද්ධිමත් ක්‍රියාවක් යැයි සිතනවාද යන්න බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ භික්ෂූන්ගෙන් ඇසූහ. එය එසේ නොවේ යැයි ඔවුහු පැවසූහ. ඊට පසු බුදුපියාණන් වහන්සේ මෙසේ කියමින් එය තීන්දු කළහ: ''ශ්‍රමණයෙනි, ධර්මය පාරුවකට සමාන යැයි ඔබ අවබෝධ කළ විට, ඔබ (අවසානයේ)

[17] D.I,87ff; M.II,147 ff; M.II,163ff.
[18] S.II,114.

හොඳ ගති ස්වභාවයන් පවා අත්හරිනු ඇත. එසේ නම් නරක අයට තවත් කොපමණ තිබේද?''[19]

වෙනස් කරුණක් පැවසීමට වුවත්, ගඟක් තරණය පිළිබිඹු කිරීම සඳහා භාවිත කළ උපමාවන්ගෙන් එකක් මෙයයි. වරක් එක් මිනිසෙක් ස්වයං-අත්තකිලමථය තුළින් විමුක්තිය ලැබිය හැකි යයි කියන දේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ සිතන්නේ කුමක්ද කියා විමසුවේය. එයට පිළිතුරු දෙමින් උන්වහන්සේ මෙසේ පැවසූහ:

> ''ගඟක් තරණය කිරීමට අවශ්‍ය මිනිසෙකු පොරවක් ගෙන, වනාන්තරයට ගොස්, නොමේරූ ගැට නැති ඍජු ගසක් කපා දැමිය යුතු යැයි සිතමු. ඔහු ගසේ මුදුන කපා දමයි, පත්‍ර සහ අතු ඉවත් කරයි, ගසේ කොටය පොරවෙන් හැඩගස්වයි, වෑයකින් පෙනුම සකස් කරයි, සූරනයකින් එය මටසිලුටු කරයි. ඊට පසු කැටයම් කළ ගල් බෝලයකින් ඔප දමයි. එසේ කිරීමෙන් පසු, ගඟ හරහා එතර වෙයි. ඔබ සිතන්නේ කුමක්ද?

ගඟ තරණය කිරීමට ඔහුට හැකි වේද?'' මිනිසා පිළිතුරු දුන්නේය: ''නැත ස්වාමීනී, ඔහුට නොහැකි වේ. එයට හේතුව ලී කොටය පිටතින් හොඳින් හැඩ දමා තිබුණත්, ඇතුළත පිරිසිදු කර නැත.'' බුදුපියාණන් වහන්සේ එකඟ වූ අතර, ඊට පසු පැවසුවේ, කෙනෙකු මානසික පවිත්‍රතාවයන් වැඩිදියුණු කරමින්''ඇතුළත පිරිසිදු කර නැතිනම්, ඔහුට හෝ ඇයට රහත්ඵලය ලැබිය නොහැකි බවය. [20]

මෙම තුන්වන ගංගාවක උපමාව බුදුපියාණන් වහන්සේ භාවිත කර ඇත්තේ සාමාන්‍ය තත්ත්වයෙන් පවතින ගැටලු දැකීමට මිනිස් සංහතියට උපකාර කිරීම සඳහා උන්වහන්සේගේ කාර්යභාරය පැහැදිලි කිරීමටයි.

> ''අලංකාර, අතිශය ප්‍රසන්න ගංගාවක් සහ එක් මිනිසෙකු එය දියවැලකින් රැගෙන යන ආකාරය ගැන සිතා බලන්න. ඊට පසු, ප්‍රත්‍යක්ෂ කර ගත හැකි මිනිසෙකු ගං ඉවුරේ සිටගෙන සිටිමින් එය දැක 'ඒයි, සර්, ගඟට තවත් පහළින් වේගවත් ජලපහර සහ සැර දිය සුළි, කිඹුලන් සහ භූතයන් සිටී. ඔබ එහි ගියහොත්, ඔබට මරණය හෝ මාරාන්තික වේදනාවෙන් දුක් විඳීමට සිදුවෙනු ඇතැයි' කියන්නේ යැයි සිතා බලන්න. මෙය ඇසූ විට, ගඟේ සිටින මිනිසා ඔහුගේ අත් සහ පාදවලින් දියවැලට එරෙහිව වෙහෙසෙනවා ඇත.''

බුදුපියාණන් වහන්සේ ඊට පසු, පැහැදිලි කළේ, උපමාවේ සෑම අංගයක්ම ආධ්‍යාත්මික ජීවිතයේ අංගයක් නියෝජනය කරන බවයි. උදාහරණ වශයෙන්, ගඟ තණ්හාව සඳහා, දියවැලට එරෙහිව අත්හැරීම සඳහා

[19] M.I,134-5.
[20] A.II,201.

වෙහෙසෙයි. ගං ඉවුරේ සිටින ප්‍රත්‍යක්ෂ කර ගත හැකි මිනිසා තමා වෙනුවෙන් අත්හැරීම සඳහා වෙහෙසෙයි.[21]

ඉගැන්වීම සඳහා බුදුපියාණන් වහන්සේගේ ප්‍රවේශයේ එක් අංගයක් සඳහන් වන්නේ කලාතුරකිනි - ඒ එහි ඇති මෘදු හාස්‍යජනක බවයි. උන්වහන්සේගේ දේශනා සහ සාකච්ඡා දෙපිට කැපෙන වැකිවලින් පිරුණු, හාස්‍යජනක අතිශයෝක්ති, වචන හරඹ, ව්‍යංග සහ ඉඳහිට උපහාසය යනාදියයි. මේ කිසිවක් කොක්හඬ ලෑම හෝ මෝඩ විහිළු නොවේ. නමුත්, එයින් සමහරක් සිනහවක් ඇති කිරීමට හේතු විය හැකිය. අවාසනාවට, බොහෝදුරට, මෙම හාස්‍යය නූතන පාඨකයාට නොපෙනේ. ඇමෙරිකානු ජාතික ඨනිස්සරෝ භික්ෂුව මෙසේ ලියති :

> ''ධර්ම ග්‍රන්ථ නාමාවලියේ හාස්‍යය හඳුනා ගැනීමට නොහැකි වී ඇති එක් හේතුවක් නම්, එහි ශෛලියයි - බොහෝ විට සියුම්ය, හැඟීම් තොර වේ. ශුෂ්කය. හාස්‍යයේ මෙම ශෛලිය කලින්ම විහිළු ටෙලිග්‍රාෆ් කරන, සහ හාස්‍යය පුළුල් ලෙස මෙහෙයැවෙන නූතන සංස්කෘතියේ පාඨකයන් පසුකොට කෙළින්ම යා හැකිය. තවත් හේතුවක් නම්, උද්ධෘතයක් හාස්‍යජනක යැයි අදහස් කිරීම පරිවර්තකයන්ට බොහෝ විට මග හැරෙයි. ඒ නිසා, එය ඒකාන්ත, පොතේ දැනුම සහ තාක්ෂණික දැනුම හිසින් ගනිමින් ඉදිරිපත් කර ඇත.''[22]

එක් භාෂාවකින් තවත් භාෂාවකට පරිවර්තනය කිරීමේදී, ග්‍රන්ථයක සඳහන් හාස්‍යය රඳවා ගැනීම කිසි විටක පහසු නොවේ. නමුත්, මෙය සහ බුදුපියාණන් වහන්සේගේ ලෝකය සහ අපගේ ලෝකය අතර ඇති භාෂාමය සහ සංස්කෘතමය වෙනස්කම් සැලකිල්ලට ගනිමින් උන්වහන්සේගේ හාස්‍යයන් සමහර විට බැබළෙන්නට පුළුවනි.

වරක්, අජාසත්තු රජ බුදුපියාණන් වහන්සේ හමුවීමට ගොස්, උන්වහන්සේගෙන් විමසුවේ, මෙහි හා දැන් දැකිය හැකි පැවිදි ජීවිතයේ ඇති ප්‍රයෝජනයක් පැවසිය හැකිද යන්නයි. රජු හරියටම මෑතකදී තම පියා ඝාතනය කර ඇති අතර, ඒ ගැන වැඩි වැඩියෙන් පසුතැවෙන බවක් දැනෙන්නට පටන් ගෙන තිබේ. තමන් තම පුතාට භයානක ආදර්ශයක් දුන් බව ඔහු සිතන්නට පටන් ගත්තා විය හැකිය. රජුගේ එක් වහලෙකු පැන ගොස් භික්ෂුවක් බවට පත් වී, පසුව පලා ගිය තැනැත්තා ඉන්නේ කොහේ ද යන්නත් දැනගතහොත්, රජු කරන්නේ කුමක්ද යන්න බුදුපියාණන් වහන්සේ විමසූහ. රජු භික්ෂුව සිරභාරයට ගෙන නැවත වහල්භාවයට ගන්නේද කියා බුදුපියාණන් වහන්සේ විමසූහ. ''නැත'' රජු පිළිතුරු දුන්නේය. ''ඊට ඉඳුරාම වෙනස්ව, මම ඔහු වෙනුවෙන් නැගිට, ආචාර කර, ඔහුට දානය පිරිනමමි.'' බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ:

---

[21] It.114.

[22] Thanissaro, p. 5, also de Silva, p.29 ff.

''හොඳයි බලන්න, භික්ෂුවකගේ ජීවිතයේ එක් වාසියක් මෙතැන, දැන් දැකිය හැකිය.''[23] බැරෑරුම් ප්‍රශ්නයකට ලැබුණු මෙම අනපේක්ෂිත හාස්‍යජනක පිළිතුර පළමුව රජු පුදුමයට පත් කරන්නට ඇත. නමුත් පසුව ඔහු සිනහසුනේය. බුදුපියාණන් වහන්සේ රජුගේ මනෝභාවය සැහැල්ලුවට පත් කර, ඔහුට සහනයක් ලබා දී, ඔහුගේ ප්‍රශ්නයට වඩා බැරෑරුම් ලෙස පිළිතුරු දෙන්නට පටන් ගත්හ.

යම් විශේෂ ආකාරයකින් සිතීමෙන් ගැටලුවක් විසඳිය නොහැකි හෝ බරක් දරාගත නොහැකි යයි එම අවස්ථාවල පෙනේ නම්, එවිට කළ යුත්තේ විහිළුවක් කර, සමහර විට වෙනස් ආකාරයකින් ඒ දෙස බලා විසඳුමක් යෝජනා කිරීමයි. හාස්‍යයට මෝචනයක්, කාංසාව, ආතතිය හෝ බියෙන්, චිකිත්සක මුදා හැරීමක් ක්‍රියාත්මක කළ හැකිය. නොඑසේ නම්, කෙනෙකු අසහනයෙන් පිටතට ඔසවා තැබිය හැකිය. මෙම සිද්ධිය බුදුපියාණන් වහන්සේ කළ බවට උදාහරණයක් විය හැකිය.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්ම සන්නිවේදනය කළ වැදගත්ම ක්‍රමයක් වූයේ එකල පැවති අංගයක් වූ ප්‍රසිද්ධ විවාදවලට සහභාගී වීමයි. මෙම සිදුවීම් කොතරම් ජනප්‍රිය වූයේද යත්, ඒවා විශාල ජනකායක් ආකර්ෂණය කර ගත් අතර, සමහර නගර ඔවුන්ගේ සභාශාලා පවා ඒවා පැවැත්වීමට යොදා ගත්හ.[24] එම කාලයේම සහ පසුව, ත්‍රිපිටකය සහ වෙනත් ප්‍රභවයන් මෙම විවාදයන් පැවැත්වූ ආකාරය පිළිබඳව යම් අදහසක් ලබා දෙයි. තුන්වන වරටත් නීත්‍යානුකූල ප්‍රශ්නයක් ඇසූ විට, විරුද්ධවාදියෙකුට පිළිතුරු දිය නොහැකි වූයේ නම්, ඔහු පරාජයට පත් බවට සැලකේ. පිළිගත් තර්ක භාවිත කරමින් සහ පිළිගත් ක්‍රියා පිළිවෙත් අනුගමනය කිරීම සහභාගිවන්නන්ගෙන් අපේක්ෂා කරන ලදී.[25] මැදහත්වන්නෙක් (පඤ්හවීමංසකා) ඔවුන් එසේ කළ බව තහවුරු කිරීමට උත්සාහ කළේය. තවත් ප්‍රශ්නයක් අසමින් ප්‍රශ්නයක් මගහැරීම, විෂය මාරු කිරීම, සනාථ නොකළ ප්‍රකාශ කිරීම, අභියෝග කළ විට එය අතහැර දමා, ඊට පසු වෙනත් එකක් ගැනීම, ප්‍රශ්න කරන්නාට සමච්චල් කිරීම, නුසුදුසු යැයි සැලකේ. ඒ හා සමානවම, විරුද්ධවාදියෙකුට කෑගැසීම, ඔහු පසුබට වූ විට, ඔහු අල්ලා ගැනීම, හෝ ප්‍රේක්ෂකයන්ට මායිම් රේඛාවලින් බාධා කිරීම ද පිළිගත නොහැකිය.[26]

මෙම සිදුවීම්වල ජනප්‍රියතාවයෙන්, මහජන කරළිය තුළ තමන්ගේ ප්‍රස්තුතය ප්‍රවර්ධනය සහ ආරක්ෂා කර ගැනීමට නිපුණ පුද්ගලයන්ට ඉහළ යාමක් සිදුවුණි. එක් විශේෂ ජෛන භික්ෂුවක පිළිබඳව විස්තර කරනු ලැබුවේ, ''විවාද කරන්නෙකු, දක්ෂ කථිකයෙකු, මහජනතාව විසින් බොහෝ සෙයින් ඇගයීමට ලක් කළ අයෙකු'' ලෙසයි.

---

[23] D.I,51-61. For more examples see Gombrich, 2009, pp.183-192.
[24] See Prets, 2000.
[25] M.I,231.
[26] M.II,168; A.I,197-199.

මෙම හමුවීම්වලට සහභාගීවූ අනෙක් අය මෙන්ම ඔහු ද ඔහුගේ අතිශයෝක්තියෙන් දක්වන සහ තාර්කික හැකියාවන් විදහා දක්වමින් නිමග්න විය. වරක් ඔහු මෙසේ ප්‍රකාශ කළේය :''මා සමග විවාදයක යෙදෙන ඕනෑම නිකායක හෝ තරාතිරමක, කිසිම සාමණයෙකු හෝ බ්‍රාහ්මණයෙකු, කිසිම නායකයෙකු හෝ ගුරුවරයෙකු, ආධ්‍යාත්මිකව සම්පූර්ණවූ හෝ රහත්ඵලයට පැමිණි බව කියන අය ඇතුළුව, වෙවුලන්නේ සහ සැලෙන්නේ නැති, බියෙන් ගැහෙන්නේ නැති සහ කිහිළිවලින් ඩහදිය නොගලන පුද්ගලයෙකු මම නොදකිමි.'' බෞද්ධ භික්ෂුවක් සමග කළ සාකච්ඡාවකින් පසු, බුදුපියාණන් වහන්සේ හමුවීමට සූදානම් කර ගැනීමෙන් අනතුරුව, ඔහු ලිච්ඡවීන්ගේ විශාල රැස්වීමක් ඉදිරියේ මෙම පුරසාරම දෙඩුවේය:

> ''අද මා සහ ගෞතමයන් වහන්සේ අතර යම් සාකච්ඡාවක් තිබෙන්නට නියමිතයි. මා ඉදිරියේ ඔහු ඔහුගේ අදහස් තරයේ දරා සිටින්නේ නම්, හොඳින් දන්නා ඔහුගේ ශ්‍රාවකයෙකු වන අස්සජි භික්ෂුව මීට පෙර ඔහුගේ අදහස් දරා සිටියේ කෙසේද? ඊට පසු ශක්තිමත් මිනිසෙකු ලෝමවලින් අවුල්වූ බැටළුවකු අදින්නා මෙන් එහාට සහ මෙහාට, මේ අතට, අර අතට මට ඔහු ඇදගෙන යා හැකිය. ඒ අනුව වාදයේදී, මම සමණ ගෞතමයන් වහන්සේ එහාට මෙහාට සහ මේ අතට, අර අතට ඇද ගෙන යමි.'[27]

සච්චක බුදුපියාණන් වහන්සේ හමුවට ගියේ කුමක් සිදුවේ දැයි බැලීමට උනන්දු වූ ලිච්චවී පිරිසක් පසුපසින්ය. සාකච්ඡාව ඉතා සුහදව ආරම්භවූ නමුත්, සච්චකගේ ප්‍රකාශයන් පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ නිරීක්ෂණයසච්චකටම පරස්පරවී අවසානයේ ඔහුටම නිශ්ශබ්ද වීමට සිදු විය. ත්‍රිපිටකයට අනුව අවසානයේ ඔහු බෞද්ධ ශ්‍රාවකයෙකු බවට පත් වී ඇත. ඉන් අනතුරුව ඔහු පිළිබඳව තොරතුරු දැනගන්නට නැත.

ජයග්‍රහණය පතා මාර්ග ගත ප්‍රසිද්ධිය සහ අනුග්‍රහය සහ ශ්‍රාවකයන් ආකර්ෂණය කර ගැනීමේ හැකියාව ඇති, ප්‍රයෝග භාවිතය සහ මුළා කිරීමට යොමු වූ වාදකරුවෝ සූදානම්ව සිටියහ. හමුවීමකට පෙර, වාදයට සහභාගිවන්නෙකු විරුද්ධවාදියා අවුල් කිරීම සඳහා තම ආධාරකරුවන් සමග නොමග යවන තර්ක සහිත ප්‍රශ්න හෝ ද්විත්ව ගැටලු (උභතෝකෝටිකං පඤ්හං) සිතීමට කුමන්ත්‍රණය කළ හැකිය. [28] එක් බෞද්ධ භික්ෂුවක වූ ශාක්‍ය හත්ථක ජයග්‍රහණය කිරීම සඳහා හෝ අවම වශයෙන් ජයග්‍රාහී පෙනුම ලබා දීමට වංචනික උපක්‍රම භාවිත කිරීමට විරුද්ධ නොවීය. [29] එක් හමුවීමකදී නරක අතට හැරීම නිසා, ඔහු එම විරුද්ධවාදියා නැවත දෙවන වටයක් සඳහා නිශ්චිත වේලාවක සහ

[27] M.I,227-228.
[28] M. I, 392-3; S.IV,323.
[29] A.V,229.

ස්ථානයකදී හමුවීමට කටයුතු සූදානම් කළේය. ළඟදීම සිදුවන්නට නියමිත මෙම සිද්ධිය පිළිබඳව ප්‍රචාරය කිරීමේදී, සම්පූර්ණයෙන්ම වෙනස් ස්ථානයක් සහ කාලයක් ඒ සඳහා නියම කරමින්, විරුද්ධවාදියාට එතැනට එන්නට නොහැකි වූ විට, ඔහුගේ විරුද්ධවාදියා සැබැවින්ම ඉදිරිපත් වීමට බිය වූ බවට උදම් ඇනුවේය. මෙම වංචාව පිළිබඳව හත්ථකගෙන් අනෙක් භික්ෂූන් විමසූ විට ඔහු තමන් සාධාරණීය කර ගත්තේ මෙසේය: ''වෙනත් අදහස් ඇති මෙම වෙනත් නිකායන්වල අනුගාමිකයන් කුමන ආකාරයකින් හෝ පරාජය කළ යුතුයි. ජයග්‍රහණය ඔවුන්ට නොදිය යුතුයි.'' බුදුපියාණන් වහන්සේ මෙය දැනගත් විට, හත්ථකට ඔහුගේ වංකභාවය පිළිබඳව දැඩි ලෙස දෝෂාරෝපණය කළහ.[30]

සමහර ගුරුවරුන් ප්‍රසිද්ධියේ නින්දාවට පත්වනු ඇතැයි බියෙන් වාද විවාදවලින් වැළකී සිටියත්, තමන් පිළිබඳව වටහා දීමට බලයෙන් යොමු කරන්නේ නම්, ඔවුන් මඟහරින ප්‍රකාශයන් වෙත යොමුවන බවත්, ඒ අතර ආඳා වගේ ලිස්සල යන බවට නම් දරාගත් (අමරාවික්ඛේපික) අය කිසිම විශේෂිත ස්ථාවරයකට යමක් පැහැදිලිව සඳහන් කිරීමකට තමන්ටම ඉඩ නොසලසන බව බුදුපියාණන් වහන්සේ අවධානයට ගත්හ.[31] බුදුපියාණන් වහන්සේගේ කාලයේදී සිටි ඉන්දියානු ගුරුවරු පැරණි ඇතන්ස් හි එම කාලයේම සිටි ඔවුන්ගේ සමකාලීනයන් මෙන්ම කෙස් පැළෙන ආකාරයේ විවාදශීලී, සියුම් සහ විනිවිදයනසුළු අය වූහ.

විවාදයක සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය සැමවිටම රඳා පවතින්නේ කෙනෙකුගේ ප්‍රත්‍යයේ අවංක භාවය හෝ කෙනෙකුගේ තර්කවල තර්කනය මත නොව, ප්‍රේක්ෂකයන්ගේ ආකල්පය මතය. සැම විටම මැදහත්වන්නෙකු නොසිටි බැවින්, යම් කෙනෙකු ඉහළටම ඒම තීරණය කළේ ප්‍රේක්ෂකයන්ගේ ආකල්පය මත විය හැකිය. ව්‍යාජ ධර්මයකට අනුබල දෙන ප්‍රමුඛයෙකුට සප්‍රමාණ තර්ක භාවිත කරන විරුද්ධවාදියෙකු නිශ්ශබ්ද කළ හැකි වුවත්, ප්‍රේක්ෂකයන් තවදුරටත්, ඝෝෂාකාරී ලෙස ශබ්ද කරමින් ඔහුට සහාය දැක්විය හැකි බව බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්හ: ''බුද්ධිමත් මිනිසා වන්නේ ඔහුය.!''[32] අනෙක් අතට, ගුරුවරයෙකුගේ අතිශයෝක්තියකින් දක්වන කුසලතාව සහ ඔහුගේ තර්කවල ශක්තිය පිළිබඳව ප්‍රේක්ෂකයන් අගය කරන්නේ නම්, එය ඔහු ප්‍රසංශාවට ලක් කර පරාජිතයා සමච්චලයට ලක් කරනු ඇත. බුදුපියාණන් වහන්සේ සමග පැවැත්වෙන විවාදයක් අවසානයේදී සහභාගිවන්නා පිළිබඳව විස්තරයක් කරයි. ''නිශ්ශබ්දතාවට බරව, ඔහුගේ හිස පහත්වී, ඔහුගේ පහතට හෙළූ දෑස්, පරාජිත ලෙස, පිළිතුරක් දිය නොහැකිව'' මේ අතර ප්‍රේක්ෂකයෝ

---

[30] Vin.IV,1-2.
[31] D.I,24-5.
[32] A.V,230-1. In later centuries being defeated in state sponsored debates could result in exile or even death. In the case of debates held in royal courts it was often the whim of the king or his personal belief that decided the outcome. See Verardi, pp. 25-26, 205-207, 218-219, etc.

''සෑම පැත්තකින්ම ප්‍රචණ්ඩ  දෝෂාරෝපණ ධාරාවක් සමගින් ඔහුට සමච්චල් කළහ...'[33]

මේ සියලු විවාද හුදෙක් දක්ෂ ලෙස බොරු තර්ක ගෙන හැර පෑමක් හෝ බුද්ධිමය විනෝදාස්වාදයේ අභ්‍යාස පමණක් බව කිව නොහැකිය; ඒවාට සහභාගී වූ බොහෝ දෙනෙක් සත්‍යය පැහැර ගැනීම සඳහා අනෙක් අයට විරුද්ධ තමන්ගේ අදහස් පරීක්ෂා කිරීමට අව්‍යාජ උනන්දුවක් දක්වයි. අවම වශයෙන් මෙම සිද්ධීන්වලට සහභාගීවූවන්ගෙන් සමහරෙකු විනෝදවීමට පමණක් අවශ්‍ය නොවූ, ඒවා පිළිබඳව බුද්ධිමත් උනන්දුවක් දැක්වූ බව කේසපුත්ත නගරයේ මිනිසුන් බුදුපියාණන් වහන්සේ එහි වැඩම කළ අවස්ථාවකදී ඔවුන් උන්වහන්සේගෙන් ඇසූ ප්‍රශ්නවලින් හැඟී යයි.

> ''බුදුපියාණන් වහන්ස, සමහර සාමණයෝ සහ බ්‍රාහ්මණයෝ කේසපුත්ත නගරයට පැමිණ ඔවුන්ගේම ධර්මය ප්‍රකාශයට පත් කරති, පැහැදිලි කරති. ඊට පසු අනෙක් අයගේ ධර්මය විවේචනය කරති, අප්‍රසාදයට ලක් කරති, සමච්චලේට ලක් කරති, අනෙක් ධර්මවල අත්තටු කපා දමති. ඊට පසු වෙනත් සාමණවරු සහ බ්‍රාහ්මණයෝ පෙර පුද්ගලයන් කළ දේම කරති. මෙම ගෞරවනීය සාමණවරුන්ගෙන් කවරෙකු සත්‍යය කතා කරන්නේද සහ අසත්‍ය කතා කරන්නේද  යන්න පිළිබඳව අපට සැකයක් ඇත.''[34]

බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ මෙම ජනතාවගේ ව්‍යාකූලත්වය තමන් වහන්සේ වටහාගෙන ඇති බවත්, හෙළිදරව් කිරීම් පිළිබඳ ප්‍රකාශවලින් නොමඟ නොයන ලෙසත් පවසමින්ය; එනම්, ගුරුවරයාගේ පෙළපත, ධර්ම ග්‍රන්ථ පිළිබඳ අධිකාරයට ආයාචනා කිරීම්, ඕපදූප, ව්‍යාජ තර්ක, හෝ ගුරුවරයා ප්‍රසන්න වීම නිසා, නොව ඔවුන්ගේ අත්දැකීම් සහ දැණුම, ප්‍රඥාවන්තයන්ගේ අදහස් සැලකිල්ලට ගනිමින් සිදු කළ යුතු බවත්ය.[35]  මෙම දේශනයේ කොටස්වල අර්ථය අපැහැදිලිය. එම නිසා මම එවැනි තැන්වල ඒවා බැහැර කර ඇත්තෙමි.

වාදවිවාද උණුසුම් විය හැකි අතර, සමහර විට ප්‍රේක්ෂකයන් අතර, ප්‍රධාන තරගකරුවන් හෝ පුද්ගලයන් අතර පවා, දැඩි ප්‍රහාර හුවමාරුවීම් ඇති විය හැකිය. ඒ නිසා බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ප්‍රගමනයේ මුල් අවධියේදී එවැනි එක්රැස්වීම් මඟහැරියහ. උන්වහන්සේ නිරීක්ෂණය කළහ :''සමහර වාදවිවාද පවත්වන්නේ එදිරිවාදිකම් සහිත භාවාර්ථයෙනි. සමහර ඒවා සත්‍යය පදනම් වූ භාවාර්ථයෙනි. දෙකේම මුනිවරයෙකු සම්බන්ධ නොවිය යුතුයි.''[36]  විපාකයක් වශයෙන්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ දර්ශනය සියුම්ව පිරික්සීමේදී එය රැක ගැනීමට

[33] A.I,187.
[34] A.I,188-189.
[35] A.I,188-189. The meaning of parts of this discourse is unclear, and I have excluded them.
[36] Sn.780. The *Caraka Saṃhitā* mentions and describes both these types of debates, see Prets p.371-373.

නොහැකිවූ බවට මුලදී චෝදනා එල්ල විය. එක් විවේචකයෙක් උන්වහන්සේ පිළිබඳව මෙසේ පැවසුවේය:

> ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ කතා කරන්නේ කා සමගද? උන්වහන්සේ ප්‍රඥාවේ පැහැදිලි බව ලබා ගන්නේ කාගෙන්ද? උන්වහන්සේගේ ප්‍රඥාව හුදෙකලාවේ ජීවත්වීමෙන් විනාශ වී ඇත. උන්වහන්සේ සාකච්ඡාවලට පුරුදු නැත. උන්වහන්සේ කතාවේ දක්ෂ නැත. උන්වහන්සේ සම්පූර්ණයෙන්ම නුහුරුය. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ දාර වටේ කැරකෙන සහ ලංවන කුරංගයෙකු වැනිය.''[37]

දීර්ඝ කාලයක් තිස්සේ බුදුපියාණන් වහන්සේ ධර්මය ගැන කථා කිරීමට ඉඩ හැරීමෙන් පමණක් සෑහීමට පත් වූ නමුත්, මිනිස්සු ඒ පිළිබඳ ගැඹුරු පැහැදිලි කිරීම් සොයන්නට පටන් ගත්හ. ධර්මය විවේචනයට සහ වැරදි ලෙස නිරූපනය කරන්නට පවා පටන් ගත් හෙයින්, බුදුපියාණන් වහන්සේට ප්‍රසිද්ධ වාදවිවාද සහ සාකච්ඡාවලට සහභාගී වන්නට සිදුවිය. උන්වහන්සේගේ ධර්මය ඉතා පැහැදිලි අයුරෙන් තේරුම් කිරීම සහ විවේචනයට හානිපූරක වශයෙන් ඵලදායී අයුරෙන් ධර්මය රැකීම සම්බන්ධයෙන් ඉමහත් කීර්තියක් බුදුපියාණන් වහන්සේට ලැබුණි. උන්වහන්සේ අන් අයගේ ධර්මවල ඉගැන්වීම් ද දැඩි ප්‍රශ්න කිරීම්වලට ලක් කළහ. උන්වහන්සේගේ විවේචකයන්ගේ සැක නිරුද්ධ කිරීමෙහිලා සහ ඔවුන් උන්වහන්සේගේ ශ්‍රාවකයන් බවට පත් කිරීමේත් කෙතරම් සාර්ථක වූවේ ද කිවහොත්, එසේ කිරීමට ගුප්ත උපක්‍රම භාවිත කරන බවට ද ඔවුහු සැක කළහ. [38]

වාදවිවාද හෝ එකින් එක සංවාදයක යෙදීමෙන් බුදුපියාණන් වහන්සේ බලාපොරොත්තු වූයේ කිසි විටකත් විරුද්ධවාදියෙකු පරාජය කිරීම, විවේචකයෙකු නිශ්ශබ්ද කිරීම හෝ ශ්‍රාවකයන් දිනා ගැනීම හෝ නොව, මිනිසුන් නොදැනුවත්කමේ සිට පැහැදිලි බව සහ අවබෝධය කරා යොමු කිරීමටයි. මෙම කරුණ උන්වහන්සේ බොහෝ විට අවධාරණය කළහ: '' සැබැවින්ම, යහපත් සාකච්ඡාව දැනුමේ සහ නිශ්චිතභාවයේ අරමුණ සඳහා'' සහ නැවතත්: ''ආධ්‍යාත්මික ජීවිතය ජීවත් වන්නේ වාදවිවාද ජයග්‍රහණය... සඳහා නොවේ. ඊට වඩා, එය ජීවත් වන්නේ සංයමය, අත්හැරීම, නොඇලීම සහ නැවතීම යන අරමුණු සඳහාය.''[39]

බුදුපියාණන් වහන්සේ මෙතෙක් කළ හෘදයාංගම ආයාචනයකින් උන්වහන්සේ මෙසේ පැවසූහ:

> ''මම ඔබට මෙය කියමි. බුද්ධිමත්, හිතවත්, අවංක සහ ඍජු පුද්ගලයෙකු මා වෙත පැමිණුනහොත්, මම ඔහුට ධර්මය

[37] D.III,38.
[38] M.I.381
[39] A.I,199; II,26.

> උගන්වන්නෙමි. ඔහු ඔහුට ඉගැන්වූ ආකාරයට පුහුණු වන්නේ නම්, දින හතක් ඇතුළත ඔහුගේම දැනුමෙන් සහ ප්‍රායෝගික බුද්ධියෙන්, පූජනීය ජීවිතයට සහ අරමුණට පත්වෙයි. මා මෙසේ කියන්නේ හුදෙක් ශ්‍රාවකයන් දිනා ගැනීමට හෝ ඔබ ලවා ඔබේ සිරිත් අතරමං කිරීමට යැයි දැන් ඔබ සිතන්නට පුළුවනි. නමුත් එය එසේ නොවේ. ඔබේ ගුරුවරයා තබාගෙන ඔබේ සිරිත් අනුගමනය කිරීම දිගටම කරගෙන යන්න. මා මෙසේ කියන්නේ ඔබගේ ජීවන ක්‍රමය අත්හරවන්නට, ඔබ අයහපත් යැයි සලකන දේ අනුගමනය කරන්නට හෝ ඔබ යහපත් යැයි සලකන දේ ප්‍රතික්ෂේප කරන්නට යැයි ඔබ සිතන්නට පුළුවනි. නමුත් එය එසේ නොවේ. ඔබ යෝග්‍ය යැයි දකින ආකාරයට ජීවත් වන්න, ඔබ අයහපත් යැයි සලකන දේ ප්‍රතික්ෂේප කරන්න, යහපත් යැයි සලකන දේ අනුගමනය කරන්න. නමුත්, අයෝග්‍ය, දූෂණයවූ, නැවත ඉපදීමට මෙහෙයවන, බියකරු, ශෝකය ඇති කරවන සහ උත්පත්තිය, දිරාපත්වීම සහ මරණය හා සම්බන්ධ තත්ත්වයන් ඇත. මා උගන්වන්නේ මේ දේවල් මැඩපවත්වා ගැනීම සඳහා පමණි.''[40]

වාදවිවාදවලට සහභාගි වීම සහ පුද්ගලයන් හෝ කුඩා කණ්ඩායම් සමග සාකච්ඡා කිරීම හැර බුදුපියාණන් වහන්සේ ඉඳහිට මිනිසුන් විශාල ප්‍රමාණයකටත්, සමහර විට උන්වහන්සේට සවන් දීම සඳහා විශේෂයෙන් එක්රැස් වූ සිය ගණනකටත් (අනේකසත) දේශනා සිදු කළහ. මෙම ප්‍රසිද්ධ ධර්ම දේශනා සංවිධානය කරන්නට ඇත්තේ උන්වහන්සේගේ බැතිමතුන් විය යුතු වන අතර, පූර්ව ප්‍රචාර ද කරන්නට ඇත. එවැනි එක් දේශනයකට සහභාගී වූ එක් පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේ වදාළ දේ කෙරෙහි දැඩි අවධානයෙන් වාඩිවී සිටින මෙතරම් විශාල ජනකායක් කෙතරම් නිශ්ශබ්දව සිටිය හැකිද යන්න පිළිබඳව සිය ප්‍රසාදය පළ කළේය.

> ''වරක් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ සිය ගණනක් ශ්‍රාවකයන්ට ධර්මය උගන්වමින් සිටියදී එක් පුද්ගලයෙකු කැස්ස අතර, තවත් කෙනෙකු ඔහුගේ දණහිසෙන් ඔහු තල්ලු කර මෙසේ කීවේයඃ 'ෂූ! ශබ්ද නොකරන්න!, බුදුපියාණන් වහන්සේ අපට ධර්මය උගන්වති.' ඉතින්, බුදුපියාණන් වහන්සේ සිය ගණන් මිනිසුන්ට උගන්වන විට කහින්නේ නැත, උගුර පාදන්නේ නැත, ඒ ශ්‍රාවකයන් එහි රැඳෙන්නේ මහත් කැමැත්තෙන් නිසාය.''[41]

සකුලුදායින් බුදුපියාණන් වහන්සේට මහත් ගෞරවයක් දැක්වූ පුද්ගලයෙකි. උන්වහන්සේ කතා කරන විට ඔහු සහ සභාවේ සිටි අනෙක් අය උන්වහන්සේගේ මුහුණ දෙස දෑස් යොමු කරමින්ම වාඩි වී සිටින බව පැවසුවේය.[42] මෙයින් අදහස් කරන්නේ බුදුපියාණන් වහන්සේගේ ශාරීරික පෙනුම නිසා ප්‍රේක්ෂකයන් ආකර්ෂණය වූ බවක් නොව, ඊට වඩා විශාල

---

[40] D.III, 55-6, condensed.
[41] M.II,4-5, condensed.
[42] M.II,30.

පිරිසක් අතර, සැමවිටම පවසන දේ ඇසීම පහසු නොවන නිසා, බුදුපියාණන් වහන්සේගේ දෙතොල් කියවීමෙන් පහසුවක් ඇතිවීමටයි.

සාහිත්‍යමය නිර්මාණ විය නොහැකි, බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් සහ සාකච්ඡාවල යෙදී සිටීම් පිළිබඳ කෙටි විසිතුරු රචනා ඇතැම් විට ත්‍රිපිටකය පුරා විසිරී ඇත. එවැනි හමුවීම්වලදී බුදුපියාණන් වහන්සේ සැබැවින්ම හැසිරුණු ආකාරය පිළිබිඹු වේ. උදාහරණ වශයෙන්, විශාල ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ තිබූ වාදවිවාදයකදී, බුදුපියාණන් වහන්සේගේ සංවාදකයා අවධාරණය කර සිටියේ පුද්ගලයෙකුගේ ශරීරය සහ මනස ඔහුගේ සැබෑ ආත්මය බවයි. මෙම අදහස බුදුපියාණන් වහන්සේගේ අවබෝධයට අනුව සම්පූර්ණයෙන්ම පටහැනිය. ඔහු සැබෑ ලෙස එය විශ්වාස කරන්නේද කියා බුදුපියාණන් වහන්සේ විමසූ විට තරගකරුවා මෙසේ පිළිතුරු දුන්නේය: ''විශ්වාස කරන්නේ මා පමණක් නොව, මෙම විශාල පිරිසම විශ්වාස කරති.'', සමහර විට ප්‍රේක්ෂකයන්ගෙන් සමස්ත ප්‍රතිචාරයක් ලැබීමට ඉඟියක් පළ කරමිනි. බහුතර අදහස සඳහා කළාවූ මෙම ඇයදීම බුදුපියාණන් වහන්සේට ආකර්ෂණය වූයේ නැත. උන්වහන්සේ ප්‍රතිචාර දැක්වූහ: ''මෙයින් මෙම විශාල පිරිසට කරන්නට ඇත්තේ කුමක්ද? ඔබ විශ්වාස කරන දෙයට සීමා වන්න!''[43] තමන්ගේ ආගමෙන් ඉගැන්වූ දේවලට අනුව, තම කුලය උසස් බවත්, අනෙක් කුලයන් බ්‍රාහ්මණවරුන්ට සේවය කිරීමට බැඳී සිටින බවත් බ්‍රාහ්මණ 'එසුකාරී' විශ්වාසයෙන් බුදුපියාණන් වහන්සේට පැවසුවේය. මෙම උඩඟුකම බුදුපියාණන් වහන්සේ බොරු කළේ මෙසේ අසමින්ය: ''මුළු ලෝකයම මෙම බ්‍රාහ්මණ එසුකාරී සමග එකඟ ද?'' මෙයින් සම්පූර්ණයෙන්ම ව්‍යාකුල වූ 'එසුකාරී'ට එය එසේ නොවන බව පිළිගැනීමට සිදු විය.[44] බුදුපියාණන් වහන්සේ සමග උන්වහන්සේගේ මැදිහත්කරු පළමුව එක් දිශාවකටද, ඊට පසු ඊට විරුද්ධ දිශාවටද නැවත නැවත මාර්ගයේ භාගයක් දුරට යන විට, එක් භික්ෂුවක බුදුපියාණන් වහන්සේට විරුද්ධ වන බව පෙනී ගිය හෙයින්, බුදුපියාණන් වහන්සේ වහා මෙසේ කියමින් යමක් ඔහුට පෙන්වා දුන්හ: ''අග්ගිවෙස්සන, ප්‍රවේසමින්, ඔබ පිළිතුරු දෙන ආකාරය පිළිබඳව හොඳින් සිතා බලන්න. ඔබ පෙර කී දෙය, පසුව පැවසූ දෙයට එකඟ නොවේ, පසුව ඔබ පැවසූ දෙය ඔබ පෙර කී දෙයට එකඟ නොවේ.''[45]

බුදුපියාණන් වහන්සේගෙන් ප්‍රශ්න අසනු ලැබීම සහ ඒවාට මෘදු ලෙස පිළිතුරු දෙනවා වෙනුවට, වාදයක් මගහැරීම හෝ සැබෑ වැදගත්කමක් නැති කාරණයක් පිළිබඳව මතයක් පළ කිරීම සඳහා ඒවා නොතකා හරිමින් පසෙකට දැමීම හෝ මඟහරින යමක් පැවසීම සඳහා ඕනෑ තරම් උදාහරණ ඇත. පුරාණ කස්සක සහ මහාවිහාර යන ගුරුවරු දෙදෙනාම සර්වඥ යන

---

[43] M.I,230.
[44] M.II,178.
[45] M.I,232.

බව කියා සිටින නමුත්, ඒ දෙදෙනාම, උගන්වන්නේ විශ්වයේ ස්වභාවය පිළිබඳව වෙනස් දෙයක් බව 'ලොකායට' බ්‍රාහ්මණයා වරක් බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: ''ඔවුන්ගේ කියමන පරස්පර වන නිසා, සත්‍යය සහ බොරුව කතා කරන්නේ කව්ද?'' බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''ඒ ඇති, ඒක එහෙම තිබුණාවේ!. මම ඔබට ධර්මය කියා දෙමි.''[46] තවත් බ්‍රාහ්මණයෙකු වරක් උන්වහන්සේට සඳහන් කළේ සතුන් බිලි පූජාවට ලක් කිරීමෙන් විශාල ආධ්‍යාත්මික ප්‍රතිලාභ ලැබෙන බව තමා අසා ඇති බවත්, බුදුපියාණන් වහන්සේ මේ පිළිබඳව උන්වහන්සේගේ මතය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරන බවත්ය. උන්වහන්සේ සැබැවින්ම සිතූ දේ පැවසුවහොත්, බ්‍රාහ්මණයා කලබල වනු ඇතැයි බුදුපියාණන් වහන්සේ අවබෝධ කරගත් නිසා, හුදෙක් පැවසුවේ තමන්වහන්සේද මෙම කියමන අසා ඇති බවයි. බ්‍රාහ්මණයා මෙම නිශ්චිත මතයක් පළ නොකළ ප්‍රතිචාරය එකඟතාවක් අර්ථකථනය කරමින්, සතුටු සිතින් මෙසේ ප්‍රකාශ කළේය: '' මේ කාරණය සම්බන්ධයෙන් යහපත් ගෞතමයන් වහන්සේ සහ මම එකඟ වෙමු.'' ආනන්ද හිමියන් මෙම හමුවීම නරඹමින් සිටියහ. ගැටලුව දැක ආනන්ද හිමියෝ බ්‍රාහ්මණයන්ට තමා ඇසූ දේ නොකියන ලෙසත්, කළ යුත්තේ බුදුපියාණන් වහන්සේගෙන් බිලිපූජාවක් පැවැත්විය යුතු හොඳම ක්‍රමය කුමක් දැයි විමසීම බවත් යෝජනා කළහ. බ්‍රාහ්මණයා එසේ කළේය. සත්‍යය මග හැරීමට මගක් නොදකිමින්, බුදුපියාණන් වහන්සේ පැවසුවේ, බිලි පූජා ගිනි ඇවිළීමට හෝ පූජා කණුව ඉහළට එසවීමට පෙර පවා, කෙනෙකු තමාට ඍණාත්මක ප්‍රතිවිපාක ඇති කරගෙන ඇති බවත්ය. එයට හේතුව මෙම චාරිත්‍රයේ සම්පූර්ණ චේතනාව වන්නේ ප්‍රාණ ඝාතනය නිසා බවයි. ඊට පසුව බුදුපියාණන් වහන්සේ පැවසුවේ, බිලි පූජා ගින්දර තුන දැල්වීම වෙනුවට කළ යුතු වඩාත් ධානාත්මක දෙය නම් ගිනි තුන නිවා දැමීම බවයි - ඒ ලෝභය, වෛරය සහ මෝහයයි. (ලෝභ, දෝෂ සහ මෝහ) [47] වෛදික බිලි පූජා ගිනි තුන - සමග තුන් ආකාර ප්‍රධාන මානසික ප්‍රතිෂේධන වන ආහවනීය, ගාර්හපතිය, සහ දක්ෂිණාග්නි, අතර ඇති වෙනස බුදුපියාණන් වහන්සේ මෙහි සහ වෙනත් ස්ථානවල දක්වා ඇත.

බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ වඩාත් දක්ෂ ක්‍රමවලින් එකක් නම් මුලින් පිළිගත් මතයක් හෝ පුහුණුවක් පිළිබඳව කළ ප්‍රකාශයක් සමග එකඟ වීමය. නමුත්, ඊට පසු, උන්වහන්සේගේ දර්ශනය ගැලපෙන පරිදි නැවත නිර්වචනය කිරීමය. උන්වහන්සේ බ්‍රාහ්මණීය යෙදුම් සමගද එසේ කළහ. ඒවා භාවිත කළ නමුත්, වෙනස්, සාමාන්‍යයෙන් සදාචාරමය අර්ථයන් දුන්හ.

[46] A.IV,428-429. *Lokāyata* was a branch of Brahmanical learning although exactly what, is disputed. It is mentioned at D.I,11; I,114; S.II,77; Vin.II,139, etc.See Rhys Davids, 1899, pp.166 ff and Jayatilleke, pp. 49 ff and 89 ff.
[47] A.IV,41-42.

උදාහරණ වශයෙන්, බ්‍රාහ්මණවරුන් ගෞරවයට පාත්‍රවීමට සුදුසු යැයි උන්වහන්සේ එකඟ වූ නමුත්, උන්වහන්සේ සහ ශ්‍රාවකයන් ''සැබෑ බ්‍රාහ්මණ''යන් වීමට සුදුසු බවයි. ඒ ඔවුන් ආදර්ශවත් ජීවිත ගත කළ නිසා මිස, බ්‍රාහ්මණ කුලයේ ඉපදුණු නිසා නොවන බවයි. උන්වහන්සේ බ්‍රාහ්මණයෙකු ලෙස සැලකීමට සුදුසු සියලු ගුණාංග ගණනය කළ නමුත්, ඒ කිසිවක බ්‍රාහ්මණ කුලයේ උපත ලැබීම, වේදය සජ්ඣායනය කිරීම, පූජා හෝ චාරිත්‍රානුකූල සේදීම සිදු කිරීම ඇතුළත් නොවේ. [48] ඒ හා සමානවම, ගුණධර්ම සහ ප්‍රතිපත්ති නොමැති පුද්ගලයා සැබෑ පහත් කුලයේ මිස, කුල ක්‍රමයෙන් නම් කරන ලද අයෙකු නොවේ.[49] සිගාල නමැති තරුණයා තම පියා මිය යන විට දිසා හයට වඳින ලෙස කළ ඉල්ලීමට අනුව, සිදු කරන බව බුදුපියාණන් වහන්සේට පැවසූ විට, උන්වහන්සේ පැවසුවේ තමන්වහන්සේද ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ දිසාවන්ට වැඳීමට බවත්, නමුත්, වෙනත් ආකාරයකින් බවත්ය. උන්වහන්සේගේ ධර්මයට අනුව, එක් එක් දිසාවන් වෙනුවෙන් - දෙමව්පියන්, කලත්‍රයා, මිත්‍රයන්, ගුරුවරුන්, සේවකයන්, පූජ්‍ය පක්ෂය - යන සම්බන්ධතා අනුව, කෙනෙකු ඔවුන්ට 'වැඳිය යුත්තේ' ඔවුන්ට ගෞරවයෙන් සහ කරුණාවෙන් සැලකීමෙන් බව බුදුපියාණන් වහන්සේ පැහැදිලි කළහ. [50] රජයේ අමාත්‍යවරයෙකු බුදුපියාණන් වහන්සේට පැහැදිලි කළේ ශ්‍රේෂ්ඨ මිනිසෙකු වන්නේ (මහා පුරිස) එවකට ලැයිස්තු ගත කළ යම් නිශ්චිත ගුණාංග ඇති අය යැයි ඔහු සැලකූ බවයි. ඒවා බොහොමයක් ලෞකික කෞශල්‍යයන්ය. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: ''මම ඔබගේ ප්‍රකාශයට එකඟවන්නේ හෝ එකඟ නොවන්නේ ද නැත.'' ඊට පසු උන්වහන්සේ ශ්‍රේෂ්ඨ මිනිසෙකු වීමට සුදුසුකම් ලෙස සලකන බවට, වෙනස්, සහ වඩා ආධ්‍යාත්මික කෞශල්‍යයන් යෝජනා කළහ. [51]

ඉතා දුර්ලභ අවස්ථාවන්හිදී බුදුපියාණන් වහන්සේ ප්‍රශ්න කරන්නාට නිශ්ශබ්දතාවෙන් ප්‍රතිචාර දැක්වූහ. ඉතා දුර්ලභ අවස්ථාවන්හිදී දුර්බෝධ නිශ්ශබ්දතාවක් පවත්වා ගැනීම බුදුපියාණන් වහන්සේගේ උගැන්වීමේ ශෛලියේ වැදගත් කරුණක් බවත්, උන්වහන්සේගේ වඩාත් ගැඹුරු සැඟවුණු ඇත්ත දැකීමේ හැකියාව සම්ප්‍රේෂණය කිරීමට භාවිත කළ තාක්ෂණයක් බවත්, සිත්ගන්නා අයුරින් ජනප්‍රිය සහ ශාස්ත්‍රීය ලේඛකයන් පවා අතිශයෝක්තියෙන් සඳහන් කර ඇත.[52] බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්දතාව ධෛර්යමත් කළේ බොහෝ විට සමාජ සන්දර්භයක් තුළ සිදු වන කෝපය හෝ ප්‍රකෝප කිරීම් හමුවේ නිෂ්ඵල කතාබහට විකල්පයක් ලෙස මිස අවංක සහ අර්ථවත් ප්‍රශ්නවලට ප්‍රතිචාරයක් ලෙස නොවේ. [53] සත්තකින්ම, සුළු හෝ අදාළ නොවන ඒවා ලෙස උන්වහන්සේ සැලකූ

---

[48] Dhp.396-423.
[49] Sn.116-134.
[50] D.III,180 ff. On the different ways of and reasons for worshipping the directions, see e.g. *Bṛhadāraṇyaka Upaniṣad* 3.7,10 and *Chāndogya Upaniṣad* 1.3, 11;5.6; 5.20,2. Sigāla was probably worshipping the directional gods as advocated at *Gautama Dharmasūtra* 5,11.
[51] A.II,35-36.
[52] On the Buddha's supposed silence, see Dhammika, 2018d,pp.85-89.
[53] M.I,161; S.I,162.

ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම බුදුපියාණන් උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහ. නමුත්, සැමවිටම එසේ කිරීමට උන්වහන්සේගේ හේතු පැහැදිලි කළහ. උන්වහන්සේගේ දීර්ඝ ප්‍රගමනය තුළදී දෙවරක්, ප්‍රශ්නයක් ඇසූ විට, උන්වහන්සේ පිළිතුරු නොදුන්හ.

වරක් උත්තිය තවුසන් බුදුපියාණන් වහන්සේගෙන් විමසුවේ ධර්මය අනුගමනය කිරීමෙන් උත්පත්තිය, මරණය සහ නැවත ඉපදීම යන අඛණ්ඩව සිදු වන ක්‍රියාවලියෙන් කී දෙනෙකු නිදහස් වේ ද යන්නයි. ''මුළු ලෝකයම සංසාරයෙන් ඉවත් වේද, එයින් හරි අඩක් හෝ තුනෙන් එකක් ඉවත් වේද?'' බුදුපියාණන් වහන්සේ නිශ්ශබ්ද විය. සිදුවෙමින් පවතින දේ නිරීක්ෂණය කළ ආනන්ද හිමියන් උත්තිය තවුසාගේ සිත තුළ බුදුපියාණන් වහන්සේ ඔහුගේ ප්‍රශ්නයෙන් ව්‍යාකූල වී ඇතැයි යන හැඟීමක් ඇති වේ යැයි සිතමින් බුදුපියාණන් වහන්සේ වෙනුවෙන් පිළිතුරක් දීමට ඉදිරිපත් වූහ. ඇත්ත වශයෙන්ම, රහත්ඵලයට පත්වූවන්ගේ සංඛ්‍යාව අදාල නොවන බවත්, වැදගත් වන්නේ ඔවුන් එය කළ ආකාරය බවත්, ඒ උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කිරීමෙන් බවත් ආනන්ද හිමියෝ පැවසූහ.[54]

තවත් අවස්ථාවක වච්ඡගොත්ත නම් තවුසා බුදුපියාණන් වහන්සේගෙන් මෙසේ ඇසූහ: ''ආත්මයක් තිබේද?'' බුදුපියාණන් වහන්සේ පිළිතුරු නොදුන්හ. වච්ඡගොත්ත තවදුරටත් මෙසේ ඇසුවේය: ''එසේ නම් ආත්මයක් නැද්ද?'' නැවතත්, බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාරයක් නොදැක්වූහ. මෙයින් සමහර විට කෝපයට හෝ කලකිරීමට පත්ව, වච්ඡගොත්ත නැගිට ගියේය. ආනන්ද හිමියන් මෙම ප්‍රශ්නවලට නිශ්ශබ්දතාව දැක්වූයේ ඇයි දැයි බුදුපියාණන් වහන්සේගෙන් ඇසූ විට, උන්වහන්සේ පිළිතුරු දුන්හ:

> ''ආත්මයක් තිබේද කියා ඇසූ විට 'ඔව්' යැයි මා පිළිතුරු දුන්නේ නම්, මා සදාකාලීත්වය උගන්වන එම ගුරුවරුන්ගේ පැත්ත ගත්තා වෙන්නට ඉඩ තිබුණි. 'නැත' යනුවෙන් මා පිළිතුරු දුන්නේ නම්, උච්ඡේදවාදී ගුරුවරුන්ගේ පැත්ත ගත්තා වනු ඇත. මා 'ඔව්' යනුවෙන් පිළිතුරු දුන්නේ නම්, මේ සියල්ල ආත්මයක් නැති බව දැන ගැනීමට අනුකූල වනු ඇත්ද?''
>
> ''නැත ස්වාමීනී'' ආනන්ද හිමියෝ පිළිතුරු දුන්හ.
>
> ''මා 'ආත්මයක් නැතැයි යන්නට පිළිතුරු දුන්නේ නම් දැනටමත් ව්‍යාකූලවී ඇති වච්ඡගොත්ත ඊටත් වඩා අවුල් වී 'මීට පෙර මට ආත්මයක් තිබුණි, දැන් මට එය නැතැ'යි සිතනු ඇත.''[55]

[54] A.V,193-195.
[55] S.IV,400.

මෙම සිද්ධියේදී වච්ඡගොත්තට පසුබිම පිළිබඳව දැනුමක් නැතැයි හෝ සමහර විට ආත්මයක් නැතැයි (අනත්ත) යන ධර්මය අවබෝධයට බුද්ධිය ඇත්තේ නැතැයි සිතමින් පිළිතුරක් දීම ප්‍රතික්ෂේප කරන්නට ඇත.

භාෂාව භාවිත කරන ආකාරය වරදවා වටහාගැනීම්වලට තුඩු දිය හැකි බව බුදුපියාණන් වහන්සේ සම්පූර්ණයෙන්ම සිහි කල්පනාවෙන් යුක්ත වූහ. උන්වහන්සේ තමන්වහන්සේගේ ප්‍රශ්න ප්‍රකාශයට පත් කිරීමේදී සහ වෙනත් අය ඔවුන්ගේ ප්‍රශ්න උන්වහන්සේට ප්‍රකාශ කරන ආකාරය පිළිබඳවත් සැලකිලිමත් වූහ. වරක් උන්වහන්සේ ජීවියෙකු ජීවත් කරන පෝෂ්‍ය පදාර්ථ හතර වන - ද්‍රව්‍යමය ආහාර, ස්පර්ශය, මානසික චේතනාව, සහ විඥානය පිළිබඳ ධර්මය භික්ෂූන් කණ්ඩායමකට උගන්වමින් සිටියහ. එක් භික්ෂුවක් මෙසේ ඇසුවේයඃ ''විඥානය යන පෝෂ්‍ය පදාර්ථය කවුරු පරිභෝජනය කරන්නේද?'' මෙසේ ප්‍රශ්න සැකසූ විට, ප්‍රශ්නය වස්තුවක ආත්මයක පැවැත්මක් අඟවයි. බුදුපියාණන් වහන්සේ වහා ප්‍රතිචාර දැක්වූහඃ ''එය වලංගු ප්‍රශ්නයක් නොවේ. මා කියන්නේ නැහැ 'කෙනෙකු පරිභෝජනය කරයි කියා'... නමුත්, කෙනෙකු මගෙන් මෙසේ ඇසුවොත්, 'විඥානයෙන් තත්ත්වාරෝපිත වී කුමක් පැන නගින්නේ ද?' එවිට එය වලංගු ප්‍රශ්නයක් වේ.''[56]

සාමාන්‍යයෙන් බුදුපියාණන් වහන්සේ අන් සමග ඍජු ලෙස කතා කරන ආකාරය, එනම්, ඇසූ ප්‍රශ්න සහ ඒවාට නිරවද්‍යව පිළිතුරු දුන් ආකාරය සියුම් ලෙස විමසා බැලීමේදී, බුදුපියාණන් වහන්සේ කෙසේ නමුත්, කරුණාවන්ත සංවාදකයෙකු ද විය. මෙයට කදිම නිදසුනක් නම්, උන්වහන්සේ ආනන්ද හිමියන් සහ සඞගාරව නම් බ්‍රාහ්මණයා අතර පැවති තුන් ආකාර සාකච්ඡාවයි. සාකච්ඡාව ඉදිරියට යද්දී ආනන්ද හිමියන් සඞගාරමගෙන් ඇසුවේ, ඔහු කලින් කී දේ වැරදි යැයි පිළිගැනීමකින් තොරව පිළිතුරු දිය නොහැකි බවයි. එබැවින් ඔහු විෂය වෙනස් කළේය. කෙසේ වෙතත්, ආනන්ද හිමියන් සඞගාරාම තවදුරටත් අපහසුවට පත්කරමින් ඔහුගේ ප්‍රශ්නය අසමින් සිටියහ. සඞගාරාම අපහසුවෙන් සිටිනු දැකීමෙන් ඔහු ගැන අනුකම්පා කරමින් බුදුපියාණන් වහන්සේ කතාවට බාධා කරමින් රාජාංගනයේ රාත්‍රියේ සිදුවූයේ කුමක් ද කියා ඇසූහ. මහත් අස්වැසිල්ලක් ලැබූ සඞගාරාම බුදුපියාණන් වහන්සේගේ ප්‍රශ්නයට පිළිතුරු දුන් අතර, ඉඟිය ලැබීමෙන්, ආනන්ද හිමියෝ ඔහුගේ ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට පෙරැත්ත කිරීම නැවැත්වූහ.[57] මෙම සිද්ධියෙන් පෙන්නුම් කරන්නේ අවහිරයක් ඉවත් කිරීමට තිබූ බුද්ධ හැකියාවයි. ඒ පමණක් නොව, විශේෂයෙන් ආචාරශීලී සහ අව්‍යාජ මැදිහත්කරුවෙකු සමග තර්කයක් දිනා ගැනීම සැමවිටම අවශ්‍ය නොවන බව උන්වහන්සේගේ ආකල්පය විය.

[56] S.II,13.
[57] A.I,168-170.

බුදුපියාණන් වහන්සේ යම් උගත් සහ ජ්‍යෙෂ්ඨ බ්‍රාහ්මණයන් සමග කතා කරමින් සිටින විට, ඔවුන්ගෙන් එක් තරුණ සාමාජිකයෙක් බාධා කරමින් සිටියේය. මෙය දිගින් දිගටම සිදු වූ විට, බුදුපියාණන් වහන්සේ තරුණයා වෙත හැරී: ''ජ්‍යෙෂ්ඨ බ්‍රාහ්මණවරුන් සමග පවත්වන මෙම කතාවට බාධා කිරීම නවත්වන්න. එය අවසන් වනතුරු සිටින්න.'' යැයි පැවසූහ. එක් බ්‍රාහ්මණයෙකු ඔහු ආරක්ෂා කරමින් මෙසේ පැවසුවේය : ''යහපත් ගෞතමයන් වහන්ස, තරුණ ශිෂ්‍ය කාපඨිකට දෝෂාරෝපණය නොකරන්න. ඔහු බුද්ධිමත් සහ උගත් කුලයේ සාමාජිකයෙකි. ඔහු හොඳින් කතා කරයි. ඔහු ඔබවහන්සේ සමග පැවැත්වෙන මෙම සාකච්ඡාවට සහභාගීවීමට තරම් මනා දක්ෂ පුද්ගලයෙකි.'' බුදුපියාණන් වහන්සේ තරුණයා වරදවා වටහාගෙන ඇති බව අවබෝධ කර ගත් අතර, ටික වේලාවකට පසු ඔහුගෙන් ප්‍රශ්නයක් ඇසූහ. ඊට පසු එම සාකච්ඡාවට ඔහුද ඇතුළත් කර ගත්හ.[58]

බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණවාදයේ සමහර අංග අගය කර ප්‍රශංසා කළ ද, එහි තවත් කොටස් උන්වහන්සේ විවේචනය කළ අතර, ඒවායෙන් දෙකක් ඉගැන්වීමට සම්බන්ධ විය. බ්‍රාහ්මණවාදයේ ස්වභාවය කෙතරම් ද යත්, එහි පූජකයන්වූ බ්‍රාහ්මණයන්, බෞද්ධ භික්ෂූන් වහන්සේලා, ක්‍රිස්තියානි දේවගැතිවරුන් හෝ යුදෙව් ගුරුවරුන් සෑම විටම ඔවුන්ගේ ආගම්වලින් කළ ආකාරයට, වෛදික ආගමේ ගිහියන්ට උපදෙස් දුන්නේ නැත. ඊට වඩා, ගිහියන් හුදෙක් අක්‍රීය නරඹන්නන් වූ අතර, බ්‍රාහ්මණවරුන් ඔවුන්ගේ සේවය සඳහා ගාස්තු අය කිරීමෙන් බැහැරව ජීවත් වූහ. ඔවුන්ගේ ඉගැන්වීමේ කාර්යභාරය වූයේ බ්‍රාහ්මණ තරුණයන් වෛදික ගීතිකා සජ්ඣායනය කිරීමට සහ මතක තබා ගැනීමට සහ විවිධ චාරිත්‍ර ඉටු කළ යුතු ආකාරය පුහුණු කිරීමයි. ශිෂ්‍යයන්ගේ අධ්‍යාපනය අවසන් කිරීමෙන් පසු, ගුරුවරයාගේ අය කිරීම යනුවෙන් හැඳින්වූ මුදල් (ආචරියධන) එකතු කිරීමට සිදු විය.[59]

මෙම ක්‍රමයේ බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළ අංශ තුනක් තිබූ අතර, එනම්, චාරිත්‍ර ඉටු කිරීම සඳහා මුදල් අය කිරීම, ශිෂ්‍යයන් පුහුණු කිරීම සඳහා මුදල් අය කිරීම, සහ වේදය රහසිගතව තබා ගැනීමයි. ඒවා බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය සමග වෙනස පෙන්වා දුන්හ. ඈත අතීතයේදී වේදය පළමු කුල තුනට පමණක් වෙන්වුණි. ඊනියා දෙවරක් උපන්, දාසයන්, හරිජනයන් සහ ආගන්තුකයන්ට ගීතිකා සජ්ඣායනයට සවන් දෙන්නට අවසර නොතිබුණි. නමුත්, බුදුපියාණන් වහන්සේගේ කාලයට බොහෝ ප්‍රථමයෙන් බ්‍රාහ්මණයන් වේදයට තනි අයිතියක් ලබාගෙන තිබූ අතර, ඒවා කොටස් වශයෙන් රහසිගතව තබා ගෙනද ඇත. අඩු කුලයේ අය ඒ අතරදී සජ්ඣායනය කළහොත් හෝ ඔවුන්ට ඒවා ඇසුනොත්, ඒවා අපිරිසුදු වේ යැයි ඔවුහු විශ්වාස කළහ.

[58] M.II,168-169.
[59] Upaniṣadic teachers demanded high feesfor the knowledge they imparted, see Black, pp. 112-113.

එසේම, ඔවුන්ගේ ආදායම රඳා පවතින්නේ ඔවුන් පිළිබඳ ඔවුන්ගේ සුවිශේෂ වූ දැනුම මතයි.

ධර්මය ඉගෙන ගැනීමට හෝ ඇසීමට යම් කෙනෙකුට මුදලක් ගෙවිය යුතුය යන අදහස බුදුපියාණන් වහන්සේට පිළිකුලකි. උන්වහන්සේ මෙසේ පැවසූහ:'' යම් කෙනෙකු ධර්මයෙන් ව්‍යාපාරයක් කිරීමට නොයා යුතුය.''[60]

උන්වහන්සේ සත්‍යය ත්‍යාගයක් ලෙස, සැලකූහ. එය වෙළඳ භාණ්ඩයක් නොවේ. එසේම, ධර්මය තනි කණ්ඩායමකට පමණක් සීමාවිය යුතුය යන අදහස උන්වහන්සේට ඒ හා සමානවම පිළිකුලක් විය. උන්වහන්සේ ඉගැන්වූ සත්‍යයන් සැමට තේරුම්ගත හැකි, සියල්ලන්ටම අදාළ වන සහ සියල්ලන්ටම ලබා ගත හැකි විය යුතුයි. උන්වහන්සේ මෙසේ පැවසූහ :''කාරනා තුනක් රහසිගතව නොව, විවෘතව බැබළේ. කුමන තුනද? සඳෙහි කක්ෂය, සූර්යයාගේ කක්ෂය සහ ධර්මය සහ තථාගතයන් වහන්සේ විසින් ඉගැන්වූ පුහුණුවයි.''[61] තමන්වහන්සේ ධර්මය රහසිගත බව සහ විවෘත බව (අනන්තරං අබාහිරං) අතර ප්‍රභේදයක් නොමැතිව ප්‍රකාශ කර ඇති බවත්, උන්වහන්සේ යම්කිසි දෙයක් නොදී තබා ගැනීමක්, ''ගුරු මුෂ්ටියක්'' (ආචරියමුට්ඨි) තබා නොගත් බවත් බුදුපියාණන් වහන්සේ එම කාරණයම නැවත නැවතත් පිරිනිවන් මංචකයේදී පවා අවධාරණය කළහ. [62] ඉගැන්වීමට සහ උන්වහන්සේ උගන්වන විට එයට අවධානය යොමු කිරීම හැර වෙනත් කිසිවක් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ගෙන් හෝ ප්‍රේක්ෂකයන්ගෙන් බලාපොරොත්තු නොවීය.[63] මේ සම්බන්ධයෙන්, උන්වහන්සේ උන්වහන්සේගේ ඉගැන්වීමේ ආචාරධර්ම ලෙස හැඳින්විය හැකි මූලධර්ම පහක් ඉදිරිපත් කළහ.

> ''අනෙක් අයට ධර්මය ඉගැන්වීම පහසු නැත. එනිසා, ඔබ උගන්වන විට පළමුව මෙම කාරණා පහ මෙසේ සිතමින් ඔබ තුළ ස්ථාපිත කර ගන්න. 'මම ක්‍රමානුකූලව උගන්වන්නෙමි. ඉලක්කය මනසේ තබාගෙන උගන්වන්නෙමි. මම කරුණාවෙන් උගන්වන්නෙමි. මම පෞද්ගලික ලාභ අපේක්ෂාවෙන් උගන්වන්නේ නැත. මම උගන්වන්නේ මගේම හෝ අන්‍යයන්ගේ අනර්ථය පිණිස නොවේ.' '' [64]

බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ පිළිබඳව පුදුමයට පත්වන කරුණක් නොවන, අසාමාන්‍ය ප්‍රකාශ කිහිපයක් සිදු කර ඇත. ඉතිහාසය පුරාම බොහෝ ආගම්වල හෝ ආගමික ව්‍යාපාරවල නිර්මාතෘවරුන් මෙය සිදු කර ඇත. ඒ උන්වහන්සේට ආශ්චර්යමත් බලයක් ඇතැයි යන්න, දෙවියන් සමග සන්නිවේදනය කිරීමට හැකිය යන්න, හෝ එසේම උන්වහන්සේ

[60] Ud.66.
[61] A.I,283.
[62] D.II,100. *Milindapañha*94 says that one of the marks of a genuine teacher is that he or she "keeps nothing secret and holds nothing back".
[63] A.V,347.
[64] A.III,184; see also A.III,196.

දෙවියෙකු යන්න යනාදියයි. බුදුපියාණන් වහන්සේගේ වැදගත්ම ප්‍රකාශය වූයේ, උන්වහන්සේ යථාර්ථයේ ස්වභාවයට බුද්ධත්වය ලැබුවේය යන්නයි. කෙසේ නමුත්, ආධ්‍යාත්මික අධිකාරිය සඳහා අනෙකුත් සියලුම සුදුසුකම්වලින් උන්වහන්සේ වෙන් කර තැබූ දෙය නම්, උන්වහන්සේ කෙරෙහි පූර්ණ විශ්වාසයක් සහ උන්වහන්සේ ඉගැන්වූ දේ ප්‍රශ්න කිරීමකින් තොරව පිළිගැනීමට උන්වහන්සේගේ අනුගාමිකයන්ට අවශ්‍ය නොවීමයි. ඇත්ත වශයෙන්ම, බුදුපියාණන් වහන්සේ මිනිසුන්ට ආරාධනය කළේ තමන්වහන්සේගේ ප්‍රකාශිත අත්පත්කරගත් දේ සත්‍යද නැද්ද යන්න හොඳින් පරීක්ෂා කර බලන තෙක් විනිශ්චයකට එළඹිය යුතු නැති බවයි.

බොහෝ මිනිසුන් මනස කියවන්නන් නොවන බව දැන සිටි බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේගේ අනුගාමිකයන් වීමට සිතන අයගෙන් ඉල්ලා සිටියේ පළමුව උන්වහන්සේ ඉගැන්වූ දෙය උන්වහන්සේගේ හැසිරීමට අනුකූල දැයි පරීක්ෂා කරන ලෙසයි. මෙසේ සිදු කරන අතරතුර, ඔවුන් උන්වහන්සේ පිළිබඳව කනට ඇසෙන දේ, උන්වහන්සේ සමහර විට පැවසූ හෝ පවසන ආකාරය පිළිබඳව ඔවුන් සමග කාලය ගත කරන අයගේ ප්‍රකාශද සැලකිල්ලට ගත යුතු බවයි. සාමාන්‍ය බුද්ධියෙන් උන්වහන්සේ පෙන්වා දුන්නේ ආගමික නායකයන්ට අවංකව එම කටයුතු පටන් ගත හැකි නමුත්, ක්‍රමයෙන් සාර්ථකත්වය සහ ප්‍රශංසාව ලැබීමෙන් පසු, දූෂිත විය හැකි බවත්, එනිසා උන්වහන්සේ පිළිබඳව පිරික්සුම කාලාන්තරයක් පුරා පැවතිය යුතු බවයි. ඊට පසු, උන්වහන්සේ පැවසුවේ ගුරුවරයෙකු පිරිසක් ඉදිරිපිටදී ඉතා ආකර්ෂණීය විය හැකි නමුත්, දර්ශනයෙන් පිටුපස ඊට හාත්පසින්ම වෙනස් විය හැකි බවත්, හැකි සෑම අවස්ථාවකදීම බුදුපියාණන් වහන්සේ පරීක්ෂා කළ යුතු බවත් එය සමාන බුද්ධියෙන් කළ යුතු නිරීක්ෂණයක් බවත් උන්වහන්සේ පැහැදිලි කළහ. සැබැවින්ම මෙය කිරීම පහසුය - එයට හේතුව 'පොදු' සහ 'පෞද්ගලික' වශයෙන් බුදුපියාණන් වහන්සේට නමක් නොමැති නිසාය. බුදු කෙනෙකු උරෙන් උර ගැටී සිටින සමීප ශ්‍රාවකයන් ඇතින් ඇසුරු කරයි. උන්වහන්සේ සම්පූර්ණයෙන්ම සහ සැමවිටම, උන්වහන්සේ හමුවීමට පැමිණෙන අයට හමුවීමට ඉඩ තිබුණි. යම් කෙනෙකු මෙම විමර්ශන සහ අනෙක් ඒවා පිළිබඳව විමසීම් සිදු කළේ නම්, උන්වහන්සේගේ හැසිරීම් -උන්වහන්සේ බුද්ධත්වයට පැමිණ ඇති බවට කරන ප්‍රකාශ සමග අනුකූල බව දකින්නට පුළුවන් බව උන්වහන්සේ විශ්වාස කළහ. උන්වහන්සේ පිළිබඳව ඔවුන් ඇති කර ගත් භක්තිය සහ විශ්වාසය සහ එහි ප්‍රතිඵලයක් ලෙස උන්වහන්සේ ඉගැන්වූ දේ වන්නේ: ''හේතු මත පදනම්වූ දැකීමෙන් ලබන අත්දැකීම්වලින් සහාය වන, ශක්තිමත් සහ නොසැලෙන...'' යන්නයි.[65]

[65] M.I, 317 ff.

# 7. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ එක් දිනක්

බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ සාමාන්‍ය දිනයක් කෙබඳු විය හැකිද යන්න පිළිබඳව යම් අදහසක් ලබා ගැනීමට ත්‍රිපිටකය ප්‍රමාණවත් තොරතුරු සපයයි. ඇත්ත වශයෙන්ම එය වර්ෂයේ විවිධ වේලාවන්හි වෙනස්වීමට ඉඩ තිබුණි. උදාහරණ වශයෙන්, වර්ෂා කාලයෙහි උන්වහන්සේ එකතැනක වැඩ සිටින විට, සහ වර්ෂයේ ඉතිරි කාලයේදී උන්වහන්සේ සංචාරය කරන විට, සහ උදාහරණ වශයෙන්, කාලයත් සමග උන්වහන්සේ තරුණ වියේ සිටින විට සහ වයසින් මුහුකුරා යන විට ආදී වශයෙනි. නමුත්, ඕනෑම දිනක පහත සඳහන් ලෙස ගණනය කර ඇති ක්‍රියාකාරකම් ඇතුළත් වනු ඇත.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සාමාන්‍ය උදෑසන චර්යාව විස්තර කළේ මේ ආකාරයටය.

> ''මම ගමකින් හෝ නගරයකින් යැපෙමින් වාසය කරන විට, උදෑසන සූදානම් වෙමි. මගේ සිවුරු සහ පාත්‍රය රැගෙන එම ගම හෝ නගරයට දානය පිණිස ඇතුළු වෙමි. ආහාර ගැනීමෙන් පසු, මම අසල පිහිටි වත්තකට ගොස්, තණකොළ හෝ කොළඅතු ගොඩක් ගසා, පාද හරහට තබා, කොන්ද ඍජුව තබමින් සිහිය පුබුදු කරගෙන ඉඳගනිමි.''[1]

මෙම උද්ධෘතයේ සඳහන් කරුණු තුන නම්, බුදුපියාණන් වහන්සේගේ ඇඳුම, උන්වහන්සේගේ ආහාර සහ ඒවා ලබා ගත්තේ කෙසේද, සහ උන්වහන්සේගේ භාවනාවයි. ඒ සෑම එකක්ම සවිස්තරාත්මකව පරීක්ෂා කිරීම වටී. බුදුපියාණන් වහන්සේගේ ඇඳුම වෙන් වූ රෙදි කැබලි තුනකින් සමන්විතය. ඍජුකෝණාශ්‍රාකාර රෙදි කැබැල්ලක් ඉණ වටා ඔතා පටියකින් ආරක්ෂිත කර තිබුණි. වම් උරහිස හරහා සහ දකුණු අත යටින් ආවරණය කර ඇති විශාල හතරැස් වස්ත්‍රයක් සහ ශීත ඍතුවේදී භාවිතය සඳහා දෙපට සිවුරක් තිබුණි. මෙම ඇඟලුම් තුන එකට මසන ලද රෙදි කැබලිවලින් නිමවා ඇත. මෙසේ කර ඇත්තේ ඒවායේ වටිනාකම අඩු වීමෙන් සොරකම් කිරීමේ සම්භාවිතාව අඩු වන නිසාය. ඒ සෑම එකක්ම තද දුඹුරු පැහැයට හෝ රතු - කහ පැහැයට වර්ණ ගන්වා තිබුණි. ඒ තුන එකට චීවර හෝ කාසාව යනුවෙන් හැඳින්වුණි. බුදුපියාණන් වහන්සේ විවිධ, දැඩි සේ හික්මීම අත්හදා බැලූ කාලයේදී සහ සමහර විට ඉඳහිට බුද්ධත්වය ලැබීමෙන් පසු ද ඉවත ලන රෙදි කැබලිවලින් සහ මාර්ගයෙන් අහුලා ගත් ඉරුණු රෙදි හෝ මිනී පිට්ටනිවලින් එකතු කරගත් රෙදි කැබලිවලින් නිමවන ලද සිවුරු ඇන්දහ. එකල බොහෝ තවුසන් අතර ඒවා භාවිත කිරීම සම්මතයක් විය. උන්වහන්සේ පරණ හණ රෙදි කැබලිවලින් නිමවූ

[1] A.I,182.

සිවුරක් පැළඳි බව විස්තර, අවම වශයෙන් එක් සඳහනක් හෝ ඇත.[2] උන්වහන්සේ එවැනි ඇඳුම් පසුවද ඇඳි නමුත්, අලුත් රෙදිවලින් නිමවූ සිවුරු පිළිගැන්වූයේ නම්, ඒවා භාවිතයට විරුද්ධත්වයක්ද නොතිබුණි. නොවෙනස්වනසුළු භික්ෂූහු රෙදි කඩවලින් නිමවූ සිවුරු වෙනුවට අවශ්‍යතාව අරමුණු කරගෙන නිමවූ සිවුරු ඇඳීම නුසුදුසු යැයි සිතූහ. නමුත් බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්නේ සැබැවින්ම වැදගත් වන්නේ මනසේ ගුණාත්මක භාවය මිස කෙනෙකු අඳින්නේ කුමන ආකාරයේ ඇඳුමද යන්න නොවන බවයි.[3] බුදුපියාණන් වහන්සේ විසින් භාවිත කරන ලද සිවුරේ සුවිශේෂ ආකාරය පැමිණ ඇත්තේ කොහෙන් දැයි නොදන්නා නමුත්, සමහර විට එය යම් නිශ්චිත ශ්‍රමණ නිකායන්වලට සම්මත ඇඳුම විය හැකිය. බුදුපියාණන් වහන්සේ හුදෙක් එය පහසු සහ ශරීරය ප්‍රමාණවත් ලෙස ආවරණය වීම සහ ආරක්ෂාව සැලකිල්ලට ගෙන තෝරා ගන්නට ඇත.

බොහෝ සාමණවරු, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූන් සහ භික්ෂුණීන් ඇතුළුව ආහාර ලබා ගත්තේ දානය රැස් කිරීම (පිණ්ඩචාර) යනුවෙන් හැඳින්වෙන පුරුද්ද යටතේය. නිතර කියන ආකාරයට එය සිඟාකෑමක් නොවේ, අනාරාධිත බවට වඩා අඩුවෙන් යම් දෙයකි.[4] යාචකයින් ආහාර සඳහා ආයචනය කරයි හෝ ඕනෑකමින් ඉල්ලා සිටියි. දානය රැස් කිරීමේදී සිදුවන්නේ විභව්‍ය පරිත්‍යාගශීලීයෙකුගේ නිවස ඉදිරිපිට නිශ්ශබ්දව ඇස් පහත් කරමින්, යමක් පිරිනමන තෙක් සිටගෙන සිටීමයි. සුදුසු වේලාවක් බලා සිටීමෙන් පසු, ඔවුන්ට යමක් ලැබුණත්, නොලැබුණත්, භික්ෂුවක හෝ භික්ෂුණියක වචනයක් නොපවසා ඉදිරියට ගමන් කරනු ඇත. මේ වේලාවේ ආහාර පිසීම සාමාන්‍යයෙන් සවස කරන නිසා, දවසේ ප්‍රධාන ආහාරය වන රාත්‍රී ආහාරය සූදානම් කළේ පසු දින ආහාරයත් සමගය. දානය සඳහා යා යුතු හොඳම වේලාව උදේ පාන්දරය.[5]

බුදුපියාණන් වහන්සේ ආහාර ලබා ගත් ප්‍රධාන ක්‍රමය දානය පිණ්ඩපාතයෙන් රැස් කිරීමෙන් වුවත්, ඉඳහිට ශ්‍රාවකයෙකුගේ හෝ උන්වහන්සේ අගයකරන්නෙකුගේ නිවසක ආහාර වේලක් පිරිනැමීමට ද ආරාධනය කරනු ලබයි. උන්වහන්සේගේ ශ්‍රාවකයන් සහ කීර්තිය වර්ධනය වීමත් සමග මෙය නිතර සිදු විය. එවැනි එක් ආරාධනයකදී බුදුපියාණන් වහන්සේ හැසිරුණු ආකාරය පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක්

---

[2] S.II,221. *Sāṇa* is the rough fibre of *Crotalaria juncea*. At A.I,240 the Buddha lists some of the material ascetics of other sects used as clothing.

[3] M.I,282; Dhp.142.
[4] Sn. 710-12. *Piṇḍa*, a ball or handful of rice; *cārita* to go.
[5] M.I,448, but see A.III,260. Numerous ancient texts show that cooking was done and the day's main meal was taken at different times from one region to another and during different periods; Prakash,1961.

ත්‍රිපිටකයේ ඇතුළත්ව ඇත. පරිත්‍යාගශීලියෙකු උන්වහන්සේට පසුදාට දානයකට වඩින ලෙස ආරාධනය කරන අතර, උන්වහන්සේ එය පිළිගත්තේ නම්, යම් පුද්ගලයෙකු උන්වහන්සේ වෙත නිසි වේලාවට පැමිණ, උන්වහන්සේ ඒ නිවසට වඩම්මා ගෙන යනු ඇත. දානය පිළිගන්වන තුරු රැඳී සිටින විට, දානය වේලාවට සහ ඊට පසුත්, බුදුපියාණන් වහන්සේ නොසන්සුන් හෝ පිළිවෙලක් නැති අයුරෙන් නොසිටියහ. ඒ වෙනුවට, ප්‍රසන්න සහ අභිමානවත් විලාශයක් පවත්වාගෙන සිටියහ. සැම දෙයක්ම කළේ අරමුණක් සහිතවය. ආහාර ගැනීමට ප්‍රථමව උන්වහන්සේ අත් සේදූහ. කළබලයක් නැතිව, සැම ආහාර කටක්ම ගිලීමට ප්‍රථමව සම්පූර්ණයෙන්ම සපමින් ගත්හ. පළමු කට අවසාන වනතුරු තවත් ආහාර නොගත්හ. උන්වහන්සේ ආහාරයේ රස අත්වින්ද නමුත්, එසේ කළේ ගිජුකමක් නැතිවය. ආහාර ගැනීමට පසු උන්වහන්සේ දැත් සහ පාත්‍රය සේදූහ. ස්වල්ප වේලාවක් නිශ්ශබ්දව හිඳ, ආහාර පිරිනැමූ අයට ස්තුති කළහ.[6] මෙහි, බුදුපියාණන් වහන්සේගේ හැසිරීම ආචාරශීලී සහ ශිෂ්ට පුද්ගලයෙකු යම් කෙනෙකුගේ නිවසේ අමුත්තෙකු නම් ආහාර වේලක් ගන්නා අතරතුර හැසිරෙන්නට අපේක්ෂිත ආකාරයට අනුමාන කළ හැකිය.

පෝෂණය සඳහා සම්පූර්ණයෙන්ම අන් අයගේ ත්‍යාගශීලීත්වය මත යැපීමේදී කෙනෙකුට හුදෙක් කැඩුණු සහල් ධාන්‍ය, ඇඹුල් කැඳ, ඉතිරි වූ හෝ සමහර විට කිසිම දෙයක් නැතිව සිටීම ද බලාපොරොත්තු විය හැකිය.[7] බුදුපියාණන් වහන්සේගේ පිඬුසිඟා වැඩීම් පිළිබඳ බොහෝ තොරතුරු ඇත. ඒ අතර, කිසිම දෙයක් නොලැබීම පිළිබඳව සඳහන් ඇත. එක් ග්‍රන්ථයක සඳහන්ව ඇත්තේ උන්වහන්සේ වරක් එක් විශේෂ ගමකට වැඩි පසු, ''උන්වහන්සේ ආපසු වැඩියේ පිඬුසිඟා වඩින විට තිබූ පරිද්දෙන්ම හිස් පාත්‍රය ඇතිව බවයි.''[8] කෙනෙකු පිණ්ඩපාතයෙන් ලැබෙන ආහාර මත යැපීමේ ඇති වඩාත් බරපතල ගැටලුවක් වූයේ ''අමුත්තන්ගේ හඳුනාගත නොහැකි ඉවතලන දේය.'' ඒවා උන්වහන්සේ විස්තර කර ඇති පරිදි නරක්වූ ඒවා නිසා සහ ආහාර විෂවීම නිසා රෝගී තත්ත්වයට පත්වීම හෝ මරණයට පත්වීම පවා සිදුවිය හැකිය.[9] නිතර දානය සොයා නොයාමට භික්ෂූන් පරෙස්සම් විය යුතුව තිබුණි. ඒ ඔවුන්ට ඇති පිළිගැනීම විඩාපත් නොවීමටයි. එක් කාලයක රාජගහ නුවර පුරවැසියන් නගරයේ සිටින භික්ෂූන් සංඛ්‍යාව පිළිබඳව පැමිණිලි කර ඇත. එයට හේතුව මිනිසුන්ට භික්ෂූන්ට දානය දීමේ හැකියාව සම්බන්ධයෙන් දැඩි පීඩාවක් ඇතිවීම විය හැකිය.[10] දානය පිරිනමන්නන්ට කිසිම ආකාරයකින් අපහසුතාවක් ඇති නොවන ආකාරයෙන් කටයුතු කළ යුතු බව බුදුපියාණන් වහන්සේ

---

[6] M.II,138-9.
[7] A.IV,392.
[8] S.I,114.
[9] S.II,281. In Brahmanism, leftovers, *ucchiṭṭha*, were considered repulsive and polluting, on a par with blood, vomit or excrement, one of the reasons why many brahmans despised non-Vedic ascetics. On the rules concerning leftovers in Brahmanism, see Olivelle 1999, p.354, note 3.27.
[10] Vin.I,79.

උන්වහන්සේගේ භික්ෂූන්ට උපදෙස් දුන්හ. ''මීමැස්සා මල් පැණි ගෙන, මලේ වර්ණය හෝ සුවඳට හානියක් නොකරන්නාක් මෙන්, භික්ෂූන්ද දානය සඳහා ගම් හරහා ගිය යුතු බව උන්වහන්සේ අවවාද කළහ.''[11] වරක් සාවත්ථියේ වැඩ සිටියදී බුදුපියාණන් වහන්සේ එක් විශේෂ මිනිසෙකුගේ නිවසට පිණ්ඩපාතයේ වැඩි අතර, ඔහු උන්වහන්සේගේ පාත්‍රයට බත් පිරවූයේය. ඊළඟ දිනයේද උන්වහන්සේ එහි වැඩම කළ අතර එම දේම සිදුවිය. එම පුද්ගලයා උන්වහන්සේට පරිත්‍යාගශීලී ආහාර වේලක් ලබා දෙන්නට කැමති යැයි වැරදීමකින් සිතූ උන්වහන්සේ තුන්වන දිනයේද එහි වැඩියහ. ඒ මිනිසා උන්වහන්සේට බත් දුන්නද අප්‍රසන්න ලෙස තොල් මතුරන්නට පටන් ගත්තේ : ''මේ කරදකාරී ශ්‍රමණයා නැවත නැවත එනවා.'' යැයි කියමිනි. [12]

අනෙක් භික්ෂූන් වහන්සේලා මෙන් බුදුපියාණන් වහන්සේ සාමාන්‍යයෙන් සරල අවුළුපත් අනුභව කළ නමුත්, ධනවත් පවුලක නිවසකට ආරාධනා කළ විට උන්වහන්සේට විවිධ තුනපහ සහ ව්‍යංජන සමග හොඳ බතක් පිළිගැනුණි. උදාහරණ වශයෙන් උග්ගගේ නිවසේදී සල් මල් කැඳ, ඌරුමස්, ජුජුබෙ[13] පලතුර සහ බදින ලද එළවළු දඬු සමග තම්බා, හොඳම වර්ගයේ සහල් කළු ඇට ඉවත් කර පිළිගන්වන ලදී. පෙනෙන ආකාරයට සුබෝපභෝගී ආහාරයකි. [14] වඩාත් සාම්ප්‍රදායික සාමණවරු එවැනි ප්‍රණීත ආහාර අනුභව කිරීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ විවේචනය කළහ. නමුත් උන්වහන්සේ මෙසේ පවසමින් එය සාධාරණීය කළහ : ''එවැනි ගුණවත්, එවැනි සමාධියක් හෝ එවැනි ප්‍රඥාවක් ඇති භික්ෂුවක් ඉස්තරම්ම බත්, විවිධ තුනපහ සහ ව්‍යංජන සමග අනුභව කිරීමෙන් ඔහුට බාධාවක් නොවනු ඇත.''[15] සමහර විට උන්වහන්සේ පාත්‍රය පිරෙන්නට හෝ ඊටත් වඩා ආහාර අනුභව කරන බවට බුදුපියාණන් වහන්සේගේ පිළිගැනීම, මතභේදාත්මක වූවාක් මෙන්ම, උන්වහන්සේ මෙය කෑදරකමකින් තොරව කරන්නට ඇති නමුත්, උන්වහන්සේ නැවත නැවතත් භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට අවවාද කර ඇත්තේ මධ්‍යස්ථව ආහාර ගන්නා ලෙසයි.[16] සමහර විට, උන්වහන්සේ මෙසේ කර ඇත්තේ උන්වහන්සේට දානය නොලැබීම, පෙර දිනයේදී හෝ දින ගණනාවක් එක දිගටම සුළු ප්‍රමාණයක් ආහාර ලැබීම නිසා විය හැකිය.

බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූන් මස් අනුභව කළ බවට ත්‍රිපිටකයේ ප්‍රමාණවත් තොරතුරු ඇත. එයින් පෙන්නුම් කරන්නේ මෙකල මස් අනුභවය සාමාන්‍ය අංගයක් වූ බවත්, ආගමික භික්ෂූන්ට පිළිගැන්විය හැකි,

---

[11] Dhp.49. In later centuries this came to be known as the bee practice, Sanskrit *mādhukāra*; see Olivelle 1992, pp. 198, 252.
[12] S.I,174.
[13] M.II,78.
[14] A.III,49. *Sālapupphakaṃ khādanīyaṃ*, probably made of rice flavoured with the jasmine-like scented flower of *Shorea robusta*; *sampannakolakaṃ sūkaramaṃsaṃ*, pork stewed in the slightly tart fruit of the *Ziziphus jujube*; the meaning of *nibbaddhatelakaṃ nāliyāsākaṃ* is unclear, I follow Bodhi who follows the commentary, 2012, p.1727, notes 1029 and 1030. *Sālinaṃ odano vigatakāḷako*. On *sāli* rice see Dhammika, 2018c,p.102.Removing shrivelled, discoloured or broken grains from rice before cooking was time consuming and suggested wealth, i.e. having servants to do such work. It improved the appearance of the rice when served.
[15] M.I,38.
[16] M.II, 6-8.

පිළිගත හැකි අවුළුපතක් වූ බවත්ය.[17] උදාහරණයක් ලෙස, එක් ධර්ම ග්‍රන්ථයක විස්තර කර ඇත්තේ බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේගේ භික්ෂූන්ට භෝජන සංග්‍රහයක් පිළියෙල කරන විට, ඔවුන් කැඳ සහ බත් පිළියෙල කර, සුප් කපන ලද හෝ අඹරන ලද මස් දමා (මංසානි කොට්ටෙන්ති) පිළියෙල කළ බවයි.[18] නිර්මාංශත්වය ඉන්දියාවේ තවමත් පුළුල්ව නොපැවතුනද, නන්ද වච්ඡ, කිස සංකිච්ච, මක්ඛලි ගොසාල වැනි සාමණයන්, විශේෂයෙන්ම ජෛනයන් මෙම පුරුද්දට අනුබල දීමට පටන් ගෙන තිබුණි. [19] බුදුපියාණන් වහන්සේ ස්වයං-අත්තකිලමථය අත්හදා බලන කාලයේදී මස් මාලු අනුභවයෙන් වැළකී සිටිය නමුත්, බුද්ධත්වය ලැබූ පසු, උන්වහන්සේගේ පාත්‍රයට පිළිගන්වන හෝ දානයකට වැඩි අවස්ථාවේ පිරිනමන ඕනෑම දෙයක් අනුභව කළහ. ජෛනයන් ප්‍රසිද්ධියේ උන්වහන්සේ විවේචනයට ලක් කළ දේ අතර මෙම මස් අනුභවය ද ඇතුළත්ය.[20] මස් මාලු පිළිගන්වන්නා විශේෂයෙන්ම, තමන් වෙනුවෙන්ම ඒ සත්ත්වයා මැරූ බව තමන් දන්නේ නම්, ඒ ආහාරය නොපිළිගත යුතු බව බුදුපියාණන් වහන්සේ භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට අවවාද කළහ. උන්වහන්සේ උන්වහන්සේගේ ගිහි ශ්‍රාවකයන්ට මේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් ලබා දී නැත. බුදුපියාණන් වහන්සේ කවරදා නමුත් වැළදීම ප්‍රතික්ෂේප කළ ආහාරය කේක්ය (පූරළාස). ඇතැම් වෛදික චාරිත්‍ර වාරිත්‍රවලදී භාවිත කරන එම ද්‍රව්‍ය, කිසිම රහත්ඵලයට එළඹි පුද්ගලයෙකු අනුභව නොකරන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ.[21]

බුදුපියාණන් වහන්සේ දහවල් කාලයෙන් පසු ආහාර ගැනීමෙන් වැළකී සිටි අතර, උන්වහන්සේගේ භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන්ට එම ආදර්ශය අනුගමනය කළ යුතු බවට නීතියක් පැනවූහ. උන්වහන්සේ දැක්වූ හේතුව සෞඛ්‍යයට සම්බන්ධ වූවකි. උන්වහන්සේ මෙසේ පැවසූහ: ''මම සවස් වරුවේ ආහාර නොගනිමි. ඒ නිසා මා රෝගවලින් සහ පීඩාවලින් නිදහස්ය. මම යහපත් සෞඛ්‍යයක්, ශක්තියක් සහ පහසුවක් භුක්ති විඳිමි.''[22] මෙම නීතියට වෙනත් හේතු ද තිබිය හැකිය. භික්ෂුවකට දිනකට වරක් ආහාර සැපයීම, සමහර විට බොහෝ මිනිසුන්ට කළමනාකරණය කර ගත හැකි විය හැකිය. දිනකට දෙවරක් එසේ කිරීම නිවැසියන්ට බරක් විය හැකිය. තව ද, කායික ශ්‍රමය වැය නොකරන භික්ෂුවකට හුදෙක් දෙවරක් හෝ තුන්වරක් එසේ ආහාර ගැනීමේ අවශ්‍යතාවක් නැත.

උන්වහන්සේගේ උදෑසන ආහාරයෙන් පසු, බුදුපියාණන් වහන්සේ භාවනා කිරීමට හෝ හුදෙක් නිශ්ශබ්දව වාඩිවී සිටීමට අසල නිශ්ශබ්ද ස්ථානයකට යෑම පුරුද්දක්ව තිබුණි. මේ සඳහා අසල ගහ කොළ, කොළවලින් සෑදූ කොට්ටයක්

---

[17] E.g. A.III,49; IV,187; Vin.III,208.
[18] Vin.I,239.
[19] M.I,238.
[20] M. I,77; A.IV,187.

[21] It has been said that there is an inconsistency with the Buddha's attitude to meat eating. If it is wrong to work as a butcher, and the Buddha said it was, and if it is wrong to sell meat, which again the Buddha said it was, then one would expect it to also be wrong to eat meat whether the animal was slaughtered specifically for one or not.
[22] M.I,473.

වැනි සරල ආසනයක් සෑදීම අවශ්‍ය විය. නැතහොත් උන්වහන්සේ හෝ වෙනත් කෙනෙකු රැගෙන ගිය පැදුරක් අවශ්‍ය විය.[23] උන්වහන්සේ සුවපහසු වූ පසු, සිවුරේ කොටසක් හිසට උඩින් අදිනු ලබයි. සමහර විට, කෘමීන් මුහුණෙන් ඉවත් කර තැබීමට හෝ හිරුඑළියෙන් ඇස්වලට ආවරණයක් ලෙස තබා ගෙන, භාවනාව ආරම්භ කරනු ඇත.[24] භාවනාව අවසන් කළ විට, උඩට පහළට සක්මන් කරනු ඇත. ඒ පාදවල තද භාවය ලිහිල් කර රුධිරය ගමන් කිරීම පිණිසත්ය.[25]

බුදුපියාණන් වහන්සේගේ භාවනා පිළිබඳව බොහෝ විස්තර ඇත. නමුත්, ඒවා උන්වහන්සේ කළේ කුමන ආකාරයේ භාවනා ද යන්න පිළිබඳ සාමාන්‍ය ඇඟවීම් පමණි. උන්වහන්සේ පවසා ඇත්තේ දෙපා හරස් අතර හෝ නවාගෙන (පල්ලඞකං ආභුජිත්වා) භාවනා කළ බවයි. පද්මාසන ඉරියව්වට (පද්මාසන) අනුව, දෙපා එකිනෙකට පූට්ටුව තිබෙන අතර, එය බොහෝ විට භාවනාව සමග සම්බන්ධ වේ. හත යෝගය පිළිබඳව තොරතුරු ත්‍රිපිටකයේ නැත. උන්වහන්සේ ශරීරය ඍජුව (උජුං කායං) තබාගත් බව පවසා ඇත. එයින් නිශ්චිතවම අදහස් වන්නේ පසුපස දරදඬු නොකර කෙළින් තබා ගත් බවයි. උන්වහන්සේ භාවිත කළ තාක්ෂණය වශයෙන් හඳුන්වා දී ඇත්තේ උන්වහන්සේගේ ඉදිරිපසට සිහිකල්පනාව අවදි කරන (පරිමුඛං සතිං උපට්ඨපෙත්වා) බවයි. මෙම යෙදුම විවිධ වෙනස් වූ භාවනා ක්‍රම කිහිපයක් සඳහා බොහෝ විට භාවිත කර ඇත. බුදුපියාණන් වහන්සේ සාමාන්‍යයෙන් ප්‍රතිවේද ශිල්පීය ක්‍රම වශයෙන් හඳුන්වන (විපස්සනා) ඕනෑම දෙයක් කරනු ඇතැයි සිතිය නොහැකිය. එයට හේතුව උන්වහන්සේ සියලු ඇතුළු නුවණ අවබෝධ කර ගැනීමට මගපෙන්වන පුහුණුවීම් සිදු කර අවසානය. සමහර විට උන්වහන්සේ සිහිකල්පනාවෙන් ඉඳගෙන සිටිමින් ආනාපානසති (ආනපානසති) භාවනාවේ යෙදී සිටින්නට ඇත. නැතහොත්, මෛත්‍රී භාවනාවේ (මෙත්ත භාවනා) අභ්‍යන්තර සන්සුන් බව හා ප්‍රීති ප්‍රමෝදය වැඩි කර ගැනීමේ ක්‍රමයක් ලෙස යෙදෙන්නට ඇත. ධර්ම දේශනාවක් පැවැත්වීමෙන් පසු උන්වහන්සේ ස්ථාවරව, නිශ්චලව, සිත ඒකාත්මික කරමින් එක් දෙයකට යොමු කරන බවත්, මෙය සාමාන්‍යයෙන් උන්වහන්සේ රැඳී සිටි තත්ත්වය බවත් වරක් සඳහන් කළහ. මෙයින් අදහස් වන්නේ එක් විඥානයකින් තවත් එකකට අවශ්‍ය පරිදි මාරුවීමට හැකි බවයි. මිනිසුන් සමග ක්‍රියා කරන විටදී හෝ දවසේ ක්‍රියාකාරකම් සැලසුම් කරන විට, බුදුපියාණන් වහන්සේ එක් විඥානයක් අවදි කරමින් ඊට පසු එම තත්ත්වය තවදුරටත් අවශ්‍ය නොවන විට උන්වහන්සේගේ විඥාන ගතිලක්ෂණවලට නැවත පැමිණේ.[26]

දවසේ යම් වේලාවක, බොහෝ විට දත් පිරිසිදු කිරීම, වැසිකිළි යාම, සමහර විට රැවුල බෑම, වැනි උන්වහන්සේගේ පෞද්ගලික සනීපාරක්ෂාව සඳහා යොමුවනු ඇත. නමුත් මේ සම්බන්ධයෙන් ත්‍රිපිටකයේ ලබා දී ඇත්තේ ඉතා සුළු තොරතුරු ප්‍රමාණයක් පමණි. එක් අසාමාන්‍ය උද්ධෘතයක, නිසැකවම අද්විතීය, ආගමික

[23] E.g. A.I,136; IV,308.
[24] S.I,167.
[25] E.g. D.II,80.
[26] M.I,249.

මුද්‍රිත ලේඛනයක, සඳහන්ව ඇත්තේ උන්වහන්සේ සංචාරයේ යෙදෙන විට, උන්වහන්සේට මලපහ කිරීමට හෝ මුත්‍රා කිරීමට අවශ්‍ය වූ විට, කිසිවෙකු එහි නොපැමිණෙන බවට ස්ථිර කර ගැනීම පිණිස වටපිට බලන බවයි.[27] සාවත්ථියේ නැගෙනහිර බලකොටුවලට ඔබ්බෙන් නැගෙනහිර නාන තටාකයේ අචිරවති ගඟේ ස්නානය කිරීමෙන් පසු නාන සිවුරක් වියළී යන තුරු උන්වහන්සේ සිටි ආකාරය පිළිබඳව කෙටි විස්තරයක් ඇත.[28] මෙම සිද්ධිය සිදුව ඇත්තේ මුල් හවස් වරුවේ යැයි කියනු ලැබේ. උන්වහන්සේගේ ස්නානය ගැන තවත් තොරතුරු දෙකක් ඇත. සෑම අවස්ථාවකදීම, ගඟක සහ නැවතත් දවසේ පසු යාමයේය. උන්වහන්සේ සහ උන්වහන්සේ සමග සිටි අනෙක් භික්ෂූන් දණ්ඩකප්පක වෙතට දීර්ඝ සක්මනකට පසු පැමිණි විට, අනෙක් භික්ෂූන් ඔවුන්ට නවාතැන් ගැනීමට මහජන ශාලාව ලබාගත හැකිද කියා විමසීමට ගිය විට උන්වහන්සේ ගසක් යට ඉඳගත්හ. ඔවුන් ආපසු පැමිණි විට, සියලු දෙනාම දවසේ ගමනෙන් ඇති වූ දූවිලි සහ ඩහදිය සෝදා දැමීමට අසල ගඟට ගියහ. [29]

උදෑසන ඉතිරි කාලය විවිධ ක්‍රියාකාරකම්වලින් යුක්ත විය - භික්ෂූන් සහ භික්ෂුණීන්ට උපදෙස් දීම, අමුත්තන් සමග කතා කිරීම හෝ විශේෂ පුද්ගලයන් හමු වීම, රෝගීන් බැලීමට යාම ආදිය.

බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනයේ මුල් කාලයේදී උන්වහන්සේගේ ඉගැන්වීමේ කටයුතු ඉටුකරන විට පෞද්ගලික අවශ්‍යතා සපුරාලීමට සහ පණිවුඩ යැවීම වැනි විවිධ කුඩා කාර්යයන් ඉටු කිරීමට, උන්වහන්සේගේ ඉදිරි ධර්මදේශනා පිළිබඳව දැනුම් දීමට, දානය සඳහා වැඩම කිරීමට සහ උන්වහන්සේගේ සිවුරු සේදීම වැනි දේ සඳහා තිබුණේ ස්වල්පවූ කාලයක් බව පැහැදිලි විය. එම නිසා උන්වහන්සේට පෞද්ගලික උපස්ථායකයෙකු (උපට්ඨාක) සූදානම් කරන ලදී. උන්වහන්සේගේ ප්‍රගමනය තුළදී එවැනි උපස්ථායකයන් නම දෙනෙකු සිට ඇත. ඒ අය නම්, සුනක්කත්ත, උපවාන, චුන්ද, නාගිත, නාගසමාල, රාධ, මෙඝිය, සගත, සහ ආනන්දයි. මේ අයගෙන් පළමු තුන්දෙනා පැවිදි සඞග සාසනය අතහැර, ප්‍රසිද්ධියේ බුදුපියාණන් වහන්සේ විවේචනය කරන්නට පටන් ගත්හ. එය අපහසුතාවට පත්වන දෙයක් වුවත්, කෙසේ හෝ ධර්මග්‍රන්ථවල සටහන් වී තිබීම ඔවුන්ගේ විශ්වාසවන්ත බව පිළිබඳ තවත් උදාහරණයකි.[30] උපවානට වෛද්‍ය විද්‍යාවේ යම් නිපුණතාවක් ඇති බව පෙනේ - ඔහු බුදුපියාණන් වහන්සේ සමග උන්වහන්සේගේ අවසාන ගමනට ගිය අතර, අවසාන පැය කිහිපයද උන්වහන්සේ සමග සිටියේය.[31] බුදුපියාණන් වහන්සේගේ අවසාන වර්ෂ විසිපහ තුළ බුදුපියාණන් වහන්සේගේ උපස්ථායකයා වූයේ උන්වහන්සේගේ ඥාතී සහෝදරයා වූ ආනන්ද හිමියන්ය. බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන් පිළිබඳව පැවසුවේ

---

[27] A.IV,344.

[28] M.I,161. King Pasadeni commented that this river, now called the Rapti, broke its banks when it rained in the mountains to the north, M.II,117. About forty-five km. north of Sāvatthī, the Rapti enters Nepal and abruptly turns east into a narrow, steep-sided valley now part of the Bardia National Park. This valley acts as a catchment area flushing large amounts of rainwater into the river and causing sudden flooding further downstream. The author once witnessed this phenomenon despite there being no rain in the immediate area at the time. The mention of the river's behavior strongly suggests that the author or authors of this passage at least, had an intimate knowledge of this part of the country.

[29] A.III,402.

[30] D.III,2; M.I,68.

[31] S.I,174-175; D.II,139.

මෙසේය: ''බුදුපියාණන් වහන්සේට ආදරණීය වචනයෙන්, සිතුවිලිවලින් සහ ක්‍රියාවෙන් සංග්‍රහ කරමින් සේවය කළේය. ඔහු භාග්‍යවතුන් වහන්සේගේ සෙවනැල්ල මෙන් කිසි දිනක උන්වහන්සේ අත්නොහැරියේය.''[32] දේශන දුසිම් ගණනකදී ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ පසුතලයේ සිටිමින් බොහෝ සහ කුඩා ආකාරවලින් සහ ඉඳහිට සිදුවූ සංවාදවලට දායකවෙමින් ද බුදුහිමියන්ගේ ජීවිතය පහසු කරවූයේය.

බොහෝ විට දහවල් කාලයේදී බුදුපියාණන් වහන්සේ සවස නින්ද (දිවාසෙයාා) ගත කළත්, එසේ කළේ බොහෝ විට උන්වහන්සේ මහලු වියේ පසුවූ කාලයේ ගිම්හානයේ උච්චතම අවස්ථාවේදී පමණය. සච්චක භික්ෂුව වරක් බුදුපියාණන් වහන්සේගෙන් විමසුවේ උන්වහන්සේ දහවල් නිදා ගන්නේද යන්නයි. උන්වහන්සේ පිළිතුරු දුන්නේ : ''මම එය පිළිගනිමි. ගිය මාසයේ උෂ්ණ ඍතුවේ, පිණ්ඩපාතයට වැඩම කිරීමෙන් පසු, ආහාර වැළඳීමෙන් පසු, මම මගේ සිවුර හතරට නවා, එය එළා ඒ මත හාන්සිවී සිහියෙන් යුක්තව, සම්පූර්ණ අවබෝධයෙන් සැතපෙමි.'' සච්ච මෙයින් එතරම් නොපැහැදී අවඥාවක් දැක්වූයේය: ''සමහර අය එය හඳුන්වන්නේ මෝහයෙන් වාසය කිරීම යනුවෙනි.''[33] එවැනි සවස් කල නින්දේදී, උන්වහන්සේ හැඳින්වූ සිංහ සෙයියාවෙන් එක් පාදයක් අනෙක් පාදය මත තබා, උන්වහන්සේගේ දකුණු ඇලයට හාන්සි වන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ.

දවසේ දෙවන භාගයේදී බුදුපියාණන් වහන්සේට නිශ්චිත වැඩපිළිවෙළක් නොතිබුණද, විවිධ ක්‍රියාකාරකම්වල නිරත වන්නට ඇති බව සඳහන් වේ - එනම්, භික්ෂූන් සහ භික්ෂුණීන්ට උපදෙස් දීම, උන්වහන්සේ බැහැදැකීමට පැමිණි විවිධ පුද්ගලයන්ට කතා කිරීම, උන්වහන්සේ සංචාරයක යෙදී සිටියේ නම්, ගමන නැවත ඇරඹීම, හෝ හුදෙක් තනිවම නිශ්ශබ්දව වාඩිවී සිටීමයි.

බුදුපියාණන් වහන්සේ කුමන ප්‍රදේශයකට වැඩියත්, උන්වහන්සේ විශාල පිරිස් ආකර්ෂණය කළ බවට ත්‍රිපිටකයට අනුව හැඟේ. සොණදණ්ඩ බ්‍රාහ්මණයා මෙසේ පැවසුවේය: ''මිනිස්සු විවිධ දිස්ත්‍රික්ක සහ රටවල්වලින්... බුදුපියාණන් වහන්සේ හමුවීමට පැමිණියහ. විවිධ නිකායන්වල ප්‍රධානීන් සහ කණ්ඩායම් ද උන්වහන්සේ හමුවීමට පැමිණියහ.''[34] උන්වහන්සේගේ කීර්තිය වැඩෙත්ම, සියලු ආකාරයේ මිනිස්සු උන්වහන්සේ වෙත පැමිණියහ - අවංකවම උන්වහන්සේ පවසන දේ ඇසීමට, කුතුහලය දනවන අය, වාද කිරීමට අවශ්‍ය සුළු පිරිසක් සහ ප්‍රසිද්ධ අය සමග ඇසුරු කිරීමට පමණක් උනන්දු වන සාමාන්‍ය පුද්ගලයන් ඒ අතර වූහ. බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ සමග කතා කිරීමට කැමති ඕනෑම කෙනෙකු වෙනුවෙන් ඉදිරිපත් වීමට සතුටු වූහ. පිරිස සහ ප්‍රශ්න කරන්නන් නොසන්සුන් වූ අවස්ථා ද තිබේ. බුදුපියාණන් වහන්සේ මාර්ගයේ වඩින විට හෝ යමක් ලැබීමට නිවසක් ඉදිරිපිට සිටින විට, සමහර විට මිනිසුන්

[32] Th.1039-1041-1043; D.I,206.

[33] M.I,249. This shows that for whatever reason the Buddha would sometimes go alms gathering and eat later in the morning.

[34] D.I,115.

කතා කිරීමට හෝ ප්‍රශ්න ඇසීමට ප්‍රවේශ වූ අවස්ථාද ඇත. මෙසේ වූ විට මේ ඒ සඳහා අවස්ථාව නොවන බව පවසා ඔවුන් ඈත් කරවීමට සිදුව ඇත. එම පුද්ගලයා පෙරත්ත කළහොත්, උන්වහන්සේ ඉතා කෙටියෙන් කතා කළහ.[35] ඉච්ඡානංගල ගම්වාසීන් බුදුපියාණන් වහන්සේ සහ භික්ෂූන් ඒ අසල වනාන්තරයේ උයන්වත්තක වැඩ සිටින බව අසා, ආහාර පූජා රැගෙමින් ගඟක් සේ ගලා ආවේය. ඔවුන්ගේ උද්‍යෝගය නිසා, මහත් ඝෝෂාවක් ඇති වූ අතර, බුදුපියාණන් වහන්සේ දෝෂාරෝපණය කළේ, මාලුන්ගෙන් පිරුණු දැලක් දැක සතුටට පත් ධීවර කණ්ඩායමක් සේ එය ඝෝෂාකාරී බවයි.[36] එවැනිම දෙයක් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ රැඳී සිටීමට වඩාත් ප්‍රිය කළ ස්ථානයක් වූ වේසාලියට උතුරින් පිහිටි මහා වනය අද්දර නවාතැන්පලක නැවතී සිටියදී සිදුවිය. ලිච්ඡවී වැදගතුන් විශාල පිරිසක්, රථ ඇතුළු සියලු දෙනාගෙන් යුක්ත විශාල ජනකායක් නගරයෙන් පිට වැල නොකැඩී බුදුපියාණන් වහන්සේ දැකීමට පැමිණ සිටියහ. ඔවුහු කතාබහ කරමින්, සිනහසෙමින් සහ විශාල ඝෝෂාවක් කරමින් සිටියහ. බුදුපියාණන් වහන්සේ සමග සිටි භික්ෂූහු මෙම ශබ්දය ඇසී ඊළඟට සිදුවන්නේ කුමක් ද කියා අවබෝධ කර ගත්හ. ඔවුහු බිය පත් වී, පිරිස සමග කටයුතු කිරීමට බුදුපියාණන් වහන්සේ වෙත ඉඩ හැරියහ.[37]

බුදුපියාණන් වහන්සේ ඒ මොහොතේ කුමක් කරමින් සිටියත්, ඔවුන් කැඳවණු ඇතැයි බලාපොරොත්තු වූ මිනිස්සු ඇතැම්  විට සිටියහ. වරක් අසල්වැසි රාජධානිවලින් පැමිණි සුප්‍රකට බ්‍රාහ්මණවරු ඇතුළු පිරිසක් බුදුපියාණන් වහන්සේ නතර වී ඇති ස්ථානයට ගොස්, උන්වහන්සේගේ උපස්ථායක වන 'නාගිතට' කතා කර ඔවුන්ට බුදුපියාණන් වහන්සේ බැහැදකින්නට පුළුවන්ද කියා ඇසූහ. බුදුපියාණන් වහන්සේ 'නාගිතට' උපදෙස් දී ඇත්තේ බාධා නොකරන ලෙසයි. ඒ නිසා නාගිත පිළිතුරු දුන්නේ:''දැන් බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට සුදුසු වේලාව නොවේ, උන්වහන්සේ හුදෙකලාව වැඩ සිටිති.''[38] ඔවුන්ගේ ඉල්ලීමක් නොසලකා හැරීමකට තරම් නුහුරු වූ බ්‍රාහ්මණයෝ බුදුපියාණන් වහන්සේ හමුවීමට අධිෂ්ඨාන කරගනිමින්, ජනප්‍රිය ගුරුවරයා දකින තුරු එතැනින් පිට නොවන බවට අවධාරණය කරමින් ඉඳගත්හ. ටික වේලාවකින්, සාමනේර 'සිහ' සියලු මිනිසුන් වාඩිවී රැඳී සිටිනු දැක එය පෙන්වමින් 'නාගිතට' යෝජනා කළේ බුදුපියාණන් වහන්සේට ඒ බව දැනුම් දෙන ලෙසයි. නාගිත පිළිතුරු දුන්නේ එය තමන්ට කළ නොහැකි බවත්, 'සිහ' එසේ කරන්නේ නම් විරුද්ධතාවක් නැති බවත්ය. සිහ බුදුපියාණන් වහන්සේට ඒ බව දැනුම් දුන් විට, නොවැළැක්විය හැකි දෙයකට යටත් වෙමින්, උන්වහන්සේ සිහට මෙසේ පැවසූහ: ''ගොඩනැගිල්ලේ සෙවනක මට ආසනයක් සූදානම් කරන්න.'' බුදුපියාණන් වහන්සේ පිටතට අවුත්, වාඩි වී බ්‍රාහ්මණයන් සමග සාකච්ඡාවේ යෙදුනහ.[39] දුර්ලභ අවස්ථාවන්හිදී, ආගන්තුකයෙකුට ධර්මය කෙරෙහි සැබෑ උනන්දුවක් නොමැති බව බුදුපියාණන් වහන්සේ තීරණය කළහොත්, සහ අවශ්‍ය වන්නේ හුදෙක් කතා කිරීමට පමණක් නම්, හෝ උන්වහන්සේගේ භාවනාව උන්වහන්සේ සම්පූර්ණයෙන්ම සන්සුන්

[35] E.g. S.II,19; Ud.7-8.
[36] A.III,30-31.
[37] A.V,133.
[38] *Paṭisallīna* could imply resting, meditating, in seclusion or perhaps having a nap.
[39] D.I,150-52.

බවට පත් කර ඇති නිසා කතා කිරීමට අදහස් නොකරන්නේ නම්, උන්වහන්සේ ආගන්තුකයා සමග කෙටියෙන් කතා කර, අවසාන කරති. එවිට එම පුද්ගලයා පිටව යයි.[40]

මේ සියල්ල දෙස බලන විට, බුදුපියාණන් වහන්සේට හුදෙකලා සහ නිහඬතාවකින් නැවුම් බවක් ඇතිකර ගැනීමේ අවශ්‍යතාව ඇතැම් විට දැනීම පුදුමයක් නොවේ. ඉඳහිට උන්වහන්සේ 'දිනක වාසය කිරීම' (දිවාවිහාර) යනුවෙන් උන්වහන්සේ හැඳින්වූ අවස්ථාව ලබා ගනිති. උන්වහන්සේ ආනන්ද හිමියන් අමතා, ඉඳගැනීමට පැදුරක් රැගෙන වේසාලියේ කාපාල බුදුමැදුරට යාමට උන්වහන්සේ සමග එන ලෙස උපදෙස් දෙන්නේ හිරිහැරයක් නොමැතිව එහි දිනක් ගත කිරීමටය.[41] මේ පිළිබඳ තවත් උදාහරණයක් නම්, උන්වහන්සේ වනයේ දිනක් තනිවම ගත කිරීමට තීරණය කිරීමයි. එවිට, උන්වහන්සේ සමග සැමවිටම සිටි ආනන්ද හිමියන්ට උපදෙස් දුන්නේ උන්වහන්සේ පසුපස නොඑන ලෙසයි.[42] ඇතැම් විට උන්වහන්සේ දීර්ඝ හුදෙකලාවට වැඩියහ. එවිට, උන්වහන්සේ මෙසේ පැවසූහ: ''මම ඊළඟ මාස භාගය හුදෙකලාවේ සිටීමට බලාපොරොත්තු වෙමි. මගේ ආහාර රැගෙන එන පුද්ගලයා හැර වෙන කිසිවෙකු පැමිණිය යුතු නැත.''[43] බුදුපියාණන් වහන්සේ කිසිවෙකුටත් නොදන්වා තනිවම පිටතට වැඩිය බව වාර්තා වන්නේ එක් වතාවක් පමණි. කොසැම්බිහි භික්ෂූන් වහන්සේලා පිරිසක් වාදයකට පැටලී සිටින විට එහි ප්‍රධානීන් අතර මැදිහත්වීමෙන් විසඳීමට බුදුපියාණන් වහන්සේ උත්සාහ කළ විට, ඔවුන් බුදුපියාණන් වහන්සේට පැවසුවේ, එයින් ඈත් වී සිටින ලෙසත්, ඔවුන් ගැටලුව විසඳා ගත යුතු බවත්ය. ඔවුන්ගේ මෙම අකීකරුකම සම්බන්ධයෙන් පිළිකුලට පත් වී, උන්වහන්සේ වැඩ සිටි කාමරයට ගොස්, එය පිරිසිදු කර, සියල්ල නිසි තැන තබා, භික්ෂූන්ට හෝ උන්වහන්සේගේ උපස්ථායකටවත් නොපවසා, වනයේ වඩාත් ගැලපෙන වාතාවරණයට වැඩියහ.[44]

උන්වහන්සේගේ ධර්මය විශාල පිරිසකට සන්නිවේදනය කිරීමට හැකිවීම බුදුපියාණන් වහන්සේ උතුම්කොට සිතීමේ ධනාත්මක පැත්ත විය. එහි ඍණාත්මක පැත්ත දරා ගැනීමට උන්වහන්සේට හැකි විය. එනම්, භාවනාව සහ හුදෙකලාව සඳහා උන්වහන්සේ ලැබීමට කැමති කාලයට වඩා අඩු කාලයක් තිබියදීත්, උන්වහන්සේ ප්‍රසිද්ධ පුද්ගලයන් කෙරෙහි දැක්වූයේ නොසැලකිලිමත් බවකි. ''වාසි, නම්බුනාම සහ ප්‍රසිද්ධිය ... ඇත්තෙන්ම භයානකයි. ඒවා බැඳීම්වලින් නිදහස් ඉහළම ආරක්ෂාව ලැබීමට බාධාවකි.'' [45] ප්‍රසිද්ධ පුද්ගලයෙකු, අවංක පුද්ගලයෙකු පවා, යම් දෙයක් අත්පත් කර ගත් පසු, සියල්ලම, පහසුවෙන් මග හරින ආකාරය බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ආවේණික ඇතුළු නුවණින්, පෙන්වා දුන්හ. ''භික්ෂුවක, ඔහුට ප්‍රසිද්ධිය සහ ගෞරවය ලබා ගන්නා

---

[40] The phrase *uyyojaniyapaṭisaṃyuttaṃ yeva thaṃ* could have several different meanings. See Anālayo 2011, Vol. II, p. 692, note 43.
[41] M.I,229; S.V,259.
[42] A.IV,438.
[43] S.V,12; V,320.
[44] S.III,95. A more detailed account of the incident is at M.III,152 ff.
[45] S.II,226.

තුරු නැඹුරු නොවන උවදුරු ඇත. නමුත්, ඔහු ඒවා අත්පත් කර ගත් පසු ඒවාට නැඹුරු වේ.''[46] එම උවදුරු වන්නේ කිසිවක් ගණනකට නොගෙන සිටීම, අහංකාරය සහ ආත්මය පිළිබඳ පිම්බීමයි.

බුදුපියාණන් වහන්සේ උඩගු නොවූහ. නමුත් උන්වහන්සේ යටහත් පහත් හෝ ස්වයං-බයාදු පුද්ගලයෙකු ද නොවූහ. උන්වහන්සේ අවබෝධ කරගත් දේ එවැනි අත්දැකීම් නැති අයට වඩා බොහෝ ඔබ්බෙන් උන්වහන්සේ සිටින බව බුදුපියාණන් වහන්සේ විශ්වාස කළහ. අනෙක් අය උන්වහන්සේට දුන් ගෞරවය උන්වහන්සේට ලැබිය යුත්ත වශයෙන් උන්වහන්සේ පිළිගත්හ. නමුත් උන්වහන්සේ එම තත්ත්වය ඉදිරිපත් නොවන විට, ඒ මත බල කිරීමක් නොකළහ. කෙසේ නමුත්, උන්වහන්සේ අතිශයෝක්තියෙන් යුක්ත ගෞරවයට හෝ කීර්තිය සමග බැඳි අධික ප්‍රසංසාවට අකමැති වූහ. සමහර අය ඔවුන්ගේ ප්‍රසිද්ධියෙන් ලබා ගත් සතුට අසූචිවලට (මිළ්හසුඛං) සමාන බව උන්වහන්සේ හැඳින්වූහ.[47]. සමහර විට සිදුවූවක් මෙන්, උන්වහන්සේ වෙත පෞද්ගලිකව අධික ප්‍රසංසාව ඕනෑවට වඩා පැමිණි විට, උන්වහන්සේ පාදය බිම හෙළනු ඇත. නැතහොත්, එක් විශේෂ අවස්ථාවක, ඇති සැටියෙන්ම උන්වහන්සේගේ පාදය බිමට දැමීම ප්‍රතික්ෂේප කළහ. සුංසුමරාගිරට චාරිකාවක් කළ විට බෝධි කුමාරයා දානයක් සඳහා උන්වහන්සේට මාළිගාවට ආරාධනය කළේය. බුදුපියාණන් වහන්සේගේ පැමිනිම සඳහා සූදානම් කිරීමට සුදු රෙද්දක් මාළිගාවේ ඉදිරිපස තරප්පු මත එලන ලදී. එය සැළකිය යුතු තරම් ගෞරවය ප්‍රකාශ කිරීමේ සළකුණකි. වර්තමානයේ රතු පලසක් එළීම හා සමානය. බුදුපියාණන් වහන්සේ පැමිණි විට, සුදු රෙද්ද දැක ඊට ටිකක් සමීපව නතර වූහ. ව්‍යාකුලත්වයට පත් වූ කුමාරයා ප්‍රශ්නය කුමක් ද කියා ඇසූ විට, බුදුපියාණන් වහන්සේ කිසිවක් නොපැවසූහ. කුමරු තුන්වන වරටත් ඇසූ නමුත්, ප්‍රතිචාරයක් ලැබුණේ නැත. ආනන්ද හිමියන් පැහැදිලි කළේ බුදුපියාණන් වහන්සේ සුදු රෙද්ද මත ගමන් නොකරන බවත්, එයට හේතුව උන්වහන්සේ ''අනාගත පරම්පරා ගැන සැලකිලිමත් වන නිසා බවත්ය.''[48] මෙයින් ආනන්ද හිමියන් අදහස් කළේ අනාගත භික්ෂූන් සහ භික්ෂුණීන් වහන්සේලාට ආදර්ශයක් තැබීමට බුදුපියාණන් වහන්සේට අවශ්‍ය වූ බවයි. එනම්, ඔවුන් ගිහි බැතිමතුන්ගේ ගෞරවය කෙරෙහි දැඩි ඇල්මක් දක්වමින් ඒවාට ඇළුම් කළහොත්, එයින් ආඩම්බරයට ගොදුරු විය හැකි නිසාය. බෝධි කුමාරයා සුදු රෙදි කැබැල්ල හකුළා ගත් විට බුදුපියාණන් වහන්සේ මාළිගයට වැඩියහ.

බුදුපියාණන් වහන්සේ තමා කෙරෙහි ඇති භක්තිය අධික යැයි සිතුවහොත්, එයට පාර්ශ්වයක් වෙමින්, හුදෙක් එය ප්‍රතික්ෂේප කිරීමෙන් ඔබ්බට ගොස්, නොවෙනස්ව, මූණටම කියමින් පවා, උද්‍යෝගය හීන කරවයි. වක්කාලි භික්ෂුව බරපතල ලෙස රෝගාතුරව සිටින බව දැනගත් විට, බුදුපියාණන් වහන්සේ ඔහු බැලීමට වැඩියහ. උන්වහන්සේ රෝගියා වෙත ප්‍රවේශ වූ විට, ඔහු ඇඳෙන් නැගිටීමට උත්සාහ කළේය. නමුත් බුදුපියාණන් වහන්සේ එය වැළකුහ. ''ඇති වක්කාලි, අසුන් ඇත. මම එතැන ඉඳ ගනිමි.'' රෝගියෙකු බැලීමට එන ඕනෑම

[46] M.I,318; also I,193.
[47] A.III,342.
[48] M.II,91-2.

කෙනෙකු මෙන් බුදුපියාණන් වහන්සේ වක්කාලිගේ තත්ත්වය සහ ඔහුට දැනෙන්නේ කෙසේ ද කියා විමසූහ. වක්කාලි පැවසුවේ ස්ථාවරව සිටීම හෝ ඔහුගේ රෝගී තත්ත්වයෙන් යහපත් බවට පැමිණෙනවා වෙනුවට එය සැබැවින්ම නරක අතට හැරෙමින් පවතින බවයි. ''එහෙනම්, යම් දෙයක් පිළිබඳව ඔබ පසුතැවෙනවාද, හෝ වරද පටවනවාද?'' බුදුපියාණන් වහන්සේ ඇසූහ. වක්කාලි පැවසුවේ ඔහු එක් දෙයක් ගැන පමණක් කණගාටු වන බවයි. ''බොහෝ කාලයක සිට මට ඔබවහන්සේ දැක බලාගැනීමට අවශ්‍ය විය. නමුත් එසේ කිරීමට නොහැකි ප්‍රමාණයට මා රෝගී වී ඇත.'' ''ප්‍රමාණවත් වක්කාලි!'' බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූහ. ''ඔබට මගේ මේ කිළිටි ශරීරය දකින්නට අවශ්‍ය ඇයි? ධර්මය දකින්නා මා දකී. මා දකින්නා ධර්මය දකී.''[49]

බුදුපියාණන් වහන්සේ කෙරෙහි භක්තිය අධික වුවද, බුදුපියාණන් වහන්සේ කිසිම අදහසක් ප්‍රකාශ නොකර ඒවා පිළිගත් ස්වල්ප වූ සිද්ධීන් ද ඇත. එක් අවස්ථාවක පසේනදී රජු ගම්බද ප්‍රදේශයක විනෝදයට ගමන් කරන විට, බුදුපියාණන් වහන්සේ ඒ අසල ස්ථානයක වැඩ සිටින බව දැන, උන්වහන්සේ බැහැදැකීමට තීරණය කළේය. හමුවූ විට, රජු බුදුපියාණන් වහන්සේ ඉදිරිපිට මුණින් වැටී නමස්කාර කරමින්, උන්වහන්සේගේ දෙපා අතගා සිප ගෙන උන්වහන්සේගේ නම උච්ඡාරණය කළේය. එවැනි අභිනයන් කරන්නට වටින්නේ යැයි ඔහු සිතුවේ කුමන හේතුවක් නිසාද කියා හුදෙක් රජුගෙන් ඇසූහ. සමහර විට, පසේනදී රජුගේ තරමක් කෘත්‍රිම හැසිරීම සම්බන්ධයෙන් යමක් පැවසීම විචක්ෂණශීලී වන්නේ යැයි බුදුපියාණන් වහන්සේ සිතන්නට ඇත. කෙසේ වෙතත්, ඔහු රජ කෙනෙකි.[50]

සාමාන්‍යයෙන්, බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් හැකි සෑම විටම අනවශ්‍ය ගරුබුහුමන් මගහරිමින් උන්වහන්සේගේ ආදර්ශය අනුගමනය කළහ. පසේනදී රජු ආනන්ද හිමියන් දකින්නට පැමිණි විට, ඔහු ඉතා අලංකාර යෝධ කළාලයක් එලා උන්වහන්සේට ඉඳ ගැනීමට ආරාධනය කළේය. ආනන්ද හිමියන් ආචාරශීලීව එය ප්‍රතික්ෂේප කරමින් කියා සිටියේ තමන්ගේම පැදුරක් තිබෙන බවයි. පසුව ඇතිවූ සංවාදය පිළිබඳව රජතුමා සතුටු වූයේය. එය අවසන් වූ පසු, ඔහු ආනන්ද හිමියන්ට ඔහුගේම පොරෝනාව පිළිගැන්වූයේය. එය අත් දාසයක් දිග, පළල අටක් සහිත අජාසත්තු රජ තෑගි කරන ලද්දක් බව ඔහු පැවසුවේය. නැවතත් ආනන්ද හිමියෝ එය ද විනීත ලෙස ප්‍රතික්ෂේප කළහ.[51] සමහර විට, සමහර ශ්‍රාවකයෝ ආඩම්බර වීමට ඇති ප්‍රවණතාව දැන සිටි නිසා, ඔව්හු හිතාමතාම නිහතමානී ගුණය වැඩි දියුණු කළහ. උදාහරණ වශයෙන් සාරිපුත්ත මහරහතන් වහන්සේ පැවසුවේ යටහත් පහත් දූවිලි පිස දමන කඩමාල්ලක් හෝ සමාජයෙන් පිටමං කරනු ලැබූ දරුවෙකු මෙන් තමන්වහන්සේගේ මනස පවත්වාගෙන යාමට උත්සාහ කළ බවයි. මහා කස්සප මහරහතන් වහන්සේ

---

[49] S.III, 119-20. By dirty body (*pūtikāya*) he did not mean that he lacked personal hygiene but rather that the human body, including his own, produces a steady stream of unpleasant excretions requiring continual washing.
[50] M.II,120.
[51] M.II,133;166.

රාජගහ වැඩ සිටින විට, පිණ්ඩපාතයේ වැඩි අතර, වඩා කැමැත්තක් දැක්වූවේ වියන්නන්ගේ මාර්ගයේ දුප්පතුන් ඉන්නා නගරයේ කෙළවරට යාමටයි.[52]

බුදුපියාණන් වහන්සේ වරක් පැවසුවේ උන්වහන්සේගේ පැවිදි ශ්‍රාවකයන් උන්වහන්සේ දැකිය යුත්තේ පියෙකු ලෙස බවත්, තමන්වහන්සේ ඔවුන්ට සලකන්නේ දරුවන් ලෙස බවත්ය.[53] පෙර සඳහන් කර ඇති ආකාරයට, භික්ෂූන් සහ භික්ෂුණීන් ඔවුන් හඳුන්වා දී ඇත්තේ සහ අනෙක් අය දන්නේ ශාක්‍යයන්ගේ දූ පුතුන් ලෙසය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සියලු පැවිදි සහ ගිහි ශ්‍රාවකයන්ට මෙම දෙමාපිය වැනි ආදරය ඔවුන්ගේ ආධ්‍යාත්මික සුභසිද්ධිය සඳහා තිබූ සැලකිල්ලෙන් ප්‍රදර්ශනය කළහ. එපමණක් නොව, ඔවුන්ගේ කායික සුභසිද්ධිය සඳහාත් එසේමයි. අවන්තියේ සිට සාවත්ථියට සියලු දුර ගෙවා ගෙන පැමිණි සොණ භික්ෂුව හමුවූ විට උන්වහන්සේ ඔහුගෙන් ඇසුවේ ඔබ හොඳින්ද කියාය. ''ඔබ හොඳින් වාසය කරනවා, ඔබ හොඳ සෞඛ්‍යයෙන් යැයි මම සිතමි. මා හිතනවා ඔබ ගමනින් එතරම් තෙහෙට්ටු වී නැත කියා. ආහාර ලබා ගැනීමේදී ඔබට එතරම් ප්‍රශ්න ඇති වූයේ නැතැයි මා හිතනවා?'' තමන් හොඳින් බව සොණ භික්ෂුව පිළිතුරු දෙන විට, බුදුපියාණන් වහන්සේ ඔහුට සුදුසු නවාතැන් සපයන ලෙස ආනන්ද හිමියන්ට උපදෙස් දුන්හ.[54] උන්වහන්සේ ශ්‍රාවකයන්ට සෞඛ්‍යමත් අයුරෙන් ආහාර ගන්නා ආකාරය, ව්‍යායාම් කිරීමේ ඇති වැදගත්කම, අඛණ්ඩව, පිළිවෙලට දත් මැදීමේ ඇති ප්‍රයෝජන සහ සනීපාරක්ෂක වැසිකිළි සාදන්නේ කෙසේ ද යන්න ගැන පවා අවවාද කළහ.[55] එසේම, කෙනෙකු අසනීප වූ විට, ඔහුගේ සුවදුක් බැලීමට යාමට කාලය යොදා ගත්හ. එය පන්සලක, ගිලන්හලක සිටින භික්ෂුවක හෝ ගිහියෙකු සිටින නිවසක් විය හැකිය.[56]

එවැනි අවස්ථාවල උන්වහන්සේ රෝගියාගේ තත්ත්වය පිළිබඳව විමසා ඔවුන් සමග ධර්මයේ යම් කරුණු පිළිබඳව සාකච්ඡා කර ඔවුන් දිරිමත් කළහ. අවශ්‍ය නම්, රෝගියාගේ අවශ්‍යතා සපුරාලීමට පවා උපකාර කරති. එක් විශේෂ ගිලන් රෝහලකට ආනන්ද හිමියන් සමග යන විට, උන්වහන්සේට අතීසාරයෙන් පෙළෙන භික්ෂුවක ඔහුගේම අසූචි මත වැතිරී, අනෙක් භික්ෂූන් විසින් නොසලකා හැර සිටිනු හමුවිය. අපිරිසිදු භෞතික ද්‍රව්‍ය සහ දුගඳ අතිශයින් අප්‍රසන්න විය යුතුයි. කෙසේ නමුත් දෙදෙනා වහන්සේලා රෝගියා සෝදා පිරිසිදු ඇඳකට ගෙන ගියහ. පසුව බුදුපියාණන් වහන්සේ භික්ෂු ප්‍රජාව කැඳවා ඔවුන් තමන්ගේම භික්ෂුවකට සිදු කළ වෙනස්කම සම්බන්ධයෙන් තරවටු කළහ: ''මට සාත්තු කරන්නා රෝගීන්ට සාත්තු කරන්නෙකු විය යුතුයි.''[57] කාරුණික සහ අවධානය දෙන සාත්තු සේවකයෙකු වීමට අවශ්‍ය ගුණාංග වශයෙන් බුදුපියාණන් වහන්සේ සඳහන් කළේ මෙම සිද්ධිය හෝ සමාන සිද්ධියකට ප්‍රතිචාර දැක්වීමෙන් විය හැකිය.

---

[52] A.IV,376; Ud.4.
[53] Vin.I,45.
[54] Ud.59.
[55] A.III,250; Vin.II,222.
[56] E.g.A.III,142; 379; S.IV,210; V,344-45.
[57] Vin.I,301-302.

> ''සාත්තු සේවකයෙකු ගුණාංග පහක් සම්පූර්ණ කිරීමෙන් රෝගීන් රැක බලා ගැනීමට දක්ෂකයෙකු වේ. ඒ පහ මොනවාද? ඔහු හෝ ඇයට ඖෂධ පිළියෙල කිරීමට හැකි විය යුතුයි, කුමක් ඵලදායීද, කුමක් ඵලදායී නොවේද කියා ඔහු දන්නා අතර, ඵලදායී නොවන දේ නොව, ඵලදායි ඖෂධය සපයයි. ඔහු ආදරයෙන් රෝගියා රැක බලා ගනියි, ලාභ ප්‍රයෝජන ලැබීමේ අරමුණින් නොවේ. ඔහු අසූචි සහ මූත්‍ර, ලේ සහ කෙළවලින් ඔහුට බලපෑමක් ඇති නොවේ. කාලයෙන් කාලයට ඔහු ධර්මය ගැන කතා කරමින් රෝගියාට උපදෙස් දෙයි, ප්‍රමෝදයට පත් කරයි, සතුටු කරයි, සනසයි.''[58]

''රෝගීන් රැකබලා ගැනීම බුදුපියාණන් වහන්සේ වර්ණනා කළ බව'' (භගවතා බෝ ආවුසෝ ගිලානුපට්ඨානං වණ්ණිතං) සඞගයා අතර ඉතා හොඳින් ප්‍රචලිත විය.[59]

බුදුපියාණන් වහන්සේ දීර්ඝ කාලයක් ජීවත්වූයේ එවකට පැවති ප්‍රමිතීන්ට අනුවය. ඊට පසු උන්වහන්සේ භික්ෂුවක බවට පත් වූ පසු උන්වහන්සේගේ ජීවිතය දුෂ්කර එකක් විය - ඉවතලන දේ ආහාරයට ගනිමින්, බොහෝ විට එළිමහනේ සැතපෙමින් සහ වසරේ බොහෝ කාලයක් මජ්ඣිම දේශයේ දූවිලි සහිත මාර්ගවල සහ පා සටහන්වල ඇවිදිමින් සහ ගිම්හාන තාපයෙන් පීඩා විඳිමින්ය. උන්වහන්සේට ශක්තිමත් කායික සොබාවක් තිබුණද, උන්වහන්සේ සමහර විට රෝගාතුරවූ බව ත්‍රිපිටකය සඳහන් කරයි. අවස්ථා කිහිපයකදී උන්වහන්සේ රෝගාතුරවී වෛද්‍ය ප්‍රතිකාර ගන්නටද සිදු විය. වරක් උන්වහන්සේ සුළඟින් (වාතේහි ආබාධිකෝ) පීඩා විඳින විට උපස්ථායකට බීමට උණු වතුර ගෙනෙන ලෙස ඉල්ලා ඇත.[60] උපස්ථායක ජලය සහ යම් උක් සීනි සිරප් ගෙන ආ අතර, උන්වහන්සේට උණු පැන් ස්නානය කරන්නට රෙකමදාරු කර, ඊට පසු බොන්නට උණු පැන් සහ උක් සීනි සිරප් දෙන ලදී. උන්වහන්සේගේ අපහසුතාව අඩු විය. බුදුපියාණන් වහන්සේට එක් වරකට වඩා වැඩියෙන් ආමාශයේ වාත (උදරවාතාබාධ) අමාරුව ඇති විය. සමහර විට එය ආයුර්වේද න්‍යායේ සඳහන් ආකාරයට, දැන් සඳහන් කළ මෙම සිද්ධිය, වාත (වාත) අමාරුවක් විය නොහැකිය. බඩවැල්වල ගෑස් වර්ග පිම්බීම, වේදනාව සහ බඩ පිපුම ඇති කළ හැකිය. මෙම තත්ත්වය ඇතිවෙන සෑම වාරයකදීම උන්වහන්සේම තුනී තල, සහල්, හෝ මුංඇට කැඳක්, කට දන රසයක් ඇති ද්‍රව්‍ය තුන වශයෙන් හැඳින්වූ මිශ්‍රණය සමග මිශ්‍ර කර පානය කරන ලදී. එයින් එය සුවවිය.[61] මෙය සිත්ගන්නාසුලු වේ - බුදුපියාණන් වහන්සේට අවම වශයෙන් හෝ මූලික වෛද්‍ය දැනුමක් තිබී ඇත. උන්වහන්සේ විසින් සකස් කළ බොහෝ ඖෂධ ලැයිස්තුවලින් මෙම හැඟීම ප්‍රතිසාධනය වී ඇත. එනම්, කොළ වර්ග, මුල්, දුම්මල, මේද සහ ඛනිජ ද්‍රව්‍යයයි. එසේම ඒවා සාදන්නේ කෙසේ ද, ගබඩා කරන්නේ කෙසේ ද,

---

[58] A.III,144.

[59] Vin.I,303.

[60] S.I,174-5. This is one of the earliest references to the Aryuvedic theory of the three humors (*tidosa vidya*), the amorphous substances that supposedly regulate the bodily state: wind (*vāta*), bile (*pitta*) and phlegm (*semhā*). These in turn were believed to interact with lymph, blood, flesh, fat, bone, marrow and semen. Disease was believed to be caused by an irregularity of these humors.

[61] Vin.I,210. There are different opinions about what these three pungent ingredients are, possibly ginger, long pepper and black pepper.

ඒවායේ ශක්තිමත් බව නැති නොවෙමින් කෙතරම් කලක් තබා ගත හැකි ද යනාදිය පිළිබඳව උන්වහන්සේ ගුරුහරුකම් දුන්හ. පැරණි ඉන්දියානු ඖෂධ පිළිබඳ ප්‍රධාන විද්වතෙකුට අනුව, මෙම ලැයිස්තු, කෙටි වුවත්, ඉන්දියාවෙන් නොනැසී පැවත එන පැරණිතම ඖෂධවේදය නියෝජනය කරයි.[62] බුදුපියාණන් වහන්සේගේ උපමාවල වෛද්‍ය නිරූපණ ඇතුළත් වාර ගණන ද විද්වතුන් විසින් පෙන්වා දී ඇත. රූපක මගින් හඟවන්නේ ඖෂධ පිළිබඳව උන්වහන්සේට හුරුපුරුදුකමක් හෝ අවම වශයෙන් උනන්දුවක් තිබූ බවයි. උන්වහන්සේ මෙම දැනුම ලබා ගත්තේ කෙසේ ද යන්න අනුමාන කළ හැක්කේ උන්වහන්සේගේ මුල්කාලීන අධ්‍යාපනයෙන් විය හැකි නමුත්, බොහෝ විට, උන්වහන්සේගේ කොටසක් වූ සාමණ සම්ප්‍රදායෙන් විය හැකිය.

තවත් නැවත සිදුවෙන පැමිණිල්ලක් වූයේ බුදුපියාණන් වහන්සේට තිබූ කොඳු ඇට පෙළේ වේදනාවයි. සමහර විට ඒ බව පැහැදිලි වූයේ උන්වහන්සේ වියපත් වූ පසුය.[63] එයට හේතුව එය වියපත් මිනිසුන් අතර සාමාන්‍ය සිදුවීමක් නිසා විය හැකිය. උන්වහන්සේ වරක් ජේතවන දොරටුවෙන් පිටත සිටගෙන සිටියහ. එසේ සිටියේ ඇතුළත පැවතුණු දේශනාවට බාධා නොකිරීම සඳහාය. එම දේශනය දීර්ඝ එකක් වූ අතර, එය අවසාන වූ පසු උන්වහන්සේ ගොඩනැගිල්ල ඇතුළට ගියහ. ඉඳගත් පසු, පිටත සිටගෙන සිටිද්දී කොන්දේ වේදනාව ඇති වූ බව උන්වහන්සේ පැවසූහ. දේශනාව සිදු කළ භික්ෂුව බුදුපියාණන් වහන්සේගෙන් සමාව ඇයදුවේය. තමන්වහන්සේ නොසැලකිලිමත් ලෙස භික්ෂුව අපහසුවට පත් කළා යැයි සිතූ බුදුපියාණන් වහන්සේ භික්ෂුවගේ දේශනාව සහ එයට සවන් දීමට පැමිණි පිරිස අගය කළහ.[64] බුදුපියාණන් වහන්සේ රැස්වීම් ශාලාවල වාඩිවී දේශනා කරන විට කණුවකට හේත්තු වී සිටි බව වෙනත් බොහෝ ධර්ම ග්‍රන්ථවල සඳහන් වී ඇත. එයින් හැඟවෙන්නේ උන්වහන්සේගේ කොන්දට යම් වාරුවක් උවමනා වූ බවයි. එවැනි බොහෝ කෙටි රචනා අතරින් වඩාත් සිත්ගන්නාසුලු එක වන්නේ බුදුපියාණන් වහන්සේ ඉඳගෙන හවස් යාමයේ හිරු එළියෙන් කොන්ද උණුසුම් කරන ආකාරයයි. මෙය දුටු ආනන්ද හිමියන් උන්වහන්සේ වෙත ගොස්, දෙදෙනා කතා කරන ගමන් උන්වහන්සේගේ කොන්ද සම්බාහනය කරන ලදී.[65]

බුදුපියාණන් වහන්සේ වඩාත් බරපතල ලෙස පැමිණිලි කළ අවස්ථා හතරක් ත්‍රිපිටකයේ සඳහන්ව තිබේ. මෙයින් එකක් තුළදී තුන්දොස් (කාය දොසාභිසන්න) නිසා කායික අක්‍රමවත් බවකින් උන්වහන්සේ පීඩා වින්දහ. ආනන්ද හිමියන් මුදල් අය නොකර සඞසයා වහන්සේට ප්‍රතිකාර කරන රාජකීය වෛද්‍ය ජීවක කැඳවූහ. ඔහු නිර්දේශ කළේ බුදුපියාණන් වහන්සේට ඖෂධීය තෙල් දින ගණනාවක් ආලේපනය කරන ලෙසයි. තෙල් ආලේපනය (සිනේහේථ) යැයි කියන විට එයට බොහෝ දේ ඇතුළත්ය. එනම් ඖෂධීය තෙල්වලින් සම්භාහනය කිරීම, එවැනි තෙල් උකහා ගැනීම, ඒවා නාසයට සහ කන්වලට දැමීම, හෝ වස්තියක් වශයෙන්

---

[62] Zysk, p.73.
[63] D.III,209; M.I,354; AIV,184.
[64] A.IV,358-9.
[65] S.V,216.

සකසා දීම - වැනි පැරණි ආයුර්වේද ග්‍රන්ථවල සඳහන් ප්‍රතිකාර ලබා දීමයි. මෙම ප්‍රතිකාර වට්ටෝරුව අවසාන කිරීමෙන් පසු ජීවක වෛද්‍යවරයා බුදුපියාණන් වහන්සේ සඳහා මෘදු විරේක පත්තියමක් නියම කළේය. එයට ජලයේ වැඩෙන ලිලීමල් පොකුරු රාශියක සුවඳ ආඝ්‍රාණය කිරීම ඇතුළත් විය. එම ප්‍රතිකාරය තවත් ඖෂධ වර්ගයක් සමග සිදු කරන ලදී. නැවතත්, මෙම ඖෂධය ශරීරගත කළේ කෙසේද යන්න පැහැදිලි නැත. සමහර විට ජලයේ වැඩෙන ලිලීමල් කුඩු කරන ලද ශාක සමග කුඩු කර සහ සුවඳ සමග ආඝ්‍රාණය කරන්නට ඇත. මීට පසු, නැවතත් ජීවකගේ උපදෙස් මත බුදුපියාණන් වහන්සේ උණු ජලය ස්නානය කර උන්වහන්සේ යථා තත්ත්වයට එනතුරු සුප් වර්ග පමණක් ආහාරයට ගත්තා විය හැකිය.[66] තවත් අවස්ථාවක රාජගහ සිටින විට බුදුපියාණන් වහන්සේ ''රෝගී, අසනීප, වේදනාකාරී රෝගයකින් පෙළුණි.'' (ආබාධිකෝ හෝති දුක්ඛිතෝ බාළ්හගිලානෝ). මෙවර, වෛද්‍යමය උපදෙස් ලැබීම වෙනුවට, බුදුපියාණන් වහන්සේ උපස්ථායකගෙන් ඉල්ලා සිටියේ නිර්වාණයට පත්වීමට අවශ්‍ය සාධක හත උන්වහන්සේ වෙනුවෙන් සජ්ඣායනය කරන ලෙසයි. උපස්ථායක එසේ කිරීමෙන් අනතුරුව උන්වහන්සේට සුවය ලැබුණි. ධර්ම ග්‍රන්ථවලින් ඇඟවෙන්නේ ධර්මයේ ඇති මෙම කරුණුවලින් බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිප්‍රාප්තිය සඳහා කාර්යභාරයක් ඉටුවූ බවයි.[67]

බුදුපියාණන් වහන්සේ කපිලවත්පුවට වැඩම කරන විට, බොහෝ විට ඉහත සඳහන් සිද්ධියකට සම්බන්ධ අනිර්දිෂ්ට රෝගයකින් සුවය ලැබූ බව ත්‍රිපිටකයේ තවත් එක් උද්ධෘතයකින් කෙටියෙන් විස්තර කර ඇත.[68] උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු වීමට පෙර මාසවල උන්වහන්සේ රෝග වාර දෙකකින් පෙළුණි. එයින් උන්වහන්සේ තදබල ලෙස දුර්වල වූහ. සමහර විට උන්වහන්සේගේ පරිනිර්වාණය එයින් ඉක්මන් වන්නට ඇත. මෙම සිදුවීම් විස්තරාත්මකව පහතින් සාකච්ඡා කරනු ඇත.

බුදුපියාණන් වහන්සේ මිනිසුන් සමග තිබූ අන්‍යෝන්‍ය ක්‍රියාකාරකම් හිරුබැස යාමත් සමග උන්වහන්සේට විවේක ගැනීම සහ සැහැල්ලුවීම සඳහා අඩු කරනු ලැබුණි. බුදුපියාණන් වහන්සේ රාත්‍රියේදී කෙතරම් වේලාවක් සැතපුණේද යන්න පිළිබඳව ත්‍රිපිටකයේ ඇත්තේ ස්වල්පවූ තොරතුරු ප්‍රමාණයක්ය. උන්වහන්සේ උන්වහන්සේගේ භික්ෂූන් සහ භික්ෂුණීන්ට උපදෙස් දුන්නේ පළමු සහ අවසාන ඔරලෝසු පැයේදී භාවනා කරමින් හෝ සිහිකල්පනාවෙන් උඩට පහතට සක්මන් කරමින් පහන් කර, ඊට පසු දෙවන ඔරලෝසු පැයේදී සැතපෙන ලෙසයි. අනුමාන කරන පරිදි, උන්වහන්සේ කාර්ය සටහනක් අනුගමනය කළහ.[69] (රාත්‍රිය ආරම්භ කිරීම සලකුණු ලැබුවේ හිරු බැස යන විටය. එය අවසාන වූයේ හිරු නැග එන විටය. අතරමැදි කාලය ඔරලෝසු පැය (යාම) තුනකට බෙදන ලදී, ඒ සෑම එකකම කාලය වෙනස් වූයේ ඍතුවට අනුවය. බුදුපියාණන් වහන්සේ

---

[66] Vin.I,279-80. Four types of soup are mentioned at M.I,245.
[67] S.V,80. The Factors of Awakening (*satta bojjhaṅga*) are mindfulness, scrutiny of mental states, energy, joy, concentration and equanimity.
[68] A.I,219.
[69] A.I,114.

සමහර විට රාත්‍රියේ බොහෝ වේලාවක් උඩට පහළට ඇවිදිමින් හෝ බොහෝ රාත්‍රිවල සාකච්ඡා පැවැත්වූ බව සඳහන් වේ.[70] අනෙක් ග්‍රන්ථවල හුදෙක් සඳහන් වෙන්නේ උන්වහන්සේ රාත්‍රිය ගත කළේ ගොඩනැගිල්ලක හෝ සෙවනක් යටට වැඩ එළිමහනේ බවයි. හුදෙක් ගිම්හානයේ පමණක් නොව, ශීත ඍතුවේද රාත්‍රිය ඉතා ශීතල විය යුතුයි.[71] උන්වහන්සේ 'අළවී' වනයේ උයන්වත්තක පිටත වැඩ සිටින විට, උන්වහන්සේම කොළඅතුවලින් යහනක් සාදා ඒ මත ඉඳ භාවනා කළහ. උන්වහන්සේ ඒ සඳහා යොදා ගත්තේ කොළ කඩාගෙන නොවේ, බිම වැටී තිබෙන කොළ භාවිත කරමින්ය.[72] මඳ වැසි තිබියදීත්, උන්වහන්සේ එළිමහනේ රාත්‍රිය ගත කිරීම පිළිබඳව ධර්ම ග්‍රන්ථ දෙකක සඳහන් වේ.[73] බුදුපියාණන් වහන්සේ අරුණෝදයට ස්වල්පයකට පෙර, භාවනා කටයුතු නිමකර උන්වහන්සේගේ දින චර්යාව ආරම්භ කළ බවට සාක්ෂි ඇත.

---

[70] S.I,107; D.II,86.
[71] Vin.I,196; S.I,107.
[72] A.I,136.
[73] S.I,104; Ud.4.

# 8. මාර්ගයේදී

වෙහෙසට පත්වූවෙකුට යෝජනා (දුර ප්‍රමාණයක්) දීර්ඝය - ධම්මපදය Dhp.60

හයවන සහ පස්වන සියවසේ මහාද්වීපික වෙළඳාම වර්ධනය වෙත්ම මජ්ඣිම දේශය පුරා මාර්ග ජාලය වර්ධනය විය. ඔවුන්ගේ ගුණාත්මකභාවය ද දියුණු විය. අඩිපාරවල් සහ කැලෑ ගමන් මගවලට ස්වල්පයක් වූ දේ ක්‍රමයෙන් ගාස්තු අය කිරීම් තුළින් නිසි තත්ත්වයට පත්වුණි. මගධ, කෝසල සහ වන්සා වැනි ශක්තිමත් මධ්‍යගත ආණ්ඩු ද මෙම පරිවර්තනයට දායක විය. මාර්ග සහ තොටුපළවල් භාවිත කිරීමට අය කරන රේගු ගාස්තු සහ රේන්ද බදු ඔවුන්ගේ භාණ්ඩාගාරය පුරවා ගැනීමට සහ භට පිරිස් ඉක්මනින් කරදරකාරී පිට පළාත්වලට යැවීමට හෝ ආක්‍රමණිකයන් වැඩෙහි යෙදවීමට රජයන්ට වෙළඳාම දිරිමත් කිරීමට අභිප්‍රායක් තිබුණි. පාරු සහ තොටුපළවල් සඳහා අය කෙරෙන රේන්ද බදු සඳහා ප්‍රමිතියක් තිබුණි. ඔබ මොබ යන තවුසන්, බ්‍රාහ්මණයන් සහ ගැබිනි මව්වරුන්ට සාමාන්‍යයෙන් නොමිලේ එතෙර වීමට ඉඩ සැලසුණි.[1] මෙම පරිවර්තනයේදී ද ආගම සුළු කාර්යභාරයක් ඉටු කරන ලදී. වන්දනා ගමන් ඒ වන විටත්, භක්තිකයන් ශුද්ධ භූමි වෙතට ආකර්ෂණය කර තිබුණි. මිනිසුන් ගයා, පයාග සහ වෙනත් තැන්වල තිබූ පූජනීය ගංගාවලට ස්නානය කිරීම සඳහා යන බව බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළහ. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේදී ප්‍රභවාත්මක සිද්ධීන් සිදුවූ ස්ථානවලට එක් වරක් හෝ යන මෙන් උන්වහන්සේ ශ්‍රාවකයන් ධෛර්යවත් කළහ. එනම්, උත්පත්තිය ලැබූ ස්ථානය, බුද්ධත්වයට පත් වූ ස්ථානය, පළමු වරට ධර්මය දේශනා කළ ස්ථානය, සහ උන්වහන්සේ පරිනිර්වාණයට පත් වන ස්ථාන වශයෙනි.[2]

ත්‍රිපිටකයේ මාර්ග වර්ග කිහිපයක් ගැන සඳහන් වේ. එනම්, අඩි පාර, කැලෑ පාර, සහ සාවත්ථි සහ විරඤ්ජ අතර දිවෙන උස් මට්ටමේ මාර්ග සහ උක්කලා සිට පැමිණ උරුවෙලා හරහා පසු කළ මාර්ගයයි. එසේම අශ්ව කරත්ත මාර්ග යැයි හැඳින්වූ මාර්ග ද තිබුණි. ඒවා බොහෝ විට, එවැනි වාහන ගමන් කළ හැකි ලෙස තරමක් හොඳින් නඩත්තු කළ හැකි ඒවා විය.[3] කෙසේ නමුත්, හොඳම මංතීරු පවා, දූවිලි සහිත, රළු, නඩත්තු කරන ලද්දේ වරින් වර පමණක් වන අතර, සමහර විට වැසි කාලයේදී පසු කර යා නොහැකි තරමය. සුමට ලෙස මතුපිට ඇති මාර්ගයක ගමන් කරන කරත්තකරුවෙකු කෙටි මාර්ගයකට අවතීර්ණ වීමෙන්, එහි සමතලා නැති

[1] *Manusmṛti* VIII,406-407. A legend recounted in the *Lalitavistara* attributes the Buddha with getting a law enacted in Magadha allowing ascetics to use ferries without payment.

[2] D.II,140.

[3] *Ekapadika*, *vanapantha*, *addhānamagga* and *rathika*, A.II,57; IV,187; Vin.I,4.

මතුපිට නිසා, ඇක්සලය කැඩීමෙන් ගමන අවසන් විය හැකි බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ.[4]

මජ්ඣිම දේශය හරහා ගලා බසින විවිධ ගංගා සන්නිවේදනයට බාධාවක් විය. පාලම් දුර්ලභ විය. ප්‍රධාන මාර්ග සමහරක් හරහා තොටුපළවල් තිබුණද, ගංගා තරණය සඳහා තිබූ ප්‍රධාන මාර්ගය වූයේ දිය බැස එගොඩ වීමයි. එවැනි පහසුකම් නොතිබූ ස්ථානවල සංචාරකයන්ට හිටි අඩියේම යමක් තනන්නට සිදුවිය. ගොපල්ලෙකු තම ගවයන් ජලයට දක්කාගෙන යද්දී භික්ෂූන් වහන්සේලා ගඟකට පැමිණි අයුරු ත්‍රිපිටකයේ විස්තර කර ඇත. ඔවුහු ගවයාගේ වලිගයේ සහ පිටුපස එල්ලී සතුන් විසින් ගෙන යන ලද බව සඳහන් වේ. [5] වඩාත් දුර බැහැර ප්‍රදේශවල ගංගා තරණය කළේ ඒ අසල ඇති ගසක අතු, අතුපතර සහ තණකොළවලින් පාරුවක් හෝ ඉපිල්ලක් හිටි අඩියේම තනා ඒ ආධාරයෙනි. කෙනෙකුගේ ගමනාන්තයට ගොඩබිමින් යෑමට විකල්පයක් ලෙස බෝට්ටුවෙන් යා හැකි විය. ආනන්ද හිමියන් බොහෝ විට, පාඨලිගාමයට, බෝට්ටුවකින් ගංගානම් ගඟේ සිට කොසම්බි තෙක් යාත්‍රා කළ බව ත්‍රිපිටකය සඳහන් කරයි. මෙය ගංගාවක දුර ගමන් සංචාරයක් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් තොරතුරු අතරින් ස්වල්ප වූ තොරතුරකි.[6] බොහෝ මාර්ග පිහිටියේ ගම්මුන් පදිංචි ප්‍රදේශ සහ ඔවුන් වගා කළ කුඹුරු ආශ්‍රිතවය. නමුත්, පසු කල කැලෑ හෝ අර්ධ-ජනශූන්‍ය වූ වල්බිහිවූ ඉඩම් මෙන් ඒවා තිබුණි. එක් මගියෙක් මෙසේ පැවසුවේය: ''මෙම ජනශූන්‍ය මාර්ගවල තිබුණේ ජලය සහ ආහාර ස්වල්පයකි. ඒ නිසා ගමනට අවශ්‍ය දේ නොමැතිව ඒ හරහා ගමන් කිරීම පහසු නැත.''[7] ග්‍රීෂ්ම කාලයේදී දිගු කාලයක් මාර්ගයේ ගමන් කරන්නට සිදුවන විට, සාපේක්ෂව, කෙටි කාලයක් වුවද, ජලය නොමැති වුවහොත්, තර්ජනයකට මුහුණ දෙන්නට සිදු වේ.

මින් ඔබ්බට, ඉන්දියාවේ සංචාරයේ යෙදෙන විට නිරන්තරව තිබූ ප්‍රශ්නයක් නම්, මංකොල්ලකෑමයි. බුදුපියාණන් වහන්සේ පැහැදිලි කළේ, සමහර මාර්ග ''බිය කරවන, අනතුරුදායක සහ කෙනෙකු එහි යන විට ආයුධයක් රැගෙන යායුතු බවයි.'' එයට හේතුව කොල්ලකෑමට හෝ නපුරට පත්වීමේ ඇති ඉඩකඩ, සහ වටිනා දේ රැගෙන ජනශූන්‍ය ප්‍රදේශයක යන මගීන්ට එයින් ආරක්ෂිතව එළියට එන විට මුහුණ දෙන්නට සිදුවන අත්දැකීම්වලින් සහනයක් ලැබිය හැකි වීමටයි.[8] සාවත්ථි සහ සාකෙත අතර ඇති මාර්ගයේ බොහෝ විට මගීන් කොල්ලකෑමට ලක් වේ. එක් කාලයකදී, අංගුලිමාල නමැති බියකරු කොල්ලකන්නා කෝසලයේ කැළෑ ප්‍රදේශයේ සිටිමින් මිනිසුන් ඝාතනය කළේය.[9] එවැනි මිනිස්සු උස්බිම්

[4] S.I,57.
[5] Vin.I,191
[6] Vin.II,290
[7] Vin.I,270
[8] Vin.IV,63; M. I,276.
[9] M. II,97; Vin.IV,87.

හරහා මතුවෙමින් පහර දෙමින් නැවත ''ඇතුළු විය නොහැකි තණකොළ හෝ ගස්, කානුවකට හෝ විශාල කැළෑවකට'' නොපෙනී යති. [10]

මෙම මිනිස්සු සමහරක් මගීන් කණ්ඩායමක් අල්ලාගෙන, අනෙක් අය වෙනුවෙන් කප්පම් මුදලක් ගෙන එන ලෙස එක් පුද්ගලයෙකු නිදහස් කරති.[11] වරක් බුදුපියාණන් වහන්සේ සහ සහායෙකු කෝසලය හරහා ගමන් කරන විට, මාර්ගයේ එක් අතු බෙදුමකට පැමිණියහ. බුදුපියාණන් වහන්සේ අතු බෙදුම හරහා ගමන් කළ යුතු බව පැවසූ අතර, සහායක අනෙක් මාර්ගයේ ගමන් කිරීමට ස්ථිරවම කියා සිටියේය. මෙම එකඟ නොවීම යම් කාලයක් තිබූ අතර, සහායකයා බුදුපියාණන් වහන්සේගේ පාත්‍රය රැගෙන ඔහු නිවැරදි යැයි සිතූ මාර්ගයේ ගමන් කළේය. ඔහුට වැඩි දුරක් යාමට නොහැකි විය. මංකොල්ලකරුවන් ඔහුට ආයුධයකින් තලා, ඔහුගේ සිවුර ඉරා දමා ඇත.[12] වඩාත් සාමාන්‍යයෙන් වුවත්, දුර බැහැර සංචාරය හුදෙක් ලෙහෙසි පහසු නොවන, වෙහෙසකාරී වන නමුත්, ඒවා සිදුකරන්නේ අවශ්‍ය වූ විට පමණි. මේවා සහ වෙනත් ප්‍රශ්න තිබියදීත්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ කාලයෙන් බොහෝ වේලාවක් සංචාරයේ යෙදුනහ. ඒ හැකි තාක් මිනිසුන් අතරට යෑමටයි. උන්වහන්සේගේ ස්ථිර අධිෂ්ඨානය සහ මහාකරුණාව එපමණය. උන්වහන්සේ විසින්ම පනවන පද නීති සහ දීර්ඝ කාලයකට පෙර සිට පැවත එන පැවිදි සම්ප්‍රදායට අනුව, උන්වහන්සේ වැසි ඍතුව මාස තුනක් එක් ස්ථානයක ද, වසරේ ඉතිරි කාලය පා ගමනින් සංචාරයේ වැඩීමද සිදු කළහ. මුළුමනින්ම සාධාරණ ලෙස ඒත්තු ගත හැකි සේ පෙනෙන, පසුකාලීන සම්ප්‍රදායට අනුව, බුදුපියාණන් වහන්සේගේ පැවිදි ජීවිතයේ වසර විසිපහෙන් පසු, අවසාන වසර හැර, උන්වහන්සේ සෑම වැසි කාලයක්ම වැඩ සිටියේ සාවත්ථියේ හෝ ඒ අවටයි.[13] එයින් පැහැදිලි වන්නේ වෙනත් ස්ථානවලදීට වඩා වැඩියෙන් එම නගරයේ උන්වහන්සේගේ ධර්මදේශනා පැවැත්වූයේ ඇයි ද යන්නයි. සැබැවක් නම්, සාවත්ථිය අවට ප්‍රදේශවල ඔබ මොබ යෑම සීමා කරන්නට උන්වහන්සේ තීරණය කළේ, උන්වහන්සේගේ වයස නිසා විය හැකිය. උන්වහන්සේට එකල වයස පනස් පහක් පමණ වන්නට ඇත. කෝසලයේ භාෂාව උන්වහන්සේගේම භාෂාව හෝ එයට සමාන විය. එසේම උන්වහන්සේගේ මව්බිමේ සිට එම නගරයට යෑමට ගතවූයේ දින හතරක් හෝ පහක් පමණි.

බුද්ධත්වයට පැමිණීමෙන් පසු, උන්වහන්සේ පෙර මිත්‍රයන් පස්දෙනා සොයා ගැනීම සඳහා සහ උන්වහන්සේ අවබෝධ කළ ධර්මය ඔවුන් සමග බෙදා හදා ගැනීමට දීර්ඝ ගමනකට අවතීර්ණ වූහ. සමාන තරමට වැදගත් ලෙස, ශ්‍රාවකයන් වූ ඔවුන්ට සහ ඊළඟ කණ්ඩායමට උන්වහන්සේගේ උපදෙස වූයේ, ග්‍රාමීය ප්‍රදේශ හරහා ඔබ මොබ ගොස්, උන්වහන්සේ ඔවුන්ට ඉගැන්වූ ''බොහෝ අයගේ සුභසිද්ධිය වෙනුවෙන්'' අනෙක් අයට උගන්වන ලෙසයි.[14] දිග්ගැස්සුණු

---

[10] A. I, 153–54; M. III, 158.
[11] Ja IV,115.
[12] Ud.90. For a modern example of such mishaps see Ajahn Sucitto and Nick Scott's highly readable *Rude Awakening*, 2010, pp.237 ff.
[13] Bv-a.4.
[14] Vin.I,5.

තේරුමක් නැති ඔබ මොබ යෑම්වලට විරුද්ධව උන්වහන්සේ භික්ෂූන්ට සහ භික්ෂුණීන්ට අනතුරු ඇඟවීම් කළහ. එසේම එක් ස්ථානයක බොහෝ කාලයක් නතරවීමද නොකළ යුතු බව උන්වහන්සේ පැවසූහ. පළමු වැන්නෙන් උගත් පැවිදි උත්තමයන් සමග කාලය ගත කිරීමේ අවස්ථාව සහ අනෙක් අය සමග ඵලදායී මිත්‍රත්වයන් ගොඩනැගීමේ අවස්ථාවද ඔවුන්ට අහිමි වේ. දෙවැන්නෙන් බොහෝ දේවල් එකතු කිරීමට හේතු වේ. ගිහියන් සහ ඔවුන්ගේ ප්‍රශ්න සමග පැටලැවීම ඒක් විශේෂ ස්ථානයකට ඕනෑවට වඩා බැඳීම ඇති වේ.[15]

බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීමේ ප්‍රගමනයේදී, උන්වහන්සේ චාරිකා කළ දුර ප්‍රමාණය පිළිබඳව අවම වශයෙන් යම් අදහසක් ලබා ගැනීමට හැකිය. එකල හිමාල පාමුල මාර්ග නොතිබූ වනාන්තරවල උතුරු දිසාවේ උන්වහන්සේගේ චාරිකා සීමිත විය. නමුත්, උන්වහන්සේ පිළිබඳ එක් සඳහනක් ඇත. ඒ වරක් කෝසලයෙන් පාලනය වූ කඳුකරයේ කොටසක තිබූ වනාන්තරයේ ගෙපැලක, උන්වහන්සේ වැඩ සිටීම පිළිබඳවයි.[16] යමුනා තැනිතලාවේ ගංගානම් ගඟේ දකුණු අද්දර කඳුවලට, මිස්‍රපූර් කන්ද, රජ්මහල් කන්ද සහ වින්ධ්‍යාචිල් අන්තරයට උන්වහන්සේ කිසිදිනක වැඩිය බවට හෝ ඒවා වෙත ළඟා වූ බවට කිසිදු සාක්ෂි නැත. උන්වහන්සේ කවරදා නමුත් වැඩි නැගෙනහිර දුරතම ප්‍රදේශය වූයේ භද්දියනගර සහ ළඟ පිහිටි කජංගල සහ බටහිර දුරතම ප්‍රදේශය මධුර බවට තවමත් හඳුනාගත හැකිය.

මෙම පළමවු සඳහන් ප්‍රදේශ භගල්පුර් දිස්ත්‍රික්කයේ නූතන නගර වන භදරිය සහ කන්ජල්, බිහාර් යනුවෙන් අනුරූපී වේ. එසේම, මථුරා යනු නූතන මධුර වන අතර, එය දිල්ලියේ දකුණට කිලෝමීටර් එකසිය හැටක් දුරින් පිහිටා ඇත. භගල්පුර් දිස්ත්‍රික්කය සහ මධුර කිලෝමීටර් 1000කට ආසන්නව ඇද නැති රේඛාවකින් එකිනෙකට දුර ප්‍රමාණයෙන් පිහිටා ඇත. බුදුපියාණන් වහන්සේ කෙතරම් ගැඹුරෙන් මෙම ප්‍රදේශය ආවරණය කළේද යන්න නිශ්චිත නැත. නමුත්, අවුරුදු පනහක් පයින් ගමන් කිරීම තුළ, උන්වහන්සේට එතරම් දුරක් පහසුවෙන් සංචාරය කරන්නට ඉඩ තිබුණි. බුදුපියාණන් වහන්සේ සංචාරය කළ හෝ පසු කළ පුරවර, නගර, ගම්, කඳුවැටි, ගුහා, ගංගා, වනාන්තර සහ වෙනත් බිම් සළකුණක් වශයෙන් ත්‍රිපිටකයේ ස්ථාන නවසියයකට වඩා නම් වශයෙන් සඳහන් වේ. ඒ අනුව, උන්වහන්සේ අවම වශයෙන් වර්ග අඩි කිලෝමීටර් 280,000ක දුර ප්‍රමාණයක් ඔබ මොබ ගමන් කර ඇත. නමුත්, මෙයින් වැඩි ප්‍රමාණයක් සංචාරය කර ඇත්තේ මෙම ප්‍රදේශවල නැගෙනහිර කොටසේ විය යුතුයි. එනම්, සාවත්ථියේ, රාජගහ, වේසාලි සහ කොසැම්බිවල විශාල නගර අතරයි. බුදුපියාණන් වහන්සේ සමහර විට ගමන් කළ දුර ප්‍රමාණ පිළිබඳව යම් අදහසක් දෙමින්, උන්වහන්සේගේ සංචාර බොහොමයක සැරිසැරුම්

[15] A.III,257-8.
[16] S.I,116.

විස්තර සටහන් ත්‍රිපිටකයේ සඳහන් වී ඇත. උදාහරණ වශයෙන්, බුද්ධත්වයට පත්වීමෙන් පසු පළමු මාස දොළහ තුළදී උන්වහන්සේ උරුවෙලාවේ සිට ගයාව සහ බාරාණසී හරහා ඉසිපතනයට වැඩිය බවත්, වැසි ඍතුවේ මාස තුන එහි ගත කර, ඊට පසු එතැන සිට ගයාවටත්, ඊට පසු ලතිවාන සහ රාජගහට වැඩිය බවත් අපි දන්නෙමු. පුරාවිද්‍යාත්මක කැණීම් සඳහා ඉඩදීමට මෑතදී කඩා බිඳ දමන ලද යුරෙල් ගම්මානය පිහිටා තිබූ බුද්ධ ගයාවේ මහාබෝධි සිද්ධස්ථානයට යාබදව තිබූ පස් කන්දක් උරුවෙලාවෙන් නියෝජනය කරන ලදී. අවාසනාවට මෙන්, යුරල් (ටාටාඩි) හි දස අවුරුදු කැණීම් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් මෙතෙක් ප්‍රකාශයට පත් කර නොමැත. ලතිවාන දැන් ජෙටිසන් සමග රාජගිර්ට නිරිත දෙසින් කිලෝමීටර් පහක් පමණ හඳුනාගෙන ඇත. මේ සියල්ල නිශ්චිතවම හඳුනාගත හැකිය. ඒ නිසා අවම වශයෙන් උරුවෙලාවේ සිට රාජගහට කිලෝමීටර් 300ක්වත්, බුදුපියාණන් වහන්සේ ඇවිදින්නට ඇතැයි ගණනය කළ හැකිය. තවත් සංචාරයකදී උන්වහන්සේ වෙරඤ්ජ සිට බාරාණාසී හරහා සොරෙයිය, සංකස්ස සහ පයාගවල තිබෙන ගංගානම් ගඟ තරණය කරමින් කණ්ණකුජ්ජට වැඩම කර ඇත. ධර්ම ග්‍රන්ථයේ පැහැදිලිව සඳහන්ව නොමැති වුවත්, සමහර විට උන්වහන්සේ පයාගවල සිට බාරාණාසීයට ගංගානම් ගඟ තරණය කිරීමට බෝට්ටුවක් ගන්නට ඇත.[17] වෙරඤ්ජ යනු ‘එටහ’ සමීපයේ පිහිටි නූතන අත්රන්ජි බෙර වන අතර, කණ්ණකුජ්ජ යනු නූතන කන්නවිජ් වේ. මේ දෙකම පිහිටියේ උත්තර් ප්‍රදේශයේය. පැරණි පයාග, නූතන අල්ලහබාද්වලින් හරහා පිහිටි ගංගාවේ ඝුසි සමග හඳුනාගෙන ඇත.[18] මෙම සංචාරය තුළ අවම මට්ටමින් කිලෝමීටර් හයසියයක් වත් ඇවිදීම අවශ්‍ය වන්නට ඇත. ත්‍රිපිටකයේ සඳහන් දීර්ඝතම තනි ගමන වූයේ බුදුපියාණන් වහන්සේ රාජගහ සිට වේසාලියට සහ සාවත්ථියට සහ නැවත කිතිගිරි සහ අයිර්ව යේ නූතන නගරය වූ ආලවී හරහා රාජගහට වැඩම කිරීමත්ය. මෙය කිලෝමීටර් 1,600ක සම්පූර්ණ ගමනකි.[19] මෙවැනි ගමනක් උන්වහන්සේ ආරම්භ කරන්නට ඇත්තේ වැසි ඍතුවක අවසානයේ වන්නට ඇත. ඊට පසු, නියම කලට ඊළඟ මාස නවය ගත කිරීම සඳහා ආපසු වඩින්නට ඇත.

මෙහිදී පැමිණෙන ඕනෑම කෙනෙකුට දින කිහිපයක් ආහාර ලබා දුන්හ. වරක් භික්ෂූන් වහන්සේලා පිරිසක් දානය සඳහා නවාතැනට නිතර නිතර වැඩියහ. ප්‍රදේශවාසීහු මැසිවිලි නගමින් මෙසේ කීහ: ‘‘දානමය ආහාර ඔවුන්ට පමණක් සූදානම් කර නැත. ඒවා සැම අයම සඳහාය.’’ භික්ෂූන් කෑදරකම පිළිබඳව අපකීර්තියක් නොලැබිය යුතු යැයි අවධානය යොමු කළ බුදුපියාණන් වහන්සේ භික්ෂූන් එවැනි ස්ථානවලට ඔවුන් රෝගීව සිටින විටදී හැර, එක් වරකට වඩා වැඩියෙන් නොගිය යුතු යැයි නීතියක් පැනවූහ. එසේම භික්ෂූන් සංචාරය කරන විට කුඩයක් හෝ ඇවිදීමට යෂ්ටියක් ගෙන ගිය යුතු නැති බවටද නීතියක් පැනවූහ. එයට හේතුව ඒවා බලය සහ

[17] Vin.III,1-11.
[18] Chakrabarti, 2001 p.263.
[19] Vin.IV,189.

තත්ත්වය පිළිබිඹු කරන නිසාය. එසේම උන්වහන්සේගේ භික්ෂූන් අනෙක් අයට වඩා උසස් යැයි සිතමින් හෝ හැසිරෙමින් සිටින පුද්ගලයන් යැයි මිනිසුන් සිතීම උන්වහන්සේට අවශ්‍ය නොවීය.

බුදුපියාණන් වහන්සේගේ චාරිකා සඳහා කොපමණ කාලයක් ගතවී ඇත්දැයි දැන ගැනීමට කළ හැක්කේ අනුමාන කිරීමෙන් පමණි. ප්‍රසිද්ධ මහාපරිනිබ්බාන සූත්‍රයෙන් අපට දැන ගන්නට ලැබී ඇත්තේ, උන්වහන්සේ රාජගහ සිට කුසිනාරාවට නාළන්දා, පාඨලිගාම, නූතන පැට්නා, සහ වේසාලී හරහා, කිලෝමීටර් තුන්සියයක් පමණ වූ සම්පූර්ණ දුර ප්‍රමාණයක් ගමන් කර ඇති බවයි. ධර්ම ග්‍රන්ථවලට අනුව, උන්වහන්සේ වේසාලියෙන් පිටවූයේ වැසි ඍතුවේය, එනම්, (ඔක්තෝබර් මැදදී). සම්ප්‍රදායෙන් සඳහන් කරන්නේ උන්වහන්සේ පරිනිර්වාණයට පත්වන්නේ වෙසාඛ (මැයි -ජූනි) පුර පෝය දින කුසිනාරාවේ බවයි. මෙයින් අදහස් වන්නේ බුදුපියාණන් වහන්සේට කිලෝමීටර් අනූ පහක් ගමන් කිරීමට මාස හතක් ගතවූ බවයි. උන්වහන්සේගේ මහලු බව සහ රෝගී බව යන කරුණුවලට ඉඩ හරිමින් වුවද, මෙය දීර්ඝ කාලයක් ලෙස පෙනී යයි. කෙසේ වෙතත්, උන්වහන්සේ වැසි ඍතුව අවසන් වීමෙන් පසු කලක් වේසාලියේ රැඳී සිටින්නට ඇති බවත්, පෙන්වා දිය යුතුව ඇත. උන්වහන්සේ වෙසාඛ මස පරිනිර්වාණයට පත්වූ බවක් ත්‍රිපිටකයේ කොතැනකවත් පැහැදිලිව සඳහන් නොවේ.

බුදුපියාණන් වහන්සේ චාරිකාවක වඩින විට, හිරු උදාවට පෙර අවදිවී, උන්වහන්සේ නතරවී සිටින ස්ථානයට ආසන්නතම ප්‍රදේශයට, ගම්මානයට නගරයට හෝ පුරවරයට පිණ්ඩපාතයට වඩින බව අනුමාන කළ හැකිය. දානය වැළඳීමෙන් පසු, සිසිල් කාලගුණය තිබියදීම උන්වහන්සේ පිටත් වේ. දහවල් උෂ්ණත්වය අපහසු තත්ත්වයට පත්වන තුරු ඇවිද, ඊට පසු පස්වරුවේ ගිමන් නිවා ගැනීම හෝ මාර්ගයේ ගම්මානයක නැවතීමට තැනක් ඇත්නම්, හෝ සාකච්ඡා කිරීමට පුද්ගලයන් සිටී නම්, එම දිනයේ හෝ දින කිහිපයක් එහි නතර වීම සිදු වේ. නගරයකට හෝ ගම්මානයකට පස්වරුවේ පැමිණියේ නම්, උන්වහන්සේ සමහර විට ඊළඟ දින අළුයම වන තුරු එහි රැඳෙති.

බුදුපියාණන් වහන්සේ පාර අයිනේ නවාතැනක, කමතක, බ්‍රාහ්මණයෙකුගේ ගිනි පූජා පවත්වන ශාලාවක, වියපත් කුඹල්කරුවෙකුගේ මඩුවක සහ වෙනත් කිසිම තැනක් නොමැති නම්, එළිමහනේ ගස් යට සැතපුණු බවට වාර්තා ඇත.[20] වරක් කපිලවත්ථුවට ආපසු වඩින විට, උන්වහන්සේට නවාතැන් ගැනීමට ස්ථානයක් නොමැති වූ නිසා, භාරණ්ඩු භික්ෂුවගේ සරල අසපුවේ නවාතැන් ගන්නට සිදුවිය. උන්වහන්සේ කුරු රටේ සිටින විට, තණකොළ ඇතුරූ කුඩා ගෙපළ මඩුවක උන්වහන්සේ වැඩ සිටියහ.[21] සුදුසු අවස්ථාවල බුදුපියාණන් වහන්සේ ආගමික සිද්ධස්ථානවල හෝ ප්‍රාදේශීය පූජනීය වෘක්ෂයන් අසල ලැගුම් ගත්හ. මෙම ස්ථානවල බොහෝ විට ඒ අසළ යම් ආකාරයක නිවහනක්, සමහර විට කණුවලින් නිමවූ ශාලා තිබුණි. ඉඳහිට විශාල ලෙස එකතුවූ පිරිස් මේවායේ

[20] M. I,206; D.II,131; A.I,136; M.III,238.
[21] A.I,276ff; M.I,501.

දකින්නට ලැබුණි. අනෙක් ඒවායේ යාබදව පිහිටියේ කුඩා ගෙපල් මඩු පමණක්ය. අවම පහසුකම් සහිත වූවත්, රාත්‍රියන් කිහිපයක් නවාතැන් ගැනීමට සුදුසුය.

තවත් විකල්පයක් වූයේ රජයෙන්, සමාජ හෝ බැතිමතුන් විසින් සමහර මාර්ග හෝ නගරවල සංචාරකයන්ගේ පහසුව පිණිස ගොඩනැගූ නවාතැනක නතර වීමයි. බොහෝ නගරවල, ඒවායේ ප්‍රධාන දොරටුවලින් පිටත එවැනි ගොඩනැගිලි තිබූ අතර, දොරටු වසා තැබීමෙන් පසු රාත්‍රියේ පැමිණෙන සංචාරකයන්ට නතර වන්නට යම් ස්ථානයක් තිබුණි.[22] එසේම රජවරුන් හෝ රාජකාරි සඳහා සංචාරය කරන රජයේ නිලධාරීන්ට රාජකීය නවාතැන් ද තිබුණි.[23] බොහෝ පොදු සංචාරකයන්ගේ නවාතැන් සඳහා නවාතැන් පහසුකම් සපයා තිබූ අතර, උදාහරණයක් ලෙස, උත්තර නගරයේ, ප්‍රධානියා වන පාඨලිය මූලික පහසුකම් පමණක් ඇති, නමුත්, ප්‍රමාණවත් ගෘහභාණ්ඩ සහිත ගොඩනැගිල්ලක් ඉදිකර නඩත්තු කළේය.[24] පැමිණෙන ඕනෑම කෙනෙකුට සුළු පිරිසක් ආහාර සපයන ලදී. වරක් භික්ෂූන් කණ්ඩායමක් දානය සඳහා නවාතැනකට ගිය විට, බොහෝ විට එහි පිරිස එයට මෙසේ කියමින් නොසතුට පළ කළහ: ''දානය ඔවුන්ට පමණක් පිළියෙල නොකෙළෙමු. ඒවා පිළියෙල කර ඇත්තේ අනිත් අය සඳහාය.'' තමන්වහන්සේගේ භික්ෂූන්ට කෑදරකම පිළිබඳව ප්‍රසිද්ධියක් ලැබේයැයි චින්තාපරයක් ඇති වූ බුදුපියාණන් වහන්සේ එවැනි ස්ථානවලට පොදු දාන සඳහා එක් වරකට වඩා නොගිය යුතු බවට නීතියක් පැනවූහ.[25]

බුදුපියාණන් වහන්සේ එක් විශේෂිත ස්ථානයක කෙතරම් කලක් නතරවී සිටින්නේද යන්න බොහෝ හේතු සාධක මත රඳා පැවතුණි - ඒ ප්‍රදේශයේ මිනිසුන් උන්වහන්සේ සමග කතා කරන්නට සහ සවන් දෙන්නට පැමිණියේද, දානය සහ ජලය ඒ ප්‍රදේශයේ තිබේද, සහ පරිසරය ප්‍රසන්නද යනාදියයි. විශාල ජනගහනයක් සිටින නවාතැන්වල රැඳී සිටින විට, උන්වහන්සේට සාධාරණ සැප පහසුකම් ලැබෙන්නට ඇත, හොඳින් අවශ්‍ය දේ සපයන්නට ද ඇත. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පත්වීමෙන් පසු රාජගහ නුවරට නැවත පැමිණෙන විට, බිම්බිසාර රජු ඔහුගේ එක් විනෝද උයනක් වූ වේළුවනාරාමය මහාසඞයා වෙනුවෙන් දන් දුන්නේය. ඉන් පසු, බොහෝ අය ඊළඟ දශකවල දන් දුන්හ. එවැනි ඉඩම්වල පළමු ආරාම කුඩා සෙවිළිකළ වරිච්චි සහ උඩින්පල්ලෙන් සාදන ලද ගෙපළ මඩු හෝ සහ කොළඅතු, පත්‍ර හෝ තණකොළවලින් සාදන ලද නිවාසවලට වඩා ටිකක් වැඩිය. වඩා ස්ථිර ව්‍යූහයන් සහිත ගොඩනැගිලි බිහිවූයේ බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනයේ පසුකාලයේදීය. අවශ්‍යතාව අනුව බිහිවූ පළමු විශාල ආරාම සංකීර්ණය වූයේ ජේතවනයයි. එහි ශාලා, ඇවිදීමට මාර්ග,

---

22 E.g. Ja.I,115.

23 It is not clear what the difference was between *āvasathāgāra, āgantukāgāra, āvasatha* and *sālāya nivāsa* if any, S. IV,219, Ja; I,115; IV,147; Vin. IV,16. The first two were certainly open to anyone, as the Buddha mentions that evenlow caste travellers could lodge there, while the last one mayhave been some typeof commercial lodge or hotel. In some places it was necessary to seek permission to stay in the local hall, Vin.IV,17. Some towns had alms halls, *dānasālā*,which probably doubled as public traveller's rests, Ja. I,231.

ළිං, නාන කාමර සහ වෙනත් පහසුකම් තිබුණි.[26] මෙම ආරාමය දොළොස්වන ශතවර්ෂයේ ඉන්දියානු බුදුදහමේ අවසාන දින වනතුරුම සශ්‍රීකව පැවතුණි.

ඔබ මොබ යෑමෙන් ජීවිතයට ලැබූ නිදහස බුදුපියාණන් වහන්සේ භුක්ති විඳින්නට ඇත. උන්වහන්සේ මෙසේ පැවසූහ: ''ගෘහස්ථ ජීවිතය බාධාවලින් පිරී ඇත, එය දූවිල්ලෙන් පිරුණු මාර්ගයකි. ලෞකික දේ අත්හළ පුද්ගලයාගේ ජීවිතය මද පවන මෙන් නිදහස්ය.''[27] එක් ස්ථානයකින් තවත් ස්ථානයකට යෑමෙන් උන්වහන්සේට ධර්ම ප්‍රචාරණයට ඉඩ සැලසුණි. නමුත්, එයින් පසුපස තවත් හේතු තිබුණි. උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට, විශේෂයෙන්ම, අලුතින් පැවිදි වන භික්ෂූන් සහ භික්ෂුණීන්ට උන්වහන්සේ සමග පෞද්ගලික හමුවීමක් වැදගත් බව බුදුපියාණන් වහන්සේ දැන සිටියහ. මෙම කාරණය උන්වහන්සේ චාරිකා කළේ කුමන දිස්ත්‍රික්කය ද සහ කෙතරම් කාලයකින් ද යන්න තීරණය කිරීමට සාධකයක් විය.[28] උන්වහන්සේගේ සැරුයුම් තුළ දී, උන්වහන්සේ එක් දිස්ත්‍රික්කයකට ගොස්, උගන්වා, යම් ශ්‍රාවකයන් පිරිසක් බිහි කර, භික්ෂු භික්ෂුණීන් පැවිදි කිරීම් පවා කර, ඊට පසු සමහර විට වසර ගණනාවකට එහි නොඑන්නට ද ඇත. ගෘහස්ථ බැඳීම් ඇති ගිහි ශ්‍රාවකයන්ට බුදුපියාණන් වහන්සේ හමුවීමට දීර්ඝ ගමන් යෑම අපහසු විය. ඒ නිසා ඔවුන්ට උන්වහන්සේ නැවත දැකීමට සමහර විට අවුරුදු ගණනාවක් බලා සිටීමට සිදු විය. බුදුපියාණන් වහන්සේ තමන්ගේ ගමට ද වඩින්නට ඉඩ ඇති බවට දුරින් පිහිටි දිස්ත්‍රික්කයක වැසියන් දැනගත් විට, උන්වහන්සේ ක්‍රම ක්‍රමයෙන් ඔවුන් වෙත ප්‍රවේශ වන බවට වචනය ඔවුන්ගේ උනන්දුව කෙතරම් වැඩිවූයේද යන්නත් යම් අදහසක් ධර්ම ග්‍රන්ථයකින් දක්වා ඇත.[29] වරක් බුදුපියාණන් වහන්සේ සමග සාවත්ථියේ වැසි ඍතුව ගත කළ භික්ෂුවක් කපිලවත්ථුවට පැමිණියේය. මිනිසුන් එම භික්ෂුව පැමිණියේ කොහෙන්ද කියා දැනගත් විට, ඔවුහු බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ උගන්වන දේ පිළිබඳව වදන් ප්‍රවාහයකින් ප්‍රශ්න කළහ.[30]

ස්වභාවිකව, බුදුපියාණන් වහන්සේට එක විට සෑම තැනකම සිටින්නට නොහැකිය. ඒ නිසා, සමහර විට භික්ෂූන් සහ භික්ෂුණීන්ට උන්වහන්සේ බැහැ දැකීමේ වරප්‍රසාදය ලබා ගැනීමට දීර්ඝ චාරිකා සිදු කරන්නට සිදු විය. උදාහරණ වශයෙන්, උන්වහන්සේ චතුමාවල වැඩ සිටින විට, උන්වහන්සේ සමග සිටිමින් උන්වහන්සේට සවන් දීම සඳහා භික්ෂූහු සිය ගණනක් පැමිණියහ.[31] තවත් උදාහරණයක් නම්, මහා කච්චාන රහතන් වහන්සේගේ භාරකාරත්වයෙන් පැවිදි වූ සොන කුටිකණ්ණ භික්ෂුව සම්බන්ධයෙනි. වසරකට පමණ පසු, ඔහුට තමන් කැපවූ ධර්මයේ පියා වූ බුදුපියාණන් වහන්සේ දැකබලා ගැනීමට කැමැත්තක් ඇති විය. ඔහු මෙසේ තම ගුරුවරයාට පැවසුවේය :'' මා තවමත් බුදුපියාණන් වහන්සේ හමුවී නැත. මා උන්වහන්සේ කෙබඳු පුද්ගලයෙක්ද යන්න පමණක් අසා ඇත්තෙමි. ඔබවහන්සේ මට අවසර දෙන්නේ නම්, මම බුදුපියාණන්

---

[27] D.I,62.
[28] S.III,90.
[29] S.V,348-349.
[30] S.V,450.
[31] M.I,456.

වහන්සේ දකින්නට යන්නෙමි.''[32] ඔහුට මෙම කැමැත්ත ඉෂ්ට කර ගන්නට හැකි විය.

බුදුපියාණන් වහන්සේ හමුවීමට උන්වහන්සේ වැඩ සිටින්නේ කොහේ දැයි දැන ගැනීමට කැමති අයට, ඔවුන් දුර බැහැර ප්‍රදේශයකින් හෝ වෙනත් රටකින් පැමිණියහොත්, ඔවුන්ට ගැටලුවක් ඇති බව සොයා ගත හැකිය. නමුත්, පසේනදී රජුගේ රාජඅංගනයේ බුදුපියාණන් වහන්සේ මහත් ගෞරවයෙන් අගය කරන්නාවූ නිලධාරියෙකුට ඕනෑම අවස්ථාවක බුදුපියාණන් වහන්සේ සිටිනා ස්ථානය හෝ උන්වහන්සේ චාරිකා කරන්නේ කොහේ සිට කොහාටද යන්න සමහර විට දැනගන්නට හැකි විය. ඒ අනුමාන කරන පරිදි, ඔහුට භික්ෂූන්ගෙන්, වෙළඳුන්ගෙන් හෝ පිටස්තර දිස්ත්‍රික්කවලින් පැමිණෙන ඔහුගේ රාජකීය මිත්‍රයන්ගෙන් ලැබෙන තොරතුරුවලින්ය.[33]

බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට මජ්ඣිම දේශයෙන් පිටත මිනිසුන් පැමිණි බවට ඇත්තේ උදාහරණ තුනක් පමණි. උන්වහන්සේගේ කීර්තිය ඉන්දියාවට යාබද ප්‍රදේශවලට පැතිරී තිබුණු බවට සාක්ෂි ඇත. බාවරි භික්ෂුවගේ ශ්‍රාවකයන් දහසයදෙනා ගොදාවරියේ සිට, සමහර විට මහාරාෂ්ට්‍ර හරහා ගලාබසින ස්ථානයේ සිට, මජ්ඣිම දේශයට බුදුපියාණන් වහන්සේ හමුවීමේ බලාපොරොත්තුවෙන් පිටත්වූ බවට විස්තරයක් ඇත. බුදුපියාණන් වහන්සේ සාවත්ථියේ වැඩ සිටින බව අසා ඔවුහු කොසැම්බි සහ සාකේත හරහා සාවත්ථියට පැමිණි නමුත්, ඊට ටික වේලාවකට පෙර පිටත්වූ බව දැනගන්නට ලැබුණි. එවිට ඔවුහු උන්වහන්සේ වැඩිය මග, සෙතව්‍ය, කපිලවත්ථු, කුසිනාරා, පාව සහ වේසාලි, හරහා ගිය අතර, අවසානයේ පසන්ක සිද්ධස්ථානයේදී උන්වහන්සේ හමුවූහ.[34] බාක් ඇඟලුම් කම්හලේ 'බාහිය' නමැති භික්ෂුව බුදුපියාණන් වහන්සේ බැහැදැකීම සඳහා සියලු දුර ගෙවා සුප්පාරක සිට පැමිණ ඇත.[35] සොපරා යනුවෙන් දැන් හඳුන්වන මෙම ස්ථානය බොම්බායේ සිට කිලෝමීටර් පනස් පහක් පමණ උතුරින් ඉන්දියාවේ බටහිර වෙරළ තීරයේ පිහිටා ඇත. බුදුපියාණන් වහන්සේගේ කීර්තිය මෙතරම් දුරක් ගමන් කළ හැකි බවක් සහ බාහියට මෙතරම් කිලෝමීටර් 1300ක් වැනි දුරක් ගමන් කළ හැකි බවත්, එය මුලින් පෙනෙන තරමට ඇත්තක් විය නොහැකි බනත් පෙනී යයි. සොපරා යනු ප්‍රධාන වරායක් වන අතර, කොසම්බි හි ආරම්භ කළ විශාල අධිවේගී මාර්ගය වන දක්ඛිණාපාථයේ පර්යන්තය වේ. එය ක්‍රි. පූ. පස්වන ශතවර්ෂයේදීත්, ප්‍රධාන අධිරාජ්‍යයක් විය. වෙළෙන්දන් බුදුපියාණන් වහන්සේ පිළිබඳ තොරතුරු සොපරා වෙත ගෙන එන්නට ඇති අතර, බාහිය මජ්ඣිම දේශයට වෙළඳ තවලමක යන්නට ඇත.[36] තවත් කතාවකින් අවන්ති රාජධානියේ සිට සොණ භික්ෂුව බුදුපියාණන් වහන්සේ බැහැදැකීමට පැමිණීම පිළිබඳව සඳහන් කරයි. අවන්ති යනු මජ්ඣිම දේශයට දකුණින් පිහිටි රාජධානියක් වේ. එය දක්ඛිණාපථයෙන්

[32] Ud.58.
[33] S.V,349-350.
[35] Ud.6. On ascetic's garments made of barksee Dhammika 2018c, p.160.
[36] On the Buddhist antiquities from Soparasee Falk, 2006, p.136-138.

සම්බන්ධ වී ඇත.[37] එකල සිටි භික්ෂූන් කෙතරම් සංචල ජීවිතයක් ගත කරන්නට ඇත් දැයි මෙම කථාවලින් පෙන්නුම් කරයි.

අද වන විට එම ප්‍රදේශයේ බොහෝ භාෂා සහ ප්‍රාදේශීය භාෂාවන් මජ්ඣිම දේශයේ කතා කරන්නට ඉඩ තිබිය හැකිය. පුළුල් ලෙස සංචාරය කළ බුදුපියාණන් වහන්සේ වැනි පුද්ගලයෙකුට එවැනි තත්ත්වයක් විශේෂ ගැටලු ඇති වන්නට ඉඩ තිබුණි. ථේරවාද සම්ප්‍රදායට අනුව, බුදුපියාණන් වහන්සේ මගධ භාෂාවෙන් කථා කළ බව කියන නමුත්, උන්වහන්සේගේ මව් භාෂාව කුමක්ද යන්න ත්‍රිපිටකයේ සඳහන් නොවේ. වෙළෙඳුන්, රාජ්‍ය තාන්ත්‍රිකයන් සහ වෙනත් ප්‍රදේශවල නිතර දුර ගමන් යෑමට අවශ්‍ය වූ වෘත්තීන්වල යෙදුණු අය මෙන්ම, උන්වහන්සේද භාෂා කිහිපයකින්ම නිපුණ වන්නට ඉඩ ඇත. බුදුපියාණන් වහන්සේ පැවසුවේ තම භාෂාව හෝ ප්‍රාදේශීය භාෂාවක් වෙනත් භාෂාවක් කතා කරන ප්‍රදේශයක භාවිත කිරීමට බල කිරීමෙන් ඇති වන්නේ ව්‍යාකූලත්වයට පත්වීමට සහ භේදය ඇති වීමට හේතුවක් ඇති වීම පමණක් බවයි:

> ''මෙසේ කියා ඇත, 'කෙනෙකු දේශීය භාෂාව කෙරෙහි වැඩි අවධානයක් යොමු නොකළ යුතුයි...' කෙනෙකු මෙය සිදු කළ යුත්තේ කෙසේද? විවිධ ප්‍රදේශවල ඔවුන් එකම දෙය බඳුනක්, බේසමක්, පිඟානක්, පිඟන් කෝප්පයක්, කෝප්පයක්, පියනක් සහිත සුප් බඳුනක්, බොකුටු බහාලුමක් හෝ වටකුරු භාජනයක් ලෙස හැඳින්විය හැකිය. නමුත්, ඔවුන් එක් ප්‍රදේශයක එය එසේ හැඳින්වුවත්, යමෙක් එම වචනය භාවිත කරමින් සිතන්නේ 'මෙම පුද්ගලයා එම දෙය අදහස් කරමින් මෙසේ හඳුන්වයි' සහ යමෙක් එම වචනය ඒ අනුව භාවිත කරයි.'' යනුවෙනි.[38]

කිසිම භාෂාවක් තමන් වහන්සේගේ ධර්මය වෙනත් කිසිම භාෂාවකට වඩා හොඳින් සන්නිවේදනය කළ බව බුදුපියාණන් වහන්සේ විශ්වාස කළේ නැත: බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: '' මට අවශ්‍ය වන්නේ බුදුන්ගේ වචන ඔබේම භාෂාවෙන් ඉගෙන ගැනීමටයි.''[39] බුදුපියාණන් වහන්සේ ප්‍රාදේශීය සිරිත් විරිත් සම්බන්ධයෙන්ද සමානව විවෘතව සිටියහ. එක් අවස්ථාවකදී උන්වහන්සේ මෙසේ පැවසූහ:

> ''වංශවත් පුද්ගලයන්, බ්‍රාහ්මණයන්, ගෘහපතියන්, භික්ෂූන් සහ දෙවිවරුන්ගේ... එක්රැස්වීම් මට පැහැදිලිව මතකය. මම සහභාගී වී ඇත්තෙමි. මම ඔවුන් සමග වාඩි වීමට පෙර, ඔවුන් සමග කතා කළෙමි, හෝ ඔවුන්ගේ සංවාදවලට සම්බන්ධ වූවෙමි, මම ඔවුන්ගේ ප්‍රකාශ, කතාවන් කුමක් වුවත් අනුමත කළෙමි. ඊට පසු ඔවුන්ට ධර්මයෙහි උපදෙස් දුන්නෙමි.''[40]

[37] Ud.58.
[38] M.III, 235.
[39] Vin.II,139.
[40] D.II,109, condensed.

ශිෂ්ට, විවෘත මනසක් සහ හොඳින් සංචාරය කළ පුද්ගලයෙකුගෙන් යම් කෙනෙකු අපේක්ෂා කරන්නේ මෙයයි. බුදුපියාණන් වහන්සේ කුමන පුද්ගලයෙකු වුවත්, උන්වහන්සේ පටු අදහස් නොදැරූහ. උන්වහන්සේගේ චාරිකා නිසා, වඩාත් නම්‍යශීලී වූහ. වෙනස්කම් ඉවසා දරා සිටි බවට සැකයක් නැත.

# 9. ප්‍රශංසා සහ චෝදනා

සම්පූර්ණයෙන්ම චෝදනාවට හෝ ප්‍රංසාවට ලක් වූවෙකු
කිසිදා සිටියේ නැත, කිසිදා සිටින්නේද නැත.
ධම්මපදය 228

මෙතරම් දීර්ඝ කාලයක් තිස්සේ ප්‍රසිද්ධ වාදබිමේ සිටිමින්, ජීවත්වෙන බොහෝ දෙනාට අභියෝග කරන අදහස් ප්‍රකාශ කරමින්, බුදුපියාණන් වහන්සේ සැබැවින්ම විරුද්ධත්වය, විවේචන සහ සමහර විට වෛරය පවා ආකර්ෂණය කර ගත්හ. මෙය සිදු වූ විට, උන්වහන්සේ තම ස්ථාවරය සාධාරණීකරණය කිරීමට උත්සාහ කළේ, සන්සුන්ව සහ තමන්වහන්සේගේ විවේචකයන්ට පෙරළා පහර නොදෙමින්, තමන්වහන්සේ වඩාත් හොඳින් පැහැදිලි කර ගනිමින්ය. ඒ හා සමානවම උන්වහන්සේ ශ්‍රාවකයන්ට උපදෙස් දුන්නේ ප්‍රකෝප නොවන ලෙසයි. නමුත්, උන්වහන්සේ, භික්ෂූන්, හෝ ඉගැන්වීම් විවේචනවලට වැරදි ලෙස නිරූපණය කිරීම පිළිබඳව ඉලක්කයන් වූ විට, හෝ මෙම කණ්ඩායම් තුනම ඇගයීමට ලක් වූ විට ද හැකිතාක් උපේක්ෂා සහගතව රැඳී සිටින ලෙසයි.

> ''යම් කෙනෙක් මා, ධර්මය හෝ සඞගයා විවේචනය කරන්නේද, එයට ඔබ කෝපයට පත්වීම, නුරුස්සන හෝ කැළඹිය යුතු නැත. ඔබ එසේ කළහොත්, එය ඔබට බාධා කරනු ඇත. ඔවුන් කිව්වේ නිවැරදි දේ ද නැතහොත් වැරදි දේ ද කියා ඔබට දැනගන්නට නොහැකි වේ. ඔබට එසේ හැකිවේද?''
> ''නැත, ස්වාමීනී.''
> '' එම නිසා, අනෙක් අය මා, ධර්මය හෝ සඞගයා විවේචනය කළහොත්, හුදෙක් වැරදි දේ පහදා දෙන්න, 'එය වැරදියි. එය හරි නැත. එය අපේ ක්‍රමය නොවේ. අපි එය නොකරමු.' ඒ ආකාරයට, අනෙක් අය මා, ධර්මය හෝ සඞයා වර්ණනා කරන්නේ නම්, ඒ නිසා ඔබ සතුටු නොවිය යුතුයි, උද්දාමයට පත් නොවිය යුතුයි, හෝ ස්වයං-තෘප්තිමත් නොවිය යුතුයි. ඔබ එසේ වුවහොත්, එයින් ඔබට බාධා ඇති වේ. එම නිසා, අනෙක් අය මා, ධර්මය හෝ සඞගයා වර්ණනා කළහොත්, එවිට හුදෙක් නිවැරදි දේ මෙසේ පැහැදිලි කළ යුතුයි: 'එය නිවැරදියි. එය හරි දේ. ඒ අපේ ක්‍රමයයි. අප කරන්නේ එසේය.''' [1]

බුදුපියාණන් වහන්සේට බුද්ධතවය ලැබී වසරක් තුළ, උන්වහන්සේ පෙර මිතුරන් පස්දෙනා ශ්‍රාවකයන් ලෙස පත්කර ගත්හ. ඒ පස්දෙනා යස නමැති ධනවත් තරුණයා සහ ඔහුගේ මිතුරන් සහ මගධයේ වඩාත් හොඳින් දන්නා සහ ඔවුන්ගේ සියලු අනුගාමිකයන් සමග සැලකිල්ලට බඳුන් වූ සාමණයන් වන කාශ්‍යප සහෝදරයන් තිදෙනාය. ඊට ටික කලකට පසු, තවත් සාමණ ගුරුවරයෙකු වූ සඤ්ජය බෙලත්ථිපුත්තගේ බොහෝ අනුගාමිකයන් දෙසිය පනහක් ඔහු අතහැර බුදුපියාණන් වහන්සේ සහ

[1] D.I,3.

සඞග සමග එකතු වූහ. මෙම අවසාන සිද්ධීන් දෙක නිසා, මගධය පුරා මහත් උනන්දුවක් ඇති විය. එයින් බුදුපියාණන් වහන්සේගේ මුල්කාලීන ප්‍රගමනය තුළදී උන්වහන්සේ ප්‍රසිද්ධියට පත්වූණි. ඉතා ඉක්මනින්, විවිධ තරුණයන් පැවිදි වීමට අවසර ඉල්ලූ අතර, ඒ සියලු දෙනා පැවිදි කිරීමට බුදුපියාණන් වහන්සේ එකඟ වූහ. නමුත්, පැවිදි වීමට අවසර ඉල්ලූ ඕනෑම අයෙකු පැවිදි කිරීමට උන්වහන්සේගේ තිබූ සූදානම, ප්‍රශ්න ඇති කිරීමට හේතු විය. අයෝග්‍ය ලෙස පුහුණුවූ සහ අධීක්ෂණයට ලක් නොවූ භික්ෂූහු වහා සියලු තැන ඔබ මොබ යමින් බාධා පැමිණවීමට පටන් ගත්හ. එසේම, බොහෝ තරුණයන් සහ පුරුෂයන් ඔවුන්ගේ පවුල් අත්හැරීම නිසා එයින් බලපෑමට ලක් වූ මිනිසුන් අතර සැනසිල්ල නැති විය. ඔවුහු බුදුපියාණන් වහන්සේට විරුද්ධව මැසිවිලි කියන්නට පෙළඹුනහ. මිනිස්සු මෙසේ පැවසූහඃ ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ අප වැන්දඹුවන් කරමින් සහ අපේ පවුල් කඩා දමමින්, අපට දරුවන් නැති කරති.'' තමන්වහන්සේ මේ පිළිබඳව සැලකිල්ලක් දැක්වූ බවට උන්වහන්සේ සඳහන් නොකළහ. මිනිසුන් කියන දේ පිළිබඳව උන්වහන්සේට දැනුම් දුන් විට උන්වහන්සේ ඒවා වෙතින් ඉවත් වූයේ මෙසේ පවසමින්ය : ''මෙම ඝෝෂාව බොහෝ කල් නොපවතී. එය දින හතක් පැවත, ඊට පසු නවතිනු ඇත.''[2] අයදුම්කරුවන් සූක්ෂම පරීක්ෂාවකට ලක් කිරීමට සහ භික්ෂූන් පැවිදි කිරීමට සහ පුහුණු කිරීමට නීති පැනවීම ආරම්භ වූයේ ඊට පසුවය. විශාල පිරිස් පැවිදි කිරීමට පෙර, පෙනෙන ආකාරයට නිසියාකරව පැවිදි ශාසනය සංවිධානය කිරීම සඳහා ප්‍රමාණවත් ලෙස නොසිතන්නට ඇත.

බුදුපියාණන් වහන්සේ වෛදික නොවන සාමණ සම්ප්‍රදාය තුළ ස්ථිරව පිහිටා සිටියත්, උන්වහන්සේ එහි සමහර බොහෝ මූලික උපකල්පන, විශේෂයෙන්ම, දැඩි තපස පුහුණු කිරීම (තප) සහ ස්වයං-අත්තකිලමථය (අත්තකිලමථ) නොවැදගත් සේ සැලකූහ. මේ සම්බන්ධයෙන් සමහර අවස්ථාවල වෙනත් භික්ෂූහු උන්වහන්සේ විවේචනය කළහ. උන්වහන්සේම වසර ගණනාවක් එවැනි හික්මීම් විඳදරා, අවසානයේ ඒවා අත්හැර, සේදීම සහ නිසියාකාරව ආහාර වැළඳීම නැවත ආරම්භ කර ඇත. උන්වහන්සේ සමග සිටි ශ්‍රාවකයන් පස්දෙනා උන්වහන්සේට දැඩි ලෙස හිංසා පීඩා කර ඇත. ඔවුහු සම්පත්තියෙන් පිරි (ආවත්තෝ බහුල්ලාය) ජීවිතයකට ආපසු පත්වූයේ යැයි උන්වහන්සේට චෝදනා කළහ. කාශ්‍යප භික්ෂුව උන්වහන්සේට ඇසුණු බුදුපියාණන් වහන්සේට විරුද්ධව කරන ලද චෝදනාවක් නැවත මෙසේ කිවුහඃ ''සාමණ ගෞතමයන් වහන්සේ සියලු සිරුරට දුක්දීම් අනුමත නොකරති. දුෂ්කර ජීවිත ගත කරන සියලු දෙනා උන්වහන්සේ විවේචනය කරති, දෝෂාරෝපණය කරති.'' බුදුපියාණන් වහන්සේ මෙය අසත්‍ය බව ප්‍රකාශ කළහ. උන්වහන්සේ පැහැදිලි කළේ අවබෝධයට සහ විමුක්තියට මග පෙන්වන හික්මීම වර්ණනා කරන බවයි. එසේ නොවන දැඩි හික්මීමේ යෙදෙන අය උන්වහන්සේ විවේචනය කළහ. දෙවෙනි ක්‍රමය පළමු වැන්න මත අනිවාර්යයෙන් රඳා නොපවතින බව

[2] Vin.I,43.

ඇඟවූහ.[3] පහතින් පෙන්වා දෙන පරිදි, දේවදත්ත බුදුපියාණන් වහන්සේ සමග බිඳී, ඔහුගේම සඞගයා ආරම්භ කිරීමට සැබෑ හේතුව විය හැක්කේ බුදුපියාණන් වහන්සේ දැඩි සදාචාරාත්මක හික්මීමේ වටිනාකම සහ ස්වයං-අත්තකිලමථය පිළිබඳ අවධාරණය ඉවත් කිරීමයි.

වඩාත් අන්තයට ගිය භික්ෂූන් ස්වල්පයක් බුදුපියාණන් වහන්සේ ජීවිතය සමග නොසැලකිලිමත් යැයි චෝදනා කළහ. භික්ෂු මාගන්දිය බුදුපියාණන් වහන්සේ සැතපෙන පොළොව මත තණකොළ එළූ යහන දැක මෙසේ පැවසුවේය: ''සසර වැඩීමේ ක්‍රියාවලිය විනාශ කරන්නෙකු වන සාමණ ගෞතමයන් වහන්සේ සැතපෙන ඇඳ දුටු විට අපට ඇති වන්නේ කණගාටුවකි, ''[4] මෙම විවේචනයෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න සම්පූර්ණයෙන්ම නිශ්චිත නැත. නමුත්, එකල සිටි සමහර සාමණයන් අතර තිබූ විශ්වාසයක් වූ ගස් සචේතනික ජීවීන් බව සහ ඒ නිසා ඒවා කඩා ගැනීම හෝ කපා දැමීම ඝාතනයට සමාන බවත්, එය සුළු දේවල් ගැන පවා වඩාත් කල්පනාකාරී භික්ෂූන් මගහරින දෙයක් යැයි මාගන්දිය ද විශ්වාස කරන්නට ඇත.[5] සමහර භික්ෂූහු ඇවිදින විට ඉතා කුඩා සතෙකු වුවද නොමැරෙන සේ පොළොව ඇමදීමට කොසු රැගෙන බොහෝ දුර ගොස්, පා තැබූහ.[6] පෙර කී ලෙස එවැනි සුළු දේවල් ගැන පවා කල්පනාකාරීවන සහ දැඩි නිර්මාංශී ජෛනයන් බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන් මස් මාංශ පරිභෝජනය කිරීම පිළිබඳව දොස් කීම පුදුමයක් නොවේ.

> ''ජෛන සමූහයක් නගරය පුරා එක් චතුරශ්‍රයක සිට තවත් එකකට දෑත් ඔසවා කෑ ගසමින්, ශ්‍රමණ ගෞතමයන් වහන්සේට ආහාරය සඳහා සීහ ජනරාල්වරයා විශාල සතෙකු ඝාතනය කර ඇත. තමන් වෙනුවෙන්ම විශේෂයෙන් ඝාතනය කර ඇති බව දනිමින් ශ්‍රමණ ගෞතමයන් වහන්සේ එය ආහාරයට ගනු ඇත.'' [7]

බුදුපියාණන් වහන්සේ පරිත්‍යාගශීලියෙකු ගෙන් පිළිගෙන, ඊට පසු සතෙකු ඝාතනය කර ලබාගත් මස් අඩංගු ආහාරයක් අනුභවයට ගැනීම යන චෝදනාවට ප්‍රතිචාර නොදැක්වූහ. කෙසේ නමුත්, උන්වහන්සේ භික්ෂූන් සහ භික්ෂුණීන්ට ඔවුන් වෙනුවෙන්ම විශේෂයෙන් සතෙකු ඝාතනය කරනු දුටුවේ නම්, ඇසුණේ නම් හෝ සැක පහළ වූයේ නම්, එය නොපිළිගත යුතු බවට නීතියක් පැනවූහ.[8]

---

[3] D.I,161.

[4] M.I,402.
[5] M.I,369.
[6] S.IV,300. Jain monks still carry brooms called *oghā* made out of either peacock feathers or strands of wool for the same purpose.
[7] A.IV,187.
[8] M.I,369. It is widely believed that the Buddha taught vegetarianism but this is not correct, although the practice was advocated by some Indian Buddhists in later centuries. See Dhammika 2016.

බුදුපියාණන් වහන්සේ පිළිබඳව සමහර මිනිසුන් තුළ ඇති වූ සිත්ගන්නාසුලු සැකයක් නම්, උන්වහන්සේගේ සාපේක්ෂ තරුණ බව තිබියදීත්, උන්වහන්සේ බුද්ධත්වයට පත්වූ බව කීමයි. එවැනි ප්‍රකාශ කළ වෙනත් බොහෝ  අය සාමාන්‍යයෙන් මහලු වියේ සිටියහ. මේ පිළිබඳව පසේනදී රජු ඇසුවේය:

> ''නිකායන් සහ ගුරුකුලවල ප්‍රධානීන් වන සාමණයන් සහ බ්‍රාහ්මණයන්, ප්‍රසිද්ධ ගුරුවරු, ප්‍රසිද්ධ සහ සාමාන්‍ය ජනතාව විසින් සලකණු ලබන අය, පවා ඔවුන් අසමසම පරිපූර්ණ බුද්ධත්වයට පැමිණ ඇති බව කියා සිටින්නේ නැත. එම නිසා, තවමත් තරුණ වියේ සිටින, මෑතකදී සාමණයෙකු බවට පත් වී ඇති ඔබවහන්සේ එවැනි දෙයක් කියන්නේ කෙසේද?''

බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: ''බුද්ධත්වය ලැබීමට තරුණ විය හා සම්බන්ධයක් නැත. එය යුව රජ කෙනෙකු, මේ දැන් බිත්තරයෙන් එළියට ආ නයෙකු හෝ මේ දැන් දල්වන ලද ගින්දර මෙන් බලපෑමක් ඇත. එම නිසා ගැඹුරු ලෙස සැලකිල්ලට ගත යුතුයි.'' [9]

මීට කලින් පෙන්වා දුන් පරිදි, ආගමික ප්‍රශ්න සම්බන්ධයෙන් ප්‍රසිද්ධ සාකච්ඡා සහ වාද විවාද, බුදුපියාණන් වහන්සේගේ කාලයේදී ඉන්දියානු සමාජයේ තිබූ ලක්ෂණයක් විය. සමහර අයට එවැනි සිදුවීම් විකාශය වන නව අදහස් ඉගෙනීමට අවස්ථාවක් උදාවීමක් වූ අතර, සුළු පිරිසකට ඔවුන් දක්ෂ සහ විනෝදය ලබා දෙන වාද කරන්නන් ලෙස ප්‍රවර්ධනය කර ගැනීමට අවස්ථාවක් ලැබුණි. දක්ෂ, අන්‍යයන්ගේ ධර්මය ඉගැන්වීම් පිළිබඳව මනා දැනුමක් ඇති, සැබෑ පුහු තර්ක ගෙනෙන්නන්, ඔවුන්ගේ තියුණු බුද්ධියෙන් අනෙක් අයගේ අදහස් කඩා බිඳ දමන ඇතැම් උගත් වංශවත් පුද්ගලයෝ සිටියහ. සමණ ගෞතමයන් වහන්සේ කිසියම් ගමකට හෝ නගරයකට වඩින බව ඇසූ විට, මෙසේ සිතමින් ඔවුහු ප්‍රශ්නයක් සකස් කරති, 'අපි මේ ප්‍රශ්නය උන්වහන්සේගෙන් අසමු. එයට පිළිතුරු මේ ආකාරයෙන් දුන්ණොත්, අපි අරක කියමු, ඒ ආකාරයට උන්වහන්සේ පිළිතුරු දුන්ණොත්, අපි මෙය කියමු. එසේ කරමින් අපි උන්වහන්සේගේ ධර්මය ප්‍රතික්ෂේප කරමු.' නමුත්, ඔවුන් සමණ ගෞතමයන් වහන්සේට මුහුණ දෙන විට, උන්වහන්සේ ධර්මය පිළිබඳ සාකච්ඡාවෙන් ඔවුන් අතිශයින් සතුටට පත් කරති, ආධ්‍යාත්මික, සදාචාරාත්මක උත්තේජනයක් ඇති කරති, පිබිදීමක් ඇති කරති, සහ ප්‍රීතිය ඇති කරති. ඔවුන්ට උන්වහන්සේගේ ධර්මය ප්‍රතික්ෂේප කිරීමට ප්‍රමාණවත් ප්‍රශ්න නැත'' [10] බුදුපියාණන් වහන්සේට එවැනි විරුද්ධවාදීන් සහ වාදකරන්නන්ගේ සැකය

---

[9] S.I,68-69.

[10] M.I,176, condensed

නිරුද්ධ කිරීමට තිබූ හැකියාවේ ප්‍රතිඵලයක් වශයෙන්, උන්වහන්සේ එසේ කළේ ගුප්ත ක්‍රමවලින් යැයි ඔවුහු සැක කළහ.[11]

වරක් එක් ගම්මුලැදෑනියෙක් බුදුපියාණන් වහන්සේ මිනිසුන් වෙනස් කිරීමට ගුප්ත බල භාවිත කරන බවට ඇති තොරතුරු සත්‍ය දැයි උන්වහන්සේගෙන් ඇසූ විට, පිළිතුර වූයේ එසේ කළ බවටයි. මෙම පිළිතුර ගම්මුලැදෑනියාට මහත් පුදුමයක් විය. ''එසේ නම්, සාමණ ගෞතමයන් වහන්සේ මැජික්කාරයෙක් යන්න සැබෑවක්!'' නමුත්, ඊට පසු, බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන්ණේ මැජික් දැනගැනීමෙන් පුද්ගලයෙකු අනිවාර්යයෙන් මැජික්කරුවෙකු නොවන බවයි. [12] උන්වහන්සේ එයින් අදහස් කළ දේ මැජික් යන විෂය සාකච්ඡාවට මත් කළ තවත් කෙනෙකු සමග බුදුපියාණන් වහන්සේ කළ සාකච්ඡාවකින් පැහැදිලි වේ. උන්වහන්සේ මැජික් දන්නේ ද සහ ඒවා අනෙක් ගුරුවරුන්ගේ ශ්‍රාවකයන් වෙනස් කිරීමට භාවිත කරන බව සත්‍යයක් ද යන්නත්, භද්දිය ඇසුවේය. බුදුපියාණන් වහන්සේ පළමුවෙන් පිළිතුරු දුන්ණේ, වෙනත් දේ අතර, ඕපදූප හෝ යම් ගුරුවරයෙකු කියා සිටිය දේ මගින් යම් කෙනෙකු මග පෙන්වීමට ලක් නොවිය යුතු බවයි. ඊට පසු, උන්වහන්සේගේ ඉගැන්වීම්වල කරුණු විස්තරාත්මකව පැහැදිලි කළහ. උන්වහන්සේ එසේ කර අවසන් වන විට, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු වන ලෙස ඇරයුම් කළේද කියා ඔහුගෙන් විමසූ විට භද්දිය ආකර්ෂණයට පත් විය.

බුදුපියාණන් වහන්සේ ප්‍රතිචාර දැක්වූහ:

> ''දැන් භද්දිය, 'මගේ ශ්‍රාවකයෙකු වන්න, මම ඔබේ ගුරුවරයා වන්නෙමි යි මා ඔබට කීවේද'?''
> ''නැත ස්වාමීනී''
>
> ''මා මේ දැන් ඔබට පැහැදිලි කළ ආකාරයට මගේ ඉගැන්වීම් විවෘතව ප්‍රකාශ කරමි, අනාවරණය කරමි. නමුත්, සමහර සාමණයන් සහ බ්‍රාහ්මණයන් වංක ලෙස සහ අසත්‍ය ලෙස, අසාධරණ ලෙස සහ වැරදි ලෙස මා වරදවා පෙන්වයි. ඒ මා වෙනත් ගුරුවරුන්ගේ ශ්‍රාවකයන් පොළඹවා ගැනීමට මැජික් භාවිත කරන බවයි.''
>
> ''ඔබේ මේ මැජික් විශිෂ්ට සහ පුදුමාකාර දෙයක්! මෙම මැජික් මගින් මගේ ආදරණීය ඥාතීන් සහ මගේ පවුලේ සාමාජිකයන් පරිවර්තනය කළ හැකි නම් පමණක්, එය බොහෝ කාලයකට ඔවුන්ගේ සුභසාධනය සහ සතුට සඳහා වනු ඇත.''[13]

---

[11] M.I,375.
[12] S.IV,340.

[13] A.II,190-194. Since ancient times in India magic (*māyā*) and conjuring (*indrajāla*) have been associated with gods and saints and at the same time with impostors and charlatans. "Nature is a magic trick and the Lord is the magician, the things of the world are but elements of Him", *ŚvetāśvatāraUpaniṣad* 4,9-10. "Through cunning in the art of magic and conjuring

බුදුපියාණන් වහන්සේ පිළිබඳ තවත් විවේචනයක්, සහ අදටත් එසේ මතු කරන දෙයක් නම්, උන්වහන්සේගේ නිර්වාණය පිළිබඳ සංකල්පය සහ ආත්මයක් නැතැයි (අනත්ත) කියන ධර්මයයි. එය ශූන්‍යවාදයේ (උච්ඡේදවාද) ස්වරූපයකට සමාන වේ. මෙය ඉගැන්වීම පිළිබඳ උන්වහන්සේට චෝදනා කළ විට, උන්වහන්සේ ප්‍රතිචාර දැක්වූයේ මෙසේය:'' සත්‍යවාදීව කතා කිරීමේ ආකාරයක් ඇත. මා උච්ඡේදවාද ධර්මයක් උගන්වන බවත්, මගේ ශ්‍රාවකයන් එය පුහුණු කරන බවත් කෙනෙකුට කියන්න පුළුවන්. මා උගන්වන්නේ ලෝභය, වෛරය සහ මෝහය නිරුද්ධ කිරීමයි. මා උගන්වන්නේ සියලු සහ බොහෝ වැරදි මානසික තත්ත්වයන් නිරුද්ධ කිරීමයි.''[14]

බුදුපියාණන් වහන්සේ සමග සාකච්ඡාවක අවසානයේදී, උන්වහන්සේ පැවසූ දේ සම්බන්ධයෙන් සංවාදකයා ඔහුගේ හෝ ඇයගේ තෘප්තිය බොහෝ විට ප්‍රකාශ කරනු ඇත. නමුත් මෙය සැමවිටම සිදු නොවේ. වරක් බුදුපියාණන් වහන්සේ කපිලවත්ථුවට වැඩම කළ අවස්ථාවකදී උන්වහන්සේගේ මවගේ සහෝදරයාවූ දණ්ඩපානී හමු විය. ඔහු උන්වහන්සේට ධර්මය පැහැදිලි කරන ලෙස ඉල්ලුවේය. බුදුපියාණන් වහන්සේ අවසාන කරන තුරුම ධර්මය ශ්‍රවනය කරමින් මහලු මිනිසා කිසිම සඳහනක් නොකරමින්, ''ඔහුගේ හිස වනමින්, දිව වේගයෙන් සොලවමින් ඔහුගේ ඇහි බැම එසෙව්වේය. එවිට නලලේ රැළි වැටුණි. ඊට පසු හැරමිටියට හේත්තුවෙමින් පිටව ගියේය.''[15] උන්වහන්සේගේම භික්ෂූන් කණ්ඩායමකට උක්කට්ඨ දී දේශනාවක් කිරීමෙන් පසු ඔවුන් සතුටට පත් නොවූ බව අපට දැනගන්නට ලැබුණි.[16] වරක් බ්‍රාහ්මණයෙකු සමග කළ කතාවකදී, පැරණි මුනිවරයන් තමන්ට ඉගැන්වූ දේ බව ඉතා විශ්වාසයෙන් පැහැදිලි කරන, කිසි දෙයක් මුඳුන්පමුණුවා නොගත් බ්‍රාහ්මණයන් අන්ධ මිනිසුන් රැහැනකට සැසඳූහ. ''පළමු වැන්නා දකින්නේ නැත, මැද සිටින්නා දකින්නේ නැත, සහ අවසන්වැන්නා දකින්නේ නැත.'' මේ ගැන බ්‍රාහ්මණයන් කෝපවී බුදුපියාණන් වහන්සේට තර්ජනය කළහ. ඔවුහු මෙසේ පැවසූහ:''ශ්‍රමණ ගෞතමයන් වහන්සේට නින්දා කරන්නෙමු!''[17] මෙම කාරණයේදී සුහද සබඳකම් යළි පිහිටුවා ගැනීමක් සිදුවිය. සාකච්ඡාව තවදුරටත් පැවතුණි. ප්‍රතිඵලය වූයේ බ්‍රාහ්මණයන් හට බුදුපියාණන් වහන්සේ කෙරෙහි යම් ගෞරවයක් ඇතිවීමයි. සමහර ශ්‍රාවකයන් බුදුපියාණන් වහන්සේ අතහැර දැමූ අවස්ථා පිළිබඳ උදාහරණ කිහිපයක්ද ත්‍රිපිටකයේ වාර්තා වී ඇත. බුදුපියාණන් වහන්සේ සමග සංවාදයේ යෙදී සිටි ජනයා උන්වහන්සේ ඔවුන්ට ධර්මය ඉගැන්වීම සම්බන්ධයෙන්

the false is given the impression of being true", *Vikramacarita* 114-15. The Buddha's comments on magicians at S.III,142 explain why he would not have liked to be thought of as one. Lee Siegel's otherwise excellent history of Indian magic fails to make clear the Buddha's distinction between psychic powers and magic, *Net of Magic, Wonders and Deceptions in India*, 1991. Interestingly, some of the earliest Christian apologists had to defend Jesus against the charge that he was really only a magician, e.g. Tertullian's *Apologeticus* 21.17; 23.7, 12 and Justin Martyr's *Dialogue with Trypho* 69. 7.

[14] Vin. I, 234-235.

[15] M.I,108.

[16] M.I,6.

[17] M.II,200.

ඔවුන්ගේ ඇඟයීම් සහ ජීවිතය පුරාම උන්වහන්සේගේ ශ්‍රාවකයන්වීමට කැමැත්ත පළ කළ අයුරු ත්‍රිපිටකය පුරාම සඳහන් වේ. එවැනි මනෝභාවයන් සාමාන්‍යයෙන් ඒකාකාරී ස්වරූපයෙන් වෙසෙසි වදනින් පළ කර තිබුණත්, බොහෝ අය මෙසේ අදහස් පළ කිරීම පිළිබඳ සැකයක් නැත. කෙසේ නමුත්, ඔවුන් පැවසුවේ ඔවුන් අදහස් කළ දේම යන්න මෙයින් අදහස් නොකෙරේ. සමහර අය සමහර විට, හුදෙක් ආචාරශීලී වන්නට ඉඩ ඇත. තවත් සමහරු පැවසූ දේ ඔවුන් අදහස් කළ දේ කර ඇති නමුත්, ඔවුන් තුළ ආරම්භයේ තිබූ උද්‍යෝගය නැතිවූ පසු නැවතත් ඔවුන්ගේ පැරණි විශ්වාසයන් වෙත ආපසු එන්නට හෝ ධර්මය කෙරෙහි ඇති උනන්දුව නැතිවී යන්නට ඇත. ත්‍රිපිටකය සමීපව කියැවීමෙන් හෙළිවන්නේ බෞද්ධයන් හා භික්ෂූන් වහන්සේලා පවා පසුව හැර ගොස් ඇති බවයි.

වරෙක, ආනන්ද හිමියන් විසින් පුහුණු කරන ලද භික්ෂූන් වහන්සේලා තිහක් පමණ මහා පරිමාණයෙන් සිවුරු හැර ගියද, ඔවුන් ආනන්ද හිමියන්ගේ උපදෙස්වලින් සෑහීමකට පත් නොවූයේද යන්න නිශ්චිත නැත. පැවිදි ජීවිතය ඔවුන් සඳහා නොවේ හෝ ධර්මය පිළිබඳව තවදුරටත්, ඒත්තු ගොස් නැති බව වටහාගෙන ඇත.[18] වරක් සුනක්ඛත්ත බුදුපියාණන් වහන්සේගේ උපස්ථායක වශයෙන් කටයුතු කර ඇත. ඉතා කුඩා ප්‍රදේශවලට ඔවුන්ගේ ගමන් බිමන් සීමාකරමින්, හෝ නිරුවතින් සිටිමින්, බල්ලන් හෝ ගවයින් අනුකරණය කරමින් හැසිරීම වැනි විකාර කර්කශ හැසිරීම් පුහුණු කරමින් සිරුරට දුක්දීම්වල යෙදුණු තවුසන් දැකීමෙන් ඔහු ඔවුන් කෙරෙහි කැමැත්තක් ඇති කර ගත්තේය. එවැනි අවධානය දිනා ගැනීමේ පුරුදු සමග සසඳන විට බුදුපියාණන් වහන්සේ විසින් උගන්වන ලද ජීවන රටාවන් ඇත්තටම විනය පවත්නා ඒවාය. අවසානයේදී, ඔහු බුදුපියාණන් වහන්සේ වෙත ගොස් මෙසේ ප්‍රකාශ කළේය: ''ස්වාමීනී, මම ඔබවහන්සේ අතහැර යමි. මම තවදුරටත් ඔබවහන්සේගේ මඟපෙන්වීම අනුව ජීවත් නොවෙමි.''[19]

බුදුපියාණන් වහන්සේ මෙම ප්‍රකාශනයට ප්‍රතිචාර දැක්වූයේ සුනක්ඛත්තගෙන් ප්‍රශ්න කරමිනි.

> ''මම කවදා හෝ මගේ මඟපෙන්වීම යටතේ ජීවත්වන්නට ඔබට කීවේද?''
> ''නැත ස්වාමීනී''
> ''එසේ නම්, ඔබ කවදා හෝ 'ඔබගේ මඟපෙන්වීම යටතේ මා ජීවත් වන්නෙමි' යැයි මට කීවේද?''
> ''නැත ස්වාමීනී''
> ''එසේ නම්, මෝඩ පුරුෂය ඔබ අත්හරින්නේ කුමක්ද?''

[18] S.II,217.
[19] A.IV,134

''නමුත් ස්වාමීන් වහන්ස, ඔබ කිසි දිනක අධි-මානුෂික විස්මයජනක දේ හෝ, යම් චෛතසික බලයෙන් හෝ වෙනත් හාස්කම් මා වෙනුවෙන් සිදු කර නැත.''

'' මා ඔබට කිසිදා කීවේද, 'මගේ මගපෙන්වීම යටතේ ඉන්න, මම එවැනි දේ ඔබට කර පෙන්වන්නම්' යැයි කීවේද?''

''නැත ස්වාමීනී''

එවිට ප්‍රාතිහාර්යයන් සහ මානසික බලයන් පිළිබඳව බුදුපියාණන් වහන්සේ හාස්කම් සහ චෛතසික බලයන් පිළිබඳව උන්වහන්සේගේ ස්ථාවරය පැහැදිලි කළේ, ඒවා එක් දෙයක් බවත්, දුක් වේදනා ජය ගැනීම තවත් දෙයක් බවත්, උන්වහන්සේ උනන්දු වූයේ මෙම අවසාන ඉලක්කය ගැන පමණක් බවත්ය. මෙම වචනවලින් සුනක්ඛත්තගේ සිත සන්සුන් වුනේ නැත. ඔහු පැවිදි බවෙන් නික්මුනි. පසුව, ඔහුට බුදුපියාණන් වහන්සේ කෙරෙහි තවදුරටත් කිසිම විශ්වාසයක් හෝ ගෞරවයක් නොමැති බවට පුළුල් ලෙස දැනගන්නට ඉඩ සැලැස්වූයේය.

''සමණ ගෞතමයන් වහන්සේට සැබෑ සාන්තුවරයෙකුට සුදුසු කිසිදු අසාමාන්‍ය බලයක් හෝ වෙනත් විශේෂ දැනුමක් හෝ දර්ශනයක් නැත. උන්වහන්සේ උගන්වන දේ තර්කානුකූලව හෝ උන්වහන්සේම මතයන්ට අනුව කාවද්දා ඇත. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය කෙනෙකුට උගන්වන වන විට, ඔවුන් දුක්විඳීම් විනාශ කිරීමට පමණක් යොමු කරවයි.''

සුනක්ඛත්ත සැමදෙනාටම පවසන දේ දැනගත් බුදුපියාණන් වහන්සේ පැවසුවේ, ''ඔහු කෝපයට පත්වන සහ මෝඩ මිනිසෙකි. ඔහු කතා කරන්නේ කෝපයෙනි.''[20]

එකල එක් ආගමකින් තවත් ආගමකට මාරුවීම හැඳින්වූයේ යම් කෙනෙකු අලුතෙන් හදාගත් ඕනෑම නිකායක් හෝ ඉගැන්වීම්වල 'ශ්‍රාවකයන් වීම සඳහා පරීක්ෂණයකට ලක්වීම' (සාවකත්තං උපගච්ඡෙය්‍ය) යනුවෙනි. ගිහියන් බෞද්ධයන්වීමට තීරණය කළ විට, බොහෝ විට ඔවුහු සුදු ඇඳුම් අඳිමින් තමන් වෙන්කොට හැඳින ගැනීමට තීරණය කරති. එසේම සාමාන්‍යයෙන් ඔවුන් ''සුදු වස්ත්‍රයෙන් සැරසුණු උපාසක, උපාසිකා'' ලෙස හැඳින් වේ. වෙනත් නිකායක තවුසෙකු හෝ භික්ෂුවෙකු බුදුදහම වැළඳ ගත් විට, ඔහු සම්පූර්ණයෙන්ම, සැම විටම ඔහුගේ පෙර ආගමේ ඇඳුම් ආයිත්තම් සහ පුරුදු අත්හැර දමා, පැවිදි වී, බෞද්ධ පැවිදි ජීවිතයට නිශ්චිත කහ හෝ තද දුඹුරු පැහැති සිවුරෙන් සැරසී විනය නීති රීති පිළිපදියි. නමුත්, පෙනෙන ආකාරයට එය සැම විටම එසේ නොවේ. ඔබ මොබ යන සරභා භික්ෂුව තම නිකායේම රැඳී සිටිමින්, අවම වශයෙන් පිටතින් තමන් බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු ලෙස හැඳින්වූයේය.

[20] A.IV,134

ටික කලකට පසු, ඔහු තවදුරටත් බෞද්ධයෙකු නොවන බව තීරණය කර, ඔහුට හමුවූ හෝ සවන් දුන් ඕනෑම කෙනෙකුට පැවසුවේ තමන් ධර්මය හරියටම අවබෝධ කර ගත් නිසා, ඔහු දැන් ධර්මය ප්‍රතික්ෂේප කර ඇති බවයි. එවැනි ප්‍රකාශයක් අභියෝගයට ලක් නොකරමින් අතහැර දැමීමට බුදුපියාණන් වහන්සේ ඉඩ නොදෙමින්, සරභා වෙත ගොස් මෙසේ ප්‍රශ්න කළහ: ''ඔබ ධර්මය සහ ශාක්‍යයන්ගේ පුතුන්වන සාමණවරුන් පුහුණු කිරීම අතහැර දැම්මේ ඔබ එය අවබෝධ කරගෙන සිටින නිසා බව කියමින් සිටින්නේ ඇත්තක් ද?''යි බුදුපියාණන් වහන්සේ ඔහුගෙන් ඇසූහ. සරභා නිශ්ශබ්ද විය. බුදුපියාණන් වහන්සේ තවදුරටත් කතා කළහ:'' එසේ නම්, ඔබේ ධර්මය සහ පුහුණුව පිළිබඳ අවබෝධය කුමක් ද කියා මට පැහැදිලි කරන්න. ඔබ එය සම්පූර්ණයෙන් ඉගෙන නැත්නම්, මම ඔබ වෙනුවෙන් එය සම්පූර්ණ කරන්නෙමි. මම ඔබගෙන් එය ඇසීමට කැමැත්තෙමි.'' නැවතත් සරභා උත්තර නොදුන්නේය. නමුත් බුදුපියාණන් වහන්සේ දෙවන වරට සහ තුන්වන වරටත්, එසේ කළහ. පසුව අවාසනාවන්ත සරභා පිළිතුරක් නොදෙන්නට හෝ ඊටත් වඩා පිළිතුරක් දෙන්නට නොහැකි වේයැයි පැහැදිලි විය. මෙම හමුවීම දුටු අනෙක් අයට උන්වහන්සේ සරභාගෙන් ප්‍රශ්න කිරීමට හේතුව පැහැදිලි කිරීමෙන් පසු බුදුපියාණන් වහන්සේ එතැනින් පිටවූහ.[21] කෙසේ වෙතත් පැවිදි සඞගයාගෙන් ඉවත් වූ අය සමහර විට ධර්මය කෙරෙහි ඔවුන් තුළ වූ කැපවීම පවත්වාගෙන ගියහ.

> ''භික්ෂුත්වය අතහැර ගිහි ජීවිතයට අවතීර්ණ වන අය පවා ඉන්පසුවත්, බුදුපියාණන් වහන්සේ, ධර්මය සහ සඞගයා අගය කරති. ඔවුන් චෝදනා කරන්නේ ඔවුන්ටමයි.'අපි අවාසනාවන්තයන් වෙමු. අපට එතරම් කුසල් නැත. එතරම් හොඳින් දේශනා කරන ලද ධර්මයක් යටතේ අප පැවිදි වූවත්, අපට අපගේ මුළු ජීවිත පරිපූර්ණ සහ පිරිසිදු ආධ්‍යාත්මික ජීවිතයක් ගත කරන්නට නොහැකි විය.' පැවිදි උපස්ථායකයන් හෝ ගිහි ශ්‍රාවකයන් වශයෙන් ඔවුහු පන්සිල් සරණ යති.''[22]

බුදුපියාණන් වහන්සේගේ ජීවිත ප්‍රගමනයේ මුළු කාලයේදී ඇති වූ වඩාත්ම සිත් තැවුලට පත් වූ සිදුවීමක් වන්නේ වේසාලියේ උන්වහන්සේ ජීවත්වූ කාලයේදීය. භික්ෂූන් රැස්වූ එක් රැස්වීමකදී අසුභභාවනා යනුවෙන් හැඳින්වූ භාවනාවක් පිළිබඳව දේශනාවක් සිදු කර ඇත. මෙම භාවනාවෙන් ශරීරයේ අංගයන් ගැන - ඔවුන්ටම පිළිකුල ඇති කරන ගලායෑම් හෝ අඛණ්ඩ සේදීම් නොමැති වූ විට ඉතා ඉක්මනින් පිළිකුල ඇති කරන ද්‍රව්‍ය පිළිබඳව මෙනෙහි කිරීම මෙම පුහුණුවට සම්බන්ධ වේ. මෙම පුහුණුව සිදු කිරීමේ අරමුණ වූයේ ශරීරය කෙරෙහි නොඇලීම, ලිංගික ආවේගය සංසිඳුවීමට ධෛර්යවත් කිරීමටයි. එසේම කායික ආකර්ෂණය පිළිබඳ සාමාන්‍යයෙන් ඇති වන අවධාරණය අභිබවා යෑමට ප්‍රතිවිරුධව කටයුතු කිරීමටයි. මෙම

[21] A.I,185.
[22] M.I, 68.

දේශනයෙන් පසුව, තමන්වහන්සේට මාස භාගයක හුදෙකලාවට යායුතු බව බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළහ. උන්වහන්සේ පිටත වැඩි පසු, භික්ෂූහු මනසිකාරය පුරුදු කළහ. ඒවායේ ප්‍රතිඵල උග්‍රවිය. භික්ෂූන් තිස් දෙනෙකු පමණ ඔවුන්ගේ ශරීර පිළිබඳව මහත් පිළිකුලට සහ අරුචියට පත්ව දිවිනසා ගෙන ඇති බව ත්‍රිපිටකය සඳහන් කරයි. බුදුපියාණන් වහන්සේ හුදෙකලාවේ වැඩ සිට ආපසු වැඩම කළ විට, සමහර භික්ෂූන් නොමැති බව දුටුවහ. ඔවුන් කොහේ දැයි විමසූ විට, සිදුවූ දෙය අනාවරණය කරන ලදී. එවිට, උන්වහන්සේ ආනපාන සති භාවනාව පිළිබඳව දේශනාවක් කරමින් එයින් නොකැළඹුන බව සහ සන්සුන් බව උපද්දවා ගැනීමේ ඇති හැකියාව අවධාරණය කළ බව ත්‍රිපිටකයේ සඳහන් වේ. නමුත් මෙම සිදුවූ ඛේදවාචකය පිළිබඳව උන්වහන්සේ කිසිවක් පැවසූ බවට ත්‍රිපිටකයේ සඳහන් වී නැත.[23] මෙම සිදුවීම පිළිබඳව අනෙක් අය විසින් කරන ලද අදහස් වශයෙන්ද කිසිවක් සඳහන් වී නැත. නමුත් එවැනි දෙයක් අද කාලයේ සිදුවූවා නම්, ඇති වන්නට තිබූ තත්ත්වය මෙන් සමහර මිනිසුන් ගැඹුරු ලෙස එයින් දැඩි කම්පනයට පත්වනු ඇතැයි සිතිය හැකිය. බුදුපියාණන් වහන්සේට අන් අයගේ මනස කියවීමට හැකියාවක් තිබූ බව හෝ අවම වශයෙන් ඔවුන්ගේ හැකියාවන් සහ නැඹුරුතාවන් තේරුම් ගැනීමට හැකියාවක් තිබූ බව සහ ඒ ඒ පුද්ගලයන්ට විශේෂවන ආකාරයෙන් ධර්මය ඔවුන්ට ඉදිරිපත් කළ බවත් බොහෝ විට සඳහන් ද වේ. මෙම සිද්ධිය උන්වහන්සේට සැමවිටම එසේ කළ නොහැකි බවට සාක්ෂියකි.

කලින් සඳහන් කළ පරිදි, බුදුපියාණන් වහන්සේගේ කාලයේදී බ්‍රාහ්මණ ආගම නැවත ඇගයීමට ලක් කර නැවත අර්ථනිරූපණය කරමින් සිටියේ වෙනස්වන ලෝකයක එය එහි අදාලත්වය සාමණ සම්ප්‍රදාය සමග තරග කිරීම සඳහා පවත්වා ගැනීමට පරිශ්‍රමයක් දැරූ නිසාය. ඒ නිසාවෙන්, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ සමහර දේවල් පිළිබඳව උනන්දුවක් සහ ඇගයීමක් පළ කළ බ්‍රාහ්මණයන් සිටි අතර, හෝ අවම වශයෙන් උන්වහන්සේ පැවසූ දේවලට සවන් දීමට ඔවුහු සූදානම් වූහ. වඩා නම්‍ය නොවූ සහ පාරම්පරික පුද්ගලයන් උන්වහන්සේ දුටුවේ බරපතල තර්ජනයක් ලෙසය. ඒ නිසා ඔවුන්ගේ එදිරිය බුදුපියාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ භික්ෂු භික්ෂුණියන් කෙරෙහි පිට කිරීමට අවස්ථාවක් ලැබුණ හොත්, කිසිවිටක එය අත්හැරියේ නැත. මෙම එදිරිය බුදුපියාණන් වහන්සේ උගන්වන දේ පිළිබඳ විවේචනය කිරීමේ ස්වරූපයක් ගත්තේ කලාතුරකිනි. නමුත් එය ප්‍රකාශ කරනු ලැබුවේ උන්වහන්සේ පිළිබඳව ඔවුන් කියනු ලබන අඩුකමක් සහ පිළිවෙත් පිළිබඳ අපිරිසිදු බවක් සම්බන්ධයෙනි. එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ හුදෙක් උදැසන පිළිවෙත්වලට අනුගත වෙමින්, පිඬුසිඟා වඩිමින්, එක් බ්‍රාහ්මණයෙකුගේ නිවස වෙත ප්‍රවේශ වූහ. උන්වහන්සේ වඩිනු දැක, පිළිවෙත් අපිරිසිදු වනවාට අකැමැති වූ බ්‍රාහ්මණයා මෙසේ කෑ ගැසුවේය: ''ඔතැන නවතින්න

[23] S.V, 321-322.

පැවිද්දා, ඔබ කාලකණ්ණි පැවිද්දා, ඔබ සමාජයෙන් පිටමං කළ පැවිද්දා!''[24] තවත් බ්‍රාහ්මණයෙක්, ඔහුගේ ගෝත්‍රයේ සාමාජිකයෙකු බුදුපියාණන් වහන්සේ සමග එක්වූ බව දැන, බුදුපියාණන් වහන්සේ වෙත ගොස් පරිභව කළේය.[25] කෙසේ නමුත්, බුදුපියාණන් වහන්සේ පිළිබඳව බ්‍රාහ්මණයන් අතර, බෙදුණු අදහස් තිබූ බවට පෙන්නුම් කරන සිද්ධීන් ඇත. සමහරක් අය උන්වහන්සේට අවමන් කළ අතර, තවත් අය උන්වහන්සේට ගෞරවයක් සහ උන්වහන්සේගේ අනුගාමිකයන්ට, සමහර විට බොහෝ ගෞරවය දක්වා ඇත. බ්‍රාහ්මණී ධානඤ්ජනී බුදුපියාණන් වහන්සේ වෙනුවෙන් කැපවී සිටි බව පෙනෙන්ට තිබුණි. එක් අවස්ථාවකදී ඇය පා පැටලී වැටුන විට හෝ වැටෙන්නට ගිය විට, ඈ තුන්වරක් හඬ නගා කීවාය:''බුද්ධත්වයට පත් උතුම් ස්වාමීන් වහන්සේ අගය කරන්න!'' මේ අවස්ථාවේ සංගාරාව බ්‍රාහ්මණයා ඒ අසල සිට මෙය ඇසී පිළිකුලෙන් මෙසේ පැවසුවේය :''ධානඤ්ජනීට නින්දා කළ යුතුයි, පහත්කොට සැලකිය යුතුයි!. බ්‍රාහ්මණයන් ඉදිරියේ ඇය මුඩු හිස ඇති සාමණයා අගය කරයි.''[26]

වරක් භික්ෂුණීන් කිහිපදෙනෙකු ගමකට පැමිණ නැවතී සිටීමට තැනක් නැති නිසා, එක්තරා බ්‍රාහ්මණයෙකුගේ නිවසට පැමිණ රාත්‍රිය ගත කළ හැකි දැයි ඇගෙන් විමසා තිබේ. තම ස්වාමිපුරුෂයා නැවත පැමිණෙන තුරු සිටින්නැයි ඇය ඔවුන්ගෙන් ඉල්ලා සිටියාය. එනිසා, ඔවුන් ඇතුළට ගොස්, ඔවුන්ගේ පැදුරු එළා බලා සිටියහ. බ්‍රාහ්මණයා රාත්‍රියේ පැමිණි විට, භික්ෂුණීන් දැක මෙම අමුත්තන් කවුරුදැයි විමසුවේය. ඇය පිළිතුරු දුන්නාය:'' ඔවුහු භික්ෂුණීන්ය.'' ඔහු කෝපයෙන් නියම කළේය:'' හිස් මුඩු කළ වෛශ්‍යාවන් එලවා දමන්න!.''[27] මෙම කතාවන් දෙකේම ප්‍රදර්ශනය වන්නේ බ්‍රාහ්මණ කාන්තාවන් පුරුෂයන්ට වඩා බෞද්ධයන් පිළිගන්නා බවයි. වෙනත් කතාවලින් පෙනී යන්නේ පෞද්ගලික සම්බන්ධතා මගින් බුදුපියාණන් වහන්සේගේ ධර්මය පැහැදිලි කිරීමට අවස්ථාවක් නිර්මාණය වූ විට, ඉවසීම සහ ගෞරවය දක්වා සතුරුකම වෙනස් කළ හැකි බවයි.

ජ්‍යෙෂ්ඨ භික්ෂුවක වූ මහා කච්චාන රහතන් වහන්සේ වනයේ පැල්පතක සිටින විට දර එකතු කරන තරුණ බ්‍රාහ්මණ සිසුන් කිහිප දෙනෙකු, උන්වහන්සේගේ පැල්පත වෙත පැමිණියහ. බෞද්ධ භික්ෂුවක ඇතුළත සිටින බව තේරුම්ගත් ඔව්හු භික්ෂූන්ට ගෞරව කරන්නේ නූගත් ග්‍රාම්‍ය පුද්ගලයන් පමණක් බව කියමින් මහත්වූ කලබලයක් කරමින් පැල්පත වටා ගියහ. මෙම නොහික්මුණු බව අත්හැර නොදැමිය යුතු බවට තීරණය කළ කච්චාන රහතුන් වහන්සේ, පිටතට පැමිණ ශිෂ්‍යයන්ට පැවසුවේ, පැරණි බ්‍රාහ්මණවරුන් පිරිසිදු සරල ජීවිත ගත කළ බවත්, වර්තමානයේ ඔවුන්ගේ අනුප්‍රාප්තිකයන්ට අද ඇත්තේ නොසැලකිලිමත් සවේදීතාවන් සහ

[24] Sn. p.21.
[25] S.I,161-162.
[26] M.II,210. Sangārava was probably advocating that she loses her caste which would mean social death for her. Several *Dharmasūtras* stipulate loss of caste for joining a samaṇa sect. The rite of excommunication is briefly described at D.I,98. *Manusmṛti* 11,183-189 described how the rite was conducted at a later period.
[27] Vin.IV,274.

දේවගීතිකා ගායනා කිරීම, අර්ථ විරහිත චාරිත්‍ර සහ බාහිර සංදර්ශන සිතින් දැඩිව දරා ගැනීම බවයි. මේ ආකාරයෙන් ඔවුන් ඇමතීම නුහුරු වූ සිසුහු තම ගුරුවරයාවූ ලොහිච්ච වෙත ගොස් බෞද්ධ භික්ෂුවක් වේදයට අපහාස කළ බව කීහ. ඔහු මහත් කෝපයට පත්වී කච්චාන මහරහතන් වහන්සේට මුහුණ දී කතා කිරීමට තීරණය කළ නමුත්, උන්වහන්සේ පිළිබඳ තොරතුරු පළමුව අසා දැන ගැනීම සුදුසු බව සිතුවේය. ඔහු පැල්පතට පැමිණි විට, ඔහුගේ පිටුපසින් සිසුහු ද සිට ගත්හ. ඔහු කච්චාන මහරහතන් වහන්සේට ආචාරශීලීව ආචාර කර, සුපුරුදු ලෙස කෙටි කතාවක නිරත විය. පසුව, සිසුන් තමාට වාර්තා කළ දේ උන්වහන්සේ පැවසුවේද කියා ඇසුවේය. එවැනි දේ තමන් සැබැවින්ම පැවසූ බව හිමියෝ ස්ථිර කළහ. සුළු මොහොතක් වික්ෂිප්ත නොසන්සුන් සහගත නිහඬතාවක් ඇතිවුණි. නමුත්, ඊට පසු අදහස් කළ ආකාරයට හිමියන්ට අවලාද කීම වෙනුවට, ලොහිච්ච උන්වහන්සේගෙන් ඇසුවේ අපරික්ෂාකාරී ඉඳුරන් යනුවෙන් අදහස් කළේ කුමක්ද කියාය. කච්චාන හිමියෝ ඉන්ද්‍රිය සංවේදී බලපෑම් පිළිබඳව දැනුවත්වීමේ භාවනා පුහුණුව, එයින් වෙන්ව සිටීමේ වටිනාකම සහ ප්‍රතිඵල වශයෙන් ඇති වන ඇතුළු නුවණ විස්තර කිරීමට උන්වහන්සේ අවස්ථාව ලබා ගත්තේය. ලොහිච්ච මෙයින් මහත් ප්‍රසාදයට පත්වුණි. ඔහු උන්වහන්සේට පැවසුවේ, දානය සඳහා තම නිවසට පැමිණෙන ඕනෑම අවස්ථාවක තමන් සහ තමන්ගේ සිසුන්ගේ සෑම ගෞරවයක්ම උන්වහන්සේට පුද කරන බවයි.[28]

සමහරුන්ගේ විවේචන සහ සෘණාත්මක මත තිබියදීත්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ කාලයේ සිටි, උන්වහන්සේට වඩා දශකයක් පමණ ජ්‍යෙෂ්ඨ ජෛන නායක මහාවීර සමග, වඩාත් ගෞරවයට බඳුන් වූ ගුරුවරයා වූහ. බුදුපියාණන් වහන්සේගේ දේශනයකට සහභාගී වූ අයෙකු දුටුවේ, එය අවසන් වූ පසු එහි රැස්වූ පිරිස උන්වහන්සේ වෙත ඇස් දල්වාගෙන, අකැමැත්තෙන් පිටව ගිය බවයි.[29] මෙමෙ සිත්ගන්නාසුලු නිරීක්ෂණයෙන් සහ ඒ හා සමාන කිහිපයකින් තහවුරු වන්නේ, බුදුපියාණන් වහන්සේට බොහෝ සෙයින් පෞද්ගලික සිත් ගැනීමේ ප්‍රභාවක් තිබූ බව යන හැඟීමයි. සමහර අයට අවම වශයෙන්, මිනිසුන් මූලිකවම ධර්මයට ආකර්ෂණය වීමට හේතුව උන්වහන්සේගේ හොඳ පෙනුම සහ කැපීපෙනෙන පෙනුම බවයි. බුදුපියාණන් වහන්සේගේ කායික පෙනුම පිළිබඳව බොහෝ තොරතුරු ත්‍රිපිටකයේ සඳහන් වේ. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ බාල සොයුරු නන්දට වඩා ඇඟිලි හතරක පළලකින් උස බව අපට දැනගන්නට ඇත. ඈතින් දකින විට නන්ද හිමියන් බුදුපියාණන් වහන්සේ යැයි වරද්දා ගන්නටද ඉඩ ඇත.[30]

බුදුපියාණන් වහන්සේගේම ප්‍රකාශයට අනුව, උන්වහන්සේ අභිනිෂ්ක්‍රමණය

[28] S.IV,117-121.
[29] M.II,140.

[30] Vin.IV,173. Srinivasam gives a finger-breadth, *aṅguli*, as about 2.54 cms, pp.9-11.

කරන්නට පෙර, බොහෝ විට දිග, කළු කෙස් සහ රැවුලක් ද තිබී ඇත.[31] බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිමා සෑම විටම තදින් රැළි වැටුණු හිසකෙස් සහිතව පෙන්නුම් කරයි. මෙය කිසිදු ඓතිහාසික පදනමක් නැති පිළිම වන්දනාවකි. අභිනිෂ්ක්‍රමණයෙන් පසු, උන්වහන්සේ කෙස් සහ රැවුළ කපා ඉවත් කර එතැන් සිට හිසේ සම සහ මුහුණ අඛණ්ඩව අනෙක් භික්ෂූන් මෙන්ම මුඩු කළහ. තමන්වහන්සේ පිළිබඳව මෙසේ සඳහන් කළහ:''සිවුරෙන් සැරසී, නිවසින් බැහැරව සහ හිස මුඩු කර මම ඔබ මොබ ගියෙමි.'' (සඞ්ඝාටිවාසී අගහො චරාමි නිවුත්තකේසෝ).[32]

බුදුපියාණන් වහන්සේ විශේෂයෙන්ම, හොඳ පෙනුමක් ඇති අයෙකු බවට සියලු මූලාශ්‍රවලින් හෙළි වේ. සෝනදණ්ඩ උන්වහන්සේ පිළිබඳව විස්තර කළේ මෙසේය: ''කඩවසම්, මනා පෙනුමකින් යුක්ත, දකින්නට ප්‍රිය, යහපත් සමේ ස්වභාවික වර්ණය සහ සුන්දර ස්වරූපයක් සහ මුහුණක් ඇති.'' ලෙසයි. දොණ මෙසේ පැවසුවේය[33] ''ලස්සන, සිත් වශී කරන විශ්වාසය, ශාන්ත, සන්සුන්, පරිපූර්ණ ලෙස හීලෑ කළ ඇතෙකුගේ තේජස සහ පෙනුම,'' යනුවෙනි.[34] තවත් නිරීක්ෂකයෙකු සඳහන් කළ පරිදි, මෙම ස්වාභාවික යහපත් පෙනුම උන්වහන්සේගේ ගැඹුරු සන්සුන් භාවය වැඩිදියුණු කරයි : ''පුදුමයි, සැබැවින්ම චමත්කාර ජනකයි, යහපත් ගෞතමයන් වහන්සේගේ පෙනුම කෙතරම් ශාන්තද, සමේ පෙනුම කෙතරම් පැහැදිලිද සහ කෙතරම් දීප්තිමත්ද? වසන්ත කාලයේ කහ පැහැති ජුජුබෙ ඵලයක් සේ පැහැදිලිය, දීප්තිමත්ය, හෝ මේ දැන් නටුවෙන් නෙලා ගත් පාම් ගසක ඵලයක් මෙන් පැහැදිලිය, දීප්තිමත්ය, යහපත් ගෞතමයන් වහන්සේගේ සමේ ස්වාභාවික වර්ණය ද එසේමයි.''[35] ප්‍රියජනක සහ ආකර්ෂණීය පැහැයක් යනුවෙන් පැරණි ඉන්දියානු මතය වූයේ, ''තද කළු සහ වඩා ළා පැහැ'' නොවන බවයි. බුදුපියාණන් වහන්සේගේ මනා පෙනුමැති වර්ණය පිළිබඳව අනුමාන කරන පරිදි උන්වහන්සේගේ සමේ වර්ණය පිළිබඳව නිතර වර්ණනා කරනු ලැබුණි.[36] වර්තමානයේ ජීවත් වන අයට ලස්සන සමේ පැහැයක් (වණ්ණෝ පසීදති) ලැබෙන බව බුදුපියාණන් වහන්සේම පවසා ඇත.[37] වාදයකදී බුදුපියාණන් වහන්සේට වාචිකව පහර දුන් විට උන්වහන්සේගේ ලක්ෂණ වෙනස්වනු සච්චක දුටුවේය. ''චමත්කාර ජනකයි, සැබැවින්ම විශ්මය දනවයි, යහපත් ගෞතමයන් වහන්සේට දිගින් දිගටම පරිභව කරන විට සහ අවිනීත, අශිෂ්ට භාෂාව විදින්නට සැලැස්වූ විට, උන්වහන්සේගේ සමේ වර්ණය සුන්දර වේ. උන්වහන්සේගේ මුහුණ දීප්තිමත් වේ. මෙවැන්නක් කෙනෙකුට බලාපොරොත්තු විය හැක්කේ ශාන්තුවරයෙකුගෙන්, බුද්ධත්වයට පත්වූ උත්තමයෙකුගෙන්.''[38]

---

[31] M.I,163.

[33] D.I,115.
[34] A.II,38
[35] A.I,181. The fruit of the *Ziziphus jujube* is yellow when ripe, gradually turning rusty-brown. The palm fruit mentioned is that of *Borassus flabellifer* which has a greyish-brown skin and is golden yellow inside.

[36] M.I,88.
[37] S.I,5.
[38] M.I,250.

මහලු විය, ''දත් දිරායෑම, කෙස් සුදුවීම, සම රැළි වැටීම, ශක්තිය පිරිහීම සහ දැනීමේ ඉන්ද්‍රියයන් දුර්වලවීම'' ගෙන එන බව බුදුපියාණන් වහන්සේ නිරීක්ෂණය කළහ. උන්වහන්සේද වියපත් වන විට මෙම ලක්ෂණ සමහරක් උන්වහන්සේගෙන්ද පිළිබිඹු වූ බවට සැක කිරීමට හේතු නැත.[39] උන්වහන්සේගේ ජීවිතයේ අවසාන කාලයට එනවිට, ආනන්ද හිමියන් දැක්වූයේ මෙවන් අදහසක්ය: ''බුදුපියාණන් වහන්සේගේ සමේ ස්වාභාවික වර්ණය තවදුරටත් පිරිසිදු හෝ දීප්තිමත් නැත. උන්වහන්සේගේ අවයව දුබල සහ රැළි වැටී ඇත. ශරීරය පහතට නැමී ඇත. දැනීමේ ඉන්ද්‍රියයන් පිරිහී ඇත.''[40] පරිනිර්වාණයට පෙර මාසවල උන්වහන්සේම උන්වහන්සේ පිළිබඳව මෙසේ පැවසූහ: ''මා දැන් වියපත්, මහලුවියට පත් වී ඇත, වැහැරී ඇත, ජීවිතයේ මාවත පසුකර ඇත, වයස 80දී මගේ ජීවිතයේ අවසානයට සමීපවෙමින් සිටිමි. පරණ කරත්තයක් තවදුරටත් යා හැක්කේ පිළිසකර කරමින් මෙන්ම, මගේ ශරීරයද තවදුරටත් ගෙන යා හැක්කේ අණ්ඩ දමමින්ය.'' [41]

ත්‍රිපිටකයේ ඇති සමහර උද්ධෘතයන් ස්ථිරවම ප්‍රකාශ කර ඇත්තේ බුදුපියාණන් වහන්සේගේ ශරීරයේ මංගල ලකුණු (මහාපුරිස ලක්ඛණ), ප්‍රදර්ශනය වන බවයි. මුල් බෞද්ධ ග්‍රන්ථවල වඩාත්ම කුතුහලය දනවන සහ ව්‍යාකුල අලුත් වෙනස්කම් - කුතුහලය දනවන කරුණ නම්, ලකුණු එතරම්ම අමුතු, ව්‍යාකුල බැවින්, ඒවා වෙනත් ධර්ම ග්‍රන්ථවලට පටහැනි බවයි.[42] අජාසත්ත රජු බුදුපියාණන් වහන්සේ හමුවීමට ගිය විට, අවට සිටි භික්ෂූන් වහන්සේලා අතරින් ක්ෂණිකව උන්වහන්සේ වෙන්කොට හඳුනාගැනීමට නොහැකි විය. බුදුපියාණන් වහන්සේට මෙම ලකුණු තිබුණේ නම් ඔහුට වහාම එසේ කරන්නට හැකිවනු ඇත.[43] පුක්කසාති තරුණයා පැය ගණනාවක් බුදුපියාණන් වහන්සේ සමග කතා කරමින් සිටියේ, උන්වහන්සේ කවුරුද කියා හඳුනා ගැනීමට පෙරය. බුදුපියාණන් වහන්සේට කිසියම් සලකුණක් තිබුණේ නම්, පුක්කසාති වහාම එය දැක තමන් ඉදිරියේ වැඩ සිටින්නේ සම්පූර්ණයෙන්ම අසාමාන්‍ය පුද්ගලයෙකු බව දැනගන්නට ඉඩ තිබුණි.[44] එසේම ඉහත සඳහන් කර ඇති ආකාරයට, උරුවෙලාවේ සිට ගයාවට යන මාර්ගයේ ගමන් කරන විට උපකට බුදුපියාණන් වහන්සේ හමුවූ විට, ඔහුගේ අවධානයට යොමු වූයේ උන්වහන්සේගේ අසාමාන්‍ය ශරීරය නොව, උන්වහන්සේගේ සන්සුන් සහ දීප්තිමත් පැහැයයි.[45] වඩා වැදගත් දෙය නම්, කායික ලක්ෂණවලින් කෙනෙකු විශේෂ වන්නේ යැයි යන මතය බුදුපියාණන් වහන්සේ බැහැර

---

[39] S.II,2.
[40] S.V,216.
[41] D.II,100. The phrase here translated as "being patched up" is obscure. For an alternative translationsee Gombrich, 1987.
[42] The texts attribute the notion to Brahmanism, although it is not specifically mentioned in any Vedic texts. See Powers, pp.16-19.
[43] D.I,50.
[44] M.III,238.
[45] M. I,170.

කිරීමයි. ඊට වඩා, නිදහස් මනසක් තිබීමෙන් (විමුත්තිචිත්ත) පුද්ගලයෙකු 'ශ්‍රේෂ්ඨ මිනිසෙකු' වීමට සුදුසු වන බව උන්වහන්සේ පැවසූහ.[46]

බුදුපියාණන් වහන්සේගේ විනිවිද දකින ප්‍රඥාව සහ ඒත්තුගැන්වීමේ හැකියාවෙන් ධර්මය පැහැදිලි කිරීම, උන්වහන්සේගේ වඩාත්ම කැපී පෙනෙන හැකියාවන් අතර බොහෝ වාර සඳහන් වේ. බ්‍රාහ්මණයන් දෙදෙනෙකු සමග උන්වහන්සේ අතර ඇති වූ සාකච්ඡාවක් ත්‍රිපිටකයේ සඳහන් වේ.

> ''එකල, කාරනපාලි බ්‍රාහ්මණයා ලිච්ඡවීන්ට ගොඩනැගිල්ලක් ඉදි කරමින් සිටියේය. ඔහුගේ මිත්‍ර පින්ගියානී බ්‍රාහ්මණයා ඈත එනු දැක, ඔහු වෙත ප්‍රවේශ වී මෙසේ ඇසුවේයඃ 'දැන් කොහොමද! පින්ගියානී ඔබ මේ උදෑසන කොහේ සිට එන්නේද?'
>
> 'මම සාමණ ගෞතමයන් වහන්සේ බැහැ දැක එන්නෙමි.'
>
> 'හොඳයි, උන්වහන්සේගේ ප්‍රඥාවේ පැහැදිලි බව පිළිබඳව ඔබ කුමක් සිතන්නේද? උන්වහන්සේ ප්‍රඥාවන්තයෙකු යැයි ඔබ සිතන්නේද?'
>
> 'නමුත්, උන්වහන්සේ සමග සැසඳීමට මා කව්ද? උන්වහන්සේ පැහැදිලි බව විනිශ්චය කිරීමට මා කව්ද? උන්වහන්සේගේ ප්‍රඥාවේ පැහැදිලි බව විනිශ්චය කළ හැක්කේ උන්වහන්සේටම පමණයි.?'
>
> 'සැබැවින්ම ඉහළයි. ඔබ සාමණ ගෞතමයන් වහන්සේට දුන් වර්ණනාව.'
>
> 'නමුත්, උන්වහන්සේ සමග සැසඳීමට මා කව්ද? ගෞතමයන් වහන්සේ ඇගයීමට මා කව්ද? සැබැවින්ම උන්වහන්සේ අගයන්නේ ඇගයීමට පත් වූ අයයි. උන්වහන්සේ දෙවිවරු සහ මිනිසුන් අතර ශ්‍රේෂ්ඨතම පුද්ගලයාය.'''[47]

ලිච්ඡවී පාලක කවුන්සලයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු වූ නන්දක සමග වරක් බුදුපියාණන් වහන්සේ සාකච්ඡා කරමින් සිටියහ. සාකච්ඡාව අවසන් වූ වහාම, නන්දකගේ සේවකයා පෙනෙන ආකාරයට පිටත්වීමට තද කැමැත්තෙන්, නන්දකගේ ස්නානය කිරීමට කාලය පැමිණ ඇති බව සිහින් හඬින් කිව්වේය. නන්දක මෙසේ කිව්වේයඃ'' බාහිර සේදීම දැන් ඇති. බුදුපියාණන් වහන්සේ කෙරෙහි විශ්වාසයෙන් ඇතුළත සෝදා ගැනීම ප්‍රමාණවත් වේ.''[48] බුදුපියාණන් වහන්සේගේ ධර්මය එවැනිය. උන්වහන්සේ ධර්මය ඉදිරිපත් කළ ආකාරයෙන් පුද්ගලයෙකුගේ කායික ස්වරූපවලට පවා

[46] S.V,158; A.II, 35 ff.
[47] A.III, 237
[48] S.V,390.

සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය. සාරිපුත්ත මහරහතන් වහන්සේ නකුලපිතා හමුවූ විට ඔහු කෙතරම් සංසුන් පෙනුමකින් සිටියේද යන්න උන්වහන්සේ දුටුවහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: ''ඔබ අද බුදුපියාණන් වහන්සේ සමග මුහුණට මුහුණලා සාකච්ඡාවක යෙදුනේ යැයි මම උපකල්පනය කරමි?'' නකුලපිතා පිළිතුරු දුන්නේය :'' එසේ නොවේ නම් කුමක්ද ස්වාමීන් වහන්ස? මේ දැන් මා බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ අමෘතයෙන් ඉසිනු ලැබුණි.''[49]

මිනිසුන් බොහෝ විට පුදුමය පළ කළේ බුදුපියාණන් වහන්සේගේ උදාර ත්‍යාගශීලීබව සහ විවෘතබව දැකීමෙනි. විශේෂයෙන්ම ආගමික කරුණු සැලකිල්ලට ගනිමිනි. වරක් භික්ෂූන් කණ්ඩායමක් හමුවූ විට, එහි නායකයා බුදුපියාණන් වහන්සේට ධර්මය පැහැදිලි කරන මෙන් ඉල්ලුවේය. උන්වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ: ''විවිධ අදහස්, මනාප සහ නැඹුරුතා ඇති සහ වෙනස් ගුරුවරයෙකු අනුගමනය කරන ඔබට මා උගන්වන ධර්මය අවබෝධ කිරීම දුෂ්කර වේ. ඒ නිසා අපි ඔබගේ ඉගැන්වීම් සාකච්ඡා කරමු.'' මෙම භික්ෂූහු පුදුමයට පත් වූහ. ''මෙය විශ්මය ජනකයි, සැබැවින්ම විශිෂ්ටයි, සාමණ ගෞතමයන් වහන්සේගේ බලය කෙතරම් ශ්‍රේෂ්ඨ ද? උන්වහන්සේ තමන්වහන්සේගේ ඉගැන්වීම් නොදී තබාගෙන අනෙක් අයට ඔවුන්ගේ ඉගැන්වීම් සාකච්ඡා කිරීමට ආරාධනය කරති.!''[50]

සමහර ගුරුවරුන් තම ශ්‍රාවකයන්ට හෝ ප්‍රශංසා කරන්නන්ට වෙනත් ආගම්වල අයට උදව් නොකරන ලෙස පවසනු ඇත. මෙම ආකල්පය අදටත් සමහර ආගමික පාර්ශ්වකරුවන් අතර සම්පූර්ණයෙන්ම බැහැරව නොපවතී. අනෙක් ධර්ම පිළිබඳව විවේචන කළ හැකි නමුත් බුදුපියාණන් වහන්සේ තමන්වහන්සේ පිළිබඳව මෙසේ පැවසූහ: ''මම දේවල් පළමුව සියුම් ලෙස පිරික්සා බලමි. මම වර්ගීකරණය කරමින් කතා නොකරමි.'' (විභජ්ජවාදෝ නාහං එත්ථ ඒකංසවාදෝ) [51] උන්වහන්සේ අනෙක් විශ්වාස පිළිබඳව සමස්ත සාධාරණීයකරණ කිරීම්වලින් වැළකුණි. නමුත්, ඒවා පිරික්සමින් ඒවායේ යම් සත්‍යයක් තිබේ නම් ඒවා පිළිගත් අතර, ඒවායේ ඇති දුර්වලතා පෙන්වා දුන්හ. එසේම, වෙනත් ආගම් අනුගමනය කරන්නන් සත්‍යය සොයා අවංකවම උත්සාහ කරන බවට උන්වහන්සේට පිළිගත හැකි විය. ඒ අනුව, ඒවා උනන්දු කිරීමට සහ සහාය දීමට සුදුසු විය. ජෛන ආගමිකයෙකු වූ උපාලි බෞද්ධයෙකු වීමට තීරණය කළේය. නමුත් බුදුපියාණන් වහන්සේ ඔහුට මෙසේ පැවසුවේය:'' බොහෝ කාලයක් ඔබේ පවුල ජෛනයන්ට උපකාර කර ඇත. එම නිසා ඔවුන් ඔබේ නිවසට ඉදිරියටත් දානය සඳහා පැමිණි විට, ඉදිරියටත් එසේ කිරීමට සැලකිල්ලට ගන්න.''[52] තවත් අවස්ථාවක බුදුපියාණන් වහන්සේට එක් පුද්ගලයෙක් මෙසේ පැවසුවේය:

---

[49] S.III,2.
[50] D.III,40.
[51] M.I,197.

[52] M.I,378-379.

''යහපත් ගෞතමයන් වහන්ස, මා අසා ඇත්තේ ඔබට පමණක් දානය දෙන ලෙසත්, අනෙක් අයට නොදිය යුතු බවත්, ඔබගේ ශ්‍රාවකයන්ට පමණක් බවත්, අනෙක් ශ්‍රාවකයන්ට නොදෙන ලෙසත් ඔබ කියා ඇති බවයි. ඔවුන් මෙසේ කියා ඇත්තේ ඔබේ අදහස් ද, නැතිනම් ඒ අය ඔබගේ අදහස් විකෘති කර ඇත්තේද? ඔවුන් කතා කරන්නේ ඔබගේ ඉගැන්වීම්වලට අනුවද? සැබැවින්ම, යහපත් ගෞතමයන් වහන්ස, මම ඔබ කියන දේ නොමග යවන ලෙස කියන්නට අකැමැත්තෙමි.''

බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ:

''එසේ කිවූ අය කියා ඇත්තේ මගේ අදහස් නොවේ. ඔවුන් මා කියූ දේ නොමග යවන ආකාරයෙන් පවසා ඇති අතර කියා ඇත්තේ අසත්‍යයකි. කෙනෙකු තවත් අයෙකු දානය දීමෙන් අධෛර්යවත් කරන්නේ නම්, ඔහු තුන් ආකාරයකින් අවහිරයට පත් වේ. ඔහු පරිත්‍යාග කරන්නාට කුසල් ලබා ගැනීමේ බාධා ඇති කරයි, ඔහු පරිත්‍යාගය ලබන්නාට එය ලබා ගැනීමට බාධා ඇති කරයි, සහ ඔහු ඒ වනවිටත් ඔහුගේ ලෝභය නිසා විනාශ වී ඇත.''[53]

බුදුපියාණන් වහන්සේ අන් අයගේ විශ්වාසයන් කෙරෙහි දක්වන විවෘත භාවය සහ ගෞරවය පිළිබඳව මිනිසුන් සිතුවේ කුමක් ද යන්න පිළිබඳව තොරතුරු නැත. නමුත්, එය එකල අනෙකුත් බොහෝ නිකායන් අතර පැවති, පොදු ඊර්ෂ්‍යාවෙන් සහ තරඟකාරීත්වයෙන් සතුටින් ඉවත්වීමක් ලෙස ඔවුන් සැලකුවා විය හැකිය. මිනිසුන් බුදුපියාණන් වහන්සේ පිළිබඳව මිනිසුන් නිරීක්ෂණය කළ එක් දෙයක් නිශ්චිතවම උන්වහන්සේ දේශනා කළ දේම පුරුදු කිරීමයි. උන්වහන්සේ ඇගයූ එක් පුද්ගලයෙක් වරක් ඔහුගේ මතය මෙසේ අවධාරණය කළේය:''බුදුපියාණන් වහන්සේ කතා කරන ආකාරයටම ක්‍රියා කරති. අතීතය හෝ වර්තමානය සෝදිසි කර බැලුවත්, උන්වහන්සේ හැරුණු විට, මේ තරම් ස්ථාවර ගුරුවරයෙකු අපට හමු නොවේ.''[54]

බුදුපියාණන් වහන්සේ තුළ නිශ්ශබ්දතාවය කෙරෙහි තිබූ කැමැත්ත මිනිස්සු අවධානයට ගෙන තිබුණහ. ඔවුහු එය ගෞරවයෙන් සැලකූහ. උන්වහන්සේ මෙසේ පැවසූහ: ''මෙය ජලයෙන් ඉගෙන ගන්න. කඳු කුස්තුර සහ දැඩි පරතරවල, ඝෝෂාකාරී දිය ධාරා ගලා යන නමුත්, විශාල ගංගා ගලාබසින්නේ නිශ්ශබ්දවය. හිස් දේවල් ශබ්ද නඟයි, පිරුණු දේ සැමවිටම නිශ්ශබ්දය. මෝඩයෙකු අඩක් පිරුණු මුට්ටියක් වැනිය. බුද්ධිමත් මිනිසා ගැඹුරු නිහඬ තටාකයක් මෙන්ය.''[55] නින්දා සහ ව්‍යාජ චෝදනා ඉදිරියේ

[53] A.I,161, condensed.
[54] D.II,224.
[55] Sn.720-721.

තැන්පත් නිශ්ශබ්දතාවය පවත්වාගෙන යාම විශේෂයෙන්ම බුදුපියාණන් වහන්සේ වර්ණනා කළහ. ''කෝපයට කෝපසහගත වචනවලින් ප්‍රතිචාර නොදක්වන්න. එය ජයග්‍රහණය කරන්නට අපහසු යුද්ධයකි. ධර්මය නොදන්නා අය ඔබ මෝඩයෙකු යැයි සිතන නමුත්, ඔබගේ සහ අනෙක් අයගේ සුභසිද්ධිය වෙනුවෙන් ක්‍රියා කළ යුතුයි.'' [56]

දේශනා පැවැත්වීම් සහ සංවාදවල යෙදීම සහ විවාදවල බුදුපියාණන් වහන්සේ නිරතවීම් පිළිබඳව විවිධ තොරතුරු තිබියදීත්, උන්වහන්සේ කෙසේ නමුත්, සමහර විට රාත්‍රිය පුරාම භාවනා කර ඇත, හුදෙකලා ස්ථානවලට යෑම හෝ හුදෙක් නිශ්ශබ්දව ඉඳගෙන සිටියහ. උන්වහන්සේ ''වනාන්තරවල, කැළයේ ගැඹුරු තැන්වලට, ශබ්දය බොහෝ සෙයින් අඩු නිශ්ශබ්ද ස්ථානවලට, මිනිසුන්ගෙන් ඈත ප්‍රදේශවලට, මිනිසුන්ගෙන් බාධා නොවන ස්ථානවලට සහ හුදෙකලාවට හොඳටම සුදුසු ස්ථානවල නවාතැන් සෙවූ''[57] බව විස්තර කර ඇත. එක් අවස්ථාවකදී භික්ෂු කණ්ඩායමක් ශබ්ද නගමින් කතා කරමින් සහ වාදකරමින් ඉඳගෙන සිටියහ. ඔවුහු ඈතින් වඩින බුදුපියාණන් වහන්සේ දුටුවහ. එක් භික්ෂුවක් අනෙක් අයට මෙසේ කිව්වේය: ''නිශ්ශබ්ද වන්න, ශබ්ද කරන්න එපා. ශ්‍රමණ ගෞතමයන් වහන්සේ වඩිති. උන්වහන්සේ නිශ්ශබ්දතාවට කැමතියි. නිශ්ශබ්දතාවය අගයමින් කතා කරති. අපේ කණ්ඩායම නිශ්ශබ්ද යැයි උන්වහන්සේ දුටුවහොත්, උන්වහන්සේ අප වෙත වඩිනු ඇත.''[58] උන්වහන්සේ එයම කළහ. සාකච්ඡාවක් ඒ අනුව පැවතුණි.

බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් බවට අනිවාර්යයෙන්ම පත්නොවී උන්වහන්සේ හමුවූ සහ සවන් දුන් මිනිසුන් පවා සමහර විට බුදුපියාණන් වහන්සේ කෙරෙහි සිය ප්‍රසාදය පළ කළහ. එයට හොඳ උදාහරණයක් ලෙස ප්‍රකට බ්‍රාහ්මණයෙකුවූ සොණදණ්ඩ දැක්විය හැකිය.

> ''ශ්‍රමණ ගෞතමයන් වහන්සේ උන්වහන්සේගේ පවුලේ දෙපැත්තෙන්ම පොහොසත් පවුලක උපත ලැබ, අවම වශයෙන් පරම්පරා හතක්වත් පිරිසිදු සහ නොබිඳුණු සම්භවයක් ඇති පුද්ගලයෙකි. උන්වහන්සේගේ උපත සම්බන්ධයෙන් ගත් කල නිර්දෝෂී එකකි. උන්වහන්සේ විශාල ඥාති පිරිසක් සහ බොහෝ රත්රන් සහ ධාන්‍ය අත්හළහ. උන්වහන්සේ ගුණවත්ය. උන්වහන්සේගේ ගුණවත් බව පුළුල්ය. සදහටම පුළුල් වේ. උන්වහන්සේ මනාව කතා කරයි, ප්‍රසන්න කතාබහ, විනීතය, උන්වහන්සේගේ උච්චාරණය ආකර්ෂණීයයි, පැහැදිලිය, සහ අදාළ දෙයට කතා කරයි. උන්වහන්සේ බොහෝ දෙනාගේ ගුරුවරයාය. උන්වහන්සේ ඉඳුරන් පිනවීම සහ තමා ගැන ඇති මාන්නය අත්හැර

[56] S.I,162.
[57] D.III,38.
[58] D.I,179.

> ඇත. උන්වහන්සේ ක්‍රියාව සහ ක්‍රියාවේ ප්‍රතිඵලය උගන්වති. උන්වහන්සේ නිදොස් බ්‍රාහ්මණ සම්ප්‍රදායට ගරු කරති. විශාල ධනයක් සහ වතුපිටි හිමි ප්‍රධාන පෙළේ රණවිරු කුලයේ උසස් පවුලකින් උත්පත්තිය ලැබූ බුදුපියාණන් වහන්සේ ඔබ මොබ යන භික්ෂුවකි. විදේශීය රාජධානිවලින් සහ දේශයන්ගෙන් මිනිස්සු උන්වහන්සේගේ උපදෙස් ලැබීමට පැමිණියහ. බොහෝ දෙවිවරු සහ මිනිස්සු උන්වහන්සේට හිතවත් වූහ. උන්වහන්සේ එක් විශේෂිත නගරයක හෝ ගමක නතරවී සිටියේ නම්, එම ප්‍රදේශය තුළ අනර්ථකාමී භූතයන්ගෙන් කරදර ඇති නොවේ. උන්වහන්සේට අනුගාමිකයන් විශාල පිරිසක් සිටියහ. උන්වහන්සේ ගුරුවරුන්ගේත් ගුරුවරයාය. විවිධ නිකායන්වල ප්‍රධානීන් පවා උන්වහන්සේ සමග කරුණු සාකච්ඡා කිරීම සඳහා පැමිණියහ. වෙනත් භික්ෂූන් සහ බ්‍රාහ්මණයන් මෙන් නොව, උන්වහන්සේගේ ප්‍රසිද්ධිය පදනම් වූයේ උන්වහන්සේ අව්‍යාජ ලෙස පත් වූ ඉහළම තත්ත්වය - එනම් බුද්ධත්වය සහ හැසිරීම නිසාය. මගධයේ රජු බිම්බිසාර, පුත්‍රයා සහ බිරිඳ, ඔහුගේ රාජ සභිකයන් සහ ඇමතිවරු පවා උන්වහන්සේගේ ශ්‍රාවකයන්ය. කෝසලයේ රජු පසේනදී සහ පොක්ඛරසාති බ්‍රාහ්මණයා ද එසේමයි.''[59]

සොණදණ්ඩගේ අත්‍යන්ත වර්ණනාවෙන් හෙළිවන්නේ එකල බ්‍රාහ්මණ පංතියේ ඕනෑකම් සහ සැලකිලි, ඔවුන් ප්‍රශංසනීය යැයි සිතූ දේ වන නමුත්, ඒ සමගම බුදුපියාණන් වහන්සේ පිළිබඳව යමක් හෙළි කරයි.

[59] D.I,119, condensed.

# 10. පැවිදි සහ ගිහි ශ්‍රාවකයන්

මට ඉහළම ප්‍රණාමයෙන් ගෞරව කරන්නේ, ධර්මය සමග ජීවත්වෙමින්, පරිපූර්ණ ලෙස එය ඉෂ්ට කරන, භික්ෂු භික්ෂුණීන්, උපාසක හෝ උපාසිකාවන්ය. දීඝ නිකාය (D.II,138).

බුද්ධත්වයට පත්වීමෙන් පසු, මිනිසුන් අවදි කිරීම සඳහා උපරිම පරිසරයක් ලබා දෙමින්, හැකිතාක් පුළුල් අයුරින් ධර්මය ව්‍යාප්ත කිරීමට ප්‍රජාව හා බැඳුණු යම් ආකාරයක අවශ්‍යතාවක් සමගින් බෙදා ගත් සාරධර්ම සහ ධර්මවල අවශ්‍යතාව බුදුපියාණන් වහන්සේ දුටුවහ. මේ අනුව, සිව් ගුණයකින් යුක්ත ප්‍රජාව (චතුපරිසා) යනුවෙන් හැඳින්වූ පරිණාමය විය. එහි සතර ආකාර පාර්ශ්වයන් වූයේ භික්ෂු භික්ෂුණීන් (භික්ඛු සහ භික්ඛුනී), උපාසක උපාසිකා (උපාසක සහ උපාසිකා) යනුවෙනි. මෙම ප්‍රජාවේ කොටස් අන්‍යෝන්‍ය වශයෙන් එකිනෙකා මත යැපෙන බව (අඤ්ඤමඤ්ඤං) උන්වහන්සේ නුවණින් දුටුවහ.[1] තවද, උන්වහන්සේගේ ධර්මය වෙනත් ඉගැන්වීම්වලට වඩා වෙනස් යැයි සැලකූ නිසා, උන්වහන්සේගේ ශ්‍රාවකයන්ද වෙනස්විය යුතු බවට, වඩා වැදගත් ලෙස ඔවුන්ගේ අවංක බව පමණක් නොව, ඔවුන්ගේ ඇඳුමෙන් පවා උන්වහන්සේට අවශ්‍යවූ යෝග්‍යතාවක් විය. වෙනත් නිකායන්වල භික්ෂූන් ඔවුන්ට ලැබෙන හෝ ලබා දුන් ඕනෑම විලාසිතාවක ඇඳුමක් ඇඳීමට පෙළඹුනහ. නමුත්, බුදුපියාණන්ට අවශ්‍ය වූයේ උන්වහන්සේගේ භික්ෂූන් සියලු දෙනා එකම වර්ණයෙන් යුක්ත සිවුරු පරිහරණය කිරීමය. එවිට ඔවුන් වහාම අනෙක් පැවිද්දන්ගෙන් වෙන්කොට හඳුනාගත හැකි විය. මෙම වර්ණය 'දුඹුරු' යන අර්ථය ඇති පාලි භාෂාවෙන් සාම යන වචනය සමග 'කා' යන උපසර්ගය සහ 'වැනි' හෝ 'සමාන' යන අර්ථයෙන් කාසාව යනුවෙන් හැඳින්වේ. සමහර විට දුඹුරු කහ පැහැ වර්ණයක් ලෙස විස්තර කෙරේ. [2] ගිහි ශ්‍රාවකයෝ වඩා අලංකාර, දීප්තිමත් වර්ණ සහ එම්බ්‍රෝයිඩර් ඇඳුම් වෙනුවට ආදේශකයක් වශයෙන් සුදු වර්ණයෙන් (ගිහිඔදාතවසන) සැරසුණහ. සමහර විට එයින් පිරිසිදු බව සහ සරල බව සංකේතවත් කිරීම පිළිබඳව සිතමින් විය හැකිය. බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනයේ ආරම්භයේ සිටම, තර්ජනීය හෝ භයානක තත්ත්වයකින් ආරක්ෂාව සලසන ස්ථානය, වන තුන් සරණ (තිසරණ) - සරණ ලැබීමට මිනිස්සු පැවිදි හෝ ගිහි ශ්‍රාවකයන් වීමේ සිය අදහස ප්‍රකාශ කළහ. බුදුපියාණන් වහන්සේ එවැනි සරණක් ලෙස සලකන ලදී. එයට හේතුව, උන්වහන්සේ බුද්ධත්වයට පැමිණීමෙන් නැවත ඉපදීමේ ක්‍රියාවලිය, මරණය සහ නැවත ඉපදීම අභිබවා යෑමට හැකි බව විස්තර කර ඇත. ධර්මය සරණකි. එයට හේතුව එය සාක්ෂාත් කර ගත හැකි ආකාරය පෙන්වා දෙයි. සඞගයා සරණක් වන්නේ එසේ

[1] It.111.

[2] Vin. I,306 give a range of colors monastics' robes should not be including red, yellow and orange. Buddhist monks today are often said to wear 'saffron robe', and indeed the color of their robes sometimes resembles the bright orange of saffron. But the saffron plant was unknown in fifth century BCE India and even later was never used as a dye because of its expense and poor fixing properties.

කිරීමට මගපෙන්වීම සහ ධෛර්යය, උදාහරණ වශයෙන් තත්ත්වාරෝපිත පැවැත්ම අභිබවා යෑස සඳහා උපකාරය ලබාදෙන නිසාය. සඞග යන වචනයේ අර්ථය නම්, එක් කණ්ඩායමක් හෝ සමූහයක් යන්නයි. සාමාන්‍යයෙන් භාවිත වන්නේ පැවිදි සාසනය හැඳින්වීමටයි. නමුත්, තුන් සරණයේ පිළිගැනීමේදී භික්ෂූන් සහ භික්ෂුණීන් ගැන සඳහන් නොවේ. නමුත්, රහත්ඵලය අවබෝධකරගත්, එම තත්ත්වය ආපසු හැරවිය නොහැකි හෝ වැළැක්විය නොහැකි, හෝ ඉහළ මට්ටමක පවතින අවධිය අවබෝධ කරගත් ඕනෑම කෙනෙකුට අදාළ වේ. අද දක්වා, බෞද්ධයෙකු වීමට තීරණය කළ විට, ඔවුහු සරල සූත්‍රයක් සජ්ඣායනය කරති - එනම්, මම බුදුන් සරණ යමි, මම ධර්මය සරණ යමි, මම සඞගයා සරණ යමි. එසේ කරමින්, ඔවුහු බුදුදහම කෙරෙහි ඇති විශ්වාසය සහ කැපවීම ස්ථිර කරති.

සිවු ආකාර ප්‍රජාවක් ගොඩනැගීම සඳහා බුදුපියාණන් වහන්සේගේ පළමු පියවර වූයේ පැවිදි සඞගයා පිහිටුවීමයි. පවුල් බැඳීම් සහ සමාජීය යුතුකම්වලින් නිදහස්වූ භික්ෂු ශාසනයක් රහත්ඵල ලැබීම සඳහා අවශ්‍ය ආධ්‍යාත්මික ගුණවගාවන් ඇති කර ගැනීමට හොඳම අවස්ථාව සලසයි. එසේම, එවැනි භික්ෂූහු ධර්මය බෙදාදීමට සුදුසු යහපත් තත්ත්වයක සිටිති. ආරම්භයේදී, පැවිදි ප්‍රජාවට එක්වීම සඳහා බුදුපියාණන් වහන්සේ වෙත පැමිණ භික්ෂුවක වීමට අවසර ඉල්ලීම අවශ්‍ය විය. නමුත් කාලය ගෙවී යත්ම, වඩාත් විධිමත් සහ ව්‍යූහාත්මක සංවිධානයක අවශ්‍යතාවය බුදුපියාණන් වහන්සේ දුටුවහ. පළමු භික්ෂූන් වහන්සේලා පැවිදි කර වසර ගණනාවක් ගෙවුණු පසු, කාන්තාවක් භික්ෂුණියක් වීමට කැමැත්ත පළ කිරීමෙන් පසු, භික්ෂුණී ශාසනයක් ද පිහිටුවන ලදී. බ්‍රාහ්මණවරුන් මෙන්, තමන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන්ට පූජක භූමිකාවක් ඇතැයි බුදුපියාණන් වහන්සේ කිසි විටක සිතුවේ නැත. ක්‍රිස්තියානි දේවගැතිවරුන් සහ යුදෙව් ආගමික නායකයන් මෙන් ඔවුන් ප්‍රජාවේ නායකයන් ලෙස අදහස් කළේද නැත. ඔවුන් හුදෙක් රහත්ඵලයට පත්වීමට ගැඹුරු කැමැත්තක් ඇති පුද්ගලයෝ වූහ. එම ඉලක්කය සපුරා ගැනීම කෙරෙහි පූර්ණ අවධානය යොමු කිරීමට සහ එම ඉලක්කය සම්පූර්ණයෙන්ම මුදුන්පමුණුවා ගැනීම පිණිස, සමාජයට සහ එහි අවශ්‍යතාවලට පිටුපා ඇත. මෙසේ කරමින්, ඔවුන් ධර්මය අවබෝධ කරගත් ආකාරය සහ එය පුහුණු කළ යුත්තේ කෙසේද යන්න අනෙක් අය සමග බෙදා දීමට ඔවුන් ධෛර්යවත් කර ඇත.

සාරිපුත්ත සහ මොග්ගල්ලාන බුදුපියාණන් වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවකයෝ වූහ. ළමා අවධියේ සිට මිතුරන් වූ ඔවුහු තරුණ වියේදී සඤ්ජය බෙලත්ථිපුත්ත ගුරුවරයා යටතේ පැවිදි වූහ. අවසානයේ ගුරුවරයා සහ ඔහුගේ දර්ශනය කෙරෙහි කලකිරීමට පත් වී එතැනින් ඉවත්වී, බෙදී ගොස්, වඩා යහපත් ගුරුවරයෙකු සොයමින් වෙන් වෙන්වූ මාර්ග ඔස්සේ ගියහ. දිනක් සාරිපුත්ත හිමියන් බුදුපියාණන් වහන්සේගේ ධර්මය පිළිබඳව අසා, පරිවර්තනයකට පත්වී, ඔහු සොයා ගත් අපූරු

ඉගැන්වීම පිළිබඳව තම මිතුරාට පැවසීමට ඔහු සොයා ගියේය. ඔවුන් නැවත හමුවූ විට, මොග්ගල්ලාන හිමියන් ද ධර්මය පිළිබඳව නම්මා ගෙන පැවිදි බව ලබා ගැනීම පිණිස බුදුපියාණන් වහන්සේ සොයා ගියහ.[3] ඔවුහු ඉතා පහසුවෙන් පැවිදි ජීවිතයට පත් වූ අතර, කාලයාගේ ඇවෑමෙන් බුදුපියාණන් වහන්සේ ඔවුන් උන්වහන්සේගේ ඉතාමත් දක්ෂ සහ විශ්වාස කටයුතු ශ්‍රාවකයන් සහ උරුමක්කාරයන් ලෙස සැලකූහ. සාරිපුත්තයන් වහන්සේගේ වෙසෙසි හැකියාව වූයේ ධර්මයේ වඩාත් ගම්භීර කරුණු අවබෝධ කර ගැනීමට ඇති හැකියාව සහ ඒවා පැහැදිලිව සහ අවබෝධ කරගත හැකි අයුරෙන් පැහැදිලි කර දීමේ ඇති හැකියාවයි. ඒ නිසා, බුදුපියාණන් වහන්සේ සාරිපුත්ත හිමියන්ට ධර්ම ප්‍රධානී තනතුර පැවරූහ. මොග්ගල්ලාන හිමියන්ට චෛතසික බල පහසුවෙන් ඇතිවුණි. කඩිසර භාවනා කරන්නෙකු වශයෙන්, උන්වහන්සේ තුළ ඉහළ මට්ටමේ භාවනාමය ස්ථාවරයක් විද්‍යමාන විය. බුදුපියාණන් වහන්සේ අනෙක් භික්ෂූන් සමග සැරියුත් සහ මුගලන් හිමියන් රෙකමදාරු කළහ:

> ''සාරිපුත්ත සහ මොග්ගල්ලාන අතර ඇති මිත්‍රත්වය වැඩිදියුණු කරන්න. ඔවුන් ආශ්‍රය කරන්න. ඔවුන් ප්‍රඥාවන්තයි. ආධ්‍යාත්මික ජීවිතයේදී මිතුරන්ට උපකාර කරති. සාරිපුත්ත මවක් මෙන්ය. මොග්ගල්ලාන හදාවඩාගත් මවක් වැනිය. සාරිපුත්ත අනෙක් අයට රහත් ඵලයේ පළමු පියවරට පත්වීම සඳහා පුහුණු කරයි. මොග්ගල්ලාන ඉහළම අරමුණට යෑමට පුහුණු කරයි. සාරිපුත්තට, චතුරාර්ය සත්‍යය ප්‍රකාශයට පත් කිරීමට, ඉගැන්වීමට, විස්තර කිරීමට, සොයා බලන්නට, හෙළි කිරීමට, සවිස්තරව පැහැදිලි කිරීමට සහ පෙන්වා දෙන්නට හැකිය.''[4]

මුගලන් හිමියන්ගේ චෛතසික බලයන්ගෙන් එකක් වූයේ අනාගතයේ සිදු වන සිදුවීම් දැකීමේ හැකියාවයි. වරක් සාරිපුත්ත හිමියෝ සහ මුගලන් හිමියෝ රාජගහ නුවර වේළුවනාරාමයේ පැලක වැඩ සිටියහ. මුගලන් හිමියෝ දවස හුදෙකලාවේ සහ භාවනාවේ යෙදී සිටියහ. දෙදෙනා වහන්සේලා සවස් යාමයේ හමුවූ විට මුගලන් හිමියන්ගේ ශාන්ත සිනහව රැඳුනු සංයමය නිරීක්ෂණය කර, ඒ පිළිබඳව මුගලන් හිමියන්ගෙන් ඇසූහ. මුගලන් හිමියන්ගේ පිළිතුර වූයේ, එවිට බොහෝ යෝජනා (දුර) දුරින් සාවත්ථියේ වැඩ සිටි බුදුපියාණන් වහන්සේ සමග තමන්වහන්සේ සාකච්ඡාවේ යෙදුණු බවයි. මේ පිළිබඳව දැන සිටි සාරිපුත්ත හිමියෝ මෙසේ ඇසූහ:'' බුදුපියාණන් වහන්සේ ඔබ වෙත පැමිණියේ ඍද්ධිද්වාරයෙන් හෝ ඔබ උන්වහන්සේ වෙත ඔබගේ ඍද්ධිද්වාරයෙන් එහි ගියේද?'' මුගලන් හිමියෝ පිළිතුරු දුන්හ: ''ඒ දෙකම නොවේ. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අසාමාන්‍ය

---

[3] Vin.I,38 ff.
[4] M.III,248.

ප්‍රතිවේදය සහ පියවි කනට නෑසෙන දෙයක් ඇසීමේ ඇති හැකියාව පිරිසිදු කර, ඒවා මා සමග සන්නිවේදනය කිරීමට භාවිත කළ අතර, මම මගේ එම ශක්තීන් පිරිසිදු කර උන්වහන්සේ සමග සන්නිවේදනය කිරීමට භාවිත කළෙමි.''[5] සමහර අවස්ථාවල බුදුපියාණන් වහන්සේ පිළිබඳව විස්තර කර ඇත්තේ අනෙක් මිනිසුන්ගේ මනස කියවීමට, සාමාන්‍ය දර්ශනයේ සහ ශ්‍රවණයෙන් ඔබ්බෙන් දුරස්ථව සිදුවන සිද්ධීන් දැකීමට හෝ දුරස්ථව සිදුවන සාකච්ඡා ඇසීමට හැකි පුද්ගලයෙකු ලෙසයි. බොහෝ ආගම්වල එවැනි හැකියාවන් ආරෝපණය කර ඇත්තේ දිව්‍යමය අනුග්‍රහ හෝ දේවත්වය ඇති පුද්ගලයෙකු ලෙසයි. සාමාන්‍ය විඥානය දියුණු කර, පිරිසිදු කර, මෙසේ කර ගැනීමට හැකි වී එම තත්ත්වය ලබා ගත හැකි වූ ඕනෑම පුද්ගලයෙකුට චෛතසික හැකියාවන් අවදිවන බව බුදුපියාණන් වහන්සේ විශ්වාස කළහ. මේ අනුව, බුදුපියාණන් වහන්සේට ආරෝපණය කර ඇති බොහෝ බලයන් ඉහත සඳහන් සිද්ධියේදී මෙන් හෝ වෙනත් නිකායන්වල සාමණයන්ගෙන් හෝ උන්වහන්සේගේ සමහර ශ්‍රාවකයන්ගෙන් වෙනස් නොවේ.

සාරිපුත්ත සහ මොග්ගල්ලාන යන අග්‍රශ්‍රාවකයන් සහ වෙනත් භික්ෂූන්, වෙනත් කුලවල භික්ෂූන් සහ ගිහියන් සහ බුදුපියාණන් වහන්සේ අතර ඇතිවූ සාකච්ඡා දුසිම් ගණන් ත්‍රිපිටකයේ සඳහන් වේ. මෙම සාකච්ඡාවලින් විෂයයන් සහ කරුණු පරාසයක් ආවරණය වන අතර, මෙම අග්‍රශාවකයන් දෙදෙනා ධර්මය කෙතරම් ගැඹුරෙන් උකහා ගෙන තිබුණේද යන්න ඔවුන් තුළ ඒවා පැහැදිලි කිරීමේ තිබූ හැකියාව තහවුරු කරයි. දෙදෙනා වහන්සේලාගේ මානුෂික පැත්ත ගැන ඉඳහිට කෙටි දැකීම් මාත්‍රයක් තිබුණි. දැඩි ලෙස රෝගාතුරවූ භික්ෂුවක සිය දිවි නසා ගන්නට කතා බහ කළ විට, එසේ නොකරන ලෙස සාරිපුත්ත හිමියෝ ඔහුට අයැදූහ. ''වන්න මිය නොයන්න. ජීවත් වන්න!, ඔබේ ජීවත්වීම මට අවශ්‍යයි. ඔබට සුදුසු ආහාර හෝ ඖෂධ නොමැති නම්, මම ඒවා ඔබට සපයමි. ඔබට සුදුසු රැකවරණයක් නොමැති නම්, මම ඔබට රැකවරණය සපයමි. මිය නොයන්න, ජීවත් වන්න!. ඔබේ ජීවත්වීම මට අවශ්‍යයි.''[6]

පැරණි අටුවාවල සඳහන් වන්නේ සාරිපුත්ත සහ මොග්ගල්ලාන හිමිවරු බුදුපියාණන් වහන්සේට පෙර පරිනිර්වාණයට පත් වූ බවය. ත්‍රිපිටකයේද මේ පිළිබඳව එක් කෙටි විස්තරයක් ඇත. එය උන්වහන්සේලා දෙදෙනා පරිනිර්වාණයට පත් වූ පසු, බුදුපියාණන් වහන්සේට ඇති වූ පාඩුව පිළිබඳ හැඟීම ප්‍රකාශ කිරීමකි. ''මහණෙනි. මොග්ගල්ලාන සහ සාරිපුත්ත පරිනිර්වාණයට පත් වීමෙන් පසු දැන් මට මේ ශාලාව හිස් ස්වභාවයක්

[5] S.II,275-276. The words for these two powers are *dibbacakkhu* and *dibbasota*. *Dibba* means wondrous, divine or heavenly, but I have used modern terms for them. Apparently, such abilities need to be cleared or purified, *visujjhi*, before being usable, suggesting that they are latent and more likely to manifest after some preparation. It should be pointed out that there is meagre scientific evidence for any extrasensory perception.
[6] M.III,264.

දැනේ. මීට පෙර හිස් ස්වභාවයක් ඇති නොවුණි. ඔවුන් කොහේ සිටියත්, සිදුවන්නේ කුමක් වුවත්, පෙරදී මට ඒ පිළිබඳ තැකීමක් නොතිබුණි.''[7]

බුදුපියාණන් වහන්සේගේ පළමු ශ්‍රාවකයන් වූයේ ගිහියන් දෙදෙනෙකු වූ තපස්සු සහ භල්ලික වෙළඳුන්ය. බුදුපියාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ ක්ෂණයකින් උරුවෙලාවේදී ඔවුන් හමුවී ඇත.[8] සමහර විට එය වැදගත් ද වේ. මාස ගණනාවකට පසු උන්වහන්සේ පෙර සිටි මිත්‍රයන් පස්දෙනාට උන්වහන්සේ බුද්ධත්වයට පත් වූ බව ඒත්තු ගැන්වීමට උත්සාහ කළ විට, උන්වහන්සේ මූලික සැකයට බඳුන් වූහ. එවිට, තපස්සු සහ භල්ලික වහා උන්වහන්සේගේ ගැඹුරු ආධ්‍යාත්මික ඉෂ්ට සිද්ධවීම හඳුනා ගත් අතර, උන්වහන්සේගේ ශ්‍රාවකයන් වීමට ඒත්තු ගැන්වීමක් අවශ්‍ය නොවීය. දශක ගණනාවකට පසු, සමාජයේ පහළම මට්ටමේ සිට වඩාත් ඉහළම මට්ටමේ සාමාන්‍ය පුරුෂයන් සහ කාන්තාවන් දහස් ගණනාවක් මෙම අග්‍රශ්‍රාවකයන් දෙදෙනාගේ ආදර්ශය අනුගමනය කර ඔවුන්ගේ ශ්‍රාවකයන් බවට පත්වූහ.

ගිහි පුද්ගලයන්ට ශ්‍රාවකයන් වීමට, ඔහු හෝ ඇය තුන් සරණ යා යුතුයි. පංච ශීලය (පඤ්ච සීල) අවංකව පිළිපැදිය යුතුයි. [9] මෙම පංච ශීලය බුදුපියාණන් වහන්සේගේ දර්ශනයේ මූලික සදාචාරමය ප්‍රතිපත්ති වේ. ඒවා නම්, ජීවියෙකුට හිංසා කිරීමෙන් හෝ මැරීමෙන් වැළකිය යුතුයි, සොරකම් නොකළ යුතුයි, කාමයේ වරදවා නොහැසිරිය යුතුයි, බොරු නොකී යුතුයි, සහ මත්වතුර භාවිත නොකළ යුතුයි. මෙය සැබැවින්ම, යන්තම් අවමයයි - බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සියලුම ශ්‍රාවකයන්ගෙන් ඉහළම සදාචාරමය, බුද්ධිමය සහ ආධ්‍යාත්මික ප්‍රාර්ථනාවන් බලාපොරොත්තු වූහ.''ගෘහස්ථව හෝ පැවිදිව, යහපත් පුහුණුව මම අගය කරමි. එසේම, ඔහු ගෘහපතියෙකු හෝ පැවිද්දෙකු වශයෙන්, යහපත් ආකාරයට පුහුණුවේද, එවිට, ඔවුන්ගේ නිවැරදි පුහුණුව නිසා, ඔවුහු සත්‍යයේ, ධර්මයේ සහ කුසලතාවේ ජයග්‍රාහකයෝ වෙති.''[10]

ධර්මයට නිපුණ ගිහි ශ්‍රාවකයන් ඇතුළත්ව නැත්නම් පූජනීය ජීවිතය අසම්පූර්ණ බව ත්‍රිපිටකයේ සඳහන් වේ. ''ගංගා නම් ගඟ සාගරයට ගලා යන්නා, නැඹුරු වෙන්නා සහ බැස යන්නා සේ, සහ ඒ සමග සම්බන්ධ වෙන්නා සේ, යහපත් ගෞතමයන් වහන්සේගේ පැවිදි සහ ගිහි ශ්‍රාවකයෝ නිර්වාණය වෙත ගමන් කරති, නැඹුරු වෙති, ගමනය වෙති.''[11] එසේම, ධර්ම ප්‍රචාරය තුළින් ගිහි ප්‍රජාවන් බිහි කිරීමේ කාර්යභාරයක් ඔවුන් විසින් සිදු කිරීම බුදුපියාණන් වහන්සේට අවශ්‍ය විය. පසුකාලීන ශතවර්ෂවලදී මෙම ප්‍රජා කොට්ඨාශ දෙක අතර තියුණු බෙදීමක් පැන නැගුණි. මෙහිදී, භික්ෂූහු තනිකරම ධර්මය ආරක්ෂා කරන්නන්, ගුරුවරු සහ අර්ථනිරූපණය කරන්නන් වූහ. ගිහි පුද්ගලයන් භික්ෂූන්ට ද්‍රව්‍යමය අවශ්‍යතා සපයන්නන්ගේ

[7] S.V,164.
[8] Vin.I,4.
[9] A.IV.222.
[10] S.V,19
[11] M.I,493.

කාර්යභාරය පැවරුණි. මෙම තත්ත්වය අදටත් විශාල වශයෙන් නොනවත්වා පවතී. එවැනි අනර්ථදායක බෙදීමක් ඇතිවීම බුදුපියාණන් වහන්සේගේ දැක්මට එකඟ නොවේ. එසේම එවැනි තත්ත්වයක් බුදුදහමේ පළමු පරම්පරාවන්ට නොතිබුණි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සියලු ශ්‍රාවකයන් ධෛර්යවත් කළේ ධර්මය හොඳින් දැන ඉගෙන ගෙන, ඒ තුළින් එය ආරක්ෂා කරගැනීමට උපකාර කර, අනෙක් අයට උගන්වමින් එයින් යහපත සලසා ගන්නා ලෙසයි.

''භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් වහන්සේලා, උපාසක උපාසිකාවන් ධර්මය හොඳින් ඉගෙන ගෙන, හොඳින් පුහුණුවී, දක්ෂ සහ නිපුණ, බහුශ්‍රැතව ධර්ම මාර්ගයේ යන තුරු මම පරිනිර්වාණයට පත් නොවෙමි. ඔවුන් ඉගැන්වීමේ දැඩි විශ්වාසයට එළඹෙන තුරු, ගුරුවරයාගෙන් ඔවුන් උගත් දේ අනෙක් අය අතට පත් කරන තුරු, පැහැදිලි කරන තුරු, ස්ථාපිත කරන තුරු, අර්ථ දක්වන තුරු, විශ්ලේෂණය කරන තුරු සහ ප්‍රකාශ කරන තුරු, ධර්මය එහි සියලු ආශ්චර්යයන් සමග ප්‍රකාශයට පත් කරන්නට තරම් ව්‍යාජ ඉගැන්වීම් මතුවූ විට ඒවා තරයේ ප්‍රතික්ෂේප කරමින් ඔවුන්ට එය භාවිත කරන්නට හැකි වන තුරු, මම පරිනිර්වාණයට පත් නොවෙමි.''[12]

හිරු නැගෙන්නට පෙර, අවදිව බුදුපියාණන් වහන්සේගේ දේශනා සජ්ඣායනය කරන කාන්තාවක් සහ බුදුපියාණන් වහන්සේගේ සමහර දේශනා දැන සිටි නමුත් ඇයට ඒවා සජ්ඣායනය කරන්නට හැකිද යන්න හෝ දේශනාවකදී ඇය අසා ඇති බව දැන සිටියේද යන්න පිළිබඳව පැහැදිලි නැති කාන්තාවක් සම්බන්ධයෙන්ද ත්‍රිපිටකයේ සඳහන් වේ.[13] තමන් නොදන්නා ධර්ම දේශනාවක් සම්බන්ධයෙන් දැනගැනීමට භික්ෂුවකට ගිහියෙකුගේ නිවසට යන්නට සිදුවිය හැකි උපකල්පිත තත්ත්වයක් බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. මෙයින් අඟවන්නේ අවම වශයෙන් සමහර ප්‍රදේශවල, එම ප්‍රදේශයේම භික්ෂූන් වහන්සේලාට නොතිබූ නමුත් ධර්ම දේශනා කටපාඩම් කළ ගිහි පුද්ගලයන් සිටි බවයි.[14] සම්ප්‍රදායට අනුව, සඳහන් වන්නේ, බුදුපියාණන් වහන්සේ කොසැම්බිවල සිදු කළ ධර්ම දේශනා බොහොමයක් සුළු සේවිකාවක්වූ කුජ්ජුත්තරා මතකයට නගා ගත් බවත්, ඊට පසු ඒවා සම්ප්‍රේෂණය කළ බවත්ය.[15] ධර්මය ඉගැන්වූ ගිහි ශ්‍රාවකයන් පිළිබඳව බොහෝ උදාහරණ ත්‍රිපිටකයේ ඇති අතර, ඔවුන්ගෙන් භික්ෂූන් පවා ඉගෙන ගෙන ඇත.

---

[12] D.II,104.
[13] A.IV,63; S.I,125-127.
[14] Vin.I,140-141. Lay expertise in the sacred text persisted for some centuries. Amongst the inscriptions from Sañchi dating from the 2nd and 1st centuries BCE, some donors describe themselves as "versed in the suttas", "who can chant [a text]", "a woman who knows a sutta", and some of these donors were probably lay. See Rhys Davids 1903, pp.167-169 and Marshall, pp.298 ff.
[15] Ud-a.32.

ගිහි ශ්‍රාවකයන් ධර්මය දේශනා කරන ආකාරය සහ භික්ෂූන් වහන්සේලා පවා ඔවුන්ගෙන් ඉගෙන ගත් ආකාරය පිළිබඳව උදාහරණ කිහිපයක් ත්‍රිපිටකයේ සඳහන් වේ. චිත්ත සහ හත්ථක යන අය ආදර්ශමත් බෞද්ධ ගිහියන් වූ අතර, ඔවුන්ගේ ඉගෙනීම සහ හැසිරීම අන් අයට අනුකරණය කිරීමට බුදුපියාණන් වහන්සේ අනුබල දුන්හ. උන්වහන්සේ මෙසේ පැවසූහ:

''කැපවූ මවක් තම ආදරණීය සහ එකම පුත්‍රයා නිසියාකාර අයුරෙන් ධෛර්යවත් කරන්නට අපේක්ෂා කරන්නේ නම්, ඇය ඔහුට මෙසේ කිව යුතුයි, 'ආලවියේ චිත්ත සහ හත්ථක ශ්‍රාවකයන් මෙන් වීමට උත්සාහ කරන්න.''' චිත්තක සාවත්ථියෙන් වැඩි ඈත නොවූ මච්ඡිකසණ්ඩ නගරයේ ධනවත් වෙළෙන්දෙකු සහ ඉඩම් හිමිකරුවෙකි. ඔහු පළමු වරට ධර්මය ශ්‍රවණය කර ඇත්තේ මහානාම භික්ෂුව ගෙනි. ඊට පසු ඔහු ඔහුට අයිති උද්‍යානයක් පැවිදි සඞගයා වෙනුවෙන් පූජා කර, එහි ඉඩකඩ ඇති ආරාමයක් ඉදි කළේය. ඊට පසු, මච්ඡිකසණ්ඩ වෙත පැමිණෙන ඕනෑම භික්ෂුවක හෝ භික්ෂුණියකට උණුසුම් පිළිගැනීමක් සහ ප්‍රමාණවත්, සහයෝගයක් සැමවිට ලැබීම සහතික විය. සියලු ගිහි ධර්ම ගුරුවරයන් අතර, වඩාත් උගත් සහ බහුශ්‍රැත 'චිත්ත' ලෙස බුදුපියාණන් වහන්සේ සැලකිල්ලට ගත්හ. ධර්මය පිළිගැනීමෙන් පසු, චිත්ත එය නගරයේ අනෙක් පුරවැසියන්ට ඉගැන්වූයේය. ඒවායෙන් සිය ගණන් පරිවර්තනය කළේය. වරක් මෙම නව පරිවර්තන සියල්ල රැගෙන සාවත්ථියේ වැඩ සිටි බුදුපියාණන් වහන්සේ හමුවීමට ගියේය. ත්‍රිපිටකයේ අඩංගු දේශනා, චිත්ත විසින් දේශනා කිරීමෙන් අදහස් වන්නේ ධර්මයේ ඇති ඉතා සියුම් කරුණු ඔහු හොඳින් උකහා ගත් බවයි. එසේම සැබැවින්ම ඔහු පසුව ආර්ය අෂ්ටාංගික මාර්ගයේ තුන්වන පියවරට පත්විය.

වරක්, චිත්ත විසින් ගොඩනැගු ආරාමයේ තාවකාලික ශාලාවේ භික්ෂූන් කණ්ඩායමක් ධර්මය සාකච්ඡා කරමින් සිටියහ. මනසට බාධා කරන්නේ ඉන්ද්‍රිය අරමුණු බව සමහර අය කියමින් සිටි අතර, තවත් සමහරු තරයේ දරා සිටියේ ප්‍රශ්න ඇති කරන්නේ ඉන්ද්‍රිය අවයව බවයි. චිත්ත මෙවෙලේ ආරාමයට පැමිණි විට භික්ෂූන් සාකච්ඡා කරමින් සිටියේ කුමක්ද කියා විමසුවේය:

> ''ස්වාමීන් වහන්ස, මෙම ඉන්ද්‍රිය අරමුණු සහ ඉන්ද්‍රිය අවයව යන මේ කරුණු වෙනස්වූ දෙවර්ගයකි. මා අදහස් කරන දේ ඔබවහන්සේලාට තේරුම් ගත හැකි වන පරිදි, මම ඔබලාට උපමාවක් භාවිතා කරන්නම්, එවිට මා කියන්නේ කුමක්ද කියා පැහැදිලි වේවි. කලු හරකෙකු සහ සුදු හරකෙකු බන්ධනයකින් හෝ කඹයකින් ගැට ගසා ඇතැයි සිතමු. දැන් කලු හරකා සුදු හරකාගේ විලංගුව හෝ සුදු හරකා කලු හරකාගේ විලංගුව යැයි කීම හරිද? ''

''සත්තකින්ම නැත'', භික්ෂූහු පිළිතුරු දුන්හ. ''කලු හරකා සුදු හරකාට බාධාවක් නොවේ. සුදු හරකා කලු හරකාට ද බාධාවක් නොවේ. දෙදෙනාටම බාධාව වී ඇත්තේ බන්ධනය හෝ කඹයයි.''

චිත්ත එකඟවෙමින් දේශනාව කරගෙන ගියේයඃ

''හොඳයි භික්ෂුණීන් වහන්ස, ඒ ආකාරයටම, ඇස දර්ශනයට ලක්වෙන දේවලට බාධාවක් නොවේ. එසේම දර්ශනයට ලක්වෙන දේවල් ඇසට බාධාවක් නොවේ. ඇත්තටම, බාධාව වන්නේ මේ දෙක හමුවීමෙන් පැන නගින ආශාවයි. එසේම, අනෙක් ඉන්ද්‍රිය අවයව සහ ඒවායේ අරමුණු සම්බන්ධයෙන්ද එය එසේම වේ.''

ප්‍රශ්න පැහැදිලි කිරීමේ සහ පිළිතුරු දීමේ චිත්තට තිබූ පැහැදිලි අවබෝධය සම්බන්ධයෙන් භික්ෂූහු සතුටට පත්වූහ.

තවත් අවස්ථාවක, බුදුපියාණන් වහන්සේගේ වඩාත් අසාමාන්‍ය සහ ගුප්ත කියමනක් නිසා, ව්‍යාකූලවූ **කමභි** භික්ෂුව එහි අර්ථය කුමක් දැයි පැහැදිලි කිරීමක් කළ හැකි දැයි චිත්තගෙන් විමසුවේය. එම කියමන නම්ඃ ''පිරිසිදු අත්පා ඇති, සුදු වියන් ඇති, එක රෝදයක් ඇති, අශ්ව රථය පෙරළේ. එහි එන තැනැත්තා දෙස බලන්න. වැරදි නැති ඇළ පහර කපා දමන, ඔහු අසීමිතය.''

චිත්ත මෙම පදය සැලකිය යුතු නිර්මාණාත්මක චින්තයකින්, සහ තීක්ෂණ බුද්ධියකින් යුක්තව මෙසේ පැහැදිලි කළේයඃ

''පිරිසිදු අත්පා යනු, ගුණවත්කමයි. සුදු වියන් යනු නිදහසයි, එක් රෝදයක් යනු, සිහියෙන් යුක්තවීමයි. අශ්ව රථය යනු, ශරීරයයි. එන තැනැත්තා යනු නිර්වාණයට පත්වීමයි. ධාරාව යනු තණ්හාවයි. දෝෂ රහිත, ඇළ කපන්නා සහ අසීමිත යනු සියලු කෙලෙස් විනාශ කළ පුද්ගලයාය.''

හුදෙක් සුන්දර පදයක් ලෙස පෙනෙන දෙයකට ආධ්‍යාත්මික අර්ථනිරූපණයක් දීමට චිත්තට තිබූ හැකියාව පිළිබඳව කාමභූ භික්ෂුව පුදුමයට හා තෘප්තියට පත් කරන ලදී. චිත්තට ඉගැන්විය හැකි වූයේ බුදුදහම පමණක් නොවේ. ඔහුට අනෙක් ධර්ම අභිබවන උසස්බව ප්‍රදර්ශණය කළ හැකි විය. වරක් මහාවිහාර මච්ඡිකසණ්ඩ නගරයට ඔහුගේ ශ්‍රාවකයන් විශාල පිරිසක් සමග පැමිණියේය. මහාවිහාර, චිත්ත බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයෙකු බව දනිමින්, සිතුවිලි ක්‍රියාදාමය නවත්වන භාවනාමය තත්ත්වයකට පත්විය හැකි යැයි බුදුන්වහන්සේ උගන්වන්නේ දැයි ඔහුගෙන් විමසුවේය. ''නැත'' යැයි පිළිතුරු දුන් චිත්ත පැවසුවේ, ''උන්වහන්සේ එසේ උගන්වයි, නමුත්, මම එය විශ්වාස කරන්නේ නැහැ.'' චිත්ත බුදුපියාණන් වහන්සේගේ සමහර ඉගැන්වීම්

පිළිබඳව සැක ඇති තැන් තිබෙන බවට පිළිගන්නේ යැයි පුදුමයට සහ සතුටට පත් මහාවිහාර ඔහුගේ ශ්‍රාවකයන් සියල්ලන් දෙස බලමින් මෙසේ පැවසුවේය:'' බලන්න චිත්ත කෙතරම් ඍජු සහ බුද්ධිමත් පුද්ගලයෙක් ද කියා. සියලු සිතුවිලි නවත්වන භාවනාමය තත්ත්වයක් ගැන විශ්වාස කළ හැකි ඕනෑම කෙනෙකුට මනස දැලකට හසුවිය හැකි යැයි හෝ අත භාවිත කරමින් ගංගා ගලා යෑම නැවැත්විය හැකි යැයි ද විශ්වාස කළ හැකිය.'' ඔහු නැවැත්වූ විට චිත්ත මෙසේ ඇසුවේය:''ස්වාමීනී, වඩා හොඳ කුමක්ද, දැනගැනීමද නැත්නම් විශ්වාස කිරීමද?'' ''දැනුම විශ්වාසයට වඩා බොහෝ හොඳයි'' මහාවිහාර පිළිතුරු දුන්නේය. ''හොඳයි, මගේ සියලු සිතුවිලි නවතින එම භාවනාමය තත්ත්වයට මට එළඹිය හැකිය. එසේ නම්, එය සත්‍ය බව මා දනිද්දී, බුදුපියාණන් වහන්සේ එය සත්‍ය යැයි කියන දේ මා විශ්වාස කරන්නේ කුමටද?'' ඔහුගේ කතාවට හසුවූ බව දැනගත් මහාවිහාර කෝපයට පත්ව, නැවතත් ඔහුගේ ශ්‍රාවකයන් දෙස බලා මෙසේ පැවසුවේය: ''බලන්න චිත්ත කෙතරම් හොර හිත් ඇති, වංචාකාර සහ වංක මිනිහෙක් ද කියා.'' මෙම පරිභවයෙන් නොකැළඹුණු චිත්ත මෙසේ පැවසුවේය: ''ඔබගේ පළමු ප්‍රකාශය සත්‍ය නම්, ඔබගේ දෙවන ප්‍රකාශය අසත්‍ය එකක් විය යුතුයි. එසේම ඔබේ දෙවන ප්‍රකාශය අසත්‍ය නම්, පළමු වැන්න සත්‍ය විය යුතුයි.'' එසේ පවසමින් චිත්ත පිළිතුරක් දීමට වෙහෙසමින් කෝපයට පත් මහාවිහාරගෙන් වෙන්ව අසුනෙන් නැගිට පිටව ගියේය. [16]

බුදුපියාණන් වහන්සේ ඇගයූ අනෙක් විශිෂ්ට ගිහි ශ්‍රාවකයා වූයේ හත්ථක, එනම් ආලවියේ ප්‍රධානියාගේ පුත්‍රයාය. හත්ථකට බුදුපියාණන් වහන්සේ පළමු වරට හමුවූයේ ඔහු එක් ශීත ඍතුවක හවස් යාමයේ එළිමහනේ ඇවිදින විටය. මෙම හුදෙකලාවූ භික්ෂුව තුනී සිවුරකින් පමණක් සැරසී පෙනෙන ආකාරයට කොළ අතු ඇතුරුමක් මත පමණක් සැතපී සිටිනු දැක ඔහු පුදුමයට පත්විය. බුදුපියාණන් වහන්සේ සතුටින් සිටීද කියා හත්ථක විමසුවේය. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: ''ඔව් තරුණය, මම සතුටිනි.'' ''නමුත් ස්වාමීනී'', හත්ථක තවදුරටත් විමසුවේය, ''මේ හිම ඇති කාලයයි, පොළොව ගවයින් විසින් තදින් පාගා ඇත, අතුපතර තුනීයට විසිරී ඇත, ඔබවහන්සේගේ සිවුර තුනීයි. සීතල සුළඟ හමයි. ඔබවහන්සේ සතුටින් වන්නේ කොහොමද?'' ලෝභ, ද්වේෂ හෝ මෝහයෙන් පෙළෙන නිසා සැප පහසු යහනක් ඇති සුවපහසු නිවසක වාසය කරන මනුෂ්‍යයෙකු අසතුටට පත් විය හැකි දැයි බුදුපියාණන් වහන්සේ විමසූ විට එය එසේ විය හැකි යැයි හත්ථක පිළි ගත්තේය. ''හොඳයි,' කියූ බුදුපියාණන් වහන්සේ, ''මම ලෝභය, වෛරය, සහ මෝහය යන මේ සියල්ලෙන් නිදහස් වී ඇත්තෙමි. එම නිසා, මම කොතැන සැතපුණත්, සතුටින් සිටිමි, මම සැම විටම සතුටින් සිටින්නෙමි.''[17] හත්ථක ධර්මය පිළිබඳ ඔහුගේ දැනුම

[16] S.IV,281-283; 291-192; 298-299.
[17] A.I,136-137.

සම්බන්ධයෙන් එතරම් ප්‍රසිද්ධ නොවුණි. ඔහු ප්‍රසිද්ධියට පත්වූයේ බෞද්ධ ප්‍රජාව වෙත මිනිසුන් ආකර්ෂණය කර ගැනීමට ඔහුට තිබූ හැකියාව පිළිබඳවයි. වරක් ඔහු බුදුපියාණන් වහන්සේ දැකීම සඳහා මිනිසුන් සිය ගණනක් සාවත්ථියට රැගෙන ආවේය. ධර්මය කෙරෙහි සෙසු නගරවැසියන් මෙතරම් ප්‍රමාණයක් උනන්දු කරවීමට ඔහුට හැකි වූයේ කෙසේ දැයි බුදුපියාණන් වහන්සේ හත්ථකගෙන් විමසූහ. ඔහු පිළිතුරු දුන්නේය:

> 'ස්වාමීනී, මා එසේ කරන්නේ ඔබ වහන්සේම මට ඉගැන්වූ ප්‍රජාවේ හතර ආකාර පාදයන් (සඞසවත්ථු) භාවිත කරමින්ය. [18] යම් කෙනෙකු පරිත්‍යාගශීලීත්වය තුළින් ආකර්ෂනය කළ හැකි බව මා දන්නා විට, මම පරිත්‍යාගශීලී වන්නෙමි. ඔවුන් කරුණාවෙන් ආකර්ෂණය කළ හැකි බව මා දන්නා විට, මම ඔවුන්ට කරුණාවෙන් කතා කරමි. යම් කෙනෙකු යහපත් දෙයක් කිරීමෙන් ආකර්ෂණය කළ හැකි යැයි මා දන්නා විට, මම යහපත් දෙයක් ඔවුන් වෙනුවෙන් කරමි. යම් කෙනෙකුට සමානතාවෙන් සැලකීමෙන් ඔවුන් ආකර්ෂණය කළ හැකි යැයි මා දන්නා විට, මම ඔවුන්ට සමානතාවෙන් සලකමි.''

හත්ථක විසින් සංවිධානය කරන ලද ධර්මය පිළිබඳ සාකච්ඡාවලට මිනිසුන් සහභාගී වූ විට, ඔවුන්ට සැමවිටම උණුසුම් පිළිගැනීමක් ලැබුණු බව පෙනී ගියේය. එයට ඔවුන් කැමැත්තක් දැක්වූ අතර, එය ඔවුන්ට ගෞරවයක් විය. එනිසා ක්‍රමයෙන් ධර්මය කෙරෙහි උනන්දුවෙමින් ඔවුහු නැවත නැවතත් පැමිණුනහ. හත්ථකගේ මෙම හැකියාව බුදුපියාණන් වහන්සේ ඇගයීමට ලක් කළහ. ''හොඳයි, හත්ථක, හොඳයි, මේ මිනිසුන් ආකර්ෂණය කළ යුතු ආකාරයයි.'' හත්ථක නික්ම ගිය පසු, භික්ෂූන් අමතා මෙසේ පැවසූහ: ''ආලවියේ හත්ථකට පුදුමාකාර සහ විස්මකුරු ගුණාංග අටක් තිබෙන බවට ඔබට සත්‍ය වශයෙන්ම විශ්වාස කළ හැකිය. ඔහුට විශ්වාසය සහ ගුණ යහපත්කම, උද්‍යෝගීබව සහ චෝදනාවට ලක්වීමේ බිය ඇත. ඔහු දැනුමැති, ත්‍යාගශීලී, බුද්ධිමත් සහ තැන්පත් පුද්ගලයෙකි.''[19]

බොහෝ විට උපාසිකාවන්ට ධර්ම කරුණු පැහැදිලි කිරීම බුදුපියාණන් වහන්සේ සිදු කළ බව සඳහන් වේ. උන්වහන්සේගෙන් ධර්ම කරුණු විමසීම් ඔවුන් කර ඇත්තේ ඉඳහිටය. භික්ෂූන් වහන්සේලාට ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපයා දීමට වඩා වැඩි යමක් සඳහා උපාසිකාවන් මූලිකත්වය ගෙන කටයුතු කර ඇත්තේ කලාතුරකිනි. එසේ වුවද, ඔවුන් ස්වාධීනව කටයුතු කරන ක්‍රියාකාරීන් වශයෙන් යම් බලපෑමක් ඇති කළ හැකි වී

---

[18] *Saṅghavatthu*. The meaning of this term is difficult to convey in English. It has been translated as "the four bases of gathering" and "the four bases of sympathy". Bodhi 2012, p.1684 note 687gives "the four means of sustaining a favorable relationship" and has useful comments on the term. The Buddha said the four help the world turn smoothly like a well-secured chariot wheel, D.III,192.

[19] A.IV,219-220.

තිබේ. විශාකා ආර්යාව මේ සම්බන්ධයෙන් උදාහරණයක් වේ. විශාඛා ''ප්‍රඥාවන්ත, බුද්ධිමත්, සහ උද්‍යෝගීමත්'' (පණ්ඩිතාය වියත්තාය මෙධාවිනියා) යැයි විස්තර කර ඇත. එක් කාලයකදී, සාවත්ථියේ පැවිදි ප්‍රජාව අතර, වැසි ඍතුවේ තුන්මාසය තුළ දී පැවිදි කිරීම් නොකළ යුතු බවට නීතියක් පැනවුණි. විශාඛාවගේ බෑනා කෙනෙකුට මේ කාලයේ පැවිදිවීමට අවශ්‍ය වූ නමුත්, සාවත්ථියේ භික්ෂූහු මේ ඒ සඳහා කාලය නොවන බවත්, වැසි ඍතුව අවසානවූ පසු එන ලෙස පවසමින් ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. වැසි ඍතුව අවසන් වූ පසුව, භික්ෂූහු දැන් ඔවුන්ට ඔහු පැවිදි කළ හැකි බව පැවසූ නමුත්, ඔහු පැවසුවේ තවදුරටත් ඔහු ඒ පිළිබඳව උනන්දුවක් නැති බවයි. මෙයින් හැඟෙන්නේ ඔවුන් පෙරදී ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම නිසා ඇති වූ අමනාපය බවයි. මෙම නියමය පිළිබඳව අසා, එයට තම බෑනාගේ ප්‍රතිචාරයටත් ප්‍රතිචාර දක්වමින් විශාඛා මතයක් පළ කළාය: ''ධර්මය පුහුණු නොකිරීමට නුසුදුසු කාලය කුමක්ද?'' (කං කාලං ධම්මෝ න චරිතබ්බෝ). මෙම සිද්ධිය සහ විශාඛා ඒ සම්බන්ධයෙන් කියූ දේ ඇසූ බුදුපියාණන් වහන්සේ පැවසුවේ - ධර්මය පුහුණු කරන්නට බැරි හෝ නොකළ යුතු කාලයක් නොමැති බවත්ය. එවැනි නීති පැනවීම සහ ඊට පසු එය අහෝසි කිරීම වැරදි බවත්, එසේම එසේම භික්ෂූන් වහන්සේලාට කීමට තරම් බුදුපියාණන් වහන්සේට එම හේතුව බලපෑවේය. ඊට පසු උන්වහන්සේ එම නීතිය අහෝසි කළහ.[20] පූජනීය දින පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ අදහසට විශාඛාවගේ මතය හොඳින් ගැලපුණි. එනම්, පිරිසිදු සෑම දිනක්ම පූජනීය දිනකි.[21]

බුදුපියාණන් වහන්සේ සදාචාරාත්මක මූලධර්ම සහ දාර්ශනික අදහස් සමූහයක් අර්ථ දක්වා ඒවා අතහැරියේ නැත. උන්වහන්සේගේ ධර්මය පෞද්ගලික පුහුණුව සහ චරිතය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීම සඳහාවූ වැඩසටහනක් විය යුතුය. මෙම ධර්මය මුළුමනින්ම සංක්ෂිප්ත කර ඇත්තේ චතුරාර්ය සත්‍යය (චත්තාරි අරියසච්චානි) තුළයි - එනම්, දුක්ඛ, දුකට හේතුව, දුක ජය ගැනීම සහ දුක ජයගත හැකි මාර්ගය යනුවෙනි. සාමාන්‍යයෙන් දුක්ඛ ලෙස පරිවර්තනය කර ඇති වචනය දුක්ඛ වන අතර, එහි තේරුම හුදෙක් කායික සහ මානසික වේදනාවට වඩා වැඩි යමක් වේ. එයට සාමාන්‍ය ජීවිතයේ අසම්පූණකම, ප්‍රමාණවත් නොවීම සහ කර්කශ ස්වභාවය, අපගේ ප්‍රසන්න අත්දැකීම් පවා කිසි විටකත් සම්පූර්ණයෙන් තෘප්තිමත් හෝ කල් පවතින ඒවා නොවන බව සහ ඇත්ත වශයෙන්ම මරණය අප එනතුරු බලා සිටින බව, යනාදිය ඇතුළත් වේ. දැන් නොවේ නම්, තවත් ඉදිරියට මාර්ගයේ තිබේ. පළමු ආර්‍ය සත්‍ය තුන නම්, බුදුපියාණන් වහන්සේ ලෝකය අවබෝධ කරගත් ආකාරය සහ ලෝකයට පැහැදිලි කළ ආකාරයයි. අවසාන කාරණය නම්, ශ්‍රාවකයන් විසින් කළයුතු

[20] Vin.I,153.
[21] M.I,39.

යැයි උන්වහන්සේ අපේක්ෂා කළ දෙයයි. එය බුදුපියාණන් වහන්සේ හැඳින්වූයේ ආර්ය අෂ්ටාංගික මාර්ගය (අරිය අට්ඨංගික මග්ග) වශයෙනි. එම මාර්ගය, යම් කෙනෙකු පිටත්ව යන තැන සිට - සාමාන්‍ය තත්ත්වාරෝපිත පැවැත්මක - අන්තිම නැවතුම් පොළට - තත්ත්වාරෝපිත නොවන සැනසුමක් සහ නිදහසක් සඳහා ගමන් කරයි. මෙම මාවතේම උන්වහන්සේ විසින්ම ගමන් කර එම තත්ත්වයට පත් වූ අයට අසමසම මාර්ගෝපදේශක සහ ගුරුවරයා බවට පත්වූහ. එහෙත්, එවැනි ගුරුවරයෙකු වීමට විවිධ කුසලතා අවශ්‍ය වේ - උපාය සහ සියුම් අවබෝධය, සංවේදනය, ඉවසීම සහ ඇතැම් විට ස්ථිර බව තිබිය යුතු අතර, බුදුපියාණන් වහන්සේ ශ්‍රාවකයන් සමග කටයුතු කරන විට මේ සියලු ගතිලක්ෂණ උන්වහන්සේ තුළින් ප්‍රදර්ශනය විය. බුදුපියාණන් වහන්සේ ''පුහුණුව ලබන්නන්ට අද්විතීය මඟ පෙන්වන්නෙක්'' (අනුත්තරෝ පුරිස ධම්ම සාරථී සත්ථා) බවට උදාහරණවලින් ත්‍රිපිටකය සම්පූර්ණ කර ඇත.

වරක් එක් භික්ෂුවකට උගුලකට හසුවී සිටි සතෙකු හමුවිය. අසරණ සතා කෙරෙහි අනුකම්පා උපදවාගෙන භික්ෂුව සතා නිදහස් කළේය. සාම්ප්‍රදායික මතය වූයේ එවැනි සතෙකු උගුලට හසුවූ විට, උගුල ඇටවූ පුද්ගලයා එහි අයිතිකරු බවයි. තවත් භික්ෂුවක් අනෙක් භික්ෂුව කළ දේ දැනගෙන ඔහු සතා සොරකම් කළ බවට චෝදනා කළේය. මේ පිළිබඳ කරුණු විමසූ විට, බුදුපියාණන් වහන්සේගේ මතය වූයේ, එම භික්ෂුව එසේ කළේ කරුණාව පෙරදැරි කරගෙන බවත්, ඒ නිසා සොරකම් කළ බවට චෝදනා කළ නොහැකි බවත්ය.[22] ඒ හා සම්බන්ධ සිදුවීමකදී පිලින්දවච්ඡ භික්ෂුව මංකොල්ලකරුවන් විසින් පැහැර ගත් දරුවන් දෙදෙනකු උන්වහන්සේගේ චෛතසික බලය භාවිත කරමින් බේරා ගෙන ඔවුන්ගේ දෙමාපියන්ට ආරක්ෂිතව භාර දුන්හ. වඩාත් දැඩි සහ දැන උගත් මනසින් යුක්ත භික්ෂූහු යම්කෙනෙකු දියුණු කරගත් ඕනෑම චෛතසික බලයක් ප්‍රදර්ශනය කිරීමට එරෙහි නීතිය කඩකිරීම පිළිබඳව ඔහුට චෝදනා කළහ. නැවතත් බුදුපියාණන් වහන්සේ පිලින්දවච්ඡ නිදොස් කළහ. අනුමාන කරන පරිදි, අනුකම්පාව පෙරදැරි කරගත්, ඔහුගේ ක්‍රියාව නිසා කුඩා දරුවන් දෙදෙනෙකුගේ ජීවිත බේරුණි.[23]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය පැහැදිලි කළ ආකාරය පිළිබඳව මහත් සේ පැහැදුණු ජ්‍යෝෂ්ඨ සහ උගත් බ්‍රාහ්මණ සෝණදණ්ඩ උන්වහන්සේගේ ශ්‍රාවකයෙකුවීමට කැමැත්ත පළ කළේය. ඊට පසු උන්වහන්සේගේ ශ්‍රාවකයෙකු වීමට ඇති විභව්‍ය ගැටලුවක් රහසින් මතු කළේය. ඒ ඔහු ප්‍රසිද්ධියේ බුදුපියාණන් වහන්සේට සාම්ප්‍රදායික වශයෙන් සාමාන්‍යයෙන් ශ්‍රාවකයෙකු වශයෙන් ගුරුවරයෙකුට පුදන ගෞරවය ප්‍රසිද්ධියේ පුද කළහොත්, ඔහුගේ බ්‍රාහ්මණ මිතුරන් ඔහු අවඥාවෙන්

[22] Vin.III,62.
[23] Vin.III,66.

ප්‍රතික්ෂේප කරනු ඇත යන්නයි. ඔවුන් අතර ඔහුගේ කීර්තියට හානි සිදුවනු ඇත. එම නිසා, සෝණදණ්ඩ ''මිනිසෙකුගේ කීර්තියට හානියක් සිදුවුවහොත්, ඔහුගේ ආදායමටද එසේම වනු ඇත'' යන්න පිළිගත්තේය. ඒ නිසා, බුදුපියාණන් වහන්සේ රැස්වීමකට වැඩිය විට, නැගී සිටීම වෙනුවට, අඤ්ජලි ආචාර කිරීම සමාන ලෙස සලකන්නේ දැයි ඔහු උන්වහන්සේගෙන් ඇසුවේය. සැමවිටම කරුණාවන්ත සහ සමහර විට අවබෝධයෙන් සහ සෝණදණ්ඩගේ අසීරු තත්ත්වය කෙරෙහි අනුකම්පාවක් ඇතිව, බුදුපියාණන් වහන්සේ මෙම එකඟවීම සම්පූර්ණයෙන් පිළිගත්හ.[24]

බුදුපියාණන් වහන්සේගේ ඥාතියෙකු වූ තිස්ස භික්ෂුව අන් අයට උපදෙස් දෙන විට, ඔවුන් පෙරළා ඔහුට අවවාද දෙන්නට එන විට කෝපයට පත් වන පුරුද්දක් ඔහ සතුව තිබුණි. මේ නිසා ඔහු අන් අය අතර, අප්‍රසාදයට ලක් විය. එවිට අන් අය ඔහුට ඇනුම් පද සහ බැණ වදින විට ඔහුගේ ඇස කඳුළු තෙමුණි. ඔහු වෙනස්වීමට බොහෝ උත්සාහ දැරුවේය. නමුත් සාර්ථක නොවීය. ඔහු කලකිරීමට පත් විය. ධර්මයේ ඇති ඵලදායීත්වය පිළිබඳවද සැක කිරීමට පටන් ගත්තේය. මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේට දැන්වූ විට, ධර්මය පිළිබඳව උන්වහන්සේ බොහෝ ප්‍රශ්න ඔහුගෙන් ඇසූහ : ''හොඳයි, හොඳයි තිස්ස! ඒක හරි'' යනුවෙන් බුදුපියාණන් වහන්සේ ඔහුගේ පිළිතුරු එකින් එකට ධෛර්යයක් දෙමින් පැවසූහ. ඊට පසු බුදුපියාණන් වහන්සේ ඔහුට පැවසුවේ ඔහුට ප්‍රශ්න ඇති වී ඇත්තේ ඔහුගේ ආකල්ප නිසා බවයි. එනිසා ඔහු විසින් වෙනස් විය යුතු බවයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පෞද්ගලික උපකාරය සහ මගපෙන්වීම තිස්සට ලබා දීමට පොරොන්දු වෙමින් කතාව අවසන් කළහ. ''තිස්ස, හොඳට ධෛර්යවත් වෙන්න, ධෛර්යවත් වෙන්න. ඔබ ධෛර්යවත් කිරීමට මම මෙතන සිටිමි. ඔබට උපකාර කිරීමට මම මෙතැන සිටිමි. ඔබට උපදෙස් දීමට මම මෙතැන සිටිමි.! ''[25] මෙම වචන නිසා උත්සාහ කිරීමේ නිරතවීමට තරම් තිස්සගේ කැපවීම ශක්තිමත් වූයේය. අවසානයේ ඔහු රහත්ඵලයට පත්විය. මෙම අවස්ථාව, සෝණ භික්ෂුවට උපකාර කළ ආකාරය සමග සැසඳෙන ආකාරය ඉතා සිත්ගන්නාසුලු වේ. දෙවැන්නාගේ ප්‍රශ්නය වූයේ උනන්දුව අඩු බව නොව, උවමනාවට වැඩි වීර්යයයි. රහත්ඵලයට පත්වීමට තීරණාත්මක වෙමින්, සෝණ අධික ලෙස ප්‍රයත්න දැරුවේය. අවසානයේ සිදුවූයේ, ඔහු වෙහෙසට පත්වීම සහ අසාර්ථකවීම සහ බරපතල ලෙස භික්ෂුත්වය අතහැර යෑමට සිතීමයි. ඔහු ගිහි ජීවිතයේදී නිපුණ සංගීතඥයෙකු බව දැන සිටි බුදුපියාණන් වහන්සේ

[24] D.I,125-126. Soṇadaṇda was not his personal name but a moniker indicating that he used a staff made of wood from the *Soṇa* tree, *Oroxylum indicum*. Amongst brahmans, staffs had great ritual significance and had to be made from very specific types of wood, mainly *Palāsa*; *Bilva* and *Udumbara*,see Dhammika 2018c. However, I have been unable to find any reference to *Soṇa* wood being used.

[25] S.II,282; III,106-109.

ඔහුගෙන් මෙසේ ඇසූහ:

''සෝණ මට කියන්න, ඔබ නිවෙස අතහැර යෑමට පෙර, වීණාව වාදනයේ දක්ෂයෙකු නොවේද?''
''එසේය ස්වාමීනී'' ''ඔබ මොකද හිතන්නේ? එහි තත් තද වැඩි හෝ බුරුල වැඩි වූ විට වීනාව හොඳින් සුසර වේද - වාදනය පහසු වේද?''
''නැත ස්වාමීනී.''
''එසේ නම්, තත් තදත් නැති, බුරුලුත් නැති සමබර තත්ත්වයේ තිබූ විට වීණාව වාදනය වේද?''
''එසේය ස්වාමීනී''
''එසේමයි, වීර්යය වැඩි නම් එයින් ඇතිවන්නේ නොසන්සුන් බවයි. වීර්යය අඩු නම්, සිදු වන්නේ වෙහෙසට පත්වීමයි. එමනිසා, සෝණ, ඔබගේ වීර්යය සමතුලිත කරගන්න. ඔබගේ ඉන්ද්‍රිය අවයව සංවර කරගන්න, සහ එම ස්ථානය මධ්‍යස්ථව තබා ගන්න.''[26]

ත්‍රිපිටකයේ ඉදිරිපත් කර ඇති බුදුපියාණන් වහන්සේගේ චිත්‍රය උන්වහන්සේගේ ජනප්‍රිය ප්‍රතිරූපය කිසි විටකත්, අභියෝග කරන, පරස්පර විරෝධී වන, හෝ චෝදනා මුඛයෙන් බලකර සිටින අයෙකු ලෙස ගළපා නැත. උන්වහන්සේ තමන්වහන්සේගේ කටයුතුවලින් හොඳම දේ එළියට ගෙන ඒම සඳහා මෘදු සහ දැඩි ක්‍රම (සංහ සහ ඵරුස) යන දෙකෙහි සංයෝජනයක් භාවිත කරමින් අශ්වයන් පුහුණු කරන්නෙකු ලෙසට සැසඳූ සේක. [27] මෙහිදී දැඩි යන්නෙන් උන්වහන්සේ අදහස් කළේ, සැබැවින්ම ශාරීරික දඬුවම් දීම නොවේ. නමුත්, වාචික හික්මවීමයි. භික්ෂු භික්ෂුණීන් වෙනුවෙන් ගන්නා අවසාන උපාය වශයෙන් සඞස වෙතින් නෙරපා හැරීමයි. කෙනෙකු කලබලවීමට උන්වහන්සේට යමක් කිව හැකි දැයි ඇසූ විට, එසේ කළ හැකි බවට පිළිගත්හ. නමුත්, සෑම විටම එසේ සිදුවන්නේ සැමවිටම පුද්ගලයෙකු කෙරෙහි ඇති මහාකරුණාව නිසා බව සහ එසේ කීමට උන්වහන්සේ සුදුසු කාලය තෝරා ගන්නා බවත්ය. [28]

ඉඳුරන් පිනවීමෙන් නිදහස්ව නිරතවීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ උගන්වා ඇති දේ තිබියදීත්, එසේ කිරීම ආධ්‍යාත්මික දියුණුවට බාධාවක් නොවේ යැයි කෙසේ හෝ අරිට්ඨ භික්ෂුවගේ මනසට දැනුණි. මෙය බුදුපියාණන් වහන්සේගේ අවධානයට යොමුවූ විට, උන්වහන්සේ අරිට්ඨ කැඳවා, අවිනිශ්චිත තත්ත්වය සම්බන්ධයෙන් ඔහු නිවැරදි එල්ලයට යොමු කළහ.

[26] A.III,374-375.
[27] A.II,112.
[28] M.I,393.

> ''මෝඩ මිනිසා! එවැනි පුද්ගලයෙකුට උගන්වන්න ඔබ මා කවදා හෝ දැන සිටියාද? මෝඩ මිනිසා! අකුල් හෙලීම්වල යෙදෙන්නාට දීර්ඝකාලීනව බොහෝ දුක්විඳීම් සහ ශෝකයට පත්වීම්වලට හේතුවන බව බොහෝ දේශනාවලදී මා පැහැදිලි කර නැද්ද?... නමුත් ඔබ, මෝඩ මිනිසා, ඔබගේ වැරදි ග්‍රහණයෙන් මා වරදවා දක්වා ඇත. එයින් ඔබම හානියට පත්වී ඇත. දොස් ලැබිය යුතු තත්ත්වයට පත්වී ඇත.''[29]

වරක් සාරිපුත්ත සහ මොග්ගල්ලාන අග්‍රශ්‍රාවකයන් වහන්සේලා චතුමා නමැති ශාක්‍ය නගරයේ යාබද ප්‍රදේශයකට පැමිණියහ. උන්වහන්සේලාගේ නායකත්වය සමග මෑතකදී පැවිදි වූ තරුණ භික්ෂූන් විශාල කණ්ඩායමක්ද පැමිණියහ. බුදුපියාණන් වහන්සේද නගරයේ වැඩ සිටියහ. එම නව භික්ෂූන් පිරිසගේ ඝෝෂාව පිළිබඳව බුදුපියාණන් වහන්සේ සුපරික්ෂාකාරී වූහ. උන්වහන්සේ එම පිරිසට පැමිණෙන ලෙස පණිවුඩයක් යැවූහ. ඔවුන් ආ පසු, උන්වහන්සේ මෙසේ පැවසූහ:'' මහණෙනි, ඔබලා මෙතරම් ශබ්දයෙන් ඝෝෂා කරන්නේ ඇයි? ඔබලා දැලක් පුරවූ මාලු ඇදගත් ධීවරයන් වැනිය.'' භික්ෂූන් පැහැදිලි කළේ ඔවුන් තමන්ගේ නවාතැන් සූදානම් කරමින් සිටි බවත්, දැනට නගරයේ සිටින භික්ෂූන් සමග කතා බහ කරමින් සිටි බවයි. මෙම පැහැදිලි කිරීමෙන් බුදුපියාණන් වහන්සේ සෑහීමට පත් නොවූහ. උන්වහන්සේ මෙසේ කී සේක :

''මහණෙනි, ඔබ යා යුතුයි! මම ඔබලා විසුරුවා හරිමි. ඔබලාට මා සමග නතරවිය නොහැකිය.'' තරයේ දඬුවම් ලැබූ තරුණ භික්ෂූන් පන්නා දැමීම නිසා පිටත්ව ගියහ. එසේ සිදු වන විට, චතුමාවල සිටි වැඩිහිටියෝ එම ශාලාවේ රැස්ව සිටියහ. භික්ෂූන් ආපසු යන බව දුටු ඔවුහු ඒ ගැන විමසූහ. සිදුවූ දේ අසා, සහ එම භික්ෂූන් පිළිබඳව අනුකම්පා කරමින්, වැඩිමහල්ලෝ භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් බුදුපියාණන් වහන්සේ වෙත ගියහ.

> ''ස්වාමීනී, ඔවුන් තරුණයි, මෑතදී පැවිදිවී ධර්මය පුහුණුවෙති. ඔවුන්ට ඔබවහන්සේ දකින්නට නොලැබේ නම්, ඔවුන් වෙනස් වෙනු ඇත. ජලය නොමැති බීජයක් මැලවී යන්නාසේ, මව නොදකින වසු පැටවෙකු වෙනස්වෙනු ඇත.'' කීහ.

මෙම හැඟීම්බර වචනවලින් බුදුපියාණන් වහන්සේ සංසිඳුණු සේක. භික්ෂූහු නැවත ඔවුන්ගේ නවාතැනට ගියහ. මෙවර ඔවුන් බොහෝ නිශ්ශබ්ද වනවාට සැක නැත.[30]

භික්ෂුණීන් සඳහා අමතර නීති විරෝධී ක්‍රියාවන් හතරක් තිබුණි. උරහිසේ සිට දණඉස දක්වා ඕනෑම තැනක් ආදරයෙන් වැළඳ ගැනීමට ඉඩ දීම,

---
[29] M.I,132.
[30] M.I,457-459.

තවත් භික්ෂුණියකගෙ බරපතලම වරද වසන් කිරීම, වරද කරුවූ භික්ෂුවකගේ අනුගාමිකයෙකු වීම, සහ අට ආකාරයක ආල හැඟුම් පාන ක්‍රියාවල යෙදීමයි.[31] බුදුපියාණන් වහන්සේ ශ්‍රාවකයෙකු අඩු මට්ටමේ වරදක් හෝ හැසිරීමක් නිසා පන්නා දැමුවේ ඉතා කලාතුරකිනි. වරක් සමහර භික්ෂූහු එක් භික්ෂුවකට ඔහු කළ වරදක් සම්බන්ධයෙන් තරවටු කළහ. නමුත්, ඔහු මුරණ්ඩු ලෙස ඔහුගේ වරද පිළිගැනීම ප්‍රතික්ෂේප කළේය. ප්‍රශ්න කළ විට ඔහු පිළිතුරු දීම මඟහැරියේය. කෝපයට පත්ව, සාක්ෂි තිබියදීත්, නොකඩවා ඔහුගේ නිර්දෝෂීභාවය තරයේ දරා සිටියේය. බුදුපියාණන් වහන්සේ මේ වේලාවේ එතැනින් යන විට, සිදුවන පරීක්ෂණය ස්වල්ප වේලාවක් නරඹමින් භික්ෂුව අවංකව ඉගෙන ගැනීමට හෝ වෙනස්වීමට උනන්දුවක් නැති බව තීරණය කරමින්, තදින් මෙසේ කිවූහ :''මහණෙනි, මෙම පුද්ගලයා ඉවත් කරන්න, එළියට දාන්න, පන්නා දමන්න! තවත් කෙනෙකුගේ පුත්‍රයා ඔබ පීඩාවට පත් කළ යුත්තේ ඇයි?'' විමසූහ.

කෙසේ වෙතත්, දුෂ්ටයන් ඔවුන්ගේ වැරැද්ද පිළිගෙන, අව්‍යාජ පසුතැවිල්ල පෙන්වා සමාවන ලෙස ඉල්ලූ විට බුදුපියාණන් වහන්සේ ඔවුන්ගේ මෝඩකම හෝ නරක හැසිරීම නොසලකා හරිනු ඇත. ඒ මෙසේ පවසින්ය :'' සැබැවින්ම ඔබ වැරදි කර ඇත. ඔබ මෝඩ, ව්‍යාකූල සහ අදක්ෂයෙකි. නමුත්, ඔබ කළ වරද කුමක් දැයි පිළිගෙන, ධර්මානුකූලව එය නිවැරදි කරන නිසා, මම ඔබට සමාව දෙමි. වරද කුමක් දැයි දැකීම, එය නිවැරදි කිරීම සහ අනාගතයේදී එසේ කිරීමෙන් වැළකීම උතුමන් පුහුණු කිරීමේ ප්‍රගතිය ලෙස සැලකේ.'' [32]

භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් වහන්සේලා හැමවිටම නීති කඩන බව හෝ බුදුපියාණන් වහන්සේ නිරතුරුවම නිරීක්ෂණය කරමින් සිටි බව මෙයින් අදහස් නොකළ යුතුයි. වරක් උන්වහන්සේ උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් අමතා පැවසුවේ, සෑම සුළු විනය කඩකිරීමක් සඳහාම නවකයන් හික්මවීම නොකළ යුතු බවයි. විශේෂයෙන්ම ඔවුන්ගේ විශ්වාසය සහ හොඳ හිත තවමත් සම්පූර්ණයෙන්ම වර්ධනය වී නොමැති නම්, එය එසේ නොවිය යුතු බවයි. එසේ කිරීමෙන් සිදුවන්නේ ඔවුන් අධෛර්යවත් වීමත්, ඔවුන් සතුව දැනටමත් තිබෙන යහපත් ගුණාංග විනාශවීම සහ ඔහු පලවා හැරීමත් පමණි. ඒ වෙනුවට, එක් ඇසක් ඇති මිනිසෙකුගේ ආදරණීයයන් ඔහු කෙරෙහි හැසිරෙන ආකාරයට ඔවුන් කෙරෙහිද සැලකිල්ලක් දැක්විය යුතු අතර, ඔහුගේ ඉතිරි ඇස ආරක්ෂා කර ගැනීමට සහ විනාශ නොවීමට වගබලා ගැනීම සඳහා හැකි සෑම දෙයක්ම කළ යුතුයි.[33] දුෂ්ටයන් තමන් කළ වරද පිළිගෙන, අව්‍යාජ පසුතැවිල්ලක්

[31] There were an extra four offences for nuns: allowing a male to fondle her anywhere from the shoulder to the knee; concealing the most serious offence of another nun; becoming the follower of a monk who has been suspended; and engaging in eight types of flirtatious activities.
[32] A.IV,169.
[33] M.I,444.

පෙන්වමින්, සමාව දෙන ලෙස ඉල්ලා සිටින විට, බුදුපියාණන් වහන්සේ ඔවුන්ගේ මෝඩකම හෝ අයහපත් හැසිරීම නොසලකා හරිමින් ඔවුන්ට මෙසේ වදාළ සේක:

''සැබැවින්ම ඔබ වැරදි කර ඇත. ඔබ, මෝඩ, ව්‍යාකූල අදක්ෂයෙකි. නමුත්, ඔබ කළ වරද කුමක් දැයි පිළිගෙන, ධර්මානුකූලව එය නිවැරදි කරන නිසා, මම ඔබට සමාව දෙමි. වරද කුමක් දැයි දැකීම, එය නිවැරදි කිරීම සහ අනාගතයේදී එසේ කිරීමෙන් වැළකීම උතුමන් පුහුණු කිරීමේ ප්‍රගතිය ලෙස සැලකේ.''[34]

[34] S. II,128 also S.II,205, condensed.

# 11. බුදුපියාණන් වහන්සේ වෙනත් කරුණු සම්බන්ධයෙන්

බුදුපියාණන් වහන්සේගේ චරිතාපදානයන් බොහොමයක් උන්වහන්සේගේ ජීවිතයේ සිදුවීම් විස්තර කිරීමට වඩා උන්වහන්සේගේ ඉගැන්වීම් විස්තර කිරීම සඳහා වැඩි ඉඩක් වෙන් කරන බව හැඳින්වීමේදී සඳහන් විය. නමුත්, එසේ වුවද, උන්වහන්සේගේ ඉගැන්වීම්වලින් වැඩි අවධානයක් යොමු කර ඇත්තේ ගැඹුරු සහ වඩා දාර්ශනික යැයි හඳුන්වන ඒවාටය. මෙය තේරුම් ගත හැකි දෙයක් පමණය. එවැනි ඉගැන්වීම් බුදුපියාණන් වහන්සේගේ යථාර්ථය පිළිබඳ අවබෝධයේ කේන්ද්‍රීය නාභිය සකස් කරයි. එසේ වුවද, එයින් අදහස් වන්නේ උන්වහන්සේ ඉගැන්වූ වෙනත් දේවලට ස්වල්පවූ හෝ අවධානයක් නොලැබෙන බව නොවේ. එහි ප්‍රතිඵලයක් ලෙස බොහෝ විට, උන්වහන්සේ ගැඹුරු චින්තකයෙකු ලෙස වටහාගෙන ඇත. නමුත්, මතුකර දක්වා ඇත්තේ උන්වහන්සේ විමුක්තිය කෙරෙහි පමණක් සීමාවූ අවධානය යොමු කර ඇති, ස්වල්ප වූ ඉහළ පැළැන්තියේ අයට මඟපෙන්වන ලද, සහ පුළුල් පරාසයක, සමාජයකට අල්ප බලපෑමක් හෝ අදාළත්වයක් ඇති, ස්වල්ප වූ දුර්ලභ ක්ෂේත්‍රයක දර්ශනයක් ප්‍රකාශයට පත් කරන ලද පුද්ගලයෙකු ලෙසයි. බුදුපියාණන් වහන්සේගේ වඩාත් ප්‍රසිද්ධ කියමනක් වන්නේ: ''පෙරදී සහ වර්තමානයේ මම එක දෙයක් උගන්වමි. ඒ දුක්විඳීම සහ දුක්විඳීම නතර කිරීම පිළිබඳවයි.'' [1] නමුත්, සියලු ත්‍රිපිටක තරයේ විමසා බැලීමේදී පෙනෙන්නේ පැවිදි හෝ ගිහි වේවා, ක්‍රි. පූ. පස්වන සියවසේ ඉන්දියාවේ හෝ විසිඑක්වන සියවසේදී යුරෝපයේ, ඕස්ට්‍රේලියාවේ හෝ ඇමෙරිකාවේ ජීවත් වූවත්, ඕනෑම කෙනෙකුට වැදගත්, පුළුල් පරාසයක ආකල්ප සහ හැසිරීම් පිළිබඳ වැදගත් කරුණු, අදහස් සහ නිර්දේශ බුදුපියාණන් වහන්සේ ප්‍රකාශ කළ බවයි.

බුදුපියාණන් වහන්සේගේ ධර්මයේ උන්වහන්සේ නැවත නැවතත් අවධාරණය කළ ලක්ෂණ දෙකක් ඇත. පළමුවැන්නෙන් උන්වහන්සේ අදහස් කළේ ''බොහෝ දෙනාගේ සුභසිද්ධියයි.'' (බහුජන හිතාය) එනම්, පැවිද්දන්ට පමණක් නොව, සාමාන්‍ය ජීවිතයේ ව්‍යාකූලතා, සහ පෙළඹවීම් හරහා ඔවුන්ගේ ගමන මඟ හසුරුවා ගැනීමට උත්සාහ කරන ඕනෑම කෙනෙකුටය. දෙවැන්න, උන්වහන්සේ, උන්වහන්සේගේ ඉගැන්වීම ''ක්‍රමානුකූල පුහුණුවක්, ක්‍රමානුකූල ක්‍රියාවක්, ක්‍රමානුකූල මාර්ගයක්' (අනුපුබ්බසික්ඛා, අනුපුබ්බකිරියා, අනුපුබ්බපටිපදා) බව දුටුවහ. [2]

මිනිසුන්ට විවිධ මට්ටමේ අවබෝධයන් සහ විවිධ හැකියාවන් ඇති නිසා, ඒ අනුව ධර්මයේ ආරම්භක හෝ ද්විතීයක අරමුණු ඇතුළත් කළ යුත්තේ ඉහළම සහ අවසාන ඉලක්කය වන නිර්වාණයේ සාමය සහ නිදහස සඳහා

[1] M.I,140.
[2] M.I,479.

සුදානම්වීමක් වශයෙන් විය හැකිය. නැවත ඉපදීම පිළිබඳ බුදුපියාණන් වහන්සේගේ සංකල්පයට අනුව, ක්‍රමික මාර්ගයක් පිළිබඳ සංකල්පයද වඩාත් අර්ථවත් විය. දේවවාදී විශ්වාසයන් තුළ, යම් කෙනෙකු මිය යෑමට පෙර විමුක්තිය ලැබීම සඳහා අවශ්‍ය දේ කර නොමැති නම්, ස්වර්ගයේ ද්වාර සදහටම වැසේ. නැවත ඉපදීමේ යථාර්ථය නම්, වර්තමාන ජීවිතයේදී සමහර ඉහළ ආධ්‍යාත්මික තත්ත්වයන් හෝ රහත්ඵලය අවබෝධ කරගෙන නැත්නම්, ඊළඟ ජීවිතයේදී හෝ ඊට පසු ජීවිතයේදී එසේ කිරීමට අවස්ථාව සැමවිටම තිබේ.

බුදුපියාණන් වහන්සේගේ මූලික ඉගැන්වීම් තුළම ඒවා වැදගත් වේ. නමුත්, එපමණක් නොව, ඒවා පුද්ගලයෙකුගේ පෞරුෂත්වයට සහ ආකල්පවලට සහ විවිධ කරුණු සම්බන්ධ මතවලට තවදුරටත් ඇතුළු නුවණ ලබා දෙයි. පහත දැක්වෙන්නේ ඒවායෙන් තෝරාගැනීමකි. බුදුපියාණන් වහන්සේ මෙම ආකල්ප සහ මතවලින් සමහරක් උන්වහන්සේ ඇතිදැඩිවන සමයේදී ලබා ගන්නට ඇත. අනෙක් ඒවා උන්වහන්සේ ජීවත් වූ සමාජයෙන් සහ තවත් සමහරක් උන්වහන්සේ බුද්ධත්වයට පත්වීමේදී ලබාගත් අත්දැකීම්වල ප්‍රතිඵලයක් ලෙස ඇතුළු නුවණෙන් සකස් වන්නට ඇත.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සමස්ථ දර්ශනයේ ආරම්භක මොහොතේ සිට දුක්විඳීම් හෝ අසාර්ථක බව (දුක්ඛ) පෙන්වා ඇති හෙයින්, ඇතැම් අය අදහස් කර ඇත්තේ උන්වහන්සේ මිනිස් ජීවිතයේ දැක ඇත්තේ සතුට සැබැවින්ම අත්පත් කර නොගත හැකි වූ බලාපොරොත්තු සුන්වීම සහ දුකක් බවයි. මෙය ධර්මය පිළිබඳ තරමක් බොළඳ දෘෂ්ටියක් විය හැක්කේ, එය බුදුපියාණන් වහන්සේගේ ධර්මය සම්බන්ධව මතුපිටින් අවබෝධ කර ගැනීමේ ප්‍රතිඵලයක් විය හැකි නිසාය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ විචාරකයන් උන්වහන්සේට ගෞරවය දෙනවාට වඩා, ඇතුළු නුවණ ඇති චින්තකයෙකු වූ අතර උන්වහන්සේ ලෝකයේ ධනාත්මක දේ පහසුවෙන් පිළිගත්තේය. උන්වහන්සේට, කායික සහ මානසික නොසතුට, ආතතිය සහ දුක්විඳීම් ජීවිතයේ අනිවාර්ය අංගයක් විය. එනිසා, එයට ඕනෑම යථාර්ථවාදී සහ දැනුම්වත් පුද්ගලයෙකුගේ මතය සමග එකඟවීමට සිදුවනු ඇත. මෙම දුක්වේදනා වළක්වා ගැනීමට හෝ අවම කිරීමට උත්සාහ කිරීමේදී මිනිසුන් හැකි තරම් සතුටක් සහ වාසනාවක් අත්විඳීමට පොරවදින බව උන්වහන්සේ නිරීක්ෂණය කළහ. බොහෝ විට, සිදු වන්නේ ඔවුන්ගේම දුක්විඳීම්වලින් නොරිස්සීමට පත් වීම පමණි, නැතහොත්, එම ක්‍රියාවලියේදී ඒවා අනෙක් අය පිට පැටවීමයි. මේ අනුව, දුක්විඳීම පිළිබඳ උන්වහන්සේගේ විශ්ලේෂණයේ ප්‍රමුඛතාව වන්නේ එහි හේතු, සහ සතුට සඳහා තෘෂ්ණාවේ ප්‍රතිවිපාකයි. නමුත්, මෙම දුක්විඳීම පිළිබඳ අවධාරණයෙන් සතුට සහ තෘප්තවීම සඳහා ජීවිතය ලබා දෙන බොහෝ අවස්ථාවන් සහ එවැනි අවස්ථාවන්වල ඇති වැදගත් බව බුදුපියාණන්

වහන්සේ නොසැලකිල්ලට ලක් කර නැත. ''ලෝකයේ තෘප්තියක් නොමැති නම්, එයින් මිනිසුන් ප්‍රමෝදයට පත් නොවනු ඇත.'' [3] නැවතත්, '' මම ලෝකය ලබා දුන් තෘප්තිය සොයා ගැනීමට පිටත්වූ අතර, මට එය හමු විය. නමුත්, ප්‍රඥාවෙන් එය පැහැදිලිව දැක, ලෝකයේ ඇති සීමාවන් මම දනිමි.''[4] මෙහි තෘප්තිය ලෙස පරිවර්තනය කර ඇති වචනය අස්සාද (පාලි) වන අතර, එයින් අදහස් කරන්නේ විනෝදය, ඉටුවීම, පිනවීම, මිහිරි බව ද යනුවෙනි. බොහෝ මිනිසුන් අඩුම තරමින් ඔවුන්ගේ වර්තමාන ජීවිතයේ 'ලෝකයේ ජීවත්වීමට', නියමිත බව පිළිගනිමින්, බුදුපියාණන් වහන්සේ එය උන්වහන්සේගේ ධර්මය තුළින් සැලකිල්ලට ගනිමින්, ධර්මිෂ්ට ලෙස එය කළ යුත්තේ කෙසේද සහ සතුට බෙදමින් සහ අනෙක් අයට අයහපතක් නොවන ආකාරය පිළිබඳ නිවැරදි, ප්‍රායෝගික සහ යථාර්ථවාදී උපදෙස් ලබා දුන්හ. ද්‍රව්‍යමය ධනය පිළිබඳ බුදුපියාණන් වහන්සේ දුන් උපදෙස් මේ සඳහා හොඳ උදාහරණයකි. උන්වහන්සේ වැදගත් සහ නීත්‍යානුකූල යැයි සැලකූ සතුට අතර, අයිතිය පිළිබඳ සතුට (අත්ථිසුඛ), ධනය පිළිබඳ සතුට (භෝගසුඛ) සහ ණයෙන් නිදහස්වීම පිළිබඳ සතුට (අනණසුඛ) සඳහන් වේ.

> ''නීත්‍යානුකූලව සහ අනුන්ට හානියක් නොවන පරිදි ධනය රැස්කර ගන්නා පුද්ගලයා එසේ කිරීමෙන් ඔහුම සතුටට පත් වේ, තෘප්තියට පත් වේ, එය අන් අය සමග බෙදා ගනියි, යහපත් වැඩ කරයි, තෘෂ්ණාව හෝ මෝහයෙන් මුළා නොවී, එහි ඇති සීමා දනිමින් සහ ඔහුගේම ආධ්‍යාත්මික ගුණවගාව සිතින් දරා ගනිමින්, ධනය භාවිත කරයි. ඔහු මේ සෑම දෙයක්ම සැලකිල්ලට ගැනීම ප්‍රශංසා කටයුතුයි.'' [5]

මේ අනුව, ධනවත් පුද්ගලයන්ට, ඔවුන්ගේ ධනය උපයාගත් ආකාරය, ඔවුන් එය භාවිත කළ ආකාරය සහ ඔවුන් ඒ කෙරෙහි දක්වන ආකල්පය අනුව ප්‍රශංසනීය (පාසංස) විය හැකිය. උන්වහන්සේගේ ශ්‍රාවකයන් ධනය අත්පත් කර ගත යුත්තේ, ''වෙහෙස මහන්සි වී වැඩ කරමින්, දෑතේ ශක්තියෙන් සහ නළලේ ඩහදිය, අවංකව සහ නීත්‍යානුකූලව'' යි. එනම්, සදාචාරාත්මක අයුරෙන්, නීතියේ සීමාව තුළ (ධම්මෙන) සහ අනෙක් අය සූරාකෑමට ලක් නොවන හෝ අවාසි නොවන (සංවිභජති) ආකාරයෙනි [6]. දෙවනුව, ඔවුන් තම ධනය අර්ථවත් ලෙස භාවිත කළ යුතු අතර, එමගින් ඔවුන්ට, ඔවුන්ගේ පවුල්වල අයට, මිතුරන්ට සහ ආශ්‍රිතයන්ට යම් මට්ටමක විනෝදයක් (අත්තානං සුඛේති පීණේති) ලබාදිය හැකිවිය යුතුයි.[7] යහපත් වැඩ කරමින්, මම උපමාණයේ තුන්වැන්නෙන් අදහස් කෙරෙන්නේ

[3] A.I,260.
[4] A.I,259.
[5] A.V,181, condensed.
[6] A.II,67.
[7] A.III,45.

භික්ෂූන්ට සහ ආගමික ගුරුවරුන්ට දානය දීම, පමණක් නොව, ''වරප්‍රසාද නොලත් අයට, දුප්පතුන්ට, නිවෙස් නැති සහ යාචකයන්ට'' (කපණද්ධික-වණිබ්බක-යාචකානං) උපකාර කිරීමයි [8]. මෙය ඇතුළත් තවත් සාමාන්‍ය යහපත් ක්‍රියාකාරකම් නම්, ගස් සිටුවීම, ළිං හෑරීම සහ පාළම් සහ මඟ අද්දර නවාතැන් ඉදිකිරීමයි [9].

බුද්ධිමත් ශ්‍රාවකයෙකු ජීවිතයේ සමතුලිතතාවක් (සමං ජීවිකං) පවත්වා ගැනීමට උත්සාහ දැරිය යුතු බව බුදුපියාණන් වහන්සේ නිර්දේශ කළහ. ඒ අනුව, ඔහුගේ හෝ ඇයගේ වියදම ආදායම ඉක්මවා නොයෑම සහ පමණ ඉක්මවා වියදම් කිරීම සහ තදින් මිට මොළවා ගත් පිරිමැස්මෙන් වැළකී සිටිය යුතුයි. [10] එසේම උන්වහන්සේ කෙනෙකුගේ ආදායම හතරට බෙදා, එක් කොටසක් මූලික අවශ්‍යතා සඳහා වියදම් කිරීමට, කොටස් දෙකක් ආයෝජනය කිරීමටත්, සහ අනාගත සිදුවීම් සඳහා එක් කොටසක් වෙන් කිරීමටත් උපදෙස් දුන්හ. [11]

ධනය සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේගේ නිරීක්ෂණයට ලක්වූ සහ අනතුරු ඇඟවූ එක් ඍණාත්මක පැත්තක් නම්, එයින් මිනිසුන් අහංකාරවීමට සහ උදාසීනත්වයට පත්වීමේ ප්‍රවණතාවයි. විශේෂයෙන්ම, ඔවුන්ට ඒවා ලැබී ඇත්තේ හදිසියේ හෝ පරිශ්‍රමයකින් වූ විටයි. බුදුපියාණන් වහන්සේගේ මතය මෙසේ ප්‍රකාශ කළහ: '' විශාල ධනයක් අත්පත් කර ගත් විට, එයින් ගිලිහී නොයන්නේ, නොසැලකිලිමත් වන්නේ, ඉඳුරන් පිනවීම පසු පස හඹායන්නේ සහ අනෙක් අයට හිරිහැර කරන්නේ මේ ලෝකයේ ස්වල්ප වූ මිනිසුන් ප්‍රමාණයකි.'' [12] එම නිසා, සුඛෝපභෝගී ජීවිත ගත කරන්නන්ට බුදුපියාණන් වහන්සේගේ අනතුරු ඇඟවීම වූයේ, ඔවුන්ගේ ධනයේ (ආදීනවදස්සාවී) සීමාවන් පිළිබඳව සිතෙහි තබා ගන්නා ලෙසයි. සමහර අංශවලින් මුදල්වලට බොහෝ දේ ලබා දිය හැකි නමුත්, ජීවිතයේ වැදගත්ම දේ ලබා දිය නොහැකි බව ඔවුන් දැන සිටිය යුතු බව උන්වහන්සේ අවවාද කළහ. එසේම මෙම කාරණය, ඔවුන්ගේ ධනය ඒ තුළම අවසාන වනවාට වඩා, අවසානයක් සඳහා උපක්‍රමයක් ලෙස දැකීමට ඔවුන් දිරිමත් කළ යුතුයි. එසේම සෑම කෙනෙකුටම ප්‍රවේශ විය හැකි, කිසි විටකත් සොරකම් කළ නොහැකි හෝ නැති නොවන, සහ ඊළඟ ජීවිතයට ගෙන ගිය හැකි වැඩි වටිනාකමක් ඇති තවත් ආකාරයක ධනයක් ඇති බව ඔවුන් සිහි තබා ගත යුතුයි. ''පස් ආකාරයක ධනයක් ඇත. ඒ පහ මොනවාද? ශ්‍රද්ධාව නමැති ධනය, ගුණවත් බව නමැති ධනය, ඉගෙනීමේ ධනය, ත්‍යාගශීලීභාවයේ ධනය සහ ප්‍රඥාවේ ධනයයි.'' [13] මේ හා වෙනත් ආධ්‍යාත්මික වස්තුවලින් පොහොසත් කවුරුන් හෝ වේවා, ''මිනිසෙකු හෝ ගැහැනියක, ඔවුන් දුප්පත් නොවේ. එසේම ඔවුන්ගේ ජීවිත හිස් නොවේ.''

[8] It.65.
[9] S.I,33.
[10] A.IV,282.
[11] D.III,188.
[12] S.I,74.
[13] A.III,53.

බුදුපියාණන් වහන්සේ පැවසූහ. [14].

බුදුපියාණන් වහන්සේ නිතරම අවධානය යොමු කළ තවත් ආකාරයක සතුට නම් පවුල් ජීවිතය හා බැඳි සතුටයි. එහි පදනම විවාහයයි. එකල ඉහළ කුලවල තරුණියන්ගේ දෙමව්පියන් ඇය විවාහ කර දීමට සූදානම් කළේ ඇයගෙන් නොවිමසාය. තවත් විටක බිරින්දෑවරුන් මිලදී ගැනීම පවා අසාමාන්‍ය නොවීය. බුදුපියාණන් වහන්සේ විවාහයට වඩා හොඳ අරමුණ ලෙස සැලකූ ''එකමුතුව සහ අන්‍යෝන්‍ය සෙනෙහසින්''[15] (සම්පියෙන පි සංවාසං සංමග්ගත්ථාය සම්පවත්තෙන්ති) එකට එකතු වීම වෙනුවට, මෙසේ කිරීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ බ්‍රාහ්මණයන් විවේචනය කළහ.

ස්වාමිපුරුෂයා සහ භාර්යාව එකිනෙකාට ගැඹුරින් ආදරය කර සහ සමාන කර්ම තිබුණේ නම්, ඊළඟ භවයේදී එම සම්බන්ධතාවය අලුත් කර ගැනීමට හැකිවනු ඇතැයි බුදුපියාණන් වහන්සේ විශ්වාස කළහ. [16] පරමාදර්ශී බෞද්ධ යුවළ වනුයේ වසර බොහෝ ගණනාවක් සතුටින් විවාහ දිවිය ගත කළ නකුලපිතා සහ නකුලමාතා ය. වරක් නකුලපිතා ඔහුගේ බිරිඳ ඉදිරිපිටදී බුදුපියාණන් වහන්සේට මෙසේ පැවසුවේය: ''ස්වාමීනී, මා නිකම්ම තරුණයෙකු සහ ඇය නිකම්ම තරුණියකව සිටියදී මගේ නිවසට ගෙන ආ දින සිටම, මම ඇයට ද්‍රෝහිවී නැත.'' [17] තවත් අවස්ථාවකදී, ඔහුගේ බිරිඳ නකුලමාතා, දීර්ග අසනීප තත්ත්වයකදී, ඇයගේ ස්වාමියා, ඔහු ධෛර්යමත් කරමින් සහ සැම විටම බිය සැක දුරු කරමින්, කැපවෙමින් ඔහුට සාත්තු කළාය. මේ පිළිබඳව දැනගත් බුදුපියාණන් වහන්සේ, නකුලපිතාට මෙසේ පැවසූහ: '' නකුලමාතා ඉතා කරුණාවෙන්, පූර්ණ ලෙස ආදරය දක්වමින්, ඔබගේ උපදේශකයා සහ ගුරුවරයා වශයෙන් සිටීමෙන් ඔබට බොහෝ යහපත සිදුවී ඇත.''[18] බුදුපියාණන් වහන්සේගේ දෘෂ්ටියට අනුව, මෙම ගුණාංග කල්පවත්නා සහ හරවත් සම්බන්ධතාවකට, උපක්‍රම වේ: විශ්වාසදායක වීම, අන්‍යෝන්‍ය ආදරය සහ අනුකම්පාව, සහ එකට ධර්මය ඉගෙන ගැනීමයි.

ආදරය සහ සෙනෙහසේ බැඳීම්වලට අමතරව, සාර්ථක විවාහයක් සඳහා ඉවහල් වන වෙනත් කරුණු පිළිබඳව බුදුපියාණන් වහන්සේ උපදෙස් ලබා දුන්හ. ධර්මය අනුගමනය කරන යුවලක්, ''එකිනෙකාට ආදරණීය වචන කතා කළ යුතුයි.'' (අඤ්ඤමඤ්ඤං පියංවදා) [19]. ස්වාමිපුරුෂයා ඔහුගේ යුතුකම් කොටස වශයෙන් ඔහුගේ බිරිඳට ගෞරව සහ අවංක විය යුතුයි. කිසි විටක හෙළා නොදැකිය යුතුයි, විශ්වාස කටයුතු විය යුතුයි, ඇයට ගෘහස්ථ කටයුතුවලට බලය පැවරිය යුතුයි. මූල්‍යමය සහාය දිය යුතුයි. බිරිඳ

[14] A.IV,5.
[15] A.III,222.
[16] A.II,61-2.
[17] A.II,61.
[18] A.III,295-8.
[19] A.II,59.

හොඳින් වැඩ කටයුතු කළ යුතුයි, සේවකයන් පාලනය කළ යුතුයි, ස්වාමියාට අවංක විය යුතුයි, පවුලේ ආදායම ආරක්ෂා කළ යුතුයි, සහ ගෘහස්ථ පාලනයේ නිපුණ සහ උදෙයා්ගිමත් විය යුතුයි. [20]

දෙමාපියන් සහ දරුවන් පිළිබඳව සාකච්ඡා කරන විටදී, නැවතත් ආදරයේ කාර්යභාරය සහ එයින් ලැබෙන සතුට සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ එයින් ගෙන එය සතුට හඳුනාගත්හ. කෙනෙකුගේ මවගෙන් සහ පියාගෙන් ලැබෙන ආදරය මේ ලොව ඇති සැබෑ සතුට වේ.'' [21] ''මව්වරු සහ පියවරු ඔවුන්ගේ දරුවන් වෙනුවෙන් බොහෝ දේ කරන නිසා, ඔවුන් හදා වඩා ගන්නා නිසා, පෝෂණය කරන නිසා, සහ ලෝකයට හඳුන්වා දෙන නිසා,'' දරුවන් ඔවුන්ගේ දෙමාපියන්ට ආදරය, ගෞරවය බුහුමන් දැක්විය යුතු බව උන්වහන්සේ පැවසූහ.[22] ඒ අනුව, ගෞරවයට පාත්‍රවූ සහ ආදරයෙන් රැකබලා ගන්නා දෙමාපියන්ගේ මනසෙහි ''දරුවන් කෙරෙහි සුන්දර සිතුවිලි සහ කරුණාව ඇති වේ. ඔවුහු මෙසේ සුභ පතනු ඇත, 'ඔබ දිගු කලක් ජීවත් වේවා!' එවිට ඔවුන් පිරිහීමට ලක් නොවනු ඇත. ඔවුන් දියුණු වනු ඇත.''[23]

දරුවන්ට ආදරය කිරීම සහ රැකබලා ගැනීම හැරුණු විට, ආදරණීය දෙමාපියන්, ''තම දරුවන් වැරදි කිරීමෙන් වළක්වා, යහපත් දේ කිරීමට ඔවුන් ධෛර්යවත් කරයි. ඔවුන්ට අධ්‍යාපනයක් ලබා දෙයි, ඔවුන්ට සුදුසු විවාහයක් කර දෙයි, සහ ඔවුන්ට යම් උරුමයක් ලබා දෙනු ඇත.'' බුදුපියාණන් වහන්සේ පැවසූහ.[24] කෘතඥතාවයේ ආශීර්වාදය ලෙස දරුවන්ට ඔවුන් වෙනුවෙන් දෙමාපියන් කළ සියලු දේ සඳහා ආපසු ගෙවිය නොහැකි බව බුදුපියාණන් වහන්සේ අවධාරණය කළහ. ඊට පසු උන්වහන්සේ මෙම කොන්දේසිය එකතු කළහ:'' නමුත්, නොඇදහිලිවන්ත දෙමාපියන් ධර්මය විශ්වාස කිරීමට උනන්දු කරන, කවුරුන් හෝ උනන්දු කරන්නේ නම්, දුෂ්චරිතවත් දෙමාපියන් සුචරිවත් කරන්නේ නම්, හෝ නූගත් දෙමාපියන් ප්‍රඥාවන්තයන් කරන්නේ නම්, එවැනි පුද්ගලයා එසේ කරමින්, ඔවුන්ගේ දෙමාපියන්ට ආපසු ගෙවයි, ආපසු ගෙවීමට වඩා වැඩි යමක් කරයි.''[25]

ගෞතමයන් වහන්සේගේ මවගේ, සුළු මවගේ සහ පියාගේ නම් සහ තවත් සුළු තොරතුරු කිහිපයක් හැරුණු විට, උන්වහන්සේගේ ඇතිදැඩිවීම්, දෙමාපියන් සහ ඥාතීන් සමග තිබූ සම්බන්ධය කිනම් ආකාරයේද යන්නත්, පසුව, විවාහය සාර්ථක වූයේ ද නැද්ද යන්න පිළිබඳව අප කිසිවක් නොදනිමු. උන්වහන්සේගේ අභිනිෂ්ක්‍රමණය, ගෘහස්ථ ජීවිතය අසාර්ථකවීම නිසා සිදුවූවක් බවට සාක්ෂි නැත. එයට පෙළඹී ඇත්තේ ගෘහස්ථයෙන්

[20] D.III,190.
[21] Dhp.332; Sn.262; 404.
[22] A.II,70
[23] A.III,76-77.
[24] D.III,189.
[25] A.I,61.

ආධ්‍යාත්මික වශයෙන් ඉහළට යෑමේ ගැඹුරු කැමැත්තකිනි. සමහර විට, ඉතාමත් සතුටෙන් සිටින පුද්ගලයෝ පවා ඔවුන්ගේ පවුල් හැර දමා වුවත් යන අදහසින් පවා එසේ කිරීමට සූදානම් වෙති. විවාහමය ප්‍රේමය, දෙමාපිය ප්‍රේමය සහ දාරක ප්‍රේමය කෙනෙකු වෙත යොමුවන්නේ ආදරය සහ සෙනෙහස ශක්තිමත්වූ නිවසකින් බව බුදුපියාණන් වහන්සේගේ අදහස සහ උපදෙසයි.

ඉහතින් පෙනෙන පරිදි, බුදුපියාණන් වහන්සේට අවශ්‍ය වූයේ උන්වහන්සේගේ ගිහි ශ්‍රාවකයන් සමාජයෙන් ලබාදෙන යහපත් සහ කායික සහ මානසික වශයෙන් ගුණදායක දේවලට සහභාගිවී ඒවායෙන් ප්‍රතිලාභ ලබා ගැනීමයි. නමුත්, ඒ අතරම, බොහෝ සමාජ ක්‍රියාකාරකම්වලට පොදුවූ සරල, නොවැදගත් සහ අවධානය වෙනතකට යොමු කරවන දේවලින් පසුබසින ලෙස බුදුපියාණන් වහන්සේ ඔවුන් දිරිමත් කළහ. සාමාන්‍යයෙන් ඉතා දැඩි ලෙස ආගමික සහ සදාචාර නීතිරීති අනුගමනය කරන්නන් හා බැඳුණු කුරිරුබවේ දැඩි භාවය සහ බලයෙන් නම්මා ගැනීමට පෙළඹීමක් නොමැතිව, උන්වහන්සේට ස්වභාවයෙන්ම තිබුණේ පාරිශුද්ධ පැත්තකි. වැදගැම්මකට නැති කතාබහ, කවටකම්, මත්වතුර භාවිතය සහ සූදුව, අලසකම, ප්‍රමාදවී අවදිවීම, රාත්‍රීවනතුරු නිවසින් බැහැරව සිටීම, සහ විවිධාකාර සැහැල්ලු විනෝදාස්වාදයන්වලින් මගහරින ලෙස බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට උපදෙස් දුන්හ. මෙය විශේෂයෙන්ම භික්ෂූන් සහ භික්ෂුණීන් සම්බන්ධයෙන් සත්‍යයක් විය.

> ''මහණෙනි, ගරු කටයුතු පුද්ගලයන් පුහුණු කිරීමේදී ගායනා කිරීම අඥෝනාවකි. නැටීම වික්ෂිප්ත කරවන්නකි. බොහෝ සේ සිනහවීමෙන් දත් බාල බව පෙන්වයි. එම නිසා, ගායනයෙන්, සහ නැටීමෙන් වළකින්න. නමුත්, ධර්මය ඔබ සතුටට පත් කරන්නේ නම්, සිනහවකින් සංග්‍රහ කිරීම පිළිගත හැකිය.''[26]

වරක් බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ පුත් රාහුලට පවසා ඇත්තේ විහිළුවකටවත් සත්‍ය නොවන කිසිවක් නොපවසන ලෙසයි.[27] පැවිදි වෘත්තිය යනු කොන්දේසි සහිත පැවැත්මේ අඩුපාඩු සහ සීමාවන් ඔබ්බෙහි තිබෙන පවත්නා තත්ත්වයකට එළඹීමට කැපවූ ගැඹුරු එකක් බව මෙම වචනවලින් අර්ථවත් වේ. ''ලෝකය ගිණිගනිමින් පවතිද්දී මෙම සිනහව සහ ප්‍රීතිය ඇයි? අඳුරට ආවරණය වී සිටිද්දී, ඔබ ආලෝකය සොයන්නේ නැද්ද?''[28] එවැනි නිර්දේශ සිදු කිරීමට ප්‍රායෝගික හේතුන්ද තිබිය හැකිය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ භික්ෂූන් පිළිබඳව ගිහි පුද්ගලයන්ගේ මතය ඉහළ මට්ටමක පවතිනු ඇතැයි සැලකිලිමත් වූහ. ඒ වගකීම්ැති, වැදගත් සහ සමාජ සිදුවීම් කෙරෙහි උනන්දුවක් නොදක්වන යන හැඟීමක් පෙන්වූ පැවිද්දන්ට සහයෝගය ආකර්ෂණය කිරීම සඳහා

[26] A.I,261; Sn.328; 926.
[27] M.I,415.
[28] Dhp.146.

මෙසේ කිරීමට වැඩි ඉඩකඩක් ඇත.[29] රාජගහ හි වාර්ෂික හිල්ටොප් උළෙල අතරතුර සමහර මිනිසුන් භික්ෂූන් වහන්සේලා කණ්ඩායමක් උත්සවශ්‍රීය නරඹමින් සිටිනු දුටු අතර, ඔවුන් සාමාන්‍ය ගිහියන්ට වඩා ඇත්තේ සුළු වෙනසක් බව ප්‍රකාශ කළහ. මෙම අදහස් බුදුපියාණන් වහන්සේට නැවත වාර්තා කළ විට, භික්ෂූන් උත්සව සහ සල්පිල්වලට නොගිය යුතු බවට උන්වහන්සේ නීතියක් පැනවූහ.

වෙනස් හේතූන් මත වුවත්, බුදුපියාණන් වහන්සේගෙන් ගිහියන්ටද සමාන පණිවුඩයක් තිබුණි. මත්වතුර කෙතරම් අසම්මත දෙයක් ලෙස බුදුපියාණන් වහන්සේ සැලකුවාද කිවහොත්, උන්වහන්සේ පංචශීලයට පදනම්වූ සදාචාරමය ප්‍රතිපත්තියට මත්වතුරෙන් වැළකීම ඇතුළත් කළහ. මේ සඳහා උන්වහන්සේ දුන් හේතූන් නම්, මත්වතුර භාවිතයෙන්, මුදල් නාස්තිවීම සහ වාදවිවාද, අසනීප, නින්දාවට ලක්වීම, ප්‍රසිද්ධියේ අපහාසයට ලක්වීම (බිම ඇදවැටී පුද්ගලයෙකුගේ යට ඇඳුම් නිරාවරණය වීම) සහ ප්‍රජනන හැකියාවන් දුබලවීම යනාදියයි. [30] උන්වහන්සේ ශික්ෂාපදවලට ඔට්ටු ඇල්ලීම ඇතුළත් නොකළද උන්වහන්සේ මුදලට ඔට්ටු අල්ලන ඕනෑම ක්‍රීඩාවක් හෙළා දැක්කහ. සූදුව පිළිබඳ සමාජ යථාර්ථයන් තියුණු ඇසකින් බැලූ බුදුපියාණන් වහන්සේ ඒ හා සම්බන්ධ ගැටලු, ජයග්‍රහණය කරන්නාට ප්‍රතිවිරෝධය පළ කිරීම, යනාදී වශයෙන් පරාදයට පත්වන්නා ඔහුගේ පරාජය පිළිබඳව ශෝක වේ, එයින් මූල්‍යමය ප්‍රශ්න ඇති වේ, සූදුවේ යෙදෙන්නන් අවිශ්වාස කටයුතු පුද්ගලයන් සේ සැලකේ, මිත්‍රයන් සූදුවේ යෙදෙන්නන් සැමවිටම මුදල් ඉල්ලන නිසා, ඔවුන් මගහරින නිසා, සූදුවේ යෙදෙන්නෙකු සමග විවාහවීමට කිසිම දෙමාපියෙකු ඉඩ නොහැරීම යනාදී හේතූන් ඉදිරිපත් කළහ. [31]

පැරණි ඉන්දියාවේ මැඩපවත්වාගත නොහැකි සූදු ක්‍රියාවන්වලින් ඍණාත්මක විපාක එවැනි ප්‍රශ්නවලින් ඔබ්බට බොහෝ දුර ගොස් ඇත. පුරුෂයන්ට සමහර විට ඔවුන්ගේ බිරින්දෑවරුන්, දරුවන් සහ තමන් පවා ඔට්ටුවට තැබූහ. ඔවුන් පරාජය වුවහොත්, ඔවුන් හෝ ඔවුන්ගේ පවුල් ණය ගෙවන තුරු වහල්කමට යොදවා ගන්නා ලදී. [32] බුදුපියාණන් වහන්සේගේ මත්වතුර සහ සූදුවට ඇබ්බැහිවීම සම්බන්ධ තක්සේරුවෙන් පුද්ගලයන්ට සහ සමාජයට ඇති වන බලපෑම පිළිබඳව දක්වන සැලකිල්ල ඉස්මතු කර පෙන්වයි. ඒවායෙන් කිසිවක්, නූතන විද්‍යාඥයන්, මනෝවිද්‍යාඥයන් සහ අපරාධ වේදියන්ට නුහුරු නොවෙනු ඇත. එවැනි ක්‍රියාකාරකම් ප්‍රතික්ෂේප කිරීම සඳහා යම් කෙනෙකු වෙනත් කෙනෙකුගේ විනෝදයට බාධා කරන්නෙකු විය යුතු නැත.

කෙසේ නමුත්, සමහරු අහිංසක විනෝදාස්වාදය ලෙස සලකන්නට හැකි

---

[29] Vin.II,107.
[30] D.III,182-183.
[31] D.III,183; Sn.106.
[32] M.III,170

දේ පිළිබඳව බුදුපියාණන් වහන්සේට තිබූයේ පහත් මතයකි. ''බහුලව පවත්වන උත්සවවලින් ඇති වන භය ආකාර අවාසි ඇත. පුද්ගලයෙකු සැමවිටම සිතන්නේ, 'ඔවුන් ගායනා කරන්නේ කොහේද? සංගීතය කොහේද? ඉදිරිපත් කිරීම කොහේද? අත්පුඩි ගැසීම කොහේද? බෙරවාදනය කොහේද?''' [33] සමහර විට, උන්වහන්සේ සිතුවේ කල්පනාකාරී සහ අවංක ගිහි ශ්‍රාවකයන්ට එවැනි උත්සවවලට සහභාගීවීමට වඩා හොඳින් කාලය ගත කළ හැකි බවයි. අනෙක් අතට, එවැනි එක්රැස්වීමකදී සිදුවූ සමහර සිදුවීම්වලදී, සත්ත්ව සටන්, අශිෂ්ට සංදර්ශන, අධික ලෙස මත්වතුර භාවිතය, පමණට වඩා ආහාර ගැනීම් සහ ආල හැඟීම් පෑම ආදිය ඇතුළත් වී ඇත. රැඟුම්හල සම්බන්ධ කළමණාකරු බුදුපියාණන් වහන්සේට පවසා ඇත්තේ වියපත් නළු නිළියන් මිය ගිය විට විනෝදයෙන් පිරි දෙවිවරුන්ගේ ස්වර්ගයට යන බව ඔහුට දැනගන්නට ලැබුණු බවත්, ඒ පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ අදහස කුමක්ද යන්නත් විමසා සිටියේය. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දීම මගහැරීමට උත්සාහ කළ නමුත්, කළමණාකරු ඔහුට පිළිතුරු දෙන මෙන් පෙරැත්ත කළේය. බුදුපියාණන් වහන්සේ පැවසුවේ, රාගය, කෝපය, ප්‍රබෝධ කිරීම්, ප්‍රකෝප කිරීම්, ශෝකය, ඇවිස්සීම වැනි චිත්තවේග නළු - නිළියන් ප්‍රේක්ෂකයන් තුළ ඇති කිරීම සහ ඔවුන් රඟපාන විට ඔවුන් තුළම ඒවා අවශෝෂණය කරන්නට උත්සාහ කරන අතර, එයින් අදහස් වන්නේ ඔවුන් 'මරණින් පසු විනෝදවන අපායට' යන බවයි. මේ අවස්ථාවේදී අසරණ කළමාණාකරු කඳුළු සලන්නට විය.[34]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සමකාලීනයන්ගෙන් බහුතරයකට වඩා වෙනස්වූ එක් දෙයක් නම්, එකල එකවිට සැම තැන තිබූ ජනප්‍රිය මිථ්‍යා විශ්වාසයන් කෙරෙහි උන්වහන්සේ දැක්වූ ආකල්පයි. එක් ධර්ම දේශනාවකදී උන්වහන්සේ ''සත්ත්ව කලා'' (තිරච්චාන විජ්ජා) යනුවෙන් හඳුන්වනු ලබන විශාල ප්‍රමාණයක, උන්වහන්සේ විසින් ගණනය කළ බවත්, කිසි විටෙකත් එවැනි දේවලට සම්බන්ධ නොවන බවත් පැවසූහ.

තමන්වහන්සේ කිසි දිනක එවැනි දේවලට සම්බන්ධ නොවන බව ද පැවසූහ. මේවාට හස්ත රේඛා ශාස්ත්‍රය, හොඳ හෝ නරක වර්ෂාපතනයක් හෝ යුද්ධයේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය, නිවෙස් සඳහා වාසනාවන්ත භූමි තෝරාගැනීම්, ස්වර්ගයේ වස්තූන්ගේ චලනය හෝ වල්ගා තරු සහ සූර්යග්‍රහණ හටගැනීම් තුළින් අනාගතය කියවීම, අද්භූත බලවේග සහ කූට වෛද්‍ය වෘත්තිය පුහුණු කිරීම, මන්ත්‍ර ගුරුකම් කිරීම් තුළින් දෙවිවරුන්ගෙන් උපකාර ඉල්ලා සිටීම ඇතුළත් බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. [35] උන්වහන්සේගේ ශ්‍රාවකයන් මැජික් වශීකරණ සජ්ඣායනය නොකළ යුතු බව, සිහින සහ සළකුණු අර්ථදැක්වීම නොකළ යුතු බව, හෝ

---

[33] D.III,183; Sn.106.
[34] S.IV,306-307. The Buddha's low opinion of the theatre and actors put him in very good company. See Jonas Barish's *The Anti-theatrical Prejudice*, 1981.
[35] D.I,8-11. See also Sn.927 and S.III,238-239.

ජ්‍යෝතිෂය පුහුණු නොකළ යුතු බව පවසන විට එයින් අදහස් කළේ බොහෝ විට භික්ෂූන් සහ භික්ෂුණීන් විය යුතුයි. [36]

නමුත්, බුදුපියාණන් වහන්සේ අනුගාමිකයන්ට එවැනි පුරුදුවලින් ඈත්වන ලෙස අනතුරු ඇඟවීමක් කළේ, එවැනි සාත්තර කීම සමග අලුගෝසුවන්, මස්මරන්නන්, ද්වේශ සහගත ලෙස අසත්‍ය කියන්නන් සහ දූෂිත නඩුකාරවරුන්, නැවත උපදින්නේ ඉතා අප්‍රසන්න තත්ත්වයන්ට පත්වීමෙන් බව කීමෙන්ය.[37] එවැනි පුරුදුවල යෙදෙන අය, ''පිටමං කරනු ලැබූ තැනැත්තෙකුවීමට, කෙලෙසුණු චරිතයක් ඇත්තෙකු, ගිහි ප්‍රජාවගේ රොඩු බවට''[38] පත්වෙන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ. හානිකර නොවන මිථ්‍යා සහ ජන විශ්වාසයන් ලෙස සැලකිය හැකි දේ පවා, බුදුපියාණන් වහන්සේ අධෛර්යවත් කළහ. වරක් උන්වහන්සේ දේශනාවක් සිදු කරන විට, කිවිසුම් පිට කළහ. පිරිස අතරින් ගීතිකා කණ්ඩායමක එක් සාමාජිකයෙක් නැගිට ශබ්දයෙන් 'දිගු කල් ජීවත් වන්න! ' යැයි කීහ. කවදත් තර්කාන්විත පුද්ගලයෙක් බුදුපියාණන් වහන්සේගේ දේශනාවේ හරයෙන් මොහොතකට පිට පනිමින්, කිවිසුම් පිට කළ විට, 'දිගු කල් ජීවත් වන්න! ' යැයි කිව්වොත්, ජීවිත කාලය දීර්ඝ වේදැයි විමසුවේය. ප්‍රේක්ෂකයන් එය එසේ නොවන බව පිළිගත් අතර, බුදුපියාණන් වහන්සේ ඔවුන්ට උපදෙස් දුන්නේ අනාගතයේදී එවැනි දේවලින් වැළකෙන ලෙසයි. [39]

ජනප්‍රිය විශ්වාසයන්, සිරිත් විරිත් සහ මිථ්‍යා විශ්වාසයන් බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළේ, බොහෝ විට, එක් ආකාරයකින් හෝ වෙනත් ආකාරයකින්, උන්වහන්සේගේ කර්මය පිළිබඳ ඉගැන්වීම් මඟහැරීම් කළ හැකි යැයි හෝ පරස්පර විරෝධී ප්‍රකාශ කිරීම් නිසා විය හැකිය. පුද්ගලයෙකුගේ වර්තමාන තත්ත්වය සහ අනාගතයේ ඉරණම තත්ත්වාරෝපණය වන්නේ ඔහුගේ චේතනය මුල්වූ කායික, වාචික සහ මානසික ක්‍රියාවන්හි සදාචාරාත්මක ගුණාත්මකභාවය මතයි. එවැනි පුරුදු සමග බොහෝ විට බැඳී ඇති රැවටීම් සහ වංචාව පිළිබඳව ඔහු දැනගෙන සිටිය යුතුයි.

පැරණි ඉන්දියාවේ ජනප්‍රිය මිථ්‍යා විශ්වාස සහ චෛතසික හැකියාවන් අතර බොහෝ කොටස් වැසී තිබුණි. බුදුපියාණන් වහන්සේට පළමුවැන්න පිළිබඳව පැහැදිලි අකැමැත්තක් තිබුණි. දෙවැන්න කෙරෙහි උන්වහන්සේගේ ආකල්පය පරීක්ෂාකාරී පිළිගැනීමකි. එයට හේතුව නිරීක්ෂණය කිරීමට පෙර, බොහෝ දේවල් පැහැදිලි කර ගත යුතුයි. ප්‍රාතිහාර්යයන් (පාටිහාරිය) යනු සාමාන්‍යයෙන් සිතනු ලබන්නේ යම් ආකාරයක අද්භුත ජීවීන් - විවිධ වර්ගයේ කරුණාවන්ත හෝ හානිකර

---

[36] Sn.927. Magic charms here is *āthabbaṇa* which refers to the spells and sorcery of the *Atharvaveda*.

[37] S.II,255-266.
[38] A.III,206.
[39] Vin.I,140.

දෙවිවරු හෝ ප්‍රේතයන්, විසින් සිදු කළ හෝ සම්බන්ධ වන දෙයක් ලෙසය. කෙසේ නමුත්, එවකට බොහෝ අය ප්‍රාතිහාර්යමය ලෙස සැලකූ සමහර දේ, බුදුපියාණන් වහන්සේ මානසික සංවර්ධනයේ, විශේෂයෙන් ප්‍රබල භාවනාවේ ප්‍රතිඵලයක් හෝ අතුරු ඵලයක් ලෙස වටහා ගත්හ.

ඒ අනුව, බෞද්ධ සන්දර්භය තුළ, ප්‍රාතිහාර්යයන් පිළිබඳවට වඩා චෛතසික බලයන් (ඉද්ධි) පිළිබඳව කතා කිරීම වඩා සුදුසු වේ. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී සමහර භික්ෂූන්ට ආධ්‍යාත්මික හික්මීමේ ප්‍රතිඵලයක් ලෙස චෛතසික බලයන් තිබූ බව බුදුපියාණන් වහන්සේ නිදහස් සිතින් පිළිගත්හ. ඔවුන් එවැනි බලයන්වල වැදගත් බව වැරදි ලෙස අර්ථනිරූපණය කරන්නට හෝ ඒවායෙන් වැරදි නිගමනවලට එළඹෙන්නට ඉඩ ඇත. නමුත්, ඒවා විද්‍යමාන කරන පුද්ගලයා කිසියම් දෙවියෙකුගේ ආශීර්වාදයෙන් හෝ දුෂ්ට බලවේග විසින් භාවිත කරමින් ලබා ඇති බවට කරන ප්‍රකාශ බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. එසේ වුවද, උන්වහන්සේ අධිමානුෂික හැකියාවන් පිළිබඳ සියලු ප්‍රකාශයන් කෙරෙහි දැක්වූයේ සන්සුන් බවක්ය. වරක්, උන්වහන්සේගේ භික්ෂුවකට''අධිමානුෂික හැකියාවන්, චෛතසික වික්‍රමයක් හෝ ප්‍රාතිහාර්යයක් නිරූපණය කරන ලෙසත් එවිට, තවත් බොහෝ මිනිසුන් ඔබ කෙරෙහි විශ්වාස කරනු ඇතැයි'' පුද්ගලයෙකු කියා ඇත. කල්පනාකාරී සහ සැක කරන පුද්ගලයන්ට සාධාරණ සැකයන් ඇති කළ හැකි එවැනි බලයන් තිබෙන බව බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ. කෙසේ නමුත්, සෑම කෙනෙකුටම විශ්වාස කළ හැකි එවැනි එක් බලයක් තිබෙන බවත්, එය උන්වහන්සේ හඳුන්වන්නේ චෛතසික බලය හෝ ශික්ෂණයේ ආශ්චර්යය (අනුසාසන) බව පැවසූහ. මෙය සමන්විත වූයේ, ආගමික ප්‍රතිපදාවනට අවධානය දෙන්නට අන් අය ධෛර්යවත් කිරීම, යම් ආකාරවලින් සිතන්නට සහ හැසිරීමට සහ එය යම් කාලයක් තුළ නොපසුබටව කරගෙන යාමටත්ය.[40]

තවත් අවස්ථාවක එක් ධනවත් වෙළෙන්දෙකු සතුව වටිනා සඳුන් භාජනයක් උනබම්බු කණුවක් මත තබා එය නගර මධ්‍යයේ තබා තිබුණි. ඊට පසු ඔහු නිවේදනයක් නිකුත් කර චෛතසික බලය යොදමින් කණුවේ මුදුනට නැග එම භාජනය ගන්නට යම් කෙනෙකුට අභියෝගයක් කළේය. ධ්‍යාන බලයෙන් ඉහළ පාවීමේ එම හැකියාව පහළ කළ පිණ්ඩෝල භික්ෂුව එම අභියෝගය භාර ගනිමින් එම භාජනය ගලවා ගත්තේය. මේ පිළිබඳව දැනගත් බුදුපියාණන් වහන්සේ දැඩි භාෂිතයෙන් භික්ෂුවට පරිභව කළහ: ''ඔබ කාලකණ්නි කාසියක් වෙනුවෙන් තමන්ගේ වස්ත්‍රය ඔසවන ගණිකාවක් වැනිය.'' ඊට පසු, උන්වහන්සේ භික්ෂු භික්ෂුණීන්ට ඔවුන් විසින් දියුණු කරගන්නා කිසිම චෛතසික බලයක් ප්‍රදර්ශනය කිරීම වරදක් ලෙසට දැන්වූහ. පිණ්ඩෝලගේ ආකර්ෂණීය ප්‍රදර්ශනයෙන් පසු, සිදු වූ දේ පිළිබඳව බුදුපියාණන් වහන්සේගේ ප්‍රතිචාරය පැහැදිලි කිරීමට උපකාරී වේ. ''ඝෝෂාකාරී, කලබලයට පත් පිරිස් පිණ්ඩෝල වටා ගමන් කිරීමට පටන්

[40] D.I,211 ff.

ගත්තේය.''[41]

බුදුපියාණන් වහන්සේට අවශ්‍ය වූයේ මිනිසුන් උන්වහන්සේට සහ උන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන්ට ඔවුන්ගේ ගුණවත්කම සහ ප්‍රඥාව නිසා ගෞරව කිරීම මිස අසාමාන්‍ය හෝ ප්‍රාතිහාර්යමය බලයන්ගෙන් වශීකරණය කිරීමෙන් නොවේ. අධිමානුෂික ප්‍රපංචයකට සම්බන්ධ ඒ හා බොහෝ විට සම්බන්ධ ප්‍රශ්නයක් තවත් සිදුවීමකින් අවධාරණය කරයි. ඒ පමණ ඉක්මවූ ප්‍රකාශ කිරීම් ව්‍යාප්ත කිරීම් සහ අවසානයේදී සනාථ කළ නොහැකි බොරු පවා විකාශනය කිරීමයි. ප්‍රාතිහාර්යමය බලයන් පිළිබඳ ප්‍රසිද්ධියක් ඉසිලූ නිර්වස්ත්‍රව සිටින පාටිකපුත්ත තවුසන් ඒ සම්බන්ධයෙන් නොමසුරු අනුග්‍රහයක් ලැබුවේය. ඔහු වේසාලියේ රැස්වීමකදී මෙම අභියෝගය භාර ගත්තේය.

> ''සාමණ ගෞතමයන් වහන්සේ ඥානවන්ත මිනිසෙකු යැයි කියා සිටින විට, මමද එසේ කියමි. ප්‍රඥාවන්ත පුද්ගලයෙකු හරි නම්, චෛතසික විස්මයක් සිදු කරමින් ඒ බව ඔප්පු කළ යුතුයි. බුදුන් වහන්සේ භාගයක් දුර ආවොත්, මම ඉතුරු භාගය එන්නෙමි. හමුවූ පසු අප දෙදෙනාටම විස්මයජනක දෙයක් කළ හැකිය. බුදුන් වහන්සේ එකක් කළොත්, මම දෙකක් කරමි. ඔහු දෙකක් කළොත්, මම හතරක් කරමි. ඔහු හතරක් කළොත් මම අටක් කරමි. සාමණ ගෝතමයන් වහන්සේ චෛතසික විස්මයන් බොහොමයක් සිදු කළත්, මම ඒවා මෙන් දෙගුණයක් කරමි.''[42]

අවසානයේදී, පාටිකපුත්තට නියමිත වේලාවට පැමිණීමට නොහැකි විය. ඔහුගේ අභියෝගයෙන් කිසිවක් සිදුවූයේ නැත.

ආශ්චර්යමත් බලයන් ආධ්‍යාත්මික හෝ සදාචාරාත්මක ජයග්‍රහණ පිළිබඳව පවා සාක්ෂි ලෙස නොගත යුතු බව බෞද්ධ සම්ප්‍රදාය දීර්ඝ කාලයක් තිස්සේ පෙන්වා දී ඇත. බුදුපියාණන් වහන්සේට අනුව, ප්‍රාතිහාර්යයන් එක් දෙයක් වන අතර, ධර්මය මුළුමනින්ම වෙනත් දෙයකි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''අධිමානුෂික හැකියාවන්, චෛතසික වික්‍රමයන් හෝ ප්‍රාතිහාර්යයන් සිදු කරන්නේ හෝ නොකරන්නේ වුවද, ධර්මය ඉගැන්වීමේ මගේ අරමුණ වන්නේ, එය පුහුණු කරන ඕනෑම කෙනෙකු දුක්විඳීමෙන් සම්පූර්ණ නිදහස ලබා ගැනීමට මග පෙන්වීමයි. ඒ අනුව, ප්‍රාතිහාර්යයන් සිදු කිරීමේ තේරුම කුමක්ද?''[43]

කුලය (වර්ණ) සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේගේ ආකල්පය උන්වහන්සේගේ සමාජයේ බොහෝ දෙනෙකු සමග අමුතු තත්ත්වයට පත් කළ තවත් අංශයකි. නමුත්, වෙනත් සමාන නිකායන්, විශේෂයන්ම ජෛන

[41] Vin.II,110-111.
[42] D.III,12-17.
[43] D.III, 4.

ආගම කුලය පවා ප්‍රතික්ෂේප කර ඇත. හයවන සහ පස්වන ශතවර්ෂවලදී පැවති කුල ක්‍රමය පසුකාලීනව තරම් දැඩි හෝ සියල්ල වැළඳගත් එකක් නොවූවද, එය තවමත් මිනිසුන් අතර බාධක ඇති කළ අතර, සමහරුන් උත්පත්තිය පිළිබඳ අහම්බයක් හෝ ඔවුන්ට කරන්නට බල කෙරුනු වැඩ හැර වෙනත් කිසිම හේතුවක් නොමැතිව, නිවට සමාජීය තත්ත්වයට යටහත් පහත් තත්ත්වයට ඇද හෙළන ලදී. නමුත්, එය එක් කණ්ඩායමක් අතර උසස් බව සහ බලය පිළිබඳ හැඟීමක් ඇති කළ අතර, තවත් කණ්ඩායමක් කොන් කර ඇත.

වේදයට අනුව, පජාපති දෙවියන් විසින් තමන්ගේ ශරීරයේ විවිධ කොටස්වලින් කුල හතර නිර්මාණය කර ඇත. නමුත්, බුදුපියාණන් වහන්සේට ශතවර්ෂ කිහිපයකට පෙර, බ්‍රහ්ම නමැති අලුත් දෙවිකෙනෙකු එසේ කළ බව සහ ඒ සඳහා ඔහුට ගෞරවය හිමි විය යුතු බවත් කියැවේ. අස්සලායන නමැති විද්වතා බුදුපියාණන් වහන්සේ සමග සිදු කළ සාකච්ඡාවකදී, බ්‍රාහ්මණ ආගමේ පොදුවේ පිළිගත් කුලය පිළිබඳ අදහස ලබා දී ඇත.

'' බ්‍රාහ්මණ කුලය උසස්ම කුලයයි. අනෙක් කුල පහත්ය. ඔවුන් නිකැළැල්ය. අනෙක් කුළ අඳුරුය. බ්‍රාහ්මණයන් පිරිසිදුය. අනෙක් කුලවල අය අපිරිසිදුය. බ්‍රාහ්මණයන් බ්‍රහ්මගේ දරුවන්ය. උපත ලබා ඇත්තේ බ්‍රහ්මගේ මුඛයෙන්ය, බ්‍රහ්ම විසින් මවා ඇත. බ්‍රහ්මගේ උරුමක්කාරයන්ය.''[44]

මෙයට සමගාමීව, සෑම කුලයකටම දිව්‍යමය වශයෙන් පැවිදිවූ තනතුරක් සහ සමාජ කාර්යභාරයක් ඇති බවට වූ ධර්මය මෙය විය. බ්‍රාහ්මණ එසුකාරී එය මෙසේ දක්වයිඃ

> ''බ්‍රාහ්මණයෙකුට බ්‍රාහ්මණයෙකු වෙනුවෙන් සේවය කළ හැකි බවත්, වංශාධිපතියෙකුට බ්‍රාහ්මණයෙකුට සේවය කළ හැකිය, වෙළෙන්දෙකුට බ්‍රාහ්මණයෙකුට සේවය කළ හැකිය, සහ දාසයෙකුට බ්‍රාහ්මණයෙකුට සේවය කළ හැකි බවත්, බ්‍රාහ්මණයෝ වන අපි තරයේ කියා සිටිමු. වංශාධිපතියෙකුට වංශාධිපතියෙකු වෙනුවෙන් සේවය කළ හැකිය, වෙළෙන්දෙකුට කළ හැකිය, දාසයෙකුටද කළ හැකිය. වෙළෙන්දෙකුට වෙළෙන්දෙකු වෙනුවෙන් සේවය කළ හැකිය, දාසයෙකුට ද කළ හැකිය. නමුත්, දාසයෙකුට පමණක් දාසයෙකු වෙනුවෙන් සේවය කළ හැකිය. තවත් එසේ කළ හැක්කේ කාහටද?'' [45]

කෙටියෙන් කිවහොත්, බ්‍රාහ්මණයන් අනෙක් සියලු කුලයන්ට වඩා ඉහළය. දාසයන් අනෙක් සියලු කුලයන්ට වඩා පහත්ය. බුදුපියාණන් වහන්සේ

[44] M.II,149.
[45] M.II,177-178. *Manusmṛti* VIII, 413-414 says: "The menial was created by the Self-existent One solely to labour as a slave for the brahman. Even if he is released by his master a menial remains a slave for that is his nature and no one can remove that from him".

පිළිගත් එකම වැදගත් සමාජ බෙදීම වූයේ නිවැසියන් (ගහපති) සහ නිවාස අතහැර ගිය (පබ්බජිත), එනම්, පැවිද්දන්ය. මෙම තත්ත්වයන් දෙකම තීරණය කරනු ලැබුයේ කිසිදු සහජ ගුණාංගයකින් නොව, කෙනෙකුගේ ජීවන රටාව සහ ජීවන ඉලක්ක අනුව වේ. කුලය ලෙස ස්ථාවර වෙනවාට වඩා, එක් පුද්ගලයෙකුට එකකින් තවත් එකකට යෑමට තෝරා ගත හැකිය.

බුදුපියාණන් වහන්සේ හේතු කිහිපයක් මත කුල ක්‍රමය විවේචනය කළහ. එය නියම කරනු ලැබුයේ උත්තරීතර ජීවියෙකු යැයි පැවසීම මිථ්‍යාවක් මිස අන් කිසිවක් නොවේ.[46] බ්‍රාහ්මණයන් උපත ලැබුවේ බ්‍රහ්මගේ මුඛයෙන් බව බ්‍රාහ්මණයෙකු පැවසූ විට, බුදුපියාණන් වහන්සේ උපහාසාත්මකව පැවසුවේ, අනෙක් අය මෙන්ම ඔවුන්ද මවගේ කුසින් උපත ලබා ඇති බව නිරීක්ෂණය කළ හැකි කරුණක් බවයි. උන්වහන්සේ පෙන්වා දුන්නේ යෝන, කාම්බෝජියා සහ යාබද රටවල කුලයක් නොමැති බවත්, එනිසා විශ්වීය සහ ස්වභාවික යථාර්ථයකට වඩා කලාපීය චාරිත්‍රයක් බවයි. [47]විවිධ කුලවලට විවිධ හැකියාවන් සහ පෞරුෂයන් ඇති බවට කරන ප්‍රකාශ අත්දැකීම්වලින් ඇති වූ ඒවා නොවේ. ඒ නිසා ඒවා වලංගු නොවේ.[48] බ්‍රාහ්මණවරු පිරිසිදු යැයි කරන ප්‍රකාශය බුදුපියාණන් වහන්සේ පිළිගත්තේ දාස කුලයේ සහ රොඩී (රැහෙන් පැන්නුවන්ගේ) කුලයේ අය අපිරිසිදු වන්නේ ඔවුන් අපිරිසිදු රැකියා සඳහා බලයෙන් යොමු කරන නිසාවෙන් විය හැකි බවයි. නමුත් ඔවුන් සෝදාගත්තොත් අනෙක් අය මෙන්ම පිරිසිදු විය හැකි බවයි.[49] බුදුපියාණන් වහන්සේ තවදුරටත් පෙන්වා දුන්නේ, කියනු ලබන දිව්‍යමය කුලයේ මූලාරම්භය ආර්ථිකමය යථාර්ථයන්ට පවා පටහැනි බවයි. කුලයෙන් නෙරපා හරින ලද පුද්ගලයෙකුට පොහොසතෙකු වන්නට හැකි වුවහොත්, ඔහුට අසරණ දුප්පත් බ්‍රාහ්මණයෙකු යොදවා තමන් වෙනුවෙන් බලා සිටීමට, සේවය කිරීමට සහ තමන්ගේ අණක් ක්‍රියාත්මක කරන්නට බල කළ හැකි වේ.[50]

එලෙසම රජෙකු විසින් ප්‍රේක්ෂකාගාරයක් ප්‍රකට බ්‍රාහ්මණයෙකුට පවා ලබා දෙන්නේ ඔහු රාජකීයයන්ගේ පැමිණීමෙන් යුක්ත කඩතුරාවකින් වෙන් කරනු ලැබුවහොත් පමණි.[51]

---

[46] M.II,148.

[47] M.II,149. Yona was the Indian name for Greece and was also used for Greeks who had migrated to Gandhāra on India's north-western border regions. A few such immigrants may well have gone further east of this too. The Buddha's mention of Yona has been used to prove that the discourse in which he used the word must date from after Alexander's invasion of India in 326 BCE. But that there were Greeks in Gandhāra before Alexander is almost certain. The Achaemenid empire stretched from Asia Minor to western India, and Greeks in the service of the empire and intrepid merchants moved freely through it. The first Greek known to have visited India was Skylaxof Karyanda who, in 520 BCE, led a naval expedition from Punjab down to the mouth of the Indus. Hekataios of Miletos (549–486 BCE) and Herodotus (484-425 BCE) both wrote about India and probably got some of their information from Greeks who had first-hand knowledge of the country. Likewise, it is likely that Indians from the Middle Land had travelled to Gandhāra and bought back stories about Greeks and their customs, that their attitude to caste became a talking point, and came to the notice of the Buddha. See Anālayo 2011, p.551-552.

[48] M.II,150; Sn.116.

[49] M.II,151.

[50] M.II,85.

[51] D.I,103.

බුදුපියාණන් වහන්සේගේ දෘෂ්ටිකෝණයෙන් බලන කල, මිනිසුන්ට සලකන ආකාරය සහ ඔවුන්ට ලබා දෙන ගෞරවය සහ ඔවුන්ට තිබූ අවස්ථාවන් රඳා පවතින්නේ ඔවුන්ගේ සදාචාරාත්මක වැදගත් හැසිරීම් මත මිස මිනිසා විසින් සාදන ලද අත්තනෝමතික සමාජ හෝ දේවධර්ම කාණ්ඩ මත නොවේ.

> '' විවිධ විශේෂ ජීවීන් ගණනාවක් ඇති බැවින් ජීවීන් අතර ඇති වෙනස මම ඔබට නියම සහ පිළිවෙලට සහ ඇත්ත වශයෙන්ම පැහැදිලි කරමි. තණ සහ ගස්, කෘමීන්, කුඩා සහ හතරැස් සිව්පාවන්, උරගයන්, මත්සයන් සහ පක්ෂීන් විවිධ විශේෂ ඇත. එක් විශේෂයකින් තවත් විශේෂයක් වෙන්කර හඳුනාගත හැකි ලක්ෂණ බොහෝ ඇත. නමුත් මිනිසුන් අතර ඒවායේ ලක්ෂණවල වෙනසක් නොමැත. හිසකෙස්වල, කන්වල, ඇස්වල, බෙල්ලේ, උරහිසේ, බඩ පිටුපස, තට්ටම්වල, පපුවේ නොවෙයි. ස්ත්‍රී පුරුෂ ලිංගේන්ද්‍රයේ, අත්වල, පාදයේ ඇඟිලි, හෝ නියපොතුවල, පැටවුන්ගේ, කලවාවල, වර්ණයේ හෝ කටහඬේ, වෙනත් ජීවීන්ගේ මෙන් නොවේ. (සමහර ආකාරවලින්) මනුෂ්‍යයන්ගේ වෙන්වී තිබුණද, ශරීර සමාන වේ. කතා කරන වෙනස්කම් සාම්ප්‍රදායික ඒවා පමණි.[52]

බුදුපියාණන් වහන්සේගේ කුලය පිළිබඳව තිබූ ආකල්පය සම්බන්ධයෙන් අදහස් දක්වා ඇති අය පෙන්වා දී ඇත්තේ උන්වහන්සේ කුල ක්‍රමය අහෝසි කිරීමට උත්සාහ කළ ප්‍රතිසංස්කරණවාදියෙකු නොවන බවත්, සහ එය හැම අතින්ම නිවැරදි බවත්ය. එවැනි ප්‍රතිසංස්කරණයක් ආරම්භ කිරීමට බලයක් හෝ නැඹුරුවක් තිබුණේ නැත. නමුත්, උන්වහන්සේ බලපෑම් කළේ කොහේද, උන්වහන්සේගේ පැවිදි සඞගයා තුළයි. උන්වහන්සේ කුලය පිළිගත්තේ නැති බව පැහැදිලි කළහ.

> ''ගංගානම් සහ යමුනා වැනි විශාල ගංගා මෙන් අචිවරතී, සරභූ සහ මහී මහා සාගරය වෙත ප්‍රවේශ වනවිට, ඒවායේ නම් සහ අනන්‍යතා අහිමි වේ. එවිට ඒවා හුදෙක් 'මහා සාගරය'යි. ඒ ආකාරයට, ඔවුන්ගේ නිවෙස් අතහැර ධර්මයට ඇතුළුවීමෙන් සහ තථාගතයන් වහන්සේ උගන්වන පුහුණුව ලැබීමෙන්, වංශවත් අය, බ්‍රාහ්මණයන්, වෙළෙඳුන්, සහ පහත් කුලයේ අයට ඔවුන්ගේ නම් සහ අනන්‍යතා අහිමි වේ. ඔවුහු හුදෙක් 'ශාක්‍යයන්ගේ පුත්‍රයන්' වේ. ''[53]

කෙසේ වෙතත් මෙයින් බුදුපියාණන් වහන්සේ විසින් කුල ප්‍රතික්ෂේප කිරීම, එහි නීත්‍යානුකුලභාවය දියාරු කිරීම යන කාරණය අඩු නොවේ. එසේම අවම වශයෙන් ශතවර්ෂ ගණනාවක් පුරා එහි බලපෑම දුර්වල විය. (බලන්න Eltschinger2012.) අද ඉන්දියාවේ කුල අයිනට දැමීම සමානාත්මතාවය සහ යුක්තිය උදෙසා උද්ඝෝෂණය කිරීමේ ක්‍රමයට

[53] Ud.55.

බුදුපියාණන් වහන්සේගේ ආකල්පයෙන් පිබිදීමක් ඇති වී තිබේ.

බුදුපියාණන් වහන්සේගේ කාලයේ සම්පූර්ණයෙන්ම අනෙක් සෑම ස්ථානයකම තිබුණු ආකාරයට, වහල්භාවය ඉන්දියාවේ සාමාන්‍ය සහ පිළිගත් දෙයක් විය. පුද්ගලයෙකු වහල්භාවයට පත්වීමට ක්‍රම කිහිපයක්ම තිබුණි - එනම්, වහල් මවකගෙන් උපත ලැබීම, මිලදී ගැනීමෙන්, යුද්ධයකදී අල්ලා ගැනීමෙන් සහ උදාහරණ, සාගතයකින් ගැලවීමට ස්වේච්ඡාවෙන් වහල්භාවයට පත්වීමෙන් වශයෙන්ය. [54]

වහලෙකුගේ නිදහස අහිමිවීම හැරුණු විට, වහල්භාවයට සම්බන්ධ කුරිරුකම් ගැන බුදුපියාණන් වහන්සේ හොඳින් දැන සිටියහ. සාමාන්‍යයෙන් සන්සුන් සහ මෘදු කාන්තාවක්, ප්‍රමාද වී අවදිවීම ගැන තම දාස තරුණියට  පහර දීම පිළිබඳ සිද්ධියක් බුදුපියාණන් වහන්සේ විස්තර කර ඇත. වහල්භාවයෙන් නිදහස්වීමෙන් වහලෙකුට දැනෙන සහනය සහ ප්‍රීතිය සම්බන්ධ හැඟීම බුදුපියාණන් වහන්සේ ප්‍රත්‍යක්ෂ කර ගත්හ.[55]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ භික්ෂු භික්ෂුණීන්ට වහලුන්ගෙන් තෑගි භාර ගැනීම තහනම් කළහ. උන්වහන්සේ මෙම නීතිය පනවන්නට හේතුව බොහෝ විට වහලුන්ට ඇති ප්‍රශ්න සහ අවුල් සහිත තත්ත්ව උන්වහන්සේ සැලකිල්ලට ගත් නිසා විය යුතුයි. එනම්, ඔවුන් වැඩට ගැනීමට අවශ්‍ය බලයෙන් නම්මා ගැනීම, ඔවුන් පලාගිය විට, නැවත ආපසු ගෙන්වා ගැනීම, යනාදියයි.[56] නමුත්, වහල්භාවයේ සදාචාරාත්මක අඩුපාඩුකම්, ආයුධ, මස්, වසවිස සහ මත්වතුර අලෙවිය සමග ගනුදෙනු කිරීම වැරදි ජීවානෝපාය මාර්ගයක් ලෙස, උන්වහන්සේගෙන් පැහැදිලි වන සාධකයකි.[57] වහල්භාවයට එරෙහි පැරණිතම තහනම් කිරීම් මේවාය.

ඉන්දියාවේ සාගත නැවත නැවත ඇතිවන ප්‍රපංචයක් වූ කාලයක, සම්පූර්ණයෙන්ම අනෙත් අයගෙන් ආහාර ලැබීමෙන් යැපුණු බුදුපියාණන් වහන්සේ වැනි භික්ෂූන්ට ආහාර ලබා ගැනීම බරපතල කාරණයක් විය. මිනිසුන්ට තමන්ට යැපීමටවත් ආහාර නොතිබූ විට, ඒ අය අනෙක් අයට දීම සිදුවිය නොහැකි දෙයක් විය. එනිසා සාගතයකින් සංකේතවත් ලෙස පළමු ගොදුර බවට පත් වන්නේ  ඔබ මොබ යන තවුසන්ය. බුදුපියාණන් වහන්සේ මෙම ගැටලුව හොඳින් දැන සිටියහ. ''සාගතයක් තිබෙන විට, දුර්වල අස්වැන්නක්, දානමය ආහාර ලබා ගැනීම දුෂ්කර වේ. අහුලා ගත් දේ  මත පවා නොකඩවා යන්නට නොහැකි කාලයක්'' [58] වන බව බුදුපියාණන් වහන්සේ එකල සඳහන් කළහ. නමුත්, එවැනි ගැටලුවලට අමතරව, බුදුපියාණන් වහන්සේ උනන්දු වූයේ, ආහාරයේ  කායික,

[54] Ja.VI,285; Vin. IV,224.
[55] M.I,125; D.I,72-73.
[56] D.I,5.
[57] A.III,208.
[58] A.III,66.

මානසික සහ සමාජීය කරුණු සම්බන්ධයෙනි - එනම්, ඒවා ලබාගන්නේ කෙසේද, පරිභෝජනය කරන්නේ කෙසේද සහ එහි සෞඛ්‍යයට ඇති බලපෑම යනාදියයි.

භික්ෂුවක විසින් විඳින සදාචාරාත්මක හික්මීමේ වැදගත් කොටසක් වන්නේ දීර්ඝ උපවාසයි. ගෞතමයන් වහන්සේ සත්‍ය සොයන කාලයේදී මෙසේ උත්සාහ දැරූහ. උන්වහන්සේ බුද්ධත්වයට පත් වූ පසු, උපවාසයක් කළ බවට හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයන්ට එසේ කරන්නට නිර්දේශ කළ බවට විස්තර නැත. භික්ෂූන් සහ භික්ෂුණීන්ගෙන් බලාපොරොත්තු වූයේ දහවල් කාලයේ සිට පසු දින හිරු උදාවෙන තුරු ආහාරවලින් වැළකෙන ලෙසයි. නමුත්, මෙය උපවාසයක් වශයෙන් සුදුසුකම් ලැබීමට ඉතා කෙටි කාලවේලාවකි. ගිහි ශ්‍රාවකයන්ටද මාසයකට දෙවරක්, පුර පෝය දිනවල එසේ කිරීමට ධෛර්යවත් කර ඇත. පැරණි ඉන්දියානු ආගමික ඇදහිලි සඳහා අනුගමනය කරන (සබත්වලට) එය සමාන වේ. පැවිද්දන්ට පමණක්, මෙම නීතියට මූලික හේතුව වන්නේ සෞඛ්‍යයි. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''මම සවස ආහාර නොගනිමි. ඒ නිසා මම රෝග සහ පීඩාවලින් නිදහස් වෙමි. මම සෞඛ්‍ය, ශක්තිය සහ පහසුව අත්විඳිමි. එයම කිරීමෙන් ඔබත්, රෝග සහ පීඩාවලින් නිදහස් වනු ඇත. සෞඛ්‍ය, ශක්තිය සහ පහසුව අත්විඳිනු ඇත.''[59]

අවංක භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් වහන්සේලා පවා ආහාර ගැන මානසිකව වික්ෂිප්ත වන්නට හැකි බවත්, කෑදරකමට ලිස්සා යා හැකි බවත් බුදුපියාණන් වහන්සේ සියුම් ලෙස දැන සිටියහ. එය පැවිද්දන්ට පමණක් අනන්‍ය වූ සාධාරණ ප්‍රශ්නයක් නොවේ. අනාගතයේදී මෙම ප්‍රශ්නය පාලනය කළ නොහැකි වන්නට ඉඩ ඇති බව සඞ්ඝයාගේ අවංකත්වය පිරිහී යන්නට ඉඩ ඇති බව බුදුපියාණන් වහන්සේ සිතූහ. ''අනාගතයේදී භික්ෂූන් ඔවුන්ගේ දිවේ කෙළවර ඉතා රසවත් ආහාරවල ආස්වාදය ලබා සුබෝපභෝගී ආහාර සිතෙහි දැඩිව දරා ගන්නවා ඇත''[60] උන්වහන්සේගේ දේශනා, ආහාර පිළිබඳව උනන්දුවක් නොදක්වන බවට අනතුරු ඇඟවීම්වලින් පිරී තිබුණි.''කෙනෙකුගේ කුස පුරවා නොගෙන, ආහාර ගැනීමේදී මැදහත් වන්න. ඒ සඳහා ඇති කැමැත්ත මධ්‍යස්ථව තබාගන්න.''[61] ආහාර ගැනීමට පෙර, මෙම වචන සජ්ඣායනය කරන ලෙස උන්වහන්සේ ශ්‍රාවකයන්ගෙන් ඉල්ලූහ.

> ''අපි මධ්‍යස්ථව ආහාර ගනිමු. බුද්ධිමත් ලෙස ප්‍රත්‍යවේක්ෂණය කරමින්, අපි විනෝදයට, අවධානය රඳවා ගැනීමට හෝ කායික ආකර්ෂණය සඳහා ආහාර නොගනිමු. මෙම ශරීරය නඩත්තුවට සහ පවත්වාගෙන යෑමට, කුසගිනි වේදනා සංසිඳවීමට, පූජනීය ජීවිතයක් ගතකිරීමට උපකාරවීමට පමණක්, සහ මෙම සිතුවිල්ල සමග, 'මම

[59] M.I,473.
[60] A.III,109.
[61] Dhp.92; Sn.707.

පැරණි ආශාවන් අවසාන කරමි. අලුත් ආශාවන් දිරිමත් නොකරමි, ඒ අනුව, සෞඛ්‍යමත් වෙමි, නිර්දෝෂි වෙමි, පහසුවෙන් ජීවත් වෙමි.' ''[62]

වරක් පසේනදී රජතුමා බුදුපියාණන් වහන්සේ වෙතට ආවේ තවත් දැවැන්ත ආහාර වේලක් අනුභව කිරීමේ ප්‍රතිඵලයක් ලෙස පිම්බෙමින් සහ වෙහෙස මහන්සිවී හුස්ම ගන්නා ආකාරයෙනි. මෙය දැක බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: '' මිනිසෙකු කෑම ගැනීමේ මැදහත් පැවැත්ම පිළිබඳව සිහි කල්පනාවෙන් යුක්ත නම්, ඔහුගේ රෝග පීඩා අඩු වේ, ඔහු වයසට යන්නේ ක්‍රමිකවය, ඔහුගේ ජීවිතය ආරක්ෂා වේ.'' රජු එම ඉඟිය පිළිගෙන, ඔහු ආහාර ගන්නා හැම විටම මෙම වචන ඔහුට නැවත මතක් කර දෙන මෙන් තමන්ගේ බෑනණුවන්ගෙන් ඉල්ලා සිටියේය.

එහි ප්‍රතිඵලයක් වශයෙන්, රජු ක්‍රමයෙන් ආහාර ගැනීම අඩු කර, බර අඩු වූ අතර, ඔහුගේ සිහින් සිරුර නැවත ලැබුවේය.[63] සිහියෙන් (සති) ආහාර ගැනීමට බුදුපියාණන් වහන්සේ රජුට දුන් උපදෙස ආහාරවේදීන් සහ බර අඩු කිරීමේ විශේෂඥයන් විසින් පිළිගැනීමට පටන් ගෙන තිබේ. සිහියෙන් ආහාර ගැනීම ඇබ්බැහිකාරී හැසිරීම සිහිකල්පනාවෙන් යුතු එකක් බවට හරවා ගැනීමට උපකාර වේ. එවිට, තෝරා ගැනීමේ හැකියාව වැඩි කරයි. එය කෙනෙකුට මොහොතකට විරාමයක් තැබීමට, සිතීමට සහ කෙනෙකු කරන්නට යන්නේ කුමක්ද සහ හේතුව කුමක්ද යන්න පිළිබඳව දැනුවත් වීමට ඉඩ සලසයි. බොහෝ විට, මෙය හැසිරීමේ වෙනසක් ඇති කිරීමට ප්‍රමාණවත් වේ. සිහිකල්පනාවෙන් සිටීමෙන්, කෙනෙකුට ආහාර ගැනීමට ආශාව ඇති වන විට, එය සැලකිල්ලට ගන්නට ඉඩ ලබා දෙයි. ඊට පසු, එයට අනුගතවීම වෙනුවට, නොඇලීමෙන් ඒ දෙස බලා සිටින්න.

පසේනදී රජු පෙළඹවීම සඳහා සෘණාත්මක එකකට වඩා ධනාත්මක පණිවුඩයක් බුදුපියාණන් වහන්සේ තෝරා ගැනීම ද විශේෂත්වයකි. ස්ථූලත්වයේ ඇති ප්‍රශ්න පිළිබඳ විස්තරයකින් ඔහු පිනවීම වෙනුවට, බුදුපියාණන් වහන්සේ බර අඩුවීමෙන් ඇතිවන වාසි වන කායික රෝග අඩුවීම (තනු තස්ස භවන්ති වේදනා), වියපත් වීමේ ක්‍රියාවලියේ වේගය අඩු වීම (සණිකං ජීරති), සහ ජීවිතයේ සාමාන්‍ය ඉහළ යෑම (ආයු පාලයං) යන මේ සියල්ල සෞඛ්‍යමත් බරක් සහ ආහාර වේලක් ගැනීමෙන් ඇතිවන වාසි වශයෙන් අවධාරණය කළහ. ධනාත්මක වෙරගැන්වුම් සමහර විට මිනිසුන් පෙළඹවීම සඳහා වඩා ඵලදායක බව බුදුපියාණන් වහන්සේ දැන සිටින්නට ඇත.

---

[62] M.I,273.
[63] S.I,81-2.

# 12. දුෂ්කර අවස්ථාවක්

එය ලෝකයේ පවතින විට එක දෙයක් තිබේ
සුභසාධනය සහ සතුට, යහපත සහ ප්‍රතිලාභ සඳහාය
දෙවියන්ගේ සහ මිනිසුන්ගේ. ඒ එක් දෙය කුමක්ද?
එය සඞ්ගයා අතර එක්සත් බවයි. ඉතිවුත්තක It.11

බුදුපියාණන් වහන්සේ හැත්තෑපස් විය වන විට, ධර්මය උගන්වමින් පැවිදි සඞ්ගයා හට වසර හතළිසක් මග පෙන්වමින් වැඩ සිටියහ. නිසැකවම, උන්වහන්සේ සැබැවින්ම, අවසාන දින තෙක්ම, අවසාන පැය තෙක්ම, ඉගැන්වීම නොකඩවා කරගෙන ගියහ. නමුත්, සමහර විට සඞ්ගයා සමග ඍජු සම්බන්ධතාවලින් ඉවත්වී, එම කාර්යයන් පළපුරුදු සහ විශ්වාසවන්ත වැඩිහිටි භික්ෂූන්ට පවරමින් වැඩ සිටියහ. උන්වහන්සේගේ දර්ශනය ව්‍යාප්ත කිරීමට දැරූ උත්සාහය මුල් දශකවලදී ඉතා සාර්ථක විය. උන්වහන්සේට දහස් ගණන් පැවිදි සහ ගිහි ශ්‍රාවකයන් සිටි බව එක් කාලයකදී උන්වහන්සේ පැවසූහ.[1] නමුත්, සමහර විට සිදුවූවාක් මෙන්, එයින් ලැබුණු සාර්ථකත්වය බලාපොරොත්තු වුවාට වඩා අඩු මට්ටමින් ලැබී ඇත. බුදුපියාණන් වහන්සේ භික්ෂූන් අතර ඇති නොසැලකිල්ල, ඔවුන් අතර පෞද්ගලික ආරවුල් සහ සියල්ලටම වඩා බරපතල වූ උන්වහන්සේගේ ධර්මය අර්ථනිරූපණය කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව ඇතිවූ එකඟ නොවීම් සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේ විවේචනය කළ ධර්ම දේශනා විශාල සංඛ්‍යාවක් අවධානයට යොමු කරමින්, ත්‍රිපිටකයේ සඳහන් වේ. එවැනි ප්‍රශ්න ආරම්භ වූයේ කවදා දැයි දැන ගැනීමට නොහැකි නමුත්, බුදුපියාණන් වහන්සේගේ ධූර කාලයේ අවසාන වර්ෂවලදී, සමහර විට එහි අවසාන දශකයේදී, එසේ සිදු වූයේ යැයි පැහැදිලිව පෙනෙන බවට කෙනෙකු විශ්වාස කරයි. මුල් කාලයේදී බුදුපියාණන් වහන්සේ මෙවැනි දෙයක් සිදුවිය හැකි බවට සැක පහළ කර ඇත. එක් අවස්ථාවකදී උන්වහන්සේ අනතුරු පහ යනුවෙන් හැඳින්වූ, ඒ වනවිටත් පැන නොනැඟී තිබූ තත්ත්වය අනාගතයේ ඇති විය හැකි බවට අනතුරු ඇඟවූහ. ඒවාට විමසිලිමත්ව සිටින ලෙසත්, ඒවා සඞ්ගයා විනාශ කිරීමට පෙර, මුලදීම විනාශ කරන ලෙසත් උන්වහන්සේ භික්ෂූන්ට අවවාද කළහ. නුසුදුසු භික්ෂූන් නුසුදුසු පුද්ගලයන් පැවිදි කරනු ඇති බවත්, ක්‍රමයෙන්, සමස්ථ සඞ්ගයා දූෂණය කරනු ඇති බවත්, පොදු විනයගරුකබව නැති බවත්, ධර්මය පිළිබඳව වැරදි වැටහීමක් සහ ව්‍යාකූල බවක් ඇති වන බව උන්වහන්සේ පැවසූහ. භික්ෂූන් ආධ්‍යාත්මික දේවල්වලට වඩා සුළු කාරණා සම්බන්ධයෙන් වඩා උනන්දු වන බවත්, පෞද්ගලික වශයෙන් ආධ්‍යාත්මික දියුණුව කෙරෙහි කැමැත්ත හීන වී යන බවත් උන්වහන්සේ පැවසූහ.[2]

එක් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ මහා කාශ්‍යප මහ රහතාණන් වහන්සේට මෙසේ පැවසූහ: ''ඔබ භික්ෂූන් වහන්සේලාට අවවාද කර ඔවුන්ට ධර්මය උගන්වන්න. එසේ නැත්නම් මම කරන්නෙමි. '' මෙසේ

[1] M. I,490 ff.
[2] A.III,106-108.

කියමින් බුදුපියාණන් වහන්සේ ඇඟ වූයේ, විසඳිය යුතු ගැටලු ඇති නමුත්, උන්වහන්සේම එසේ කිරීමට අකැමැති බවත්, කාශ්‍යප හිමියන් එසේ කරනු ඇතැයි බලාපොරොත්තු වන බවත්ය. තරමක් දුරට පුදුමය ඇති කරමින්, කාශ්‍යප හිමියන් උපකාර කිරීම ප්‍රතික්ෂේප කරමින් මෙසේ පැවසූහ: ''මේ වන විට, භික්ෂූන් වහන්සේලාට උපදෙස් දීමට අපහසුය. ඔවුන්ගේ ආකල්පය කෙසේද යත්, ඔවුන්ට උපදෙස් දීම අපහසුය. ඔවුන් නොනැමෙන සුලුය. ගෞරවාන්විතව අවවාද පිළිගන්නේ නැත.''[3] බුදුපියාණන් වහන්සේ මෙම තීන්දුවට එකඟ වූ අතර, සඞ්ගයාට, හුදෙක් මෑතදී පැවිදි කළ භික්ෂූන් පමණක් නොව, පළමු සහ දෙවන පරම්පරාවෙන් පැවත එන සඞ්ගයාට පවා, අතොරක් නැති කරදර හිරිහැර ඇති කරන ප්‍රශ්න රාශියක් ලැයිස්තුගත කිරීමට කටයුතු කරන ලදී. බුදුපියාණන් වහන්සේ පැවසූ දෙයින් පෙනී යන්නේ, මුල් දිනවල පැවති සරල ජීවිතයකට සහ සදාචාරාත්මක, දැඩි සේ හික්මීම සමහරුන් අතර අඩු වී ඇත.[4] මෙය බොහෝ විට පුළුල් නොවූ නමුත්, එය පැහැදිලිව කැපී පෙනෙන සහ සමහර විට වර්ධනය වන ප්‍රවණතාවක් තිබුණි.

සාමාන්‍ය නොසැලකිල්ල සහ වැරදි හැසිරීම සම්බන්ධයෙන් සියල්ල දෙසිය විසි හතක් වූ නීති කඩ කිරීම වළක්වන තුරු වැඩි වැඩියෙන් නීති අවශ්‍ය විය. සියල්ලම අනර්ථකාමී ආකාරයෙන් අවබෝධ කරගෙන තිබුණි. එනම්, භික්ෂූන්ට යම් යම් දේ කිරීමට වඩා, නොකිරීමට තහනම් කර තිබුණි. මෙම ප්‍රවණතාව අවධානයට ගනිමින්, මහා කාශ්‍යප හිමියෝ අතීතයේදී නීති රීති තිබියදී බොහෝ සුපේශල භික්ෂූන් සිටි අතර, දැන් බොහෝ නීති රීති සමග ස්වල්ප වූ සුපේශල භික්ෂූන් වීමට හේතුව කුමක්ද කියා බුදුපියාණන් වහන්සේගෙන් විමසා සිටියහ. බුදුපියාණන් වහන්සේ පිළිතුරු දුන්හ: '' කාශ්‍යප, එය එසේමයි. සත්ත්වයන් (සදාචාරාත්මකව) පිරිහෙමින් සිටින විට, සැබෑ ධර්මය අතුරුදහන්වන විට, පුහුණු කිරීමේ නීති වැඩි වේ. සුපේශල භික්ෂූන් ස්වල්ප වේ.''[5] බුදුපියාණන් වහන්සේ ශෝකය, බලාපොරොත්තු සුන්වීම හෝ සමහර විට විඳ දරා සිටීමේ අපහසුව වැනි හැඟීම් නොමැතිව මෙසේ පැවසීම පිළිබඳව සිතීමත් දුෂ්කර වේ. භික්ෂූන් වහන්සේලාගේ ගුණාත්මකභාවය පෙර තිබූ තරම් යහපත් මට්ටමක නොතිබීම යන කරුණ ගැන වැඩිහිටි සහ වඩා ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා ශෝක වෙමින් කළ ප්‍රකාශ ද ඇත. පසුව දැකිය හැකි පරිදි, බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් ටික කලකට පසු, එක් භික්ෂුවක් බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය ශෝකවීමට හේතුවක් නොවිය යුතු බවත්, එයට හේතුව දැන් භික්ෂූන්ට තමන්ට අවශ්‍ය දේ කළ හැකි බව කියන්නට තරම් ගරුසරු නැති විය.[6] බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වෙන්නටත් පෙර, මෙම හෙළාදැකිය යුතු පිරිහීමට හේතුව වූයේ කුමක්ද? පරස්පර විරෝධී ලෙස, එක් හේතුවක් විය හැක්කේ, බුදුපියාණන් වහන්සේ

[3] This was not the only time Kassapa refused a request made by the Buddha, albeit politely, S.II,202. There are no other examples of disciples ever having done this.
[4] S.II,208-210.
[5] S.II,224.
[6] D.II,162.

පෞද්ගලිකව සහ උන්වහන්සේගේ ශ්‍රාවකයන් බොහොමයක්, විශේෂයෙන්, භික්ෂු භික්ෂුණීන් සාමාන්‍ය ජනතාවගෙන් උපයා ගත් ගෞරවයයි. භික්ෂූන් කෙරෙහි මහත් ගෞරවයක් සහ විශ්වාසයක් තමා තුළ ඇති කර ගැනීමට ඔහු දුටු කරුණු කිහිපයක් පසේනදී රජු විස්තර කළේය. ඔවුන් එකඟතාවෙන් සහ අන්‍යෝන්‍ය වශයෙන් එකට ජීවත් වූහ. ඔවුන් බුදුපියාණන් වහන්සේගේ දේශනාවලට එතරම් අවධානයෙන් සවන් දුන් බවක් පෙනෙන්නට තිබුණි. ඔවුන් වෙනත් භික්ෂූන්ට වඩා සිත්ඇදගන්නාසුළු පෙනුමෙන් යුක්ත විය. ''මම එක් උද්‍යානයක සිට තවත් උද්‍යානයකට සහ සමහර සාමණයන් සහ බ්‍රාහ්මණයන් වෙත ගොස් ඇත්තෙමි. ඔවුන් ගොරෝසු, දුක්බර සහ සිහින් පෙනුමැතිය. ඔවුන්ගේ සම අවලක්ෂණ සහ සුදුමැලි සහ ඔවුන්ගේ සිරුරු පුරා ඉදිරියට නෙරා සිටි ශිරාවලින් පිරී ඇත.''[7] මෙය දුටු විට මට මෙසේ සිතුණි:

> 'ඔවුන් අභිනිෂ්ක්‍රමණය කළ ජීවිතය පිළිබඳව අතෘප්තියට පත්ව සිටිය යුතුයි, නැත්නම්, ඔවුන් අතීතයේ කළ යම් නරකක් යටපත් කර ගෙන සිටිය යුතුයි.' ඔවුන් කෙතරම් දුක්බර සහ අවලක්ෂණ ලෙස පෙනෙන්නේද කිවහොත්, ඔබට නැවතත් ඔවුන් දැකීමට අවශ්‍ය නොවනු ඇත. ඔවුන් එසේ පෙනෙන්නේ ඇයිද කියා වරක් මම ඔවුන්ගෙන් ඇසුවෙමි. ඔවුන් පැවසුවේ: 'එය පවුලේ රෝගයක්' බවයි. ඊට පසු බුදුපියාණන් වහන්සේගේ ශ්‍රාවකයන් මම දකිමි. ඔවුන් සිනහසෙමින්, සතුටු සිතින් සහ සතුටින්, පැහැදිලි සංවේදිතා පහසුකම් සහිතව, සැහැල්ලුවෙන් සහ නොකැළඹුණු, ඔවුන්ට තිබෙන දෙයින් සතුටුව සහ වනාන්තරයේ මුවන් මෙන් මනසින්''[8] යුක්ත විය.

එවැනි ප්‍රශංසා, මුලින් ප්‍රමාණවත් වටිනාකමින් යුක්ත පරිත්‍යාගත්, ඊට පසුව බහුල ලෙස සහ අවසානයේ ලබා ගත හැකි හොඳම දේවලින් - විසි කළ වැරහැලි, ඒවා වෙනුවට, පට සිවුරු, කොළ සහ පිදුරුවලින් නිමවූ පැල්පත් වෙනුවට, සුව පහසු අරමුණු සඳහා සාදා නිම කළ නිවහන්, පිණ්ඩපාතයෙන් එකතු කරන ලද කැබලි වෙනුවට සුඛෝපභෝගී අවුළුපත් යනාදී වශයෙනි. ගිහියන් සණ හෝ මෘදු ආහාර සහ බීම වර්ග, තමන්ට, තම දෙමාපියන්ට, අඹුසැමියන්ට හෝ දරුවන්ට, ඔවුන්ගේ දාසයන්ට හෝ මිතුරන්ට, ඥාතීන්ට, නොදී භික්ෂූන්ට දන් දුන් අවස්ථා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස භික්ෂූන්ට කඩවසම්, ස්ථූල පැහැපත් සහ පැහැදිලි සමක් තිබුණි.''[9] සඞග යන්නෙහි සැබෑ අරමුණට සම්පූර්ණයෙන්ම සම්බන්ධයක් නැති හේතුවලට, නොමිලේ ආහාර වේලක් ලැබීම සඳහා පැවිදි වූ මිනිසුන් පිළිබඳ කතා කිහිපයකට වඩා වැඩි තොරතුරු විනය පිටකයේ සඳහන් වේ. මෙයින් එක් කතාවකින් කියන්නේ, වංශවත් පවුලක පුත්‍රයෙක්, දැන් දුෂ්කර ජීවිත ගත කරමින් සිටින විට, භික්ෂූන් ''හොඳ ආහාර අනුභව කරමින්,

[7] Interestingly, appearing gaunt and having protruding veins were some of the very things the Buddha praised monks for, Dhp.395.
[8] M.II,120-121.
[9] Vin.III,88.

සුළඟින් ආරක්ෂා වූ ඇඳන් මත සැතපෙන'' බව දැන ගනියි. ඔහු ඊට පසු භික්ෂුවක වීමට තීරණය කරයි. ඒ එවැනි ප්‍රතිලාභ භුක්ති විඳීමටයි.[10] එවැනි තවත් කතාවකින් විස්තර කරන්නේ උදෑසන කුඹුරේ වෙහෙස මහන්සිවී නිවස බලා යන අතරමගදී එක් ගොවියෙකු ප්‍රාදේශීය ආරාමයේ නතරවූ ආකාරයයි. එක් භික්ෂුවක් ඔහුට තමාගේම පාත්‍රයෙන් රසවත් ආහාර ලබා දුන් අතර, මීට පෙර කිසි දිනක එතරම් හොඳ ආහාර ලබා ගෙන තිබුණේ නැත. භික්ෂුවකගේ ජීවිතයට ගොවියෙකුගේ ජීවිතයට නොලැබෙන නිශ්චිත වාසි ඇති බව තීරණය කර ඔහු සඞග ජීවිතයට සම්බන්ධ වූයේය.[11]

ණය ආපසු ගෙවීමෙන් බේරීමට, රජුට ඇති බැඳීම්වලින් වැළකීමට, හෝ ඔවුන් කායිකව ආබාධිත නිසා වීදිවල හිගාකෑමට බල කෙරෙන නිසා, පැවිදි වූ මිනිස්සු සිටියහ. තමන්ගේ වහලෙකු පලා ගොස් භික්ෂුවක් බවට පත්වී ඇතැයි අනාවරණය වුවහොත්, තමන් ඔහු අත්අඩංගුවට නොගන්නා බවත්, වහල්භාවයට නැවතත් නොගන්නා බවත්, අජාසත්තු රජු බුදුපියාණන් වහන්සේට පැවසුවේය. මෙය සම්පූර්ණයෙන්ම වහලුන්ට පලා ගොස් සඞගයාට එකතු වීමට පෙළඹවීමක් ඇති කරයි.[12] කාලය ගෙවීමත් සමග ඇතිවූ තවත් ප්‍රශ්නයක් නම්, එක් භික්ෂුවක් තවත් භික්ෂුවක් අතර සහ භික්ෂූන් වහන්සේලා කුඩා කණ්ඩායමක් අතර ඇතිවූ තර්ක විතර්කයි. මෙය පැවිද්දන්ට පමණක් සීමාවූ ප්‍රශ්නයක් නොවේ, මිනිසුන් කණ්ඩායම් වශයෙන් එක්වෙන සෑම අවස්ථාවකම ඇතිවන සාමාන්‍ය දෙයකි. සමහර තර්ක විතර්කවලට හේතු වූයේ වෙනස්වනසුලු හැසිරීම් චරියා ඇති පුද්ගලයන් සම්බන්ධ වීමෙනි. අනෙක් ඒවා සුළු ඊර්ෂ්‍යා නිසා වන අතර, ධර්මය පිළිබඳ වෙනස්වූ අර්ථ දැක්වීම් සම්බන්ධයෙන් ප්‍රශ්න කිහිපයකි.

මේ ආකාරයේ පළමු බරපතල සිදුවීම කොසැම්බි මහ නගරයේ සිදු විය. ගැටුම පිළිබඳ විස්තර තුනක් තිබේ. ඒවා සාරාංශයකට සමාන වන අතර, විස්තරාත්මකව සලකා බලන විට සුළු වශයෙන් වෙනස් වේ. සමහර විට කොටස් වශයෙන් ව්‍යාකුල වී ඇත. ආරවුලට මූලිකව හේතු වූ යේ කුමක් ද යන්න ත්‍රිපිටකයේ සඳහන් වී නැත. නමුත්, සඞගයා වෙත බුදුපියාණන් වහන්සේගේ බලපෑම පහත වැටීම සහ උන්වහන්සේ කෙරෙහි සමහරුන් තුළ ගෞරවය නොමැතිකම ත්‍රිපිටකයේ ඉස්මතු කර ඇත. ගැටුම පිළිබඳ විස්තරය මෙසේ දිව යයි. භික්ෂූන් වහන්සේලා කිහිප දෙනෙකු අතර ඇති වූ මතභේදයක් හේතුවෙන්, එය අවසානයට පත්වූයේ නගරයේ සිටි බොහෝ භික්ෂූන් වහන්සේලා එයට සම්බන්ධ වීමෙනි. ''ඔවුහු අභිනයෙන්, වචන සහ දැඩි ප්‍රහාර එල්ල කරමින්, එකිනෙකාට නින්දා සහගත ලෙස හැසිරුණහ.'' මේ පිළිබඳව දැනගන්නට ලැබී, බුදුපියාණන් වහන්සේ ආරවුල්කාරී පාර්ශ්වයන් කැඳවා, ඔවුන්ගෙන් මෙසේ ඇසූහ:

[10] Vin.I,86.
[11] Ja. I,311.
[12] D.I,60-61.

> ''ඔබලා වචන නමැති ආයුධයෙන් එකිනෙකා සමග වාද කරමින්, රණ්ඩු කරමින්, ආරෝව කරමින් සහ දැඩි ප්‍රහාර එල්ල කරමින් සිටින බව සත්‍යයක්ද? ඔබලාට අනෙක් අයට ඒත්තු ගැන්වීමට හෝ පොළඹවා ගැනීම හෝ ඔවුන්ට ඒත්තු ගැන්වීම හෝ පෙළඹවීමට නොහැකි බව නොදන්නේද?''

ඔවුන් එය පිළිගත්හ. බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ :

> ''ඔබලා සිතන්නේ මොනවාද? ඔබලා මෙසේ කරන විට, ආධ්‍යාත්මික ජීවිතයේ කයෙන්, වචනයෙන් සහ මනසින්, ප්‍රසිද්ධියේ සහ පුද්ගලිකව ඔබලාගේ මිත්‍රයන් සමග සම්බන්ධ වන්නේ මෛත්‍රියෙන්ද?''

> ''නැත ස්වාමීනී'

> ''මෝඩ පුරුෂයනි, මෙය බොහෝ කාලයකට ඔබලාගේ ශෝකයට සහ දුක්විඳීමට හේතු වන බව ඔබලාට නොතේරේද හෝ නොපෙනේද?''

භික්ෂූන් වහන්සේලාගේ හැසිරීම පිළිබඳව තදින් තරවටු කිරීමෙන් පසු, බුදුපියාණන් වහන්සේ ඔවුන්ගේ යහපත් ස්වභාවයන් ගැන අවධානය කැඳවූහ. ඔවුන් එකිනෙකා කෙරෙහි කයෙන්, වචනයෙන් සහ මනසින් ප්‍රසිද්ධියේ සහ පෞද්ගලිකව මෛත්‍රිය ප්‍රකාශ කළ යුතු බව බුදුපියාණන් වහන්සේ අවවාද කළහ. නිසි ලෙස හෝ නීති රීතිවලට අනුව ඔවුන්ට ලැබෙන ඕනෑම දෙයක්, දානමයේ පාත්‍රයේ අන්තර්ගතයක් වුවත්, ඔවුන් එය තම මිතුරන් සමග බෙදා ගත යුතුයි. ඔවුන් දන්නේ යහපත් සහ ප්‍රශංසා කටයුතු, කුමන ගුණාංගයක් වුවද, ඔවුන් ඒවා සමග ජීවත් විය යුතුයි. අවසානයේ, ඔවුන්ගේ විමුක්තිය සඳහා මග පෙන්වන ඕනෑම මත ඔවුන් පිළිගත යුතු අතර ඒවා සමග ජීවත්විය යුතුයි.[13] මෙය විවිධ කණ්ඩායම් අතර තිබූ ආතතිය ටික කලකට සමනය වූ බවක් පෙනුණත්, ටික කාලයකට පසු, කාලය නිශ්චිතවම පැහැදිලි නැති වුවත්, එය නැවතත් පැන නැගුණි. මෙවර නැවතත් බුදුපියාණන් වහන්සේ සමාදානයක් කරන්නට උත්සාහ කළත්, ඔවුන්ගේ ගරු සරු නැති බව කුමන ආකාරයේද කිවහොත්, උන්වහන්සේට උන්වහන්සේගේ වැඩක් බලාගන්නා ලෙස ඔවුහු කීහ. ''ස්වාමීනී, ධර්ම ගුරුවරයාණෙනි, මොහොතක් සිටින්න!, මේ ගැන ඔබ කරදර නොවන්න. ඔබ මෙහි සැනසිල්ලේ ඉන්න. දැන් අපි වාද කිරීම සහ දබර කිරීම ගැන බලාගන්නෙමු.'' මෙය බුදුපියාණන් වහන්සේට හොඳටම ඇති. පසු දින උදෑසන, බුදුපියාණන් වහන්සේ කොසැම්බියේ දානය සඳහා වැඩියහ, ආහාර වැළඳීමෙන් පසු, උන්වහන්සේගේ ලැගුම්හල පිරිසිදු කර, කිසිවෙකුට නොදන්වා කොසැම්බියෙන් පිටවූහ.[14] උන්වහන්සේ මෙසේ පැවසුවේ මේ සම්බන්ධයෙන් විය හැකිය: ''භික්ෂූන් වහන්සේලා වාද කරන

---

[13] M.I,321-322.

[14] M.III,153; Vin.I,341. There are hints of other serious divisions within the Saṅgha which seem to have been resolved before they got out of hand; e.g. A.II,239.

විට සහ දබර කරන විට, මම ඇත්ත වශයෙන්ම ඒ ස්ථානයට යන්නටවත් නොසිතමි.''[15] කොසැම්බි අර්බුදය පිළිබඳ එක් විස්තරයක බුදුපියාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට තරවටු කර ඔවුන්ගෙන් සමුගත්හ: ''ඇටකටු කඩන, ජීවිත නැති කරන, ගවයින්, අශ්වයන්, වස්තුව සොරකම් කරන, සහ රට කොල්ලකන පුද්ගලයන්ටත් එකිනෙකා සමග එකඟ විය හැකි නම්, නුඹලාට බැරි ඇයි?''[16]

භික්ෂූන් වහන්සේලාගේ හැසිරීම පිළිබඳව පිළිකුලට පත් වූයේ බුදුපියාණන් වහන්සේ පමණක් නොව, කොසැම්බියේ ගිහි ශ්‍රාවකයන් ද එසේ වූහ. ඔවුහු භික්ෂූන්ට උපකාර කිරීම නතර කළහ. ඔවුන් පිණ්ඩපාතයට වැඩි විට තවදුරටත් දානය පිරිනැමුවේ නැත.[17] මෙයින් ඉතා ඉක්මනින් මතභේද ඇති කළ අය නිවැරදි අවබෝධය ලැබූහ. ඔව්හු කණ්ඩායමක් වශයෙන් බුදුපියාණන් වහන්සේ වෙත ගොස් උන්වහන්සේගෙන් සමාව අයැද සිටියහ. අවාසනාවට, කොසැම්බිහී කරදර කවදා හෝ විසඳුණේද නැද්ද යන්න ත්‍රිපිටකයේ සඳහන් නොවේ. එනිසා, අවසානයේ කුමක් සිදුවූයේද යන්න පිළිබඳ තොරතුරක් අපට දැනගන්නට නැත. බුදුපියාණන් වහන්සේ භික්ෂූන් සම්බන්ධයෙන් වගකීම සම්පූර්ණයෙන්ම අත්හැර එම නගරයට කිසි දිනක නොපැමිණෙන්නට ඉඩ තිබිය හැකිය.

කොසැම්බි නුවරින් පිටව බුදුපියාණන් වහන්සේ බාලකලොණකාර ගම්මානය අසල පිහිටි වනාන්තරයට වැඩි අතර, එහිදී අනුරුද්ධ ස්වාමීන් වහන්සේ සහ තවත් භික්ෂූන් වහන්සේලා දෙදෙනෙකු දීර්ඝ හුදෙකලාවක වැඩ සිටියහ. භික්ෂූන් වහන්සේලා තිදෙනා බුදුපියාණන් වහන්සේ පිළිගෙන, උන්වහන්සේගේ පාත්‍රය සහ අතිරේක සිවුරු රැගෙන උන්වහන්සේට අසුනක් සූදානම් කර, පාද දෝවනය කළහ. එය අමුත්තෙකුට ආගන්තුක සත්කාර පළ කරන නිසි ක්‍රමය වේ. ඔවුන්ගේ හුදෙකලාව පිළිබඳව බුදුපියාණන් වහන්සේ විමසූ අතර, ඔවුන් පිළිතුරු දුන්නේ තිදෙනා පරිපූර්ණ එකඟතාවෙන් ජීවත්වන බවයි. ඔවුන්ට එසේ සිටින්නට හැකිවූ ආකාරය තවදුරටත් බුදුපියාණන් වහන්සේ විමසූ විට, අනුරුද්ධ හිමියෝ, තිදෙනා එකිනෙකා කෙරෙහි ඇති සම්බන්ධය සහ ඔවුන්ගේ දෛනික චර්යාව විස්තර කළේය.

> ''එය කෙතරම් ආශීර්වාදයක් ද කියා මම සැමවිට සිතමි. ආධ්‍යාත්මික ජීවිතයේදී එවැනි මිතුරන් සමග ජීවත්වීමට ලැබීම මට සැබෑ ආශීර්වාදයකි. මම මෙසේ සලකමි, 'මා මගේම බලාපොරොත්තු පසෙකට ලා අනෙක් අයට අවශ්‍ය දේ නොකරන්නේ ඇයි?' ඊට පසු මම එය කරමි. ඉතින් කායිකව වෙනස් වුවත්, මනසින් එක් අයෙකි. ගමට පිණ්ඩපාතයට වැඩ කවුරු පළමුව පැමිණියත්, ආසන සූදානම් කර, බීමට සහ සේදීමට ජලය සහ පාත්‍ර පිටත තබයි. අවසානයට

[15] A.I,275, condensed.
[16] M.III,154.
[17] Vin.I,353.

පැමිණෙන තැනැත්තා ඉතිරිව තිබෙන දෙයක් ආහාරයට ගනියි, නැත්නම් ඔහුට ප්‍රමාණවත් නම්, ඉතිරි ඉවත දමනු ලැබේ. ඊට පසු ආසන, ජලය සහ පාත්‍ර ඉවත් කර, පොදුවේ ආහාර ගන්නා කාමරය අතුගා දමයි. පානය කිරීම හෝ සේදීම සඳහා ඇති භාජන හිස්ව තිබෙන බව කව්රු හෝ දකින්නේ නම්, ඒවා පුරවා තබයි. ඔහුට එය කරන්න නොහැකි නම්, ඔහුගේ හුදෙකලාව නොබිඳමින් වෙනත් කෙනෙකුට උපකාර පතා අතින් සංඥාවක් දෙයි. ඊට පසු අපි දින පහකට වරක් එකට වාඩිවී රාත්‍රිය පුරා ධර්මය සාකච්ඡා කරන්නෙමු. අපි ජීවත් වෙන ආකාරය මෙහෙමයි - උද්‍යෝගිමත්, අති උණුසුම්, සහ සසල නොවෙන.''[18]

බුදුපියාණන් වහන්සේ නිතරම ඉගැන්වූ - සරල බව, අන්‍යෝන්‍ය ගෞරවය, ඉගෙනීම සහ හුදෙකලා සහ නිශ්ශබ්ද කාල වකවානුවන් ගත කිරීම වැනි ජීවන රටාවේ භාවාර්තයට සත්‍යවූ භික්ෂූන් වහන්සේලා තවමත් සිටින බව දැන සිටීමෙන් බුදුපියාණන් වහන්සේ සතුටට පත්වන්නට ඇත. ත්‍රිපිටකයේ විවිධ වූ කොටස්වල කොසැම්බිහි ගැටුම විස්තර කර ඇති පරිදි, කොටස්වල ව්‍යාකූල වී තිබේ. එය සම්පූර්ණ කතාව විය නොහැකිය.

බුදුපියාණන් වහන්සේගේ ජීවිත කාලය තුළදී ධනවත් වෙළෙන්දෙකු වූ සෝෂිත විසින් කරවන ලද ආරාමයක් පිළිබඳව ත්‍රිපිටකයේ සඳහන් වේ. පසුව එය ඔහුගේ නමින් හැඳින්විය.[19] මෙම ආයතනයේ නටබුන් 1956දී පුරාවිද්‍යාඥයන් විසින් කැණීමෙන් අනාවරණය කරගෙන ඇත. ඒවායේ අනන්‍යතාවය එම ස්ථානයේ තිබූ සෙල් ලිපි මගින් සනාථ කර ගන්නා ලදී.[20]

පැරණි අටුවාවක් තවත් ආරාම දෙකක් පිළිබඳව ද සඳහන් කරයි. එකක් ආරම්භ කර ඇත්තේ කුක්කුට විසින් වන අතර, අනෙක, පාවරික විසිනි. ඒ දෙදෙනා සෝෂිතගේ මිතුරන් සහ ව්‍යාපාරික සහකරුවන් බව කියනු ලැබේ. නමුත්, පුදුමයට හේතුව, අටුවාවලින් මෙම මිනිසුන් දෙදෙනා සහ ඔවුන් විසින් කරන ලදැයි කියන ආරාම පිළිබඳව ත්‍රිපිටකය සඳහන් නොකිරීම සහ එසේ නොවීමට හේතුව කුමක්ද යන ප්‍රශ්නය මතු කරයි. පසුකාලීන විචාරකයන් මෙම පුද්ගලයන් දෙදෙනා නිර්මාණය කරන්නට ඉඩ ඇති අතර, ඔවුන් විසින් ආරාම ඉදි කිරීම පිළිබඳ වටාපිටා සිදුවීම් විය නොහැකි ලෙස පෙනී යයි. නමුත් ත්‍රිපිටකය ඔවුන් පිළිබඳව නිහඬ විය යුත්තේ ඇයි? කොසැම්බිහි ඇති වූ ගැටුම හදිසියේ ඇරඹී, කුක්කුටාරාම සහ පාවරිකාරාමයේ භික්ෂූන් සම්බන්ධවී මුළු පලහිලව්වෙන් ඇතිවූ පිළිකුලෙන් ත්‍රිපිටකය සම්පාදනය කළ භික්ෂූන්ට ඒවා එහි සඳහන් කිරීමට පවා ප්‍රතික්ෂේප කිරීමට පෙළඹවීමක් විය නොහැකිද?

[18] M.III,156, condensed.
[19] S.IV,113-114.
[20] Ghosh pp.14-16.

කොසැම්බිහි සිදුවූ ගැටුම බුදුපියාණන් වහන්සේ කෙරෙහි බරපතල සැලකිල්ලක් දැක්වීමට හේතුවක් වන්නට ඇත. එය වඩා විනයගරුක භික්ෂූන්ට කම්පනයක් වන්නට ඇත. එය ඊටත් වඩා දරුණු ගැටලු පවා ඇතිවීමට පෙරනිමිත්තක් පමණි.

බුදුපියාණන් වහන්සේ බුද්ධත්වයට පැමිණීමෙන් පසු, පළමු වරට කපිලවත්ථුවට වැඩම කළ විට, උන්වහන්සේගේ විස්තීර්ණ පවුලේ සමහර සාමාජිකයන් ඇතුළුව ශාක්‍යයන් කිහිප දෙනෙකු සඞ්ඝ ශාසනයට එක්වීමට තීරණය කළහ. මේ අය අතරින් එක් කෙනෙකු වන්නේ බුදුපියාණන් වහන්සේගේ පිය පාර්ශ්වයෙන් මාමා කෙනෙකු වූ සුප්පබුද්ධගේ පුත් දේවදත්තයි. දේවදත්ත හොඳ භික්ෂුවක වූ බව විස්තරවල සඳහන් වේ. නමුත් ඔහු පිළිබඳව ධර්ම ග්‍රන්ථවල සඳහන්වී ඇත්තේ ඉඳහිටය. බොහෝ ස්ථානවල ඔහු ප්‍රශංසාවට ලක් වී ඇති අතර, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේ ඇතුළු භික්ෂූන් දස දෙනෙකු යහපත් සහ වැදගත් ශ්‍රාවකයන් ලෙස ඇතුළත් කර තිබුණි.[21] නමුත්, බුදුපියාණන් වහන්සේගේ වෘත්තීය ප්‍රගමනයේ විශාලතම අර්බුදය මෙහෙයවන ලද පුද්ගලයා දේවදත්ත වන අතර, ඔහු බෞද්ධ ප්‍රජාව බිඳීමටද කටයුතු කළේය. නමුත්, මෙය වෙනස් කළ නොහැකි දෙයකි. මෙය සිදු වූයේ බුදුපියාණන් වහන්සේගේ අවසාන වසරවලදී බව ගණනය කළ හැකිය. ඒ අජාසත්තු රජ මගධයේ රජ කරන කාලයේදීය. ශ්‍රී ලංකාවේ පැරණි පුරාවෘත්තය වූ මහාවංසයේ කලින් ඉන්දියානු මූලාශ්‍ර මත පදනම්වූ කරුණු කිහිපයක් ඇතුළත් කර ඇත. එහි සඳහන්ව ඇත්තේ අජාසත්තු රජ සිංහාසනයට පැමිණෙන්නේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයට වසර අටකට පෙර බවයි. නමුත් ත්‍රිපිටකයේ එය තහවුරු කිරීමට සාක්ෂි නැත.[22] සමස්ත කාරණයම ත්‍රිපිටකයේ සඳහන් කර ඇති පරිදි එය අතිශයෝක්තියක් බව පෙනී යයි. එසේම අර්ධ වශයෙන් ප්‍රකාශ කර තිබිය හැකිය. දේවදත්තට නින්දා කිරීම වඩා හොඳය. එහි රජු මරන්නා, ඝාතනය කිරීමේ උත්සාහ, ප්‍රචණ්ඩ ලෙස හැසිරෙන ඇතෙකු, දිව්‍යමය පුද්ගලයෙකුගේ පණිවුඩයක්, බොරු සහ කුමන්ත්‍රණ කිරීම ඇතුළත් වේ. ධර්ම ග්‍රන්ථවල දක්වා ඇති පරිදි, සිදුවීම් දිග හැරුණු අනුපිළිවෙල ද අර්ධ වශයෙන් ව්‍යාකූල වේ. එක් ස්ථානයක බුදුපියාණන් වහන්සේ දේවදත්ත සමග වාඩිවී ආහාර සම්බන්ධයෙන් සුළු රීතියක් උල්ලංඝණය කිරීම ගැන ඔහුට තදින් තරවටු කර ඇත. නමුත්, දේවදත්ත බුදුපියාණන් වහන්සේ ඝාතනය කිරීමට මෑතදී ගත් උත්සාහ හතර පිළිබඳව කිසිවක් සඳහන් වී නැත.[23] මෙම ප්‍රශ්න තිබියදීත්, කතාවේ සත්‍ය කරුණු ප්‍රත්‍යක්ෂ කරගෙන සැබැවින්ම සිදුවන්නට ඇත්තේ කුමක්ද යන්න සිතින් ගොඩ නගා ගත හැකිය.

බුදුපියාණන් වහන්සේගේ අවසාන වසරවලදී පැවිදි සඞ්ඝයා අතර භේද භින්නවීමක් තිබූ බවත්, ඒ සඳහා පොළඹවන ලද්දේ දේවදත්ත යන්න

[21] A.IV,402 ff; Ud.3-4.
[22] Mhv. II,232.
[23] Vin.II,196.

නිශ්චිතය. නමුත් එයට හේතුව හොඳින් පැහැදිලි කළ හැක්කේ සඞසයා සම්බන්ධයෙන් දේවදත්ත කළ යම් ඉල්ලීම් මත මිස ඔහු හුදෙක් ගිජු, බලය සඳහා කෑදර හෝ හුදෙක් කරදර ඇති කිරීමේ අභිප්‍රායෙන් යනාදී කරුණු නිසා නොවේ. දේවදත්ත කළ ඉල්ලීම් නම්, භික්ෂූන් ජීවත්විය යුත්තේ කෙසේද සහ එම භික්ෂූන් නිවහන්වලින් ඈත, වනාන්තරයේ ජීවත්විය යුතුද, ඔවුන් ආහාර ගත යුත්තේ පිණ්ඩපාතයෙන් පමණක්ද සහ යම් කෙනෙකුගේ නිවසේ දානයක් සඳහා ඇරයුම් භාර ගත යුතුද, ඔවුන් වැරහැලිවලින් මසන ලද සිවුරු පමණක් පෙරවිය යුතුද සහ අලුතින් නිමවූ සිවුරු කිසි විටක භාර ගත යුතු නැද්ද, ඔවුන් සැතපිය යුත්තේ කිසිවෙකුත් නොසාදන ලද සෙවනක් නැති ගසක් යටද, ඔවුන් මස් මාංශවලින් වැළකිය යුතුද, යන ප්‍රතිසංස්කරණ වේ.[24] යම් කාලයක සිට දේවදත්ත නිහඬව පහත වැටීමක් සහ සැකයක් වපුරමින් සිටින්නට ඇත. එසේම සැබෑ ශ්‍රමණ පරමාදර්ශය පාවාදුන්නේ යැයි බුදුපියාණන් වහන්සේට චෝදනා කළේය. එසේම ඔහු සමග එකඟවීමට භික්ෂූන් වහන්සේලාද හවුල් කර ගත්තේය. ගිහි ප්‍රජාව තුළින්ද කිහිප දෙනෙකු පවා ඔහු සමග සිටියහ. පැවිද්දන් ඉදිරියේ කුමන ජීවන රටාව වඩා සුදුසුද යන්න පිළිබඳව මතභේද තිබුණි. හුදෙකලාව කාලය ගත කළ සහ දැඩි ස්වයං ප්‍රතික්ෂේප කිරීම් කළ අය, එසේ නොකළ අය පහත් කොට සැලකීමේ ප්‍රවණතාවක් තිබුණි. මේ පිළිබඳව අවබෝධ කර ගත හැකි වූ බුදුපියාණන් වහන්සේ කණ්ඩායම් දෙක අතර අන්‍යෝන්‍ය ගෞරවය සඳහා උපදෙස් දී තිබේ.[25]

අවසානයේ දේවදත්ත බුදුපියාණන් වහන්සේ වෙත ගියේ හුදෙක් ඔහුගේ කටහඬේ අවධාරණයක ඉඟියක් යෝග්‍ය යැයි යෝජනා කරමින්ය. එනම් දැඩි හික්මීම් පහ සියලු භික්ෂූන් හට පුරුදු කිරීමට වගකීමක් සේ පැවරිය යුතු බවයි. නමුත්, බුදුපියාණන් වහන්සේ පුළුල් ලෙස තරයේ දරා සිටියේ වනාන්තරේ කායිකව වෙහෙසකර ස්වයං ප්‍රතික්ෂේප කිරීම සහ දික්ගැස්සුණු හුදෙකලාව ප්‍රයෝජනවත් විය හැකි නමුත්, ඒවා සැමදෙනාටම සුදුසු නොවන බවත්ය. එසේම එයින් අභ්‍යන්තර වෙනස්වීමකට අනිවාර්යයෙන්ම මග නොපෙන්වයි. උන්වහන්සේ නිරීක්ෂණය කර ඊට පසු පෙන්වා දුන්නේ භික්ෂුවකට වනාන්තරයේ ජීවත්වෙන අතරම, කලබල, අහංකාර, නිෂ්ඵල, වාචාල සහ ස්වල්ප වූ භාවනාමය දියුණුව තිබිය හැකි බවයි.[26] භික්ෂූන් වහන්සේලා සහ භික්ෂුණීන් වහන්සේලා ගිහි ප්‍රජාව සමග සම්බන්ධතා පැවැත්වීමේ වටිනාකමද බුදුපියාණන් වහන්සේ දුටුවහ. එනිසා, බුදුපියාණන් වහන්සේ දේවදත්තගේ නිර්දේශ අනිවාර්ය කිරීම ප්‍රතික්ෂේප කළහ. නමුත්, එකඟතාවකට එළඹීමේ ශක්තියකින් උන්වහන්සේ පැවසුවේ භික්ෂුවක් එවැනි පුරුදු සිය කැමැත්තෙන් පවරා ගන්නේ නම් එසේ කළ හැකි බවයි.

[24] Vin.II,197.
[25] M.I,469.
[26] A.III,391.

මෙය දේවදත්තට ප්‍රමාණවත් වූයේ නැත. නමුත්, ඔහු එම තීරණයට බල කළේ නැත. ඔහු සඞගයා අතර ඔහුගේ සහාය ක්‍රමයෙන් වැඩි කරමින් ඔහුගේ අදහස් ප්‍රවර්ධනය කිරීම නොකඩවා කරගෙන ගියේය. බුදුපියාණන් වහන්සේ නොකළ හෝ අනුමත නොකළ නීතිරීති සඳහා වාද කිරීම භේද ඇති විය හැකි තරම් ප්‍රමාණවත් විය. නමුත්, ඉතා ඉක්මනින් දේවදත්ත ඉන් ඔබ්බට ගියේය. පළමුව නොකියා කියමින්, ඊට පසු, සැබැවින්ම කීවේ, සඞසයාගේ මඟ පෙන්වීම සඳහා සහ ඔවුන් පෙළඹවීමට තමා බුදුපියාණන් වහන්සේ වෙනුවට පොළඹවන ලෙසයි. බුදුපියාණන් වහන්සේගේ සමීපතම ඥාතියෙකු වීම නිසා, උන්වහන්සේ බුද්ධත්වය අත්හළ විට, තමා හොඳ තත්ත්වයකට පත් කරනු ඇතැයි ඔහු සිතන්නට ඇත. සැබැවින්ම, ගෞතමයන් වහන්සේගේ වංශයේ හෝ අවම වශයෙන් ශාක්‍ය ජාතිකයෙකු සඞගයා මෙහෙයවීමට වරප්‍රසාදය තිබිය යුතුය යන්න බුදුපියාණන් වහන්සේට අතිශය අප්‍රසන්න දෙයක්ව තිබියදී, කාලය පිළිබඳව සිතන විට එය හැම අතින්ම අනුකූල විය හැකිය.

දේවදත්ත පැවසූ දෙය බුදුපියාණන් වහන්සේ වෙත පැමිණි බව පෙනී ගියේ, උන්වහන්සේගේ විශ්වාස කටයුතු ශ්‍රාවකයන් සමහරක් සමග සාකච්ඡා කළ නිසාය. නමුත් ඒ කිසිවෙකු ඒ සම්බන්ධයෙන් දේවදත්ත කෙරෙහි විරෝධයක් නොපෑහ. ඔහුට විරුද්ධව කටයුතු කළේ නැත. ඒ සමහර විට ප්‍රශ්නය පහව යනු ඇතැයි සිතමින් විය හැකිය. නමුත්, තීරණාත්මක අවස්ථාව නොවැළැක්විය හැකි විය. අවසානයේ එය තීරණයක් ගත යුතු තත්ත්වයට එළඹුණි. දිනක් බුදුපියාණන් වහන්සේ විශාල පිරිසකට ධර්ම දේශනා සිදුකරමින් සිටින විට, දේවදත්ත ශ්‍රාවකයන් අතරින් ඉදිරියට පැමිණ, ගෞරවයෙන් උන්වහන්සේට නමස්කාර කර, සියලු දෙනාටම ඇසෙන සේ මෙසේ ඇසුවේය: ''ස්වාමීනී, ඔබ දැන් මහලුයි, වයසැති, විඩාපත්, ජීවිත ගමන පසුකර ඇත, ඔබේ ජීවිතයේ අවසානය කරා ප්‍රවේශ වෙමින් සිටිති. දැන් භාවනාවට කැපවී, පහසුවෙන් ජීවත් වෙමින් තෘප්තිමත් වන්න. පැවිදි සඞසයා මට භාර දෙන්න. මම එය මෙහෙයවන්නෙමි.'' බුදුපියාණන් වහන්සේ එය ප්‍රතික්ෂේප කළහ. දේවදත්ත නැවතත් එම ඉල්ලීම කළහ. තවත් වරක් බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. දේවදත්ත තුන්වන වරටත් බල කරන විට බුදුපියාණන් වහන්සේ මෙසේ පැවසූහ: ''දේවදත්ත, මම සඞසයා සාරිපුත්ත හෝ මුගලන් රහතන් වහන්සේලාටවත් භාර නොදෙන මම, කෙළ ගසා ඉවත දැමිය යුතු තරම් ඔබ වැනි කළෙකණ්ණි පුද්ගලයෙකුට නොදෙමි.'' බුදුපියාණන් වහන්සේගේ වචනවල තිත්ත සහ ඇඹුල් රසයෙන් යුක්ත ස්වරයෙන් ප්‍රේක්ෂකයන් තිගැස්සෙන්නට ඇත. එසේම ප්‍රසිද්ධියේ ප්‍රතික්ෂේප වීමෙන් නිසැකවම දේවදත්තද නින්දාවට ලක්වන්නට ඇත. දේවදත්ත ඔහුගේ හැඟීම් හොඳින් පාලනය කර ගත්තේය. ඔහුගේ මුහුණට බලයෙන් සිනහවක් ඇති කරගෙන, යළිත් වරක් බුදුපියාණන් වහන්සේට ආචාර කර රැස්වීමෙන් පිටව ගියේය.

දැන් සියල්ල නැවැත්විය යුතු කාලය එළඹ ඇතැයි බුදුපියාණන් වහන්සේ තීරණය කළහ. දේවදත්තට එරෙහිව ක්‍රියා කිරීමට අධිෂ්ඨාන කරගත්හ.

ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා ගණනාවක් රැස් කරන ලෙස බුදුපියාණන් වහන්සේ උපදෙස් දුන්හ. පැවිදි ක්‍රියාපාටියට අනුකූලව, දේවදත්තව තදින් විවේචනය කර, ඊට පසු ඒ පිළිබඳව ප්‍රසිද්ධ නිවේදනයක් කරන ලෙසත් උපදෙස් දුන්හ. [27]

මෙයින් අධෛර්යයට පත් නොවී, තමන්ගේ මාවත සකසා ගැනීම පිණිස අධිෂ්ඨානය කරමින්, දේවදත්ත තමන්ගේම නිකායක් පිහිටුවන බව වහා නිවේදනය කළේය. මෙයින් සැමතැනම සංකූලතා ඇතිවුණි. සමහර භික්ෂූන් තමන් දේවදත්ත සමග බව නිවේදනය කළ අතර, අනෙක් අය ඔහුගේ ක්‍රියාව තදින්ම නිෂ්ප්‍රභ කළහ. ගිහි ශ්‍රාවකයන්, ආධාරකරුවන්, විරුද්ධවාදීන් සහ නිවැරදි සහ වැරදි කවුරුන්දැයි නිශ්චිත නොවූ අය අතර බෙදී ගියේය. එය පෙනුණේ දශක හතරකට වඩා වැඩි කාලයක් බුදුපියාණන් වහන්සේ මඟ පෙන්වූ ආධ්‍යාත්මික ප්‍රජාව සහ එයින් උපයා ගත් දහස් ගණනකගේ සහයෝගය සහ ගෞරවය, ජෛන සඞඝ නායකයා මිය යන විට පැවති ආකාරය, එනම්, බෙදීම, එකිනෙකාට දොස් පවරා ගැනීම සහ ව්‍යාකූලත්වය සමගින්, අවසන් කිරීමට ආසන්නව තිබුණු ආකාරයකි. බුදුපියාණන් වහන්සේ එම සිද්ධිය පසුකර ගොස් තිබුණේවත් නැත !. මේ පිළිබඳව බුදුපියාණන් වහන්සේ සිතුවේ කුමක්ද යන්න සඳහන් කිරීමෙන් ත්‍රිපිටකය වළකී. නමුත්, එය උන්වහන්සේට දැඩි ලෙස තැවුලට සහ බලාපොරොත්තු සුන්වීමට හේතුවන්නට ඇත.

දේවදත්ත ඔහුගේ ආධාරකරුවන් සමග ගයාව බලා ගියේය. නමුත්, එහි යන්නට පෙර ඔහුට අලුත පැවිදිවූ වජ්ජියානු භික්ෂූන් පිරිසකට අව්‍යාජ සාමණ සම්ප්‍රදායේ පිළිවෙතක් දිගටම ගෙන යන්නේ බුදුපියාණන් වහන්සේ නොව, තමා බව ඒත්තු ගැන්වීමට හැකි වූයේය. ඔවුහු දේවදත්තට එකතු වූහ. බුදුපියාණන් වහන්සේ සාරිපුත්ත සහ මොග්ගල්ලාන හිමිවරුන්ට ගයාවට ගොස්, විශේෂයෙන්ම බුදුපියාණන් වහන්සේ වඩාත් සැලකිලිමත් වූ, තරුණ සහ පහසුවෙන් පෙළඹවිය හැකි වජ්ජියන් සමග ක්‍රමානුකූල පරිපාටික නිගමනය කරන ලෙස උපදෙස් දුන්හ. දෙදෙනා වහන්සේලා ගයාවට පැමිණ දේවදත්ත නොමැතිව භික්ෂූන්ට ආමන්ත්‍රණය කරන්නට හැකිවිය.[28] එම ආමන්ත්‍රණය අවසාන වූ විට, දෙදෙනා වහන්සේලා පැවසුවේ, ඔවුන් පිටත්ව යන බවත්, එම සාකච්ඡාව අනුමත කරන අය සිටීනම් තමන් සමග ආපසු යන්නට හැකි බවත්ය. ත්‍රිපිටකයට අනුව, සෑම භික්ෂුවක්ම නැගිට සාරිපුත්ත සහ මොග්ගල්ලාන මහරහතන් වහන්සේලා සමග නැවත රාජගහට සහ බුදුපියාණන් වහන්සේ වෙතට ගියහ. භේද භින්නවීම අවසන් විය. දේවදත්ත තමන්ගේ අනුගාමිකයන් සියල්ල ඔහු අතහැර ගොස් ඇති බව අවබෝධ කරගත් විට, ඔහුගේ මුවෙන් උණුසුම් රුධිරය විදින්නට පටන් ගත් බව ත්‍රිපිටකයේ සඳහන් වේ. මෙය පුද්ගලයෙකු

[27] In canon law this procedure is called *pakāsanīya kamma* and is usually done after another one called *ñatticatuttha kamma*. For details see C. S. Upasak's *Dictionary of Early Buddhist Monastic Terms*,1975, pp.101and 126.

[28] Vin.II,200.

මිය ගිය බවට සාම්ප්‍රදායිකව අර්ථදක්වන ආකාරයකි. නමුත්, එය සමහර විට, කෝපාවිෂ්ටව, කෝපයට පත්වීම පිළිබඳව සිදු කරන වර්ණවත් ප්‍රකාශනයක් විය හැකිය.[29]

දේවදත්ත ඉල්ලා සිටි දැඩි සේ භික්මුණු තපස ඉතා දුෂ්කර වුවත්, ඒවා බොහෝ සාමණයන් අතර, මතභේදයට ලක්නොවන්නට ඇත. එනමුත් ඒවා බුදුපියාණන් වහන්සේගේ අදහස් සමග මුළුමණින්ම පරස්පරය. උන්වහන්සේ දැඩි සේ භික්මුණු තපස සැමවිටම සැලකිල්ලට ගනිමින්ම ඔහුගේ ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇත. උන්වහන්සේ කියා සිටියේ හිතාමතාම ස්වයංව පැනවූ දුෂ්කරතා සහ විරහිත කිරීම් අර්ථ විරහිත බවයි. කෙනෙකුට ජීවිතයේ විඳදරා ගැනීමට ප්‍රමාණවත් දුෂ්කරතා ඇත. ඒ සමග කටයුතු කරමින් හිතාමතාම නිර්මාණය නොකරමින් ආධ්‍යාත්මික වර්ධනයට උපකාරී විය හැකිය. බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනයේ ආරම්භයේ සිටම, මේ නිසා, අනෙක් සමණයන් සහ උන්වහන්සේ අතර පොදු අවබෝධයේ පරස්පර බවක් ඇති විය. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ඒ පිළිබඳව උන්වහන්සේ විවේචනයට ලක් කළහ. එබැවින්, දේවදත්තගේ ඉල්ලීම් සහ ඊට පසු ඔවුන් ඇති කළ භේදය සැබැවින්ම ඉදිරිපත් වූයේ සාමණයන් සැම විටම කළ දේ කරන ලෙස බල කළ සාම්ප්‍රදායික වාදියෙකු සහ අතීතයෙන් බිඳීමට විරුද්ධ නොවූ මනෝවිද්‍යාත්මකව වඩා හොඳ අවබෝධයක් ඇති අයෙකු අතර ගැටුමකි. ඉල්ලීම් පිළිබඳව නම්‍යශීලීවීමට බුදුපියාණන් වහන්සේ සූදානම් වූ අතර, දේවදත්ත අවධාරණය කළේ එක් ප්‍රවේශයක් පමණක් වලංගු වන බවත්, එය සෑම කෙනෙකුටම සුදුසු බවත්ය.

[29] Vin.II, 184 ff, also at A.IV,135.

# 13. අවසාන දින

අතිඋතුම් යහගුණයෙන් පිරුණු බුදුපියාණන් වහන්සේ
පරිනිර්වාණයට පත් වූ විට වෙව්ලීමක් සහ තැතිගැස්මක් ඇති විය
දීඝ නිකාය D.II,157

ත්‍රිපිටකයේ දීර්ඝතම දේශනාව වන මහාපරිනිබ්බාන සූත්‍රයේ බුදුපියාණන් වහන්සේගේ අවසාන මාස විස්තර කර ඇත. අදාළ චරිතවල අභ්‍යන්තර හැඟීම් සහ චිත්ත වේගයන් ප්‍රකාශ වන්නේ ත්‍රිපිටකයේ කොටස් කිහිපයෙන් එකකය. එය ආරම්භ වන්නේ බුදුපියාණන් වහන්සේ දැන් 'ඡඨ' යනුවෙන් හැඳින්වෙන, රාජගහ නුවරේ නැගෙනහිර දොරටුවට මඳක් ඔබ්බෙන් එක් කඳු ගැටයක පසෙකින් පිහිටි බොහෝ උස කන්දක් වූ එනම්, ගිජ්ජකූටයේ, වාසය කිරීම පිළිබඳවයි. මගධයේ ප්‍රධාන ඇමති, වස්සකාර බුදුපියාණන් වහන්සේ බැහැ දැකීමට පැමිණ උන්වහන්සේට දැනුම් දුන්නේ අජාසත්තු රජු තමන්ගේ උතුරු අසල්වැසි වජ්ජියානුවන්ට පහරදී විනාශ කිරීමට සූදානම් වී සිටින බවයි. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේට ඍජුවම පිටුපසින් සිටගෙන සිටි ආනන්ද හිමියන් දෙසට හැරී වජ්ජියානුවන් ගැන විමසූහ. ''ඔවුන් අඛණ්ඩව සහ නිතර රැස්වීම් පවත්වනවාද?'' ආනන්ද හිමියෝ එය ස්ථිර කළහ. ඉන්පසු බුදුපියාණන් වහන්සේ දිගටම විමසුවේ, වජ්ජීන්ගේ රැස්වීම් හමුවී, රාජකාරී කටයුතු පැවැත්වූයේද සහ අනුකූලතාවෙන් නැවත හමුවන සේ විසිර ගියේද, ඔවුන්ගේ පැරණි සම්ප්‍රදායන් සම්බන්ධයෙන් කිසිම අනුමැතියක් නොදුන්ණේද හෝ තීරණය කළ දේවල් කිසිවක් අවලංගු කළේ නැද්ද සහ ස්ථිර කළේ නැද්ද, ඔවුන්ගේ වංශයේ වැඩිහිටියන් අගය කළේද සහ ඔවුන්ට ගෞරව කළේද සහ ඔවුන්ගේ උපදෙස් අනුගමනය කළේද, ඔවුන් ගැහැණුන් පැහැර ගැනීම සහ ඔවුන් සමග ජීවත්වීමට බල කිරීම නවත්වා තිබේද, ඔවුන් ඔවුන්ගේ සිද්ධස්ථානවලට ගෞරව දක්වන්නේද සහ ඒවා පවත්වාගෙන යනවාද සහ ඔවුන් අතර ජීවත්වන සාන්තුවරයන්ට සහයෝගය දැක්වූවේද යනාදී ප්‍රශ්නයි. ආනන්ද හිමියෝ මේ සියලු ප්‍රශ්නවලට ධනාත්මක ලෙස පිළිතුරු දුන්හ. එවිට බුදුපියාණන් වහන්සේ පැවසුවේ වජ්ජියන් දිගින් දිගටම එසේ ජීවත් වූයේ නම්, ඔවුන්ට පහරදීම් වළක්වා ගැනීමට සහ ඔවුන්ගේ නිදහස පවත්වා ගැනීමට හැකිවනු ඇති බවයි. බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ට කතා කරන විට වස්සකාරට එය ඇසුණේද, නැතහොත් ඔහුට පෞද්ගලිකව දැන ගත්තේද, යන්න ධර්ම ග්‍රන්ථයේ සඳහන්ව නැත - අවස්ථා දෙකම විය හැකිය.[1] ඊට පසු බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ පාර්ශ්වය රාජගහ සිට උතුරු දෙසට ගමන් කරමින්, අම්බලට්ඨිකා සහ නාළාන්දාව හරහා හවස් යාමට පෙර පාටලිගාමයට

[1] Singh, p.254 interprets this incident to mean that the Buddha was indirectly telling Vassakāra how to undermine the Vajjians. I read it to say the opposite, that he wanted Vassakāra to know that being strong and united it would be difficult to overcome them.

පැමිණියහ. ගිහි ප්‍රජාව උන්වහන්සේ මහත් හරසරයෙන් පිළිගෙන දේශීය විවේක ස්ථානයකට ආරාධනය කළහ. බුදුපියාණන් වහන්සේ එම ආරාධනය පිළිගැනීමෙන් ඉක්බිතිව, ගම්වැසියෝ කාපට් අතුරා, ජලභාජන ජලයෙන් පුරවමින්, ආසන පිළියෙළ කරමින් සහ පහන් දල්වමින් විවේකාගාරය සූදානම් කළහ. සියල්ල සූදානම් වූ පසු, දොරටුව අසලදී බුදුපියාණන් වහන්සේ දෙපා සෝදමින්, ඇතුළතට වඩිමින්, ප්‍රධාන කණුවට හේත්තුවෙමින් නැගෙනහිරට මුහුණලා අසුන් ගත්හ. ගිහි පුද්ගලයෝ බටහිරට පසුපස හරවා බුදුපියාණන් වහන්සේට මුහුණලා අසුන් ගත්හ.[2] බුදුපියාණන් වහන්සේ රාත්‍රියේ බොහෝ වේලාවක් ගත කරමින් දේශනාවක් සිදු කළහ.[3]

වේලාසනින් අවදිවීම බුදුපියාණන් වහන්සේගේ පුරුද්දක් විය. තවත් ඇමති කෙනෙකුගේ සහාය ලබමින්, වස්සකාර, මගධයේ වජ්ජියානුවන් සමග සැලසුම් කළ ගැටුමේ කොටසක් ලෙස බලකොටු ඉදිකිරීම අධීක්ෂණය කරන බව බුදුපියාණන් වහන්සේට දන්වා තිබුණි. බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ට පැවසුවේ, ඉදිකිරීම් සිදු කරන ප්‍රදේශයේ දහස් ගණන් භූමියට අරක් ගත් ආත්මයන් ජීවත්වන අයුරු උන්වහන්සේට දැකගත හැකි බවයි. ඔවුන් ඔවුන්ගේ භූමිය තුළ ඉදිකිරීම් කරන එම නිලධාරීන්ගේ මනසට බලපෑම් කිරීමට උත්සාහ කරන බව උන්වහන්සේට දැකගත හැකි විය. මෙම ආත්මයන්ට ඔවුන්ගේ භූමිය තුළ ඉදිකරන්නට යන ආරක්ෂක පවුරු සහ බලකොටු සාදා ගැනීමට අවශ්‍ය වන්නේ ඇයිද යන්න පැහැදිලි කර නොමැත. එසේම බුදුපියාණන් වහන්සේ මෙම කුතුහලය දනවන තොරතුර ආනන්ද හිමියන් සමග බෙදා ගැනීමට උනන්දු වන්නේ ඇයිද යන්නත් පැහැදිලි කර නැත. ටික කාලයකට පසු, බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේ සමග සිටි අය ගංගානම් ගඟ තරණය කර, කොටිගාමය හරහා ගොස් අවසානයේ වේසාලියේ දකුණු මායිමේ පිහිටි නාදිකා නම් කුඩා ගමට පැමිණියහ. උන්වහන්සේ ඇතුළු පිරිස සංචාරකයන්ගේ තානායමක් වූ ගිඤ්ජකාවසථයේ නවාතැන් ගත්හ.[4]

පසු දින උන්වහන්සේ ඇතුළු පිරිස ප්‍රසිද්ධ ගණිකාවක් වූ අම්බපාලී නැමැත්තියට අයිති ඒ ආසන්නයේ පිහිටි අඹ පලතුරු උයනකට ගියහ.[5] බුදුපියාණන් වහන්සේ අඹ උයනට වැඩි බව අසා, අම්බපාලී ඇයගේ අශ්ව කරත්තය ඒ දෙසට පදවා ගෙන ගියාය. බුදුපියාණන් වහන්සේ හමුවී උන්වහන්සේගේ දේශනයකට සවන් දී උන්වහන්සේට සහ අනෙක් භික්ෂූන්ට පසු දින දානයට වඩින ලෙස ආරාධනය කළාය. උන්වහන්සේ

---

[2] In the *Upaniṣads*, the *Dharmasūtras*, etc., the east is given various auspicious and mystical significance, probably originating from Vedic sun worship; e.g. *Bṛhadāraṇyaka* 3.9.20. By sitting facing the east, the Buddha was probably following the convention of the time expected of an honoured guest.

[3] D.II,84-6.

[4] The name means 'the brick house', and suggests that being made of this material was unusual. Archaeology has shown that baked bricks were rare in India before the Mauryan period.

[5] The Chinese pilgrim Faxian who visited the orchard in the fifth century said it was three *li* south of Vesālī on the west side of the road, i.e. the main north/south road, so it must have been somewhere near Nādikā.

එම ආරාධනය පිළිගත්හ. එය සිදුවූ පසු, බුදුපියාණන් වහන්සේගේ පැමිණීම පිළිබඳව අසා ලිච්ඡවීන්ද ඔවුන්ගේ අශ්වකරත්ත පදවාගෙන ඔවුහුද උන්වහන්සේ බැහැදැකීම පිණිස පැමිණි අතර අම්බපාලිය මගදී හමුවූහ. ඇය දානයට ආරාධනය කිරීම පිළිබඳව ඔවුන්ට පැවසුවාය. වේසාලියේ බුදුපියාණන් වහන්සේට දන්දීමෙන් ආගන්තුක සත්කාරයේ පළමුවැන්නා වීම සඳහා ඔවුහු ඇයගේ දානය ඔවුන්ට මාරු කරන්නේ නම් ලොකු මුදලක් දෙන බව පැවසූහ. ඇය එය ප්‍රතික්ෂේප කර ආහාර සූදානම් කිරීම සඳහා නිවස බලා ගියාය. තව කෙනෙකු තමන්ට වඩා හොඳින් කරනවාට අකැමැතිවූ තරුණයෝ අඹ උයනට වේගයෙන් ගියහ. ඔවුන් විවිධ වර්ණයෙන් හැඩ ගන්වමින් සහ ඇඳුම්වලින් සැරසී උන්වහන්සේ වෙත ප්‍රවේශ වනු දැක බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන් සමග පැවසුවේ ඔවුන් දෙවියන් සේ පෙනුම ඇති බවයි.[6]

ලිච්ඡවීන් පැමිණි විට බුදුපියාණන් වහන්සේ ඔවුන්ට ධර්ම දේශනා කළ අතර, ඊට පසු ඔවුහු බුදුපියාණන් වහන්සේට පසුදින දානය සඳහා ඇරයුම් කළහ. තමන්වහන්සේ අම්බපාලීගේ ඇරයුම පිළිගත් බව පවසා උන්වහන්සේ එම ඉල්ලීම ආචාරශීලී ලෙස ප්‍රතික්ෂේප කළහ. මෙයින් කෝපයට පත් ඔවුහු අකීකරු ලෙස මෙසේ පැවසූහ:"මෙම අඹ ගැහැණිය නිසා  අප පරාජයට පත් වී ඇත, අවධානය වෙනතකට යොමුවී ඇත.!"[7] පසුදා උදෑසන බුදුපියාණන් වහන්සේ සහ උන්වහන්සේගේ භික්ෂූහු අම්බපාලීගේ නිවසට වැඩියහ. රසවත් ආහාර වේලක් පිරිනැමීමෙන් පසු ඇය කියා සිටියේ ඇයගේ අඹ උයන සඟයා වෙනුවෙන් පරිත්‍යාග කරන බවයි. පසුව අම්බපාලී භික්ෂුණියක් බවට පත්වී මහලු වියේදී, ඇය ඇයගේ තුරුණු වියේ සුන්දරත්වය සමග මහලු වියේ ඇයගේ රූපය පෙනෙන ආකාරය සංසන්දනය කරමින් කවියක් ලිව්වාය. එය ඉන්දියාවේ කාන්තාවක් විසින් රචිත පැරණිතම සාහිත්‍ය කෘතියකි.[8] බුදුපියාණන් වහන්සේ අම්බපාලීයගේ ආරාධනය පිළිගැනීම සමාන කර ඇත්තේ මිල අධික තෙල්වලින් ජේසුස් වහන්සේගේ පාද ආලේප කළ, බොහෝ විට ගණිකාවක් විය හැකි, සහ සම්ප්‍රදායිකව මේරි මැග්ඩලින් යනුවෙන් හඳුන්වන ලැබූ 'පව්කාර ස්ත්‍රියට' ජේසුස් වහන්සේ සමාව දීමටයි. සමානතාවය අඩුය. පළමුවන ශතවර්ෂයේදී පලස්තීන ගණිකාවන් සමාජයෙන් පහත්කොට නෙරපා හරින ලද අය වූ අතර, ජේසුස් වහන්සේ ඇය කෙරෙහි අනුකම්පාවෙන් කටයුතු කළහ. ඔහු ඔහුගේ ශුභාරංචියේ ප්‍රධාන තේමාවක් වූ ප්‍රතික්ෂේප කරන ලද අය කෙරෙහි ආදරණීය පිළිගැනීම ප්‍රකාශ කළේය.  ඉන්දියාවේ ගණිකාවන් (ගණිකා), සාමාන්‍ය ගණිකාවන් (වෙසියා)ට, වඩා ඉහළින් සලකනු ලැබීය. ඔවුහු බොහෝ විට,

---

[6] For centuries it was the norm for upper class Indian males to wear makeup. The Buddha's half-brother Nanda used to paint his eyes, Vin. IV,173. On male grooming in ancient India, see *Kāmasūtra* I, 4, 5-6 and Daud Ali's *Courtly Culture and Political Life in Early Medieval India*, 2004, p.63. In the 11th century Alberuni found Indian men distinctly dandified and effeminate compared to what he was used to: "The men wear articles of female dress; they use cosmetics, wear earrings, arm-rings, golden seal-rings on the ring-finger as well as on their toes", Edward Sachau's *Alberuni's India*, 1910, Vol.I p.181

[7] This is a word play on Ambapālī name which means 'mango guardian'.

[8] Thi.252-270.

ධනවත් කාන්තාවන්, දැනඋගත්, සහ ප්‍රබුද්ධ, ඊනියා හැට හතර මායම්වලින් නිපුණ සහ සමහර විට, ඔවුන් අතර නගර පාලක කවුන්සලයේ වාඩිවූ අය පවා සිටියහ.[9]

බුදුපියාණන් වහන්සේ තරුණ ලිච්ඡවීන්ගේ ඉල්ලීම වෙනුවට, අම්බපාලීගේ ආරාධනය පිළිගත්තේ හුදෙක්ම ඇය පළමුවෙන් එම ඉල්ලීම සිදු කළ නිසාය. බුදුපියාණන් වහන්සේ වෙසාලි නුවරට පැමිණ ටික කලකට පසු මෝසම් ඍතුව ආරම්භ වූ අතර, සාමාණ සම්ප්‍රදායට අනුකූලව, උන්වහන්සේ සහ අනෙක් භික්ෂූන් වහන්සේලාට ඊළඟ මාස තුන නතරවීම සඳහා ස්ථාන ලැබුණි. බුදුපියාණන් වහන්සේ සහ ආනන්ද හිමියන් බේලුව යන කුඩා ගම්මානයේ නතරවූ අතර, එම ස්ථානය නගරයෙන් පිටත උප නගරවලින් එකකි. ටික කාලයකට පසු, බුදුපියාණන් වහන්සේට ''දරුණු රෝගයක් ඇති විය. එය තියුණු සහ මරණය වැනි වේදනාවකින් යුක්ත රෝගයකි. නමුත් උන්වහන්සේ එය යහපත් සිහියෙන්, සම්පූර්ණයෙන්ම දැන ගනිමින් සහ පැමිණිලි නොකරමින් විඳ දරා ගත්හ.''[10]

සුවය ලැබීමෙන් පසු, උන්වහන්සේ නැවතී සිටි වාසස්ථානයෙන් පිටතට පැමිණ, ආලින්දයේ සෙවනේ ඉඳගත්හ. ආනන්ද හිමියෝ උන්වහන්සේට ආචාර කර මෙසේ පැවසුවේය:

> ''ස්වාමීනී, ඔබවහන්සේ නැවත සුවපහසුවෙන් සහ සුවයෙන් සිටිනු දැකීම චමත්කාරජනකයි. ඔබවහන්සේ අසනීපයෙන් සිටින විට, මගේ ශරීරයට දැනුණේ මතෙන් සිහි මුළාවූ ගතියකි. මම මංමුළාව සිටියෙමි. කිසිම දෙයක් මට පැහැදිලි නැති විය. නමුත්, ඔබවහන්සේ සඞසයා සම්බන්ධයෙන් යම් ප්‍රකාශයක් නොකරමින් පරිනිර්වාණයට පත් නොවනු ඇතැයි යන සිතුවිල්ලෙන් මම සැනැසිල්ලක් ලැබුවෙමි.''

පෙනුණු ආකාරයට පුදුමයට පත් වූ බුදුපියාණන් වහන්සේ මෙසේ පිළිතුරු දුන්හ:

> ''සඞසයා මගෙන් බලාපොරොත්තු වන්නේ මොනවාද ආනන්ද? රහසිගත සහ විවෘත ඉගැන්වීම් අතර වෙනසක් නොමැතිව මම ධර්මය ප්‍රකාශයට පත් කර ඇත්තෙමි. සමහර ඉගැන්වීම්වල නොදී තබාගන්නා ගුරුමුෂ්ටිය මා සතුව නැත. 'මම සඞසයාගේ වගකීම භාර ගන්නෙමි' හෝ 'සඞසයා මා අනුගමනය කළ යුතුයි' යම් කෙනෙකු සිතන්නේ නම්, එවිට, ඔවුන්ට එවැනි කියමනක් කියන්න ඉඩ දෙන්න. නමුත්, තථාගතයන් වහන්සේ එසේ නොසිතති. එසේ නම්, තථාගතයන් වහන්සේ එවැනි ප්‍රකාශයක් සමහර සඞසයා පිළිබඳව කළ යුත්තේ ඇයි?''

---

[9] See *Kāmasūtra* 1.3,16-22. On the less glamorous side of the courtesan's life, see Shonaleeka Kaul's *Imaging the Urban, Sanskrit and the City in Early India*, 2010, p.146 ff.
[10] D.II,99.

ඊට පසු බුදුපියාණන් වහන්සේ ආධ්‍යාත්මික කටයුතුවලදී ස්වයං විශ්වාසය තබා ගැනීම සඳහා වූ උන්වහන්සේගේ ඉල්ලීම නැවත අවධාරණය කළහ.

> ''ආනන්ද, ධර්මය ඔබගේ දූපත සහ සරණ කරගනිමින්, තවත් සරණක් නොමැතිව, ඔබ ඔබටම දූපතක් වන්න. ඔබේම සරණ වන්න. දැන් හෝ මා පරිනිර්වාණයට පත් වූ පසු, ඕනෑම කෙනෙකු තමන් තමන්ගේ දූපත, තමන්ගේ සරණ කර ගනිමින්, ජීවත් වන්නේ නම්, ඔවුන්ට ඉගෙන ගැනීමට කැමැත්ත තිබේ නම්, ඉහළම තත්ත්වය වූ නිර්වාණයට පත් වනු ඇත.''[11]

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේට හැකි තරම් පැහැදිලිව යළි යළිත් ප්‍රතිඥා දුන්නේ උන්වහන්සේ පෙන්වා දෙන්නේ ස්වයං අවබෝධයෙන් ස්වයං මාර්ගඵලවලට එළඹෙන මාවතක් බවයි. උන්වහන්සේ වැනි ගුරුවරයෙකු මිනිසුන් හැකිතාක් ප්‍රබෝධමත් කළහ, ධෛර්යමත් කළහ, උත්තේජනය කළහ සහ පැහැදිලි කළහ. නමුත් අවසානයේ උත්සාහ දැරීම සහ අවබෝධ කර ගැනීම ඔවුන් සතු කාර්යයකි.

බුදුපියාණන් වහන්සේ උන්වහන්සේට හැකි තරම් පැහැදිලිව යළි යළිත් ප්‍රතිඥා දුන්නේ උන්වහන්සේගේ මාර්ගය වූයේ ස්වයං නිර්වාණයට පත්වීමේ ස්වයං අවබෝධයක් බවයි. උන්වහන්සේ වැනි ගුරුවරයෙකු කළ හැකි සහ කළේ දිරිගැන්වීම සහ අනුබලදීම, පෙළඹවීම සහ පැහැදිලි කිරීමයි. නමුත්, අවසානයේ උත්සාහ දැරීම සහ තමන් විසින්ම අවබෝධ කිරීම පුද්ගලයා සතු කාර්යභාරයකි. මෝසම් ඍතුව අවසානයේ පිරිස නැවතත්, භණ්ඩගාම, ජම්බුගාම, භොගනගාම පසු කර, සහ අවසානයට පාවා වෙත පැමිණියහ. එහිදී පිරිස නතර වූයේ චුන්ද කම්මල්කරුවා සතු අඹ උයනේය.[12] චුන්ද බුදුපියාණන් වහන්සේ ඇතුළු පිරිස පිළිගෙන පසුදින දානයට ආරාධනා කළේය. මෙම දානය සඳහා බුදුපියාණන් වහන්සේට සූකරමද්දව යන ආහාරය පිළිගන්වන ලදී. එය ආහාරයට ගැනීමෙන් පසු ''උන්වහන්සේට ලේ බඩයෑම සහ තියුණු මරණීය වේදනාවක් සහිත දරුණු රෝග තත්ත්වයක් ඇති විය.''[13] මෙය උන්වහන්සේගේ අවසාන ආහාරය බවට පත් වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, මෙම ආහාරයේ අනන්‍යතාවය පිළිබඳව බොහෝ අනුමාන සහ මතභේද ඇති වුණි. ඒවායෙන් බොහොමයක් දැනුමක් නැති ඒවා විය. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය සිදුවීමට හේතු වූයේ විෂ සහිත හතු උන්වහන්සේට පිරිනමා ඇති බව හෝ හිතාමතාම උන්වහන්සේට විෂ කවා ඇත යන්න ඒ මතවලට

[11] D.II,100-101.

[12] Where they would have crossed the Gandak is impossible to know as the river's constantly changing course has long since washed away any evidence of an ancient ford. None of the towns they passed through can be identified either. It is now being claimed that the ruins at Fazilnagar represent Pāvā. Excavations conducted there in the early 1980s showed that they are the remains of a Hindu temple first built in the fifth or sixth century CE and enlarged from the thirteen century onwards; see Chakrabarti, 2001, pp.211-213.

[13] D.II,127.

ඇතුළත් විය.[14] සූකරමද්දව යන්නේ අදහස 'ඌරන්ගේ මස්වල මෘදුබව' යන්නයි. එනිසා එය ඌරු මස් පිළියෙළ කිරීමක් විය හැකිය. උදාහරණ වශයෙන් මෘදු ඌරුමස්, එසේ වීම අනිවාර්යය නොවේ. දැන් මෙන්, සූපශාස්ත්‍රමය සූදානම් කිරීමේ පිළිවෙත් ඒවායේ අමුද්‍රව්‍ය සමග සම්පූර්ණයෙන්ම සම්බන්ධ නැති නම් ඒවට යොදා තිබිය හැකිය. සම්ප්‍රදායෙන් මෙම ආහාරයේ නම ආරක්ෂා කර ඇත්තේ එය ඉතා මිල, විරල හෝ අසාමාන්‍ය එකක් නිසා විය හැකිය.[15]

බුදුපියාණන් වහන්සේගේ ප්‍රධාන රෝග ලක්ෂණය වන්නේ අසූචිවල ලේ සහ සැරව ගලන අතීසාරයයි (ලෝහිත පක්ඛන්දික). උන්වහන්සේ ආමාශය සහ බඩවැල් ඉදිමීමේ රෝග තත්ත්වයකින් පෙළුණු බව කියැවේ. එය වැසි සමයේ ඉන්දියාවේ ඉතා සාමාන්‍ය දෙයකි. අශූචිවල ලේ ඇතිවීම සාමාන්‍යයෙන් ආහාර විෂවූ විට ඇති නොවේ. පෙර කී ලෙස, බුදුපියාණන් වහන්සේ වෙසාලියේ වැඩ සිටින විට රෝගීව සිටියහ. උන්වහන්සේ පැවසුවේ උන්වහන්සේට යම් මට්ටමක කායික සහනයක් ලැබුණේ උන්වහන්සේ ගැඹුරු භාවනාවකට පත් වූ විට පමණක් බවයි. උන්වහන්සේ එකළ අසූවැනි වියේ සිටියහ. උන්වහන්සේගේ පරිනිර්වාණය සිදු වූයේ පෙරදී ඇති වූ රෝගය අඛණ්ඩව පැවතීම යන කරුණු කුමක් වුවත්, එය උග්‍රවූයේ වෙහෙසට පත්වීම සහ මහලු විය නිසා බව පෙනී යයි. මෙම නිගමනය පළමු සහස්‍රයේ ආරම්භයේ එක් වචන අදහස් ආදියට සමාන වේ. ''බුදුපියාණන් වහන්සේ රෝගී වූයේ ආහාරවලින් නොවේ. එය සිදුවූයේ උන්වහන්සේගේ ශරීරයේ ස්වාභාවික දුර්වලතාවය සහ උන්වහන්සේගේ ආයු කාලය සම්පූර්ණ වීම නිසා බුදුපියාණන් වහන්සේගේ රෝගී තත්ත්වය උත්සන්න විය.'' [16]

තරමක් සුවය ලැබීමෙන් පසු, බුදුපියාණන් වහන්සේ සහ සෙසු පිරිස දිගටම ගමන් කරමින් සිටියද, උන්වහන්සේගේ තත්ත්වය වඩ වඩාත් දුර්වල විය. ඒ නිසා නැවත නතර වන්නට සිදුවිය. ගසක පාමුල විවේක ගනිමින් සිටියදී උන්වහන්සේ ආනන්ද හිමියන්ට පැවසුවේ සිවුරක් හතරට නවා, ඒ මත හිඳ ගැනීමට සලස්වන ලෙසයි. තරමක් සුවය ලැබූ පසු පුක්කුස නමැති මිනිසෙකු එතැන සිටි භික්ෂූන් වහන්සේලා වෙත ප්‍රවේශ විය. ඔහු

---

[14] Karen Armstrong posits the poisoning theory as a possibility and then adds: "The Pāli texts however, do not even consider this appalling possibility", pp.179-180. The Pali texts do not consider it because it has no basis in fact. Armstrong's book is marred by many such flights of fancy and factual errors.

[15] D.II,101. For some of the theories about the identity of *sūkaramaddava* and its possible role in the Buddha's death, see Hinüber 2000, Fa Chow, Mettanando, Thomas, Waley, Wasson and O'Flaherty. Buddhaghosa (5th cent. CE) gave the opinions of various ancient authorities on the identity of *sūkaramaddava*– that it was pork; bamboo shoots; a type of mushroom; or some kind of elixir; indicating that what the original was had been lost by his time. One of the most widespread and persistent theories today is that it was truffles, first put forward by western scholars in the nineteenth century. The Indian truffle, *Tuber indicum*,also known as the Chinese truffle, *Tuber sinense*, grows mainly in south-western China and parts of the Tibetan and Indian Himalayas and was only given the name *indicum* because it was first described by the British Indian Botanists M. C. Cooke and G. E. Massee in 1892. Truffles would have been unknown in the Ganges and Yamuna valley where the Buddha lived and there is no evidence that they were ever eaten in India or even harvested until the 1980s. Indian/Chinese truffles lack the pleasant fragrance of European varieties, have little of their distinctive taste, and are used mainly as a cheap substitute for them.

[16] Mil.175.

බුදුපියාණන් වහන්සේගේ පැරණි ගුරුවර, ආලාර කාලාමගේ ශ්‍රාවකයෙකු බව පැවසුවේය. ඔහු බුදුපියාණන් වහන්සේට රන්වන් සිවුරු දෙකක් පූජා කළේය. බුදුපියාණන් වහන්සේ එකක් පිළිගෙන, අනෙක ආනන්ද හිමියන්ට පූජා කරන ලෙස පැවසූහ. පුක්කුස ගිය විට, ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේ වටා එක් සිවුරක් එතුවේය. මුළුමණින්ම, ඒ ක්ෂණයේම, උන්වහන්සේගේ සිරුරේ පෙනුම වෙනස් විය. උන්වහන්සේගේ සිරුරෙන් රැස් විහිදුණි, දීප්තිමත් උණුසුම් පැහැයක් ඇතිවීමෙන්, රන්වන් සිවුර අඳුරු විය. ආනන්ද හිමියන් උන්වහන්සේගේ පුදුමය පළ කළ විට, බුදුපියාණන් වහන්සේ පැවසුවේ, මෙම සංසිද්ධිය උන්වහන්සේට මීට පෙර එක් වරක් සිදු වී ඇති බවත්, ඒ උන්වහන්සේ බුද්ධත්වය ලැබූ රාත්‍රියේ බවත්ය.

මෙම පළමු රූප වෙනස්වීමේ තොරතුරුවලින් සඳහන් වන්නේ නිල් සහ කහ කහ. රතු, සුදු සහ තැඹිලි වර්ණ ආලෝක කිරණ (රශ්මි) උන්වහන්සේගේ සිරුරින් පිටවූ බවයි. ස්වල්ප වේලාවක් විවේක ගැනීමෙන් පසු, බුදුපියාණණ් වහන්සේ ඇතුළු පිරිස කුකුත්ථා ගඟට ගොස් පැන් පහසුවී ස්නානය කළහ.[17]

බුදුපියාණන් වහන්සේ ඊට පසු චුන්දකගෙන් ඉල්ලා සිටියේ උන්වහන්සේට නැවත සැතපී ගිමන් නිවා ගැනීම පිණිස, සැතපීමට සිවුරක් නවා පොළොව මත එලන ලෙසයි. චුන්දක මෙය කළ අතර, බුදුපියාණන් වහන්සේට අවශ්‍ය ඕනෑම දෙයකට උපස්ථාන කිරීම සඳහා උන්වහන්සේ අසල බලා සිටියේය.

ඔහු අතීතයේදීද බුදුපියාණන් වහන්සේගේ අවශ්‍යතා පිළිබඳව අවධානයෙන් සිට ඇත. වරක් බුදුපියාණන් වහන්සේ අසනීප වූ විට, ඔහු උන්වහන්සේ බැහැ දැකීම සඳහා එහි ගොස් ධර්මය පිළිබඳවද සාකච්ඡා කර ඇත. ඒ අවස්ථාවේ චුන්දකගේ කරුණාවන්ත පැමිණීම නිසාම බුදුපියාණන් වහන්සේගේ රෝගී තත්ත්වය පහව ගිය බව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ.[18] බුදුපියාණන් වහන්සේ විවේක ගනිමින් සිටියදී, චුන්ද විසින් උන්වහන්සේගේ අවසාන ආහාරය ලබා දී ඇති හෙයින්, තමන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු තමා ඒ පිළිබඳව වගකිව යුතුයැයි අසරණ මිනිසා සිතමින් පසුතැවිල්ලට පත් වනු ඇතැයි යන අදහස උන්වහන්සේගේ මතකයට ආවේය. මේ සියල්ල වළක්වා ගැනීම සඳහා, බුදුපියාණන් වහන්සේ නැවත පාවා වෙත ගොස්, ආනන්ද හිමියන් බුදුපියාණන් වහන්සේගෙන්ම මුවින්, මෙසේ ඇසූ බවත්, එනම්, ''බුදුපියාණන් වහන්සේට උන්වහන්සේ බුද්ධත්වය ලැබීමට මොහොතකට පෙර, දානයක්

[17] Now called the Khanua River, it is about ten km. east from Kusinārā, seemingly a long way for the weak and ailing Buddha to walk in the time he had remaining. However, the Khanua has a very meandering course as most rivers in the region do and may well have been closer to Kusinārā at the time. The commentary gives the distance between Pāvā and Kusinārā as three *gāvutas* which Rhys Davids calculated at a little less than two miles, see Srinivasan, pp. 18, 23, 25. Unfortunately, we do not know exactly where Pāvā was in relation to the Kukutthā at that time, or to Kusinārā, nor are we sure how long a *gāvuta* was.
[18] S.V,81.

දීම සහ පරිනිර්වාණයට මොහොතකට පෙර, දානයක් දීමත්, සියලු දාන දීම අතරින් වඩාත්ම සුබදායක සහ කුසල් ලැබෙන දානය බව'' චුන්දට පවසන ලෙස ආනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියහ. වෙහෙස, අපහසුව සහ මරණය ආසන්නව තිබියදීත්, බුදුපියාණන් වහන්සේ අනුන් පිළිබඳව සිතමින් සිටි බවට බුදුපියාණන් වහන්සේගේ මහාකරුණාව මෙයින් පෙන්නුම් කරයි.[19] නැවත ගමන් ආරම්භ කර, පිරිස අවසානයේ හිරඤ්ඤවතී ගඟ[20] තරණය කර අවසානයේ බුදුපියාණන් වහන්සේ ඇතුළු පිරිස මලලගේ ප්‍රධාන නගරය වන කුසිනාරාවට මායිම්වූ රුක් වත්තකට පැමිණියේ ආලෝකය පහව යන විටයි. විශාල ගස් දෙකක් අතර, උන්වහන්සේට සැතපීම සඳහා යහනක් සූදානම් කරන ලෙස බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියහ.[21] උන්වහන්සේ වැතිරුණු පසු, වහා ක්ෂණයකින් ගස් දෙකේම මල් පිපුණු අතර, මල් පෙති බුදුපියාණන් වහන්සේගේ සිරුර පුරා මල් පෙති විසිරුණි. මෙය දුටු ආනන්ද හිමියෝ පුදුමය පළ කළහ. බුදුපියාණන් වහන්සේ වැදගත් කරුණක් පැවසීමට එය අවස්ථාවක් කරගත්හ.

''මෙම සල් ගස් ඍතුවෙන් පිටදී මල් පිපී ඇත. මීට පෙර කවදාවත් තථාගතයන් වහන්සේ මෙතරම් ගෞරවයට සහ ගරුබුහුමනට, පූජනීයත්වයට සහ ආචාරයට ලක් වී නැත. නමුත්, ධර්මය සම්පූර්ණයෙන් පුහුණු කරන සහ ධර්ම මාර්ගය හැම අතින්ම සම්පූර්ණ කරන භික්ෂූහු හෝ භික්ෂුණීහු, උපාසක හෝ උපාසිකාවෝ සැබැවින්ම තථාගතයන් වහන්සේට ඉහළින්ම ගෞරව කරන, ගරුබුහුමන් කරන, පූජනීයත්වයෙන් සලකන සහ ආචාර කරන්නෝ වෙති.''[22]

ධර්මයට අනුව ජීවත්වීමට සහ ධර්මය පැවිදි සහ ගිහි යන සියල්ලන්ටම බව පවසමින්, බුදුපියාණන් වහන්සේ එයට පළමු තැනත්, ප්‍රාතිහාර්යයන්ට දෙවන තැනත් දුන් බවටත්, මෙය තවත් උදාහරණයකි.

අවසානයට එළෙඹින් සිටින බව අවබෝධ කර ගනිමින්, බුදුපියාණන් වහන්සේ සමහර අවසාන උපදෙස් සහ ශික්ෂණ ලබාදුන්හ. තමන් වහන්සේ උත්පත්තිය ලැබූ ස්ථානය, බුද්ධත්වයට පත් ස්ථානය, ධර්මය පළමු වරට දේශනා කළ ස්ථානය සහ පරිනිර්වාණයට පත්වන ස්ථානයත් දැක බලා ගැනීමට යන ලෙස බුදුපියාණන් වහන්සේ සෑම ශ්‍රාවකයෙකුම ධෛර්යවත් කළහ. කාන්තාවන් සමග කුළුපග නොවන ලෙස භික්ෂූන්ට අනතුරු ඇඟවූහ. උන්වහන්සේගේ දේහය බැහැර කළ යුත්තේ කෙසේද කියා උපදෙස් දුන්හ. වැරදිකරු වූ චන්න භික්ෂුව විනයගරුක කළ යුතු බවට උපදෙස් දුන්හ. සුළු පැවිදි නීති අලුත් තත්ත්වයන් ඇති වන විට වෙනස් කිරීමට අවසර දුන්හ. කඳුළු වළක්වා ගැනීමට නොහැකි වූ ආනන්ද

[19] D.II,135-136.
[20] The Chota Gandak, recently renamed the Hiraññavatī River for the benefit of pilgrims.
[22] D.II,137-138

හිමියෝ අසල පිහිටි ගොඩනැගිල්ලකට ගොස්, දොර කණුවකට හේත්තු වී ඉකි බිඳින්නට වූහ. ''අහෝ, මම තවමත් ඉගෙන ගන්නෙක් වෙමි. මට ඉගෙන ගන්නට ඇති දේ බොහෝය. මහාකරුණාවෙන් යුක්තවූ එම ගුරුවරයා පරිනිර්වාණයට පත්වෙන්නට ආසන්නය.'' ආනන්ද හිමියන් ළඟ නැති බව දකිමින්, බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ට එන ලෙස දන්වා උන්වහන්සේ එතරම් සසලව සිටිනු දැක, ආනන්ද හිමියන් සැනසූහ. බුදුපියාණන් වහන්සේ ගැනම සිතමින් බොහෝ කාලයක් සේවය කිරීම පිළිබඳව ස්තුති කළහ. ''ආනන්ද, ඔබ කායික වශයෙන් ආදරයෙන් ක්‍රියාකාරකම් පෙන්වමින්, වාචිකව ආදරය පෙන්වමින්, මානසිකව ආදරය දක්වමින්, ප්‍රයෝජනවත් වන පරිදි, සහ හෘදයාංගමව, සතුටින් සහ ක්‍රියාශූර අන්දමින් බොහෝ කාලයක් තථාගතයන් වහන්සේ සමීපයේ සිටිමින්ම කටයුතු කර ඇත. ආනන්ද ඔබ බොහෝ යහපත වර්ධනය කර ඇත. උත්සාහ කරන්න, කෙටි කාලයකින් ඔබ කෙලෙස්වලින් නිදහස් වනු ඇත. ''මෙම කඳුළු සහ කෘතඥපූර්ව බව සහ ස්තුතිය ප්‍රකාශ කිරීම උන්වහන්සේලා දෙදෙනාගේ ඥාති සබඳතාව ඔබ්බට ගොස් ඇති බැඳීම පිළිබඳ සාක්ෂියකි.

මෙයින් පසු, බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන්ගෙන් ඉල්ලා සිටියේ උන්වහන්සේ ඔවුන්ගේ නගරයට පැමිණීම සහ සිදුවීමට ආසන්න පරිනිර්වාණය පිළිබඳව මලල රජදරුවන්ට දන්වන ලෙසයි. මලල රජදරුවන් ඔවුන්ගේ රැස්වීම් ශාලාවේ එක්වී සිටි අතර, ආනන්ද හිමියන් පණිවුඩය සැල කළ විට, ඔවුහු චිත්ත කම්පනයට සහ සන්ත්‍රාසයට පත් වූහ. ජන සමූහය ආනන්ද හිමියන් අනුගමනය කරමින් සල් උයන්වත්තට ගියහ.  ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේ එහි වැතිරෙන විට, සෑම පවුලක්ම උන්වහන්සේට හඳුන්වා දුන්හ.

ධර්ම ග්‍රන්ථවල සඳහන් නොවූවත්, මලල රජදරුවන් ඔවුන් සමග ලාම්පු ස්වල්පයක් ගෙන එන්නට ඇත. මුළු උයන්වත්තම අඩු වැඩිවන ආලෝකයෙන් ආලෝකමත් කරන්නට ඇත. මෙම විශාල පිරිස අතර, ඔබ මොබ යන භික්ෂුවක වූ සුභද්ද ද කුසිනාරාවේ සිටියේය. මෙම උතුම් ගුරුවරයා පිළිබඳව දැන සිටියද, කිසිම දිනක හමු නොවූ නිසා, උන්වහන්සේ සමග කතා කිරීමට හැකි දැයි ආනන්ද හිමියන් වෙත ප්‍රවේශ වී ඇසුවේය. ආනන්ද හිමියෝ බුදුපියාණන් වහන්සේ වෙහෙසට පත් වී සිටින නිසා එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළේය. නමුත් සුභද්ද නොනවත්වාම ඉල්ලා සිටියේය. එම සංවාදය ඇසුණු බුදුපියාණන් වහන්සේ එම භික්ෂුවට එන්නට ඉඩ දෙන ලෙස  ආනන්ද හිමියන්ට පැවසූහ. එම කෙටි සාකච්ඡාව තුළදී සුභද්ද හිමියෝ පැවිද්ද ඉල්ලා සිටියේය. මෙය සිදු විය. ඔහු රහත්ඵලයට පත් වූ බව ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. නමුත්, කොපමණ කලකින්ද යන්න සඳහන් වී නැත. [23]

[23] D.II,149-152.

මීට වසර කිහිපයකට පෙර, බුදුපියාණන් වහන්සේ පවසා ඇත්තේ ධර්මය පිළිබඳව දැන ගැනීමට කැමැති සහ එසේ කිරීමට හැකියාවක් ඇති විමසන්නන්ගේ ප්‍රශ්නවලට පිළිතුරු දීමට උන්වහන්සේ සැමවිටම සූදානම් බවයි. ''ඔබලාට මා ගිලන් මැස්සක් මත අතන මෙතනට ගෙන යාමට සිදුවුවත්, මගේ ප්‍රඥාවේ පැහැදිලි බවේ වෙනසක් නොවේ. යම් කෙනෙකු මා පිළිබඳව නිවැරදිව කථා කළහොත්, එම පුද්ගලයාට කිව හැක්කේ මෝහයට වගකීමට යටත් නොවුණු, බොහෝ දෙනාගේ යහපත පිණිස, ලෝකය කෙරෙහි මහාකරුණාවෙන් යුක්ත, දෙවිවරුන්ගේ සහ මිනිසුන්ගේ යහපත සහ සතුට පිණිස පුද්ගලයෙකු ලෝකය තුළ පහළ වී ඇති බවයි. ''[24] සුභද්ද සමග බුදුපියාණන් වහන්සේගේ හමුවීමේදී උන්වහන්සේ අවසන් හුස්ම ගනිමින් සිටියදී වුවත්, උන්වහන්සේ තමන්වහන්සේගේ වචනවලට කෙතරම් සත්‍යවාදී වූවේද යන්න පෙන්වාදී ඇත.

අවසාන දිරිගැන්වීමක් වශයෙන්, ආනන්ද හිමියන්ට සහ අනෙක් අය වෙනුවෙන් මෙම වචන එකතු කළහ :'' ආනන්ද, ඔබලා මෙසේ සිතන්නට ඉඩ ඇත, 'ගුරු මඟපෙන්වීම අවසන් වී ඇත, අනේ අපට ගුරුවරයෙකු නැත.' නමුත්, ඔබ එය දැකිය යුත්තේ එසේ නොවේ. මා ඔබලාට උගන්වා ඇති ධර්මය සහ පුහුණුව මා නැති වූ පසු, ඔබේ ගුරුවරයා බවට පත් කර ගන්න.''

දැන් අවසානය එළඹී ඇත. බුදුපියාණන් වහන්සේ කැටුව උන්වහන්සේගේ අවසන් ගමනට පැමිණි භික්ෂූන්, සුභද්ද සහ අනෙක් අය වටේට එකතු විය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අවසාන වචන ප්‍රකාශ කළහ. ''දැන් මහණෙනි, මම ඔබලාට ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරමි, සියලු තත්ත්වාරෝපිත දේ අනිත්‍යය. අවබෝධයෙන් යුක්තව උත්සාහ කරන්න.'' (හන්දදානි භික්ඛවෙ ආමන්තයාමි, වෝ වයධම්මා සඞකාරා. අප්පමාදේන සම්පාදේථ). ස්වල්ප වේලාවකට කම්පනයක් ඇති විය. එය වහා ඉකි බිඳීමෙන් බිඳී ගියේය. පැමිණ සිටි සමහර අය කඳුළු සමගින් කෑ ගසා හඬන්නට වූහ: ''ඉතා ඉක්මනින් බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වූහ. ඉතා ඉක්මනින් ප්‍රීතිමත් උතුමන් පරිනිර්වාණයට පත්වූහ. ඉතා ඉක්මනින් විශ්වයේ ඇස නික්ම ගියහ!.'' සාමාන්‍ය ජීවිතයේ ඇති තත්ත්වාරෝපිත පැවැත්මේ ස්වභාවය අවබෝධ කරගත් අනෙක් අය, නිහඬව සිට එදින රාත්‍රියේ ඉතිරි කාලය නිශ්ශබ්දව භාවනාවේ යෙදුනහ. එම රාත්‍රියේ සල් ගස් යට පරිසරය කණස්සලු සහිත වන්නට ඇත. එයට හේතුව භික්ෂූන් ඔවුන්ගේ මඟපෙන්වන්නා, පොළඹවන්නා සහ දීර්ඝකාලීන මිතුරා යන සාධක ලෙස අවබෝධ කරගත් පුද්ගලයා තවදුරටත් නැතිවීමයි. උන්වහන්සේ හදිසියේ ළඟ නැති වීම, අවිනිශ්චිත බවේ හැඟීමක් ඇති කරන්නට ඇත. එනිසා අවස්ථාවට ගැළපීමට කාලය අවශ්‍ය විය.

[24] M.I,83.

# 14. ආනිසංසය

මම ඉතා විශිෂ්ට ලෙස ධර්මය ඉගැන්වූ
ඒ බුදුපියාණන් වහන්සේ සහ ධර්මය අගය කරමින්
නගරයෙන් නගරයට යන්නෙමි - නුවරින් නුවරට යන්නෙමි -
සුත්ත නිපාතය 192

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය ශෝකය සහ පාඩුවක් පිළිබඳ හැඟීමක් උපද්දවයි. දීර්ඝ සහ ඵලදායී ජීවිතයක අවසානයට පැමිණි බව සහ ස්වභාවික ගමන් මගකට අනුකූලව සිදුවූ බවත් දනිමින් එවැනි හැඟීම් නොරිස්සුම් සහගත වී ඇත. පසුදා උදෑසන හිරු උදාවන විට, අනුරුද්ධ ස්වාමීන් වහන්සේ ආනන්ද ස්වාමීන් වහන්සේගෙන් සිදුවූ දෙය කුසිනාරාවට ගොස් මලල රජදරුවන්ට පවසන ලෙස ඉල්ලුවේය. ඔවුන් බොහෝ දෙනෙකු රැස්වීම් ශාලාවේ රැස් වී සිටි අතර, ඔවුන් ප්‍රවෘත්තිය දැනගත් විට, සියලු දෙනාටම දැඩි ශෝකයක් ඇති විය. භික්ෂූන්ගේ එකඟතාව ඇතිව, අලංකාර අවමංගල්‍ය සහ සමරු උත්සවයක් සතියක් පුරා පැවැත්වීමට සූදානම් කිරීම ආරම්භ කළහ.

මේ අවස්ථාවේදී, මහාකාශ්‍යප මහරහතන් වහන්සේ ඇතුළු විශාල භික්ෂූන් කණ්ඩායමක් කුසිනාරාවට යෑමට ප්‍රධාන මාර්ගයේ ගමන් කරමින් සිටින විට, නගරයේ සිට පැමිණෙන ආජීවක නම් භික්ෂුවක් හමුවිය. ඔවුන් ශාක්‍ය පුත්‍රයන් බව දැක, තිගැස්මක්, ව්‍යාකූල බවක් සහ ශෝකයක් භික්ෂූන් තුළ ඇති වීමට පෙර, ඔහු බුදුපියාණන් වහන්සේ සතියකට පෙර පරිනිර්වාණයට පත් වූ බව ඔවුන්ට දැන්වූහ. කෙසේ නමුත්, ජීවිතයේ පසු කාලයේ පැවැදිවූ එක් භික්ෂුවක් වූ සුභද්ද වෙනස් ආකාරයකින් එයට ප්‍රතිචාර දැක්වූයේය. ඔහු මෙසේ කීවේය: '' මිතුරනි, වැලපීම සහ සහ ශෝක කිරීම ඇති. අපි උතුම් සමණයන්ගෙන් සෑහෙන පමණට මිදුනෙමු. 'ඔබලා මෙය කළොත් හොඳයි. ඔබලා එය කළොත්, එය හොඳ නැත.' යනාදිය කියමින්, අපි නිරන්තරව උන්වහන්සේගෙන් හිරිහැර වින්දෙමු. දැන් අපට අප කැමති දේ කිරීමට හෝ නොකිරීමට හැකිය.'' මේ වේලාවේ එවැනි මත දැක්වීම අනෙක් භික්ෂූන්ට චිත්ත පීඩාවක් වන්නට ඇති නමුත්, කිසිවෙකු කිසිවක් කීවේ නැත.[1]

මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සහ සෙසු භික්ෂූන් වහන්සේලා මෙම මාර්ගයේ සිටීමත්, ඔවුන් සිටි දිසාවට ගමන් කිරීමත් කුතුහලය දනවන කරුණකි. සිතියමක් දෙස බැලූ විට, පෙනී යන්නේ කුසිනාරා හරහා පැරණි මාර්ගය පසු කර ඉදිරියටම සාවත්ථියට යන්නට ඇති බවත්ය. එසේම කුසිනාරාවට ඔබ්බෙන් එක් ස්ථානයකදී කපිලවත්ථුවට මාර්ගය දෙකට බෙදෙන්නට ඇති බවත්ය. බුදුපියාණන් උන්වහන්සේගේ

[1] D.II,162-163.

පරිනිර්වාණය සඳහා රාජගහ සිට කපිලවත්ථුවට, උන්වහන්සෙගේ අවසාන දින කිහිපය නැවතීමට බලාපොරොත්තු වූ පරිදි, ගිය බවට අනුමාන කිරීම අසාධාරණ නොවේ. එසේ නම්, පිටත්ව යෑමට පෙර, බුදුපියාණන් වහන්සේ ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලාට අවසාන උපදෙස් සහ සමුගැනීම් සඳහා කපිලවත්ථුවේදී උන්වහන්සේ හමුවන ලෙස දන්වන ලෙස සමහර භික්ෂූන්ට පණිවුඩ දෙන්නට ඉඩ ඇත. නමුත්, උන්වහන්සේ සැලසුම් කළ ස්ථානයට පැමිණෙන්නට පෙර උන්වහන්සේ කුසිනාරාවේදී පරිනිර්වාණයට පත්වූහ.

මෙම අනුමානය නිවැරදි නම්, බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත් වූ බව දැනගත් විට, උන්වහන්සේගේ ප්‍රධාන ශ්‍රාවකයන්ගෙන් එක් කෙනෙකු වූ සහ වනයේ තනිවම ජීවත්වීමට ප්‍රිය වූ මහාකාශ්‍යප මහරහතන් වහන්සේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳ පුවත අසන විට සිටි ස්ථානය වන කපිලවත්ථුව වීමට හේතුව ද පැහැදිලි කරනු ඇත. කාරණය කුමක් වුවත්, දුක්බර පුවත අසන්නට ලැබුණු මහාකාශ්‍යප හිමියෝ සහ අනෙක් භික්ෂූහු කුසිනාරා වෙත වේගයෙන් ගියහ.

මලල රජදරුවෝ උතුරු දොරටුව හරහා බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී දේහය වීදි දිගේ රැගෙන ගියහ. නැගෙනහිර දොරටුවෙන් සහ එතැන් සිට මකුට බන්ධන සිද්ධස්ථානයට රැගෙන ගොස් ආදාහනය කළහ. අවමගුල් චිතකය සිසිල් වූ පසු, ඔවුහු අස්ථි ධාතුන්ගේ ශේෂය ඔවුන්ගේ සභා ශාලාවට ගෙන ගියහ. මෙසේ සියලු දෙනාටම ඒවාට ගෞරව දැක්විය හැකි විය. බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය පිළිබඳ පුවත පැතිර ගිය විට, බොහෝ රාජධානිවලින්, ප්‍රධාන රාජ්‍යයන්ගෙන් සහ ගෝත්‍රවලින් කුසිනාරාවට ශේෂවූ ධාතුන් වහන්සේලාට හිමිකම් ඉල්ලීම සඳහා පැමිණෙන්නට පටන් ගත්හ. ශාක්‍යයන්ගේ නියෝජිතයා පැවසූ පරිදි, ධාතුන් වහන්සේලා අවශ්‍ය වූයේ: ''තථාගතයන් වහන්සේ අපගේ ගෝත්‍රයේ උතුම්ම පුද්ගලයා වූහ.'' මගධයේ රජුගේ නියෝජිතයා පැවසුවේ ඔවුන්ගේ ස්වාමියාට භෂ්මාවශේෂ සඳහා හිමිකම් කිව හැකි බවත් එයට හේතුව බුදුපියාණන් වහන්සේ සහ ඔහුගේ ස්වාමියාද රණවිරු කුලයේ නිසා බවත්ය. කුසිනාරාවේ මලල රජදරුවෝ නීතියෙන් දහයෙන් පංගුවෙන් නවයක් සන්තකයේ තබා ගැනීමේ දෘෂ්ටි කෝණයෙන් තර්ක කරමින් මෙසේ පැවසහ: ''තථාගතයන් වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ අපගේ නගර සීමාවේ සිටය. අපි උන්වහන්සේගේ අස්ථි ධාතුන් අත් නොහරිමු.'' ධාතුන් වහන්සේලා ඉල්ලා සිටි මුළු ගණන අසැබි ආරවුලට සම්බන්ධ වූහ. දොණ නමැති බ්‍රාහ්මණයෙකු කුසිනාරාව වෙත පැමිණෙමින් සිටි අතර, රණ්ඩු සරුවල් කරන පාර්ශ්වයන් අතර මැදිහත්වීමෙන් විසඳීමට ඔහු

ඉදිරිපත් විය.[2] ඔහු එක්රැස්වූ වැදගතුන් අමතා මෙසේ කීවේය: ''බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් ඉවසීම පිළිබඳවයි. එනිසා, මිනිසුන් අතර උතුම්ම පුද්ගලයාගේ ශේෂයන් බෙදා ගැනීම සම්බන්ධයෙන් අරගල ඇති කර ගැනීම හරි නැත. අපි සියලු දෙනාම එකමුතුව සහ සාමයෙන් සහ මිත්‍රත්වයේ හැඟීමකින් ශේෂධාතූන් වහන්සේ කොටස් අටකට බෙදා ගනිමු.'' සමහර අය, සමහර විට අකැමැත්තෙන් වුවද මෙම අභියාචනය පිළිගත්හ. දොණ ඔහු සාධාරණ යැයි සිතූ ආකාරයට ශේෂයන් බෙදිය යුතු යැයි එකඟ විය. ඔහු මෙය කළ අතර, ඔහුගේ සේවය වෙනුවෙන් ත්‍යාගයක් ලෙස, ධාතූන් වහන්සේලා වැඩම කර තිබූ සහ ඔහු ඒවා මැන බැලූ භාජනය ඔහුට දෙන ලදී. සෑම දෙනාම තෘප්තිමත් වන අයුරින් බෙදීම සිදු කෙරුණි. මොරිය වංශයේ නියෝජිතයා පසුව පැමිණ ධාතූන්ගේ ඔවුන්ට හිමිවිය යුතු කොටස ඉල්ලා සිටි අතර, නැවතත් දොණ ඒ සඳහා ඉදිරිපත් විය. ඒ පසුව පැමිණෙන අයට, අවමංගල්‍ය චිතකයෙන් භෂ්මාවශේෂ ලබා දීමට යෝජනා කරමින්ය. මෙසේ කර, ධාතූන්වහන්සේ සහ භෂ්මාවශේෂ ලැබූ සෑම කෙනෙකුම ස්තූපයක් බැගින් ඉදිකරන්නට භාර ගත්හ. [3]

බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු, භික්ෂූන් වහන්සේලාට පෞද්ගලිකව අනාගතය කෙබඳු වේදැයි, පැවිදි සඞසයාට පොදුවේ කෙසේ වේදයි සහ විශේෂයෙන්ම බුදුපියාණන් වහන්සේගේ ධර්මයට කෙසේ වේදැයි යන්න පිළිබඳව භික්ෂූන් අතර යම් සාකච්ඡාවක් ඇතිවුණි. අනාගත පරම්පරාවල සුභසිද්ධිය සඳහා ධර්මය ආරක්ෂා කිරීමට යම් උත්සාහයක් ගත යුතු බවට මහාකාශ්‍යප මහරහතන් වහන්සෙ යෝජනා කළහ. සුභද්දගේ අගෞරවනීය සහ විභව්‍ය භයානක ප්‍රකාශය මහාකාශ්‍යප මහරහතන් වහන්සේට මෙම යෝජනාව කිරීමට හදිසි අවශ්‍යතාවයක් ඇති කරන්නට ඇත. මහාවිහාර වසර කිහිපයකට පෙර මිය ගිය විට ඇති වූ දෙයද - එනම් ඔහුගේ අනුගාමිකයන් රණ්ඩු සරුවල්වලට කල්ලි ගැසීම ද, මහාකාශ්‍යප මහරහතන් වහන්සේ සහ අනෙක් අයට සිහිපත් වන්නට ද ඇත.[4] සැබැවින්ම, රහත්ඵලයට පත් වූ සියලු භික්ෂූන් වහන්සේලාගේ රැස්වීමක් කැඳවිය යුතු බවට තීරණය කරන ලදී. එවිට බුදුපියාණන්

---

[2] D.II,166. Doṇa had met the Buddha years before, A.II,37; III,223. His name is probably a moniker given to him by the compilers of the Tipitaka for his role in dividing the Buddha's ashes. Doṇa refers to a wooden bowl or tub which according to Olivelle, 2004 p.458, had a capacity of about 5 litres. See also Srinivasan pp. 49-51, 90-92 and 166.

[3] It could be conjectured that Doṇa placed the Buddha's ashes in one of the monk's alms bowl rather than in a bowl used for some mundane purposes. This would have been more appropriate considering the Mallas' and the monks' wish to have a fitting funeral for the Tathāgata – solemn and dignified. The Tipitaka provides almost no information about what Buddhist alms bowls were like at that time, but there is one in the State Museum in Lucknow, India. It is of pottery known as Northern Black Polished Ware which was produced around the time and in the region the Buddha lived and its shape and size are almost the same as today's standard Burmese monk's bowls. These bowls hold 4 ½ litres, very close to Olivell's estimation of a *doṇa* measure, and would have easily held the Buddha's ashes. The remains of the average human male after cremation weighing about 2 ½ kgs. On the possible identification of the stupa built by Doṇa see Dhammika 2018a, pp.174-75.)

[4] M.II,243.

වහන්සේ ඔවුන්ට ඉගැන්වූ ධර්මය ආරක්ෂා කර ගන්නට යම් උත්සාහයක් ගන්නට හැකිවනු ඇත. ඉදිරියට එළඹෙන වැසි සමයේදී රාජගහ නුවරදී එවැනි උපදේශක සභාවක් පැවැත්වෙන බවට විවිධ දිශාවලට ගොස් ප්‍රචාරණය කිරීමට කුසිනාරාවේ භික්ෂූහු තීරණය කළහ. පෙර කී ලෙස නගරයක, රාජගහ වැනි විශාල නගරයක වුවද, එවැනි විශාල සංඛ්‍යාවක භික්ෂූන් පිරිසකට දානය ලබා ගැනීමට සහ නවාතැන් ලබා ගැනීමට දුෂ්කර විය හැකි බැවින්, අනෙක් සියලුම භික්ෂූන් වහන්සේලාට නොපැමිණෙන ලෙස ඉල්ලා සිටිය යුතුයි. නැතහොත්, ඔවුන් දැනටමත් එහි ඇත්නම්, නගරයෙන් පදිංචිය අතහැර යා යුත බවත් දැනුම් දිය යුතුව තිබේ.

වැසි සමය ආරම්භ වන විට, සිය ගණනක් භික්ෂූහු පැමිණියහ. ත්‍රිපිටකයෙන් සාම්ප්‍රදායික පන්සියයක් සංඛ්‍යාව ලෙස ලබා දුන්නේය. පෙර මාසවලදී නිතිපතා රැස් වූයේ සත්තපණ්ණ ගුහාවේදීය. එය පිහිටා තිබූයේ වෙභාර කඳුවැටියේ උතුරු දෙසින් පිහිටි බෑවුමේය.[5]

රැස්වීමේ ප්‍රමුඛ පුද්ගලයන් වූයේ දැඩි සහ සදාචාරාත්මක මහාකාශ්‍යප මහරහතන් වහන්සේ, කලබල නැති සහ ප්‍රිය මනාප ආනන්ද ස්වාමීන් වහන්සේ සහ පැවිදි විනය පිළිබඳ විශේෂඥ ඥානයක් තිබූ උපාලි ස්වාමීන් වහන්සේ යන අයයි. ආනන්ද හිමියන් සහ කාශ්‍යප හිමියන් අතර අතීතයේදී ආතතියන් තිබී ඇත. එයට හේතුව, කාශ්‍යප හිමියන් ආනන්ද හිමියන් භික්ෂුණීන් කෙරෙහි පමණට වඩා උපකාර කිරීම සහ උන්වහන්සේගේ භාරකාරත්වයේ සිටින සාමනේර හිමියන්ට ප්‍රමාණවත් ලෙස දැඩි නොවීම සම්බන්ධයෙනි.[6] කවුන්සිලයට සහභාගී විය යුත්තේ කවුරුන්ද යන්න පිළිබඳව කාශ්‍යප හිමියන් සිය නිර්දේශ ලබා දුන් විට, බොහෝ කාලයක් බුදුපියාණන් වහන්සේට ඉතාමත් සමීපවූ සහ බුදුපියාණන් වහන්සේ දේශනා කළ බොහෝ දේ ආනන්ද හිමියන් අසා තිබූ නිසාත් උන්වහන්සේ එම කවුන්සිලයේ සිටිය යුතු බවට අනෙක් භික්ෂූන් පෙන්වා දෙන තුරු කාශ්‍යප හිමියන් ආනන්ද හිමියන්ගේ නම ඇතුළත් කිරීම නොසලකා හැර තිබුණි. හුදෙක් භික්ෂූන්ට අදාළ යැයි කාශ්‍යප හිමියන් අනුමැතිය දුන් ඉගැන්වීම් පමණක් නොව, ආනන්ද හිමියන් විසින් වැදගත් යැයි දුටු, ගිහියන්ට අදාළ ඉගැන්වීම් ද ත්‍රිපිටකය බවට පත්වන දෙයට ඇතුළත් කිරීමට ගත් තීරණයේ මෙම එකිනෙකට වෙනස් පෞරුෂයන් ඇති දෙදෙනාගේ පැමිණීම වැදගත් වන්නට ඇත.[7]

මෙම රැස්වීම ඉදිරියට ගෙන ගිය ආකාරය පිළිබඳ විස්තරය හරියටම සිදුවූයේ කුමක් ද යන්න අදහසක් ලබා ගැනීමට නොහැකි තරම් බොහෝ හරයක් නැත. එය නිසැකවම සහභාගිවන්නන්ට සියල්ල හෝ නැතහොත්,

---

[5] Vin.II,76. The cave is actually two fissures, one larger than the other, in the side of a high jagged cliff near the top of the hill. When Buddhist pilgrims visit the site today they wonder how several hundred monks could have fitted into either or even both these fissures. The council was held at, not in, the cave, likely in a hall built on the wide platform extending outward from the foot of the cliff.

[6] S.II,215-218.

[7] Tilakaratne, has some interesting observations on this matter and its possible implications.

රැස්වීම පැවති කාලය තුළ බුදුපියාණන් වහන්සේගේ දේශනාවලින් ඉතාම වැදගත් ඒවා පවා, කටපාඩම් කර ගැනීමට දුෂ්කර වන්නට ඇත. කෙසේ වෙතත්, භික්ෂූන් සහ ගිහියන් පවා සමහර ධර්මදේශනා මතකයට නගා ගත් බවට සාක්ෂි ඇත. එසේම ඔවුන්ට ඒවා බුදුපියාණන් වහන්සේ ජීවත්ව සිටි අවධියේදී ද සජ්ඣායනය කරන්නට හැකි වී ඇත. බලන්න[8] තෝරාගෙන කටපාඩම් කළ සූත්‍ර පිළිවෙළකට සකස් කළ බව දැනගන්නට ඇති නමුත්, සමහර විට ඒවා පිළිවෙළකට සකස් කර ඇත්තේ ඒවායේ දිග ප්‍රමාණයට විය හැකිය.

වරක්, භික්ෂූන් කණ්ඩායමක් බුදුපියාණන් වහන්සේ වෙත ප්‍රවේශ වී ඔවුන් බටහිර කලාපයට ගොස් ටික කාලයක් එහි රැඳී සිටීමට තීරණය කළ බව දැන්වූහ.[9] පිටව යාමට පෙර සාරිපුත්ත හිමියන්ට දන්වන මෙන් බුදුපියාණන් වහන්සේ ඔවුන්ට අවවාද කළ අතර ඔවුහු එසේ කළහ. සාරිපුත්ත හිමියන්ට ඔවුන්ගේ අදහස් දැන්වූ විට, සාරිපුත්ත හිමියෝ මෙසේ පැවසූහ: ''විශ්ලේෂී උතුම් පුද්ගලයෝ සහ බ්‍රාහ්මණයෝ, ගෘහපතියෝ සහ පැවිදි උත්තමයෝ ඔවුන් පිටස්තර ප්‍රදේශයකට යන්නට පෙර, භික්ෂුවකගෙන් විමසීම් කරති. එයට හේතුව එවැනි පුද්ගලයන් උගතුන් වන නිසාය. ඔවුන් මෙසේ අසනු ඇත, 'ඔබගේ ගුරුවරයා කව්ද?' සහ 'ඔහු උගන්වන්නේ කුමක්ද?' ඔබලා ඉගැන්වීම් හොඳින් ඉගෙන ගෙන, අධ්‍යයනය කර, උකහා ගෙන, ඒ පිළිබඳව සිතා, ඒ තුළට ගැඹුරෙන් ගොස් ඇතැයි මම බලාපොරොත්තු වෙමි. ඒ අනුව, ඔබලා පිළිතුරු දෙන විට, බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ දේ කියනු ඇති බවත්, උන්වහන්සේ වැරදියට නොදක්වනු ඇතැයි ද මම සිතමි.'' ඊට පසු සාරිපුත්ත හිමියෝ ඔවුන්ට ධර්මයේ වැදගත් කරුණු කිහිපයක් යෝජනා කර ඔවුන් හමුවන පුද්ගලයන්ට එම ඉගැන්වීම් හඳුන්වා දෙන ලෙස ද පැවසූහ.[10] බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් දුර බැහැර ප්‍රදේශවලට රැගෙන ගියේ මෙම භික්ෂූන් වහන්සේලා පමණක් නොවේ. පැවිදි වී ධර්මය උගත් පුණ්ණ භික්ෂුව දිනක් බුදුපියාණන් වහන්සේට, තමා සුනාපරන්ත ප්‍රදේශයට ගොස් පදිංචිවීමට අදහස් කරන බව පැවසුවේය. එම ප්‍රදේශය නොහික්මුණු සහ ප්‍රචණ්ඩකාරී පදිංචිකරුවන් සිටින දිශාවකි.[11] පුණ්ණ භික්ෂුවට බුදුපියාණන් වහන්සේ පැවසුවේ ඔහුට එහි තත්ත්වය මෙහෙයවන්නට හෝ නරක අතට හැරෙන්නට අවදානමක් ඇති බවයි. නමුත්, ඔහු ධෛර්යවත්ව, නොබියව සහ අධිෂ්ඨානශීලීව පිටව ගියේය. ඔහු සුනාපරන්තයේ මිනිසුන් බොහොමයක් ධර්මය කෙරෙහි යොමු කළ බවත්, අවසානයේ එහිදීම මිය ගිය බවත්, ත්‍රිපිටකයේ සඳහන් වේ.[12]

---

8 See page 139 - on Monastic and Lay Disciples

9 *Pacchābhūmaṃ janapadaṃ*. This would have been what is now Pakistan's Punjab and parts of western Afghanistan, then known as Gandhāra, which became a predominantly Buddhist region by the early centuries CE. These monks must have been amongst the first missionaries there.

10 S.III,6-9.

11 M.III,268-270. Several later Pali and Sanskrit sources say that Puṇṇa was born in Suppāraka, the modern Sopara, which if correct would mean that Sunāparanta must have been the coastal region north of Mumbai. The ruins of a very ancient stupa can be found near Wagholi Naka Road on the western side of Sopara.

12 M.III,268-270.

මෙම කතා දෙකම උපදේශාත්මකය. එයට හේතුව, ඒවායෙන් පෙන්වා දෙන්නේ භික්ෂූන්, සමහර විට භික්ෂුණීන්ද බුදුපියාණන් වහන්සේගේ උපදෙස් ගනිමින් ධර්මය ප්‍රචලිත කිරීම සඳහා බුදුපියාණන් වහන්සේ ජීවතුන් අතර සිටින කාලයේදීම ගැඹුරෙන් කටයුතු කළ නිසාය. උන්වහන්සේගේ පරිනිර්වාණයෙන් පසු, සහ සංගායනාවෙන් පසු, ධර්මදූත ව්‍යාපෘතිය ශතවර්ෂ කිහිපයක් තුළදී ඊටත් වඩා උද්‍යෝගීමත් එකක් විය. බුදුදහම ඉන්දියාවේ ප්‍රධාන ආගම බවට පත්විය. එසේම ආසියාවේ වෙනත් කොටස්වලින් ඔබ්බෙහිද බුදුදහම ප්‍රචලිත විය. අවසාන අවුරුදු එකසිය පනහ තුළදී බුදුපියාණන් වහන්සේගේ ධර්මය යුරෝපය, අමෙරිකා සහ ඕස්ට්‍රේලියානු කලාපය තුළද ප්‍රචලිත වී තිබුණි.

# උපග්‍රන්ථය I

# බුදුපියාණන් වහන්සේ වැඩම කළ නගර සහ පුරවර

## ආලවී

බුදුපියාණන් වහන්සේ අවස්ථා කිහිපයකදීම මෙම නගරයේ නැවතී සිටි අතර, සම්ප්‍රදායට අනුව උන්වහන්සේ උන්වහන්සේගේ දහසයවන වර්ෂා ඍතුවද එහි ගත කළහ. අග්ගාළව නමැති ඒ අසල පිහිටි සිද්ධස්ථානයක් උන්වහන්සේට ඔබ මොබ යන සාමණයන්ට ලබා දෙන අවශ්‍ය මූලික නවාතැන් පහසුකම් ලබා දී ඇත. බුදුපියාණන් වහන්සේ සාමාන්‍යයෙන් ආලවීයට වැඩම කළ විට නවාතැන් පහසුකම් ලබා ගත්තේ එහිය. සමහර විට ප්‍රදේශවාසීන් ආලවක යන යක්ෂයා වන්දනා කරනු ලැබුවේ මෙහි විය හැකිය.[1] සුන්දර පද රචනා කිරීම සම්බන්ධයෙන් බෙහෙවින් ගෞරවයට පාත්‍රවූ වන්ගිස භික්ෂුව සමහර අවස්ථාවල මෙම සිද්ධස්ථානයේ ද නතර වූහ.[2] බුදුපියාණන් වහන්සේගේ ඉතාමත් භක්තිමත් ශ්‍රාවකයෙකුවූ හත්ථක ආලවීයේ පුද්ගලයෙකු විය. ඔහු විශාල ප්‍රමාණයෙන් මිනිසුන් බුදුදහම කෙරෙහි ආකර්ෂණය කිරීමෙහිලා මෙහෙවරක් කළ පුද්ගලයෙකු වන අතර, ඒ පිළිබඳව බුදුපියාණන් වහන්සේ ඔහු වර්ණනා කළහ.[3] ආලවීය පිළිබඳව ජෛන ධර්ම ග්‍රන්ථවල සඳහන් වේ. එහි එය ආලභියා යනුවෙන් හැඳින් වේ. මහාවිහාර එහි කිහිප වරක් ගොස් ඇත.[4] උත්තර් ප්‍රදේශයේ එටවා සිට කිලෝ මීටර් 28ක් පමණ ඈතින් පිහිටි අග්‍රා - ලක්නව් අධිවේගී මාර්ගයට ඔබ්බෙන් වූ එයර්වා හි නූතන නගරය සමග ආලවී හඳුනාගෙන ඇත.

## බාරාණසී

බාරාණසී ගංගානම් ගඟේ වම් ඉවුරේ පිහිටා ඇත. දැන් එහි ජීවත්වන මිනිසුන් එම ප්‍රදේශය හඳුන්වන්නේ බරණැස, කාසි වශයෙනි. නිල වශයෙන් වරනසී යනුවෙනි. එය කලින් කාසි රාජධානියේ අගනුවර විය. වර්තමානයේ සහ අවම වශයෙන් පසුගිය සහස්‍ර එකහමාර තුළදී නගරය හින්දු ආගමේ වඩාත් පූජනීය ස්ථානය ලෙස සලකනු ලැබුණි. නමුත්, මුල් බෞද්ධ සහ පෙර-බෞද්ධ ග්‍රන්ථවල ඒ සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් නැත. ගංගාවලින් මිනිසුන් ස්නානය කිරීමට යන ස්ථාන බුදුපියාණන්

---

[1] D.III,205.
[2] S.I,188; Tha.1227-1251.
[3] A.IV,216-220.
[4] *Viyāhapaṇṇatti* 11,12.

වහන්සේ සඳහන් කර ඇතත්, ඒ අතර බාරාණසී නැත.[5] සමහර විට ගෞතමයන් වහන්සේගේ තරුණ කාලයේදී හෝ ඊට පෙර, කාසි ය කෝසලය විසින් ආක්‍රමණය කර ගෙන ඇත. ඊට පසු ප්‍රාදේශීය නගරයක් බවට මැකී ගොස් ඇත. නමුත්, එය වෙළඳාමට, විශේෂයෙන් සුඛෝපභෝගී භාණ්ඩ සඳහා වැදගත් මධ්‍යස්ථානයක් ලෙස පැවතුණි. [6] නගරයෙන් උතුරට යෝජනාවක් (සැතපුම් සඳහා මිණුම් ක්‍රමයක්) පමණ දුරින් ඉසිපතන නමැති මුව සංරක්ෂිතයක් තිබුණි. බුදුපියාණන් වහන්සේ පළමු ධර්ම දේශනය සිදු කරන ලද්දේ මෙම ස්ථානයේදීය.[7] සාරිපුත්ත සහ මහාකොට්ඨිත යන ජ්‍යෙෂ්ඨ භික්ෂූන් වහන්සේලා ද ඉසිපතනයට වැඩියහ. බුදුපියාණන් වහන්සේගේ ජීවිතයේ වැදගත් සිද්ධීන් සිදුවූ එක් ස්ථානයක් වන ඉසිපතනයට ජීවිතයේ එක් වරක් හෝ වඩින ලෙස උන්වහන්සේ සියලු ශ්‍රාවකයන් දිරි ගැන්වීම නිසා ඔවුන් සමහර විට එහි වඩින්නට ඉඩ ඇත.[8]

දැන් ඉසිපතනය හඳුන්වනු ලබන්නේ සරනාත් යනුවෙනි. ඉන්දියානු බුදුදහමේ අවසාන කාලය දක්වාම, එම ප්‍රදේශය උතුම් පැවිදි මධ්‍යස්ථානයක් දක්වා සාර්ථක ලෙස වර්ධනය විය. බුදුපියාණන් වහන්සේගේ කාලයේදී කිසිම ආරාමයක් බාරාණසියේ ආරම්භ නොවීය. පසුකාලීන ශතවර්ෂවලදීද බුදුදහම එහි පැවතුණද එය සැමවිටම හින්දු ආගම බුදුදහමට වඩා ඉස්මතු විය. පැරණි නගරයේ කොටස් රජ්සට් හිදී කැණීම් කර ඇත.

**චම්පා**

චම්පා, මගධයට නැගෙනහිරෙන් පිහිටි අඬගා නම් කුඩා ප්‍රාන්තයේ අගනුවරයි. එය පිහිටා ඇත්තේ ගංගානම් ගඟේ දකුණු ඉවුර මතයි. ගෞතමයන් වහන්සේගේ යෞවන කාලයේදී අඬගා මගධයට ඒකාබද්ධ කර තිබුණි. එය බලහත්කාරයෙන්, ගිවිසුම් විධිවිධානයක් නිසා හෝ ගිවිසුමක් මත ද යන්න පිළිබඳව නොදනී. කෙසේ නමුත්, එය සිදු විය. අඬගා හි රජු ඔහුගේ ජීවිතයම කැප කළේ, සහ අවම වශයෙන් ඔහුගේ ධනයෙන් යම් ප්‍රමාණයක් තබා ගත්තේ නොමසුරුව ආගමික පරිත්‍යාග කිරීමටයි. ධර්ම ග්‍රන්ථවල සඳහන් වන්නේ බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණයෙන් පසුවත් ඔහු ජීවත්ව සිටි බවයි. [9]

චම්පා හි බොහෝ නිර්භය වෙළෙඳුන් හැර, මජ්ඣිම දේශයේ මිනිසුන් සාගරය ගැන අසා ඇති නමුත්, එය දැක ඇත්තේ ස්වල්ප වූ පිරිසකි. නගරය ගංගා තීරයේ බඩු සහ මගී ප්‍රවාහනයට සහ ගංගානම් ගඟේ සිට මුහුදට සහ ඉන් ඔබ්බට යාත්‍රා කරන ලද නැව්වලට සහ දකුණු ඉන්දියාව සහ ගිනිකොණ දිග ආසියාවට විශාල තොටුපළක් විය. නගරයේ එක්

[5] M.I,39.
[6] A.I,248; A.III,391.
[7] E.g. A.I,279; III,320; S.III,66: V,406.
[8] D.II,141.
[9] M.II,163.

වැදගත් සලකුණක් වූයේ පෙර රැජිනක් වූ නමින්, ගග්ගරා විසින් කැණීම් කරවන ලද විශාල විල හෝ ජලාශයයි. විල වටා චම්පක ගස් (මැග්නොලිය චම්පච) වවා තිබුණි. නගරයට බුදුපියාණන් වැඩම කළ බොහෝ විට, උන්වහන්සේ මෙම වත්තේ නතරවීමට තෝරා ගත්හ. මජ්ඣිම දේශයේ ප්‍රධාන නගර අතර අද්විතීය වූ චම්පා හි තිබූ බුදුපියාණන් වහන්සේ විසින් නිතර නිතර වැඩම කළ මෙම ආරාමය හැර වෙනත් කිසිම ආරාමයක් උන්වහන්සේගේ ජීවිත කාලය තුළ පිහිටු වූයේ නැත. නමුත් පසුකාලීන ශතවර්ෂවලදී එහි බෞද්ධයන්ගේ පරම්ණීම තිබුණි. බිහාර් හි භගල්පුර් හි බටහිර මායිමේ පිහිටි විශාල පස් කන්දක් සමගින් චම්පානගර් ලෙස අද හැඳින්වේ. ගග්ගරා රැජින විසින් කරවන ලද විල තවමත් පැවතුණද, රොන් මඩින් ඇහිරී ඇත. දැන් එය හැඳින්වෙන්නේ භෙර්ව විල යනුවෙනි.

**කේසපුත්ත**

කේසපුත්ත යනු කාළාම යනුවෙන් හැඳින්වෙන ගෝත්‍රයක මිනිසුන් ජීවත්වූ ප්‍රධාන නගරයකි. ත්‍රිපිටකයේ සඳහන් වන්නේ එය පිහිටියේ කෝසලයේ බවයි. නමුත් එය පුදුමයක් ලෙස පෙනී යයි. එයට හේතුව, එම නගරය ගන්දක් ගඟෙන් නැගෙනහිරට ස්වල්පයක් වූ දුරින් පිහිටි, නිසා ප්‍රාන්ත දෙක අතර ස්වාභාවික මායිම සාදන්නට ඉඩ තිබූ නිසාය. ශාක්‍යයන් මෙන් කාලාමයන්ද කෝසලයේ ආධිපත්‍ය යටතේ සිටින අතර, යම් ස්වාධීනත්වයක් පවත්වා ගෙන යන්නට ඇත. ගෞතම බුදුපියාණන් වහන්සේගේ පළමු ගුරුවරයා වන ආලාර කාළාමගේ නමින් විමසා බලමින්, කාළාම දේශයෙනි. බුදුපියාණන් වහන්සේ කේසපුත්තට වැඩි එක් අවස්ථාවකදී, එහි ගිය විවිධ ඔබ මොබ යන ගුරුවරුන්ගේ තරගකාරී ප්‍රකාශයන් සම්බන්ධයෙන් ඔවුන්ට ඇති වූ ව්‍යාකූලතාවන් පිළිබඳව බුදුපියාණන් වහන්සේට පැහැදිලි කළහ. එයට බුදුපියාණන් වහන්සේ දුන් පිළිතුර සුප්‍රසිද්ධ කේසපුත්ත සූත්‍රයේ සඳහන් වේ. එය කාළාම සූත්‍රය වශයෙන් සුප්‍රසිද්ධ වී තිබේ.[10] කේසපුත්ත දැන් කුඩා නගරයක් වූ කෙසරිය වශයෙන් හැඳින්වේ. එය පිහිටා ඇත්තේ වේසාලියෙන් උතුර-වයඹ ට කිලෝ මීටර් විසි පහක් පමණ දුරින්ය. නගරයේ දකුණට මඳ දුරකින් විශාල නටබුන් ස්තූපයකි.

**කොසැම්බි**

මජ්ඣිම දේශයේ දකුණු මායිමේ වංසා රාජධානිය එහි අගනුවර වන කොසැම්බි හි පිහිටා ඇත. මෙම නගරය උපායශීලී අයුරෙන් පිහිටා තිබුණේ, යමුනා ගඟේ වම් ඉවුරේ පයාග සිට දින පහක් ගමන් කිරීමෙන් ගංගානම් සහ යමුනා ගංගා සමග එකතුවීමෙන් ගංගාවල ප්‍රවාහනය

[10] A.I,188-189.

පාලනය කිරීමට ඉඩ ලැබුණි. එය පිහිටා තිබුණේද දක්ඛිණාපතයේ උතුරු කෙළවරේයත දෙක්කන, එනම්, මධ්‍යම ඉන්දියාවේ, සිට පැමිණෙන හෝ යන වෙළෙඳුන්ට සහ සංචාරකයන්ට මෙය මහාමාර්ගයකි. මෙම සාධක දෙකම වංසා ධනවත්, බලවත් සහ මජ්ඣිම දේශයේ දේශපාලනයට විශාල බලපෑමක් ඇති කළේය. කොසැම්බි හි බුදුපියාණන් වහන්සේ වදාරන ලද ස්වල්ප වූ ධර්මදේශනාවලින් විනිශ්චය කරන විට, උන්වහන්සේ එහි රැඳී සිටියේ කෙටි කාලයක් බව පෙනී යයි. ඝොසිත නමැති වෙළෙන්දෙකු ආරාමයක් පිහිටුවීම පිණිස නගරයේ භූමියක් පරිත්‍යාග කළ අතර, එය ඔහුගේ නමින් කරවන ලදී. 1950දී ඝොසිතාරාමයේ නටබුන් සොයාගත් අතර, එහි අනන්‍යතාවන් සෙල්ලිපියකින් සහ එහි නම සඳහන් තවත් බොහෝ මැටි මුද්‍රාවලින් හඳුනා ගත්හ. [11]

සම්ප්‍රදායට අනුව, නගරයේ තවත් ආරාම දෙකක් තිබී ඇත. එනම්, කුක්කුටාරාම සහ පාවාරිකර්ම යි. නමුත්, ඒවා හෝ ඒවා පිහිටුවීම පිළිබඳ අවස්ථාවක් ත්‍රිපිටකයේ සඳහන්ව නැත. මෙම නිශ්ශබ්දතාවයට සහ කොසැම්බිහි දී බුදුපියාණන් වහන්සේ සිදු කළ ස්වල්ප වූ දේශනා සම්බන්ධයෙන් නගරයේ සඞසයා අතර ඇති වී තිබූ විශාල භේදය සම්බන්ධයක් තිබිය හැකිය. නගරය ආශ්‍රිත වනාන්තර සහ එළිමහන බොහොමයක් බුදුපියාණන් වහන්සේගේ සහ උන්වහන්සේගේ භික්ෂූන් වහන්සේලාට ප්‍රියතම නිතර ගැවසෙන ස්ථාන විය. ඒවා පාරිලෙයියක, බද්‍රිකාරාම සහ සිංසපාවන වන අතර, මෙහිදී උන්වහන්සේ උන්වහන්සේගේ වඩාත් අමතක නොවන ධර්ම දේශනා සිදු කර ඇත.[12]

බුදුපියාණන් වහන්සේගේ ප්‍රගමනයේ බොහෝ කාලයක් වංසා දේශයේ රජ වූ උදේනට, ධර්මය කෙරෙහි තිබුණේ ස්වල්ප වූ උනන්දුවකි. ඔහු සහ බුදුපියාණන් වහන්සේ සමග ඇති වූ බවට සාකච්ඡා කිසිවක් සංරක්ෂිතවී නැත. කෙසේ නමුත්, රජු එක් වරක් ඝෝෂිතාරාමයට ගොස් පිණ්ඩෝල භාරද්වාජ භික්ෂුව සමග සාකච්ඡා කර ඇති අතර, එම භික්ෂුව රජුගේ රාජ සභාවේ දේවගැතිවරයාගේ පුත්‍රයා බව පසුකාලීන සම්ප්‍රදායෙන් කියැවේ.[13]

### කුසිනාරා

කුසිනාරා යනු මලල රජදරුවන්ගේ ප්‍රධාන නගර දෙකෙන් එකකි. අනෙක පාවා වේ. ඔවුන් පැමිණියේ කුමන නගර දෙකෙන් කුමන එකෙන්ද යන්න අනුව, මෙම පුද්ගලයන් ඔවුන් හඳුනා ගැනීමෙන් පෙනී යන්නේ ඔවුන් අතර යම් ආකාරයක බෙදීමක් තිබූ බවයි. [14] ආනන්ද හිමියන් කුසිනාරා කුඩ්ඩ නගරක, උජ්ජඞගල නගරක, සාඛ නගරක යනුවෙන් ප්‍රසිද්ධියේ හැඳින්වූ [15]

[11] See Sinh pp.27-31.
[12] Ud.41-42; S.III,94-98; III, 126; V,437.
[13] S.IV,10-12.
[14] D. II,165.
[15] D.II,146.

අතර, රීස් ඩේවිඩ්ස් එය '' මෙම කුඩා වරිච්චි-සහ-උඩිං පල්ලෙන් නැවරූ නගරය, මෙම නගරය වනාන්තරයක් මධ්‍යයේ, මෙම දියුණු කළ බෙදී ගිය අලුත් ප්‍රදේශයක.'' යනුවෙන් පරිවර්තනය කළේය. පසුකාලීන පරිවර්තකයන් මෙහි සාරාංශය අනුගමනය කරමින්, කුසිනාරා අවාසනාවන්තවූ සහ අඳුරු ස්ථානයක් බවට හැඟීමක් ඇති කරයි. සමහර වෙනස්කම් අතරට, ''මෙම කණගාටුදායක කුඩා නගරය'' (චාමර්ස්), ''මෙම දුර්වල ස්ථානය, මෙම වනාන්තරයක් අතර තිබෙන අශිෂ්ට නගරය, පළාතේ හුදු මුරපොළකි.'' (වජ්‍ර සහ ස්ටොරි), ''මෙම අවාසනාවන්ත කුඩා නගරය... වනාන්තරයේ දකුණේ එපිට පසුපස'' (වොල්ෂ්), ''මෙම කුඩා නගරය, මෙම පාළු නගරය, මෙම බෙදී ගිය නගරය'' (ආනන්දජෝති), සහ ''කුඩා නගරයක්, වන්නාතරයේ කුඩා නගරයක්, බෙදී ගිය කුඩා නගරයක්'' (සුජාතො) යනුවෙන් පරිවර්තනය කර ඇත. මෙම අවසාන පරිවර්තන දෙක අනෙක් ඒවාට වඩා වැඩියෙන් පාලි භාසාවට සමීප වචන අනුගමනය කරයි.

එසේ වුවද, මෙම සන්දර්භය තුළ, ශාඛා හෙවත්, සාඛ යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න ප්‍රශ්නයකි. ඉංග්‍රීසි මාධ්‍යයෙන්, එයින් අදහස් කරන්නේ ප්‍රධාන මාර්ගයෙන් බැහැරව යන්නයි. සාමාන්‍යයෙන් පැහැදිලි කිරීමේදී, මාර්ගයක්, පාරක් හෝ දුම්රිය මාර්ගයක් යනුවෙන් අදහස් කළ හැකිය. නමුත්, ප්‍රධාන මාර්ගයෙන් බැහැරව කුසිනාරා පිහිටා තිබුණේ මගධ සහ වජ්ජි සිට කෝසල අගනුවර වන සාවත්ථි දක්වාත්, ඉන් ඔබ්බටත් දිවෙන උතුරට සමාන වන අතර, පසු කාලීනව 'මහා කඳ මාවත' Great Trunk Road යනුවෙන් හැඳින්වුණු මාර්ගයට සමාන බව සාධාරණ විශ්වාසයි. එසේම, මගේ දැනුමට අනුව, ත්‍රිපිටකයේ හෝ වෙනත් ඉන්දියානු සාහිත්‍යයක කිසිදු නගරයක් හෝ ගමක්, පඳුරක් හෝ ගස් අතු විස්තර කිරීමට කිසි දිනක සාඛ සල් ක්‍රම ලෙස භාවිත කර නැත. කුඩ්ඩ *Kuḍḍa* සංස්කෘතයෙන් කුඩ්ය *kuḍya* හෙවත් 'බිත්තියක්' යන අර්ථය හෝ සමහර දැනවතුන්ට අනුව, ක්සුණ්ණ, *ksuṇṇa*, හෙවත් 'ඇඹරීමට' සහ පාලියන් හුණු කුඩු *cuṇṇa*, 'powder' යන්නයි. මෙම අර්ථ දෙකම කුසිනාරාවට අදාළ විය හැකිය. නගරයේ ආරක්ෂාව සම්බන්ධයෙන් බිත්තියක් හෝ බලකොටුවක් හෝ මැටි ගඩොල් වැස්සෙන් ආරක්ෂා කිරීම සඳහා හුණු බදාම ආලේපය විස්තර කිරීමට යොදා ගෙන ඇත.[16] උජ්ජඞගල *ujjaṅgala* යනු තද හෝ එකට තදවූ පස් හෝ මඩ වේ. කුසිනාරාවට පැමිණෙන නූතන අමුත්තන්, නගරය වටා ඇති පස් සැලකිය යුතු තරම් තද හෝ නිසරු නොවන බව හෝ උතුරු යූපි UP හි වෙනත් ඕනෑම තැනකට වඩා වැඩි නොවන බවත්, සැබැවින්ම එය සාරවත් සහ ඵලදායී බවත් නිරීක්ෂණය කරනු ඇත. මේ අනුව, කුසිනාරාවේ උජ්ජඞගල බලකොටුවල

[16] Vin.III,81 mentions a *kuḍḍa* of burnt brick for a monastery being built.

භාවිතා වූ බවට සඳහන් වන්නේ පීඩනයට පත් කළ පස් හෝ මඩ බවයි. ඒ හා සමානවම, සාඛ *sākha* යනුවෙන් විස්තර වන්නේ කටු සහිත පඳුරුවල අතු කපා ආරක්ෂක අරමුණු සඳහා භාවිත කිරීම [17] හෝ විකල්පීය වශයෙන් පීඩනයට පත් කළ පස්වලින් නිම කළ බලකොටු මත ආරක්ෂාව සඳහාවූ උල් ඉනි පෙළක් ඇදීම විස්තර කිරීමටය.

මෙම අර්ථනිරූපනය නිවැරදි නම්, එකල මහා නගර සමග ආනන්ද හිමියන් කළ සැසඳීමට අනුව, එය මූලික හෝ යල්පිනූ ආරක්ෂා ක්‍රම සහිත කුඩා ස්ථානයක් වීම, ප්‍රධාන නගරවල වඩාත් ආකර්ෂණීය සහ සැලකිය යුතු තරම් ගල් සහ මඩ ගඩොල්වලින් යුක්ත වූ බවයි. ආනන්ද හිමියන් පැහැදිලිව සඳහන් කළ පරිදි, උන්වහන්සේගේ තැවුල වූයේ, බුදුපියාණන් වහන්සේට ගැලපෙන අවමගුල් උත්සවයක් සූදානම් කිරීම සඳහා ප්‍රමාණවත් ධනවත් පිරිසක් කුසිනාරාවේ නොසිටීම මිස, එම නගරය කාලකණ්ණි හෝ අවාසනාවන්ත ස්ථානයක් නොවන බවයි.

බුදුපියාණන් වහන්සේ කුසිනාරාවට වැඩම කළ විට, සාමාන්‍යයෙන් උන්වහන්සේ වැඩ සිටියේ බාලිහරණ, හෙවත් Wood of Oblation යේය. සමහර විට, මලල රජදරුවන් පූජනීය ලෙස සලකමින් පූජා තැබූ, වෘක්ෂ උයන්වත්තකය.[18] උන්වහන්සේ නතරවූ තවත් ස්ථානයක් නම්, උපවත්තනයි, එය සල් වෘක්ෂ උයන්වත්තකි (ෂොරෙයා රොබුස්ටා). එම ස්ථාන දෙකම ප්‍රකට ඒවා වේ. එයට හේතුව ඒවායේ ප්‍රමාණය සහ පෙනෙන ආකාරයට, එකනෙකට සමීපව තිබීමයි. [19] බුදුපියාණන් වහන්සේ පරිනිර්වාණයට පත්වූයේ මේ වෘක්ෂ දෙක යටයි. කුසිනාරා අසල පිහිටා ඇති බව සඳහන් කරන තවත් ස්ථානයක් වූයේ බුදුපියාණන් වහන්සේගේ ශ්‍රී දේහය ආදාහනය සඳහා රැගෙන ගිය මකුට බන්දන සිද්ධස්ථානයයි.[20]

19 වන ශතවර්ෂයේ අග භාගයේ සිට බුදුපියාණන් වහන්සේගේ පරිනිර්වාණය ආශ්‍රිත ස්ථාන, ඒ වටා ගොඩනැගුණු ආරාම, සහ ආදාහනය කරන ලද ස්ථානයේ ස්තූපවල පුරාවිද්‍යා කැණීම් කිහිපයක් සිදු කර ඇත. කෙසේ නමුත්, මෙතෙක් කුසිනාරාවේ සැබෑ නගරය සොයා ගැනීමට සහ කැණීමට කිසිදු උත්සාහයක් ගෙන නැත. මෙය සිදු කිරීම අනාගතයේදී වැඩියෙන්ම දුෂ්කර වනු ඇත.

**මධුරා**

දැන් මථුර ලෙස අක්ෂර වින්‍යාසය කෙරෙන මෙම නගරය, සුරසේනගේ රාජධානියේ අගනුවර වේ. බුදුපියාණන් වහන්සේ බටහිර දුරතම මෙතෙක්

---

[17] Vin.II,154; Ja. I,240.
[18] A.I,274: V,79.
[19] Ud.37; D.II,137.
[20] D.II,163.

වැඩම කළ ප්‍රදේශය එයින් නියෝජනය වන අතර, තවමත් එතැන හඳුනා ගත හැකිය. උන්වහන්සේ එතැනට වැඩම කළේ එක් වරක් පමණි. එයට හේතුව, එය මජ්ක්ධිම දේශයේ බටහිර මායිමෙන් ඔබ්බෙන් වූ නිසා විය හැකිය. එසේම, එම ස්ථානය පිළිබඳව උන්වහන්සේ තුළ තිබූයේ දුර්වල හැඟීමකි. එම ස්ථානය, දූවිලි සහිත, දරුණු සුනඛයන්ගෙන් සහ අනර්ථකාමී ආත්මයන්ගෙන් පිරී තිබුණු නිසාත්, සමතලා නැති වීදි සහ එහි වැසියන් සම්මිශ්‍රණය කළ දාන පිළිගැන්වූ බව උන්වහන්සේ පැමිණිලි කළහ. [21]

බුදුපියාණන් වහන්සේ මධුරා හි සිට ආපසු වේරඤ්ජා දක්වා යන ගමනේදී ප්‍රධාන මාර්ගයේදී උන්වහන්සේට පිරිමි සහ ගැහැණු කණ්ඩායමක් හමුවිය. උන්වහන්සේ ඔවුන්ට පාර දෙපස ගසක් පාමුල වාඩිවී[22] විවාහමය සම්බන්ධතා පිළිබඳව දේශනාවක් කළහ. නගරයට වැඩි අනෙක් එකම භික්ෂුව වූයේ මහා කච්චාන මහරහතන් වහන්සේය. බුදුපියාණන් වහන්සේගේ කාලයේ නගරයට වැඩම කළ අනෙක් එකම භික්ෂුව මහා කච්චාන නම් රජතුමා සමග කුල විෂය ගැන සාකච්ඡා කරද්දී බ්‍රාහ්මණයන් වෙනුවෙන් පෙනී සිට, ඔවුන්ට ගෞරව නොකරන බවට ඔහුට නින්දා කළ තවත් බ්‍රාහ්මණයෙකු සමග තවත් පුද්ගලයෙකු සිටියේය.[23]

පසුකාලීන ශතවර්ෂවලදී මධුරා බුදුදහම සහ ජෛන ආගම සම්බන්ධ ප්‍රධාන මධ්‍යස්ථානයක් බවට පත්විය. දහනවවන ශතවර්ෂයේ සිට වර්තමානය දක්වා ආගම් දෙකෙහිම පුරාවස්තු නගරය අවට ඇති විවිධ පැරණි ස්ථානවලින් සොයාගෙන ඇත.

## පාඨලිගාම

මෙම ගම්මානය ගංගානම් ගඟේ දකුණු ඉවුරේ පිහිටා තිබූ අතර, මගධ සහ වජ්ජි අතර ප්‍රධාන හරස් ස්ථානය විය. ඒ නිසා, එය වැදගත් වෙළඳ මධ්‍යස්ථානයක් සහ රේගු මුරපොළක් ද වන්නට ඇත. එහි නමේ අර්ථය වන්නේ පාඨලි ගසේ (පාඨලි) ගම්මානය (ගාම) යන්නයි. *Sterospermum chelonoides* යනු, සුවඳවත්, ලා දම් පැහැ මල් සහිත, පොදු, මධ්‍යම ප්‍රමාණයේ ගසකි.[24] බුදුපියාණන් වහන්සේගේ අවසන් ගමනේදී ඒ පිළිබඳව කුතුහලය දනවන අනාවැකියක් පළ කළහ: ''ආර්ය රාජධානිය පවතින තාක් කල්, පාඨලිපුත්ත ප්‍රධාන නගරයක් වනු ඇත. එහි වෙළෙන්දෝ දුර ඇතින් ගෙන ආ පෙට්ටි විවෘත කරති. නමුත් නගරය තර්ජන තුනකට මුහුණ දෙනු ඇත. ඒ ගින්නෙන්, ගංවතුරෙන්, සහ අභ්‍යන්තර භේදවලින් ය.''[25] මෙම ප්‍රකාශයේ කොටසක් අනාවැකියේ වැකිකඩක් වූ *puṭa bhedana* යේ සහභාගි

[21] A.III,256.
[22] A.II,57.
[23] M.II,83; A.I,67.
[24] See Schlingloff's comments of on the name, p.44
[25] D.II,87-88.

වන්නන් විය හැකිය. එයින් අදහස් කරන්නේ පෙට්ටියක්, ලොකු වේවැල් හෝ ලෑලි පෙට්ටියක් හෝ බහාලුමක් විවෘතව කිරීම හෝ ගසක බීජ කරල විවෘත වීම යනාදිය අදහස් කරන්නට ඇත. පාඨලි ගසේ බීජ කරල් සෙන්ටි මීටර් 30 සිට 60 අතර, හැඩයෙන් සිලින්ඩරාකාර, රැලි ගැසුණු, සහ වේළුණු විට ඉරී තැළෙන හෝ එහි බීජ මුදා හැරීම සඳහා පැළීම සිදු වේ. බුදුපියාණන් වහන්සේගේ අනාවැකියේ දෙවන කොටස සඳහා, 1905දී පැරණි නගරයේ භූමිය පිළිබඳ පුරාවිද්‍යාත්මක පරීක්ෂණයකින් හෙළි වූයේ අනෙක් දේවල් අතර, මීටර් තුනකට ආසන්න රොන් මඩ තට්ටුවක්, ඊට ඉහළින් ඝන අළු තට්ටුවක් ඇති බවත්, එයින් පෙන්නුම් කළේ නගරය අවම වශයෙන් මහා විපත්තිදායක ගංවතුරක්, සමහර විට බොහෝ සහ ප්‍රබල ලැව් ගින්නක් අත්විඳින්න ඇති බවයි.[26]

බුදුපියාණන් වහන්සේ උතුරු දෙසට ගමන් කිරීම සඳහා ගමෙන් පිටත්ව යන විට, එහි පුරවැසියෝ උන්වහන්සේ පිටත්වූ වම් දොරටුව ගෞතම දොරටුව ලෙසද උන්වහන්සේ තරණය කළ ගඟ ගෞතම තොටුපළ යනුවෙන් ද නම් කළහ. ශතවර්ෂ එකහමාරකට පමණ පසු, පාඨලිගම විශාල නගරයක් දක්වා වර්ධනය වූවා පමණක් නොව, බලසම්පන්න මෞර්ය අධිරාජ්‍යයේ නගරය බවට පත් විය. අශෝක රජතුමා එහිදී තුන්වන ධර්ම සංගායනාව කැඳවූ අතර, මේ සඳහා පූර්වාදර්ශයක් වූයේ අශෝක රජුගේ සීයා වූ චන්ද්‍රගුප්ත රජුගේ පාලන සමයේදී නගරයේ පැවත් වූ ජෛන සභාවයි. බොහෝ කාලයක් පාඨලිපුත්තහි ජීවත් වූ මෙගස්ථනයේ ග්‍රීක තානාපති ඒ පිළිබඳව සවිස්තරාත්මක විස්තරයක් ඉදිරිපත් කළේය. නූතන නගරය වන පැට්නා ඉදිවී ඇත්තේ පැරණි භූමිය පුරාය.

**රාජගහ**

රජුගේ වාසස්ථානය වන රාජගහ යනු එකල වඩාත්ම බලවත් රාජධානිය වූ මගධයේ විශාලතම නගරයයි. එය ගිරිබ්‍රාජ සහ කඳුකරයේ කොටුව Hill Fort යන නමින් හැඳින්වූ අතර, දැන් රාජ්ගිර් යනුවෙන් හැඳින් වේ. සම්ප්‍රදායට අනුව, මෙම නගරය සකස් කරනු ලැබුවේ අර්ධ-ගුඨවාදී ගෘහ නිර්මාණ ශිල්පී සහ නගර සැලසුම්කරු මහා ගොවින්ද විසිනි.[27] පස්වන ශතවර්ෂයේදී ඝන සහ වඩා කොළ පැහැති ආවරණයක් තිබෙන්නට ඇති නමුත්, එහි සියලු පැති බොහෝ ගැඹුරු සමතලා නොවූ කඳුවලින් වටවී ඇති අතර, අද වන විට එය මිටි ගස් සහ කටු සහිත උණබම්බු ලැහැබ්වලින් ආවරණය වී ඇත. බුදුපියාණන් වහන්සේ සඳහන් කළ නගරය තුළ සහ වටා තිබෙන බොහෝ ස්ථාන තවමත් හඳුනාගන්නට තිබේ - වැරදිකරුවූ කොල්ලකරුවන් හෙළා දැමූ කොල්ලකරුවන්ගේ තද බෑවුම Robbers Cliff, ජීවකගේ අඹ උයන, පළමු ධර්ම සංගායනාව පැවැත්වූ

---

[26] D. B. Spooner, *Annual Report of the Archaeological Survey of India*,1905-1906; 'Mr. Ratan Tata's Excavations at Pataliputra', *Archaeological Survey of India Annual Report, 1912–13*, 1916.) A. S. Altekar and V. Mishra, *Report on the Kumrahar Excavations, 1951-55*, 1959.
[27] Mv.III,208-209.

සතපණ්ණ ගුහාව, සමහර විට භික්ෂූන් ශීතල උදෑසන ජල ස්නානය කළ උණු දිය උල්පත්, බුදුපියාණන් වහන්සේ නගරයට ගිය විට නතරවීමට බොහෝ කැමැත්තක් දැක්වූ ගිජ්ජකූට නම් තටු හකුළා ගත් ගිජුලිහිණියෙකු පිළිබිඹු කෙරෙන කන්ද, සහ නගරයේ උතුරු දොරටුවට ස්වල්පයක් ඔබ්බෙන් පිහිටි රාජකීය උද්‍යානයක් වූ වේළුවන උයන ආදියයි. සුන්දර වටාපිටා සහ මිහිරි ජලය තිබූ, මොග්ගල්ලාන මහරහතන් වහන්සේ අගය කළ තපෝදාරාම දැන් හින්දු කෝවිලක් තුළ පොදු ස්නානය කරන ස්ථානයකි.[28] රාජගහේ සිත් ඇදගන්නාසුලු බිත්ති, ඒවායේ නටබුන් තවමත් දැකගත හැකිය. කඳු මුඳුන හරහා සුළඟ හමයි. නගරයේ දොරටු සෑම රාත්‍රියකම වසන බව අපට දැනගන්නට ලැබුණි. [29]

ගෞතමයන් වහන්සේ අභිනිෂ්ක්‍රමණය කළ පසු වැඩම කළ පළමු ස්ථානය වශයෙන් අපට දැනගන්නට ඇත්තේ නගරය වටා ඇති කඳුවලින් එකක් වූ පණ්ඩව පාමුළ බවයි.[30] බොහෝ විට උන්වහන්සේ එහි වැඩම කර ඇත්තේ උද්‍යානවල, ගුහාවල සහ නගරය වටකර ගත්, පර්වතවල නිවහන්වල වෙසෙන ශ්‍රමණයන් සමග සබඳතා පවත්වා ගැනීම පිණිසයි. ශ්‍රමණයන් රාජගහ වෙත ආකර්ෂණය වී ඇත්තේ එය හුදෙක් බලවත් මධ්‍යස්ථානයක් නිසා නොව, නමුත්, බුද්ධිමතුන් සහ ආගමික ගුණවගාවෙන් යුක්ත පුද්ගලයන් ජීවත්වූ ප්‍රදේශයක් නිසාය. විශාල ජනගහනයකින් අදහස් කළ තවත් දෙයක් වනුයේ දානය අඛණ්ඩව ලැබීම හෝ අනුග්‍රහය ලැබීම සහතික කිරීමයි. ගෞතමයන් වහන්සේ එහි පැමිණීමට පෙරත්, රාජගහ ජෛන ක්‍රියා සම්බන්ධයෙන් මධ්‍යස්ථානයක් විය. මහාවීර එහි වර්ෂා ඍතු දහහතරක් නගරය වටා සහ නාළන්දාවට සමීපව ගත කර ඇති බව කියැවේ.[31] එකල මගධයේ රජු වූ බිම්බිසාර, බුදුපියාණන් වහන්සේ සමග සුහද සම්බන්ධතාවක් රැකගෙන සිටියේය. මුල්කාලීන සම්ප්‍රදායට අනුව, ඔහු බෞද්ධයෙකු වූ බවට කීවත්, ජෛන ධර්ම ග්‍රන්ථවලට අනුව, ඔවුන්ද එසේ කියා ඇත. බිම්බිසාර රජු සියලු කුලවලට අනුග්‍රහ දක්වන්නට ඇති බවත් ඒ සෑම දෙනාම ඔහු ඔවුන්ගේ යැයි කියන්නටත් ඉඩ ඇත. මෙයට බෞද්ධයන් ද ඇතුළත් වේ. ත්‍රිපිටකයේ බුදුපියාණන් වහන්සේ සහ කෝසලයේ පසේනදී රජු අතර ඇතිවූ විවිධ සාකච්ඡා පිළිබඳව සටහන්වීම වැදගත් වන අතර, බුදුපියාණන් වහන්සේ සහ බිම්බිසාර රජු අතර එවැනි කිසිවක් නැත. බුදුපියාණන් වහන්සේ රාජගහ නුවරට විවිධ අවස්ථාවල වැඩම කළහ, එනම්, වර්ෂා ඍතුවලදී තුන්වැන්න, හතරවැන්න. දහත්වැන්න සහ දාහතරවැන්න යි. උන්වහන්සේගේ පරිනිර්වාණයට මාස දොළොසක් ප්‍රථමව, උන්වහන්සේ රාජගහ නුවර සිට අවසාන ගමන ආරම්භ කළහ.

**සාකෙත**

---

[28] Vin.III,108.
[29] Vin.IV.117.
[30] Sn.417
[31] Jain, p.344-349.

දකුණු සාවත්ථියේ සිට ඍජු සහ කරුණු සලකා බලන විට ඇද නැති මාවතක් වන්නේ සාකෙතයි. එය නිශ්චිතවම කිව නොහැකි වුවද, අයොජ්ඣා[32] සාකෙත සඳහා විකල්ප නමක් හෝ ඒවා නූතන අයොධ්‍යා සහ ෆයිසබද් තිබෙන ආකාරයට එකිනෙකට යාව තිබූ නගර දෙකක් ලෙස පෙනී යයි. විනය පිටකයේ සඳහන් ආකාරයට මෙම කාරණය පිළිබඳව ව්‍යාකූල බවක් ඇති වී තිබේ, එනම් මෙම ස්ථාන දෙක අතරට පාරුවක් ක්‍රියාත්මක වූ බවයි. එයින් අදහස් කරන්නේ එම ප්‍රදේශ දෙක තිබූයේ සරභූ ගංගාවට ප්‍රතිවිරුද්ධ ඉවුරුවල බවයි. නූතනයේ එම ගංගාව හඳුන්වන්නේ සරයු සහ සමහර විට, සග්හර යනුවෙනි.[33] සාවත්ථියට පෙර, සාකෙත කෝසලයේ අගනුවර විය. මේ නගර දෙක අතර දුර ප්‍රමාණය කිලෝමීටර් අසූවක් පමණ විය. අසුපිට යන්නේ නම්, හෝ රජු සහ ඔහුගේ නිලධාරීන් අශ්වරථ හතකින් කඩින් කඩ දිනකින් ආවරණය කළ හැකිය.[34] බුදුපියාණන් වහන්සේ ඉඳහිට උන්වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශ්‍රාවකයන් කිහිප දෙනෙකු සමග සාකෙතයට වැඩියහ. උන්වහන්සේ එහි වැඩි එක් අවස්ථාවකදී ධනවත් වෙළෙන්දෙකු වූ සහ ජෛනයන්ගේ අනුශාසක, කාළක, බුදුපියාණන් වහන්සේට ඔහුගේ නිවසට දානයකට වඩින ලෙස ආරාධනය කළේය. බුදුපියාණන් වහන්සේගේ දේශනයක් අසා, මහත් සතුටට පත් ඔහු උන්වහන්සේට ඉඩමක් පූජා කර, එහි ආරාමයක් ඉදි කළේය. එය එම නගරයේ පිහිටවූ එකම ආරාමය බවට පත් විය. [35] නූතන අයොධ්‍යා හි නාගෙශ්වර්නාත් කෝවිලේ අශෝක කණුවක කොටසක්, දැන් පූජාසනයක් ලෙස භාවිත වේ. ආරාමයට ඍජුවම පිටුපස, විශාල පස් කන්දක් ඇත. නිසැකවම, එය සම්පූර්ණ ස්තූපයක නටබුන් වේ. කාළක විසින් ඉදි කරන ලද ආරාමයේ භූමිය මෙය විය හැකි නමුත්, එය සනාථ කර ගත හැක්කේ කැණීම්වලින්ම පමණක්ය.

## සාවත්ථි

බුදුපියාණන් වහන්සේ අන් කවර තැනකටත් වඩා වැඩි කාලයක් ගත කළ ස්ථානය, කොසලයේ අගනුවර වූ සාවත්ථියයි. දැන් එය උත්තර් ප්‍රදේශයේ සහෙත් මහෙත්හි විශාල නටබුන් සමගින් හඳුනාගෙන ඇත. නගරය දළ වශයෙන් අඩසඳක හැඩ ඇත. චන්ද්‍රවංකයේ අභ්‍යන්තර වංගුව හරහා අචිජිරවති ගංගාව ගලයි. රාජගහ මෙන් නොව, නගරයට ඇති ප්‍රවේශයන් ආරක්ෂා කිරීමට කඳු නොතිබුණි. ඒ නිසා, උස බලකොටු එම කාර්යය ඉටු කළේය. එක් කාලයක හෝ වෙනත් අවස්ථාවක මෙම බලකොටු යකඩ වැටක් හෝ ගඩොල් බිත්තියක් ඒ මත තිබීමෙන් ශක්තිමත් විය. බුදුපියාණන් වහන්සේගේ වැදගත්ම අනුග්‍රාහකයන් වූයේ සාවත්ථියේ - පසේනදි සහ ඔහුගේ රැජින වූ මාල්ලිකා සහ ධනවත් වෙළෙන්දෙකුවූ සුදත්ථයි. ඔහු ප්‍රසිද්ධ වූයේ අන්වර්තනාමය වූ අනාථපිණ්ඩික යනුවෙනි. එබැවින්,

---
[32] S.III,140.
[33] Vin.IV,65; 288
[34] M.I,149
[35] A.II,24.

බුදුපියාණන් වහන්සේගේ කාලයේදී වෙනත් කිසිම නගරයකට වඩා සාවත්ථියේ සහ ඒ අවට ආරාම වැඩි ප්‍රමාණයක් ගොඩ නැගීම පුදුමයක් නොවේ. ඒවා සමස්තයක් වශයෙන්, මිගාර මාතුපාසාද, පුබ්බාරාම, රාජකරාම සහ මේ සියල්ලටම වඩා නගරයේ ප්‍රධාන දොරටුවට කිලෝමීටරයක් පමණ නිරිත දෙසින් පිහිටි ජේතවනය ප්‍රසිද්ධය. බුදුපියාණන් වහන්සේගේ දේශනාවලින් ආසන්න වශයෙන් අටසියයක් පමණ දේශනා කළේ සාවත්ථියේදීය. බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ අවසාන දශක දෙකහමාර තුළ, උන්වහන්සේගේ ක්‍රියාකාරකම්වල ප්‍රධාන මධ්‍යස්ථානය ලෙස රාජගහට වඩා සාවත්ථියට ප්‍රසාදය දැක්වීම සිත්ගන්නා කරුණකි. මෙයට හේතුව වන්නට ඇත්තේ, කෝසලයේ රජු සහ රැජින බුදුපියාණන් වහන්සේට දක්වන ලද අනුග්‍රහය නිසා විය හැකිය. සමහර විට, එහි කතා කරන භාෂාව උන්වහන්සේ කතා කළ එකම භාෂාව, හෝ සමාන වන්නට ඇත. නගරය උන්වහන්සේගේ උපන් ගම වූ කපිලවත්ථුවේ සිට දින හතරක් හෝ පහක ඇවිදින දුරක් වීමේ සාධකයද එයට හේතුවක් වන්නට ඇත. තවමත්, සාවත්ථියේ විධිමත් පුරාවිද්‍යාත්මක පරීක්ෂණයක් සිදු කර නැත. නමුත්, 1863දී ජේතවනය හඳුනාගත් දා සිට, එහි ප්‍රධාන කැණීම් මාලාවක් සිදු කර ඇත.

## සුංසුමාරගිරි

සුංසුමාරගිරි, හෙවත් කිඹුලා කන්ද යනු ගංගානම් ගඟේ දකුණු ඉවුරේ පිහිටා ඇති නගරයකි. වංස රාජධානියට ඒකාබද්ධ කරනතුරු, එය භග්ගා ප්‍රධාන රාජධානියේ අගනුවර විය. බුදුපියාණන් වහන්සේ එම නගරයට බොහෝ වාරයක් වැඩම කළ අතර, සාමාන්‍යයෙන් නතර වූයේ ඒ අසල වූ භෙසකලා උද්‍යානයේය. සම්ප්‍රදායට අනුව, උන්වහන්සේගේ අටවන වස්සාන ඍතුව ගත කළේ එම ස්ථානයේය. මෙම උද්‍යානයේ සිට පා ගමනින් යන දුරක උන්වහන්සේගේ වඩාත් භක්තිමත් ශ්‍රාවකයන් දෙදෙනෙකු වූ නකුලපිතා සහ නකුලමාතාගේ නිවස පිහිටා ඇත.[36] නගරයට වඩින විට වරක් උදෙන රජුගේ පුත් බෝධි කුමාරයා හමු විය. සමහර විට, භග්ගාහි ආණ්ඩුකාරවරයා බුදුපියාණන් වහන්සේට සහ උන්වහන්සේ සමග රැඳි අනෙක් භික්ෂූන්ට ළඟදී නිමැවූ ඔහුගේ මාලිගයට දානයකට ආරාධනය කළේය.[37] මහාවීර සුංසුමාරගිරියට කිහිප වරක් ගිය අතර, ඔහුගේ දොළොස්වන වැසි ඍතුව එහි ගත කළේය. සුංසුමාරගිරිය වරනාසි සිට ගංගානම් ගඟේ සිට කිලෝමීටර් විස්සක් පමණ දුරින් චුනාර් සමග හඳුනාගෙන ඇත. කඳු මුඳුනේ දැන් පිහිටා ඇති ආකර්ෂණීය බලකොටුව පිළිබඳව ප්‍රසිද්ධ වේ.

## උක්කාචෙලා

පාඨලිගාමයේ ඇති ගංගානම් ගඟ තරණය කරන අය වජ්ජියානු

[36] E.g. A. II,61; S.II,1.
[37] M.II, 91.

සන්ධානයේ මායිම සහ රේගු මුරපොළ වන උක්කාවෙලා වෙත පැමිණෙනු ඇත. බුදුපියාණන් වහන්සේ රටේ මේ කොටසේ සංචාරය කරන විට, මෙම නගරය හරහා බොහෝ වාරයක් පසු කරන්නට ඇත. නමුත්, උන්වහන්සේ එහිදී කළ දේශනාවලින් ත්‍රිපිටකයේ සඳහන් වන්නේ එකක් පමණි. එහි දී, සමහර විට, උචිත ලෙස, වැසි සෘතුවේදී අවසාන මාසයේ ගඟ සම්පූර්ණයෙන්ම ගංවතුරෙන් යටවන විට, තොටක් නොමැති සුවිදෙහා නමැති ස්ථානයකින් ගොපල්ලෙකු තමන්ගේ ගවයන් ගංගා තීරයෙන් දක්කාගෙන ගිය බව බුදුපියාණන් වහන්සේ සඳහන් කළහ. ගවයෝ ගඟ මැදදී එක පොදියට ගුලි ගැහී දියේ ගිලී මිය ගියහ. උන්වහන්සේ මේ කාරණය පෙන්වා දුන්නේ මේ ලෝකය ගැන හෝ ඊළඟ ලෝකය ගැන, මරණය ආදියේ විෂය පථය කුමක්ද යනාදිය පිළිබඳව කිසිවක් නොදන්නා ගුරුවරුන් කෙරෙහි සවන් දීමෙන් හෝ විශ්වාස කිරීමෙන් එකී පුද්ගලයාට මහත් විපතක් ගෙන දීමෙන් අවසන් වන බවයි.[38] නූතන හජ්ජිපූර් නගරය පැරණි නගරයේ ස්ථානයක් ලෙස හඳුනාගෙන ඇත. පසුකාලීන සම්ප්‍රදායට අනුව, ආනන්ද හිමියන් පරිනිර්වාණයට පත් වූ පසු, උන්වහන්සේගේ භෂ්මාවශේෂ උක්කාවෙලාවේ ගොඩනගන ලද ස්තූපයක තැන්පත් කළ බව පසුකාලීන සම්ප්‍රදායේ සඳහන් වේ. එම නෂ්ටාවශේෂ රම්භද්‍ර දිස්ත්‍රික්කයේ හජ්ජිපුරයෙන් සොයා ගත හැකිය.

## වෙරඤ්ජා

වෙරඤ්ජා විශාල නගරයකි. සම්ප්‍රදායට අනුව උන්වහන්සේගේ දොළොස්වන වැසි සෘතුව මෙහි ගත කර ඇත. නමුත් උන්වහන්සේ වෙනත් බොහෝ අවස්ථාවන්හි එහි වැඩම කරන්නට ඇත.[39] බුදුපියාණන් වහන්සේගේ ඉගැන්වීම් සඳහාවූ සංචාර බොහොමයකදී තවත් දුර ප්‍රමාණයකට නගරය පිළිබඳව වාර්තා විය. ඊට ඔබ්බෙන් උන්වහන්සේ වැඩම කළේ මධුරාවලට එක් වතාවක් පමණි. උන්වහන්සේ වෙරඤ්ජාවල වැඩ සිටින විට, වරක් එම දිස්ත්‍රික්කයේ සාගතයක් තිබුණි. සමහර විට, නගර සභාව, සමාජ හෝ ප්‍රාදේශීය පරිත්‍යාගශීලීන් විසින් ආහාර සලාක නිකුත් කරන ලදී. බුදුපියාණන් වහන්සේ සහ අනෙක් භික්ෂූහු, අශ්වයන් වෙළෙඳාම් කරන්නන් ලබා දුන් ධාන්‍ය ආහාරයට ගැනීම අඩු කළහ. ඔවුන් සාමාන්‍යයෙන් ඒවා දුන්නේ සතුන්ටය. ඒවා ආහාරයට ගැනීමට පෙර, තම්බා ඊට පසු වංගෙඩියක කොටා ගත යුතුයි. එවැනි අවුළුපත් ආහාරයට ගැනීම පිළිබඳව බුදුපියාණන් වහන්සේ භික්ෂූන් ඇගයූහ. එවැනි ආහාර ගැනීමට අප්‍රිය කරන්නට ඉඩ ඇති අනාගත පරම්පරාවන්ට යහපත් ආදර්ශයක් සපයා ඇති බව බුදුපියාණන් වහන්සේ පැවසූහ.[40] එටා සිට කිලෝ මීටර් දහතුනක් උතුරින් අත්‍රන්ජි ඛෙර හි ඇති විශාල පස්කන්දක්

[38] M.I,225.
[39] A.IV; IV, 197-198.
[40] Vin.III,6.

සමග වෙරඤ්ජා හඳුනාගත හැකිය.[41]

## වෙසාලි

කොසලයට නැගෙනහිරෙන් සහ ගන්දක් ගඟෙන් බෙදී ගිය වජ්ජියානු සන්ධානය කුඩා ප්‍රධාන ප්‍රාන්ත අටකින් සමන්විත විය. මෙම සන්ධානය ඔවුන්ගෙන් බටහිරට තිබෙන කොසලය සහ දකුණට තිබෙන ඔවුන්ගේ විශාලතම අසල්වැසියාවන මගධයෙන්ද ආරක්ෂාවීමට එක්සත් වූහ. මෙම සැලසුමේ ප්‍රමුඛ ගෝත්‍රිකයන් වූයේ ලිච්ඡවීන් සහ විදෙහාසයන්ය. ලිච්ඡවීන්ගේ ප්‍රධාන නගරය වූ වේසාලීය සන්ධානයේ දේශපාලනමය සහ පරිපාලනමය අගනුවර ලෙස ක්‍රියා කළේය. නගරය සහ ඒ අවට විවිධාකාර සිද්ධස්ථාන තිබුණි. ඒවා සාරනන්ද සහ චාපාල අනෙක් සිද්ධස්ථානයි. භහුපත්ත, ගොතමක, උදෙන සහ සත්තම්බක යන සිද්ධස්ථාන නගරය වටා ඇති ප්‍රධාන ස්ථාන හතරේ ඇත. සමහර විට එහි බිත්තිවලට ස්වල්පයක් ඔබ්බෙන් තිබිය හැකිය.[42] මෙම සිද්ධස්ථානවලින් එකක හෝ තවත් එකක බොහෝ විට බුදුපියාණන් වහන්සේ එක් දිනක තාවකාලිකව නවාතැන් ගත් බව ත්‍රිපිටකයේ සඳහන් වේ. කෙසේ නමුත්, උන්වහන්සේ වෙසාලියට වැඩම කළ විට නතර වන්නට වඩා ප්‍රිය වූයේ කූටාගාරසාලාවේය. Peaked Roofed Hall වේ, මහාවාන අද්දර නගරයේ උතුරු උප නගරයෙන් ඔබ්බෙන්, හිමාලයේ පාමුළ දක්වා සම්පූර්ණයෙන්ම නොබිඳුණු විහිදුණු විශාල වනාන්තරය යනාදි ස්ථානයි.[43] මෙම ශාලාව නගරයට පහසුවෙන් පාගමනින් යා හැකි දුරක තිබෙන්නට ඇත. බුදුපියාණන් වහන්සේ සමහර විට එතැන් සිට නගරයේ සමහර ස්ථාන කරා සක්මන් කරන්නට ඇත.[44] ඒ අසල ගිලන්හලක් තිබූ අතර, ඉඳ හිට බුදුපියාණන් වහන්සේ එහි රැඳී සිටි රෝගීන් බැලීමට ගියහ.[45] බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ සිදුවීමට ආසන්න පරිනිර්වාණය පිළිබඳව ඒ අවස්ථාවේ සිට මාස තුනකින් සිදුවන බව ප්‍රකාශ කළේ කූටාගාරසාලාවේ සිටය.[46] උන්වහන්සේ කූටාගාරසාලාවට වැඩි කැමැත්තක් දැක්වූයේ එය නිරන්තරව උන්වහන්සේ හමුවීමට පැමිණෙන මිනිසුන්ගේ ගලා ඒම බුද්ධත්වයට පත්වූ පුද්ගලයෙකුට පවා ටික වේලාවකට පසු ඇති වෙන වෙහෙසකර බවින් විවේකයක් ලැබෙන නිසාය.

බුදුපියාණන් වහන්සේට වෙසාලිය කෙරෙහි විශේෂ සෙනෙහසක් තිබූ බවත්, ඔවුන්ද උන්වහන්සේට එසේ බවට ත්‍රිපිටකයෙන් පෙනේ. වරක් බුදුපියාණන් වහන්සේ ආනන්ද හිමියන් සමග නිශ්ශබ්ද දිනයක් නගරයේ සිද්ධස්ථානයේ ගත කරන විට, උන්වහන්සේ එහි බොහෝ කැපී පෙනෙන දේ පිළිබඳව උන්වහන්සේගේ ඇගයීම ප්‍රකාශ කළහ. බුදුපියාණන් වහන්සේ

[41] Sarao, p.103.
[42] D.II,117 ff; III,9.
[43] E.g. A. II,191; V,86; D. I,150; M. II,252; S. I,230.
[44] A.III,167; IV,308; D.II,102; S.V,258.
[45] A.III,142; S.IV,210.
[46] D.II,120.

උන්වහන්සේගේ අවසාන ගමන සඳහා වේසාලියෙන් පිටත්වන විට, ඒ දෙස නැවත හැරී බලා භාවනානුයෝගී ලෙස පැවසුවේ උන්වහන්සේ එය දකින අවසාන අවස්ථාව මෙය බවයි. [47]

තවත් අවස්ථාවක බුදුපියාණන් වහන්සේ එක් දිනක් මහාවනා වේ ගත කරමින් සිටියදී, දඩයමේ ගිය ලිච්ඡවී තරුණයෝ පිරිසක් උන්වහන්සේ දැක. ඔවුහු ඔවුන්ගේ දුනු ලිහා දැමූහ. ඔවුන්ගේ සුනඛයන්ට ඇලවෙන මෙන් අණ කළහ. බුදුපියාණන් වහන්සේට ආචාර කර උන්වහන්සේ දෙස බලමින් නිශ්ශබ්දව සිට ගත්හ. නගරවැසියෙකු මෙය දැක බුදුපියාණන් වහන්සේට ඔහුගේ පුදුමය පළ කළේය. මෙම තරුණයන්, සාමාන්‍යයෙන් නරක හැසිරීම්වලින් යුක්ත කලහකාරී පුද්ගලයන් වශයෙන් මෙතරම් ගෞරවනීය සහ නිශ්ශබ්ද වීම ඔහුට මහත් පුදුමයකි.[48] බුදුපියාණන් වහන්සේ ලිච්ඡවීන්ට ඔවුන්ගේ සරල සහ සෞඛ්‍යමත්, සම්පූර්ණයෙන්ම අල්පේච්ඡ පුරුදු - කොට්ට වෙනුවට ලී කැබැලි භාවිතය, දුෂ්කර ඇඳන් මත සැතපීම, හිරු උදාවට පෙර අවදි වීම, සහ කායික වශයෙන් ක්‍රියාශීලී වීම පිළිබඳව වර්ණනා කළහ. එවැනි පුරුදු පවත්වා ගෙන යන තාක් කල්, ඔවුන් කිසි විටකත්, ආක්‍රමණිකයෙකුට ගොදුරු නොවන බව බුදුපියාණන් වහන්සේ පැවසූහ.[49] වජ්ජිවරුන්ට ඔවුන්ගේ ස්වාධීනත්වය පවත්වා ගැනීමට හැකිවනු ඇතැයි බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ බලාපොරොත්තුව ප්‍රකාශ කළ අවස්ථා දෙකෙන් මෙය එක් අවස්ථාවකි.

ජෛන මූලාශ්‍ර බොහොමයකට අනුව, මහාවීර ඉපදී ඇත්තේ වේසාලියේදීය. ඔහු බොහෝ අවස්ථාවල එහි ගොස් ඇත. අනෙක් ජෛන මූලාශ්‍ර පවසා ඇත්තේ ඔහු ඉපදී ඇත්තේ පාවාවල බවයි.

ශතවර්ෂ ගණනාවක් මුළුල්ලේ බොහෝ වාරයක් අසල පිහිටි ගන්දක් ගඟෙන් ප්‍රදේශය ජලයෙන් යටවී ඇති බැවින් අද දැකිය හැක්කේ වේසාලියේ නටබුන් ස්වල්පයක් පමණි. කෙසේ වෙතත්, බුදුපියාණන් වහන්සේගේ භෂ්මාවශේෂවලින් ලිච්ඡවීන්ගේ කොටස තැන්පත් කිරීම සඳහා ඉදි කරන ලද ස්තූපයේ අත්තිවාරම 1958දී සොයා ගෙන කැණීම් කරන ලද අතර, එය තවමත් දැකිය හැකිය. වඩා විශාල ස්තූපයක්, විවිධ කුඩා ස්තූපවලින් වටවී, ආශෝක රජුගේ යෝධ කුළුණුවලින් එකක් ද තවමත් දැකිය හැකිය. මෙම ස්තූපය අනුස්මරණය කරන්නේ කුමක් දැයි නිශ්චිතවම නොදනී. එය පසුකාලීන ශතවර්ෂවලදී අම්බපාලීගේ අඹ උද්‍යානයේ ඉදි කරන ලද භික්ෂූන්ගේ සංකීර්ණයේ කොටසක් විය හැකිය. මහාවීර වේසාලියේ වැසි සෘතු අටක් ගත කර ඇත.

---

[47] D.II, 102; II,122.

[48] A.III,75-76.
[49] S.II,268.

# උපග්‍රන්ථ II
# බුදුපියාණන් වහන්සේ සහ උපනිෂද්

කර්මය සහ ඒ හා සම්බන්ධ නැවත ඉපදීමේ සංකල්පය බුදුදහමේ ප්‍රධාන ධර්ම දෙකක් වේ. නමුත්, බෞද්ධයන් මෙන්ම බෞද්ධ නොවන අය අතරද එය වඩාත්ම වරදවා වටහාගෙන ඇත. මෙම වරදවා වටහාගැනීම්වලින් වඩාත් පුළුල්ව ව්‍යාප්ත වී ඇත්තේ කර්මය සහ නැවත ඉපදීම පැරණි ඉන්දියාවේ විශ්වීය වශයෙන් විශ්වාස කළ අතර, බුදුපියාණන් වහන්සේ ඒවා හුදෙක් සරලව උන්වහන්සේගේ ධර්මය තුළට ඇතුළත් කර ගත් බවයි. සුපුරුදු ප්‍රකාශය නම්, උන්වහන්සේ මෙම ධර්ම උපනිෂද්වලින් අනුකරණය කළ බවයි. මෙම උපකල්ප යන් දෙකම ගැටලු සහගතය. සාක්ෂි ඒවාට සහාය නොදක්වන බව පෙනී යාම පමණක් නොව, ඒවා බුදුපියාණන් වහන්සේගේ ධර්මය උන්වහන්සේගේ පෞද්ගලික අවබෝධයේ ප්‍රතිඵලයක් යැයි ප්‍රකාශ කිරීම පිළිබඳව සැක මතු කරයි. මෙම එක් එක් උපකල්ප යන් අනුගමනය කරන්නේ කුමක්ද යන්න පරීක්ෂා කරනු ඇත.

ක්‍රි. පූ. පස්වන ශතවර්ෂයේදී කර්මය සහ නැවත ඉපදීම පුළුල් ලෙස පිළිනොගත් බවට ත්‍රිපිටකයෙන් සැහෙන සාක්ෂි සපයයි. උදාහරණ වශයෙන්, සාමඤ්ඤඵල සූත්‍රය බුදුපියාණන් වහන්සේගේ කාලයේ ප්‍රමුඛ පෙළේ ගුරුවරුන් හය දෙනෙකුගේ ධර්ම පිළිබඳ සාමාන්‍ය අදහසක් ලබා දෙයි. ඒවායෙන් එක් අයෙකු පමණක් කර්ම ස්වරූපයක් උගන්වා ඇත.[1] ඒ හා සමානවම, කර්මය සහ නැවත ඉපදීම ප්‍රතික්ෂේප කළ අයගේ බෞද්ධ සහ ජෛන ධර්ම ග්‍රන්ථවල නිතර විවේචන සඳහන් වේ. උදාහරණ වශයෙන්, ජනප්‍රිය ගුරුවරයෙකු වූ මක්ඛලි ගොසාල ඉගැන්වූයේ, ''කර්මයක් නැත, ක්‍රියාවක් නැත, උත්සාහයක් (දැරීමේ තේරුමක් නැත.)''[2] බුදුපියාණන් වහන්සේ අසත්‍ය යැයි සැලකූ අසත්‍ය විශ්වාසයන් කිහිපයක් සඳහන් කළ අතර, ඉන් එකක් වන්නේ සිදුවන හැම දෙයක්ම උත්තරීතර දෙවිකෙනෙකුගේ කැමැත්ත නිසා වන බවයි. අනෙක, ඒවාට ප්‍රත්‍යක්ෂ හේතුවක් නොමැති බවයි.[3] සමහර ගුරුවරු කර්මය සහ නැවත ඉපදීම සාපේක්ෂව නව සහ සාම්ප්‍රදායික නොවන අදහස් ලෙස ඒවා ප්‍රතික්ෂේප කළහ. තවත් අය, පායාසි කුමරු වැනි අය ඒවා තාර්කික හේතූන් මත ප්‍රතික්ෂේප කළහ. ඔවුන්ට පාදක කොට කටයුතු කරන සාක්ෂි නොමැති බව දකිමින්, මෙම උගත්, සැකයෙන් යුක්ත පුද්ගලයා නිගමනය කළේ: ''වෙනත් ලෝක නැත, ඕපපාතිකව උපදින සත්ත්වයන් නැත, යහපත් හෝ අයහපත් ක්‍රියාවල කිසිම පලයක් හෝ ප්‍රතිඵලයක් නැත.''[4]

බ්‍රාහ්මණ ආගමේ සහ පසුකාලීන හින්දු ආගමේ පැරණිතම සහ මූලික ධර්ම ග්‍රන්ථ වන වේදයේ ද කර්මය හෝ නැවත ඉපදීම පිළිබඳ දැනුමක්

[1] D.I,52-59.
[2] A.I,286.
[3] A.I,173.

නොපෙන්වයි. කර්මය යන වචනය. සංස්කෘතයෙන් කර්ම, බොහෝ විට වේදයේ පවතින්නේ සදාචාරාත්මක හේතූන් මත පදනම් වූ හැඟීමකින් නොවේ. නමුත්, වැඩ කිරීම, හෝ විශේෂයෙන්ම වෛදික චාරිත්‍ර ඉටු කිරීම යන එහි මූලික අදහසිනි. වේදයට අනුව, පුද්ගලයෙකුගේ මරණයෙන් මතු දෛවය තීරණය වන්නේ යම් චාරිත්‍ර ඉටු කිරීමෙනි. එසේම දෙවිවරුන් විසින් සිදු කිරීමෙනි. මරණයේදී පුද්ගලයා නැවත නූපදියි, ඔහු හෝ ඇය පියවරුන්ගේ ලෝකයට (පිට්‍රලොක) යයි. මිය ගිය පුද්ගලයාගේ පුත්‍රයා විසින් පූජා (ශ්‍රද්ධ) සිදු කිරීමෙන් පසු යම් අපැහැදිලි ආකාරයේ ස්වර්ගයක ඔවුන් පෝෂණය කෙරේ. මිනිසෙකුට අවම වශයෙන් එක් හෝ පුත්‍රයෙකු බෝ කිරීම ඉතා වැදගත් වන්නේ මේ නිසාය. මෙම සංකල්පය උදාහරණ වශයෙන් ඍග්වේදයේ සඳහන් වේ. 10. 14, 2; *Taittirīya Brahmaṇa* 1.5,5,6 and *Āpastampa Dharmasūtra* 2. 24,1-7. පියවරුන්ගේ ලෝකයේ පුද්ගලයෙකුගේ තත්ත්වය රඳා පවත්නේ බිලිපූජා පැවැත්වීමෙන් ඇති කර ගන්නා කුසල් මතයි.

උපනිෂද් ගැන කුමක් කිව හැකිද? බුදුපියාණන් වහන්සේ මෙම උපනිෂද් අදහස් අනුකරණය කරන්නට, තාවකාලිකව භාවිත කරන්නට හෝ ඒවායේ ඕනෑම දෙයකින් බලපෑමක් ඇති වූයේ නම්, මෙම ග්‍රන්ථ උන්වහන්සේට පෙර තිබිය යුතුව තිබේ. එය එසේ බවට හෙළි කිරීමට කිසිසේත් පහසු නොවේ. යථාර්ථය නම්, උපනිෂද්වල දින සහ බුදුපියාණන් වහන්සේ ද ඉතාම සුභවාදීව අනුමාන ක්‍රියාවකි. මුලින්ම පැමිණියේ කුමක් ද යන්න මෙයින් ඉතා අවිනිශ්චිත කරයි. ගැටලුව තවදුරටත් සංකීර්ණ කරමින්, උපනිෂද් කිහිපයක් සමජාති වේ. බොහෝ ඒවාට ඒවායේ ආරම්භක සංයුතියෙන් පසු, සමහර විට ශතවර්ෂ ගණනාවකට පසුවත් කරුණු එකතු කර ඇත. කෙසේ වෙතත්, විද්වතුන් අතර ඇති පොදු එකඟතාවය නම්, පැරණිතම උපනිෂද් බොහෝ විට, බ්‍රහදාරණ්‍යක, ඡාන්දොග්‍ය, කෞෂීතකී සහ සමහර විට, ඓතරෙය්‍ය විය හැකිය. ඔවුහු බුදුපියාණන් වහන්සේ පූර්වගාමී, හෝ අවම තරමින්, ඔවුන්ගේ මූලික තොරතුරු බුදුපියාණන් වහන්සේට පෙර දිනයක් යොදා ඇත. තර්කය සඳහා අපි මෙය පිළිගනිමු. මෙම ග්‍රන්ථ බුදුපියාණන් වහන්සේට බලපෑමක් කළ බවට පැවසීමට පෙර දිනයක් යොදා ගැනීම හැර, කරුණු දෙකක් අවශ්‍ය වේ. 1. බුදුපියාණන් වහන්සේට ඒවා පරිහරණයට ප්‍රවේශයක් තිබිය යුතුව තිබූ අතර, 2. කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ එම සංකල්ප, හෝ මෙම අදහස් පිළිබඳ බුදුපියාණන් වහන්සේ විසින් ඉදිරිපත් කළ දෙයම හෝ හඳුනාගත හැකිවන පරිදි සමාන ලෙස ඔවුන් විසින් ඉගැන්විය යුතු වේ.

මුල් උපනිෂද්වල අභ්‍යන්තර සාක්ෂිවලින් පෙන්වන්නේ ඒවා රචනාවී ඇත්තේ ප්‍රධාන වශයෙන් මද්‍රා, මතස්‍ය, උශිනර, පඤ්චාල, කුරු, විදෙහ, කොසල සහ කාසිවල බවයි. සමහර ඒවා අනෙක් ස්ථානවලට වඩා වැඩිය. බුදුපියාණන් වහන්සේ මෙම කලාපවලින් පළමු හතරට කිසි දිනක වැඩිය බවට කිසිම සටහනක් නැත. උන්වහන්සේ කවදත් වැඩියේ කුරු සහ

විදෙහවලට යන දේශවලට පමණක් වන අතර එයද එක් වරකි.[5] උන්වහන්සේ කොසලයේ වැඩි කාලයක් ගත කළහ, අවම වශයෙන් සමහර අවස්ථාවල කාසියේ අගනුවර වූ බාරානසී අවට ද ගත කළහ. එහෙත් සිත්ගන්නා කරුණ නම්, උපනිෂද් හතර බුදුපියාණන් වහන්සේට පූර්වගාමී ලෙස සැලකුවත්, ඒ කිසිවක කොසලය පිළිබඳව සඳහනක් නැත. බ්‍රහදාරණ්‍යක සහ කෞෂීතකී කාසි පිළිබඳව සඳහන් කර ඇති නමුත්, එයද එකක් එක් වරක් පමණි. මෙයින් ප්‍රබල ලෙස ඇඟවෙන්නේ පැරණිතම උපනිෂද් උගන්වන කාලයේ එම ප්‍රදේශවල බුදුපියාණන් වහන්සේ ගත කර ඇත්තේ සුළු කාලයක් හෝ ගත කරම නොමැති බවයි.

සැලකිල්ලට ගත යුතු තවත් දෙයක් නම්, උපනිෂද් ආශ්‍රිත ගුප්ත බවයි. ඔවුන්ට පෙර පැවති වේදය වැනි උපනිෂද් ධර්ම මුල සිටම රහසක් ලෙස සලකනු ලැබුණි. ඒවා කුඩා අභ්‍යන්තර සාමාජිකයන් කණ්ඩායමක් අතර පමණක් තිබුණි. බ්‍රාහ්මණයෙකු ඉගැන්වීම රහසක් ලෙස තබාගන්නේ නම්, ඔහුට සදාකාලික ජීවිතයක් (3,7), ලැබෙන බව කඨා *Kaṭha* කියයි. ඇත්ත වශයෙන්ම එයින් කර්මය පිළිබඳ අදහස ද බැහැර කරයි. ශ්වෙතාෂ්වතර එහි ධර්මය ''උත්තරීතර රහස'' යනුවෙන් හඳුන්වන්නේ එය කිසිවිටෙක කැළඹුන, පුත්‍රයෙකුට හෝ ශිෂ්‍යයෙකුට (6,22) හෙළි නොකළ යුතු බව පවසයි. ඡාන්දොග්‍ය මෙසේ සඳහන් කරයිඃ ''පියෙකු මෙම සත්‍යයේ සූත්‍රායනය හෙළි කළ යුත්තේ ඔහුගේ වැඩිමහල් පුත්‍රයාට හෝ වටිනා ශිෂ්‍යයෙකුටය. වෙනත් කිසිවෙකුට හෙළි නොකළ යුතුයි...'' (3,11,5-6) එයට හේතුව එහි ඉගැන්වීම් රහසිගත නිසාය. (*guhya ādeśa*, 3,5,2) සැබැවින්ම, උපනිෂද් යන වචනයේ හරියටම අර්ථය 'ලඟින් වාඩිවීම' සහ එයින් අඟවන්නේ රහස්‍යභාවයයි, එනම්, ගුරුවරයා ඉගැන්වීම් පැහැදිලි කරන විට ඔහු ලඟ වාඩිවීමයි. එවිට අත්දැකීම් නොමැති අයට නොඇසීමටය. බුදුපියාණන් වහන්සේගෙන් ශතවර්ෂ ගණනාවකට පසුවද, මනුස්මෘතියේ *Manusmṛti* විස්තර කර තිබුණේ උපනිෂද් රහස්‍ය, *rahasya* හෙවත් රහසින් හෝ සැඟවුණු යන අර්ථයෙනි. [6] මෙසේ සැලකිල්ලට ගත් විට, බොහෝ බ්‍රාහ්මණයන්ගේ මතයට අනුව, ඉතාමත්ම නරක මිථ්‍යා ලබ්ධිකයා වශයෙන් සලකන ලද බුදුපියාණන් වහන්සේ උපනිෂද් ධර්ම කිසිවක් දැන සිටින්නට ඉඩ නොමැති විය හැකිය. නමුත්, උන්වහන්සේ ඒවා වරක් භාවිත කළ ස්වරූපය අසා තිබිය හැකිය.

බුදුපියාණන් වහන්සේගේ නිතරම පැවසූ දෙයක් නම් උන්වහන්සේගේ ධර්මය සියල්ලටම බවත්, උන්වහන්සේ ''ගුරු මුෂ්ටියක්'' (ආචරිය මුට්ඨි) වශයෙන් කිසිවක් ආපසු තබා නොගත් බවත් පවසා ඇත. මෙය උන්වහන්සේ අවම වශයෙන් සමහර උපනිෂද් ගැන දැන සිටි බවට සාක්ෂි ලෙස ගත හැකිය.[7] කෙසේ වෙතත්, බුදුපියාණන් වහන්සේ උන්වහන්සේගේ ධර්මය වේදයන් සමග සසඳන විට, උන්වහන්සේගේ කාලයේදී ප්‍රධාන

---

[5] M.II,74; 54.
[6] See Black, p. 101 ff.
[7] D.II,100.

වශයෙන් තිබූයේ බ්‍රාහ්මණයන්ට පමණක් විය හැකි අතර, සමහර විට දෙවන කුලයේ සමහරක් අයත් වූයේ ක්ෂත්‍රියන්ටය *kṣatriyas*. උන්වහන්සේ විස්තර කළේ වෛදික ගීතිකා පටිච්ඡන්න හෝ වැස්මක් බවයි. [8]

ඊළඟට විමසා බැලිය යුතු කරුණ නම්, උපනිෂද්, විශේෂයෙන්ම, කියනු ලබන පෙර-බෞද්ධ ඒවා, කර්මය සහ නැවත ඉපදීම හෝ ඒවායේ බෞද්ධ අනුවාදයන් වැනි දෙයක් පිළිබඳව උගන්වන්නේ දැයි යන්න පිළිබඳවයි. උපනිෂද් පශ්චාත් මරණ ඉරණම් පරාසයක් සහ ඒවායෙන් තීරණය කරන්නේ කුමක්ද යන්න ගැන උගන්වයි. නමුත්, මේවායෙන් සමහරක් ඒවා පමණක් බෞද්ධ අවබෝධයට සමාන වේ. එහෙත්, අපැහැදිලි වචනවලින් පමණි. උදාහරණ වශයෙන්, ස්වර්ගයට පිවිසෙන දොරටුව වන සඳ වෙත මියයන සියලු මිනිසුන් යන බව කෞශීතකි පවසයි. එසේ වීමට සුදුසුකම් ලැබීමට ඔවුන් ප්‍රශ්නයකට පිළිතුරු දිය යුතුයි. මෙම ප්‍රශ්නයට පිළිතුරු දෙන්නට බැරි වන අය වර්ෂාව බවට පත්වී පොළොවට පතිත වන බවත්, ඊට පසු ඔවුන් ඔවුන්ගේ කර්මයට අනුව පණුවන්, කෘමීන්, මාළු, කුරුල්ලන්, සිංහයන් හෝ මිනිසුන් බවට පත් වෙන බවත්ය. ප්‍රශ්නයට පිළිතුරු දෙන අය ස්වර්ගයට ඇතුළු වී බ්‍රහ්මයා ඉදිරියට යති. (1.2) මෙහි කර්මය යනුවෙන් අදහස් කරන්නේ සදාචාරාත්මක හේතු කාරකයද හෝ වෛදික චාරිත්‍ර නිසියාකාරව ඉටු කිරීමද යන්න පැහැදිලි නැත. නමුත්, බොහෝ විට දෙවැන්න එහි අර්ථය විය යුතුයි. ඡාන්දොග්‍ය උගන්වන්නේ සමාන දෙයක් නමුත්, මිය ගිය අය පොළොවට වැටුණ විට, වැස්ස ගස් බවට පත් වී ඒවා මිනිසෙකු ආහාරයට ගත් විට ඔහුගේ ශුක්‍රාණු බිරිඳගේ දරුගැබට ඇතුළු වී අලුත් ජීවියෙකු හට ගනී.

සිත්ගන්නා කරුණ නම්, ඡාන්දොග්‍ය පවසන්නේ ''මෙම (ඉගැන්වීම) බ්‍රාහ්මණයන් මීට පෙර නොදැන සිටීමයි.'' වෙනත් වචනයකින් කියනවා නම්, එය වෛදික සම්ප්‍රදායට අලුත් දෙයකි. බෘහදාරණ්‍යක යාඥවල්ක්‍ය දේශනා කරන්නේ කර්මය පිළිබඳව බුදුපියාණන් වහන්සේ ඉගැන්වූ යම් දෙයකට සමානවයි. එය කෙටියෙන් සහ කිසිදු විස්තරයකින් තොර වුවද, සදාචාරාත්මක හේතුකාරක පිළිබඳ හැඟීමයි. නමුත්, ඊට පසු ඔහු මෙය රහස් ඉගැන්වීමක් යැයි පැහැදිලි කරයි. (3.2.13) නමුත්, මෙය එසේ විය යුත්තේ ඇයි? සමහර විට, සියලු උපනිෂද් ධර්මයන් රහස්ව පැවතුණ නිසා විය හැකිය. නමුත්, සාම්ප්‍රදායික වෛදික චින්තනයේ කොටසක් නොවීම නිසාත්, යාඥවල්ක්‍යට අවශ්‍ය වූයේ අසාධාර්මිකතාවේ චෝදනා මගහැරීමටය.

ගැටලුව සංකීර්ණ කරමින්, බෘහදාරණ්‍යකයේ ඇති තවත් ඡේදයක් කර්මය සදාචාරාත්මක හේතුකාරකයක මුහුණුවරින් පැහැදිලිව ප්‍රතික්ෂේප කරයි. කෙනෙකුගේ පශ්චාත් මරණ පරීක්ෂණයේ ඉරණම තීරණය වන්නේ පුතෙකු ලැබීමේ සම්ප්‍රදායික වෛදික විශ්වාසය සහ ඉහළම පශ්චාත් මරණ

[8] A.I,282.

පරීක්ෂණයට යන තත්ත්වය ස්වර්ගයට යෑම බව එය ස්ථිරව ප්‍රකාශ කරයි. ''මිනිසුන්ගේ, පියවරුන්ගේ සහ දෙවිවරුන්ගේ ලෝක තුනක් ඇත. මිනිසුන්ගේ ලෝකය ලබා ගන්නේ පුතෙකු ලැබීමෙන් මිස වෙනත් ආකාරයකින් නොවේ. පියවරුන්ගේ ලෝකය ලබා ගන්නේ චාරිත්‍රවලින් වන අතර, දෙවිවරුන්ගේ ලෝකය දැනුමෙන් ලබා ගනී. මෙයින් හොඳම දෙය නම් දෙවිවරුන්ගේ ලෝකය වන අතර, එය බෙහෙවින් පැසසුමට ලක් වන්නේ එබැවිනි.'' (1. 5, 16). එම ග්‍රන්ථයේම තවත් ඡේදයක එය තවත් න්‍යායයක් සනාථ කරයි. එනම්, පුද්ගලයෙකු මිය ගිය විට, ඔහු සුළඟට යයි, එතැන් සිට, සූර්යයා වෙතට, ඊට පසු නැගී එන චන්ද්‍රයා වෙතට ගොස් තාපය හෝ සිසිල නැති ලෝකයකට පැමිණේ. එහි සදහටම වාසය කරයි. (5.10,1) කර්මය සහ ඇත්ත වශයෙන්ම සියල්ල දෙවියෙකු විසින් පාලනය කරන බවට මත දැරීම ඇතුළුව විවිධ පැහැදිලි කිරීම් ශාවේතාස්වතර ප්‍රතික්ෂේප කරයි. (1.2-3) කෞෂීතකී සහ තෛතිරිය වැනි උපනිෂද් කර්ම සහ නැවත ඉපදීමේ ආකාර ගැන දළ වශයෙන් සඳහන් කරන අතර, බුදුපියාණන් වහන්සේගේ ධර්මය සමග සමාන කරමින්, නමුත්, පෙනෙන ආකාරයට, යාවත්කාලීනව, පිළිගත හැකි පැහැදිලි කිරීමක් ලෙස පෙනේ. මේ සියලු තරගකාරී ප්‍රකාශයන් සමග කඨා *Kaṭha* ඇත්ත වශයෙන්ම ප්‍රකාශ කරන්නේ පුද්ගලයෙකු මිය ගිය පසු ඔහුට කුමක් වන්නේදැයි කිසිවෙකු නොදන්නා බව පැවසීම පුදුමයක් නොවන බවයි. (1.20-24) මේ සියල්ලේ අවසාන ප්‍රතිඵලය වන්නේ කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ කාරණය මත උපනිෂද් අවිනිශ්චිත වේ, සම්ප්‍රේක්ෂණය වේ. ඒවා සඳහන් කළහොත්, තවමත් සම්පූර්ණයෙන් සකස් නොකළ හෝ පිළිගෙන නොමැති බොහෝ පිළිගත හැකි පැහැදිලි කිරීම් කිහිපයක් ලෙස හුදෙක් ඉදිරිපත් කරනු ලබයි. පැහැදිලිවම, මෙම අදහස් වෙනත් තැනකින් ලබාගත් නව අදහස් වේ. යමෙකු සිතීමට පෙළඹෙන්නේ, බුදුපියාණන් වහන්සේ උපනිෂද්වලින් කර්මය සහ නැවත ඉපදීම තෝරාගත් නිසා නොවේ, නමුත්, ඊට වඩා, උපනිෂද්වලට බුදුදහමින් සහ සමහර විට ජෛන ආගමෙන් බලපෑම් ඇති වූ නිසාය.

කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ පැරණිතම තේරුම නිශ්චිත සහ සවිස්තරාත්මක සඳහන ජෛන ධර්ම ග්‍රන්ථවල දක්නට ලැබේ. ජෛන ආගම, සමහර විට දශකයකට පෙර සිට පැවත එන්නට ඇත. එහි නිර්මාතෘ මහාවීර සහ ඔහුගේ ඉගැන්වීම් නිතර ත්‍රිපිටකයේ සඳහන් වේ. කෙසේ වෙතත්, හඳුනාගත හැකි කර්ම සංකල්පයක් වන අතර, ජෛන ආගමේ කර්මය බුදුදහමේ කර්මයට වඩා වැදගත් ආකාරවලින් වෙනස් වේ. උදාහරණ වශයෙන්, ජෛන ආගම උගන්වන්නේ සෑම ක්‍රියාවක්ම, චේතාන්විත හෝ නැතිව, කර්මයක් නිර්මාණය වන බවත්, කර්මය යනු ආත්මයට අනුගත වෙමින් ජීවිතයට දුෂ්කරතාවක් ඇති කරන ආකාරයේ ද්‍රව්‍යමය යථාවක් (පෞද්ගලික) බවයි. ජෛන ආගම විසින් එක් ජීවිතයකින් තවත් ජීවිතකයකට ගමන් කරන ආත්මයක් උපග්‍රහණය කරයි. මෙය බුදුපියාණන් වහන්සේ ප්‍රතික්ෂේප කළහ. ජෛන ධර්මයේ කර්මය සහ නැවත ඉපදීම සම්බන්ධයෙන් බුදුපියාණන් වහන්සේට බලපෑමක් ඇති වූ

බවට නිසැකය. නමුත්, උන්වහන්සේ ඒවා හුදෙක් නොසිතාමතා සහ අවිචාරවත් අන්දමින් පිළිගත්තේ නැත. මහාවීරගේ ආධ්‍යාත්මික බුද්ධිය ඔහුට කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව අර්ධ දැක්මක් ලබා දුන් අතර, බුදුපියාණන් වහන්සේගේ බුද්ධත්වයට පත්වීමෙන් උන්වහන්සේට ඒ පිළිබඳව සම්පූර්ණ අවබෝධයක් ලබා දුන්නේය.

පළමු සහස්‍රයේ ආරම්භය ඇති වන විට, කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ විවිධ අදහස් ආගමට ඒකාබද්ධවීමේ මාවතේ පැවතුණි. නමුත්, එදා සහ පසුව පවා, මෙම අදහස් කිසිසේත් විශ්වීයව පිළිගත්තේ නැත. හින්දු ආගම සාමාන්‍යයෙන් පෙර සංකල්ප අතනොහරිමින් නව සංකල්පයන් විකසනය වෙමින් හෝ අවශෝෂණය කර ගන්නා ලදී. එයින් අදහස් කරන්නේ එය බොහෝ කරුණා සම්බන්ධයෙන් පුළුල් පරාසයක, සමහර විට, පරස්පර හෝ පරස්පර විරෝධී ධර්ම ඉදිරිපත් කරන බවයි. කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ සමහර න්‍යායයන් හින්දු ආගමේ පුළුල් ලෙස පිළිගත් විට, ඒවා තරමක් අයෝග්‍ය ලෙස එයට ගළපන ලදී. බොහෝ විට අනෙක් ආගම් සමග ගැටෙන්නට විය. එම පරස්පර විරෝධි ධර්ම නම්, දෙවිවරුන්ට මිනිස් කටයුතුවලට මැදහත් විය හැකි බවට ඇති විශ්වාසය, යම් දෙවියෙකු කෙරෙහි ඇති භක්තිය (භක්ති) විමුක්තියට මග පාදයි, පූජනීය ගංගාවල ස්නානය කිරීමෙන් අකුසල් සෝදා ඉවත් කළ හැකිය, ඇතැම් චාරිත්‍ර ඉටුකිරීම, ඇතැම් ශුද්ධ සිද්ධස්ථාන නැරඹීම හෝ වරනාසි පසු කර යෑම විමුක්තිය සහතික කරයි, කර්මය පිළිබඳ අදහස පැහැදිලිවම අවලංගු කරයි.

හින්දු ආගමේ සමහර නිකායන් කර්මය ඉරණම (දෛව) පිලිසරණ කරගනිමින්, ප්‍රතික්ෂේප කළහ. අනෙක් අය දරා සිටියේ පුද්ගලයෙකුගේ දෛවය තීරණය වන්නේ කාලයෙන් (කාල), සහජ ස්වභාවයෙන් (ස්වභාව), අහඹුව (යදෘච්ච) හෝ එය කලින් නියම වූ (භාවිවශාත්) බවයි. ධර්මශාස්ත්‍රයේ සහ පුරාණාවල බොහෝ ඡේදවල කර්මය පිළිබඳව සඳහන්ව ඇත්තේ ඊළඟ ප්‍රාණයේදී එය මඟහැරීමට හෝ අහෝසි කිරීමට ගත යුතු විවිධ ක්‍රම නිර්දේශ කරමිනි. එසේම නැවත ඉපදීමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පුරාණයන් සැබැවින්ම ව්‍යාකුල න්‍යායයන් ඉදිරිපත් කරයි. ඒවා එකිනෙකට පරස්පර, අතිශයින් අවුල් සහගතය. උදාහරණයක් වශයෙන්, මනුස්මෘතියේ ප්‍රස්තාවනාවේ මෙසේ සඳහන් කරයිඃ ''ඒවා එකින් එක ඉදිරියට ගෙන එනු ලබන විට, දෙවියන් විසින් ඔවුන්ට නියම කරනු ලබන විට, සත්ත්වයන් ඔවුන්ගේ පුද්ගල හැසිරීම් අනුගමනය කරයි. ආක්‍රමණය හෝ සාමකාමී බව, මෘදු බව හෝ කෲරත්වය, යහපත් බව හෝ නපුර, අවංක බව හෝ වංක බව, යනාදියෙන් ඔවුන් මවන විටදී එක් එක් අයට ඒ අවස්ථාවේදී පවරන ලද දේ එම සත්ත්වයා තුළ ඉබේම එම ගති රැඳී පවතී.'' (1.28-29). එම ග්‍රන්ථයේම තවත් ස්ථාන කිහිපයකම කෙනෙකු යහපත හෝ අයහපත ක්‍රියා කර ඇති ආකාරයට මරණයෙන් පසු කෙනෙකුගේ දෛවය තීරණය වන බව සඳහන් කරයි.

ආයුර්වේදයේ (ක්‍රි. පූ. පළමුවන ශතවර්ෂය/ ක්‍රි. පූ. දෙවන ශතවර්ෂය) තීරණාත්මක ග්‍රන්ථ දෙකකින් එකක් වන චරක සංහිතා නිවැරදිව පෙන්වා දෙන්නේ සෑම දෙනාම නැවත ඉපදීම විශ්වාස නොකරන බවත්, හින්දු ධර්ම ග්‍රන්ථ විවිධ පශ්චාත් විමර්ශන න්‍යායයන් ඉදිරිපත් කර ඇති බවත්ය. එහි මෙසේ සඳහන් වේ: ''සමහර මිනිසුන් ඔවුන්ට දැකිය හැකි දේ පමණක් විශ්වාස කරයි. එයට හේතුව නැවත ඉපදීම අවබෝධ කර ගැනීමෙන් ඔබ්බට ඇති දෙයක් නිසා ඒ පිළිබඳව මිනිසුන් විශ්වාස නොකරයි. තවත් සමහරු තනිකරම ආගමික විශ්වාසයන්ගේ ශක්තිය මත ඔවුන් නැවත ඉපදෙන බව විශ්වාස කරයි. නමුත්, ධර්ම ග්‍රන්ථ මෙම කාරණයේදී බෙදී ඇත.'' (I,11). මේ අනුව, හින්දු ආගම කර්මය සහ නැවත ඉපදීම පිළිබඳව උගන්වන්නේ නැතැයි කීම බොහෝ දුරට වැරදි නැත. එය ඒවා දුසිම් ගණන් උගන්වයි, නමුත්, පශ්චාත් විමර්ශන පරීක්ෂණ පිළිබඳ ඉරණම සහ ඒවා සිදුවන්නේ ඇයිද යන්න සම්බන්ධයෙන් තිබෙන විවිධ පැහැදිලි කිරීම් අතර ඒවා කිහිපයක් පමණි. බුදුපියාණන් වහන්සේගේ කර්මය සහ නැවත ඉපදීම පිළිබඳ ධර්ම ඊට හාත්පසින්ම වෙනස් වේ. ඒවා සම්පූර්ණයෙන්ම වැඩිදියුණු වූ, අතර, උන්වහන්සේගේ වෙනත් ඉගැන්වීම් සමගින් භේද රහිතව හොඳින් ගැළපේ, තේරුම් කර ඇත්තේ ඉතා පැහැදිලි සහ ස්ථාවර ආකාරයෙනි.

# Abbreviations

## Pali and Sanskrit Texts

A Aṅguttara Nikāya, ed. R. Morris, E. Hardy, PTS London 1885-1900.

Bv-a Madhuratthavilāsinī, ed. I. B. Horner, 1946

D Dīgha Nikāya, ed. T. W. Rhys Davids, J. E. Carpenter, PTS London 1890-1911.

Dhp Dhammapada, ed. O. Von Hinuber, K. R. Norman, PTS Oxford 1994.

Dhp –a Dhammapada-aṭṭhakathā, ed. H. C. Norman, PTS London 1906-14.

It Itvuttaka, ed. E. Windisch, PTS London 1889

Ja Jātaka with commentary, ed. V. Fauseboll, PTS London 1877-96.

Jn Jātaka Nidānakathā, ed. V. Fauseboll, PTS London 1877-96

Kv Kathāvatthu, ed. A. C. Taylor, PTS London, vol. I 1894, vol. II 1897

M Majjhima Nikāya, ed. V. Trenchner, R. Chalmers, PTS London 1887-1902

Mhv Mahāvaṃsa, ed. W. Geirge, PTS, London, 1908

Mil Milindapañho, ed. V. Trenckner, PTS London 1880

Mvu Mahāvastu, ed. E Senart, Paris 1882-1897

S Saṃyutta Nikāya, ed. L. Feer, PTS London 1884-98

Sn Sutta Nipāta, ed. D. Andersen, H. Smith, PTS London 1913

Th, Thi Theragātha and Therīgāthā, ed. H. Oldenberg, R. Pischel, 2nd edition, PTS London 1966

Ud Udāna, ed. P. Steinthal, PTS London 1885


Ud-a Paramatthadīpanī, ed. F. L, Woodward PTS London 1926
Vin Vinaya Piṭaka, ed. H. Oldenberg, PTS London 1879-83

# Bibliography

Agrawal, V. S. *India as Known to Pāṇini*,1963.
Allen, Charles. *The Buddha and Dr Führer*, 2008.
Apte, V. M. *Social and religious life in the Ghyasūtra*,1939.
Bailey, Greg and Mabbett, Ian. *The Sociology of Early Buddhism*, 2003.
Balbir, Nalini. 2000. 'Jain-Buddhist Dialogue – Material from the Pāli Scriptures', *Journal of the Pali Text Society*, Vol. XXVI, 2000.
Balcerowicz, Piotr. *Early Asceticism in India*,2016.
Barua, P. R. 'The Brahman Doctrine of Sacrifice and Ritual in the Pali Canon,' *Journal of the Asiatic Society of Pakistan*, Vol.I, 1956.
Basham, A. K. *History and Doctrine of the Ajivakas*, *A Vanished Indian Religion*,1951.
- 'The Background to the rise of Buddhism', in A. K. Naraian (ed.), *Studies in History of Buddhism*, 1980.
Bechart, H. (ed.). *When Did the Buddha Live?* 1995.
Black, Brian. 'The Rhetoric of Secrecy in the Upanaṣads,' Steven E. Lindquist (ed.) *Religion and Identity in South Asia and Beyond*, 2013.
Bodhi, Bhikkhu.*In the Buddha's Words*,2005.
- *The Numerical Discourses of the Buddha*,2012.
-*The Buddha's Teachings on Social and Communal Harmony: An Anthology of Discourses from the Pali Canon*, 2016.
Bronkhorst, Johannes. 2007. *Greater Magadha,Studies in the Culture of Early India*, 2007.
-*Buddhism in the Shadow of Brahmism*,2011.
-*How the Brahmins Won*,2016.
Chakrabarti, Dilip K. 'Rajagaha: An early historic site in India', *World Archaeology*, Vol.7 No.3, 1975.
-*Archaeological Geography of the Ganges Plain. The Lower and the Middle Ganga*,2001.
-*Archaeological Geography of the Ganges Plain. The Upper Ganges*,2007.
Chakravarti, U. *The Social Dimensions of Early Buddhism*,1987.
de Silva, Padmasiri. *The Psychology of Emotions and Humour in Buddhism*, 2018.
Deva, Krishna. 'The Antiquity of Sites Related to the Buddha', in Satish Chandra (ed.) *Studies in Archaeology and History*, 2003.
Dhammika, S. *Middle Land Middle Way*, 2008a.
- *Jesus and the Buddha, A Study of their Commonalities and Contrasts*,2018b.
-*Nature and the Environment in Early Buddhism* (revised edition),2018c.
- *The View from the West*, 2018d.
Dyson, Tim. *A Population History of India*, 2018.
Eltschinger, Vincent. *Caste and Buddhist Philosophy*, 2012.
Erdosy, Georg. 1995. 'City States of North India and Pakistan at the Time of the Buddha',inF. Raymond Allchin (ed.), *The Archaeology of Early Historic South Asia*,1995.
Falk, Harry.2006.*Aśokan Sites and Artefacts*,2006.
- 'The Ashes of the Buddha',*Bulletin of the Asia Institute*, 2018.
Fick, Richard. *The Social Organisation in North-east India in Buddha's Time*,1972.
Fleet, J. F. 'The Inscription on the Piprawa,' *Journal of the Royal Asiatic Society* Vol. 38 issue 1,1906.
Fogelin, Lars. *Archaeology of Early Buddhism*, 2006.
Ghosh, A. 'Buddhist Inscription from Kausambi', in D, C. Sircar (ed.), *Epigraphia Indica*, 1961-1962.
Gokhale, B. G. *The Brahmans in Early Buddhist Literature*,1970.

-'The Merchant in Ancient India',*Journal of the American Oriental Society*, 97.2, 1977.
-'Early Buddhism and the Urban Revolution', *Journal of the InternationalAssociation of Buddhist Studies*, 5/2.1982.
Gombrich, Richard. 'Bodies like Old Carts', *Journal of the Pali Text Society*, XI,1987.
-*Theravada Buddhism*,1988.
-*What the Buddha Thought*,2009.
- *Buddhism and Pali*,2018.
Hinüber, Oskar von. 'The Cause of the Buddha's Death: The last Meal of the Buddha', Appendix, A Note on *sūkaramaddava*', *Journal of the Pali Text Society*, XXVI. 2000.
- 'Hoary past and hazy memory. On the history of early Buddhist texts', *Journal of the International Association of Buddhist Studies*, Vol.29,2.2006.
Jain, Jagdishchandra. *Life in Ancient India as Depicted in the Jain Canon and Commentaries*,1984.
Jamison, Stephanie and Brereton, Joel, P. *The Rigveda, The Earliest Religious Poetry of India*, Vols. I, II, III, 2014.
Jayatilleke, K. N. *Early Buddhist Theory of Knowledge*,1963.
Jha, D. N. 'Brahmanical Intolerance in Early India', *Social Scientist*Vol. 44, No. 5/6,2016.
Joshi, Lal.*Discerning the Buddha, A Study of Buddhism and of the Brahmanical Hindu Attitude to It*,1983:
Kosambi, D. D.'Ancient Kosala and Magadha', *Journal of the Bombay Branch of the Royal Asiatic Society*,1952.
Kumar, D. *Archaeology of Vaisali*,1986.
Lahiri, Nayanjot. *The Archaeological of Indian Trade Routes (up to C 200 BC)*,1992.
Lal, M. *Settlement History and the Rise of Civilization in the Ganga-Yumuna Doab*,1984a.
-'Summary of Four Seasons of Exploration in Kanpur District, Uttar Pradesh', *Man and Environment 8*,1984b.
- 'Population Distribution and its Movement During the Second-First Millennium B.C. in the Indo-Gangetic Divide and Upper Ganga Plain',*Puratāttva*,1987–8.
Law, B. C.*Geography of Early Buddhism*,1932.
- *Sravasti in Indian Literature*,1939.
Levman, Bryan Geoffrey.'Cultural Remnants of the Indigenous Peoples in the Buddhist Scriptures', Buddhist *Studies Review*, 30, 2.2013.
Ling, Trevor. *The Buddha, Buddhist Civilization in India and Ceylon*,1973.
Majumdar, R. C.*Corporate Life in Ancient India*,1922.
Marshall, J. 'Excavations at Bhita', *Archaeological Survey of India Annual Report*, 1911-12. 1915.
Milligan, Matthew, D. 'Corporate Bodies in Early South Asian Buddhism: Some Relics and their Sponsors According to Epigraphy',*Religions*,10 (1) 4, 2019.
Mohanty, Gopinath, *et el.*'Tapussa and Bhallika of Orissa, their Historsity and Nativity', *Orissa Review*, Nov.2007.
Nakamura, Hajime. *Gotama Buddha, A Biography Based on the Most Reliable Texts*, Vol. I and II, 2000-2005.
Norman K. R. 'The Origin of Pāli and its Position among the Indo-European Languages',*Journal of Pali and Buddhist Studies*, Vol. I March,1988.
-'A Philological Approach to Buddhism',*The Buddhist Forum*, Vol. V.1997.
-'Theravada Buddhism and Brahmanical Hinduism: Brahmanical Terms in Buddhist Guise',*The Buddhist Forum* Vol.VII, 2012.
Oldenberg, Hermann. *The Gihya-Sūtras. Rules of Vedic Domestic Ceremonies*. Part I and II, 1896-1892.
-*Buddha, His Life, His Doctrine, His Order*,1892.
Olivelle, Patrick. *Saṃnyasa Upaniṣads*,1992.
- *The Āśrama System*,1993,
-*The Early Upaniṣads*,1998.


-*Dharmasūtras, The Law Codes of Ancient India*,1999.
-*The Law Code of Manu*,2004.
-*Kings, Governance, and Law in Ancient India*, 2013.
Pande, G, C. *Śramaṇa Tradition, Its History and Contribution to Indian Society*,1978.
Powers, John. *A Bull of a Man*,2009.
Prakash, Om. *Food and Drink in Ancient India*,1961.
Prasad, A. K. 'Excavations at Taradih-Bodhgaya',in C. P. Singh (ed.), *Archaeology and Art: K. Deva Felicitation Volume*, Part II.1990.
Prasad, R. C. *Archaeology of Champa and Vikramasila*,1987.
Prets, Ernst.'Theories of Debate, Proof and Counter-proof in the Early Indian Dialectical Tradition', in
Piotr Balcerowitz and Mark Mejor(eds.), *Studia Indologiczne 7*, 2000.
Puri, B. N. *India in the Time of Patañjali*,1957.
Rhys Davids, C. A. F. *The Psalms of the Early Buddhists*, Vol. II,1913.
Rhys Davids, T. W. *Buddhist India*,1903.
Sarao, K. T. *The Origin and Nature of Ancient Indian Buddhism*,1989.
Sarkisyanz, E. *Urban Centres and Urbanisation as Reflected in the Pāli Vinaya and Sutta Piṭakas*,1990.
Schinnglogg, Dieter. *Fortified Cities of Ancient India, A Comparative Study*, 2014.
Sen, Chitrabhanu. *A Dictionary of the Vedic Rituals based on the Śrauta and Ghya Sūtras*,1978.
Sharma, R. S. 'Material Background of the Rise of Buddhism', in Mohit Sen and M. B. Rao (eds.), *Das Kapital Centenary Volume*,1968.
Singh, Upinder. *Political Violence in Ancient India*.2017.
Sinha, K. K. *Excavations at Sravasti:1959*,1967.
Srinivasan, Saradha. *Mensuration in Ancient India*,1979.
Srivastava, K. M. *The Discovery of Kapilavatthu*,1986.
Sujato, Bhikkhu and Brahmali, Bhikkhu. *The Authenticity of the Early Buddhist Texts*,2014.
Tatia, N. 'The Interaction of Jainism and Buddhism,' inA. K. Narain, (ed.), *Studies in History*, 1980.
Thanissaro Bhikkhu, *The Buddha Smiles, Humor in the Pali Canon*, 2015.
Thaplyal,K. K. *Village and Village Life in Ancient India*, 2004.
Tilakaratne, Asanga. 'Personality Differences of Arahants and the Origins of Theravada', in Asanga Tilakaratne, Toshiichi Endo, *et al*, (eds.), *Dhamma-Vinaya: Essays in Honour of Venerable Professor Dhammavihari*, 2005.
Verardi, Giovanni. *Hardships and Downfall of Buddhism in India*,2011.
Wangle, N, K. 'Minor Rites and Rituals Attributed to the Brahmans in the Nikāya Texts of the Pali Canon', *Journal of the Oriental Institute of Baroda*Vol. XVII, No. 4, 1968.
-*Society at the Time of the Buddha*,1995.
Warder, A. K. 'On the relationships between Buddhism and other contemporary systems',*Bulletin of the School of Oriental and African Studies*,18.1956.
Wezler, Albrecht.'On the Problem of Contribution of Ascetics and Buddhist Monks to the Development of Indian Medicine', *Journal of the European Āyurvedic Society*,1995.
Wijayaratna, Mohan. *Buddhist Monastic Life according to the Texts of the Theravāda Tradition*,1990.
Wynne, Alexander. 'The Oral Transmission of Early Buddhist Literature',*Journal of the International Association of Buddhist Studies*, 27 (1) 2004.
-*The Origin of Buddhist Meditation*,2007.
Zysk,Kenneth.1998.*Asceticism and Healing in Ancient India*,1998.



පිප්ප්‍රහාවා වල හමුවූ ශිලා ලේඛන සහිත කරඬුව, ක්‍රි.පූ 2/3 සියවස



පාත්තරය, කොසම්බි, ක්‍රි.පූ. 4වෙනි සියවස



අශෝක අධිරාජ්‍යය සමයේ ලුම්බිනී ශිලා ලේඛන, ක්‍රි.පූ. 249



පුරාණ භාරතයේ මෙන් කනු මත සෑදුනු රැස්වීම් ශාලාවක්, ශ්‍රී ලංකාව, 18වෙනි සියවස



මල් වලින් පිරුනු සල් ගස, කුසිනාරාව



පුරාණ භාරතයේ ගම්මානයක්, සංචිය, ක්‍රි,පූ 1වෙනි/2වනි සියවස



අග්නි පූජාවක යෙදෙන ජටිල තාපසයෙක්,
මතුරා, ක්‍රි.පූ. 1වෙනි සියවස



ශ්‍රී, සෞභාග්‍යයේ දේවතාවිය,
සංචිය, ක්‍රි.පූ. 1වෙනි/2වනි සියවස



පුර්ෂ සහ ස්ත්‍රී වස්ත්‍රයන්, කන්හෙරි, ක්‍රි.පු. 2වනි/1වැනි සියවස



පුර්ෂ තලප්පාව සහ කරාඹු, සාරානාත්, ක්‍රි.පු. 3වෙනි සියවස




බෝධිය, බුද්ධ ගයාව, ක්‍රි.පු. 2වනි සියවස



නාග ලෝකයේ ජීවීන් දැක්වෙන මනිමේකලා චෛත්‍යය (වර්තමාන නම: මනියාර් මත්), රාජ්ගිර්, ක්‍රි.පූ 150.



කාසි, මයුර රාජධානිය, ක්‍රි.පූ 3වෙනි සියවස



හමුදාව නගරයක් ආක්‍රමනය කිරීම, සංචිය, ක්‍රි.පූ. 1වැනි/2වෙනි සියවස



සත්තපණ්ණි ලෙන, ප්‍රථම බෞද්ධ සංගායනාව සිදුවූ ස්ථානය, රාජ්ගීර්

බුද්ධ චරිතාපදාන සිය ගණනක් ක්‍රි. පූ. 1වන සියවසේ සිට වර්තමානය දක්වා දිවෙන නමුත්, ඒවා බැහැරවීමෙන් තොරව, බුදුපියාණන් වහන්සේගේ පිරිණිවීමෙන් පසුව වර්ධනය වූ ජනප්‍රවාද සමග පැරණිතම ග්‍රන්ථවල ඒකාබද්ධ කරුණු සමග පටලවා ගනී. වර්තමාන ග්‍රන්ථය වෙනස් ප්‍රවේශයක් ගනී. පැරණිතම බෞද්ධ ලේඛනවල පාළි ග්‍රන්ථයේ අඩංගු තොරතුරු සහ මුල් සංස්කෘත මූලාශ්‍ර සමග එයට අනුපූරක වන තොරතුරු පමණි. කතුවරයා ආරම්භ කරන්නේ බුදුපියාණන් වහන්සේ දැන සිටි ලෝකය, එහි සංස්කෘතිය, ආගමික ජීවිතය සහ එකල සිදුවෙමින් පවතින ප්‍රබෝධමත් කරන වෙනස්කම් පිළිබඳ තීව්‍ර සහ උද්‍යෝගිමත් වාර්තාවක් ලබා දෙමිනි. ඊට පසු ඔහු කුඩා නිදර්ශන සිය ගණනක් එක්රැස් කර, බුදුපියාණන් වහන්සේ පිළිබඳව පසෙකට තබමින්, උන්වහන්සේගේ පෙනුම, ගමන්බිමන්, ඉගැන්වීමේ විලාශය සහ උන්වහන්සේ ශ්‍රාවකයන්ට සහ උන්වහන්සේගේ විරුද්ධවාදීන් සමග සම්බන්ධවූ ආකාරය ගැන අපට පවසති. පරිපූර්ණ සහ ඉතා සුපරික්ෂාකාරී ලෙස ආශ්‍රේය ග්‍රන්ථ පරිහරණය කර ඇති මෙම ග්‍රන්ථය ලෝකයේ ශ්‍රේෂ්ඨතම ආගමික නිර්මාතෘවරයා පිළිබඳව දැනගැනීමට කැමැති ඕනෑම කෙනෙකුට අත්‍යවශ්‍ය කියවීමක් වනු ඇත.

ශ්‍රාවස්ති ධම්මික ස්වාමීන් වහන්සේ 1951දී ඕස්ට්‍රේලියාවේදී උපත ලද අතර, නවයොවුන් වියේ අවසාන භාගයේදී ඉන්දියාවේදී 1976දී පැවිදි වූහ. උන්වහන්සේ ශ්‍රී ලංකාවේදී බෞද්ධ දර්ශනය සහ භාවනාව හැදෑරූ අතර, පසුව සිංගප්පූරුවට ගොස් එරට වඩාත් ක්‍රියාශීලී බෞද්ධ ආයතනයක් ආරම්භ කළහ. 2017දී උන්වහන්සේ නැවත සිය මව්බිමට පැමිණි අතර, එහිදී උන්වහන්සේ අර්ධ-විශ්‍රාමික ජීවිතයක් ගත කරති.